
# මැතිවරණ හා සැබැඳි අධිකරණ තීරණ



නීතිඥ ජගත් ලියන ආරච්චි

-පැෆ්රල් ප්‍රකාශනයක්-

# මැතිවරණ හා සැබැඳි අධිකරණ තීරණ

නීතිඥ ජගත් ලියන ආරච්චි

පැෆ්රල් ප්‍රකාශනයක්

# මැතිවරණ හා සැබැඳි අධිකරණ තීරණ

ප්‍රථම මුද්‍රණය - 2022 අගෝස්තු

පැෆ්රල් ප්‍රකාශන වෙනුවෙන් සම්පාදනය

**නීතිඥ ජගත් ලියන ආරච්චි**

ISBN 978-624-6235-05-5

කවරයේ ඡායාරූපය

**චමිල කරුනාරත්න**

පිටු සැකැස්ම

**පැෆ්රල් මාධ්‍ය අංශය**

ප්‍රකාශනය

**පැෆ්රල්**

නො. 16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

Tel: 011 2 558 570/1 Fax: 011 2 558 572

paffrel@sltnet.lk

www.paffrel.lk

මුද්‍රණය

..............................

..........

# පැෆ්රල් සංවිධානයේ පණිවුඩය

මැතිවරණ හා සබැඳි නඩු තීරණ පොතක් ලෙස එළි දක්වන්නට හැකිවීම කාලීන අවශ්‍යතාවයක් එහි කූඨප්‍රාප්තිය සනිටුහන් කිරීමක් බව මෙහිලා වෙසෙසින් සඳහන් කළ යුතුය. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මැතිවරණ ඉතිහාසයේ සුවිශේෂී නඩුතීන්දු පොතක් ලෙස එළි දක්වන්නට කලෙක පටන් අපදුටු සිහිනය යථාර්තයක් බවට පත්ව ඇතිබව පවසන්නේ ඉමහත් සතුටිනි.

කුමන හෝ ඡන්ද බලයක් අභ්‍යාස කළ ආසියාවේ පැරණිම රාජ්‍යය ලෙස අපට ඇත්තේ ඉතා දීර්ඝ මැතිවරණ ඉතිහාසයකි. ශ්‍රී ලංකාවේ මැතිවරණ ඉතිහාසය පිරික්සීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථාවේ සඳහන් ජනතා පරමාධිපත්‍ය තහවුරු කරන්නට විවිධ නඩු තීන්දු හරහා ලබාදී ඇති දායකත්වය අති මහත්ය. එමතුදු නොව මාක් ප්‍රනාන්දු වැනි කීර්තිමත් විනිසුරුවරුන් ලබාදුන් අර්ථකථන ඡන්ද බලය කොතරම් පුළුල් පරාසයක් කරා විහිදෙන්නේද යන්න සිතා ගැනුමට කදිම උදාහරණය සපයයි.

නිවී සැනසිල්ලේ මෙම නඩු තීන්දු අධ්‍යයනය කරන්නෙකුට වර්තමානයේ අප අත්විඳින නිදහස් හා සාධාරණ මැතිවරණ වූ දීර්ඝ ගමන් මගතුල කොතරම් අභියෝග දුෂ්කරතා සහ බාධාවන් ප්‍රමාණයක් පසුකර ආවාදැයි සිතා ගැනුමට හැකිවනු ඇත. මැතිවරණ ඉතිහාසය අධ්‍යයනය කරන්නෙකුට එහි අක්මුල් පිළිබඳව සොයා බලන්නට මෙම ග්‍රන්ථය මහත් උත්තේජනයක් සපයනවා නිසැකය. විවිධ තැන්වල ඉතා සුලු වශයෙන් එකතුව තිබූ මැතිවරණ ආශ්‍රිත නඩු තීන්දු පොතක් ලෙස එළි දැක්වීම තුළ ඒවා අධ්‍යයනය

කරන්නෙකුට විශාල ආයාසයක් නොදරා එක් ග්‍රන්ථයක් තුළින් පරිශීලනය කරන්නට ඉඩ හසර විවර කරදීම මෙම ග්‍රන්ථය එළි දැක්වීමේ අපගේ ප්‍රමුඛ අරමුණක් බව වෙසෙසින් සඳහන් කළ යුතුය. දේශපාලන විද්‍යාව හදාරන සිසු දරුවන්ට පමණක් නොව දේශපාලනය ගැන ඇල්මක් දක්වන කවරෙකුට වුව මෙම ග්‍රන්ථය පරිශීලනය කිරීම මගින් වෙනත් දේශපාලන කියවීමකට කවුළුවක් විවර කරදෙනු නොඅනුමානය.

කවදත් මෙවැනි අභියෝගයන් කිසිදු පැකිලීමකින් තොරව භාරගන්නා අප සුමිතුරු නීතිඥ ජගත් ලියන ආරච්චි මහතා මෙම සුවිශේෂී ග්‍රන්ථයේ සම්පාදකවරයා වශයෙන් ඊට උපරිම සාධාරණත්වය ඉටුකර ඇති බව ඔහුට කරනු ලබන ගෞරවයක් ලෙස සඳහන් කළ යුතුමය. ඊට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති නීතිඥ නිමල් පුංචිහේවා, කොමසාරිස් ජනරාල් සමන් රත්නායක යන මහත්වරුන් ඇතුලු මැතිවරණ කොමිසමේ නිලධාරින් ලබාදුන් මිත්‍රශීලී දායකත්වයද සිහිපත් කළ යුතුය. එමෙන්ම මැතිවරණ කොමිසමේ හිටපු සභාපති මහින්ද දේශප්‍රිය මහතාද මෙම ග්‍රන්ථයට අවැසි තොරතුරු ලබාදීමෙන් දක්වන ලද දායකත්වයද අති මහත්ය. තවද ඉතා අලංකාරව කවරය සහ පිටු සැකසූ නිලුක පෙරේරා මහතාද සෝදුපත් බැලූ නිමේෂා යුගාන්ති මහත්මියද කවරයේ ඡායාරූපයේ මුල් හිමිකරු වන චමිල කරුණාරත්න මහතාවද සිහිපත් කරමි. එමෙන්ම අතිශයින් කාර්යය බහුල තත්ත්වයක් තුළ ඉතා කෙටි කාලසීමාවකින් මෙම ග්‍රන්ථය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරදුන් හිතවත් නීතිඥ තුසිත සිරිවර්ධන මහතාටද අපගේ වෙසෙස් ස්තුතිය පලකළ යුතුය.

**රෝහණ හෙට්ටිආරච්චි**
**විධායක අධ්‍යක්ෂ**
**පැෆ්රල් සංවිධානය**

# පෙරවදන

නීතිඥ ජගත් ලියන ආරච්චි මහතා විසින් පැෆ්රල් සංවිධානයේ ඉල්ලීම හා අනුග්‍රහය මත සකසන ලද මැතිවරණ හා සබැඳි අධිකරණ තීන්දු කෘතිය සමාජ අවශ්‍යතාවයක් හා කාලීන වැදගත්කමකින් යුතු එකක් බව සඳහන් කළ යුතුව ඇත. මහජනතාවගේ පරමාධිපත්‍ය අයිතියක් වූ ඡන්ද බලය මඟින් ක්‍රියාත්මක වන මැතිවරණ/ඡන්ද විමසීම් මගින් ප්‍රජාතන්ත්‍රවාදී රටක අනාගතය සැකසෙන බව පැහැදිලි කරුණකි. එම මැතිවරණ ක්‍රියාවලිය නිදහස් හා සාධාරණ විය යුතු අතර, ඒ සඳහා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මගින් හා ජනාධිපතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත, පළාත් සභා පනත, පළාත් පාලන ආඥා පනත හා ජනමත විචාරණ පනත මගින් මඟ පෙන්වීම් හා අනුගමනය කළ යුතු නීතිමය කාර්ය පරිපාටි අන්තර්ගතව ඇත. එම විධිවිධාන උල්ලංඝනය කිරීම හෝ ඉක්මවීම මහජන කැමැත්ත නිසි පරිදි ප්‍රකාශ කිරීමට ඉඩ නොතැබීමක් හා මහජන මතය විකෘති කිරීමට හේතුවන්නකි. එම අවස්ථා වල පුරවැසියෙකුට හා/හෝ අපේක්ෂකයෙකුට ඒ පිළිබඳව අධිකරණය හමුවේ කරුණු දක්වා එම නුසුදුසු නියෝජිතයා ඉවත් කිරීමට කටයුතු කිරීමේ හැකියාව ද එම විධිවිධාන මගින්ම සලසා දී ඇත. අතුරු මැතිවරණයක් මගින් සුදුසු නියෝජිතයෙකු පත් කර ගැනීමට අවකාශ සැලසීම ද ප්‍රශස්ත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයකි. 1931 වර්ෂයේ සිට මැතිවරණ පෙත්සම්, අතුරු මැතිවරණ පෙත්සම්, මැතිවරණ නීති හා සම්බන්ධ කරුණු පිළිබඳ විශාල නඩු සංඛ්‍යාවක් හා ඉහළ අධිකරණ තීරණ රාශියක් පවතින අතර, එකී තීරණ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම හා නීතියේ ආධිපත්‍ය පිළිබඳව අධ්‍යයනයක යෙදෙන්නට අගනා මූලාශ්‍ර වේ.

ශ්‍රී ලංකාව තුළ නීතිඥ ක්ෂේත්‍රය තුළ පවා මේ පිළිබඳව ඇත්තේ ඉතා අඩු අවධානයක් බව නිරීක්ෂණය වන අතර, ඒ නිසාම මේ සම්බන්ධ අධිකරණ කටයුතුවල දී සේවාදායකයනට නිසි උපදෙස් නොලැබී ඇති අවස්ථා ද වාර්තා වී ඇත.

මැතිවරණ නඩු තීන්දු වල ඇති කරුණු හා නීති විධිවිධාන පුරවැසියාට, දේශපාලන පක්ෂ හා අපේක්ෂකයාට, සිවිල් සංවිධාන හා නිරීක්ෂණ සංවිධාන වලට මෙන්ම නීතිඥයනට හා නීති ශිෂ්‍යයාට ද ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව උනන්දුවක් දක්වන සැමට ද මනා ප්‍රයෝජනයක් හා ආකර්ශනයක් ගෙන දෙයි. ප්‍රජාතන්ත්‍රවාදී නියෝජිතවරයෙක් ඡන්ද විමසීමක් පිළිබඳව මනාව වටහා ගැනීමට ද ඒ සඳහා සක්‍රිය දායකත්වය ලබාදීමට ද එම කෘතිය මගින් අගනා පිටුවහලක් සලසයි. මෙම කාර්යය අවධානයට යොමු කිරීම පිළිබඳව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි මහතා ප්‍රමුඛ පැෆ්රල් සංවිධානයට ද මහත් දුෂ්කර කර්තව්‍යයක් සරලව පහසුවෙන් වටහා ගැනීමට හැකි පරිදි පරිවර්තනය කර ඉදිරිපත් කිරීම පිළිබඳව නීතිඥ ජගත් ලියනාරච්චි මහතාට ද සැමගේ ප්‍රශංසාව හිමිවිය යුතුව ඇත.



**ජ්‍යෙෂ්ඨ නීතිඥ නිමල් ජී. පුංචිහේවා**
**සභාපති - මැතිවරණ කොමිෂන් සභාව**

# මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ පණිවිඩය.

මැතිවරණ වලට අදාළ නෛතික ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මෙන්ම මැතිවරණ සහ ඡන්ද විමසීම් වලට අදාළ පනත් තුළ ද සඳහන් වේ. එයට අමතරව මැතිවරණ ආශ්‍රිතව ලබාදුන් විවිධ නඩු තීන්දු මගින්ද නව නීති සම්පාදනයවී තිබේ. එකී අධිකරණ තීන්දු මැතිවරණ ක්‍රියාවලියේ ප්‍රගතියට ලබාදී ඇති දායකත්වය අතිමහත්ය. විවිධ වකවානු වල ලබාදුන් එකී නඩු තීන්දු මගින් ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණවද විශ්වසනීය ලෙස පැවැත්වීමට අවශ්‍ය ක්‍රමවේද සහ මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමනය කිරීමේ අවශ්‍යතාව වැනි මැතිවරණයක සුජාතභාවය ආරක්ෂා කිරීමට අදාළව අතිශයින් වැදගත් වන වත්මන් සමාජය තුළ ද සාකච්ඡාවට බඳුන් වී ඇති කරුණු පිළිබඳව අවධානය යොමු වී තිබීම සුවිශේෂී ලක්ෂණයකි.

මැතිවරණ ඉතිහාසයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කළ එවැනි නඩු තීන්දු පිළිබඳව තොරතුරු මැතිවරණ කොමිෂන් සභාව හා උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්වයන් සතුව සීමිත ප්‍රමාණවලින් තිබුණද පුළුල් එකතුවක් ලෙස නොතිබීමේ අඩුපාඩුව කාලාන්තරයක් තිස්සේ නිරීක්ෂණය වූ ගැටළුවකි. එයට පිළියමක් ලෙස පැෆ්රල් සංවිධානය මගින් නීතිඥ ජගත් ලියනආරච්චි මහතා ගේ සම්පාදකත්වයෙන් "මැතිවරණ හා බැඳුණු අධිකරණ තීරණ" නම් ග්‍රන්ථය එළිදැක්වීම කාලීන අවශ්‍යතාවක් ඉටු වීමක් ලෙස මම දකිමි. ඒ පිළිබඳ පැෆ්රල් සංවිධානයට මෙන්ම මෙහි ග්‍රන්ථයේ සම්පාදක ලෙස කටයුතු කළ නීතිඥ ජගත් ලියනආරච්චි මහතාට ද අපගේ කෘතඥතාව හිමිවේ.

අප රටේ ඡන්ද විමසීම හා සම්බන්ධ වන පාර්ශව කිහිපයක්වේ. ඉන් පුරවැසියන් ප්‍රධානය. එකිනෙකාට වෙනස් අර්ථ සහිතව පුරවැසියා, ඡන්ද හිමියා සහ ඡන්දදායකයා යන භූමිකාවන්ට පණපොවනු ලබන අතර තරඟ කරන අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්, මැතිවරණ කොමිෂන් සභාව හා එහි නිලධාරීන්, තේරීම් භාර නිලධාරීන් ඇතුළු මැතිවරණ රාජකාරිවල නිරතවන රජයේ නිලධාරීන් සහ පොලීසිය, සහයක සේවාවන් මෙන්ම ජනමාධ්‍යද මෙහිදී තම තමන්ගේ භූමිකා ක්‍රියාවේ යොදවයි. එම ක්‍රියාවලියේදී ඇතිවන, මුහුණ දෙන ගැටළු රැසකට විසඳුම් මේ පොතෙන් සොයා ගත හැකිය.

දේශපාලන පක්ෂ පිළිබඳ ජනප්‍රිය අර්ථ දැක්වීමට අනුව එම සංවිධාන" ජනතා කැමැත්ත මත ආණ්ඩු බලය ලබාගැනීමේ හා එමගින් ස්වකීය සංවිධානයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ අරමුණින් ක්‍රියා කරයි.

වර්තමානයේදී නම් මේ පක්ෂ සැලකියුතු ප්‍රමාණයක් බලය ලබා ගැනීමේ අරමුණ කෙරෙහිම වැඩි බරක් යොදන බව නිරීක්ෂණය වේ. එසේවුවද රාජ්‍ය බලය අත්පත් කරගෙන ආණ්ඩුවක් පිහිටුවීම යන අරමුණෙන් ඔබ්බට ගොස් සියලුම පුරවැසියන්ට සමාජ යුක්තිය ඉටුකිරීමේ අරමුණ කෙරෙහිද දේශපාලන පක්ෂවල හා ක්‍රියාකාරීන්ගේ අවධානය යොමුකිරීම අත්‍යවශ්‍යව පවතින මේ යුගයේ පොදු ජනතා අභිලාශ වෙනුවෙන් පෙනී සිටිමින් වඩා දියුණු ආකල්ප වලින් සමන්විත, අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සහිත සංවිධාන ලෙස දේශපාලන පක්ෂ ක්‍රියාත්මක වන්නේ නම් රාජ්‍ය බලය කාට හිමිවූවද අනෙක් පාර්ශව වලට අසාධාරණයක් නොවන අයුරින් ක්‍රියා කිරීමට හැකිවනු ඇත. මෙම නඩු තීන්දු ලබාදීමේ මුඛ්‍ය පරමාර්ථය වන්නේද මැතිවරණ වලදී එකී ප්‍රජාතන්ත්‍රීය භාවිතාව වඩ වඩාත් තහවුරුවන පරිසරයක් නිර්මාණය කිරීමය. යුක්තිය පසිඳලීම හරහා සැමට යුක්තිය ඉටු කරන්නේ කෙසේ දැයි මෙම නඩු තීන්දු අධ්‍යනය කරන්නෙකුට වඩාත් හොඳින් තහවුරු වේ. එසේවුවත් දේශපාලන පක්ෂ හා පුරවැසියන් සියලු දෙනා බලය ලබාගන්නා චින්තනයෙන් බැහැරව සැමට යුක්තිය ලබාදිය යුතුය යන සංකල්පයට මාරු වනතෙක් ජනතා අභිලාශ සාධාරණ අයුරින් ඉටු කිරීම අපහසු කටයුත්තක් වනු ඇත. සියලු ජනතාවට යුක්තිය ඉටු වනු ඇත්තේ දේශපාලන පක්ෂ පුරවැසියන් මේ පරම සත්‍ය අවබෝධ කරගත් විටදී පමණකි.

එනයින් බලන කළ මැතිවරණ හා බැඳුනු අධිකරණ තීන්දු නම් මෙම ග්‍රන්ථය දේශපාලන පක්ෂ වලට, මැතිවරණ නිලධාරීන්ට සහ දේශපාලන විද්‍යාව හදාරන සැමට මෙන්ම මැතිවරණ පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම පුරවැසියෙකුට මැතිවරණ ආශ්‍රිත යුක්තිය පසඳලීමේ ක්‍රියාවලිය පිළිබඳව පූර්වාදර්ශ සපයාගත හැකි මහඟු කෘතියක් වන්නේය. කාලීන අවශ්‍යතාවක් වූ මෙම භාරධූර කටයුත්ත සඳහා නොපැකිලිව ඉදිරිපත් වූ අප හිතවත් රෝහණ හෙට්ටිආරච්චි මහත්මා ඇතුළු පැෆ්රල් සංවිධානයත්, මෙවැනි කටයුත්තකට වඩාත් සුදුසුම පුද්ගලයා යැයි මා විශ්වාස කරන නීතිඥ ජගත් ලියනආරච්චි මහතාත් පෙර සඳහන් මැතිවරණ ක්‍රියවලිය හා සම්බන්ධිත සැමගේ හා යහපත් රටක් උදෙසා පෙනී සිටින සැමගේ පැසසුමට සහ සම්භාවනාවට පාත්‍ර විය යුතු යැයි හැඟිමි.

මහින්ද දේශප්‍රිය
සභාපති, සීමා නිර්ණ කොමිෂන් සභාව
හිටපු සභාපති, මැතිවරණ කොමිෂන් සභාව

# සම්පාදක සටහන

මැතිවරණය යනු ප්‍රජාතන්ත්‍රවාදයේ මංගල උත්සවය ලෙස හැඳින්විය හැකිය. මැතිවරණ නොමැතිව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවත්වාගෙන යා නොහැකිය. විටින් විට පවත්වන මැතිවරණ මෙන්ම එම මැතිවරණයන්හි සුපිළිපන් බව රටක ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්මේ තීරණාත්මක දර්ශකයන්ය. මැතිවරණයක සුපිළිපන් බවට දේශපාලන පක්ෂ ලියාපදිංචියේ සිට මැතිවරණය පැවැත්වීමට අදාළ සියළු කරුණු, එනම් නාමයෝජනා භාරගැනීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු මෙන්ම මැතිවරණයකින් පසුව මැතිවරණ පෙත්සම් ගොනුකිරීම මෙන්ම මැතිවරණයකින් තේරී පත්වූ මහජන නියෝජිතයන් ඉවත් කිරීම සහ පුරප්පාඩු ඇති වන විට පුරප්පාඩු සම්පූර්ණ කිරීම දක්වා පුළුල් පරාසයක විහිදී යයි.

මැතිවරණයකට අදාළ එවැනි සිදුවීම් සම්බන්ධව පවතින නීතිමය තත්ත්වයන්ට පටහැනිව යම් පාර්ශවයක් කටයුතු කරන අවස්ථාවකදී එම තීරණ මගින් අතෘප්තිමත් වන පාර්ශවයන් අධිකරණයේ පිහිට පැතීම සුලබ කරුණකි. එවැනි නඩු කටයුතු වලදී අධිකරණයන් ලබාදෙන තීරණ නීතියේ අපැහැදිලි තත්ත්වයන් පැහැදිලි කරන අතර ඇතැම් අවස්ථාවලදී පුරවැසි අයිතිවාසිකම් පුළුල් ලෙස අර්ථ නිරූපණය කිරීමක්ද සිදුවේ. එමෙන්ම එම තීරණය මැතිවරණයක් සම්බන්ධ තීරණාත්මක මග පෙන්වීම් ලෙසද සැලකිය හැකිය.

එබැවින් මැතිවරණය හා සැබැඳි අධිකරණ තීරණ, මැතිවරණ හා සම්බන්ධව කටයුතු කරන දේශපාලන පක්ෂවලට, මැතිවරණ මෙහෙයවන නිලධාරීන්ට, මැතිවරණ නිරීක්ෂකයන්ට මෙන්ම සිවිල් ක්‍රියාකාරින්ටද වැදගත් වේ.

1931 වසරේදී ලාංකියන්ට සර්වජන ඡන්ද බලය ලැබුණ අතර පැවැත්වූ පළමු මැතිවරණයේ සිටම බොහෝ මැතිවරණ ආශ්‍රිතව අධිකරණමය ක්‍රියාකාරකම් සිදුවිය. ඇතැම් නඩු තීන්දු නව නීති වාර්තා සහ ශ්‍රී ලංකා නීති වාර්තා වලට ඇතුළත් වී ඇති නමුත් ඇතැම් නඩු තීන්දු එම වාර්තාවලට ඇතුළත් වී නැත. කෙසේ නමුත් මැතිවරණ වලට අදාළ නීතිරීති ද වරින්වර සංශෝධනය වන අතර අධිකරණයේ මතය කාලීනව  වෙනස් වේ.

වාර්තාගත වූ නඩු තීන්දු වුවද ඒ පිළිබඳව හැදෑරීම් කරන්නකුට පහසුවෙන් පරිශීලනය කළ හැකි ලෙස ගොනුගත කිරීමක් මෑත කාලයේදී සිදුවී නැත.

දිවයිනේ ප්‍රමුඛතම මැතිවරණ නිරීක්ෂණ ආයතනය මෙන්ම නිදහස් සහ සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් කැපවූ ජාතික සංවිධානයක් ලෙස මෙම අවශ්‍යතාව දුටු පැෆ්රල් සංවිධානය එවැනි ග්‍රන්ථයක් සම්පාදනය කිරීමට ගත් තීරණය  මත මෙම ග්‍රන්ථය ඔබ අතට පත්වේ.

මෙම ග්‍රන්ථය පරිච්ඡේද 19 කින් සමන්විත වන අතර ඉදිරි පර්ච්ඡේද තුළ විස්තර වන නඩු තීන්දු ලේඛනය පළමු පරිච්ඡේදය තුළ ඇතුළත් වේ. දෙවන පරිච්ඡේදයෙන් විස්තර වන්නේ ශ්‍රී ලංකාවේ මැතිවරණ සම්බන්ධයෙන් අදාළ වන නීතිරීති සහ අධිකරණමය කටයුතු පිළිබඳ විස්තරයකි. තුන්වන පරිච්ඡේදයේ සිට 18 වන පරිච්ඡේදය දක්වා මැතිවරණයට අදාළ එක් එක් ක්ෂෙත්‍ර යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනා අධිකරණය විසින් ලබාදුන් එකී ක්ෂේත්‍රයන් සම්බන්ධ නීතිමය තත්වයන් පැහැදිලි කරන  නඩු තීන්දු විස්තර කර ඇත. එහිදී නඩු තීන්දු විස්තර කිරීමට පෙර අදාළ ක්ෂෙත්‍රය පිළිබඳව පවතින නීති තත්ත්වය පිළිබඳ කෙටි විස්තරයක් ඇතුළත් කර ඇත්තේ පාඨකයන්ට වැඩි අවබෝධයක් සහ පහසුවක් ඇති කිරීමේ අරමුණිනි්ය.

පැෆ්රල් සංවිධානය විසින් විවිධ අවස්ථාවන්හිදී නිදහස් සහ සාධාරණ මැතිවරණයක් වෙනුවෙන් සිදුකරන ලද අධිකරණමය මැදිහත් වීම් පිළිබදව 19 වන පරිච්ඡේදය තුළ විස්තර වේ. අවසානයේ මැතිවරණ ක්‍රියාවලියට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් ලබාදී ඇති නඩු තීන්දු ලේඛනයක් ඇතුළත් කර ඇත.

මෙම පරිච්ඡේද කිසිවක් මගින් නීතිමය කරුණු සහ ක්‍රියාවලිය හෝ අධිකරණ තීරණ පිළිබඳව විවේචනයන් සිදුකිරීම අපේක්ෂා නොකළ

අතර විෂය පිළිබඳව උනන්දුවක් දක්වන සහ අවශ්‍යතාවක් ඇති අය වෙනුවෙන් අදාළ නීති සහ නඩු තීන්දු එක්කල සම්පත් ග්‍රන්ථයක් ලෙස මෙම පොත සම්පාදනය කළෙමි.

ග්‍රන්ථය සම්පාදනය කිරිමේදී මූලික කාර්යය වූයේ මැතිවරණයට අදාළ නඩු තීන්දු හඳුනා ගැනීමයි. ඒ සඳහා උපකාරී වූ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති නීතිඥ නිමල් පුංචිහේවා සහ මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති මහින්ද දේශප්‍රිය යන මහත්වරුන්ටත් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික එම්.එම්.මොහොමඩ් මහතාටත් ස්තුති වන්ත විය යුතුය. එමෙන්ම වාර්තාවලට ඇතුළත් නොවූ නඩු තීන්දු සහ අතිරේක ලේඛන සපයා ගැනීමේදී උපකාර කළ මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස් ජෙනරාල් සමන් ශ්‍රී රත්නායක, අතිරේක මැතිවරණ කොමසාරිස් බී.පී.සී.කුලරත්න මහතා සහ ටානියා ලක්ෂාණි ද අල්විස් යන අයට විශේෂ ස්තුතිය පිරිනමමි. එසේම මෙම කාර්යායයේදී උපකාර කළ මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයට සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයටද ස්තුති වන්ත වෙමි.

මෙම පොත සම්පාදනය සඳහා ආරාධනා කළ පැෆ්රල් විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි සහ නිසි සම්බන්ධීකරණයන් සිදුකළ ඉසුරු කරවිට, සුජීව ගයනාත් සහ උපේක්ෂි ප්‍රනාන්දු යන පැෆ්රල් සාමාජික සාමාජිකාවන්ටද, මෙහි පිටු සැකැස්ම සිදුකල නිලූක පෙරේරාටද ස්තුතිය පිරිනමමි.

**නීතිඥ ජගත් ලියන ආරච්චි**
2022 අප්‍රේල්

# මැතිවරණ හා සැබැඳි අධිකරණ තීරණ

අන්තර්ගතය


| | | |
|---|---|---|
| 1. | නඩුතීන්දු පෙලගැස්ම | 17 |
| 2. | මැතිවරණ හා සැබැඳි නීතිමය පසුබිම | 21 |
| 3. | ඡන්දය ප්‍රකාශ කිරීම සහ මූලික අයිතිවාසිකම් | 34 |
| 4. | ඡන්ද දායකයා හඳුනාගැනීම | 53 |
| 5. | ඡන්ද මධ්‍යස්ථාන සාමකාමී ලෙස පවත්වාගෙන යාම | 63 |
| 6. | නාමයෝජනා ලබා නොදුන් පුද්ගලයන් මහජන නියෝජිතයන් ලෙස පත්වීම | 79 |
| 7. | මැතිවරණ ප්‍රචාරක වියදම් | 101 |
| 8. | නුසුදුසුකම මත අසුන අහිමිකිරීම | 109 |
| 9. | අසත්‍ය මැතිවරණ ප්‍රචාරය වැළැක්වීම | 151 |
| 10. | මැතිවරණ ප්‍රචාරයන් සහ ආගමික කටයුතු | 177 |
| 11. | ප්‍රචණ්ඩක්‍රියා මත මැතිවරණ නිශ්ප්‍රභා කිරීම | 187 |
| 12. | ඡන්දදායකයන්ට අල්ලස්දීම වැළැක්වීම | 199 |
| 13. | නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම | 217 |

| | | |
|---|---|---|
| 14. | ඡන්ද පෙත්සම් | 233 |
| 15. | මැතිවරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ සාපරාධී වගකීම් | 251 |
| 16. | දේශපාලන පක්ෂයෙන් නෙරපීමේදී මන්ත්‍රීධූරය අහිමිවීම | 259 |
| 17. | දේශපාලන පක්ෂ ලියාපදිංචිය | 273 |
| 18. | මහජන නියෝජිත ආයතන විසුරුවාහැරීම | 295 |
| 19. | පැෆ්රල් සංවිධානයේ අධිකරණමය මැදිහත්වීම් | 315 |
| 20. | ආශ්‍රිත මූලාශ්‍ර | 333 |

**ඇමුණුම**

**මැතිවරණයට අදාළ ප්‍රමුඛ නඩුතීන්දු**

## පළමු පරිච්ඡේදය

# නඩු තීන්දු පෙලගැස්ම

ඉදිරි පරිච්ඡේද මගින් විස්තර වන නඩු තීන්දු ලේඛනය මෙම පරිච්ඡේදය තුළ දක්වා ඇත. නඩු තීන්දුව සම්බන්ධ විස්තරය දැක්වෙන පිටුවේ අංකය නඩු තීන්දුව ඉදිරියේ දක්වා ඇත.


1. A.S.N.Perera v. Dayananda Dissanayake 280
2. Abewardhana Vs Ariya Bulegoda 194
3. Abeywickrema v. Pathirana (1984) 1 Sri L.R. 215 126
4. Abeywickrema v. Pathirana-(1986)-1-Sri.L.R-120 125
5. Anusha Pelpita v. Attorney General 255
6. Centre for Policy Alternatives (Guarantee) Ltd. and Another vs. Dayananda Dissanayake and 3 others 90
7. Centre for Policy Alternatives( Guarantee)Ltd & Another v. Kabeer Hashim & Others 96
8. Chelvanayakam v.Natesan- 116
9. D.M.Tharanga Harshanka Prasad v. W.M.Sunil Shantha 215
10. Dahanayake Vs. De Silva 121
11. Deepthi Kumara Gunarathne & Others v. Dayananda Dissanayake & Others 286
12. Denial Appuhamy Vs. T.B.Illangaratne 155
13. Devananda v. Dayananda Dissanayake 86
14. Dilan Perera v. Rajitha Senarathne 131
15. Disanayake v. Abeysinghe 182
16. Don Alexander v. Leo Fernando 236
17. Don Philp v. T.B.Ilangaratne 104/153
18. Dr.Arjuna Parakarama v. Dayananda Disanayake & 10 others 70
19. Ediriweera, Returning Officer Vs Kapukotuwa, General Secretary, United National Party 223

20. Ellawala v.Wiejesundara 119

21. Gamini Dissanayake v. M. C. M. Kaleel and Others 261

22. Gardihewa Sarath C. Fonseka v. Dammika Kithulegoda 135

23. Geetha Samanmali Kumarasinghe v. N.W.E.Buwaneka Lalitha 138

24. Gooneratne & Others v. Chandranande De Silva, Commissioner of Elections 277

25. Hafi v Dayananda Dissanayake, Commissioner of Elections & others 245

26. Halkandaliya Lekamalage Premalal Jayasekera v. Thushara Upuldeniya Commissioner General of Prisons and Others 142

27. Hapuarachchi and Others v. Commissioner of Election and another 284

28. Hemadasa v. Sirisena 179

29. In re Abu Bakr 106

30. In re C.W.F.V.Jayawardane 107

31. In re de Zoysa. 103

32. Indra Kumar v. Dayananda Dissanayake & Others 218

33. Jayakody v. Karunanayake, Officer-in-Charge, Police Station, Polgahawela and Attorney-General 253

34. Jayantha Liyanage v. Election Commission 290

35. Jayasena v. T.B.Ilangaratne 166

36. Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (case-1) 34

37. Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (Enforcement Judgment) (Case No 2) 41

38. Kelepotha Vithanage Ariyaratne and Another v. S.T.Kodikara, Returning officer, District Secrataiat Galle and others 227

39. Kularatne v. Chandrananda De Silva 172
40. Kularatne v. Chandrananda De Silva and another 173
41. Kularatne v. Rajapaksha 170
42. Kumaranatunge v. Jayakody 237
43. Lateef v. Saravanamuttu ( 1932) 114
44. Mahindasoma V. Senanayakeand Another 300
45. Mahindasoma V. Hon. Maithripala Senanayake 299
46. Maithripala Senanayake, Governor of the North-Central Province and Another v. Gamage Don Mahindasomaand Others 296/30
47. Masahir v. Returning Officer Kegalle District and Others 93
48. Mediwake and Others v. Dayananda Dissanayake, Commissioner of Elections and Others 66
49. Mohamed Hussain Hajiar Muhammad and 17 others v. Election Commission of Sri Lanka and Others 48
50. Muththettugama v. Pilapitiya 168
51. Nagananda Kodituwakku v. Election Commission and 10 others 147
52. Omalpe Sobhita Thero v Dayananda Dissanayake and another 303
53. PAFFREL & Warnakulasooriya Patabedige Wilson V. Dayananda Dissanayake & Others (SC FR 706/2009) 319
54. PAFFREL & Others v. Dayananda Dissanayake & 2 Others 55/316
55. PAFFREL & Rohana Hettiarachcchi v. Attorney General 325
56. PAFFREL & Rohana Hettiarachchi v. Dayananda Dissanayake & another 58/318
57. PAFFREL & Rohana Hettiarachchi v. Faiszer Musthapha & 10 Others 326

58. PAFFREL & Rohana Hettiarachchi v. Mahinda Deshapriya & 8 Others 208/323
59. Peiris v..Samaraweera 118
60. Pelendagama v. Commissioner of Elections and Others 243
61. Pelpola v. Gunawardene 188
62. Perumpulli Hewage Piyasena v. ITAK Office 270
63. Rajapakse v. Kularatne and others 128
64. Rajavarothiam Sampanthan v. Attorney General & Others 310
65. Rambukwella v United National Party and others 267
66. Ranjan Ramanayake v. Secretary General of Parliament 144
67. Rasiah Thurairatnam vs. Mahinda Deshapriya and 7 Others 307
68. Samaranayake V. Kariiyawasam 161
69. Sarath Amunugama and Others V. Karu Jayasurtya, Chairman, United National Party and Others 264
70. Sarath Fonseka v. Mahinda Rajapakse and others 247
71. Sunil Shantha V Tharanga Harshaka Priya Prasad Dissanayake & Others 212/330
72. Thavaneethan v Dayananda Dissanayake Commissioner of Elections and Others 43
73. Vigneswaran and Stephen v. Dayananda Dissanayake and Others 221
74. Wadugedara Wijeratne & 5 Others v. Faizer Mustapha- Minister of Provincial Councils & Local Government and 2 others 328
75. Wasantha Jayalath & Others V. Dr, Nihal Jayathilake & Others 204/321
76 Weerasinghe v. Chandrananda silva, Commission of Eection and other 240
77. Weragoda vs Dayananda Dissanayake and others 225
78. Wijewardena v. Senenanayake 191
79. Willian Silva v. Wickramasuriya 164
80. Wimalasara Banda V. Yalegama 157

## දෙවන පරිච්ඡේදය

# ශ්‍රී ලංකාවේ මැතිවරණ සඳහා අදාළ නීතිමය පසුබිම

මැතිවරණයන් සඳහා බලපාන නීතිමය පසුබිම විස්තර කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීතියේ විකාශනය පිළිබඳවත්, විවිධ මැතිවරණ සහ ඡන්ද විමසීම් සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන පිළිබඳවත්, මැතිවරණය සහ ඡන්ද විමසීම් සම්බන්ධව පැවරෙන නඩු කටයුතුවල ස්වභාවයන් පිළිබඳවත් මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබයි.

## 2.1. ශ්‍රී ලංකාවේ මැතිවරණ නීතියේ විකාශනය සංක්ෂිප්තව

ලංකාව (Ceylon) නමින් 1972 ට පෙර හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකාවේ පළමු ඡන්ද විමසීම වාර්තා වන්නේ 1866 වසරේදීය. ඒ කොළඹ සහ මහනුවර නගර සභා සඳහා සභිකයන් තෝරා පත්කරගැනීම සඳහා පැවති ඡන්ද විමසීමය. ඉන්පසුව 1867 වසරේදී ගාල්ල නගර සභාව සඳහා සභිකයන් තෝරාපත්කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන ලදී (විතානවසම්. 2016,73). 1865 අංක 17 දරණ පනත යටතේ කොළඹ සහ මහනුවර මහ නගර සභා ස්ථාපනය කර තිබිණි.(පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් වාර්තාව, 2000.11).

ව්‍යවස්ථාදායකය සඳහා පළමුවරට මැතිවරණයක් පවත්වන ලද්දේ මැකලම් කොමිෂන් සභා නිර්දේශ යටතේ සකස් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය අනුව 1911 නොවැම්බර් 16, දෙසැම්බර් 12 සහ 13 දින වලදීය (අලවත්තගේ, 2014, 14). මෙම මැතිවරණයේ දී ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලැබුනේ සීමිත පිරිමින් සංඛ්‍යාවකට

පමණි. මැතිවරණය සඳහා අදාළ නීතිමය ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම ඇතුළත් විය.

ලාංකික මැතිවරණ ඉතිහාසයේ සංදිස්ථානයක් වන්නේ ඩොනමෝර් කොමිෂන් සභාව වාර්තාව මත සම්මත කළ ඩොනමෝර් ව්‍යවස්ථාව ලෙස හඳුන්වන 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා) රාජ්‍ය සභා ආඥාව (Ceylon (State Council) Order in Council, 1931) මගිනි. එමගින් සිදුකරන ලද විප්ලවීය ප්‍රතිපාදනය වූයේ සර්ව ජන ඡන්දබලය ලබාදීමයි. එසේම 50 දෙනෙකුගෙන් යුතු මන්ත්‍රීවරුන් පිරිසක් ව්‍යවස්ථාදායක සභාව සඳහා ඡන්දයෙන් තෝරාපත්කර ගැනීම සඳහා ප්‍රතිපාදනය සලසා තිබිණි. එසේම මන්ත්‍රීවරයකුගේ සුදුසුකම් සහ නුසුදුසුකම් පිළිබඳවද ප්‍රතිපාදන මෙම ව්‍යවස්ථාව තුළ ඇතළත් විය. (8 සහ 9 ව්‍යවස්ථා). එසේම මැතිවරණය පැවැත්වීම සඳහා වන පටිපාටිය නීතිය 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව (The Ceylon (State Council Elections) Order in Council, 1931) තුළ ඇතුළත් විය. මෙරට මැතිවරණයක් සඳහාම වෙන්වූ පළමු නීතිය ලෙස 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව හැඳින්විය හැකිය.

පසුව මැතිවරණ නීතියට එක් වූ ඉතාමත් වැදගත් නීතිමය ප්‍රතිපාදනය වන්නනේ සෝල්බරි ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලබන 1946 ලංකා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා) රාජ්‍ය සභා ආඥාවයි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සංඛ්‍යාව මන්ත්‍රීවරයකුගේ සුසුදුකම් නුසුදුසුකම් පිළිබඳව එම ව්‍යවස්ථාව මගින් දක්වා තිබිණි.

1931 වසරේදී සර්වජන ඡන්ද බලය ලැබීමත් සමග ඡන්ද දායකයන් ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාව මතු විය ඒ සඳහා වෙනම නීතියක් ලෙස 1946 ලංකා (ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ)(විශේෂ විදිවිධාන) රාජ්‍ය සභා ආඥාව (The Ceylon ( Electoral Registers) (Special Provisions) Order in Council, 1946) පනවන ලදී.

මැතිවරණ නීති ඉතිහාසයේ වඩාත් වැදගත් සංදිස්ථානයක් සළකනු කළ ඊලඟ නීතිමය ප්‍රතිපාදනය වන්නේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවයි. මෙතෙත් පැවති 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව ඒ හා බැඳුණු සංශෝධන සහ 1946 ලංකා (ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ)(විශේෂ විධිවිධාන) රාජ්‍ය සභා ආඥාව (The Ceylon (Electoral Registers) (Special Provisions) Order in Council,

1946) පරිච්ඡින්න කරමින් සම්මත කළ මෙම නීතිය මගින් පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීම සඳහා මැතිවරණ කොමසාරිස් ධුරයක් ඇති කරන ලදී. ඒ අනුව මැතිවරණ පැවැත්වීමට නිශ්චිත නිලධාරින්ට වගකීම් පැවරීමක් මෙම පනත මගින් සිදුවිය. එසේම මන්ත්‍රීවරයකුගේ සුදුසුකම්. ඡන්දය පැවැත්වෙන ආකාරය, නාමයෝජනා ඉදිරිපත් කිරීම, දේශපාලන පක්ෂ, ඡන්ද පෙත්සම් ආදී කරුණු පිළිබඳව සවිස්තර නීතිමය ප්‍රතිපාදන මෙම පනත තුළ අන්තර්ගත විය. 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත මගින් මෙම පනතේ ඇතැම් කොටස් සංශෝධනය වුවද, මෙම පනතේ ඇතැම් ප්‍රතිපාදන අද දක්වාම බලාත්මක බව ඩිලාන් පෙරේරා එදිරිව රාජිත සේනාරත්න (Dilan Perera v. Rajitha Senarathne (2000) 2 Sri LR.79) නඩුවේදී අභියාචනාධිකරණ විනිසුරු හෙක්ටර් යාපා විනිසුරුවරයා ප්‍රකාශ කරන ලදී. එසේම පළාත් පාලන මැතිවරණ පැවැත්වීම සඳහා 1946 අංක 53 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත සම්මත කිරීමත් සමග පළාත් පාලන ඡන්ද විමසීම් පැවැත්වීමේ බලතලද මැතිවරණ කොමසාරිස්වරයාට පවරන ලදී. මෙම ආඥා පනත අද දක්වාම විවිධ සංශෝධනයන්ට ලක්වෙමින් ක්‍රියාත්මක වේ.

ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයෙකු යටතේ පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුවක්ද, පළාත් පාලන මැතිවරණ පැවැත්වීම සඳහා කොමසාරිස්වරයකු යටතේ පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුවක්ද ක්‍රියාත්මක වූ අතර 1955 ඔක්තෝබර් මස 01 වන දින මෙම දෙකම දෙපාර්තමේන්තු දෙකම එක් කරමින් මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. (හේරත්, 2016,190) 1972 වසරේදී නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මතවූ අතර එමගින් ආණ්ඩුකාරවරයා විසින් පත්කරන මන්ත්‍රීවරුන් ඉවත් වූ අතර සියළුම මන්ත්‍රීවරුන් මහජන ඡන්දයෙන් පත්වීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් විය.

නමුත් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මැතිවරණ ක්‍රමයේ විශාල වෙනසක් සිදුකළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය. විශේෂයෙන්ම කොට්ඨාශ මැතිවරණ ක්‍රමය වෙනුවට සමානුපාතික නියෝජනය ක්‍රමයත් පසුව එකී ක්‍රමය මනාප ක්‍රමය දක්වා සංශෝධනය කිරීම මෙම ව්‍යවස්ථාව මගින් සිදුවිය. එසේම ජනමත විචාරණය නමින් නව මැතිවරණයක් හඳුන්වා දීමත් විධායක ජනාධිපතිධූරයක් හඳුන්වාදීම මගින් ජනාධිපති මැතිවරණ හඳුන්වා දීමත් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සිදුවිය. පසුව මෙම ව්‍යවස්ථාවට 1987 වසරේදී

සිදුකරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පළාත් සභා හඳුන්වාදීමත් සමගම පළාත් සභා ඡන්ද විමසීම්ද ශ්‍රී ලාංකික මැතිවරණ පද්ධතියට එක් විය. එසේම මැතිවරණ පැවැත්වීම සඳහා අදාළ නීති පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යුතු බවද ව්‍යවස්ථාවේ සඳහන් විය.

1980 වසරේදී හඳුන්වාදුන් සංවර්ධන සභා පැවැත්වීම සඳහා දිස්ත්‍රික් සංවර්ධන සභා ඡන්ද විමසීම් පනතද ශ්‍රී ලංකාවේ එක් වරක් පමණක් ක්‍රියාත්මක වූ මැතිවරණයක් සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසූ අතර පළාත් සභා හඳුන්වාදීමත් සමග දිස්ත්‍රික් සංවර්ධන සභා අහෝසි විය.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් සමානුපාතික නියෝජන ක්‍රමයට අනුරූපී ලෙස පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීම සඳහා 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත හඳුන්වාදෙන ලදී. එසේම නව ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් ජනාධිපතිවරණය සහ ජනමත විචාරණය පැවැත්වීම සඳහා පිළිවෙලින් 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනත සහ 1981 අංක 7 දරණ ජනමත විචාරණ පනත හඳුන්වාදෙන ලදී. එසේම පළාත් පාලන ආයනත ඡන්ද විමසීම් ආඥා පනතද සමානුපාතික නියෝජන ක්‍රමයට අනුකූල ලෙස සංශෝධනය කරන ලදී. එමෙන්ම 1987 වසරේදී 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් හඳුන්වාදුන් පළාත් සභා මැතිවරණ පැවැත්වීම සඳහා 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත හඳුන්වා දෙන ලදී.

2001 වසරේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාව හඳුන්වා දීම මැතිවරණ නීතියේ සිදුවූ සුවිශේෂී පියවරකි. ඒ අනුව මැතිවරණ පැවැත්වීම සඳහා ස්වාධීන ආයතනයක් ස්ථාපනය කරන ලදී.

2001 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට ඇතුළත් වුවද මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳ අදහස මුලින්ම සඳහන් වූයේ ව්‍යවස්ථා කටයුතු අමාත්‍යංශය විසින් 1997 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනාවලිය තුළය (ලියන ආරච්චි, 2021.49) 2001 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මැතිවරණ කොමිෂන් සභාව සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද්දේ 2015 නොවැම්බර් මාසයේදීය.

ඒ වන විට මැතිවරණ කොමිෂන් සභාවක් නොමැතිව කොමිෂන් සභාවේ රාජකාරි ආවරණය කළ මැතිවරණ කොමසාරිස් විසින් 2001 වසරේ සිට 2015 වසර දක්වා වසර 14 ක කාලය තුළ ජනාධිපතිවරණ 3ක්, පාර්ලිමේන්තු මැතිවරණ 4ක්, පළාත් සභා ඡන්ද විමසීම් 18ක් සහ පළාත් පාලන ඡන්ද විමසීම් 5ක් පවත්වා ඇත. (දිසානායක සහ ලියන ආරච්චි, 2019,51) ඡන්දය භාවිතා කිරීම සඳහා ඡායාරූපයක් සහිත හැඳුනුම්පතක් භාවිතා කිරීම අනිවාර්යය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන 2004 අංක 14 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගින් සම්පාදනය කළද එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූයේ පැෆ්රල් එදිරිව මැතිවරණ කොමසාරිස් (PAFFREL v. Dissanayake-C.A.No 176/2006 - C.A.M.16.03.2006) දරණ අභියාචනාධිකරණ නඩුවේ සමතය මතය.

මැතිවරණ නීතියට සිදුකරන ලද තවත් වැදගත් සංශෝධනයක් වූයේ සියයට 30ක තරුණ නියෝජනය නාමයෝජනා සඳහා අනිවාර්ය කිරීම සඳහා වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීමයි. එකී සංශෝධනයන් 1990 අංක 25 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සිදුවිය. එම ප්‍රතිපාදනය පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතට එක්කරන ලද 2012 අංක 22 දරණ පළාත් පාලන ආයතන ඡන්දවිමසීම් (සංශෝධන) පනත මගින් ඉවත් කරන ලදී.

1978 වසරේ සිට සමානුපාතික නියෝජන ක්‍රමයට පැවති පළාත් පාලන මැතිවරවරණ වෙනුවට සමානුපාතික සහ කොට්ඨාස ක්‍රමය එක්වූ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් 2012 අංක 22 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සිදුවිය. පළාත් පාලන මැතිවරණ සඳහා හඳුන්වාදුන් මෙම ක්‍රමය 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් පළාත් සභා සඳහාද හඳුන්වාදීම සිදුවිය.

ඉන් පසුව මැතිවරණ නීතියට එක්වූ සුවිශේෂි සංශෝධනයක් වූයේ පළාත් පාලන ආයතන සඳහා සියයට 25ක කාන්තා නියෝජනය අනිවාර්ය කිරීමයි, ඒ සඳහා නීතිමය ප්‍රතිපාදන සලසන ලද්දේ 2017 අංක 16 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගිනි. පළාත් පාලන මැතිවරණ සඳහා සිදුකළ මෙම වෙනස්කම් 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත පළාත් සභා සඳහාද හඳුන්වාදීම සිදුවිය.

වයස අවුරුදු 18 සම්පූර්ණ වුවද ඡන්ද නාම ලේඛනයේ නම ඇතුළත්ව නොමැති නම් ඡන්ද භාවිතා කළ නොහැකි බැවින් ද ඡන්ද නාමලේඛන සකස් වන්නේ වසරකට එක් වරක් පමණක් බැවින්ද වයස අවුරුදු 18 සම්පූර්ණ වුවද ඇතැම් අවස්ථාවලදී තරුණයන්ගේ ඡන්ද අයිතිය අහිමිවීම් දක්නට ලැබිණි. මෙම තත්ත්වය මගහැරීම සඳහා නීතිමය ප්‍රතිපාදන 2021 අංක 22 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මගින් සිදුකරන ලදී. වයස 18 සම්පූර්ණ කරන පුරවැසියන්ට සිය නම ඡන්ද නාමලේඛනයේ පරිපූරක ලැයිස්තුවට ඇතුළත් කිරීමට සෑම වසරකම පෙබරවාරි 1 සිට මැයි 31 දක්වාද, ජූනි 1 සිට සැප්තැම්බර් 31 දින දක්වාද, සහ ඔක්තෝබර් 1 වන දින සිට එළඹෙන වසරේ ජනවාරි 31 දක්වා යන කාලසීමාවලදී ඇතුළත් කරගැනීමට අවස්ථා මේ අනුව ලැබේ.

## 2.2. මැතිවරණයට අදාල මූලික නීති

මැතිවරණයක් හා සම්බන්ධ නීති කිහිපයක් භාවිතයේ පවතී. එනම්

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඉ) ව්‍යවස්ථාවේ දක්වන්නේ

"අටළොස් විය සම්පූර්ණ කර ඇත්තා වූ ද, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ඡන්දහිමියකු වීමට සුදුසුකම් ලැබ තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කරනු ලැබ සිටින්නා වූ ද, සෑම පුරවැසියකු විසින් ම ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ දී ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයේ දී ද, සෑම ජනමත විචාරණයක දී ද ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකි විය යුතු වන්නේ ය" යනුවෙනි. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIII වන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ ජනමත විචාරණය පිළිබඳව නීතිමය ප්‍රතිපාදන වෙනුවෙනි.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIV වන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ ඡන්ද බලය, ඡන්ද විමසීම් හා මැතිවරණ පිළිබඳව නීතිමය ප්‍රතිපාදන වෙනුවෙනි. එකී පරිච්ඡේදය තුළ ඡන්ද හිමියකුගේ අයිතිවාසිකම්, ඡන්ද බලය අහිමිවීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් පාර්ලිමේන්තු

මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට නුසුදුසුකම්, ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගැනීමට නුසුදුසුකම් ඡන්දය දීම නිදහස්ව, සමානව සහ රහසේ විය යුතු බව, ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම, සීමා නිර්ණය කොමිෂන් සභාව, මැතිවරණ කොට්ඨාස, සමානුපාතික නියෝජනය මහ මැතිවරණයක දී ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම, නුසුදුස්සකුව සිටිය දී පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ ඡන්දය දුනහොත් දණ්ඩනය, පිළිබඳව ප්‍රතිපාදනද එම පරිච්ඡේදයේ දැක්වේ.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101 ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ පාර්ලිමේන්තු මැතිවරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් විධිවිධාන සැලසිය යුතු බවයි. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(5) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ ජනාධිපති මැතිවරණය මැතිවරණ කොමිෂන් සභාව විසින් පැවැත්විය යුතු බවත් ඒ සඳහාවන නීති පාර්ලිමේන්තුව විසින් සම්මත කළ යුතු බවත්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 87 වන ව්‍යවස්ථාව දක්වන්නේ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකළ යුතු බවත් ජනමත විචාරණ පැවැත්වීමට අදාළ නීති පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කළ යුතු බවත්ය. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ච ව්‍යවස්ථාව දක්වන්නේ පළාත් සභා සඳහා මන්ත්‍රීවරුන් පත් කිරීමේ මැතිවරණ පැවැත්වීම සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කළ යුතු බවයි.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIVඅ වන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ මැතිවරණ කොමිෂන් සභාව පිළිබඳව වූ ප්‍රතිපාදන වෙනුවෙනි. කොමිෂන් සභාවේ සංයුතිය, බලතල සහ කාර්යයභාරය පිළිබඳව මෙම පරිච්ඡේදයේ විස්තර කර ඇත.

## 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101 ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට ලැබී ඇති බලතල අනුව පාර්ලිමේන්තු මැතිවරණ පැවැත්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන මෙම පනත මගින් සලසා ඇත. එසේම මෙම පනත මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ සභා ආඥාවේ I, IV, V ,VI කොටස් අහෝසි කරන ලදී. මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීම, නාමයෝජනා භාරගැනීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු මැතිවරණ හා බැඳුනු දූෂණ ක්‍රියා වැරදි සහ නීති විරෝධි ක්‍රියාවන් පිළිබඳව ප්‍රතිපාදන, මැතිවරණ පැවැත්වීම, තැපැල් ඡන්දය,

ඡන්ද ගණන් කිරීම, ප්‍රතිඵල නිකුත් කිරීම, සහ ඡන්ද පෙත්සම් පිළිබඳව ප්‍රතිපාදන වැනි පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පනත තුළ අන්තර්ගතවේ.

## 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VII වන පරිච්ඡේදයේ දැක්වෙන "ජනරජයේ විධායකය - ජනාධිපතිවරයා" තෝරා පත්කර ගැනීමේ මැතිවරණයට අදාළ නීතිමය ප්‍රතිපාදන මෙම පනත තුළ ඇතුළත්ව ඇත. මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීම, නාමයෝජනා භාරගැනීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු මැතිවරණ හා බැඳුන දූෂණ ක්‍රියා වැරදි සහ නීති විරෝධි ක්‍රියාවන් පිළිබඳව ප්‍රතිපාදන, මැතිවරණ පැවැත්වීම, තැපැල් ඡන්දය, ඡන්ද ගණන් කිරීම, ප්‍රතිඵල නිකුත් කිරීම, සහ ඡන්ද පෙත්සම් පිළිබඳව ප්‍රතිපාදන වැනි ජනාධිපතිවරයණයක් පැවැත්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පනත තුළ අන්තර්ගත වේ.

## 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ වන පරිච්ඡේදයේ සහ 1987 අංක 42 දරණ පනත මගින් ස්ථාපනය කරන ලද පළාත් සභා සඳහා මන්ත්‍රීවරුන් තෝරාගැනීම සඳහා පවත්වන ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන මෙම පනත මගින් සලස්වා ඇත. මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීම, නාමයෝජනා භාරගැනීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු මැතිවරණ හා බැඳුන දූෂණ ක්‍රියා වැරදි සහ නීති විරෝධි ක්‍රියාවන් පිළිබඳව ප්‍රතිපාදන, මැතිවරණ පැවැත්වීම, තැපැල් ඡන්දය, ඡන්ද ගණන් කිරීම, ප්‍රතිඵල නිකුත් කිරීම, සහ ඡන්ද පෙත්සම් පිළිබඳව ප්‍රතිපාදන වැනි පළාත් සභා සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පනත තුළ අන්තර්ගතවේ. මෙම පනත යටතේ ආරම්භයේදී සමානුපාතික නියෝජන ක්‍රමයට මැතිවරණ පැවැත්වීමට ප්‍රතිපාදන සලසා තිබූ නමුත් 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් පළාත් සභා ඡන්ද විමසීම් මිශ්‍ර ක්‍රමයකට පැවැත්වීම සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)

1987 අංක 15 දරණ ප්‍රාද්ශීය සභා පනත මගින් ස්ථාපිත ප්‍රාදේශීය සභා, (255 අධිකාරය වූ) නගර සභා ආඥා පනත මගින් ස්ථාපිත නගර සභා. (252 අධිකාරය වූ) මහ නගර සභා ආඥා පනත මගින්

ස්ථාපිත මහ නගර සභා සඳහා සභිකයන් තෝරාපත් කිරීම අදාළ නීතිමය ප්‍රතිපාදන සලස්වන්නේ  මෙම ආඥා පනත මගිනි.

1946 වසරේදී රාජ්‍ය සභා ආඥාවක් ලෙස සම්මත වූ පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පතත මේ වන විට මුල් ස්වරූපයට වඩා බොහෝ සෙයින් සංශෝධනය වී ඇත. මැතිවරණයක් ප්‍රකාශයට පත් කිරීම, නාමයෝජනා භාරගැනීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු මැතිවරණ හා බැඳුන දූෂණ ක්‍රියා වැරදි සහ නීති විරෝධී ක්‍රියාවන් පිළිබඳව ප්‍රතිපාදන, මැතිවරණ පැවැත්වීම, තැපැල් ඡන්දය, ඡන්ද ගණන් කිරීම, ප්‍රතිඵල නිකුත් කිරීම, සහ ඡන්ද පෙත්සම් පිළිබඳව ප්‍රතිපාදන වැනි පළාත් පාලන ආයතනයක ඡන්ද විමසීමක් පැවැත්වීමට අදාළ නීතිමය ප්‍රතිපාදන පනත තුළ අන්තර්ගතවේ.

## 1981 අංක 7  දරණ ජනමත විචාරණ පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIII පරිච්ඡේදය තුළ විස්තර වන ජනමත විචාරණ පැවැත්වීමට අදාළ නිතිමය ප්‍රතිපාදන සලසන්නේ මෙම පනත මගිනි. ජනාධිපති විසින් ජනමත විචාරණයක් ප්‍රකාශයට පත් කිරීම, ජනමත විචාරණය පැවැත්වීම, ඡන්දය ගණන් කිරීම, මැතිවරණ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීම, මැතිවරණ වැරදි, දූෂණ ක්‍රියා සහ නීතිවිරෝධි ක්‍රියා වැනි ජනමත විචාරණය පැවැත්වීම අදාළ නීතිමය ප්‍රතිපාදන මෙම පනත තුළ අන්තර්ගත වේ,

## 1980 අංක 44 දරණ ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මැතිවරණ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා ඡන්දය භාවිතා කළ හැකිවන්නේ අදාළ ඡන්ද නාමලේඛනයේ සිය නම ලියාපදිංචි කළ පුරවැසියන්ට පමණි. එබැවින් මෙම පනත මැතිවරණයක් සම්බන්ධයෙන් තීරණාත්මක කාර්යයක් ඉටුකරන නීතිමය ප්‍රතිපාදනයකි. ඡන්දදායකයන්ගේ සුදුසුකම්, ඡන්ද ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය, ඡන්ද නාමලේඛනය සකස් කිරීම, විරෝධතා ඉදිරිපත් කිරීම, ඡන්ද නාමලේඛනය සහතික කිරීම ඇතුලු ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමට අදාළ ප්‍රතිපාදන මෙම පනත තුළ ඇතුළත් වේ. එසේම 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ සභා ආඥාවේ II සහ III කොටස් මෙම පනත මගින් පරිච්ඡින්න කර ඇත.

## 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව

පාර්ලිමේන්තු මැතිවරණ සම්බන්ධ කරුණු සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන යොදන තුරු කලින් කළ සංශෝධිත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අදාළ වන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101(2) ව්‍යවස්ථාව සඳහන් වේ.

ඒ අනුව 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත මගින් මෙම පනතේ ඇතැම් කොටස් ඉවත් වී ඇත. එසේම 1984 අංක 36 දරණ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව (සංශෝධන) පනත මගින් ඇතැම් වගන්ති සංශෝධනය වී ඇත.

ඩිලාන් පෙරේරා එදිරිව රාජිත සේනාරත්න ( Dilan Perera v. Rajitha Senarathne (2000) 2 Sri LR.79) නඩුවේ තීන්දුව ලබාදෙමින් යාපා විනිසුරුවරයා ප්‍රකාශ කර සිටියේ මෙම පනත තවදුරටත් අප නීතියේ කොටසක් වන බවයි.

## දණ්ඩනීති සංග්‍රහය - 19 වන අධිකාරය

දණ්ඩ නීති සංග්‍රහයේ IX අ වෙනි පරිච්ඡේදය වෙන්වී ඇත්තේ "ඡන්ද විමසීම් සම්බන්ධ වැරදි" පිළිබඳ විස්තර කිරීම වෙනුවෙනි. ඒ අනුව ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් අල්ලස් දීම (169(ආ) වගන්තිය), ඡන්ද විමසීම් සම්බන්ධයෙන් අයථා බලය යෙදීම(169(ඇ) වගන්තිය), ඡන්ද විමසීම්වලදී අන්‍යයකුගේ නාමයෙන් පෙනී සිටීම(169(ඈ) වගන්තිය) සහ ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ සිදුකිරීම (169(උ) වගන්තිය) අපරාධ වැරදි ලෙස දණ්ඩ නීති සංග්‍රහය විසින් හඳුනාගෙන ඇත. එයට අමතරව යම්කිසි නීතියක් මගින් ඡන්ද විමසීමක් සම්බන්ධයෙන් දරණ ලද වියදම් ගණන් හිලව් තැබීමට නියමකර තිබෙන අවස්ථාවකදී එය පැහැර හැරීමද වරදක් බව දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා තිබේ. (169(ඌ) වගන්තිය)

## මැතිවරණයට අදාළ නඩුකටයුතු සිදුකරන අධිකරණ බලතල හා විකාශනය

මැතිවරණයක් හා සම්බන්ධව නීති කෘත්‍යයන් ආකාර කිහිපයකට අධිකරණ ඉදිරියට පැමිණේ. එනම්,

### අපරාධ නඩු

මැතිවරණ කාලපරිච්ඡේදයකදී මැතිවරණ දූෂණ, නීති විරෝධි ක්‍රියා සහ මැතිවරණ වැරදි යන අපරාධමය වැරදි සඳහා විත්තිකරුවන්ට එරෙහිව නඩු පැවරීම. මෙම නඩු පැවරීම් සිදුකරනු ලබන්නේ නීතිපතිවරයාගේ අනුමැතිය මත මහේස්ත්‍රාත් අධිකරණ තුළදීය.

එයට අමතරව මැතිවරණයකදී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන නියමයන්ට අනුගත නොවන රජයේ නිලධාරීයකු වරදක් සිදුකරනු ලබන පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරිය හැකිය.

එසේම මැතිවරණයක් ආශ්‍රිතව පොදු දේපළ අයතා ලෙස පරිහරණය සිදුකරනු ලබන පුද්ගලයන්ට එරෙහිව 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත යටතේ සහ දණ්ඩ නීති සංග්‍රහය යටතේ සාවද්‍ය පරිහරණය යන වැරදි සඳහා නඩු පැවරිය හැකිය. පොදු දේපළ විෂයෙහිලා සිදුකරනු ලබන අපරාධ පිළිබඳ පනත යටතේ පවරනු ලබන නඩු මහාධිකරණයකදී පවත්වනු ලැබේ.

### ජනාධිපතිවරණ පෙත්සම්

ජනාධිපතිවරණයකදී ජයග්‍රහණය කරනු ලබන අපේක්ෂයකයකුගේ පත්වීම අභියෝගයට ලක්කරමින් ජනාධිපතිවරණ පෙත්සම් ගොනු කිරීම පිළිබඳව ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ VI වන කොටස තුළ අන්තර්ගතව ඇත. ඒ අනුව ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලතල පවතින්නේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙතය.

### පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම්

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ VII වන කොටස වෙන්වී ඇත්තේ පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් පිළිබඳව නීතිමය ප්‍රතිපාදන වෙනුවෙනි. එසේම එකී පනතේ හතරවන උපලේඛනය මගින් පාර්ලිමේන්තු මැතිවරණරණ පෙත්සම් පිළිබඳ

රීති හඳුන්වාදී ඇත. පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය පවතින්නේ අභියාචනාධිකරණය වෙතයි.

## පළාත් සභා ඡන්ද විමසීම් පෙත්සම්

1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ VII වන කොටස වෙන්වී ඇත්තේ පළාත් සභා ඡන්ද විමසීම් සම්බන්ධ ඡන්ද පෙත්සම් පිළිබඳව නීතිමය ප්‍රතිපාදන වෙනුවෙනි. පනතේ 111 වන වගන්තිය දක්වන්නේ පළාත් සභා ඡන්දවිමසීම් පෙත්සම් පිළිබඳව කාර්ය පටිපාටිය සහ පරිචය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සාදනු ලබන රීති වලට අනුකූලව විය යුතු බවයි.

පළාත් සභා ඡන්ද පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය පවතින්නේ අභියාචනාධිකරණය වෙතයි.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පෙත්සම්

262 වන අධිකාරිය වන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ IVඅ කොටස වෙන්වී ඇත්තේ පළාත් පාලන ඡන්ද විමසීම් පෙත්සම් පිළිබඳව නීතිමය ප්‍රතිපාදන වෙනුවෙනි. පනතේ 82(2)(උ) වන වගන්තිය දක්වන්නේ පළාත් සභා ඡන්දවිමසීම් පෙත්සම් පිළිබඳව කාර්ය පටිපාටිය සහ පරිචය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සාදනු ලබන රීති වලට අනුකූලව විය යුතු බවයි.

පළාත් පාලන ඡන්ද පෙත්සම් විභාග කිරීමේ අධිකරණ බලය පවතින්නේ අදාළ පළාත් පාලන ආයතය අයත් වන ප්‍රදේශයේ පළාත්බද මහාධිකරණය වෙතයි (82ජ වගන්තිය).

## රිට් ආඥා

මැතිවරණයකින් තෝරාපත් කරගත් මහජන නියෝජිතයකුගේ පත්වීම අභියෝගයට ලක් කිරීම සඳහා රිට් ආඥා ලබාගැනීම ද මැතිවරණයකින් පසුව දක්නට ලැබේ. එසේම නාමයෝජනා භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලද අවස්ථාවකදී තේරීම්භාර නිලධාරියාගේ තීරණය බලරහිත කර අදාළ නාමයෝජනා භාරගන්නා ලෙස අධිකරණමය නියෝග ලබාගැනීම සඳහාද රිට් ආඥා ඉල්ලා නඩු පැවරීම දක්නට ලැබේ. මෙවැනි රිට් ආඥා සඳහා පෙත්සම් ගොනුකරනු ලබන්නේ අභියාචනාධිකරණය වෙතය.

## මූලික අයිතිවාසිකම් පෙත්සම්

මැතිවරණ නිලධාරීන්ගේ හෝ යම් අමාත්‍යවරයකුගේ ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මගින් තමන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවූ බවට චෝදනා නගමින් මූලික අයිතිවාසිකම් නඩු පැවරීම් දක්නට ලැබේ. මැතිවරණයන් ප්‍රමාද වීම් සම්බන්ධයෙන්ද, මැතිවරණයන් ආශ්‍රිතව සිදුවන ක්‍රියාවන් සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගේ නොකරහැරීම් සම්බන්ධයෙන්ද මූලික අයිතිවාසිකම් නඩු පැවරීම් දක්නට ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කිරීමේ බලය පවතින්නේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙතය.

### තුන්වන පරිච්ඡේදය

# ඡන්දය ප්‍රකාශ කිරීම මූලික අයිතියක් බවට පත්වීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මගින් පුරවැසියන් වෙත ප්‍රධානය කර ඇති මූලික අයිතිවාසිකම් සහ ඡන්ද අයිතිය අතර ඇති සබඳතාවය පිළිබඳව ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහ තීරණාත්මක නඩු තීන්දු කිහිපයක් මගින් ව්‍යවස්ථාපිත මූලික අයිතිවාසිකම් සහ ඡන්ද අයිතිය අතර සබඳතාව පැහැදිලි කිරීම මෙම පරිච්ඡේදයේ අරමුණයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පිළිබඳ සංක්ෂිප්ත සඳහන් කිරීමක් සහිතව මැතිවරණය ක්‍රියාවලිය සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් පාදක කරගෙන සිදුකරන ලද නඩු පැවරීම් සහ එම මූලික අයිතිවාසිකම් පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය දක්වන ලද තීරණාත්මක නියෝග මෙම පරිච්ඡේදයේ ඇතළත් වේ.

## 3.1. මූලික අයිතිවාසිකම්

පුරවැසියන්ට භුක්තිවිඳිය හැකි මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය තුළ විස්තර කර ඇත.

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය; වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද, ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේය" යනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(ඈ) ව්‍යවස්ථාව දක්වයි.

එසේම මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට ආසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් 126 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇති බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන ව්‍යවස්ථාව දක්වයි.

නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ සඳහන්වන මූලික අයිතිවාසිකම් පිළිබඳව සඳහන් වන 10 වන ව්‍යවස්ථාවේ සිට 14 වන ව්‍යවස්ථාව දක්වා පරීක්ෂා කර බලන විට එහි සඳහන් වන මූලික අයිතිවාසිකම් පහත පරිදි සංක්ෂිප්ත කළ හැකිය.

- සිතීමේ හා හෘද සාක්ෂියේ නිදහස
- වධ හිංසාවලින් නිදහස
- සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම
- අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම
- කථාකිරීමේ නිදහස හා අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස
- තොරතුරු දැනගැනීමේ අයිතිය
- සාමකාමී රැස්වීමේ නිදහස
- සමාගමයේ නිදහස
- වෘත්තීය සමිතියකට බැඳීමේ නිදහස
- ආගම ඇදහීමේ ප්‍රගුණ කිරීමේ හා ඉගැන්වීමේ නිදහස
- සංස්කෘතිය භුක්තිවිඳීමේ නිදහස
- නීත්‍යානුකූල වෘත්තියක නියැලීමේ නිදහස
- කැමති තැනක වාසය කිරීමේ නිදහස හා යාම් ඊම් නිදහස
- ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහස

මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුළ "ඡන්ද අයිතිය" මූලික අයිතියක් ලෙස ප්‍රකාශිතව සඳහන්ව නොමැති බව පැහැදිලි වේ. එබැවින් මෙම මූලික අයිතිවාසිකම් පිළිබඳව වූ ප්‍රකාශිත ප්‍රතිපාදන අනුව ඡන්ද අයිතියට බාධා කිරීම

හෝ ඡන්ද අයිතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් සිදුකරන පුද්ගලයෙකුට එරෙහිව මූලික අයිතිවාසිකම් හි සහනය අයැද සිටිය නොහැක. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම දරණ රාජ්‍යයේ ක්‍රියාවක් මගින් දේශපාලන අයිතිවාසිකම් වල සඳහන් වන ප්‍රධානම අයිතිවාසිකමක් වන ඡන්ද අයිතිය උල්ලංඝනය පිළිබඳව මූලික අයිතිවාසිකම් හි පිහිට පැතීමට පුරවැසියන්ට නොහැකි වන්නේ නම් එය ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව බරතල අර්බුදයකි. නමුත් අප ශ්‍රේෂ්ඨාධිකරණය මැතිවරණ සම්බන්ධයෙන් ගොනුකරන ලද මූලික අයිතිවාසිකම් පිළිබඳව වූ පෙත්සම් වලදී ඉතා පුළුල් අර්ථ නිරූපණ ලබාදෙමින් ඡන්ද අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ ප්‍රකාශිතව සඳහන්ව නැතත් "අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය" යටතේ සහ "නීතිය ඉදිරියේ සමාන ලෙස සැලකීම" යන මූලික අයිතිවාසිකම් මගින් පුරවැසියන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා වී තිබෙන බව ප්‍රකාශ කර තිබේ. එවැනි නඩු තීන්දු කිහිපයක් පිළිබඳව මෙම පරිච්ඡේදය තුළින් විස්තර කරනු ලැබේ.

## 3.2. ඡන්දය මගින් සිදුකරනු ලබන්නේ අදහස් ප්‍රකාශ කිරීමකි

**කරුණාතිලක සහ තවත් අය එදිරිව දයානන්ද දිසානායක මැතිවරණ කොමසාරිස් හා තවත් අය (පළමු නඩුව)**

**Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (case-1) (1999) 1 Sri LR. 157**

### පසුබිම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් ස්ථාපනය කර ඇති පළාත් සභාවන් පිළිබඳව පටිපාටිය කරුණු ඇතුළත් වන 1987 අංක 42 දරණ පළාත් සභා පනතට අනුව පළාත් සභාවක ධූරකාලය වසර 5කි. පළාත් සභා සඳහා මන්ත්‍රීවරුන් පත් කිරීම සිදුකරනු ලබන්නේ 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත අනුවය.

1998 ජූනි මාසය වන විට මධ්‍යම පළාත් සභාව, ඌව පළාත් සභාව, උතුරු මැද පළාත් සභාව, බස්නාහිර පළාත් සභාව සහ සබරගමුව පළාත් සභාව යන පළාත් සභාවන්හි නිල කාලය අවසන්ව තිබිණි. ඒ අනුව මැතිවරණ කොමසාරිස් විසින් පළාත් සභා ඡන්ද

විමසීම් පනතේ 10 වන වගන්තිය යටතේ එකී පළාත් සභා සඳහා නාමයෝජනා කැඳවා තිබිණි. නාම යෝජනා භාරදීමේ අවසන් දිනය වූයේ 1998 ජූලි 15 වනදාය. ඒ අනුව එම පළාත් සභාවල තැපැල් ඡන්ද විමසීම 1998 අගෝස්තු 4 වන දිනටද, ඡන්ද විමසීම් 1998 අගෝස්තු 28 වන දිනටද පළාත් සභා ඡන්ද විමසීම් පනතේ විධිවිධාන අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරන ලදී.

එසේ තිබියදී තැපැල් ඡන්ද දිනයට පෙර දින එනම් 1998 අගොස්තු 3 වන දින මැතිවරණ කොමසාරිස්වරයා සියලුම අදාළ තේරීම් භාර නිලධාරීන් වෙත විදුලි පණිවිඩ මගින් දැනුම් දුන්නේ තැපැල් ඡන්දය නොපවත්වන ලෙසයි. තැපැල් ඡන්දය නොපැවැත්වීමට හේතුවක්ද මැතිවරණ කොමසාරිස් විසින් දන්වා නොතිබිණි.

ඊට පසුදින එනම් 1998 අගොස්තු 4 වන දින ජනාධිපතිතුමිය මහජන ආරක්‍ෂක පනතේ විධිවිධාන අනුව යමින් හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරන ලද අතර මහජන ආරක්‍ෂක පනතේ 5 වන වගන්තිය යටතේ හදිසි අවස්ථා නියෝගයක් නිකුත් කරමින් ඡන්ද විමසීමේ දිනය අවලංගු කරන ලදී. මැතිවරණ කොමසාරිස්වරයාද ඡන්ද විමසීම යලිත් පැවැත්වීම පිළිබඳව ක්‍රියාමාර්ග ගත්තේ නැත. පසුව වයඹ පළාත් සභාවේ කාලය ඉකුත් වු අතර, එහි ඡන්ද විමසීම සඳහා 1999.01.25 දිනට මැතිවරණ කොමසාරිස් විසින් දින නියම කරන ලදි. නමුත් ඉහත පළාත් සභා 5 සඳහා ඡන්ද විමසීම් දිනයක් මැතිවරණ කොමසාරිස් විසින් නැවත නියම නොකෙරුණි.

## ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම

අත්තනෝමතික ලෙස තැපැල් ඡන්දය නවත්වා ඡන්ද විමසීමේ දිනය අවලංගු කිරීම හා ඡන්ද විමසීමේ දිනය නැවත නියම නොකිරීම මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව පවසමින් මාධ්‍යවේදියෙකු ලෙසද මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්‍ෂණ මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරුවකු ද වූ වරුණ කරුණාතිලක හා මාධ්‍යවේදී සුනන්ද දේශප්‍රිය විසින් 1998 සැප්තැම්බර් 9 දින ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදි. මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් පහත කරුණු ප්‍රකාශ කරන ලදී

- ❖ හදිසි නීතිය ප්‍රකාශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බලයක් නොමැති සහ නීති විරෝධී අභිමතය අනුව ක්‍රියාකිරීමකි.

- ❖ එය සද්භාවයෙන් හෝ රටේ පළාත් පහේ ආරක්‍ෂක තත්ත්වය සැලකිල්ලට ගෙන නොව තනිකරම මැතිවරණ පහ කල්දැමීම සඳහා සිදුකරන ලද ක්‍රියාවකි.

- ❖ මැතිවරණ කොමසාරිස්වරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහ පළාත් සභා ඡන්ද විමසීම් පනත මගින් මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇති කාර්ය භාරය ට නීති විරෝධි ඇඟිලි ගැසීමක් සහ උදුරාගැනීමක් මෙම හදිසි නීති රෙගුලාසි මගින් සිදුවී ඇත.

- ❖ මෙම හදිසි නීති රෙගුලාසිවල නිතිමය බලපෑම පළාත් සභා 5 හි අඛන්ඩ පැවැත්මට, ඡන්ද බලයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව සහ 14(1)(අ) ව්‍යවස්ථාවට අදාළ වන බැවින් එම රෙගුලාසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(2) ව්‍යවස්ථාවට පටහැනි වේ.

ඒ අනුව හදිසි නීතිය මගින් අවලංගු කරන ලද මැතිවරණය නොපැවැත්වීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය". යන මූලික අයිතිවාසිකම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති "භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස" වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවයි. මැතිවරණ කොමසාරිස්වරයා සහ අදාළ පළාත් සභාවල මැතිවරණ දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් 12 දෙනා සහ නීතිපතිවරයා මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබිණි.

**පෙත්සම් විභාගය**

අගවිනිසුරු පී.පී.එස්.ද සිල්වා, සමග මාර්ක් ප්‍රනාන්දු සහ ගුණසේකර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසින් මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කරන ලදී. එහිදී පළමුවන වග උත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ දිවුරුම් ප්‍රකාශයක් ගොනුකර තිබිණි.

ඒ අනුව මැතිවරණ දිනය නියම කිරීමට පෙර පළමු වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් පිළිගත් දේශපාලන පක්‍ෂවල

රැස්වීමක් 1998 ජූනි මස 25 වන දින පවත්වන ලද බවත්, මෙම රැස්වීමේදී මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කර ඇත්තේ පළාත් සභා පහටම අදාළ ඡන්ද විමසීම එකම දිනයක පවත්වන බවයි. එසේම පොලිස්පති වරයා ප්‍රකාශ කර ඇත්තේ මැතිවරණය සඳහා අවශ්‍ය ආරක්ෂක විධිවිධාන සලසන බවත්ය. එසේම එම රැස්වීමේදී ආරක්ෂාව පිළිබඳව ගැටුලුකාරී තත්ත්වයක් සම්බන්ධයෙන් පොලිස්පතිවරයා කිසිඳු සඳහනක්ද කර නොතිබිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අගවිනිසුරු ජී.පී.එස් ද සිල්වා සහ විනිසුරු ගුණසේකරගේ එකඟතාවය විනිසුරු මාර්ක් ප්‍රනාන්දු විසින් සකස් කළ මෙම නඩු තීන්දුව 1999 ජනවාරි 27 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

දෙපාර්ශවයෙන් මතු වු කරුණු සලකා බලමින් සිය තීන්දුව ප්‍රකාශයට පත් කළ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමන් පළමුව ප්‍රකාශ කරන ලද්දේ හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීමේ ජනාධිපතිතුමියගේ ප්‍රකාශය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේදී ප්‍රශ්න කළ හැකිද යන්නයි. එහිදී විනිසුරුතුමන් ප්‍රකාශ කරන ලද්දේ මෙම හදිසි අවස්ථා ප්‍රකාශය සිදු කරන ලද්දේ මහජන ආරක්ෂක පනතේ 2 වන වගන්තිය උපයෝගී කරගෙන බැවින් එය විධායක ක්‍රියාවක් වන බවයි. විධායක කාර්යය පිළිබඳව ප්‍රශ්න කිරීමේ බලය ආණ්ඩු ක්‍රම ව්‍යාවස්ථාවේ 126 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට ලැබෙන බැවින් ජනාධිපතිතුමිය හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 35 වන ව්‍යවස්ථාවේ සඳහන් වන ජනාධිපති විනිර්මුක්තිය මගින් ආවරණය නොවන බවයි. එමෙන්ම එකී හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව මහජන ආරක්ෂක පනතේ 8 වන වගන්තිය යටතේ ජනාධිපතිනිය විසින් පනවන ලද හදිසි අවස්ථා නියෝගයද පෙර පරිදිම අධිකරණයේ ප්‍රශ්න කළ හැකි බවයි. ඒ අනුව මෙම හදිසි අවස්ථා රෙගුලාසි මහජන ආරක්ෂක පනතේ 5 වන වගන්තියට අනුකූලව පනවා නැති බවත් මැතිවරණ කල් දැමීම යනු රෙගුලාසියක් නොව එය එක්තරා ආකාරයක අත්හිටුවීමේ නිවේදනයකි. එකී නිවේදනය බලවත් වන්නේ ජාතික ආරක්ෂාවට හා මහජන සාමයට තර්ජනයක් පවතින විටය. නමුත් වගඋත්තරකරුවන් 1998 ජූලි හෝ අගෝස්තු මාසයන්හිදී ජාතික ආරක්ෂාවට හා මහජන සාමයට තර්ජනයක් පැවති බවට අධිකරණයට ඔප්පු කර නැත.

එමෙන්ම කිසිදු හේතුවක් නොදන්වා නීතියට පටහැනි ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් තැපැල් ඡන්දය අත්හිටුවීමට

කටයුතු කර ඇති අතර ජනාධිපතිතුමිය විසින් හදිසි අවස්ථා නියෝග මගින් කල් දමන ලද ඡන්ද විමසීම සඳහා අලුත් දිනයක් නියම කිරීමට ඔහු කිසිඳු පියවරක් ගෙන නැත. ජනාධිපතිවරිය විසින් හදිසි නීති නියෝග මගින් අත්හිටුවන ලද ඡන්ද විමසීමේ දිනය වෙනුවට වෙනත් දිනයක් නියම කර ඡන්දය පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයාට අවස්ථාව තිබුණු බවද විනිසුරුවරයා මෙහිදී නිරීක්ෂණය කරන ලදී. ඒ අතර මැතිවරණ කොමසාරිස්වරයා විසින්ම වයඹ පළාත් සභා ඡන්ද විමසීම සඳහා දින නියම කර ඇත. එනිසා ඡන්ද විමසීම කල් දමන ලද පළාත් සභා 5 ට අඩු සැලකිල්ලක් දක්වා ඇත. ඒ මගින් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණව ලැබීමේ අයිතිය (12(1) ව්‍යවස්ථාව) උල්ලංඝනය වී ඇත.

මෙම නඩු තීන්දුවේ වැදගත්ම කොටස වන්නේ භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පල කිරීමේ නිදහස (14(1)(අ) ව්‍යවස්ථාව) යන ව්‍යවස්ථාමය අයිතිය මැතිවරණයේදී ඡන්ද හිමියෙකුට මැතිවරණයකදී ඡන්ද ප්‍රකාශ කිරීමේ අයිතියද ඇතුළත් වන පරිදි ඉතා පුළුල්ව අර්ථ නිරූපණය කළ යුතු බවට කරන ලද ප්‍රකාශයයි.

එසේම එම ප්‍රකාශය තහවුරු කරමින් වූ සිය තීන්දුව තුළ කරුණු දැක්වූ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා මෙසේ ප්‍රකාශ කර තිබේ.

"ඡන්දය ප්‍රකාශ කිරීම මගින් පුරවැසියෙකු රහසිගතව හා නිහඬව එක් අයෙකුට මනාපය ප්‍රකාශ කිරීම මහජන වේදිකාවක් මත කරනු ලබන ව්‍යයක්ත කථාවකට ඇති ප්‍රකාශනයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට වඩා අඩු වන්නේ නැත".

මේ අනුව ඡන්ද අයිතිය මූලික අයිතියක් ලෙස පිළිගැනීම මත පෙත්සම්කරුගේ ඉල්ලීම් සඳහා ඉඩ ලබා දුන් විනිසුරුවරයා වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකාරීත්වය නිසා පෙත්සම්කරුට ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර දී ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණව ලැබීමේ අයිතිය හා 14(1)(අ) ව්‍යවස්ථාව එසේ සහතික කර දී ඇති භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් එළ කිරීමේ නිදහසට ඇති අයිතියද, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකාරීත්වය නිසා උල්ලංඝණය වී ඇති බව තීරණය කරන ලදී.

ඒ අනුව සති 2 ක් අතුළත නැවත ඡන්ද විමසීම් දිනයක් නියම කරන ලෙසත්, එකී දිනය නඩු තීන්දුව දෙන දිනයේ සිට මාස 3 කට වඩා දිගු නොවිය යුතු බවත් මැතිවරණ කොමසාරිස්වරයාට නියෝග කරන ලදි.

එමෙන්ම පෙත්සම්කරු අලාභ ඉල්ලා නොසිටි නමුත් ඔහුට නඩු ගාස්තු ලෙස රුපියල් 30,000 ක් රජය විසින් ගෙවිය යුතු බවත් නියෝග කරන ලදි.

## 3.3. මැතිවරණ දිනය සැම දෙනාටම සුදුසු දිනයක් විය යුතුය

**කරුණාතිලක සහ තවත් අය එදිරිව දයානන්ද දිසානායක මැතිවරණ කොමසාරිස් හා තවත් අය (බලාත්මක කිරීමේ නඩු තීන්දුව) (දෙවන නඩුව)**

**Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (Enforcement Judgment) (Case No 2) (1999) 1 Sri LR. 183)**

**පසුබිම**

කරුණාතිලක සහ තවත් අය එදිරිව දයානන්ද දිසානායක මැතිවරණ කොමසාරිස් හා තවත් අය (SC(FR) 509/98) ( 1999- I- SLR 157) ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ 1999 ජනවාරි 27 වන දින තීන්දුවට අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් එදින සිට මාස තුනක් ඇතුළත අදාළ පළාත් සභා 5 සඳහා ඡන්ද විමසීම පැවැත්විය යුතු විය. එසේම තීන්දුව ලබාදුන් දිනයේ සිට සති දෙකක් ඇතුළත ඡන්ද විමසීම් දිනය ප්‍රකාශයට පත් කළ යුතු විය.

ඒ අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1999 පෙබරවාරි 8 වන දින ගැසට් නිවේදනයක් මගින් නව ඡන්ද විමසීම් දිනය ලෙස 1999 අප්‍රේල් 01 දිනය ප්‍රකාශයට පත් කරන ලදී. යෝජිත දිනයට පෙර දිනය එනම් මාර්තු 31 වන දිනය පුර පසලොස්වක පෝය දිනය විය. එසේම ඡන්ද දිනයට පසු දිනය එනම් අප්‍රේල් 2වන දිනය මහ සිකුරාදා දිනය විය. එසේම එම කාලය මුස්ලිම් බැතිමතුන්ගේ මක්කම හජ් වන්දනා සමය විය. ඒ අනුව නියම කරන ලද ඡන්ද විමසීම් දිනය වෙනස් කරන ලෙස බොහෝ ඉල්ලීම් මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලැබී තිබිණි. ඒ අනුව තමන් විසින් ගැසට් පත්‍රයක් මගින් නියම කරන ලද ඡන්ද විමසිම් දිනය වෙනස් කළ හැකිද? යන්න විමසා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පෙත්සමක් සහ දිවුරුම් පෙත්සමක් 1999 මාර්තු 3 වන දින ඉදිරිපත් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු ජී.පී. එස් ද සිල්වා විනිසුරු මාර්ක් ප්‍රනාන්දු සහ විනිසුරු ගුණසේකර යන මෙයට පෙර මෙම නඩුව විභාග කළ විනිසුරුවරුන් විසින්ම වේ. පෙත්සම ගොනු කරන ලද දිනට පසු දිනම එනම් 1999 මාර්තු 4 වන දින පෙත්සම පිළිබඳ කරුණු සලකා බැලීම සිදුකරන ලදී. එහිදී අදාළ පළාත් සභා 5 සඳහා නාමයෝජනා ලබාදී තිබූ සියලුම දේශපාලන පක්ෂවල මහලේකම්වරුන්ට නොතිසි නිකුත් කිරීමට නියම කළ ශ්‍රේෂ්ඨාධිකරණය නඩු විභාගය 1999 මාර්තු 9 වන දිනට කල් තබන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අග විනිසුරු ජී.පී, එස් ද සිල්වා සහ විනිසුරු ගුණසේකර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ එකඟතාව මත මෙම තීරණයද ප්‍රකාශයට පත් කරන ලද්දේ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා විසිනි.

ඡන්ද දිනය නියම කිරීමේදී, අදාළ පනත් යටතේ හෝ මෙම අධිකරණයේ නියෝගවලට අනුකූලව, මැතිවරණ කොමසාරිස්වරයා අත්තනෝමතික ලෙස ක්‍රියා නොකළ යුතු බවත්; අදාළ සියලු කරුණු සැලකිල්ලට ගනිමින් ඔහු යම් තරමකට විවෘතව කටයුතු කළ යුතු බව මාර්ක් ප්‍රනාන්දු විනිසුරු වරයා සිය තීරණයේ සඳහන් කර ඇත. එහිදී ඡන්දදායකයින්ගේ පහසුව පිළිබඳව සලකා බැලිය යුතු බවත් මැතිවරණයක පරමාර්ථය වන්නේ ඡන්දදායකයින්ට - සහ හැකි තරම් ඡන්දදායකයින්ට - ඔවුන්ගේ ඡන්ද බලය භාවිතා කිරීමට හැකියාවක් ඇති කිරීම බවත් නඩු තීන්දුවේ සඳහන් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 වැනි ව්‍යවස්ථාවට අවධාරණය කරන විනිසුරුවරයා එහි මැතිවරණ කොමසාරිස්වරයාගේ බලතල, රාජකාරි සහ කාර්යයන් ගැන සඳහන් වන නමුත් එමගින් පමණක් මැතිවරණ කොමසාරිස්වරයාගේ බලතල සහ යුතුකම් සම්පූර්ණ නොවන බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93 වැනි වගන්තියට අනුව ඡන්දය ප්‍රකාශ කිරීම නිදහස්, සමාන සහ රහසිගත විය යුතු බව දක්වන ප්‍රතිපාදන කෙරෙහිද මැතිවරණ කොමසාරිස් අවධායනය යොමුකළ යුතු බව දක්වයි. එකී ව්‍යවස්ථාව මගින් ඡන්දය ප්‍රකාශ කිරීම නිදහස්, සමාන සහ රහසිගත බව සහතික කිරීම සඳහා අවශ්‍ය වන ව්‍යංග බලතල සහ රාජකාරි මැතිවරණ කොමසාරිස්වරයා සතු බව විනිසුරුවරයා සිය තීන්දුව මගින් ප්‍රකාශ කරයි. එසේම ආගමික

නිදහස සම්බන්ධයෙන් වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇති අතර ඒවාද ඔහු විසින් සලකා බැලිය යුතු බව පවසන විනිසුරුවරයා ඒ විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඉ) ව්‍යවස්ථාව මගින් සහතික කරදී දී ඇති එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට පවතින අයිතිය ආරක්ෂා කිරීමේ රාජ්‍ය වගකීම පිළිබඳවද අවධාරණය කරයි.

මේ අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීම් දිනය තීරණය කිරිමේදී පවතින සියලු කරුණු සලකා බලා ඇති බවක් නිරීක්ෂණය නොවන බව සඳහන් කළ අධිකරණය මෙයට පෙර නඩු තීන්දුවේ සඳහන් පරිදි 1999 අප්‍රේල් 27 වන දිනට පෙර ඡන්ද විමසීම පවත්වන ලෙසත් නඩු තීන්දුව ප්‍රකාශ කළ දින එනම් 1999 මාර්තු 9 වන දින සිට දින දෙකක් ඇතුළත් අදාළ ඡන්ද විමසීමේ දිනය ප්‍රකාශයට පත් කරන ලෙසත් නියෝග කරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ක්‍රියාත්මක කිරීම

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට නියමිත කාලය තුළ ඡන්ද විමසීම් දිනය නියමකිරීමට මැතිවරණ කොමසාරිස්වරයා කටයුතු කළ අතර ඒ අනුව 1999 අප්‍රේල් 6 වන දින ඡන්ද විමසීම් දිනය ලෙස නියම කරන ලදී. එදින මධ්‍යම, ඌව, උතුරු මැද, සබරගමුව සහ බස්නාහිර පළාත් සභා සඳහා ඡන්ද විමසීම් පවත්වන ලදී (පළාත් සභා ඡන්ද විමසීම් ප්‍රතිඵල - මැතිවරණ කොමිෂන් සභා වෙබ් අඩවිය).

## 3.4. ඡන්දය ප්‍රකාශ කිරීමට බාධා කිරීම මූලික අයිතිවාසිකම් කඩකිරීමකි

**තවනීතන් එදිරිව දයානන්ද දිසානායක, මැතිවරණ කොමසාරිස් සහ තවත් අය**

**Thavaneethan v Dayananda Dissanayake Commissioner of Elections and Others (2003) -I Sri LR 74)**

### පසුබිම

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමට පසුබිම් වූයේ 2001 දෙසැම්බර් මස 5 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී මඩකලපුව ප්‍රදේශයේදී උද්ගතවූ තත්ත්වයකි. යුද්ධය තීව්‍රව පැවති කාලයක් වූ එකල මඩකලපුව දිස්ත්‍රික්කයේ ද වන්නි දිස්ත්‍රික්කයේද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේද ඇතැම් ප්‍රදේශ එකල මුදානොගත් ප්‍රදේශ ( Uncleared areas) ලෙස සැලකූ අතර එම ප්‍රදේශවල ඡන්ද මධ්‍යස්ථාන ස්ථාපනය

නොකළ අතර එකී ප්‍රදේශවල ඡන්දදායකයන්ට ඡන්දය භාවිතා කිරීම සඳහා රජයේ පාලන ප්‍රදේශවල පිහිටුවන ලද පොකුරු ඡන්ද මධ්‍යස්ථාන ලෙස හඳුන්වන ලද අනුරූප ඡන්ද මධ්‍යස්ථාවලදී ඡන්දය භාවිතා කිරීමට පහසුකම් සලසා තිබිණි. මඩකලපුව දිස්ත්‍රික්කයේ සහ වන්නි දිස්ත්‍රික්කයේ මුදානොගත් ප්‍රදේශවල සිට රජයේ පාලන ප්‍රදේශවලට පැමිණෙන යුධ හමුදා මාර්ග බාධකවලදී ඇතැම් ඡන්දදායකයන්ට සිය ඡන්දය භාවිතා කිරීම සඳහා පොකුරු ඡන්ද මධ්‍යස්ථාවලට යාමට යුධ හමුදාව විසින් අවසර ලබාදී තිබුණේ නැත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුදා නොගත් ප්‍රදේශවල සිට රජයේ පාලන ප්‍රදේශවලට පැමිණෙන ඡන්දදායකයන්ව යුධ හමුදාව විසින් වැළැක්වීමක් සිදු නොවීය, එයට පෙර 2000 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී මඩකලපුව සහ වන්නි දිස්ත්‍රික්කයේ ඡන්දදායකයන් ගේ බහුතරය රජයට විරුද්ධව ඡන්දය භාවිතා කර තිබූ අතර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඡන්දදායකයන් බහුතරය 2000 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී රජයට පක්ෂව ඡන්දය භාවිතා කර තිබිණි.

එම ඡන්දයේදී මඩකපුව දිස්ත්‍රික්කයේ 40,000ක් ඡන්ද දායකයන්ටද, වන්නි දිස්ත්‍රික්කයේ 15,000ක් ඡන්දදායකයන්ටද මෙසේ හමුදාමය ක්‍රියාමාර්ග නිසා ඡන්දය භාවිතා කිරීමට නොහැකිවූ බව වාර්තා විය. ඒ අතර ජනාධිපතිතුමිය, අගමැතිතුමා, කථානායක තුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා, සිය පදිංචි ස්ථානවල සිටම විශේෂ ආකාරයකට සිය ඡන්දය භාවිතා කරන ලදී.

2001 වසරේ පැවති පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන අවස්ථාව වන විට තවනීතන් සහ ඔහුගේ බිරිඳ වාසය කරන ලද්දේ මඩකලපුව දිස්ත්‍රික්ත්‍රියේ වාකරේ ප්‍රදේශයේය. එම ප්‍රදේශය එකල මුදා නොගත් ප්‍රදේශයක් (un cleared areas) ලෙස හැඳින්වූ අතර ඔහුට සහ බිරිඳට ඡන්දය භාවිතා කිරීමට අදාළ ඡන්ද මධ්‍යස්ථාය ද රජයේ පාලන ප්‍රදේශවලට ගෙනගොස් තිබිණි. ඒ අනුව තවනීතන් සහ ඔහුගේ බිරිඳ ඡන්දය භාවිතා කිරීම පිණිස සිය ඡන්ද මධ්‍යස්ථාන පිහිටි රජයේ පාලන ප්‍රදේශවලට ගමන්කරන ලදී. මුදානොගත් ප්‍රදේශවල සිට රජයේ පාලන ප්‍රදේශවලට පැමිණෙන ඡන්දදායකයන් පරීක්ෂා කරන කජුවත්ත යුධ හමුදා මාර්ග බාධකය වෙත ඔවුන් පෙරවරු 10.15 පමණ වන විට ලඟාවන ලදී. තවත් ඡන්දදායකයන් 500ක් පමණ ඒවන විට එම හමුදා මාර්ග බාධකය අසල සිටින ලදී. ඔවුන්ට එම යුධ හමුදා බාධකයෙන් ඉදිරියට ගමන් කිරීමට අවසර ලබාදීම සඳහා තවමත් සිය උසස් නිලධාරීන්ගෙන් උපදෙස් ලැබී

නොමැති බව හමුදා නිළධාරීන් ප්‍රකාශ කරන ලදී. අවසර ලැබෙන තෙක් බලා සිටියද අවසර නොදුන් බැවින් පස්වරු 2.30 ට පමණ ඔවුන් ආපසු නිවස කරා යන ලදී. ඒ අනුව තවනීතන් ඇතුලු පිරිසට පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඡන්දය භාවිතා කිරීමට නොහැකි විය.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

කජුවත්ත යුධ හමුදාව ආරක්ෂක කපොල්ල තුළින් ගමන් කර ඡන්දය භාවිතා කිරීමට ඉඩ නොදීම සහ එමගින් සිය ඡන්දය භාවිතා කිරීමට නොහැකි වීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් 12(1) ව්‍යවස්ථාව (නීතිය ඉදිරියේ සමානාත්මතාව), 14(1)(අ) ව්‍යවස්ථාව (ප්‍රකාශනය ඇතුලු අදහස් පලකිරීමේ නිදහස) 14(1)(ඌ) ව්‍යවස්ථාව (යාම් ඊම් නිදහස සහ අභිමත ස්ථානයක වාසය කිරීම් නිදහස) උල්ලංඝනය වූ බව ප්‍රකාශ කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකරන ලදී. මැතිවරණ කොමසාරිස්වරයා, මඩකලපුව තේරීම්භාර නිලධාරීවරයා, යුධ හමුදාපතිවරයා, මඩකලපුව ප්‍රදේශයේ යුධ හමුදා ප්‍රධානියා වූ 23 වන බලකායේ අණදෙන නිලධාරියා සහ නීතිපතිවරයා මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබිණි. තවනීතන්ගේ පෙත්සමටම සමාන පෙත්සම් තුනක් මගින් පෙත්සම්කරුවන් 8 දෙනෙකු ද ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සම් ගොනුකර තිබිණි. පෙත්සම් සියල්ල එක්ව ගෙන විභාග කරන ලදී.

## පෙත්සම් විභාගය

මාර්ක් ප්‍රනාන්දු. ස්මයිල් සහ විග්නේෂ්වරන් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය පවත්වන ලදී. 280000 ක් වූ මඩකලපුව දිස්ත්‍රික්කයේ සමස්ථ ඡන්දදායන්ගෙන් අඩුම තරමින් 40000ක්වත් සහ 210000 ක් වූ වන්නි දිස්ත්‍රික්කයේ සමස්ථ ඡන්දදායකයන්ගෙන් අඩුම තරමින් 15000ක් වත් හමුදාවේ ක්‍රියාකාරකම් නිසා සිය ඡන්ද භාවිතා කිරීමට නොහැකි වූ බව නිරීක්ෂණය කරන ලදී. හමුදා මාර්ග බාධක වසා දැමීමට තුන්වන වගඋත්තරකාර හමුදාපතිවරයා ගත් තීරණය නියම ආරක්ෂක අවශ්‍යාවක් මත නොව දේශපාලන කරුණු මත සිදුකරන ලද්දක් බවද නිරීක්ෂණය කරන ලදී.

හමුදා මාර්ග බාධක වසා දැමීම සාධාරණීකරණය සඳහා සිදුකරන ලද සන්නිවේදන ඉදිරිපත් කරන ලෙස අධිකරණය

වගඋත්තරකරුවන්ට උපදෙස් ලබාදුන්නද එවැනි ලේඛන අධිකරණය වෙත ඉදිරිපත් නොවිනි.

එසේම පෙත්සම්කරුවන් විසින් මෙම සිදුවීම්වලට අදාළ පුවත්පත් වාර්තා රැසක්ද අධිකරණයට ඉදිරිපත් කර තිබිණි. එමගින් මෙම සිදුවීම් සම්බන්ධව විවිධ පාර්ශවයන් විසින් සිදුකරන ලද ප්‍රකාශ ද වගඋත්තරකරුවන්ගේ ප්‍රතිචාරද දක්වා තිබිණි. පැෆ්රල් සංවිධානයේ මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායමක් තුන්වන වගඋත්තරකාර යුධ හමුදාපතිවරයා හමුවී මේ පිළිබඳව විවේචනය කර තිබිණි.

තුන්වන වගඋත්තරකාර හමුදාපතිවරයා වෙනුවෙන් කරුණු දක්වා සිටියේ මැතිවරණයේ ආරක්ෂාව සඳහා විශාල හමුදා සාමාජිකයන් ප්‍රමාණයක් යෙදවීමට සිදුවූ බවත්, එල්ටීටීඊ සාමාජිකයන් රජයේ පාලන ප්‍රදේශවලට පැමිණ මැතිවරණයට බාධාකිරීම නැවැත්වීම සඳහා මෙම මාර්ග බාධක වසා දැමීමට කටයුතු කළ බවත්ය.

## ශ්‍රේෂ්ඨාධිරකරණ තිරණය

ස්මයිල් සහ විග්නේෂ්වරන් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ ඒකඟතාව මත අදාළ නඩු තීන්දුව සකස් කර තිබුණේ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා විසිනි. නඩු තීන්දුව ලබාදෙමින් විනිසුරුවරයා "ඔප්පු කරන ලද උල්ලංඝනයන් තමන් තුළම බරපතල විය. බලපෑමට ලක්වූ ඡන්දදායකයින්ගේ සංඛ්‍යාව කොතරම් විශාලද යත්, මඩකලපුව සහ වන්නි දිස්ත්‍රික්කවල මැතිවරණ නිදහස් හෝ සාධාරණ නොවීය. එම උල්ලංඝනයන්ට හේතු වූ තීරණ ගැනීමේ ක්‍රියාවලීන් රහසිගතව, කඩිමුඩියේ හා අයහපත් විශ්වාසයකින් යුක්ත විය". යනුවෙන් සඳහන් කරන ලදී.

එසේම "උල්ලංඝනයන් සිදුවී ඇත්තේ මැතිවරණ ක්‍රියාවලියේ සුපිළිපන්න බව පිළිබඳ මහජන විශ්වාසය බරපතල ලෙස බාදනය වී ඇති අවස්ථාවකය, විශේෂයෙන්ම "මුදා නොගත්" ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ අයිතිවාසිකම් යලි සහතික කිරීම සඳහා මැතිවරණ නිදහස් හා සාධාරණ බව සහතික කිරීම අතිශයින් වැදගත් ය" යනුවෙන්ද සිය තීන්දුවේ සඳහන් කර තිබිණි.

තීන්දුවේදී මූලිකවම සලකා බලා ඇත්තේ මැතිවරණයේදී වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය මගින් පෙත්සම්කරුවන්ගේ සමානාත්මතාවයේ අයිතිය උල්ලංඝනය වී තිබේද යන්නයි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රජයේ පාලන ප්‍රදේශවලට පැමිණෙන

ඡන්දදායකයන්ට සැලකූ ආකාරයට වඩා වෙනස් ලෙස මෙම පෙත්සම්කරුවන්ට සැලකීමත්, ජනාධිපතිතුමිය ඇතුලු සුවිශේෂී පුද්ගලයන්ට පාර්ලිමේන්තු මැතිවරණ පනත ඉක්මවා යමින් විශේෂ අකාරයකට ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබාදීමත් මෙම පෙත්සම්කරුවන්ට ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබීමත් සැලකිල්ලට ගෙන පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමේ අයිතිය උල්ලංඝනය වී ඇති බව ප්‍රකාශ කරන ලදී. එසේම පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(උ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති ශ්‍රී ලංකාව තුළ යාම් ඊම් නිදහස රජයට සීමා කළ හැකිවන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදනවලට අනුකූලව පමණක් බව ප්‍රකාශ කළ ශ්‍රේෂ්ඨාධිකරණය මෙම සිදුවීමේ දී වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය එකී සීමාවන් ඉක්මවා ගොස් පෙත්සම්කරුවන්ගේ ශ්‍රී ලංකාව තුළ යාම් ඊම් නිදහස උල්ලංඝනය කර ඇති බවයි.

ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති භාෂණයේ සහ ප්‍රකාශනයේ යටතට ගැනෙන බව කරුණාතිලක එදිරිව දයානන්ද දිසානායක ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව පෙන්වා දෙන ලදී. මෙම ඡන්ද විමසීමේදී යුධ හමුදාවේ ක්‍රියාකලාපය අනුව මඩලපුව සහ වන්නි දිස්ත්‍රික්කවල ඡන්දදායකයන් 55000ක් පමණ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි විය. ඒ අය සඳහා නැවත ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාවක් පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා ලබා නොදීම නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය පළවෙනි වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් 1 සහ 3 වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(ඉ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් 3 වන වගඋත්තරකරු විසින් උල්ලංඝනය කර ඇති බව තීරණය කරන ලදී.

ඒ නිසා රජය විසින් රුපියල් ලක්‍ෂය බැගින් ලක්‍ෂ තුනක් පෙත්සම් තුන සඳහා ගෙවීමටද, තුන්වන වගඋත්තරකාර යුධ හමුදාපති විසින් රුපියල් 30000ක් බැගින් රුපියල් 90000ක් පුද්ගලිකවද පෙත්සම්කරුවන්ටද ගෙවන ලෙස නියෝග කළ අධිකරණය,

පළමුවන පෙත්සමේ පෙත්සම්කරු වෙත නාමික වන්දියක් ලෙස රුපියල් දහසක මුදලක් ගෙවන ලෙස පළමු වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට නියෝග කරන ලදී. මෙම සියලු මුදල් 2003 මැයි 31 වන දිනට පෙර ගෙවන ලෙසද නියෝග කරන ලදී.

## 3.5. ව්‍යවස්ථාදායකය විසින් සිදුකරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් සහන ලබාදීමට ශ්‍රේෂ්ඨාධිකරණයට නොහැක.

**මොහොමඩ් හුසේන් හාජියාර් මුහම්මඩ් සහ තවත් 18 දෙනෙකු එදිරිව මැතිවරණ කොමිෂන් සභාව සහ තවත් අය**

Mohamed Hussain Hajiar Muhammad and 18 others V. Election Commission of Sri Lanka and Others SC (FR) 35/2016- SCM 15-12-2017

**පසුබිම**

පළාත් පාලන ඡන්ද විමසීම් පනතට 2012 අංක 22 දරණ සංශෝධන පනත සංශෝධනයන් රැසක් සිදුකරන ලදී. ඒ අනුව පළාත් පාලන මැතිවරණ සඳහා කොට්ඨාශ සහ සමානුපාතික යන ක්‍රම දෙකෙහි මිශ්‍රනයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව සෑම පළාත් පාලන ආයතනයකම නිශ්චිත කොට්ඨාශ හඳුනා ගැනීමක් සිදුකළ යුතුය. ඒ සඳහා පනතට අනුව සීමා නිර්ණය කමිටුවක් විසින් එම කොට්ඨාස සීමාවන් නිර්ණය කළ යුතුය. මුල් සීමා නිර්ණය කමිටුවේ නිර්දේශයන්ට බොහෝ විරෝධතා එල්ලවූ අතර ඒ හේතුවෙන් සීමා නිර්ණය සමාලෝචන කමිටුවක් පත් කරන ලදී. බොහෝ පළාත් පාලන ආයතවල අවසන් වරට ඡන්දය පවත්වන ලද්දේ 2011 වසරේදී වන අතර 2016 වන විට එකී පළාත් පාලන ආයතනවල ධූරකාලය අවසන් වී තිබිණි. ඒ අනුව එම පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් සහ කොමසාරිස්වරුන් වෙත සභාවේ බලතල පවරා තිබිණි. මෙම තත්ත්වය තුළ පළාත් පාලන ඡන්ද විමසීම දින නියමයක් නොමැතිව කල් යාම හේතුවෙන් තමන්ට නැවත පළාත් පාලන සභිකයන් ලෙස පත්වීමට සහ සභාපතිධූර දැරීමට අවස්ථාව නොමැති වීම මගින් මූලික අයිතිවාසිකම් කඩුවීමක් සිදුවී ඇති බවට චෝදනා නගමින් බලයේ සිටි ප්‍රාදේශිය සභා සභාපතිවරුන් පිරිසක් මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනුකරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරුවන් 18 දෙනෙකු විය. ඔවුන් සියළුම දෙනා ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතනවල හිටපු සභාපතිවරුන් හෝ උප සභාපතිවරුන් විය. පෙත්සමේ වගඋත්තරකරුවන් 24 ක් නම්කර තිබිණි. පළවෙනි වගඋත්තරකරු ලෙස නම්කර තිබුණේ මැතිවරණ කොමිෂන් සභාවයි. 2 සිට 4 දක්වා වගඋත්තරකරුවන් වූයේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයන්ය. 5 වන වගඋත්තරකරු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාය. 6 සිට 23 දක්වා වගඋත්තරකරුවන් වූයේ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්/ලේකම්වරියන්ය. 24 වන වගඋත්තරකරු වූයේ නීතිපතිවරයාය.

පළාත් පාලන ආයතනවල ධූරකාලය 2015 ජනවාරි 1 වන දින අවසන් වීමට නියමිත වූ බැවින් පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ 25 වගන්තිය අනුව පළාත් පාලන ආයතනයක ධූරකාලය අවසන් වීමට මාස 6ක කාලය ඇතුළත ඡන්ද විමසීමක් පැවැත්විය යුතු බවට කරුණු දක්වා සිටි පෙත්සම්කරුවන් පෙන්වා දී තිබුනේ ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්ද විමසීම පවත්වා නැති බවයි. තමන් එම ඡන්ද විමසීම් සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂාවෙන් සිටි බවද පෙත්සම මගින් කියා සිටින ලදී. මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමට පෙර (මැතිවරණ කොමිෂන් සභාව පත්කරන ලද්දේ 2015 නොවැම්බර් 16 වන දිනය) මැතිවරණ කොමසාරිස් ලෙස කටයුතු කළ දෙවන වගඋත්තරකරු (මහින්ද දේශප්‍රිය) හෝ මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසුව 1 සිට 4 දක්වා වගඋත්තරකරුවන් හෝ මෙම ඡන්ද විමසීම පැවැත්වීමට ක්‍රියාකර නොමැති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103(ආ)(1) සහ 104(ආ)(2) ව්‍යවස්ථා සමග කියවිය යුතු නගර සභා ආඥා පනතේ සහ/හෝ ප්‍රාදේශීය සභා පනතේ සහ/හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන ඉක්මවමින් ක්‍රියා කර ඇති බවත් එදී ක්‍රියාකලාපය සහ/හෝ ක්‍රියා නොකිරීම අත්තනෝමතික, අසාධාරණ සහ නීති විරෝධී බවත් එකී ක්‍රියාකලාපය නීත්‍යනුකූල නොවන බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් අඛණ්ඩව උල්ලංඝනය වීමක් මෙමගින් සංයුක්ත වන බවත් පෙත්සම්කරුවන් පෙත්සම මගින් කියා සිටින ලදී. ඒ අනුව පෙත්සම්කරුවන් සිය පෙත්සම මගින් අයැද සිටියේ

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් 1වන වගඋත්තරකාර කොමිෂන් සභාව විසින් සහ /හෝ 2 සිට 4 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් සහ /හෝ රජය විසින් උල්ලංඝනය කර හෝ කඩකර ඇති බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත්,

(ආ) නීතිය මගින් නියම කර ඇති ආකාරයට පළාත් පාලන ආයතනය සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට අවශ්‍ය සියලු පියවර ගැනීම 1වන වගඋත්තරකාර කොමිෂන් සභාව විසින් සහ/හෝ 2 සිට 4 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් සහ/හෝ රජය විසින් පැහැර හැරීම මගින් සහ /හෝ ප්‍රතික්ෂේප කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පෙත්සම්කරුවන් ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව සහ/හෝ තවදුරටත් උල්ලංඝනය වන බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත්,

(ඇ) නීතිය මගින් නියම කර ඇති ආකාරයට නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම පැවැත්වීමට අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස 1වන වගඋත්තරකාර කොමිෂන් සභාව වෙත සහ/හෝ 2 සිට 4 දක්වා වූ වගඋත්තරකරුවන් වෙත සහ /හෝ රජය වෙත විධාන කරමින් නියෝගයක් නිකුත් කරන ලෙසත්,

(ඈ) නගර සභාවල සහ ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ගේ සහ උප සභාපතිවරුන්ගේ අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සඳහා 6 සිට 23 දක්වා වගඋත්තරකරුවන්ට අවසර ලබාදීමෙන් 1වන වගඋත්තරකාර කොමිෂන් සභාව විසින් සහ/හෝ 2 සිට 4 දක්වා වූ වගඋත්තරකරුවන් විසින් සහ/හෝ රජය විසින් පැහැර හැරීම මගින් සහ /හෝ ප්‍රතික්ෂේප කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පෙත්සම්කරුවන් ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව සහ/හෝ තවදුරටත් උල්ලංඝනය වන බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත් ය,

## පෙත්සම් විභාගය

2016 අප්‍රේල් 4 වන දින ඉල්ලීම් විභාග කිරීම සඳහා පෙත්සම කැඳවා තිබිණි. ඒ අනුව පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් 1 වන වගඋත්තරකාර මැතිවරණ කොමිෂන් සභාවට එරෙහිව පෙත්සම විභාග කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ අවසරය ප්‍රධානය කරන ලදී. පසුව දකුණු පළාතේ

ඡන්ද දායකයන් 7 දෙනෙකුද මෙම පෙත්සම සඳහා මැදිහත්වන පෙත්සම්කරුවන් ලෙස එක් වූ අතර ඔවුන් 25 සිට 31 දක්වා වගඋත්තරකරුවන් ලෙස එකතු කරන ලදී.

වගඋත්තරකරුවන්ගේ මූලික තර්කයක් වූයේ 2012 අංක 22 දරණ සංශෝධන පනතින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතට සැලකිය යුතු සංශෝධයන් ඇතුළත් වී තිබූ අතර එම සංශෝධන පනත මගින් ඉවත් කරන ලද ප්‍රතිපාදන මත මෙම නඩුව පවරා ඇති බවත් අදාළ 2012 අංක 22 දරණ සංශෝධනය පිළිබඳව සඳහන් කිරීමට පෙත්සම්කරුවන් අපොහොසත් වී ඇති බවත්ය. එසේම මෙම සංශෝධනයන්ට දායකවූ 5වන වගඋත්තරකාර අමාත්‍යවරයාගේ කිසිඳු සහනයක් ඉල්ලා නොමැති බැවින්ද මෙම පෙත්සම නිශ්ප්‍රභාකරන ලෙස මූලික විරෝධතාවක් නගන ලදී. නමුත් පෙත්සම මගින් නගා ඇති මූලික චෝදනාව මූලික අයිතිවාසිකමක් වන ජනතාවගේ ඡන්ද බලයට බලපාන මැතිවරණ නොපැවැත්වීම පිළිබඳ කරුණක් වන බැවින් එම මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමින් පෙත්සම විභාගයට ගන්නා ලදී.

2012 අංක 22 දරණ සංශෝධන පනතට අනුව පළාත් පාලන ආයතන වල කොට්ඨාශ සීමා නිර්ණය කිරීමේ කටයුතු ආරම්භ කර තිබෙන නමුත් එම ක්‍රියාවලිය සම්පූර්ණ වී නොමැති බවට 5වන වගඋත්තරකරු විසින් සවිස්තරාත්මකව කරුණු දක්වන ලදී. එසේම 2 වන වගඋත්තරකරු විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙම සංශෝධන පනතේ තාක්ෂණික දෝෂ පවතින බවත් ඒවා සංශෝධනය කළ යුතු බවට 5වන වගඋත්තරකාර අමාත්‍යවරයා වෙත කරුණු දක්වා ඇති බවත්ය.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රියසාත් ඩෙප් සමග අනිල් ගුණරත්න සහ නලින් පෙරේරා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. අනෙක් විනිසරුවරුන්ගේ ද එකඟතාව මත අගවිනිසුරුවරයා විසින් 2017 දෙසැම්බර් 5 වන දින සිය තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

කාලසීමාව අවිනිශ්චිතව දීර්ඝ කිරීම සඳහා නීතියේ ප්‍රතිපාදන නොමැති බවත්, සර්වජන ඡන්ද බලය යන්නෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය අදහස් වන අතර එම අයිතිය පුරවැසියන්ට ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතු බව ප්‍රකාශ කළ විනිසුරුවරයා පළාත් පාලන

ආයතනයකට වසර 4ක කාලයක් සඳහා සභිකයන් තෝරා පත් කරගන්නා බැවින් එම කාලය අවසානයේදී පුරවැසියන් නව සභිකයන් තෝරාගැනීමට අපේක්ෂා කරන බවත් එම අයිතිය නිශ්ප්‍රභ නොකළයුතු බවත් සඳහන් කරන ලදී. 2012 අංක 22 දරණ සංශෝධන පනත 2012 වර්ෂයේ සම්මත කරනු ලැබුවද මේ වනතෙක් එකී සංශෝධනයන්ට අදාළ විධිවිධාන සම්පූර්ණ කර නොමැති බව පෙනීයන බව පැවසූ විනිසුරුවරයා එකී ප්‍රමාදයට හේතුවක්ද දක්වා නොමැති බව නිරීක්ෂණය කරමින් මෙම තත්ත්වය මත පෙත්සම්කරුවන්ගේ පමණක් නොව සමස්ථ ඡන්ද දායකයන්ගේම අයිතිවාසිකම් උල්ලංඝනය වන බව පැවසීය, එසේම ඉදිරිපත්වූ කරුණු අනුව සංශෝධන පනතට අදාළ විධිවිධාන සම්පූර්ණ වනතෙක් මැතිවරණය පැවැත්විය නොහැකි බව සඳහන් කළ විනිසුරුවරයා ඒ සඳහා අමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුව වගකිවයුතු බව පවසන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ බලතල ව්‍යවස්ථාදායකය දක්වා දිගු නොවන අතර අමාත්‍යවරයාගේ කිසිඳු සහනයක් පෙත්සම්කරුවන් විසින් අපේක්ෂා නොකර ඇති බවද සඳහන් කරන ලදී. ඒ අනුව 1වන වගඋත්තරකරු විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුකර නොමැතිබව ප්‍රකාශ කළ අගවිනිසුරුවරයා පෙත්සමේ ඈ ඡේදයෙන් දක්වා සිටි එනම් පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්ට බලතල පැවරීම මගින් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී තිබීම යන කරුණාට ඉඩ ලබාදෙන බව පැවසීය. අධිකරණය සියලු වගඋත්තකරුවන්ට නියෝග කරන ලද්දේ කඩිනමින් මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසයි.

### හතරවන පරිච්ඡේදය

# ඡන්දායකයා හඳුනාගැනීම

එක් ඡන්දදායකයකු වෙත නිකුත් කරන්නේ එක් ඡන්ද පත්‍රිකාවක් පමණි. එබැවින් ඡන්ද දායකයාගේ අනන්‍යතාව හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. එය මැතිවරණායක නිදහස් සහ සාධාරණ බව සම්බන්ධයෙන් සෘජුවම අදාළ වේ. ඡන්දදායකයා හඳුනා ගැනීම සඳහා පවතින නීතිමය ප්‍රතිපාදන පිළිබඳව සහ එකී ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට බලධාරීන්ට ඇති වගකීම පිළිබඳව අභියාචනාධිකරණට ඉදිරිපත් කළ රිට් පෙත්සම් පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබයි.

## 4.1. ඡන්දදායකයාගේ අනන්‍යතාව තහවුරුකර ගැනීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

මැතිවරණායකදී ඡන්දදායකයකුගේ ඡන්දය වෙනත් පුද්ගලයන් විසින් භාවිතා කිරීම නිදහස් සහ සාධාරණ මැතිවරණායක් සඳහා පවතින ප්‍රධාන බාධාවක් වේ. මෙම තත්ත්වය මගහැරීම සඳහා හොඳම ප්‍රතිපාදනය වන්නේ ඡන්දදායකයාගේ අනන්‍යතාවය තහවුරුකර ගැනීම සඳහා හැඳුනුම්පතක් භාවිතා කිරීමයි. නමුත් 2004 වර්ෂය දක්වාම ඡන්දදායකයා හඳුනාගැනීම සඳහා අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්යය අවශ්‍යතාවක් නොවීය.

මේ හේතුවෙන් ඇතිවූ මැතිවරණායේ සුපිළිපන්නභාවයට සිදුවන හානිය මෙන්ම පුරවැසියන්ගේ ඡන්ද අයිතිය උල්ලංඝනය වීම පිළිබඳව මැතිවරණ නිලධාරීන් මෙන්ම මැතිවරණ නිරීක්ෂකයන්ද

උනන්දුවක් දක්වන ලදී. මැතිවරණ ප්‍රතිසංස්කරණය සඳහා පත් කරන ලද පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ ද විශේෂ අවධානයට ලක්විය. එහිදී පියවර 2ක් අනුව අනන්‍යතා පත්‍රය භාවිත කළ යුතු බවට නිර්දේශ විය.

i. සියළුම සුදුසුකම් ඇති පුද්ගලයන් හට ජාතික හැඳුණුම්පත් නිකුත් කිරීමෙන් අනතුරුව 2005 වසරේ දිනයකින් ආරම්භවන පරිදි, ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමේදී ඡන්ද දායකයන් ලෙස ගණන් ගැනීම ජාතික හැඳුනුම්පතේ අංකය හා නිකුත් කළ දිනය ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක් සිදු කිරීම හා එක් එක් ඡන්දදායකයාගේ නමට ඉදිරියෙන් ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීමට පියවර ගැනීම.

ii. ජාතික හැඳුණුම්පත හෝ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් ඡායාරූපයක් සහිත එවැනි හැඳුනුම්පතක් හෝ ඉදිරිපත් කළ විටදී පමණක්, තැපැල් ඡන්ය දායකයන්ද ඇතුළුව සියළුම ඡන්ද දායකයන් හට ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම.

ඉහත සඳහන් කළ ලියාපදිංචිය සම්පූර්ණ වී එම ඡන්ද හිමි නාමලේඛන වල පිටපත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත් කිරීම හෝ රැස්කිරීම සිදුවීමෙන් අනතුරුව එළඹෙන දිනක සිට එය ක්‍රියාත්මක කිරීම. (පිටුව 6.පාර්ලිමේන්තු ප්‍රකාශමාලා අංක 24) මෙම විශේෂ කාරක සභාවේ නිර්දේශ අනුගමනය කරමින් 2004 අංක 14 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

## 4.2. 2004 අංක 14 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත

මෙම පනත මගින් පාර්ලිමේන්තු මැතිවරණ, ජනාධිපතිවරණ, පළාත් සභා ඡන්ද විමසිම්, පළාත් පාලන ඡන්ද විමසීම් සහ ජනමත විචාරණවලදී වලංගු ඡන්දදායකයකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර වලංගු අනන්‍යතා ලේඛනයක් ඔස්සේ එකී ඡන්දදායකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ නීතිමය ප්‍රතිපාදන නීතිගත කරන ලදී. (පනතේ 3වන වගන්තිය) පනතේ 4වන වගන්තිය දක්වන පරිදි වලංගු අනන්‍යතා ලේඛනයක් යනු "කවර හෝ කාර්යක් සඳහා එය දරන්නාගේ අනන්‍යතාව නිශ්චය කර ගැනීම පිණිස යම් නීතියක් ප්‍රකාර ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරනු ලැබූ අනන්‍යතා

ලේඛනයක් අදහස් වන අතර, ඊට වෙනත් යම් අනන්‍යතා සහතිකයක් නොමැති තැනැත්තකුගේ ඡායාරූපයක් එම තැනැත්තාගේ ඡායාරූපය බවට අවස්ථානෝචිත පරිදි ග්‍රාම නිලධාරිවරයා විසින් හෝ වතු අධිකාරිවරයා විසින් යථා පරිදි සහතික කොට එම තැනැත්තා පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කාර්යය සඳහා ලිඛිතව බලය පවරන ලද නිලධරයකු විසින් සත්‍යායනය කරන ලද ලේඛනයක්ද ඇතුළත් විය යුතුය". යනුවෙන් දැක්වේ.

මෙම පනත සඳහා කථානායකවරයාගේ සහතිකය සටහන් කළ දින සිට වසරක කාලයක් අවසන් වීමෙන් අනතුරුව ක්‍රියාත්මක විය යුතු අතර ඒ අනුව එම වසරක කාලයට පෙර ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට සියලු පරිපාලන කටයුතු සලසා ඇති බවටත් ඡන්දය භාවිතා කිරීමට බලය ඇති කිසිවෙකු මෙම පනතේ ප්‍රතිපාදන හේතුවෙන් ඡන්දය භාවිතා කිරීමෙන් වැළැක්වීමක් සිදුවී නොමැති බවටත් සහතික කරමින් ගැසට් පත්‍රයක් පලකිරීමට මැතිවරණ කොමිසමට වගකීමක් පනතේ 2වන වගන්තිය මගින් පවරා තිබිණි.

## 4.3. වලංගු අනන්‍යතා පත්‍රයක් නොමැතිව ඡන්දය භාවිතා කළ නොහැක.

**පැෆ්රල් සංවිධානය සහ තවත් අය එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අය -**
**PAFFREL & Others v. Dayananda Dissanayake & Others - C.A.No 176/2006 C.A.M. 16.03.2006**

### නඩුවේ පසුබිම

2006 වසරේ දී පළාත් පාලන ආයතන 17 ක නිල කාලය 2006 අප්‍රේල් 16 වන දින අවසන් වන බව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා 2006 ජනවාරි 10 වන දින ගැසට් පත්‍රය මගින් නිවේදන නිකුත් කරන ලදී. එයට අමතරව තවත් පළාත් පාලන ආයතන 272 ක නිල කාලය 2006 අප්‍රේල් 16 වන දින අවසන් වීමට නියමිත විය. තවත් පළාත් පාලන ආයතන ගණනාවක නිල කාලය 2006 ජූලි මාසයේදී අවසන් වීමට නියමිත විය. ඉහත 2004 අංක 14 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත සඳහා කථානායකවරයාගේ සහතිකය සටහන් කර ඒ වන විට වසරක කාලය ඉක්මවා ගොස් තිබිණි. නමුත් එකී පනතේ

2වන වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පලකළ යුතු සහතිකය ඒ වන විටත් ගැසට් පත්‍රයේ පලකර නොතිබිණි.

එකී තත්ත්වයක් තුළ පවත්වන ඡන්ද විමසීම් තුළදී 2004 අංක 14 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගින් ප්‍රතිපාදන සලසා තිබූ ඡන්දය භාවිතා කිරීමේදී ඡන්දදායකයකු හඳුනාගැනීම සඳහා වලංගු අනන්‍යතා ලේඛනයක් ඉදිරිපත් කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවය එම ඡන්ද වීමසීමට අදාළ නොවන තත්ත්වයක් උදාවිය.

## රිට් පෙත්සම

මෙම තත්ත්වය වැළැක්වීම සඳහා පැෆ්රල් සංවිධානයේ සභාපති කිංස්ලි රොද්‍රිගෝ සහ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි විසින් 2006 ජනවාරි 31 වන දින අභියාචනාධිකරණය ඉදිරියේ රිට් පෙත්සමක් ගොනුකරන ලදී.

2004 අංක 14 දරණ පනතේ 2වන වගන්තිය යටතේ සිදුකළ ව්‍යවස්ථාපිත වගකීම් මැතිවරණ කොමසාරිස්වරයා සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් ඉටුකර නොමැති බව පෙත්සම මගින් අවධාරණය කරන ලදී, ඒ අනුව පනතේ 2වන වගන්තිය යටතේ වන සහතිකය ගැසට් පත්‍රයේ පලකිරීම, ඒ සඳහා වන දේශපාලන පක්ෂවල අදහස් ලබාගැනීම, පනතේ 2වන වගන්තිය යටතේ වන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාගෙන් ජාතික හැඳුණුම්පත් නිකුත් සිදුකර ඇති බවට තහවුරුවක් ලබාගැනීම ආදිය මැතිවරණ කොමසාරිස් හෝ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් සිදුකර නොමැති බව පෙත්සම මගින් කියා සිටින ලදී.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන්, මැතිවරණ කොමසාරිස් දයානන්ද දිසානායක සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් එච්.කේ. ගීතසේන යන අය මෙම පෙත්සම මගින් පිළිවෙලින් 1 සිට 3 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

පළවෙනි වගඋත්තරකාර පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2006 ජනවාරි 10 වන දින නිකුත් කරන ලද ගැසට් නිවේදනය අවලංගු කිරීමේ සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, 2004 අංක 14 පනතේ 2වන වගන්තිය යටතේ වන අවශ්‍ය පියවර ගැනීම සඳහා

දෙවන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස් සහ තුන්වන වගඋත්තරකාර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් වෙත මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, නීතියට අනුව ඡන්දදායකයන්ට අනිවාර්යය වූ වලංගු අනන්‍යතා ලේඛනයක් නිකුත් කිරීම සඳහා 2වන සහ 3වන වගඋත්තරකරුවන්ට එරෙහිව මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත් මෙම පෙත්සම මගින් ඉල්ලා සිටින ලදී.

එසේම මෙම පෙත්සම් විභාගය අවසන් වන තෙක් ඡන්ද විමසීමේ ගැසට් පත්‍රයට අදාළ කටයුතු නවත්වන ලෙසද, මෙම නඩු විභාගය අවසන් වන තෙක් නාමයෝජනා කැඳවීම වළක්වන ලෙසත්, අතුරු නියෝග නිකුත් කරන ලෙසත් පෙත්සම මගින් ඉල්ලා තිබිණි.

එසේම අතුරු සහනයක් ලෙස මෙම පෙත්සම විභාගය අවසන් වන තෙක් අදාළ පළාත් පාලන ආයතනවල කාලය දීර්ඝ කරන ලෙසද වැඩිදුරටත් ඉල්ලා සිටින ලදී.

## අභියාචනාධිකරණයේ පෙත්සම් විභාගය

මෙම පෙත්සම කේ ශ්‍රීපවන් සහ කේ. එස්. ඩී. ද ආබෲ යන අභියාචනාධිකරණ විනිසුරුවරුන් ඉදිරියේ විභාග විය. මැතිවරණ කොමසාරිස්වරයා 2006 මාර්තු 8 වන දින සිය විත්තිවාචකය ඉදිරිපත් කරන ලදී. එකී පෙත්සමේ 7 වන වගන්තියේ ඔහු දක්වා සිටියේ 2004 අංක 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තියේ සඳහන් පරිදි මෙම පළාත් පාලන මැතිවරණය සඳහා ඡන්ද දායකයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස "පිළිගත් හැඳුනුම් පත්‍රයක්" ලබාදීමට සඳහා විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවයි. එසේම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාද ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යොදන බවට පොරොන්දුවක් ලබාදෙන ලදී.

එම කරුණු දැක්වීම සම්බන්ධයෙන් පෙත්සම්කරුවන් එකඟතාවය පල කළ අතර, එකී සමතය අනුව පෙත්සම 2006 මාර්තු 03 ඉල්ලා අස්කරගන්නා ලදී.

## 4.4. ඒකඟතාවය සියළු මැතිවරණ සඳහාද ආදේශ කර ගැනීම

**පැෆ්රල් සහ රෝහණ හෙට්ටිආරච්චි එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අයෙක් PAFFREL & Rohana Hettiarachchi v. Dayananda Dissanayake & another- C.A (Writ) No.356/2008- C.A.M. 28.04.2008**

### පසුබිම

මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2008 මාර්තු 8 වන දින නැගෙනහිර පළාත් සභා මැතිවරණ පැවැත්වීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කරන ලෙස ගැසට් නිවේදනයක් මගින් නිවේදනය කරන ලදී. ඡන්ද විමසීම 2008 මැයි 10 වන දිනට නියමකරන ලදී. නමුත් 2004 මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පල කළ යුතු සහතිකය ("ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම් ඇති තැනැත්තන් විසින් හැඳුනුම්පත් ලබා ගැනීම සහ ඔවුන් විසින් ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් වැළැක්වී නොමැති බව තහවුරු කර ගැනීම පිණිස, 1968 අංක 22 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හැඳුණුම්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් සියලු පරිපාලන වැඩ පිළිවෙල සපුරා ඇති බවට මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීමට පෙර මැතිවරණ කොමිෂන් සභාව සෑහීමට පත්විය යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාව විසින් එම කරුණු සහතික කරමින් එම සහතිකය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතුය") නිකුත් කර තිබුණේ නැත. ඒ අනුව මැතිවරණයේදී ඡන්දය ලබාදීමට සුදුසු සෑම ඡන්දදායකයකුටම පිළිගත් හැඳුණුම් පතක් ලබාදීම සහතික කර නොතිබිණි. මේ නිසා පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි විසින් 2008 අප්‍රේල් 2 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් ලියමින් පිළිගත් අනන්‍යතා පත්‍රයක් සෑම ඡන්දදායකයකුටම ලබාදීම සහතික කරන ලෙස ඉල්ලා සිටින ලදී. නමුත් ඔහුට මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ප්‍රතිචාරයක් ලැබුනේ නැත. ඒ අනුව ඉදිරියේදී පැවැත්වෙන නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්වන සියලුම ඡන්දදායකයන් සඳහා පිළිගත් අනන්‍යතාපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස නියෝගයක් නිකුත් කරන ලෙස අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

## රිට් පෙත්සම

පැෆ්රල් සංවිධානය පළවෙනි පෙත්සම්කරු ලෙසත් එහි විධායක අධ්‍යක්‍ෂක රෝහණ හෙට්ටිආරච්චි දෙවන පෙත්සම්කරු ලෙසත් සඳහන් වූ මෙම පෙත්සමේ මැතිවරණ කොමසාරිස්වරයා සහ පුද්ගලයන් ලියාපදංචිකිරීමේ කොමසාරිස්වරයා පිළිවෙලින් 1 සහ 2 වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

2004 අංක 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය අනුව ඡන්දදායකයකුගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා පිළිගත් අනන්‍යතාපත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්යය බවත් එකී අනන්‍යතා පත්‍රය ලබාදීමේ වගකීම දෙවන වගඋත්තරකාර පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ කොමසාරිස්වරයාගේ වගකීමක් බවත් පෙත්සම මගින් ඔවුන් දක්වා තිබිණි. එසේම එම සෑම ඡන්දදායකයකුටම අනන්‍යතා පත්‍රයක් නිකුත් කිරීම පිළිබඳව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විමසා එකී කාර්යය ඉටුවී ඇති බවට නිවේදනය කිරීමේ වගකීම පළමු වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ වගකීමක් බව පනතේ 2වන වගන්තිය සඳහන් වන බවත් එකී නිවේදනය නිකුත් කිරීමේ කාලය 2005 නොවැම්බර් 18 වන දින සම්පූර්ණ වන බවත් පෙත්සම මගින් දක්වා සිටින ලදී. නමුත් මැතිවරණ කොමසාරිස්වරයා සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා එම වගකීම් ඉටුකිරීමට අපොහොසත් වී ඇති බවත්, මෙයට සමාන කරුණක් මත 2006 වසරේ පැවති පළාත් පාලන ඡන්ද විමසීම සම්බන්ධයෙන් 176/2006 දරණ රිට් පෙත්සම තම සංවිධානය යොමුකරන ලද බවත් පෙත්සමේ සඳහන් විය. එම පෙත්සම තමන් ඉල්ලා අස්කරගන්නා ලද්දේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිය කරුණු දැක්වීම මගින් එකී ඡන්ද විමසීම් සඳහා විකල්ප අනන්‍යතා පත්‍රයක් ලබාදීමට කටයුතු කරන බවට පොරොන්දු වූ බැවින් බව තවදුරටත් සඳහන් කරන ලදී. නමුත් ඉදිරියේ පැවැත්වෙන පළාත් සභා මැතිවරණ සඳහා 2004 අංක 14 පනතේ ප්‍රතිපාදන ක්‍රියාවට නැගීමට වගඋත්තරකරුවන් සූදානමක් නැති බවත් තමන් විසින් 2008 අප්‍රේල් 2 වන දින යොමුකරන ලද ලිපියට ප්‍රතිචාර ලැබී නැති බවත් සඳහන් කළ පෙත්සම්කරුවන් අධිකරණයෙන් ඉල්ලා සිටින ලද්දේ, 2004 අංක 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 2වන වගන්තියෙන් ඔවුන් වෙත පැවරී ඇති ව්‍යවස්ථානුකූල වගකීම් ඉටුකරන ලෙස බලකරන මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, 2008 මැයි 10 වන දින පැවැත්වෙන නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීම සඳහා සහ ඉදිරියේදී පැවැත්වෙන සියලුම මැතිවරණ සඳහා පිළිගත්

අනන්‍යතාපත්‍රයක් නිකුත් කිරීමට පියවර ගන්නා ලෙස බලකරන මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත්කරන ලෙසත්ය.

## රිට් පෙත්සම් විභාගය

පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණයේ සභාපති චන්ද්‍රා ඒකනායක සහ අනිල් ගුණරත්න සහ අභියාචානධිකරණ විනිසුරන් විසිනි. පෙත්සම් විභාගය ආරම්භයේදීම අංක 176/2006 නඩුව සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ පෙත්සමේ 7 වන වගන්තියේ සඳහන් කරුණු  අනුව පිළිගත් අනන්‍යතා පත්‍ර නිකුත් කිරීමට විකල්ප වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට  මැතිවරණ කොමසාරිස්වරයා මෙම නඩුවේදීද එකඟතාවය ප්‍රකාශ කළ බැවින් එකී එකඟතාවයට යටත්ව පෙත්සම්කරුවන් විසින් 2008 අප්‍රේල් 28 වන දින පෙත්සම ඉල්ලා අස්කරගන්නා ලදී.

## අධිකරණ ක්‍රියාමාර්ගයේ බලපෑම

ඡන්දය භාවිතා කිරීමේදී ඡන්දදායකයා විසින් සිය අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා වලංගු අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය කරන ලද්දේ මෙම අධිකරණමය ක්‍රියාමාර්ග හරහාය. එමගින් හොර ඡන්දදැමීම සහ පුද්ගලාරූඪය සම්පූර්ණ වශයෙන් පිටු දැකීමට හැකිවිය. එය නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා බෙහෙවින් ඉවහල් වූ කාරණයක් වූ අතර මැතිවරණ නිළධාරීන්ටද තීරණ ගැනීමේදී නිශ්චිත මඟපෙන්වීමක් ලබාදෙන ලදී.

මෙම අධිකරණ තීරණයෙන් පසුව පවත්වන සෑම මැතිවරණයකදීම ඡන්ද විමසීමේදී වලංගු අනන්‍යතා පත්‍ර ලෙස මැතිවරණ නිලධාරීන් විසින් පිළිගන්නා අනන්‍යතා පත්‍ර මොනවාද යන්න මැතිවරණ කොමසාරිස් / මැතිවරණ කොමිසම විසින් කල් තබා ප්‍රසිද්ධ කරනු ලබයි. එසේ වලංගු අනන්‍යතා ලේඛනයක් නොමැති ඡන්ද දායකයන් වෙත අදාළ ඡන්ද විමසීමේදී භාවිතා කිරීම සඳහා වලංගු අනන්‍යතා පත්‍රයක් සහකාර මැතිවරණ කොමසාරිස්වරයකුගේ අත්සන යටතේ නිකුත් කිරීමේ ප්‍රතිපාදන(පනතේ 4වන වගන්තිය ප්‍රකාරව) මැතිවරණ කොමසාරිස් /කොමිසම විසින් ආරම්භ කරන ලදී.

මේ අනුව පුද්ගලාරූඪනය සහ හොර ඡන්ද දැමීම මුලුමනින්ම පාහේ අවසන් කිරීමට මෙම තීරණය මගින් හැකියාවක් ලැබිණි. 1931 වසරේදී පැවති පළමු සර්වජන ඡන්දයේ සිටම පුද්ගලාරූඪනය සහ හොර ඡන්ද දැමීම සෑම මැතිවරණයකම දක්නට ලැබුණ සුලබ

සිදුවීමක් වූ අතර 1982 ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයාගේද ඡන්දය වෙනත් පුද්ගලයකු විසින් භාවිතා කර ඇති බවට මාධ්‍ය වාර්තා පලවිය.

අදාළ නීතිමය ප්‍රතිපාදන පාර්ලිමේන්තු පනතක් මගින් සලස්වා තිබියදීත් මැතිවරණ කොමිෂන් සභාව විසින් එම ප්‍රතිපාදන අනුව කටයුතු නොකරමින් (එසේ නොකර හැරීමට සාධාරණ හේතු පැවතිය හැකිය) පැරණි නීති තත්ත්වයක් යටතේම මැතිවරණය පැවැත්වීමට සූදානම් වූ අවස්ථාවේදී පැෆ්රල් සංවිධානයේ මෙම නීතිමය මැදිහත්වීම හේතුවෙන් මැතිවරණයක සුපිළිපන් බව ආරක්ෂා කරගැනීම සඳහා විශාල මෙහෙයක් සිදුවිය.

පස්වන පරිච්ඡේදය

# ඡන්ද මධ්‍යස්ථාවල කලබල ඇති වූ අවස්ථාවකදී අවලංගු කිරීම

නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සහතික කිරීමට නම් ඡන්ද මධ්‍යස්ථානයක් සාමකාමීව පවත්වාගෙන යායුතුය. ඡන්ද මධ්‍යස්ථානයක කලබලකාරී සිදුවීම් ඇතිවන විට එම ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද වලංගු ඡන්ද ලෙස පිළිගත යුතුද යන්න පිළිබඳව ගැටලුවක් මතුවේ. ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය භාවිතා කිරීමට අයිතිය ඇති ඡන්ද දායකයන් ඡන්දය දීමෙන් වැළැක්වීම සහ හිමිකම නොමැති පුද්ලගලයන් එම ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය භාවිතා කිරීම යන සිදුවීම් දෙකම මෙවැනි අවස්ථාවක සිදුවීම එයට හේතුවයි. ඡන්ද මධ්‍යස්ථානයක් අසල කලබල ඇතිවන අවස්ථාවකදී එම ඡන්ද මධ්‍යස්ථානය අවලංගු කිරීම පිළිබඳව පවතින නීතිමය ප්‍රතිපාදන සහ ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දු පිළිබඳව මෙම පරිච්ජේදය මගින් විස්තර කරනු ලබයි.

## 5.1. ඡන්ද මධ්‍යස්ථානවල කලහකාරී සිදුවීම්

ඡන්ද විමසීමක් නිදහස් සාධාරණ මෙන්ම ඡන්දය භාවිතා කිරීමේදී රහස්‍යභාවයද ආරක්ෂා වන පරිදි පැවැත්විය යුතුය. ඡන්ද මධ්‍යස්ථානයක කලබල ඇතිවීම මගින් මෙම නිදහස් සහ ස්වාධීන ඡන්දයට විශාල අගතියක් ඇතිවේ. විශේෂයෙන්ම තම දේශපාලන පක්ෂයට අවාසි සහගත ඡන්ද මධ්‍යස්ථාන අසල කලබලකාරී තත්ත්වයන් ඇති කිරීම මගින් ඡන්දදායකයන් මෙන්ම ඡන්දපොළ නියෝජිතයන්ද පලවාහරිමින් බලහත්කාරයෙන් ඡන්දපෙට්ටි පිරවීම ඡන්දදායකයන් බියවැද්දීම සහ හොර ඡන්ද දැමීම සිදුකරනු ලබයි.

මැතිවරණයක් ආශ්‍රිතව මෙන්ම ඡන්ද මධ්‍යස්ථාන අසලද කලබලකාරී තත්වයන් ඇතිවීම සුලබ තත්වයන් ලෙස 2000 වර්ෂය දක්වාම පැවතින. මෙහි කූඨාප්‍රාප්තිය 1999 ජනවාරි 25 වන දින පැවති වයඹ පළාත් සභා මැතිවරණයයි. එම මැතිවරණය අවසන් වී පැය කිහිපයක් තුළදී එම මැතිවරණයේදී සිදුවූ ප්‍රචණ්ඩක්‍රියාවන් මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණයට සිදුවූ බාධාවන් හේතුවෙන් එම මැතිවරණය අවලංගු කරන ලෙස පැෆ්රල් සංවිධානය මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටින ලදී.( පැෆ්රල් (1999).5) ඡන්ද මධ්‍යස්ථාන අසල කලබලකාරී සිදුවීම් මගින් ඡන්ද මධ්‍යස්ථානයට සිදුවන නිදහස් සහ ස්වාධීන බවට සිදුවන බලපෑම අවම කිරීමේ එක් පියවරක් වන්නේ කලබල සිදුවූ ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද අවලංගු කිරීමයි.

## 5.2. ඡන්ද මධ්‍යස්ථාන අවලංගු කිරීමේ ප්‍රතිපාදන

ඡන්ද මධ්‍යස්ථාන තුළ කලබලකාරී තත්ත්වයන් ඇතිවන අවස්ථාවන්වලදී එකී ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය අවලංගු කිරීමට සහ නැවත ඡන්දයක් පැවැත්වීම පිළිබඳව ප්‍රතිපාදන මුල් මැතිවරණ පනත් තුළ ඇතුළත්ව තිබුනේ නැත. එකල යම් ඡන්ද මධ්‍යස්ථානයක කලබල ඇතිවීම මගින් ඡන්ද ප්‍රතිඵලයට බලපෑමක් සිදුවී තිබේනම් ඡන්ද පෙත්සමක් මගින් සහන ලබාගැනීමේ හැකියාව අපේක්ෂකයන්ට තිබිණි. නමුත් ඡන්ද දායකයන්ට එමගින් සිදුවන අසාධාරණයට සාධාරණයක් ඉටුකිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

මෙම තත්ත්වය යම්තාක් දුරකට වෙනස්කරන ලද්දේ 1988 අංක 35 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගිනි. එම පනත මගින් පාර්ලිමේන්තු මැතිවරණ පනත, ජනාධිපතිවරණ පනත සහ පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කරමින් ඡන්ද මධ්‍යස්ථාන තුළ කලබලකාරී තත්ත්වයන් ඇති වුවහොත් එකී ඡන්ද මධ්‍යස්ථානවල ඡන්දය අවලංගු කිරීම සඳහා බලතල මැතිවරණ කොමසාරිස්වරයාට ලබාදෙන ලදී.

ඒ අනුව 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 49 වගන්තියට අනතුරුව 49අ ලෙස නව වගන්තියක් ඇතුළත් කරන ලදි. එහි සඳහන් වූයේ "49අ(1) යම්කිසි ස්වභාවයක සිද්ධි ඇතිවීමේ හේතුවෙන්

(අ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට නියමිත වේලාවේදී ඡන්ද පොළක ඡන්ද විමසීම ආරම්භ කිරීමට නොහැකි වන්නා වූ : හෝ

(ආ)ඡන්ද විමසීම පටන්ගැනීමට නියමිත වේලාවේදී ඒ ඡන්ද පොළෙහි ඡන්ද විසීම ආරම්භ වූ නමුත් ඡන්ද විමසීම අවසන් කිරීම සඳහා නියමිත වෙලාව තෙක් එය පවත්වාගෙන යා නොහැකි වන්නාවූ: හෝ

(ඇ) ඒ ඡන්ද පොළට වෙන් කර දෙන ලද කවර හෝ ඡන්ද පෙට්ටියක් ගණන් කිරීමේ නිලධාරියා වෙත භාරදීමට නොහැකි වන්නාවූ අවස්ථාවක ඒ ඡන්ද පොළෙහි ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් අප්‍රමාදව ඒ බව තේරීම්භාර නිළධාරියා වෙත දැන්විය යුතු අතර, ඔහු එය කොමසාරිස්වරයාට දැන්විය යුතුය,

(අ) මැතිවරණ කොට්ඨාශයක ඡන්ද පොළක් සම්බන්ධව (1) වන උපවගන්තිය යටතේ දැනුම්දීමක් ලැබුණු විට ඒ දැනුම්දීමේ සත්‍ය අසත්‍යතාවය නිර්ණය කිරීම පිණිස අවශ්‍යයැයි කොමසාරිස්වරයා විසින් සලකනු ලැබිය හැකි විමසීම් කිරීමෙන් පසුව, ඒ ඡන්දපොළෙහි පවත්වන ලද ඡන්ද විමසීම ශූන්‍ය බවට, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකිය".

මෙම ප්‍රතිපාදන අනුව අවලංගු කරන ලද ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්ද ගණන් නොකිරීම හේතුවෙන් එකී මැතිවරණ කොට්ඨාසයේ සමස්ථ ඡන්ද ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති නොවන බව මැතිවරණ කොමසාරිස්වරයාගේ මතය වන අවස්ථාවකදී මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත්කළ යුතු බව එහි 6 වන උපවගන්තියේ සඳහන් වන අතර අවලංගු කරන ලද ඡන්ද මධ්‍යස්ථානය හෝ ඡන්ද මධ්‍යස්ථාන හේතුවෙන් මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද ප්‍රතිඵලයට බලපෑමක් සිදුවන අවස්ථාවකදී එකී අවලංගු කරන ලද ඡන්ද මධ්‍යස්ථාන සඳහා නැවත ඡන්දයක් පැවැත්විය යුතුය.

පාර්ලිමේන්තු මැතිවරණ පනතට සිදුකරන ලද මෙම සංශෝධනයන් ඉහත කී පනතේ II සහ III කොටස් මගින් ජනාධිපතිවරණ පනතට සහ පළාත් සභා ඡන්ද විමසීම් පනතට ද සිදු කරන ලදී. මෙම ප්‍රතිපාදන අනුවද ඡන්ද මධ්‍යස්ථාන අසල ඡන්දදායකයන් හෝ ඡන්දපොල නියෝජිතයන් පලවා හැරීම්. බලහත්කාරයෙන් ඡන්ද

පෙට්ටි පිරවීම් සංවිධානාත්මකව හොර ඡන්ද දැමීම් ආදී ඡන්ද දූෂණ සිදුවීම් සිදුවන අවස්ථාවකදී ඡන්ද මධ්‍යස්ථානය අවලංගු කිරීම සම්බන්ධව ඍජු ප්‍රතිපාදන නොතිබිණි.

## 5.3. කලබල සිදුවූ ඡන්ද මධ්‍යස්ථාන අවලංගු නොකිරීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනයකි.

**මැදිවක (එගොඩවෙල) එදිරිව දයානන්ද දිසානායක මැතිවරණ කොමසාරිස් සහ තවත් අය**

Mediwake and Others v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (20011) I  Sri L.R. 177

### පසුබිම

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම සඳහා පසුබිම් වූයේ 1999 ජූනි 4 වන දින පැවති මධ්‍යම පළාත් පළාත් සභා ඡන්ද විමසීමේදී මහනුවර දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාවල සිදුවූ සිදුවීම්ය. පෙත්සම්කරුවන් විසින් පෙත්සම මගින් පෙන්වා දී ඇති පරිදි ඡන්ද මධ්‍යස්ථාන 23ක මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවී තිබිණි. ඒ අතරින් ඡන්ද මධ්‍යස්ථාන 12කම බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටි පිරවීම් වාර්තා වී තිබිණි. අනෙක් ඡන්ද මධ්‍යස්ථාන වල ඡන්දපොල නියෝජිතයන් සහ ඡන්දදායකයන් පලවාහැරීම්, ඡන්ද දායකයන් බියවැද්දීම් ආදී සිදුවීම් වාර්තාවී තිබිණි. එම සිදුවීම් සම්බන්ධයෙන් පැමිණිලිද සිදුකර ඇත, නමුත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් අවලංගු කරන ලදදේ එම ඡන්ද මධ්‍යස්ථාන අතරින් එක් ඡන්ද මධ්‍යස්ථානයක් පමණි. එම අවලංගු කරන ලද ඡන්ද මධ්‍යස්ථානය සඳහාද නැවත ඡන්දයක් නොපවත්වන ලදී.

### මූලික අයිතිවාසිකම් පෙත්සම

ඡන්ද මධ්‍යස්ථාන 25ක් අසල කලබලකාරී සිදුවීම් වාර්තා වී තිබියදී එක් ඡන්ද මධ්‍යස්ථානයක පමණක් ඡන්දය අවලංගු කර අනෙක් ඡන්ද මධ්‍යස්ථාන අවලංගු නොකිරීම සම්බන්ධයෙන්  මෙම පෙත්සම මගින් චෝදනා නගා තිබිණි. පෙත්සමේ පෙත්සම්කරුවන් වූයේ මෙම ඡන්දවිමසීමේදී එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් නාමයෝජනා ලබාදුන් අපේක්ෂකයකු  සහ එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ඡන්දපොල නියෝජිත වශයෙන් කටයුතු කරන ලද පුද්ගලයන් තිදෙනෙකුය. සිව්දෙනාම මහනුවර දිස්ත්‍රික්කයේ ලියාපදිංචි

ඡන්දදායකයන් මෙන්ම එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන්ය. පෙත්සම මගින් වගඋත්තරතරුවන් 15 දෙනෙකු නම්කර තිබිණි. පළවෙනි සහ දෙවෙනි වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබුණෝ පිළිවෙලින් මැතිවරණ කොමසාරිස් සහ මහනුවර දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියා. තුන්වන වගඋත්තරකරු ලෙස නම්කර තිබුනේ නීතිපතිවරයාය. 4 සිට 10 දක්වා වගඋත්තරකරුවන් ලෙස මෙම මැතිවරණයට අපේක්ෂකයන් ඉදිරිපත් කළ පිළිගත් දේශපාලන පක්ෂවල මහලේකම්වරුන් නම්කර තිබිණි. 11 වන වගඋත්තකරුවූයේ මැතිවරණයට ඉදිරිපත්වූ ස්වාධීන කණ්ඩායමේ නායකයාය. 12 සිට 15 දක්වා වගඋත්තරකරුවන් ලෙස මැතිවරණයට ඉදිරිපත්වූ පොදු පෙරමුණ දේශපාලන පක්ෂයේ අපේක්ෂයන් සිව්දෙනෙකු නම්කර තිබූ අතර එකී සිව්දෙනා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරතවූ බවට පෙත්සම මගින් චෝදනා නගා තිබිණි.

1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 46අ වගන්තිය අනුව එකී ඡන්ද මධ්‍යස්ථාන අවලංගු කර 46(2) (7) යටතේ නැවත ඡන්දයක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස් කටයුතු නොකිරීම මගින් පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම සහ 14(1)(අ) ව්‍යවස්ථාව මගින් සහතිකර දී ඇති භාෂණය ඇතුළු අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම, 14(1)(ඉ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහස සහ 14(1)(උ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති එකලාව හෝ අන් අය හා සමග යම් නීත්‍යනුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළෙඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට පෙත්සම මගින් චෝදනා නගා තිබිණි.

## පෙත්සම් විභාගය

පෙත්සමේ සඳහන් වූ ආයාචනයන් අතරින් වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය මගින් පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1)(අ) ව්‍යවස්ථාවන් මගින් සහතික කර ඇති මූලික අයිතවාසිකම් උල්ලංඝනය වි තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා නඩුව විභාග කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය 1999 මැයි 25 දින ලබාදී තිබිණි.

මෙම පෙත්සම විභාග කරන ලද්දේ මාර්ක් ප්‍රනාන්දු, වඩුගොපිටිය සහ ස්මයිල් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. පෙත්සම් විභාගය 2000 ඔක්තෝබර් 17, නොවැම්බර් 16 සහ දෙසැම්බර් 4 සහ 5 යන දිනවලදී පවත්වන ලදී.

නීතිපතිවරයා විසින් මූලික විරෝධතාවයක් නගමින් මෙම පෙත්සම සඳහා චෝදනා කරනු ලබන ඡන්ද මධ්‍යස්ථාවල ජ්‍යේෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් සහ පොලිස්පතිවරයා වගඋත්තරකරුවන් ලෙස නම් කර නොමැති බැවින් මෙම පෙත්සම විභාගයට නොගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලද්දේ මෙම පෙත්සම පදනම් වී තිබෙන්නේ ඡන්ද මධ්‍යස්ථාන 23ක ඡන්දය අවලංගු කිරීමට සහ නැවත ඡන්දය පැවැත්වීම මැතිවරණ කොමසාරිස්වරයා සහ තේරීම්භාර නිලධාරිවරයා අපොහොසත් වීම මත වන අතර පොලිසියේ හෝ ජ්‍යේෂ්ඨ ඡන්දපොළ නියෝජිතයන්ගේ නොකරහැරීම් සම්බන්ධව නොවන බවයි. ඒ අනුව නීතිපතිවරයාගේ මූලික විරෝධතාවය ශ්‍රේෂ්ඨාධිකරණ විසින් බැහැර කරන ලදී.

එසේම නීතිපතිවරයා තවත් මූලික විරෝධතාවක් නගමින් මෙම සිදුවීම් සම්බන්ධයෙන් ඡන්ද පෙත්සමක් ගොනුකිරීම මගින් අගතියට පත් පාර්ෂවයන්ට සහන ඉල්ලා සිටීමේ අවස්ථාව තිබෙන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහන පැතිය නොහැකි බවයි. නමුත් මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ ඡන්ද පෙත්සම් සහ මූලික අයිතිවාසිකම් පෙත්සම් යනු ආරවුල් සහ ඊට අදාළ පිළියම් (සහන) යන දෙඅංශයෙන්ම සම්පූර්ණයෙන්ම එකිනෙකට සම්පූර්ණයෙන්ම වෙනස් නීතිමය ක්‍රියාදාමයන් වන බවයි.

එසේම 16වන වගඋත්තරකරුගේ නීතිඥයා විසින්ද මූලික විරෝධතාවක් නගමින් ප්‍රකාශ කරන ලද්දේ 16වන වගඋත්තරකරු පුද්ගලික පාර්ශවයක් වන බැවින් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට එරෙහිව මෙම නඩුව පවත්වාගෙන යා නොහැකි බවයි. අධිකරණය ප්‍රකාශ කළේ Faiz v. Attorney-General නඩු තීන්දුවේ මූලධර්මය මේ සඳහා උපයෝගී කරගන්නා බවයි.

පෙත්සම්කරුවන් විසින් සිදුවීම් සිදුවූවා යැයි ප්‍රකාශ කරන ලද ඡන්ද මධ්‍යස්ථාන 25කට අදාළව ජ්‍යේෂ්ඨ ඡන්දපොළ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ජර්නල් සටහන් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස 1වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට නියෝග කරන ලදී.

පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා සහ දෙවන වගඋත්තරකාර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීවරයා දිවුරුම් ප්‍රකාශ ගොනුකරන ලද අතර එමගින් ඇතැම් සිදුවීම් සිදුවී ඇති බව පිළිගන්නා ලදී. ඡන්ද මධ්‍යස්ථාන 15 කට අදාලව සංවිධානාත්මක හොර ඡන්ද දැමීම්, එක්සත් ජාතික පක්ෂයේ ඡන්දපොල නියෝජිතයන් පලවා හැරීම්, ඡන්ද මධ්‍යස්ථාන අසල විශාල වශයෙන් රංචු ගැසීම්, ඡන්දදායකයින් බියවැද්දීම් ආදිය ජ්‍යෙෂ්ඨ ඡන්දපොල නිලධාරීන් සහ සහකාර තේරීම්භාර නිලධාරීන් විසින් වාර්තා කර තිබෙණ බව එමගින් අධිකරණයට වාර්තා විය. මෙම චෝදනාවන් මැතිවරණයට තරඟ වැදුන දේශපාලන පක්ෂවල මහ ලේකම්වරුන් (වගඋත්තරකරුවන්) විසින්ද ප්‍රතික්ෂේප කර නොතිබිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

වඩුගොපිටිය සහ ස්මයිල් යන විනිසුරුවරුන්ගේ එකඟතාවයෙන් යුක්තව මෙහි ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 2001 අප්‍රේල් 3 වන දින මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. පෙත්සම්කරුවන් සියලු දෙනාම අදාළ දිස්ත්‍රික්කයේ ඡන්දදායකයන් වූ බැවින් මෙම පෙත්සම මගින් ඉල්ලා ඇති සහන ඉල්ලීම සඳහා ඔවුන්ට නඩු පැවරීමේ බලය පවතින බව ප්‍රකාශ කරන ලදී. එසේම ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවූ ඡන්ද මධ්‍යස්ථාවල ඡන්දය අවලංගු නොකිරීම පිළිබඳව අදහස් දක්වන මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා සිය තීන්දුවෙන් ප්‍රකාශ කරන ලද්දේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 46(අ)(2) වගන්තියට අනුකූල නොවන සෑම නොකර හැරීමක්ම සම්බන්ධයෙන් ස්වයංක්‍රියවම ඡන්දය අවලංගු කිරීමක් අවශ්‍ය නොවන බව සත්‍යයක් වන අතර අදාළ වගන්තියේ "හැකිය" යන වචනය යොදා තිබීමෙන් මැතිවරණ කොමසාරිස්වරයාට අභිමතයක් ලබාදී ඇත. කෙසේ වෙතත් එය රාජකාරියක් සම්බන්ධ වූ අභිමතයකි. ඔප්පුකරන ලද සිදුවීම් නිදහස්, සමානත්වයෙන් යුතු සහ රහස් ඡන්දයකට බාධා කර ඇති බව පෙනී යන සෑම අවස්ථාවකම එම අභිමතය භාවිතා කළ යුතුය.

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 50 වන වගන්තිය අනුව සෑම ඡන්ද පෙට්ටියක්ම විවෘත කර ඡන්ද පත්‍රිකා ගණන් කළ පසු එම ගණන් කිරීමේ මධ්‍යස්ථානයේ සියලුම පෙට්ටිවලින් ලබාගත් ඡන්ද පත්‍රිකා මිශ්‍ර වේ. එම ඡන්ද පත්‍රිකා ඉවත් කළ හැකියැයි උපකල්පනය කළත්, වසර දෙකකට පසුව මෙම අවස්ථාවේ නැවත ඡන්දයක් සඳහා නියෝගයක් ලබාදුන්නත් එහිදී භාවිතා වන්නේ පෙර පැවති ඡන්ද නාමලේඛනය නොවේ. එම ඡන්ද නාමලේඛනයම නියම කළත් ඇතැම්

ඡන්දදායකයන් ජීවත් නොවනවා විය හැකියි. වර්ථමාන ඡන්ද නාමලේඛනය නියම කළහොත් ඇතැම් ඡන්දදායකයින් පෙර පැවති මැතිවරණයට සුදුසුකම් ලත් ඡන්දදායකයින් නොවේ.

එබැවින් ප්‍රශ්නගත ඡන්ද මධ්‍යස්ථාවල ඡන්දය අවලංගුකර නැවත ඡන්දයක් පැවැත්වීමේ නියෝගයක් පළවෙනි වගඋත්තරකරුට නිකුත් කිරීම අධිකරණයට මෙම අවස්ථාවේදී සිදුකළ නොහැකි දෙයක් බව විනිසුරුවරයා සිය තීන්දුවේ ප්‍රකාශ කරන ලදී.

නමුත් පළවෙනි සහ දෙවෙනි වගඋත්තරකරුවන්ගේ විසින් ප්‍රශ්න ගත ඡන්ද මධ්‍යස්ථාන සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදු සිදුකර ඡන්ද මධ්‍යස්ථානවල ඡන්දය අවලංගු නොකිරීම මගින් පෙත්සම්කරුවන්ගේ 12(1) සහ 14(1)(අ) ව්‍යවස්ථා යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව අධිකරණය තීරණය කරන ලදී.

පෙත්සම්කරුවන් වන්දි මුදලක් ආයාචනය කර නොමැති වුවද ඔවුන් අධිකරණයට පැමිණ ඇත්තේ වැදගත් මූලික අයිතිවාසිකමක් වෙනුවෙන් වන බව නිරීක්ෂණය කළ අධිකරණයට ඔවුන්ට නඩු ගාස්තු ලබාගැනීමේ අයිතිවාසිකම පවතින බව තීරණය කරන ලදී.

ප්‍රමාණවත් නොවූවත් සැබෑ මැතිවරණයක් සහතික කිරීම සඳහා පළවෙනි වගඋත්තරකරු අවංකවම උත්සාහයක් ගත් නමුත් අවශ්‍ය සහයෝගය සහ සම්පත් නොලැබීම යන කරුණු සලකා බැලූ අධිකරණය ඔහුට එරෙහිව නඩු ගාස්තු ගෙවීමේ නියෝගයක් නිකුත් නොකළ අතර රජය විසින් රුපියල් පනස් දහසක නඩු ගාස්තුවක් පෙත්සම්කරුවන්ට ගෙවිය යුතු බවට නියෝග කරන ලදී.

## 5.4 කලබල ඇති ඡන්ද මධ්‍යස්ථාන අවලංගු කිරීම සඳහා අතිරේක බලතල.

**ආචාර්ය අර්ජුන පරාක්‍රම එදිරිව දයානන්ද දිසානායක**

**Dr.Arjuna Parakarama v. Dayananda Dissanayake & 10 Others-SC/FR 640/2000- S.C.M.25.02.2002**

## පසුබිම

2000 අගෝස්තු 28 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඇතැම් ඡන්ද මධ්‍යස්ථාන තුළ කලබලකාරී සිදුවීම් සහ බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටි පිරවීමේ සිදුවීම් වාර්තා විය. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කය තුළ ඡන්ද මධ්‍යස්ථාන තුළ විශේෂයෙන් කලබලකාරී තත්ත්වයන් වාර්තාවිය. මැතිවරණ කොමසාරිස්වරයා විසින් දිස්ත්‍රික්ක 6ක ඡන්ද මධ්‍යස්ථාන 22ක් අවලංගු කර තිබිණි. නමුත් කලබල සහ බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටි පිරවීම් සිදුවීම් වාර්තා වු ඇතැම් ඡන්ද මධ්‍යස්ථානවල ඡන්දය අවලංගු නොකරන ලදී. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ තත්ත්වය වඩාත් බරපතල විය. මේ අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඡන්ද මධ්‍යස්ථාන අවලංගු කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදයේ අතාර්කික බව පිළිබඳ ගැටලු මතුවිය. සිවිල් සමාජ ක්‍රියාකාරිකයකු මෙන්ම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ සම්බන්ධිකාරකවරයා වූ ආචාර්ය අර්ජුන පරාක්‍රම විසින් මේ සම්බන්ධව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරණ ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

මැතිවරණ කොමසාරිස්වරයා, පාර්ලිමේන්තු මැතිවරණ සඳහා නාමයෝජනා ඉදිරිපත් කර තිබූ සියලුම දේශපාලන පක්ෂවල මහලේකම්වරුන් සහ නීතිපතිවරයා මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

2000 මැතිවරණයේදී දිස්ත්‍රික්ක ගණනාවක ඡන්ද මධ්‍යස්ථාන රැසක ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවී ඇති බව මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය නිරීක්ෂණය කර ඇති බව පෙන්වා දුන් පෙත්සම්කරු එම තත්ත්වය නිසා පුරවැසියන්ට සිය ඡන්ද අයිතිය නිදහස්ව සහ නිසිපරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත්, නිදහස් සහ සාධාරණ මැතිවරණයක් නොපැවති බවත්, එබැවින් මෙම මැතිවරණ ප්‍රතිඵලයෙන් ජනතා වරම නිසි ලෙස නිරූපණය නොවන බවත්, එසේම මෙම මැතිවරණයේ ප්‍රතිඵල අනුව පාර්ලිමේන්තුවට තේරී පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ජනතාවගේ ස්වාධිපත්‍යය නිරූපණය වන නිසි පරිදී තේරී පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස සැලකිය නොහැකි බවත් පෙත්සම්කරු සිය පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙම මැතිවරණ ප්‍රතිඵලය මගින් ජනමතය නිරූපණය නොවන බවද ප්‍රකාශ කරන ලදී.

එකී ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ ඡන්ද මධ්‍යස්ථා අතරින් දිස්ත්‍රික්ක 6 ක ඡන්ද මධ්‍යස්ථාන 22ක් පමණක් අවලංගු කර ඇති බව සඳහන් කරන ලදී. නමුත් පෙත්සම්කරු විසින් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ නිරීක්ෂණ අනුව බරපතල ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ ඡන්ද මධ්‍යස්ථාන අතරින් ආසන්න වශයෙන් 1.3% ක පමණ ඡන්ද මධ්‍යස්ථාන ආශ්‍රිතව මනුෂ්‍ය ඝාතන, බලහත්කාරයෙන් ඡන්ද පෙට්ටි පිරවීම්, බෝම්බ පිපිරවීම්, ඡන්ද පෙට්ටි ඉවත් කිරීම්, හොර ඡන්ද දැමීම්, ගිණි අවි භාවිතා කිරීම්, ඡන්දදායකයන් සහ ඡන්දපොල නියෝජිතයන් පලවා හැරීම් සහ රාජ්‍ය දේපළ අයතා ලෙස භාවිතා කිරීම් සිදුවූ බව සිය පෙත්සම මගින් කියා සිටින ලදී.

නමුත් එම ඡන්ද මධ්‍යස්ථාන වල ඡන්දය අවලංගු කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා ක්‍රියාත්මක නොවූ බව පවසන ලදී. විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ඇතැම් ඡන්ද මධ්‍යස්ථා අවලංගු කරන ලෙස ආණ්ඩුවේ දේශපාලනඥයන් ද ඉල්ලා සිටින ලද බවද පෙත්සම මගින් ඔහු කියා සිටින ලදී.

මෙම හේතුව නිසා මෙම මැතිවරණය අවලංගු කරන ලෙස ඉල්ලා මැතිවරණ කොමසාරිස්වරයා වෙත 2000 ඔක්තෝබර් 10 වන දින මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය මගින් ලිපියක් යොමුකළ නමුත් ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බවත් පෙත්සම මගින් දක්වන ලදී.

මේ හේතුව නිසා මැතිවරණ දූෂණ සහ වැරදි අවම කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා ගෙන තිබූ ක්‍රියාමාර්ග අපැහැදිලි සහ අතාර්කික බවද ප්‍රකාශ කරන ලදී.

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ඉදිරිපත් කරන්නේ මහජන උන්නතිය සඳහා බව සඳහන් කර පෙත්සම්කරු සිය පෙත්සම මගින් ඉල්ලා සිටින ලද්දේ, මැතිවරණ කොමසාරිස්ගේ ඉහත විස්තර ක්‍රියාකලාපය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 14(1) ව්‍යවස්ථා මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට තීන්දුවක් ලබාදෙන ලෙසත්, මැතිවරණය පැවැත්වීමට අදාළ මාර්ගෝපදේශ සකස් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයාට නියෝග කරන ලෙසත්, ඡන්ද මධ්‍යස්ථාන අවලංගු කිරීම පිළිබඳව නිශ්චිත ක්‍රියාමාර්ග ස්ථාපනය කරන ලෙසට නියෝගයක් ලබාදෙන ලෙසත් වේ.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙත්සම් විභාගය

මෙම පෙත්සම අගවිනිසුරු සරත් එන් සිල්වා ආචාර්ය ශිරානි බණ්ඩාරනායක සහ හෙක්ටර් එස් යාපා යන විනිසුරුවරුන්ගෙන් විනිසුරු මඩුල්ල විසින් සලකා බලන ලදි. පෙත්සම්කරු විසින් පෙත්සමේ දී ඉදිරිපත් කරන ලද පරිදි මැතිවරණ කොමසාරිස්වරයා පිළිගත් දේශපාලන පක්ෂවල එකඟතාවය ඇතිව මැතිවරණයේදී සිදුවන වැරදි වැළැක්වීම සඳහා මගපෙන්වන මාර්ගෝපදේශ මාලාවක් පිළියෙල කර ඉදිරිපත් කර අධිකරණයට ඉදිරිපත් කරනු ලැබීය.

පෙත්සම්කරු මෙම මාර්ගෝපදේශ මාලාවට එකඟවී පෙත්සම ඉල්ලා අස්කරගන්නා ලදී.

මැතිවරණ කොමසාරිස්වරයා අධිකරණයට ඉදිරිපත් කළ මාර්ගෝපදේශ මාලාව

01. 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතේ 48 ඒ උප වගන්තිය යටතේ මැතිවරණ අවලංගු කිරීම.

- ⇨ තේරීම්භාර නිලධාරියාගේ පාලනයෙන් තොර යම් කිසි හේතුවක් මත මැතිවරණය පැවැත්විය නොහැකි නම්
- ⇨ ඡන්දය ප්‍රකාශ කරන කාලය තුළදී, ඡන්දපොල නියෝජිතයකුට හෝ නියෝජිතයින් වැඩි පිරිසකට තර්ජනය කළොත් හෝ පහරදුන හොත් අදාළ ඡන්ද මධ්‍යස්ථානයෙන් පන්නා දැමුවහොත්,
- ⇨ අදාළ දිනයේ මාර්ග බාධාවක් නිසා මැතිවරණ කාර්ය මංඩලයට ඡන්ද මධ්‍යස්ථානයට පැමිණිය නොහැකි වුවහොත්
- ⇨ ඡන්ද පැවැත්වීමට නොහැකි ආකාරයේ සාමයට බාධාවක් ඡන්ද මධ්‍යස්ථානයේ වුවහොත්,
- ⇨ බලහත්කාරයෙන් කිසිවකු ඡන්ද පෙට්ටි පිරවුවහොත්,
- ⇨ ඡන්ද මධ්‍යස්ථානයක සාධාරණ නිදහස් රහස් ඡන්දයක් නොවු සෑම විටෙකම,

මැතිවරණ කොමසාරිස් එම ඡන්ද මධ්‍යස්ථානය අවලංගු කරවීමේ බලය ක්‍රියාත්මක කරයි.

02. ඉහත සඳහන් කළ ආකාරයේ යම් ඡන්ද මධ්‍යස්ථානයක් තුළ ඡන්දය ප්‍රකාශ කෙරෙන කාලය තුළ එය 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ 48 ඒ (1) බී ද, 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ මැතිවරණ පනතේ 46 ඒ (1) බී උප වගන්තිය යටතේද 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනතේ 46 ඒ (1) බී යටතේද, මැතිවරණ කොමසාරිස් ඉහත සඳහන් අංක 01 කරුණු ආකාරයේ සිදුවීමක් එවැනි ඡන්ද මධ්‍යස්ථාන අවලංගු කිරීමට ඉහත සඳහන් කළ මැතිවරණ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරයි.

03. 1981 අංක 01 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 48 ඒ වගන්තිය යටතේ නව මැතිවරණයකට නියෝග කිරීම.

48 ඒ 7 යටතේ ඉහත සඳහන් කළ කරුණු මත මැතිවරණ කොමසාරිස් අවලංගු කළ බවට ප්‍රකාශ කළ ඡන්ද මධ්‍යස්ථාන වලට නව ඡන්දයක් පැවැත්වීම මැතිවරණ ප්‍රතිපල වලට එවැනි බලපෑමක් ඇති වී ඇත්තනම් මැතිවරණයේදි ගණන් කිරීමට නොහැකි වු හෝ භාවිතා වීමට තිබූ හෝ මැතිවරණ කොමසාරිස් වරයා විසින් ඒ ඒ දේශපාලන පක්ෂ නම් කළ අපේක්ෂකයන් හෝ කණ්ඩායම් ලබාගත් මනාප වලට බලපෑමක් වී ඇත්දැයි අවධානය යොමුකරයි.

ඡන්ද භාවිතා වු හෝ භාවිතා වීමට ඉඩ තිබු හෝ යන කාරණයේදී ඒ ඒ අපේක්ෂකයා ලබාගත් මනාප, ප්‍රතිඵලයට බලපෑවේ නම් පාර්ලිමේන්තු පනතේ 48 ඒ 7 46 ඒ 7 ජනාධිපතිවරණ පනත 46 ඒ 17 පළාත් සභා පනතේ වගන්ති ප්‍රකාරව කොමසාරිස් විසින් වහාම අලුත් මැතිවරණයකට දින නියම කරයි.

ජ්‍යේෂ්ඨ ස්ථානභාර නිළධාරීන් විසින් මැතිවරණ කාලය තුළ ඡන්ද මධ්‍යස්ථානයේ මැතිවරණ පැය තුළ සිදුවු සියලු සිදුවීම් වාර්තා කළ යුතු අතර ඔහුගේ ජර්නල් හා ඒ පිළිබඳ සහකාර තේරීම් භාර නිළධාරියා හා තේරීම් භාර නිළධාරියාට වහාම දැනුම් දිය යුතුය.

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ඒ කොටස, ජනාධිපතිවරණ මැතිවරණ පනතේ 119 ඒ කොටස ජනමත විචාරණ පනතේ 76 ඒ යටතේ මැතිවරණ රාජකාරී වල ඡන්ද මධ්‍යස්ථාන වල රාජකාරී කරන නිළධාරීන්ට ජර්නල් වාර්තා පවත්වා ගෙන යන ලෙසත් ඡන්ද මධ්‍යස්ථානයේ සියලු සිදුවීම් වාර්තා කරන ලෙසත් ඡන්ද මධ්‍යස්ථාන වසා දමන විට එය තේරීම්භාර නිළධාරියාට භාර දෙන ලෙසත්

පොලිස් නිළධාරීන් උපදෙස් දෙන ලෙසත් පොලිස්පතිවරයා ගෙන් ඉල්ලා තිබුණි. ජ්‍යෙෂ්ඨ ස්ථාන භාර නිළධාරීන් ගෙන් මෙම තොරතුරු ලැබීම මත  කොමසාරිස්වරයා විසින් ඉහත සඳහන් කළ මැතිවරණ පනතේ කරුණු මත සුදුසු පියවර ගනු ලබයි.

ඡන්ද මධ්‍යස්ථානයේ සිටින ඕනෑම ස්ථානභාර නිළධාරී හෝ පොලිස් නිළධාරි ඹුවුන් ගේ  ජර්නල් සටහන් වල යම් සිද්ධියක් සටහන් කිරීමට අසමත් වුවහොත්  තේරීම් භාර නිළධාරියා විසින් විනයානුකූල ක්‍රියාමාර්ග එවැන්නන්ට එරෙහිව ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා ගනු ලබයි.

මෙම මාර්ගෝපදේශ මගින් ඡන්ද ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇතිවන අවස්ථාවකදී අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය අවලංගු කිරීම හා නැවත ඡන්දයක් පැවැත්වීම සඳහා පැහැදිලි සහ ඵලදායි මගපෙන්වීමක් මැතිවරණ කොමසාරිස්වරයාට ලැබිණි.

## පෙත්සමේ ප්‍රතිඵල

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් ඒකඟතාවය පලකළ මාර්ගෝපදේශ මැතිවරණ කොමසාරිස්වරයා විසින් අනුගමනය කරනු ලැබූ බව පසුගිය මැතිවරණ කිහිපයකදීම දක්නට ලැබිණි. උදාහරණයක් ලෙස 2009 වසරේ පැවති වයඹ පළාත් සභා මැතිවරණයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ නායක්කාර්චේනෙයි ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය අවලංගු කර නැවත ඡන්ද විමසීමක් පැවැත්වීම. 2010 පාර්ලිමේන්තු මැතිවරණයේදී මහනුවර දිස්ත්‍රික්කයේ නාවලපිටිය මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද මධ්‍යස්ථාන 34ක් අවලංගුකර නැවත ඡන්ද විමසීම් පැවැත්වීම, එම මැතිවරණයේදීම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දය අවලංගු කර නැවත ඡන්දයක් පැවැත්වීම (දේශප්‍රිය (2011),14) පෙන්වා දිය හැකිය.

එසේම 2012 අංක 22 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් පළාත් පාලන ඡන්ද විමසීම් පනත (262 වන අධිකාරය) සංශෝධනය කළ අතර ඒ අනුව පළාත් පාලන ඡන්ද විමසීම් පනත සඳහා පහත සඳහන් පරිදි 72අ ලෙස නව වගන්තියක් ඇතුළත් කරන ලදී.

"72අ. ඡන්ද පොළවලදී බාධා කිරීම.

(අ)ඡන්ද දීම ආරම්භ කිරීම සඳහා වන නියමිත වේලාවේදී ඡන්ද පොළක ඡන්දය දීම ආරම්භ කිරීමට නොහැකි වීම,

(ආ) එවැනි ඡන්දපොළක ඡන්දය දීම විවෘත කිරීමට නියමිත වේලාවේ දී ඡන්දය දීම ආරම්භ කළ ද ඡන්දය දීම අවසන් කිරීමේ නියමිත වේලාව වනතුරු එය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වීම,

(ඇ) ඡන්ද ස්ථානාධිපතිවරයාගේ පාලනයෙන් බැහැර කිසියම් හේතුවක් නිසා එම ඡන්ද පොළේ දී ඡන්දය දීම පැවැත්වීමට නොහැකි වීම,

(ඈ) ඡන්දය දීමක දී බාධා කිරීමක් සිදුවන අවස්ථාවක ඡන්ද ස්ථාන නියෝජිතයන් එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට තර්ජනය කිරීම, මරණයට පත්කිරීම හෝ ඡන්දපොළෙන් පිටතට පළවා හැරීම

(ඉ) මාර්ගයේ යම් අවහිරතාවක් නිසා ඡන්දපොළ කාර්ය මණ්ඩලයට ඡන්දපොළට පැමිණීමට නොහැකි වීම,

(ඊ) ඡන්ද පොළේ දී සාමයට බාධාවන යම් සිදුවීමක් නිසා ඒ ඡන්ද පොළේ දී ඡන්දය පැවැත්වීම අපහසු වීම,

(උ) කිසියම් තැනැත්තකු විසින් බලහත්කාරයෙන් ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි තුළට දැමීම, හෝ (ඌ) කිසියම් ඡන්දපොළක සැබෑ, නිදහස්, සාධාරණ සහ රහස් ඡන්දය දීමක් නොමැති වීම,යන ස්වභාවයේ වූ ඇතැම් සිදුවීම් එම ඡන්ද පොළෙහි සිදු වූ අවස්ථාවක ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් වහාම තේරීම්භාර නිලධාරියා වෙත දැනුම් දිය යුතු අතර, එවිට ඔහු විසින් එම සිද්ධිය කොමසාරිස්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(2) කොමසාරිස්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ යම් තොරතුරක් ලැබීම මත සහ එම තොරතුරෙහි නිරවද්‍යභාවය සොයා බැලීම සඳහා අවශ්‍ය යයි සළකනු ලබන යම් පරීක්ෂණ සිදු කිරීමෙන් පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම ඡන්ද පොළෙහි ඡන්දය දීම අවලංගු බව ප්‍රකාශයට පත් කළ යුතු ය".

මෙම සංශෝධනයන් සහ ආචාර්ය අර්ජුන පරාක්‍රම එදිරිව මැතිවරණ කොමසාරිස් නඩුවේ දී සිදුවූ එකඟතා අතර සෘජු සබඳතාවක් පවතින බව එම මාර්ගෝපදේශ සහ මෙම 72අ වගන්තිය සංසන්දය කිරීමෙන් මනාව පැහැදිලි වේ.

## හයවන පරිච්ඡේදය

# නාමයෝජනා ලබා නොදුන් පුද්ගලයන් මහජන නියෝජිතයන් ලෙස පත්වීම

මහජන නියෝජිතයකු ලෙස පත්වීමට නම් සාමාන්‍යයෙන් අදාළ මැතිවරණය සඳහා නාමයෝජනා ඉදිරිපත් කර ජනතාවගෙන් වරමක් ලබාගත යුතුය. නමුත් එසේ මැතිවරණයකට ඉදිරිපත් නොවී පසුව එම මහජන නියෝජිත ආයතනයේ ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මහජන නියෝජිතයන් ලෙස පක්ෂ ලේකම්ගේ නාමයෝජනා කිරීම මත මැතිවරණ කොමසාරිස් / කොමිෂන් සභාව විසින් පත් කිරීම දක්නට තිබේ. පළාත් සභාවල හිස්වූ මන්ත්‍රී ආසන සම්පූර්ණ කිරීමේදී, පළාත් පාලන ආයතනවල හිස්වූ නියෝජිත ධුර සම්පූර්ණ කිරීමේදී මෙන්ම පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර සම්පූර්ණ කිරීමේදි ද මෙම තත්ත්වය දක්නට ලැබේ.

නාමයෝජනා ඉදිරිපත් නොකර මහජන නියෝජිතයන් ලෙස පත් කිරීම් පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීරණ කිහිපයක් මෙම පරිච්ඡේදය මගින් සාකච්ඡා කරනු ලබයි.

## 6.1. තේරීපත්වූ මන්ත්‍රීවරයකු ඉවත්වූ විට ඒ වෙනුවට මන්ත්‍රීවරයකු පත් කිරීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ඉවත්වූ විට හිස්වූ මන්ත්‍රීධූරය සම්පූර්ණ කිරීම පිළිබඳ ප්‍රතිපාදන.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ අසුන හිස්වූ අවස්ථාවක පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳව ප්‍රතිපාදන පවතින්නේ 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ V වන කොටස තුළය. මෙම

කොටසේ ඇති ඇතැම් වගන්ති 1998 අංක 15 දරණ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත මගින් සහ 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධනය වී ඇත.

එහි සඳහන් වන්නේ මැතිවරණ පෙත්සමකින් අසුන අහිමිවූ අවස්ථාවක හැර වෙනත් අවස්ථාක පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් හිස්වූ අවස්ථාවකදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13) ව්‍යවස්ථාවට අනුව අපේක්ෂකයකු නම් කර එවන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් අදාළ පක්ෂයේ මහලේකම්වරයාට දැනුම්දිය යුතු බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ හිස්වූ මන්ත්‍රීධූරය අයත්වන දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා කරන ලද ඊළඟ වැඩිම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයා ඒ හිස්වූ අසුන සඳහා තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කළ යුතු බවයි.

ඒ අනුව මැතිවරණ කොට්ඨාශයකින් තරඟ කරනු ලැබ පාර්ලිමේන්තුවට තේරී පත්වූ මන්ත්‍රීවරයකුගේ අසුන හිස්වීම සම්පූර්ණ කරනු ලබන්නේ එම නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් ඊළඟට වැඩිම මනාප ඡන්ද ලැබූ අපේක්ෂකයාගෙන් බව පැහැදිලිය. ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු ඉවත්වූ විට හිස්වූ මන්ත්‍රීධූරය සම්පූර්ණ කිරීම පිළිබඳ ප්‍රතිපාදන.

ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරයකු ගේ ධූරය හිස්වූ අවස්ථාවකදී එකී ධූරය සම්පූරණ කිරීම පිළිබඳ ප්‍රතිපාදන ඇතුළත් වන්නේ 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය තුළය. එහි සඳහන් වන්නේ "මේ වගන්තියේ මීට පෙරාතුව ඇති විධිවිධානවල කුමක් සඳහන් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ තෝරාපත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකුගේ අසුන හිස්වූ අවස්ථාවක, පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් කොමසාරිස්වරයා වෙත ඒ බව දැනුම් දිය යුතු අතර, අසුන හිස් කළ මන්ත්‍රීවරයා අයත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයකට ද නැතහොත් ස්වාධීන කණ්ඩායමකට ද ඒ පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ සාමාජිකයකුගේ නම ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යෝජනා කරන ලෙස ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය යුතුය. ඒ නාම යෝජනාව ලැබුණු විට, ඒ තැනැත්තා

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලදැයි කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කර එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ මන්ත්‍රීවරයාගේ නම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතුය"

මේ අනුව ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරයක් හිස්වූ අවස්ථාවක එම මන්ත්‍රීධුරය සම්පූර්ණ කළ යුත්තේ අදාළ මැතිවරණයේදී එම පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් නාමයෝජනා ඉදිරිපත් කළ පුද්ගලයකුගෙන්ම වීමේ අවශ්‍යතාවක් මෙම වගන්තිය තුළ දක්වා නැත.

පළාත් සභාවක තේරීපත්වූ මන්ත්‍රීවරයකු ඉවත්වූ විට ඒ වෙනුවට මන්ත්‍රීවරයකු පත් කිරීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සමානුපාතික නියෝජන ක්‍රමයක් මත පදනම් ව පැවති පළාත් සභා ඡන්ද විමසීම 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන ) පනත මගින් මිශ්‍ර ඡන්ද ක්‍රමයක් බවට පරිවර්ථනය කරන ලදී. ඒ අනුව එකී ප්‍රතිපාදනවලට අනුරූපවන පරිදි පළාත් සභාවල මන්ත්‍රීධුරයන් හිස්වන අවස්ථාවලදී පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් වන 65 වන වගන්තියද ඉහතකී සංශෝධන පනත මගින් බරපතල සංශෝධනයන්ට ලක් කරන ලදී. වර්ථමානය වන විට පළාත් සභාවක පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳව ප්‍රතිපාදන පහත පරිදි වේ.

"65(1) මියයෑම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා පළාත් සභාවක මන්ත්‍රීවරයකුගේ ධුරය හිස් වන අවස්ථාවක ඒ පුරප්පාඩුව ඇතිවීම පිළිබඳ කාරණය පළාත් සභාවේ ලේකම්වරයා විසින් කොමසාරිස්වරයා වෙත දැනුම්දෙනු ලැබිය යුතුය. කොමසාරිස්වරයා විසින්, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ පුරප්පාඩුව පුරවනු ලැබිය යුතුය.

(2) මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මන්ත්‍රීවරයකුගේ ධුරය හිස් වුවහොත් කොමසාරිස්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදය ඇතුළත එම පුරප්පාඩුව පිරවීම සඳහා තේරී පත් වී සිටින හෝ මන්ත්‍රීවරයකු වීමට නුසුදුස්සකු වී සිටින අපේක්ෂකයන් නොවන, මැතිවරණ කොට්ඨාස ලැයිස්තුවේ හෝ දිස්ත්‍රික් ලැයිස්තුවේ වෙනත් යම් අපේක්ෂකයකුගේ නම යෝජනා කරන ලෙස ධුරය හිස්කරන මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගෙන් ඉල්ලා සිටිය යුතුය. නියමිත

කාලපරිච්ඡේදය ඇතුළත එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කරනු ලැබුවහොත් ද එම පුරප්පාඩුව පිරවීම සඳහා නාමයෝජනා කරන ලද තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද්දා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයේ වූ ද අවස්ථාවෝචිත පරිදි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් එම නාම යෝජනාව සමග ඇත්නම්ද, කොමසාරිස්වරයා විසින් එම තැනැත්තා ඒ පුරප්පාඩුව ඇතිවූ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා එම පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වූ බව ප්‍රකාශයට පත් කළ යුතුය. අනෙක් අතට නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා කිරීම එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් නොකරන ලද අවස්ථාවක තේරී පත් වී සිටින හෝ මන්ත්‍රීවරයෙක් වීමට නුසුදුස්සකු වී සිටින අපේක්ෂකයකු නොවන, දිස්ත්‍රික් ලැයිස්තුවේ ඊළඟට සිටින ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වූ බව කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. එසේ තෝරා පත් කරනු ලැබූ බවට ප්‍රකාශයට පත් කරන ලද මන්ත්‍රීවරයගේ නම කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතුය.

"(3) පළාත් සභාවක (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ වන කාන්තා මන්ත්‍රීවරයකු සම්බන්ධව පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක දී, තේරී පත් වී සිටින කාන්තා අපේක්ෂකයකු හෝ මන්ත්‍රීවරයකු වීමට නුසුදුස්සකු වී සිටින කාන්තා අපේක්ෂකයකු නොවන, ඡන්ද කොට්ඨාස ලැයිස්තුවෙන් හෝ දිස්ත්‍රික් ලැයිස්තුවෙන් කාන්තා අපේක්ෂකයකු නම් කිරීමෙන් පමණක් එම පුරප්පාඩුව පුරවනු ලැබිය යුතු ය.

## පළාත් පාලන ආයතනයක සභික ධූරයක් හිස්වූ විට සභිකධූරය සම්පූර්ණ කිරීම පිළිබඳ ප්‍රතිපාදන

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ක්‍රියාවලිය 2012 අංක 22 දරණ සංශෝධන පනත මගින් සහ 2017 අංක 16 දරණ පනත මගින් සමානුපාතික නියෝජන ක්‍රමයක සිට මිශ්‍ර ක්‍රමයකට මාරු වූ අතර ඡන්ද ක්‍රමයට සිදුවූ වෙනස්කම් වලට අනුකූල වන පරිදි පළාත් පාලන ආයතන වල පුරප්පාඩු පිරවීම පිළිබඳ ප්‍රතිපාදන ද ඉහතකී පනත් මගින් සංශෝධනය වී ඇත. ඒ අනුව දැනට පවතින ප්‍රතිපාදන පිළිබඳ සඳහන් වන 66අ වගන්තියේ සඳහන් වන්නේ පළාත් පාලන ආයතනයක යම් කොට්ඨාසයක් සඳහා ඡන්දයෙන් තෝරාගනු ලැබූ

අපේක්ෂයකුගේ ධුරයක් හිස්වූ විට එම හිස්වූ ධුරය සඳහා පළමු නාමයෝජනා පත්‍රයේ හෝ අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයකුගේ නම ඉදිරිපත් කරන ලෙස ප්‍රදේශයේ තේරීම්භාර නිලධාරීයා විසින් හිස්වූ සභිකයා අයත්වූ පක්ෂයේ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා වෙත දැනුම්දිය යුතු බවයි.

එහිදී පුරප්පාඩු වී ඇත්තේ කාන්තා සභික ධුරයක් නම් පත් කළ යුත්තේද කාන්තා අපේක්ෂිකාවක් බවද තවදුරටත් සඳහන් වේ.

මේ අනුව නාමයෝජනා පත්‍රයක නම සඳහන් නොවන අයෙකු වර්ථමාන නීතිමය ප්‍රතිපාදන යටතේ පළාත් පාලන ආයතනයක ඇතිවන පුරප්පාඩුවක් සම්පූර්ණ කිරීම සඳහා පත් කළ නොහැකි බව පැහැදිලිය.

## 6.2. මැතිවරණයට තරඟ නොකර පාර්ලිමේන්තු ඇමතිවරුන් මහ ඇමතිවරුන් බවට පත්වීම

2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත සම්මත වන තෙක්ම පළාත් සභාවක් සඳහා තෝරාපත් කරගන්නා ලද මන්ත්‍රීවරයකු ඉවත් වූ අවස්ථාවක එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම පිළිබඳව නීතිමය ප්‍රතිපාදන ඇතුළත් වූයේ 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 වන වගන්තිය තුළය එහි මෙසේ සඳහන්ව ඇත.

"65(1) මියයෑම, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා පළාත් සභාවක මන්ත්‍රීවරයකුගේ ධුරය හිස් වන අවස්ථාවක ඒ පුරප්පාඩුව ඇතිවීම පිළිබඳ කාරණය පළාත් සභාවේ ලේකම්වරයා විසින් කොමසාරිස්වරයා වෙත දැනුම්දෙනු ලැබිය යුතුය. කොමසාරිස්වරයා විසින්, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ පුරප්පාඩුව පුරවනු ලැබිය යුතුය.

(2) මරණය, ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මන්ත්‍රීවරයකුගේ ධුරය හිස් වුවහොත් කොමසාරිස්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදය ඇතුළත එම පුරප්පාඩුව පිරවීම සඳහා එම පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් තේරී පත්වීම සඳහා මේ පනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු

නාම යෝජනා කරන ලෙස ධුරය හිස්කරන මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායම් නායකයාගෙන් ඉල්ලා සිටිය යුතුය. නියමිත කාලපරිච්ඡේදය ඇතුළත එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කරනු ලැබුවහොත් ද එම පුරප්පාඩුව පිරවීම සඳහා නාමයෝජනා කරන ලද තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද්දා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයේ වූ ද අවස්ථාවෝචිත පරිදි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් එම නාම යෝජනාව සමග ඇත්නම්ද, කොමසාරිස්වරයා විසින් එම තැනැත්තා ඒ පුරප්පාඩුව ඇතිවූ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා එම පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වූ බව ප්‍රකාශයට පත් කළ යුතුය. අනෙක් අතට නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා කිරීම එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් නොකරන ලද අවස්තාවක එම පක්ෂය හෝ කණ්ඩායම විසින් ඒ පුරප්පාඩුව ඇතිවූ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා භාර දෙන ලද නාම යෝජනා පත්‍රයේ එම පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් එම පළාත් සභාවට තේරී පත්වූ බව ප්‍රකාශයට පත් කරන ලද අවසාන මණ්ත්‍රීවරයා ලඟට එම පළාත් සභාවට මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ දී මනාප වැඩි ගණන ලබාගත් අපේක්ෂකයා ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ මන්ත්‍රීවරයා වශයෙන් තේරී පත් වූ බව කොමසාරිස්වරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. එසේ තෝරා පත් කරනු ලැබූ බවට ප්‍රකාශයට පත් කරන ලද මන්ත්‍රීවරයගේ නම කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතුය.

(3) ඒ නාමයෝජනා පත්‍රයේ නම් ඇතුළත්ව තිබූ සියලුම අපේක්ෂකයන් තේරී පත්වී ඇති බවට ප්‍රකාශයට පත් කර ඇති හෝ, ඒ නාමයෝජනා පත්‍රයේ නම් ඉතිරිව ඇති අපේක්ෂකයන්ගෙන් කිසිවකුට මනාප ඡන්ද කිසිවක් ලැබී නොමැති හෝ, ධුරය හිස් කරන මන්ත්‍රීවරයා පරිපාලන දිස්ත්‍රික්කයකින් තෝරා පත් කරගනු ලැබූ මන්ත්‍රීවරයකු නොවන හෝ අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් අප්‍රමාදව, ඒ බව ජනාධිපතිවරයාට දැනුම්දිය යුතු අතර, ඒ දැනුම් දීම ජනාධිපතිවරයා වෙත ලැබුණු විට සහ සුදුසු යැයි ඔහු අදහස් කරන කවර හෝ අවධියකදී ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ආඥාවක් මගින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඡන්ද විමසීමක් පවත්වන ලෙස කොමසාරිස්වරයාට විධාන කළ හැකිය. මේ

වගන්තිය යටතේ පවත්වන ඡන්ද විමසීමකට හා ඒ ඡන්ද විමසීමක් සම්බන්ධයෙන්, මේ පනතේ විධිවිධාන අදාළ වන්නේය. මේ වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කරන ලද ආඥාවක් ප්‍රකාර පවත්වන ඡන්ද විමසීමකදී පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගන්නා ලද සෑම තැනැත්තකුම, ඔහු අනුප්‍රාප්ත වන මන්ත්‍රීවරයාගේ ධූර කාලයෙන් නො ගෙවී ඉතිරිව ඇති කාල සීමාව සඳහා ධූරය දැරිය යුතුය"

මෙම ප්‍රතිපාදන අනුව පළාත් සභාවක මන්ත්‍රීවරයකු ඉල්ලා අස්වීමකදී අදාළ පක්ෂයේ ලේකම්වරයා විසින් නාමයෝජනා ඉදිරිපත් කරන පුද්ගලයා එකී මැතිවරණය සඳහා එම පක්ෂයෙන් නාම යෝජනා ඉදිරිපත් කළ පුද්ගලයකු වීම අත්‍යවශ්‍ය නොවේ.

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 වගන්තියේ මෙම ප්‍රතිපාදන අවභාවිතා කරමින් පාර්ලිමේන්තු ඇමතිවරුන් පළාත් සභා ඡන්දයට තරඟ නොකර පසුව මහ ඇමතිවරුන් වීමේ ප්‍රවණතාවක් 1990 දශකයේ අගභාගයේදී ආරම්භ විය. එහිදී සිදුවන්නේ අදාළ අමාත්‍යවරයාගේ සමීපතමයෙක් බොහෝවිට බිරිඳ, අදාළ පළාත් සභා මැතිවරණයට නාමයෝජනා ඉදිරිපත් කර තරඟ කර ජයග්‍රහණය කරයි. මෙම මැතිවරණ ව්‍යාපාරයේදී අදාළ අමාත්‍යවරයා ක්‍රියාකාරීව සම්බන්ධ වන අතර තමන් ඉදිරියේදී මහ ඇමතිවරයා වන බැවින් තම බිරිඳ ජයග්‍රහණය කරන ලෙසද කියා සිටියි. මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව අදාළ ඇමති බිරිඳ මහ ඇමති ලෙස දිවුරුම් දෙයි. ඊට ටික දිනකට පසුව එම පක්ෂය නියෝජනය කරන පළාත් සභා මන්ත්‍රීවරයකු ඉල්ලා අස්වන අතර අමාත්‍යවරයාද පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයෙන් ඉල්ලා අස්වෙයි. ඉන්පසුව පක්ෂ ලේකම්වරයා එම හිටපු අමාත්‍යවරයාව අදාළ ඉල්ලා අස්වූ මන්ත්‍රීවරයා ගේ අනුප්‍රාප්තිකයා ලෙස මැතිවරණ කොමසාරිස්වරයාට නාමයෝජනා කරනු ලබයි. ඒ අනුව ඔහු පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස මැතිවරණ කොමසාරිස් විසින් ගැසට් පත්‍රයේ පලකරනු ලබයි. ඉන් පසුව එතෙක් මහ ඇමතිධූරය දරණ ලද ඇමති බිරිඳ මහ ඇමති ධූරයෙන් ඉල්ලා අස්වන අතර ඒ වෙනුවට මෙම අභිනව මන්ත්‍රීවරයා මහ ඇමති ලෙස පත් කරනු ලබයි. මෙම රටාවට පළාත් සභා මැතිවරණය පවතිද්දී පාර්ලිමේන්තුවේ අමාත්‍යවරුන් ලෙස කටයුතු කළ අමාත්‍යවරුන් කිහිප දෙනෙකුම මහ ඇමතිවරුන් බවට පත්විය.

## 6.3 අපේක්ෂකයන් ඉල්ලා අස්වීම මගින්ද නාමයෝජනා ලැයිස්තුව අවසන් විය හැකිය

**දේවානන්ද එදිරිව දයානන්ද දිසානායක**
**Devananda v. Dayananda Dissanayake (2000) 3 Sri LR. 127**

### පසුබිම

මෙම නඩුවේ පෙත්සම්කරු වූයේ ඊ.පී.ඩී.පී සංවිධානයේ මහලේකම්වරයා ද වූ ඩග්ලස් දේවානන්දය, 1994 වසරේදී ඩග්ලස් දේවානන්ද යාපනය මැතිවරණ කොට්ඨාශය සඳහා තරඟ කරන ලද්දේ ස්වාධීන කණ්ඩායමක් මගිනි. එම කණ්ඩායමේ 13 දෙනෙකු නාමයෝජනා ඉදිරිපත් කරන ලද අතර ඉන් 9 දෙනෙකු පාර්ලිමේන්තුවට තේරී පත්විය. පසුව 9 වෙනි ස්ථානයේ සිටි මන්ත්‍රීවරයා ඉල්ලා අස්වන ලද අතර 10 වන ස්ථානයට මනාප ලබාගත් අපේක්ෂකයා මන්ත්‍රීවරයකු ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. 11, 12 සහ 13 යන ස්ථාන ලබාගත් අපේක්ෂකයන් ස්වාධීන කණ්ඩායමෙන් ඉල්ලා අස්වන ලදී, 10 වෙනියාට මනාප ලබාගෙන පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයකු වූ අපේක්ෂකයා සහ 4වන ස්ථානයට මනාප ලබාගෙන පාර්ලිමේන්තුවට පිවිසි අපේක්ෂකයාව ස්වාධීන කණ්ඩායමේ සාමාජිකත්වයෙන් ඉවත් කරන ලදී.

ඉන්පසුව වගඋත්තරකරු විසින් නාමයෝජනා ඉදිරිපත් නොකරන ලද පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස පත් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයාට නාමයෝජනා කරන ලදී. නමුත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාමයෝජනා පත්‍රයේ සඳහන් අපේක්ෂකයන් අතරින් 11 සහ 12 ලෙස මනාප ලබාගත් අපේක්ෂකයන් දෙදෙනාව (මේ වන විට ස්වාධීන කණ්ඩායමෙන් ඉවත්වී ඇති) මන්ත්‍රීවරුන් ලෙස පත්වූ බවට ගැසට් පත්‍රයේ පළ කරන ලදී. එම තීරණයට එරෙහිව පෙත්සම්කරු රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

### රිට් පෙත්සම

පෙත්සමේ පළවෙනි වගඋත්තරකරු ලෙස නම්කර තිබුනේ මැතිවරණ කොමසාරිස්වරයාය. දෙවන වගඋත්තරකරු වූයේ යාපනය දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියාය. මැතිවරණයේදී 11,12 සහ 13 ස්ථානවලට මනාප ලබාගත් අපේක්ෂකයන් පිළිවෙලින් 3,4 සහ 5 වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි. 6වන වගඋත්තරකරු ලෙස නම්කර තිබුනේ පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාය.

පෙත්සම්කරු මෙම පෙත්සම ඉදිරිපත් කරන ලද්දේ 1999 අප්‍රේල් මස 4 වන දිනය. එකී පෙත්සම මගින් ඔහු ප්‍රකාශ කර සිටියේ ඊ.පී.ඩී.පී සංවිධානය සහ එක්සත් ජාතික පක්ෂය අතර අවබෝධතා ගිවිසුමක් පැවති බවත් ඒ අනුව පෙත්සම්කරුගේ නායකත්වය යටතේ ස්වාධීන අංක 2 කණ්ඩායම ලෙස මැතිවරණයට ඉදිරිපත් වූ බවත් නාමයෝජනා පත්‍රයේ ඊ.පී.ඩී.පී සංවිධානයෙන් අපේක්ෂකයන් 10 දෙනෙකුද එක්සත් ජාතික පක්ෂයෙන් අපේක්ෂකයන් 3 දෙනෙකුද ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී. මෙම පෙත්සමේ 3,4 සහ 5 වගඋත්තරකරුවන් වූයේ එම එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයන්ය. ඒ අනුව මැතිවරණයෙන් අපේක්ෂකයන් 9 දෙනෙකු පාර්ලිමේන්තුවට තේරී පත්වූ බවත් මැතිවරණයෙන් පසුව එක් අපේක්ෂකයෙක් ඉල්ලා අස්වීම නිසා නාමයෝජනා ලැයිස්තුවේ 10 වන ස්ථානයට ඡන්ද ලබාගත් අපේක්ෂකයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් කළ බවත් ඉන්පසුව තවත් අපේක්ෂකයින් දෙදෙනෙකු පක්ෂයෙන් නෙරපන ලද බවත් පෙත්සම්කරු ප්‍රකාශ කරන ලදී. මෙම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පක්ෂයෙන් නෙරපීමේ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ද තහවුරු කරන ලද බවත් 11 සිට 13 දක්වා මනාප ලබාගත් අපේක්ෂකයින් කණ්ඩායමෙන් ඉල්ලා අස්වී තිබූ බැවින් නාමයෝජනා පත්‍රයේ අපේක්ෂකයන් නොමැති බැවින් වෙනත් පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස ඉදිරිපත් කළ නමුත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් 11 සහ 12 ලෙස මනාප ඡන්ද ලබාගත් අපේක්ෂකයන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස 1999-04-08 වන දින අංක 1074/10 දරණ අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ බවත් පෙත්සම්කරු පෙත්සම මගින් කියා සිටින ලදී. ඔවුන් ඒ වන විටත් ස්වාධීන කණ්ඩායමෙන් ඉල්ලා අස්වූ අපේක්ෂකයන් බැවින් මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණය අභියෝගයට ලක් කරමින් පෙත්සම්කරු පහත සහන ඉල්ලාසිටින ලදී.

I. 3 සහ 3 වගඋත්තරකරුවන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස පවත්වූ බවට 2වන වගඋත්තරකරු ලබාදුන් සහතිකය බලරහිත කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස.

II. 3 සහ 4 වගඋත්තරකරුවන් 1981 අංක1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බවට පත් කරන බවට නිවේදනය කරමින් මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනය බල රහිත කරන සර්ෂියොරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස.

III. ඉදිරි පත්කිරීම් වලදී 5 වන වගඋත්තරකරු පත් කිරීමෙන් වැළැක්වීමේ මැන්ඩාමුස් ආඥාවක් නිකුත් කරන ලෙස

IV. යාපනය දිස්ත්‍රික්කයේ ස්වාධීන කණ්ඩායම් 2 හි නාමයෝජනා පත්‍රය අවසන් වී ඇති බවට සලකන ලෙස 1 හා 2 වගඋත්තරකරුවන්ට එරෙහිව මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙස.

V. පුරප්පාඩු වූ මන්ත්‍රීධූර සඳහා පෙත්සම්කරුගෙන් නාමයෝජනා ඉල්ලා සිටින ලෙස 1වන වගඋත්තරකරුට එරෙහිව මැන්ඩාමුස් ආඥාවක් නිකුත් කරන ලෙස.

එසේම පෙත්සම ආරම්භයේදීම 3 සහ 4 වගඋත්තරකරුවන්ගේ මන්ත්‍රීධූර මෙම පෙත්සම් විභාගය අවසන් වනතෙක් නවත්වන අතුරු තහනම් නියෝගයක් ලබාදෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

## රිට් පෙත්සම් විභාගය

පෙත්සම විභාග කරන ලද්දේ යාපා සහ කුලරත්න යන අභියානාධිකරණ විනිසුරුවරුන් විසිනි. පෙත්සම් විභාගය ආරම්භයේදීම පෙත්සම විසින් ඉල්ලා සිටින ලද අතුරු තහනම් නියෝගය ලබාදීම අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එකී තීරණයට එරෙහිව පෙත්සම්කරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් සිදුකළ අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනා පෙත්සම විභාගය අවසන් වනතෙක් 3 සහ 4 වන පෙත්සම්කරුවන් මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කිරීම වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලදී. (නඩු අංක S.C. Spl. L.A.No.96 /99) පෙත්සම් විභාගයේදී 5 වන වගඋත්තරකරු විසින් තමන් ඉල්ලා අස්වූ බව පිළිගන්නා ලදී. නමුත් 3 සහ 4 වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටියේ පෙත්සම්කරු විසින් නාමයෝජනා පත්‍ර සකස් කරන අවස්ථාවේදී බොහෝ කොලවලට අත්සන් ලබාගත් බවත්, තමන් පෙත්සම්කරුවෙත ඉල්ලා අස්වීමක් භාරනොදුන් බවත් තමන් අත්සන් කරන ලද හිස් කොල භාවිතා කරමින් පෙත්සම්කරු ව්‍යාජ ලෙස ඉල්ලා අස්වීමේ ලිපි සකස් කර ඇති බවත්ය. නමුත් පෙත්සම්කරු විසින් එසේ හිස්කොලවලට අපේක්ෂකයන්ගෙන් අත්සන් ලබා ගැනීමක් සිදු නොකළ බවට පෙත්සම්කාර පාර්ශවයෙන් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර තිබිණි.

## පෙත්සම් විභාගයේ තීරණය

පෙත්සම් විභාගයේ තීරණය කුලරත්න විනිසුරුවරයාගේද එකඟතාව මත හෙක්ටර්යාපා විනිසුරුවරයා විසින් 2000 අගෝස්තු 04 වන දින ලබාදෙන ලදී. එහිදී ඉදිරිපත් වූ කරුණු අනුව 3 සහ 4 වගඋත්තරකරුවන්ගේ ඉල්ලා අස්වීම් අව්‍යාජ ඉල්ලා අස්වීම් බවට තීරණය කරන ලදී.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93(13)(ආ) ප්‍රතිපාදනද එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101(1) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනද සැලකිල්ලට ගත් විනිසුරුවරයා එකී ව්‍යවස්ථාවන්ගෙන් පැවරී ඇති බලය මත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1988 අංක 5 දරන පනතේ 17 වන වගන්තිය මගින් සංශෝධිත 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 වගන්තිය අවධාරණය කරන ලදී.
එහි සඳහන් වන්නේ

"යම් මැතිවරණ කොට්ඨාශයක් වෙනුවෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයේ නම් දැක්වෙන සියලුම අපේක්ෂකයන් තේරී පත්වීම නිසා හෝ අන්‍යාකාරයකින් අවසන් වී ඇති සහ ඉන් පසුව ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද සාමාජිකයකුගෙන් පිරවිය යුතු පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක ආසනය හිස් කළ මන්ත්‍රීවරයා අයත්ව සිටි පක්ෂයේ හෝ කණ්ඩායමේ නාමයෝජනා පත්‍රයේ ඒ පුරප්පාඩුව පිරවීමට තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කිරීම සඳහා අපේක්ෂකයකු ඉතිරිවී නොමැති බව ඒ මැතිවරණ කොට්ඨාශයේ තේරීම් භාර නිලධාරයා විසින් කොමසාරිස්වරයා වෙත දැනුම්දිය යුතුය"

ඒ අනුව මෙහි සඳහන් "අන්‍යාකාරයෙන්" යන්නට පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් නෙරපීම හෝ ඉල්ලා අස්වීමද ඇතුළත් වන බව තීරණය කළ විනිසුරුවරයා ඒ අනුව පෙත්සම මගින් ඉල්ලා සිටින ලද රිට් ආඥා නිකුත් කරන ලදී.

## අභියාචනාධිකරණ තීරණයේ බලපෑම

මෙම පෙත්සම ගොනුකරන ලද්දේ 1999 අප්‍රේල් මස 4 වන දිනය. තීන්දුව ලබාදුන්නේ 2000 අගෝස්තු 04 දිනය. 1994 වසරේදී පත්වූ පාර්ලිමේන්තුව 2000 අගෝස්තු මස 18 වන දින විසුරුවා හරින ලදී. (https://www.parliament.lk/si/duration-of-parliament -2022-02-03)

## 6.4 ඡන්ද විමසීම සිදුවන අවස්ථාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ අයෙකු පළාත් සභාවට පත්කළ නොහැක.

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා තවත් අය එදිරිව දයානන්ද දිසානායක - මැතිවරණ කොමසාරිස් හා තවත් අය**
**Centre for Policy Alternatives (Guarantee) Ltd and another v Dayananda Dissanayake, Comm, of Elections and others -(2003) 1 Sri L.R 277**

### පසුබිම

1999 අප්‍රේල් මස 6 වන දින පැවති ඌව පළාත් සභා මැතිවරණය සඳහා පොදු පෙරමුණෙන් නාලිනී වීරවන්නි ඉදිරිපත් විය. එම පක්ෂය ජයග්‍රහණය කිරීම හේතුවෙන් ඇයට ප්‍රධාන අමාත්‍ය ධූරය පිරිනමන ලදී. 1999 මැයි 19 වන දින ඇයගේ ස්වාමිපුරුෂයාවූ එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුවූ සමරවීර වීරවන්නි පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස්විය. 1999 මැයි 21 වන දින පොදු පෙරමුණ නියෝජනය කළ ඌව පළාත් සභා මන්ත්‍රීවරයකුද ඉල්ලා අස්විය.

මැතිවරණ කොමසාරිස්වරයා පක්ෂ ලේකම්වරයාගෙන් පුරප්පාඩු වූ පළාත් සභා මන්ත්‍රීධූරය සඳහා සුදුසු පුද්ගලයකු නම් කරන ලෙස ඉල්ලා සිටි අතර පක්ෂ ලේකම්වරයා විසින් නම් කරන ලද්දේ ඡන්දය පැවැත්වෙන කාලයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ සමරවීර වීරවන්නිවය. ඒ අනුව 1999 මැයි 24 වන දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් සමරවීර වීරවන්නි ඌව පළාත් සභාව සඳහා මන්ත්‍රීවරයකු ලෙස ප්‍රකාශයට පත් කරන අතර එදිනම නාලිනී වීරවන්නි ප්‍රධාන අමාත්‍ය ධූරයෙන් ඉල්ලා අස්විය. පුරප්පාඩු වූ ප්‍රධාන අමාත්‍යධූරයට සමරවීර වීරවන්නි පත් කරනු ලැබීය.

### රිට් පෙත්සම

මුල් නාම යෝජනා පත්‍රයේ නම නොමැති අයකු මන්ත්‍රීවරයකු ලෙස පත් කළ නොහැකි බව පවසමින් පෙත්සම් දෙකක් 1999 ජූනි 1 වන දින අභියාචනාධිකරණයට යොමු විය. එක් පෙත්සමක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කළ අතර අනෙක් පෙත්සම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂක සහ මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ සම කැඳවුම්කරුවෙකු වූ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් ඉදිරිපත් කරන ලදී.

සමරවීර වීරවන්නි ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස තෝරාපත් කළ බවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1999 මැයි 24 වන දින නිකුත් කළ නිවේදනය බල රහිත බවට සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, සමරවීර වීරවන්නි මහතාගේ ඌව පළාත් සභා මන්ත්‍රීධූරය බලරහිත බවට ක්වෝවොරන්ටෝ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස මෙම පෙත්සම් මගින් ඉල්ලා තිබිණි.

මෙම පෙත්සම් මගින් මැතිවරණ කොමසාරිස්වරයා පළමු වගඋත්තරකරු ලෙසත්, සමරවීර වීරවන්නි දෙවන වගඋත්තරකරු ලෙසත්, පොදුපෙරමුණ පක්ෂයේ මහ ලේකම්වරයා තුන්වන වගඋත්තරකරු ලෙසත් නම්කර තිබිණි.

අභියාචනාධිකරණය රිට් පෙත්සම විභාග කළ අතර 2001 නොවැම්බර් 6 වන දින අභියාචනාධිකරණය ප්‍රකාශයට පත්කරන ලද්දේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසු පුද්ගලයකු නම්කරන ලෙස පළාත් සභා ඡන්ද විමසීම් පනතේ විධිවිධාන අනුව පක්ෂ ලේකම්ගෙන් ඉල්ලා සිටි අතර ඒ වන විට පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමට සුදුසුකම් ලබා සිටි සමරවීර වීරවන්නි මහතාව පක්ෂ ලේකම් විසින් නම් කර ඇති බැවින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඔහුව පත් කිරීම නීත්‍යානුකූල බවයි. ඒ අනුව පෙත්සම්කරුවන්ගේ පෙත්සම නිශ්ප්‍රභා කෙරිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කල අභියාචනය

පෙත්සම්කරු විසින් එකී තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය කළ අතර 2002 මැයි මස 28 වන දින එකී පෙත්සම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය හිමිවිය. ඒ අනුව මාක් ප්‍රනාන්දු, ජී.පී.එස්.ගුණසේකර හා විග්නේෂ්වරන් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ඉදිරියේ මෙම නඩුව විභාග විය.

එහිදී පළාත් සභා මැතිවරණ පනතේ ප්‍රතිපාදන අනුව මුල් නාමයෝජනාවට නම ඇතුළත් නොවූ පුද්ගලයකු හිස්වූ මන්ත්‍රීධූරයක අඩුව පිරවීම සඳහා නාමයෝජනා කිරීම නීත්‍යානුකූල, යන්න පිළිබඳව නිශ්චිත අර්ථ නිරූපණයක් සිදු කරන ලදී.

අභියාචනා විභාගය අවසානයේදී අනෙකුත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් දෙදෙනාගේද එකඟතාවය මත 2003 මාර්තු 17 වන දින විනිසුරු මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමන් සිය තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී.

පළාත් සභා ඡන්ද විමසීමේ පනතේ 65වන වගන්තිය අර්ථ නිරූපණය කළ අධිකරණය ප්‍රකාශ කරන ලද්දේ පළාත් සභා මන්ත්‍රීධුරයේ පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා පක්ෂ ලේකම්වරයා විසින් නාමයෝජනා ඉදිරිපත් කළ යුත්තේ අදාළ මැතිවරණයට නාමයෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී පළාත් සභා මන්ත්‍රීධුරයක් දැරීමට සුදුසු පුද්ගලයකු බවයි. පළාත් සභා මන්ත්‍රීධුරය සඳහා සුදුසු පුද්ගයකු යන්න පනතේ 9 වන වගන්තිය දක්වන්නේ පළාත් සභා පනතේ 3වන වගන්තිය යටතේ නුසුදුසු පුද්ගලයකු නොවිය යුතුය යන්නයි. (ඒ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයක් දැරීම නාමයෝජනා වීමට නුසුදුසුකමක් වේ) එසේම මුල් නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් නොවන පුද්ගලයකු පක්ෂ මහලේකම්වරයා විසින් නාමයෝජනා කරන විට එම පුද්ගලයා එම තනතුරට පත්වීම සඳහා කැමැත්ත ලබාදී තිබේද යන්නවත් මැතිවරණ කොමසාරිස්වරයා නොදනී. අපේක්ෂයකුගේ කැමැත්ත නාම යෝජනා පත්‍රයේ ඇත. මේ අනුව පක්ෂ මහ ලේකම්වරයාගේ නාම යෝජනා බලය මුල් නාමයෝජනා ලේඛනයේ සඳහන් නම්වලට පමණක් සීමාවේ. එම නාමයෝජනා අතරින් සුදුසු පුද්ගලයකු නාමයෝජනා කළ යුතුය. (ඇතැම්විට එම නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් අය මේ වන විට නුසුදුසු වී සිටිය හැකිය) එසේම අධිකරණය තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ වසර ගණනාවක් ප්‍රමාද වීම නිසා මෙම නඩු තීන්දුවේ ප්‍රතිඵලය නිෂ්ඵල ලෙස පෙනී යා හැකි නමුත් මෙය මහජන උන්නති හා සම්බන්ධ කරුණක් වන බැවින් මැතිවරණ කොමසාරිස්වරයා, දේශපාලන පක්ෂ ස්වාධීන කණ්ඩායම්, අපේක්ෂකයන් මෙන්ම ඡන්දදායකයන්ද පළාත් සභාවක මන්ත්‍රී පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලිය නිශ්චිතවම දැන සිටිය යුතු බවයි.

ඒ අනුව සමරවීර වීරවන්නි මහතාව ඌව පළාත් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස පත් කිරීමේ මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රකාශය අවලංගු කිරීමේ සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තිරණයේ බලපෑම

එම තීන්දුව නිකුත්වන අවස්ථාව වන විට සමරවීර වීරවන්නි මහතා මහ ඇමතිධුරයෙන් මෙන්ම අදාළ දේශපාලන පක්ෂයෙන්ද ඉවත්ව ගොසිනි.(2001 ඔක්තෝබර් 29 දින මහ ඇමතිධුරයෙන් ඉවත්විය) නමුත් මෙම නඩු පැවරීම හා නඩු තීන්දුව නිසා මුල් නාමයෝජනා පත්‍රයේ නම් ඇතුළත්ව නොමැති අයකු දේශපාලන පක්ෂ ලේකම්ගේ අභිමතය පරිදි හිස්වූ මන්ත්‍රීධුරයක් සඳහා නම් කිරීමේ දේශපාලන සංස්කෘතිය අවසන් විය.

## 6.5 පළාත් පාලන ආයතන මැතිවරණ ලැයිස්තුවේ නොමැති අයව පත් කිරීමද අභියෝගයට ලක්වේ

මසාහිර් එදිරිව තේරීම්භාර නිලධාරී - කෑගල්ල සහ තවත් අය
Masahir vs. Returning Officer Kegalle District and Others (2005) 3 Sri L,R. 39

### පසුබිම

2003 මාර්තු 20 වන දින පැවති පළාත් පාලන මැතිවරණයට මසාහිර් (පෙත්සම්කරු) එක්සත් ජාතික පක්ෂයේ නාම යෝජනා ලැයිස්තුවෙන් මාවනැල්ල ප්‍රාදේශීය සභාව සඳහා තරඟ කරන ලදී. ඡන්ද ප්‍රතිඵල අනුව එක්සත් ජාතික පක්ෂයට සභිකධූර 16ක් හිමිවිය. පෙත්සම්කරු මනාප ලැයිස්තුවේ 17 වෙනියා විය. 2003 මාර්තු 15 වන දින එක් අපේක්ෂයකු (4වන වගඋත්තරකරු) පුද්ගලික හේතුවක් මත අපේක්ෂකධූරයෙන් ඉවත්වන බව දන්වා තිබිණි. ඒ අනුව පෙත්සම්කරුව මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ සභිකධූරයක් හිමිවනු ඇතැයි ඔහු විශ්වාස කරන ලදී. නමුත් 2003 මැයි 23 වන දින පෙත්සම්කරුට දැනගැනීමට ලැබුනේ එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් (දෙවන වගඋත්තරකරු) විසින් නාමයෝජනා ලැයිස්තුවේ නොමැති පුද්ගලයකු (තුන්වන වගඋත්තරකරු) ගේ නම මාවනැල්ල ප්‍රාදේශිය සභාවේ එක්සත් ජාතික පක්ෂයේ සභිකයකු ලෙස කෑගල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීවරයා (පළමුවෙනි වගඋත්තරකරු) වෙත යෝජනා කර ඇති බවයි. මේ සම්බන්ධව පෙත්සම්කරු විරෝධතා ඉදිරිපත් කළද එම විරෝධතා නොසලකා කෑගල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් එම පුද්ගලයාව ප්‍රාදේශිය සභාවේ සභිකයකු ලෙස පත් කරන ලදී.

මෙම මැතිවරණය පවත්වන අවස්ථාව වන විට 1987 අංක 24 දරණ පළාත් පාලන ඡන්දවිමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 65අ වගන්තියේ සඳහන් වූයේ "මරණය, හෝ ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ සභිකයකුගේ ධූරය හිස් වුවහොත් දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන කාල පරිච්ඡේදයක ඇතුළත එම පුරප්පාඩුව පිරවීම සඳහා එම පළාත් පාලන ආයනතයේ සිභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා මේ ආඥා පනත යටතේ සිදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කරන ලෙස ධූරය හිස්

කරන සභිකයා අයත් ව සිටි පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතුය. නියමිත කාල පරිච්ඡේදය ඇතුළත එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කරනු ලැබුවහොත් ද එම පුරප්පාඩුව පිරවීම සඳහා නාම යෝජනා කරන ලද තැනැත්තා විසින් අවස්ථාවෝචිත පරිදි දිවුරුම් දී හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද්දා වූ ද ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ හත්වන උපලේඛනයේ දක්වා ඇති ආකාරයේ වූ ද අවස්ථාවෝචිත පරිදි වූ දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් එම නාම යෝජනාව සමග ඇත්නම් ද, තේරීම් භාර නිලධාරියා විසින් එම තැනැත්තා එම පළාත් පාලන ආයතනයේ සභිකයකු ලෙස තේරී පත්වූ බවට ප්‍රකාශයට පත් කළ යුතුය. අනෙක් අතට නිශ්චිතව සඳහන් කාල පිරිච්ඡේදය ඇතුළත නාම යෝජනා කිරීම එම ලේකම්වරයා හෝ කණ්ඩායම් නායකයා විසින් නොකරන ලද අවස්ථාවක එම පක්ෂය හෝ කණ්ඩායම විසින් භාර දෙන ලද නාම යෝජනා පත්‍රයෙන් එම පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් එම පළාත් පාලන ආයතනයට තේරී පත් වූ බව ප්‍රකාශයට පත් කරන ලද අවසාන සභිකයා ළඟට එම පළාත් පාලන ආයතනයට සභිකයන් තෝරාපත් කර ගැනීමේ දී මනාප වැඩි ගණන ලබාගත් අපේක්ෂකයා සභිකයා වශයෙන් තේරී පත්වූ බව තේරීම් භාර නිලධාරියා විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතුය."

නමුත් නාමයෝජනා පත්‍රයේ නොමැති පුද්ගලයකුව හිස්වූ සභික ධූරයට පත් කිරීම අහෝසි කරන ලෙස ඉල්ලා පෙත්සම්කරු රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

## රිට් පෙත්සම

රිට් පෙත්සම මගින් පෙත්සම්කරු කියා සිටියේ නාමයෝජනා පත්‍රයේ නොමැති පුද්ගලයකුව සභිකයකු ලෙස එක්සත් ජාතික පක්ෂයේ ලේකම් විසින් නාමයෝජනා කිරීමද, ඔහුව පුරප්පාඩු වූ සභික ධූරය සඳහා තේරීපත්වූ පත්වූ බවට කෑගල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා විසින් ප්‍රකාශ කිරීමද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 65අ වගන්තියට පටහැනි බවයි.

ඒ අනුව එම තීරණවලදී පක්ෂ මහ ලේකම් සහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ස්වභාවික යුක්තිය මූලධර්මයට අනුකූලව කටයුතු කර නොමැති බවත් කරුණු නිසි ලෙස සොයා බලා කටයුතු කර නොමැති බවත් සිය පෙත්සම මගින් පෙත්සම්කරු කියා සිටින ලදී.

ඒ අනුව නාම යෝජනා පත්‍රයේ නම සඳහන් නොවූ පුද්ගලයකු පුරප්පාඩු වූ සභික ධූරයට පත් කිරීමේ කෑගල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියාගේ ප්‍රකාශය අවලංගු කිරීමේ සර්ෂියෝරාරි රිට් ආඥාවක්ද, නාමයෝජනා පත්‍රයේ නම නොමැතිව පත්වූ සභිකයා වූ 3 වන වගඋත්තරකරුට එම සභික ධූරය දැරීමට නීත්‍යානුකූල බලයක් නොමැති බවට ප්‍රකාශ කරන ක්වෝවොරන්ටෝ රිට් ආඥාවක්ද, පෙත්සම්කරුව හිස්වූ සභිකධූරයට පත් කිරීමේ මැන්ඩාමුස් රිට් ආඥාවක්ද ඉල්ලා පෙත්සම්කරු අභියාචනාධිකරණය රිට් පෙත්සම ගොනු කරන ලදී.

මෙම රිට් පෙත්සම මගින් කෑගල්ල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී, එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්, පුරප්පාඩු වූ සභික ධූරය සඳහා පත්කරන ලද පුද්ගලයා සහ නාමයෝජනා ඉදිරිපත් කර පසුව ඉල්ලා අස්කරගත් පුද්ගලයා පිළිවෙලින් 1 සිට 4 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

## පෙත්සම් විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු ඉමාම් සහ ශ්‍රී ස්කන්ධරාජා යන විනිසුරුවරුන් විසිනි.

පෙත්සම් විභාගයේදී 3වන වගඋත්තරකරුගේ නම නාමයෝජනා පත්‍රයේ සඳහන් නොවූ බවට කරුණු ඉදිරිපත් විය. ඒ අනුව සලකා බැලිය යුතු කරුණ වූයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 65අ වගන්තියට අනුව පුරප්පාඩු වූ සභික ධූරයක් සඳහා ඕනෑම පුද්ගලයකුගේ නමක් යෝජනා කිරීමට පක්ෂ ලේකම්වරයකුට බලය තිබේද යන්නයි.

## පෙත්සම් විභාගයේ තීරණය

2005 සැප්තැම්බර් 19 වන දින ඉමාම් විනිසුරුවරයාගේද එකඟතාව මත ශ්‍රී ස්කන්ධරාජා විනිසුරුවරයා විසින් රිට් පෙත්සමේ තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. එහිදී විනිසුරුවරයා නිරීක්ෂණය කළේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 65අ වගන්තිය පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 වන වගන්තියට සමාන ප්‍රතිපාදන පවතින වගන්තියක් බවයි. ඒ අනුව මේවන විට ශ්‍රේෂ්ඨාධිකරණ විසින් තීරණය කර ඇති විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හා තවත් අය එදිරිව දයානන්ද දිසානායක - මැතිවරණ කොමසාරිස් හා තවත් අය (SC APPEAL No. 27/2002) ((2003) I Sri L, R 277) නැමති නඩුවේ තීරණය

මේ සඳහා පූර්වගාමී කරගත හැකි බවයි. ඒ අනුව පක්ෂ ලේකම්වරයාට පුරප්පාඩු වූ සභිකධූරයක් සඳහා පුද්ගලයකු නාමයෝජනා කිරීමේදී හිස් හෝ අපැහැදිලි ප්‍රතිපාදනයක් අදාළ වගන්ති මගින් ලබාදී නොමැති බව පැවසූ විනිසුරුවරයා නාමයෝජනා ලැයිස්තුවේ සඳහන් පුද්ගලයකු නම් කිරීමේ වගකීමට ඉතිරි අනු වගන්ති කියවීමේ දී පැවරෙන බවට ඉහත නඩුවේදී මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයාගේ ප්‍රකාශය උපුටා දක්වමින් 3වන වගඋත්තරකරු සභිකයකු ලෙස පත් කිරීමේ පළවෙනි වගඋත්තරකරුගේ ප්‍රකාශය අහෝසි කරමින් සර්ෂියෝරාරි ආඥාවක්ද, මාවනැල්ල ප්‍රාදේශිය සභාවේ පුරප්පාඩු වූ සභික ධූරය නීතියට අනුකූලව සම්පූර්ණ කරන ලෙස පළවෙනි වගඋත්තරකාර කෑගල්ල තේරීම්භාර නිලධාරියාට මැන්ඩාමුස් ආඥාවක්ද නිකුත් කරන ලදී.

## 6.6 පුරප්පාඩු වන ජාතික ලැයිස්තු මන්ත්‍රීධූර සම්පූර්ණ කිරීම පිළිබඳව ප්‍රතිපාදන පවතින්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ නොව පාර්ලිමේන්තු මැතිවරණ පනත තුළය

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව කබීර් හෂීම් සහ තවත් අය**
**Centre for Policy Alternatives (Guarantee) Ltd & Another v. Kabeer Hashim & Others – SC (FR) No.54/2016 S.C.M. 24.05.2016**

### පසුබිම

2015 අගොස්තු මාසයේ පැවැත්වූ පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා සරත් ෆොන්සේකා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් කොළඹ දිස්ත්‍රික්කය සඳහා තරඟ කරන ලදී. මැතිවරණ ප්‍රතිඵල අනුව ඔහු පාර්ලිමෙන්තුවට තේරී පත්වූයේ නැත.

පසුව එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු වන එම්.කේ.ඩී.එස්.ගුණවර්ධන මිය යාම නිසා එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරයක් පුරප්පාඩු විය. එම පුරප්පාඩුව සඳහා එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් විසින් සරත් ෆොන්සේකාගේ නම මැතිවරණ කොමිෂන් සභාව වෙත යෝජනා කරන ලදී. ඒ අනුව 2016 පෙබරවාරි 8 වන දින මැතිවරණ කොමිසම විසින් සරත් ෆොන්සේකාගේ නම ගැසට් පත්‍රයේ පලකළ අතර පෙබරවාරි 9 වන දින ඔහු පාර්ලිමේන්තුවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම්

දෙන ලදී. මෙම ක්‍රියාවලිය මගින් තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බව පවසමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂක ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් මූලික අයිතිවාසිකම් නඩුවක් පවරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

පළමු පෙත්සම්කරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලිය. යහපාලනය, පරිපාලන නීතිය හා රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධව රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශයේ මැදිහත්වී සිදුකරන සංවිධානයක් බවත් දෙවන පෙත්සම්කරු එහි විධායක අධ්‍යක්ෂකවරයා බවත් පෙත්සමේ සඳහන් විය. පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා, සරත් ෆොන්සේකා, කථානායකවරයා, පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා, මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් තිදෙනා සහ නීතිපතිවරයා පිළිවෙලින් 1 සිට 8 දක්වා වගඋත්රකරුවන් ලෙස නම්කර තිබිණි.

2වන වගඋත්තරකරු ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයෙන් කොළඹ දිස්ත්‍රික්කය සඳහා තරග කළ බවත්, 2016 ජනවාරි 20 දින එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු වන එම්.කේ.ඩී.එස්.ගුණවර්ධන මියගිය බවට ප්‍රවෘත්ති පත්‍රවල පලවී තිබූ බවත් ඉන් පසුව අගමැති රනිල් වික්‍රමසිංහ සමග දෙවන වගඋත්තරකරු ගිවිසුමකට එළඹෙන බවට 2016 පෙබරවාරි 3 වන දින පුවත්පත් වාර්තා කර තිබූ බවත්, දෙවන වගඋත්තරකරුගේ නම මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 8 දින ගැසට් පත්‍රයේ පලකළ බවත්, 9 වන දින දෙවන වගඋත්තරකරු 3වන වගඋත්තරකරු ඉදිරියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දුන් බවටත් පෙත්සම් කරුවන් විසින් අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කර තිබිණි.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය උපුටා දක්වමින් එහි සඳහන් වන ආකාරයට ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීධූරයක් හිස්වූ අවස්ථාවකදී පක්ෂයේ ලේකම් හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා විසින් ඒ පක්ෂයේ හෝ කණ්ඩායමේ සාමාජිකයකුගේ නම ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යෝජනා කරන ලෙස දේශපාලන පක්ෂයේ ලේකම්ට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට දැන්විය යුතුය යන්න උපුටා දක්වමින් එකී පනත පනවා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101 වන ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට ලබාදී ඇති බලතල අනුව බැවින් අගතියකින්

තොරව පනත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ආනුශංගික වන බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ ජාතික ලැයිස්තුවෙන් ඉදිරිපත් කළ මන්ත්‍රීවරයකුගේ අසුනක් පුරප්පාඩු වූ විට එය සම්පූර්ණ කළ යුත්තේ ජාතික ලැයිස්තුවේ සාමාජිකයන් අතරින් හෝ එම නාමයෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී පක්ෂයේ සාමාජිකයකු වූ අයෙකුගෙන් බව සඳහන් කළ පෙත්සම්කරුවන් දෙවන වගඋත්තරකරු නාමයෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී වෙනත් පක්ෂයක සාමාජිකයකු ලෙස කටයුතු කළ බැවින් මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම නිසිපරිදි සිදුකර නොමැති බව සිය පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී.

මෙම ක්‍රියාවලිය හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව,12(1) ව්‍යවස්ථාව 14(1)(අ) ව්‍යවස්ථාව සහ 14(1)(ඇ) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට ප්‍රකාශයක් සිදුකරන ලෙසත් දෙවන වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය බල රහිත බවට ප්‍රකාශයක් සිදුකරන ලෙසත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

අගවිනිසුරු ශ්‍රීපවන් සහ සිසිර ද ආබෲ සහ නලින් පෙරේරා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසින් මෙම පෙත්සම විභාගයට ගත යුතුද යන්න පිළිබඳ මූලික විභාගය සිදුකරන ලදී. එහිදී පෙත්සම්කරුවන්ගේ සහ වගඋත්තරකරුවන්ගේ සැලකිරීම්වලට සවන්දුන් විනිසුරු මණ්ඩලය වෙනුවෙන් අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව මත අගවිනිසුරුවරයා විසින් 2016 මැයි මස 24 දින තීරණය ලබාදෙන ලදී. අගවිනිසුරුවරයා එහිදී ප්‍රකාශ කරන ලද්දේ 2 වන වගඋත්තරකරුගේ නම එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තුව මගින් හෝ දිස්ත්‍රික් නාමයෝජනා ලැයිස්තුවක් මගින් 2015 පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා ඉදිරිපත් වී නැති තත්ත්වයක් තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(අ) ව්‍යවස්ථාව යටතේ පත්වූ එම්.කේ.ඩී.එස්.ගුණවර්ධන මහතාගේ ඇබෑර්තුවූ අසුනට පත් කිරීම පිළිබඳව පෙත්සම්කරුවන් චෝදනා කරන බවයි. 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය මගින් ඇබෑර්තුවූ මන්ත්‍රී ආසන පිරවීම පිළිබඳව ප්‍රතිපාදන විස්තර කර ඇති බවයි. මැතිවරණයකින් පසුව ඇතිවන ඇබෑර්තු සම්පූර්ණ කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(අ) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ඇසුරු කිරීමට අධිකරණයට නොහැකි බවට අධිකරණයේ මතය වන බව පැවසූ අගවිනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ 99(අ) ව්‍යවස්ථාව

මැතිවරණයකින් පසුව පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඇබෑර්තු සම්පූර්ණ කිරීම තරම් දිගු නොවන බවයි. ඒ අනුව මෙම පෙත්සම විභාග කිරීමට අවසර දීමට තරම් නීතිමය පදනමක් අධිකරණයට ප්‍රදර්ශනය නොවන බැවින් පෙත්සම් විභාගයට අවසර ලබා නොදෙන බවට තීරණය කරන ලදී.

හත්වන පරිච්ඡේදය

# මැතිවරණ ප්‍රචාරක වියදම්

මැතිවරණයක් නිදහස්ව සහ සාධාරණව පැවැත්වීමට නම් සෑම අපේක්ෂයකුටම සමාන තරඟ බිමක් නිර්මාණය කළ යුතුය. ආර්ථික හැකියාව මත ඡන්දයක් ජයග්‍රහණය කිරීම මගින් මැතිවරණයක සුපිළිපන්න බව සහ ජනතා වරම අභියෝගයට ලක්වේ. මැතිවරණ ප්‍රචාරක වියදම් නියාමනය කිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන සම්මත කරන්නේ එම මැතිවරණයක නිදහස් සහ සාධාරණ බව ආරක්ෂා කිරීම සඳහාය. වර්තමාන නීති තත්ත්වය තුළ මැතිවරණ වියදම් නියාමනය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන කිසිදු මැතිවරණ පනතක් තුළ අන්තර්ගත නොවේ. මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබන්නේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාව තුළ ඇතුළත් වූ මැතිවරණ ප්‍රචාරණ වියදම් නියාමනය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සහ එම ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුතීන්දු කිහිපයක් පිළිබඳවයි.

## 7.1. මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳ නීති ප්‍රතිපාදන

මැතිවරණයක අපේක්ෂකයන් සහ තරඟ වදින දේශපාලන පක්ෂ විසින් සිදුකරනු ලබන වියදම් නියාමනය පිළිබඳව බොහෝ කතා බහ සිදුවන නමුත් වර්තමානයේ එවැනි නීතියක් බලාත්මකව නොමැත. නමුත් 1946 (ලංකා පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව තුළ එවැනි ප්‍රතිපාදන ඇතුළත් විය. ඒ අනුව එම පනතේ 70 වගන්තිය මැතිවරණයක මැතිවරණ වියදම් පිළිබඳව ප්‍රකාශයක් වාර්තා කිරීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.

ඒ අනුව මැතිවරණයේ ප්‍රතිඵල ගැසට් පත්‍රයේ පලකර දින 31ක් ඇතුළත සෑම අපේක්ෂයකුගේම නියෝජිතයකු විසින් පනතේ දක්වා ඇති ආකෘතියට අනුව එම මැතිවරණයේ මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳ ප්‍රකාශයක් තේරීම්භාර නිලධාරියාට භාරදිය යුතුය. මෙම වියදම් ප්‍රකාශයට පහත සඳහන් වියදම් ඇතුළත් විය යුතුය.

- ❖ අපේක්ෂකයාගේ නියෝජිතයන් විසින් දරණ ලද සියලු වියදම් බිල්පත්‍ර සමග,
- ❖ අපේක්ෂක විසින් දරණ ලද පුද්ගලික වියදම්,
- ❖ නියෝජිතයන්ගේ දැනුම් අනුව මතභේදයට ලක්වී ඇති වියදම්,
- ❖ ගෙවීමට නියමිතව ඇති සියලු වියදම්,
- ❖ අපේක්ෂකයාගෙන් හෝ වෙනත් අයගෙන් අපේක්ෂකයා වෙත ලැබුණ සියලුම මුදල් සහ ප්‍රතිස්ථාවන් (පොරොන්දු වූ මුදල්ද ඇතුලුව),
- ❖ දායකත්වයන් ලෙස ලැබූ මුදල්,
- ❖ ණය සහ තැන්පතු,

මෙම වියදම් ප්‍රකාශ අපේක්ෂක සමග අපේක්ෂකගේ නියෝජිත සාම විනිසුරුවරයකු ඉදිරියේ අත්සන් කළ යුතු අතර එම අත්සන් සාම විනිසුරු විසින් සහතික කළ යුතුය. එසේම පනතේ උපලේඛනයේ සඳහන් Q සහ R ආකෘති පත්‍රද, මෙම වියදම් වාර්තාව සමග තේරීම්භාර නිලධාරියා වෙත යොමු කළ යුතුය.

නියමිත දිනයට වියදම් වාර්තාව ඉදිරිපත් කර නොමැති නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස අසුන් ගැනීම හෝ ඡන්දය භාවිත කිරීමට පෙර එය නියමිත කාලයට පෙර ඉදිරිපත් නොකිරීමට සාධාරණ හේතු ඉදිරිපත් නොකළ යුතුය. එසේ නොවන සෑම දිනකටම රුපියල් 500ක දඩයක් නියම වනු ඇත.

මෙම වියදම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් අපේක්ෂකයා සහ අපේක්ෂකයාගේ නියෝජිතයා මෙම පනතේ 58 වන වගන්තිය යටතේ දූෂණය නැමති වරදට වරදකරුවේ.

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 75 වන වගන්තියේ දැක්වෙන්නේ මැතිවරණ වියදම් වාර්තාවක් භාරදීම ප්‍රමාද වූ විට මැතිවරණ විනිසුරුවරයකු වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වෙත කරුණු ඉදිරිපත් කර එම ප්‍රමාදය සාධාරණ බවට තීන්දුවක් ලබාගත යුතු බවයි.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ප්‍රතිපාදන අනුව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ මෙම ප්‍රතිපාදන අහෝසි විය.

## 7.2. සාධාරණ ප්‍රමාදයකට අධිකරණයේ අවසරය ඇත.

**ද සොයිසා ප්‍රතිශෝධන ඉල්ලීම**
**In re de Zoysa. 38 NLR 244**

**පසුබිම**

1935 සැප්තැම්බර් 21 වන දින පැවති බලපිටිය අතුරු මැතිවරණය සඳහා ප්‍රැන්සිස් ද සොයිසා තරඟ කරන ලද අතර ඔහු එම මැතිවරණයෙන් පරාජයට පත්විය. මෙම මැතිවරණය පවත්වන ලද්දේ 1931 ලංකා (රාජ්‍ය සභා මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව යටතේය. මෙම මැතිවරණයට අදාළ ප්‍රතිඵල 1935 සැප්තැම්බර් 26 දින අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලදී. රාජ්‍ය සභා ආඥාවේ ප්‍රතිපාදන අනුව වියදම් වාර්තාව ප්‍රතිඵල ගැසට් පත්‍රයේ පළකළ දින සිට දින 31ක් තුළ තේරීම්භාර නිලධාරී වෙත භාරදිය යුතුය. ප්‍රැන්සිස් සොයිසා විසින් සිය  නියෝජිතයා මගින් නියමිත කාලය තුළ සිය මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳව වියදම් වාර්තාව තේරීම්භාර නිළධාරී වෙත ඉදිරිපත් කරන ලදී. නමුත් එම වියදම් වාර්තාවේ තිබූ රුපියල් 20ක වියදමකට අදාළ බිල්පත්‍රය එම වියදම් වාර්තාව සමග ඉදිරිපත් කර නොතිබුණි. රුපියල් 20 කට අදාළ බිල්පත්‍රයක් අඩු බව නිරීක්ෂණය කළ තේරීම්භාර නිලධාරියා විසින් ඔක්තොබර් 23 වන දින ඒ බව ප්‍රැන්සිස් සොයිසා වෙත ලිඛිතව දන්වන ලදී. එසේම ඔක්තොබර් 28 වන දිනට වියදම් ලේඛන ඉදිරිපත් කළ යුතු කාලය අවසන් වන බැවින් තේරීම්භාර නිලධාරී විසින් නොවැම්බර් 1 වන දින ප්‍රැන්සිස් සොයිසා වෙත දන්වන ලද්දේ නියමිත කාලය තුළ බිල්පත ඉදිරිපත් කර නොමැති බැවින් රාජ්‍ය සභා ආඥාවේ 72 පනත යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසරය ලබාගන්නා ලෙසයි. ප්‍රැන්සිස් සොයිසා විසින් නොවැම්බර් 12 වන දින එම බිල්පත තේරීම්භාර නිලධාරී වෙත යොමුකර තිබිණි.

### ශ්‍රේෂ්ඨාධිකරණයට ප්‍රතිශෝධන ඉල්ලීම

ඉල්ලුම්කරු සිය පෙත්සම මගින් ප්‍රකාශ කර සිටියේ අදාළ බිල්පත වියදම් ලේඛනයට ඇමිණීමට නොහැකි වූයේ අමතක වීමකින් බවත්, තේරීම්භාර නිලධාරියා ඒ බව දැන්වීමෙන් පසුව තමන් එය යොමුකිරීමට කටයුතු කළ බවත්, ඔක්තෝබර් 24 වන දින තේරීම්භාර නිලධාරියා සිදුකළ නිවේදනය තමන්ට ලැබුනේ ඔක්තෝබර් 31 වන දින බවත්, තමන් කොළඹින් පිට සිටි නිසා එය නොලැබූ බවත් මෙම බිල්පත අම්බලන්ගොඩ ප්‍රදේශයේ මුද්‍රණාලයකට අයත් බිල්පත්‍රයක් බවත්, ඒ නිසා එය ලබාගෙන තේරීම්භාර නිලධාරී වෙත භාරදීමට යම් කාලයක් ගතවූ බවත් අධිකරණයට දැනුම් දෙන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

මෙම ප්‍රතිශෝධන ඉල්ලීම විභාග කරන ලද්දේ කොච් (Koch) විනිසුරුවරයා විසිනි, 1936 මාර්තු 11 වන දින සිය තීරණය ලබාදෙමින් විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ, ඉල්ලුම්කරු මෙම ක්‍රියාව නීතිය නොතකා හැරීමක් නොව අමතක වීමක් බවයි. එසේම නියමිත කාලය පසුවීමෙන් මාසයක් ඇතුළත අදාළ බිල්පත ගොනුකිරීමද සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුගේ ඉල්ලීමට අවසරය ලබාදෙන ලදී.

## 7.3. පරිවර්තන ගාස්තු වියදම් වර්තාවට ඇතුලු නොකිරීම වරදකි

### දොන් පිලිප් එදිරිව ටී.බී. ඉලංගරත්න

### Don Philp v. T.B.Ilangaratne- 1951 NLR 561

### පසුබිම

1948 මැයි මස පැවති මහනුවර අතුරු මැතිවරණය වෙනුවෙන් ටී.බී.ඉලංගරත්න(ස්වාධීන) සහ ප්‍රෙඩ් ඊ.ද සිල්වා (එ.ජා.ප) සහ ඩී.බී.වඩුගොපිටිය (ස්වාධීන) ඉදිරිපත් විය. ටී.බී.ඉලංගරත්න ජයග්‍රහණය කරන ලදී. ටී.බී.ඉලංගරත්නගේ ආධාරකරුවන් විසින් අපේක්ෂක ප්‍රෙඩ් සිල්වා පිළිබඳව අසත්‍ය වාර්තා පළ කිරීම මගින් ඔහුගේ චරිතයට සහ පැවැත්මට අගතියක් සිදුකරන ලද බවට චෝදනා කරමින් ඡන්ද පෙත්මක් ගොනුකරන ලදී.

### ඡන්ද පෙත්සම

ටී.බී.ඉලංගරත්නගේ ආධාරකරුවන් ලෙස කටයුතු කරමින් පුද්ගලයන් 8 දෙනෙකු පමණ ප්‍රසිද්ධ රැස්වීම්වලදී සහ පුවත්පත්

මගින් ප්‍රෙඩ් ද සිල්වා පිළිබඳව අසත්‍ය ප්‍රකාශ සිදුකළ බවත් එම අසත්‍ය ප්‍රකාශ මගින් අපේක්ෂක ප්‍රෙඩ් ද සිල්වා ගේ චරිතයට සහ පැවැත්මට හානිදායක වූ බවත් එම නිසා මෙම ඡන්දය අවලංගු කරන ලෙසත් මැතිවරණ පෙත්සම මගින් පෙත්සම්කරු ඉල්ලා සිටින ලදී.

## අධිකරණ තීරණය

(නඩු තීන්දුවේ අසත්‍ය ප්‍රකාශවලට අදාළ කරුණු පිළිබඳව 9 වන පරිච්ඡේදයේ විස්තර කරනු ලබයි) ඡන්ද පෙත්සම පිළිබඳව තීරණය නාගලිංගම් විනිසුරුතුමා විසින් 1949 පෙබරවාරි 10 වන දින ලබාදෙන ලදී. එහිදී ටී.බී. ඉලංගරත්නගේ ආධාරකරුවන් විසින් අසත්‍ය ප්‍රකාශ කිරීම මත අපේක්ෂක ප්‍රෙඩ් ද සිල්වාට සිදුවූ අගතිදායක තත්ත්වයට අමතරව පෙත්සම් විභාගයේදී හෙලිදරව් වූ වෙනත් කරුණක් පිළිබඳවද නාගලිංගම් විනිසුරුවරයාගේ අවධානය යොමු විය. ඒ අනුව පෙත්සම් විභාගයේදී හෙලිදරව් වූයේ ප්‍රෙඩ් ද සිල්වාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය දෙමළ බසට පරිවර්තනය කිරීම සඳහා ගනේෂන් නැමති පුද්ගලයකුට රුපියල් 40ක මුදලක් ගෙවා ඇති බවත් එම මුදල ප්‍රෙඩ් ද සිල්වාගේ මැතිවරණ වියදම් ප්‍රකාශයට ඇතුළත් වී නොමැති බවත්ය. ප්‍රෙඩ් ද සිල්වා මෙම කරුණු පෙත්සම් විභාගයේදී පිළිගෙන ඇත.

ඒ අනුව ප්‍රෙඩ් ද සිල්වා 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82 වගන්තිය යටතේ වරදක් කර ඇති බව නාගලිංගම් විනිසුරුවරයා විසින් තීරණය කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව ඉලංගරත්නගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහිමිවූ අතර මැතිවරණයෙන් දෙවන ස්ථානය දිනාගත් ප්‍රෙඩ් ද සිල්වා ද වරදකරුවෙකු බවට තීරණය කරන ලදී. ඒ අනුව මහනුවර මැතිවරණ කොට්ඨාශය සඳහා නැවත අතුරු මැතිවරණයක් 1949 ජුනි මස පවත්වන ලදී. එකී අතුරු මැතිවරණය සඳහා ටී.බී.ඉලංගරත්න හෝ ප්‍රෙඩ් ද සිල්වා ඉදිරිපත් නොවූ අතර තමරා කුමාරි ඉලංගරත්න (ටී.බී.ඉලංගරත්නගේ බිරිඳ), සී.එල්.රත්වත්තේ, ආර්,ඊ,ජයතිලක සහ ඩී.බී.වඩුගොපිටිය ඉදිරිපත් වූ අතර තමරා කුමාරි ඉලංගරත්න ජයග්‍රහණය කරන ලදී.

## 7.4. නීතිය පිළිබඳව නොදැන සිටීම අතපසු වීමක් ලෙස සැලකිය නොහැක.

**ප්‍රතිශෝධන ඉල්ලීම අබු බකර්**
**In re Abu Bakr-1952 NLR 286**

### පසුබිම

1950 මැයි මස 6 වන දින පැවති මැද කොළඹ අතුරු මැතිවරණය සඳහා එම් එස් අබු බකර් එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් තරඟ වදින ලදී. මැතිවරණ ප්‍රතිඵලය අනුව තුන්වන ස්ථානයට ඡන්ද ලබාගත් අතර පාර්ලිමේන්තුවට තේරී පත්වූයේ නැත.

1945 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 70 වන වගන්තියට අනුව මැතිවරණ ප්‍රතිඵලය ගැසට් පත්‍රයේ පලකළ දින සිට දින 30ක් තුළ මැතිවරණ ප්‍රචාරක වියදම් පිළිබඳව වාර්තාව අපේක්ෂකයාගේ නියෝජිත විසින් තේරීම්භාර නිලධාරී වෙත භාරදිය යුතුය. මැතිවරණ ප්‍රතිඵලය 1950 මැයි 8 වන දින ගැසට් පත්‍රයේ පලකරන ලදී. වියදම් වාර්තාව භාරදිය යුතු අවසන් දිනය වූ වූයේ ජූනි 7 ය. පෙත්සම්කාර අබු බකර්ගේ නියෝජිත විසින් වියදම් ලේඛණය ජූනි 7 වන තැපැල් කරන ලද අතර ජූනි 8 වන දිනය පෝය නිවාඩු දිනයක් වූ බැවින් තේරීම්භාර නිලධාරී වෙත වියදම් වාර්තාව ලැබී තිබුනේ ජූනි 9 වන දිනය. වියදම් වාර්තාවේ දිවුරුම් ප්‍රකාශය සමග යොමුකළ යුතු Q සහ R ආකෘති එම වියදම් වාර්තාව සමග යොමු නොකිරීම මත වියදම් වාර්ථාව භාරගැනීම ප්‍රතික්ෂේප කළ අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ "බලයලත් සමාව" ලබාගැනීමේ අපේක්ෂාවෙන් පෙත්සම්කාර අබුබකර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත මෙම පෙත්සම ගොනුකරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එස්.පී.ඩයස් විනිසුරුවරයා විසින් මෙම පෙත්සම විභාග කරන ලදී. 1980 සැප්තැම්බර් 20 වන දින විනිසුරුවරයා සිය තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. එහිදි විනිසුරුවරයා සඳහන් කරන ලද්දේ රාජ්‍ය සභා ආඥාවේ 70 වගන්තියේ සඳහන් වන්නේ මැතිවරණ ප්‍රතිඵලය ගැසට් පත්‍රයේ පලකිරීමෙන් පසුව දින 31ක් තුළ වියදම් වාර්තාව තේරීම්භාර නිලධාරී වෙත සම්ප්‍රේෂණය වියයුතු බවත් එහිදී සම්ප්‍රේෂණය යනුවෙන් සලකනු ලබන්නේ තේරීම්භාර නිලධාරියා වෙත යොමු කිරීම බවත් බ්‍රිතාන්‍ය අභියාචනාධිකරණ තීරණයක් වූ In Mackinnon v. Clarke 1[(1898) 2

Q. B. 251.] තීරණය අනුගමනය කරමින් නියමිත කාලය තුළ තැපැල් කර ඇති බැවින් නීතියෙන් නියමකර ඇති කාලය තුළ වියදම් වාර්තාව තේරීම්භාර නිලධාරී වෙත සම්ප්‍රේෂණය කළ බව විනිසුරුවරයා සිය තීන්දුව මගින් පිළිගන්නා ලදී.

නමුත් වියදම් වාර්තා සමග යොමුකළ යුතු Q සහ R ආකෘති එම වාර්තාව සමග යොමු නොකිරීමට හේතුව ලෙස පෙත්සම්කරුගේ නීතිඥයා විසින් දක්වන ලද කරුණ වූ නීතිය පිළිබඳව නොදැන සිටීම යන කාරණය රාජ්‍ය සභා ආඥාවේ 70 වන වගන්තියේ දක්වන අතපසුවීමක් ලෙස සැලකිය නොහැකි බව සඳහන් කළ විනිසුරුවරයා ඒ අනුව Q සහ R ආකෘති වියදම් වාර්තාව සමග යොමු නොකිරීම රාජ්‍ය සභා ආඥාවේ 70 වන වගන්තියේ සඳහන් වන්නේ සද්භාවයෙන් වූ වරදක් නිවැරදි කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයට "බලයලත් සමාව" ලබාදිය හැකි අවස්ථාවක් නොවන බව ප්‍රකාශ කරමින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 7.5. මැතිවරණ නියෝජිතයාගේ අසනීප තත්ත්වය මැතිවරණ වියදම් ප්‍රකාශය නිසි පරිදි භාර නොදීමට සාධාරණ හේතුවක් නොවේ

**සී.ඩබ්ලිව්.එෆ්.ඒ.ජයවර්ධන**

I n re C. W. F. A. Jayawardene-1954 NLR-358

### පසුබිම

සී.ඩබ්ලිව්.එෆ්.ඒ.ජයවර්ධන 1952 පාර්ලිමේන්තු මැතිවරණයට තරංග කර පරාජයට පත්වූ අපේක්ෂකයෙකි. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 70 වන වගන්තිය අනුව මැතිවරණයෙන් දින 31ක් තුළ ගොනුකළ යුතු මැතිවරණ වියදම් පිළිබඳ වාර්තාව ගොනුකළ යුතු අවසන් දිනය වූයේ ජූලි 1 වනදාය. පෙත්සම්කරු තමාගේ අත්සනින් යුතුව ජූනි 28 වන දින මැතිවරණ වියදම් වාර්තාවක් තේරීම්භාර නිලධාරී වෙත ගොනුකර තිබිණි. නමුත් රාජ්‍ය සභා ආඥාවේ විධිවිධාන අනුව වියදම් වාර්තාවට අත්සන් කළ යුත්තේ අපේක්ෂකයාගේ නියෝජිතයා විසිනි. ජූලි 14 වන දින තේරීම් භාර නිලධාරී විසින් පෙත්සම්කරුට දැනුම්දී ඇත්තේ පෙත්සම්කරු විසින් අප්‍රේල් 28 වන දින පී.ඩබ්ලිව්.එච්.ජයසිංහ නැමති අයෙකු තම මැතිවරණ නියෝජිතයා ලෙස නම් කර ඇති නිසා ඔහුගේ අත්සනින් වියදම් ප්‍රකාශය ලබාදෙන ලෙසයි.

ඒ අනුව පෙත්සම්කරුගේ මැතිවරණ නියෝජිතයා වන ජයසිංහ විසින් අගෝස්තු 1වන දින මැතිවරණ වියදම් වාර්තාව තේරීම්භාර නිලධාරී වෙත භාරදෙන ලදී.

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 75 වන වගන්තියේ දැක්වෙන්නේ මැතිවරණ වියදම් වාර්තාවක් භාරදීම ප්‍රමාද වූ විට මැතිවරණ විනිසුරුවරයකු වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වෙත කරුණු ඉදිරිපත් කර එම ප්‍රමාදය සාධාරණ බවට තීන්දුවක් ලබාගත යුතු බවයි. ඒ අනුව අදාළ තේරීම්භාර නිලධාරියා පෙත්සම්කරු වෙත උපදෙස් ලබාදී ඇත්තේ අදාළ ප්‍රමාදය සාධාරණ බවට තීන්දුවක් ලබාගන්නා ලෙසයි. ඒ අනුව පෙත්සම්කරු විසින් මෙම පෙත්සම 1952 අගෝස්තු 19 වන දින ගොනු කරන ලදී.

## පෙත්සම් විභාගය

මෙම පෙත්සම ආරම්භයේදී පුල්ලේ විනිසුරුවරයා විසින් විභාග කළ අතර පසුව පෙත්සම විභාග කරන ලද්දේ ගුණසේකර විනිසුරුවරයා විසිනි.

පෙත්සම් විභාගයේදී කරුණු ඉදිරිපත් වූයේ පෙත්සම්කරුගේ මැතිවරණ නියෝජිතයා දැඩි ලෙස අසනීප වූ බවත් එම හේතුවෙන් අදාළ මැතිවරණ වියදම් වාර්තාව නියමිත දිනයට ලබාදීමට නොහැකි වූ බවත්ය. මෙම කරුණු සනාථ කිරීම සඳහා වෛද්‍ය වාර්තාවන්ද ඉදිරිපත් කරන ලදී. නමුත් එම වෛද්‍ය වාර්තාවේ සඳහන් වූයේ පෙත්සම්කරුගේ මැතිවරණ නියෝජිතයා ගේ උදරාබාධයක් සඳහා ජූනි 22 සිට ජූලි 10 දක්වා ආයුර්වේද වෛද්‍යවරයෙකු විසින් ප්‍රතිකාර කළ බවටද කරුණු ඉදිරිපත් කර තිබිණි. එසේම ජූලි 10 සිට ජූලි 20 වනදා දක්වාද මැතිවරණ නියෝජිතයා අසනීපව සිටි බවට කරුණු ඉදිරිපත් විය.

නමුත් අධිකරණය නිරීක්ෂණය කරන ලද්දේ ජූනි 22 දක්වා මෙම මැතිවරණ වියදම් වාර්තාව ගොනු කිරීම සඳහා පෙත්සම්කරුගේ මැතිවරණ නියෝජිතයාට අවස්ථාව තිබූ බවයි නැතහොත් කිසිදු අවහිරයක් නොතිබුණ බවයි.

ඒ අනුව පෙත්සම් විභාගයේ තීරණය 1953 ජනවාරි 30 වන දින ලබාදෙමින් ගුණසේකර විනිසුරුවරයා මෙම මැතිවරණ වියදම් වාර්තාව ඉදිරිපත් කිරීමට සිදුවූ ප්‍රමාදය සඳහා දක්වන ලද හේතු සාධාරණ ලෙස පිළිගත නොහැකි බව ප්‍රකාශ කරමින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

අටවන පරිච්ඡේදය

# නුසුදුසුකම මත අසුන අහිමිකිරීම

මහජන නියෝජිතකයකු ලෙස පත්වීම සහ මහජන නියෝජිතයකු ලෙස කටයුතු කිරීම සඳහා සුදුසුකම් අවශ්‍ය වන්නා සේම එසේ කටයුතු කිරීමට බාධාවන නුසුදුසුකම්ද පවතී. නුසුදුසු පුද්ගලයන් පාර්ලිමේන්තුවෙන් ඉවත් කිරීම පිළිබඳව නීතිමය ප්‍රතිපාදන පවතී. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීමට සහ කටයුතු කිරීමට පවතින නීතිමය නුසුදුසුකම් පිළිබඳ ප්‍රතිපාදන සහ එකී නුසුදුසුකම් මත මන්ත්‍රීධූරය දැරීම අභියෝගයට ලක්වූ අවස්ථාවන් සම්බන්ධ නඩු තීන්දු කිහිපයක් පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබයි.

## 8.1. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ සුදුසුකම් සහ නුසුදුසුකම්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ සුදුසුකම් සහ නුසුදුසුකම් පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වේ.

### පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ සුදුසුකම් - 90 ව්‍යවස්ථාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 90 වන ව්‍යවස්ථාව දක්වන්නේ 91වන ව්‍යවස්ථාව යටතේ නුසුදුස්සෙකු වූවකු මිස ඡන්ද බලය හිමි සෑම තැනැත්තෙකුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට සුදුසුකම් ලබන බවයි.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ නුසුදුසුකම්- 91 ව්‍යවස්ථාව

91 ව්‍යවස්ථාව දක්වන්නේ 89 වන ව්‍යවස්ථාවේ ඡන්ද බලය අහිමිවන තැනැත්තන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස පත්වීමට හෝ පාර්ලිමේන්තුවේ ඡන්දය භාවිතා කිරිමට නුසුදුසු වන බවයි.
ඒ හැරුණවිට

❖ කොට්ඨාශ එකකට වැඩි ගණනකට නාම යෝජනා ඉදිරිපත් කර තිබේනම්

❖ පක්ෂ කිහිපයක් මගින් නාමයෝජනා ඉදිරිපත් කර තිබේනම්

එසේම

➡ ජනාධිපතිවරයා

➡ රාජ්‍ය නිලධාරීන්

➡ ස්වාධීන කොමිෂන් සභාවල සාමාජිකයන්

➡ සන්නද්ධ හමුදාවල සාමාජිකයන්

➡ පොලිස් නිලධාරීන්

පාර්ලිමේන්තු මන්ත්‍රි ධූරය දැරීම හෝ පාර්ලිමේන්තුවේ ඡන්දය ප්‍රකාශ කිරීම සුදුස්සෙකු නොවන බව දක්වා ඇත.

19වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ "විදේශ රටක පුරවැසිභාවය හිමි පුද්ගලයකු" ද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වීමට නුසුදුසුකමක් ලෙස දක්වා තිබුණද 20වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් එම ප්‍රතිපාදනය ඉවත් කරන ලදී.

## ඡන්දබලය අහිමිවීම - 89 ව්‍යවස්ථාව

❖ වයස අවුරුදු 18 සම්පූර්ණ නොවීම,

❖ අධිකරණය මගින් සිහිවිකල තැනැත්තෙකු බවට ප්‍රකාශ කිරීම,

❖ යම්කිසි තැනැත්තෙක් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට කවර වූ හෝ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව නියම කරන ලද හය මාසයකට නොඅඩු කාලයකට කවර වූ හෝ ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන්ම විඳ සිටියේ

නම් නැතහොත් මරණ දණ්ඩනයට යටත්ව සිටී නම් නැතහොත් එවැනි දණ්ඩන නියමයක් ක්‍රියාවේ යෙදවීම වෙනුවට හය මාසයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් විඳ සිටියේ නම්

- ❖ යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) හෝ 53 වන වගන්තිය හෝ යටතේ යම්කිසි වරදකට හෝ එකී වගන්ති දෙකින් කවර වගන්තියක් හෝ යටතේ යම්කිසි වරදකට අනුරූප වන්නා වූ ද, ජනමත විචාරණ හෝ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,
- ❖ යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) දූෂණ ක්‍රියාවකට අනුරූප වන්නා වූ ද, ජනමත විචාරණ හෝ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,
- ❖ යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ හෝ ජනමත විචාරණ හෝ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා යම්කිසි නීතියක් යටතේ හෝ යම්කිසි දූෂණ ක්‍රියාවකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ පසු විනිශ්චයකාරවරයකු විසින් වරදකරු බව නිගමනය කොට වාර්තා කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වාර්තා කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,
- ❖ යම්කිසි තැනැත්තකු අල්ලස් පනතේ විධිවිධාන යටතේ හෝ මතු පනවනු ලබන්නා වූ ද, අල්ලස් පනතට අනුරූප වන්නා වූ ද, යම්කිසි නීතියක විධිවිධාන යටතේ හෝ අල්ලස්

චෝදනාවකට වරදකරු කරනු ලැබුවහොත් හෝ වරදකරු යයි තීරණය කරනු ලැබුවහොත් හෝ අන්තිම වරට එසේ වරදකරු කරනු ලැබූ හෝ වරදකරු යයි තීරණය කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,

❖ යම්කිසි තැනැත්තකු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 77 වන වගන්තියේ පටන් 82 වන වගන්තිය තෙක් වූ (ඒ වගන්ති දෙක ම ඇතුළුව) වගන්තිවල විධිවිධාන යටතේ වූ වරදකට හෝ එකී වගන්ති යටතේ යම්කිසි වරදකට අනුරූප වන්නා වූ ද, මතු පනවනු ලබන්නා වූ යම්කිසි නීතියක් යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ අන්තිම වරට වරදකරු කරනු ලැබූ දින පටන් පස් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,

❖ යම්කිසි තැනැත්තකු මහජන ආයතන (දූෂණ වැළැක්වීමේ) ආඥා පනතේ 2 වන සහ 3 වන වගන්තිවල විධිවිධාන යටතේ වරදකට හෝ එකී වරදට අනුරූප වන්නා වූ ද, මතු පනවනු ලබන්නා වූ යම්කිසි නීතියක් යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ අන්තිම වරට වරදකරු කරනු ලැබූ දින පටන් පස් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,

❖ යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ නීති විරෝධී ක්‍රියාවකට හෝ ජනමත විචාරණ සම්බන්ධයෙන් නැතහොත් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය යටතේ වූ ද, ඉහත කී නීති විරෝධී ක්‍රියාවකට අනුරූප වන්නා වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ අන්තිම වරට වරදකරු කරනු ලැබූ දින පටන් තුන් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,

❖ යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ නීති විරෝධී ක්‍රියාවකට හෝ ජනමත විචාරණ සම්බන්ධයෙන් නැතහොත් ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා යම්කිසි නීතියක් යටතේ නීති විරෝධී ක්‍රියාවකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ක්‍රියාත්මක වීම ආරම්භ වූ පසු විනිශ්චයකාරවරයකු විසින් වරදකරු බව නිගමනය කොට වාර්තා කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වාර්තා කරනු ලැබූ දින පටන් තුන් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,

❖ යම්කිසි තැනැත්තකු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව අනුව සම්මත කරනු ලැබ, ඒ යෝජනා සම්මතයෙහි දැක්වෙන ප්‍රජා අශක්නුතා කාලසීමාව අවසන් වී නොමැති නම්,

❖ යම්කිසි තැනැත්තකු දණ්ඩ නීති සංග්‍රහයේ 188 වන වගන්තියේ පටන් 201 වන වගන්තිය තෙක් වූ (ඒ වගන්ති දෙක ම ඇතුළුව) වගන්තිවල විධිවිධාන යටතේ වූ යම් වරදකට හෝ එකී වගන්ති යටතේ යම් වරදකට අනුරූප වන්නා වූ ද, මතු පනවනු ලබන්නා වූ නීතියක් යටතේ වූ ද වෙනත් වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්,

❖ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවකට අගෞරව කිරීම පිළිබඳ වරදකට වරදකරුවී වසර 7ක් ඉකුත්වී නොමැති නම්,

❖ යම්කිසි තැනැත්තකු අවස්ථාවෝචිත පරිදි 116 වන ව්‍යවස්ථාව හෝ 111ඇ ව්‍යවස්ථාව(අධිකරණ කටයුතු වලට අයුතු ලෙස මැදිහත්වීම) යටතේ නුසුදුස්සකු වීමේ කාලසීමාව ඉකුත් වී නැත්නම්,

❖ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නැතහොත් රජය වෙනුවෙන් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙනුවෙන් එළඹ ඇත්තා වූ යම්කිසි ගිවිසුමකට යම්කිසි තැනැත්තකුගේ යම් ආකාරයක සම්බන්ධතාවක් තිබීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ නුසුදුසුකමක් යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබේ ද, එවැනි ගිවිසුමකට ඒ ආකාරයේ සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

- ❖ වස්තු භංගත්වයට පත් වූවකු
- ❖ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරමින් සිටියදී අල්ලස් වරදකට වරදකරුවෙකු වූවකු,

## 8.2. මැතිවරණ දූෂණ වරදකට වරදකරු වූ පුද්ගලයකු වසර 7ක් ගත වීමට පෙර මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා ගැනීම අසුන අහිමිවීමට හේතුවකි.

**ලතීෆ් එදිරිව සරවනමුත්තු**
Lateef v. Saravanamuttu( 1932) 34 NLR 369

**පසුබිම**

මෙම නඩුතීන්දුවට පසුබිම් වූයේ ලංකාවේ පළමුවරට පවත්වන ලද සර්වජන ඡන්දයේ උතුරු කොළඹ මැතිවරණ කොට්ඨාශයට අදාළ ඡන්ද විමසීම සහ එයට පසුව පැවති අතුරු මැතිවරණයයි. මෙම මැතිවරණය පවත්වන ලද්දේ 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව යටතේය. මැතිවරණය 1931 ජූනි 13 වන දින පැවත්වූ අතර වෛද්‍ය ආර්.සරවනමුත්තු ජයග්‍රහණය කරන ලදී. ඔහුට එරෙහිව ඡන්ද පෙත්සමක් ඉදිරිපත් වූ අතර එම ඡන්ද පෙත්සමෙන් සරවනමුත්තු පරාජයට පත්වී මන්ත්‍රීධූරය අහෝසි විය. එසේම එම මැතිවරණයේදී ඡන්දය අපේක්ෂාවෙන් අල්ලස් ලබාදීම සහ අයුතු බලපෑම යන දූෂණ ක්‍රියා සඳහා වරදකරු විය.

උතුරු කොළඹ මැතිවරණ ප්‍රතිඵලය අහෝසි වීම නිසා අතුරු මැතිවරණයක් පැවැත්වීමට තීරණය විය. එම අතුරු මැතිවරණය 1932 මැයි 28 වන දින පැවැත්වූ අතර වෛද්‍ය සරවනමුත්තුගේ බිරිඳ වන නේසම් සරවනමුත්තු එම මැතිවරණය සඳහා ඉදිරිපත් විය. එහිදී නේසම් සරවනමුත්තු ජයග්‍රහණය කරන ලදී. නේසම් සරවනමුත්තුගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා මැතිවරණ දූෂණ ක්‍රියාවකට වරදකරු වූ වෛද්‍ය සරවනමුත්තු ආධාර කිරීමේ චෝදනාව මත පදනම්ව මැතිවරණයට තරඟ කරන ලද අපේක්ෂකයකු වූ පෙත්සම්කරු විසින් මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## මැතිවරණ පෙත්සම

මෙම මැතිවරණය පැවැත්වීමට පාදක කරගත් 1931 ලංකා ( රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ ) රාජ්‍ය සභා ආඥාවේ 74(ඈ) වගන්තියට අනුව මැතිවරණ දූෂණ ක්‍රියාවකට වරදකරු වී වසර 7ක කාලය ඇතුළත එවැනි වරදකරුවූ පුද්ගලයකු තම මැතිවරණ නියෝජිතයා හෝ මැතිවරණ ප්‍රචාරකයකු ලෙස දැනුවත්ව භාවිතා කර ඇති බව මැතිවරණ විනිසුරුවරයකු සෑහීමකට පත් වන්නේ නම් එම මැතිවරණය බල ශූන්‍ය කළ යුතු බව දැක්වේ. පෙත්සම්කරු සිය පෙත්සම මගින් දක්වා සිටියේ 1931 උතරු කොළඹ මැතිවරණ පෙත්සමට අදාළ නඩු තීන්දුව මගින් වෛද්‍ය සරවනමුත්තු දූෂණ ක්‍රියාවක් පිළිබඳව වරදකරු වී ඇති බවත් ඔහු මෙම මැතිවරණයේදී සිය බිරිඳ වූ වගඋත්තරකාරියගේ මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් ප්‍රචාරක කටයුතුවලට සම්බන්ධ වූ බවත්ය. මෙහිදී පෙත්සම මගින් තම බිරිඳව වන නේසම් සරවනමුත්තු මෙම මැතිවරණයේදී තරග වදින බවත් ඇයට ඡන්දය ලබාදෙන ලෙස ආයාචනා කරන සිංහල දෙමළ සහ ඉංග්‍රිසි අත් පත්‍රිකා බෙදා හැර ඇති බවත්, එසේම එම අත් පත්‍රිකා බෙදාදීමට වෛද්‍ය සරවනමුත්තු සම්බන්ධ වී ඇති බවටත් පෙත්සම්කරු චෝදනා කරන ලදී, ඒ අනුව මෙම මැතිවරණ ප්‍රතිඵලය බල ශූන්‍ය කරන ලෙස මැතිවරණ පෙත්සම මගින් ඉල්ලා තිබිණි.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සම විභාග කරන ලද්දේ ඩැල්ටන් විනිසුරුවරයා (DALTON J.) විසිනි. මෙහිදී ඡන්ද ප්‍රචාරකයා (canvasser) යන අර්ථ නිරූපණය තුළට වෛද්‍ය සරවනමුත්ගේ ක්‍රියාකාරකම් අදාළ වන්නේද යන්න විමසා බැලූ විනිසරුවරයා එම ක්‍රියාකලාපය මැතිවරණ ප්‍රචාරකයකුගේ ක්‍රියාකලාපයක් බවට සෑහීමකට පත්වන බවත් එය ඔහු විසින් පුද්ගලිකව සිදුකර ඇති බවටත් සෑහීමකට පත්වන බව සඳහන් කරන ලදී. ඒ අනුව මෙම මැතිවරණ ප්‍රතිඵලය බල ශූන්‍ය බවට තීරණය කරන ලදී.

## අධිකරණ තීරණයේ ප්‍රතිඵලය

අධිකරණ තීරණය අනුව නේසම් සරවනමුත්තුගේ මන්ත්‍රීධූරය අහෝසි විය. එබැවින් නැවත අතුරු මැතිවරණයක් උතුරු කොළඹ මැතිවරණ කොට්ඨාශය සඳහා පවත්වන ලදී. එම අතුරු මැතිවරණය 1932 නොවැම්බර් 12 වන දින පැවැත්වූ අතර ඒ සඳහා නේසම් සරවනමුත්තු සහ එම්.ඒ.කාසිචෙට්ටි තරඟ කරන ලද අතර වැඩි ඡන්ද 7730ක් ලබාගනිමින් නේසම් සරවනමුත්තු නැවත් රාජ්‍ය මන්ත්‍රණ සභාවට නැවත තේරීපත් විය.

## 8.3. මැතිවරණ වරදක් ඔප්පු කිරීමේදී එය අපරාධ නඩුවක ඔප්පු කිරීමේ භාරයෙන්ම ඔප්පු කළ යුතුය.

**එස්.ජේ.වී.චෙල්වනායගම් එදිරිව නඩේසන් - (කන්කසන්තුරේ මැතිවරණ පෙත්සම**
**Chelvanayakam v.Natesan-1954 NLR 271**

### පසුබිම

1952 පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා චෙල්වනායගම් සහ නඩේසන් යන දෙදෙනාම කන්කසන්තුරේ මැතිවරණ කොට්ඨාශය සඳහා තරඟ කරන ලදී. එම මැතිවරණයේ ප්‍රතිඵල අනුව නඩේසන් ඡන්ද 15,337 ක් ලබාගත් අතර චෙල්වනායගම් ලබාගන්නා ලද්දේ ඡන්ද 11,571ක් පමණි. ප්‍රතිඵල අඩංගු ගැසට් නිවේදනය 1952 ජූනි 2වන දින නිකුත් විය. ඒ අනුව වැඩි ඡන්ද 3,666 ලබාගත් නඩේසන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්විය.

### ඡන්ද පෙත්සම

1952 ඔක්තෝබර් 24 දින චෙල්වනායගම් විසින් නඩේසන්ගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අභියෝගයට ලක් කරමින් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. එහිදී නඩේසන්ට එරෙහිව මැතිවරණයේදී සිදුකරන ලද මැතිවරණ වැරදි කිහිපයක් පිළිබඳව චෙල්වනායගම් චෝදනා කරන ලදී.

- ❖ වගඋත්තරකරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් දැනුවත්ව සහ චේතනාන්විතව පෙත්සම්කරු පිළිබඳව අසත්‍ය සහ ඔහුගේ චරිතයට හානියක් වන ප්‍රකාශ ප්‍රසිද්ධ කිරීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 58(1) (ඩී) වගන්තිය යටතට ගැනෙන දූෂිත ක්‍රියාවක් සිදුකිරීම.
- ❖ වගඋත්තරකරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් දැනුවත්ව සහ චේතනාන්විතව පෙත්සම්කරු පිළිබඳව අසත්‍ය සහ ඔහුගේ චරිතයට හානියක් වන ප්‍රකාශ ඇතුළත් පත්‍රිකා මුද්‍රණකරුගේ හෝ ප්‍රකාශකගේ නම හෝ ලිපිනය නොමැතිව පල කිරීම කිරීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 58(1) (සී) වගන්තිය යටතට ගැනෙන දූෂිත ක්‍රියාවක් සිදුකිරීම.

- ❖ වගඋත්තරකරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් දැනුවත්ව සහ චේතනාන්විතව පෙත්සම්කරු පිළිබඳව අසත්‍ය සහ ඔහුගේ චරිතයට හානියක් වන ප්‍රකාශ ඇතුළත් පත්‍රිකා මුද්‍රණකරුගේ හෝ ප්‍රකාශකගේ නම හෝ ලිපිනය නොමැතිව පල කිරීම කිරීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 58(1) (සී) වගන්තිය යටතට ගැනෙන දූෂිත ක්‍රියාවක් සිදුකිරීම.
- ❖ වගඋත්තරකරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ඡන්දදායකයන් ප්‍රවාහනය සඳහා වාහන කුලියට ගැනිම, ඉල්ලා ගැනීම හෝ ඡන්දදායකයන් ප්‍රවාහනය සඳහා යෙදවීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 67(3) වගන්තිය යටතට ගැනෙන නීති විරෝධි ක්‍රියාවක් සිදුකිරීම.
- ❖ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 70 වගන්තිය යටතේ භාරදිය යුතු මැතිවරණ වියදම් ප්‍රකාශයට අසත්‍ය කරුණ ඇතුළත් කිරීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) පනතේ 58(1) (ඩී) වගන්තිය යටතට ගැනෙන දූෂිත ක්‍රියාවක් සිදුකිරීම.

## පෙත්සම් විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ ද සිල්වා විනිසුරුවරයා විසිනි. පෙත්සම් විභාගයේදී පෙත්සම්කරුගේ පාර්ශවයෙන් සාක්ෂිකරුවන් 63 දෙනෙකුද වගඋත්තරකරුගේ පාර්ශවයෙන් සාක්ෂිකරුවන් 16 දෙනෙකුද වශයෙන් සාක්ෂිකරුවන් 79ක් සාක්ෂි ලබාදෙන ලදී. පෙත්සම් විභාගය ද දින 79ක් පවත්වන ලදී.

## මැතිවරණ පෙත්සමේ තීරණය

1954 ජූලි 03 වන දින සිය තීරණය ලබාදුන් ද සිල්වා විනිසුරුවරයා අලුවිහාරේ එදිරිව නානායක්කාර නඩුවේදී අගවිනිසුරු බස්නායක විසින් ප්‍රකාශ කළ "මැතිවරණ පෙත්සමකදී මැතිවරණ වරදක් පිළිබඳව ඔප්පු කිරිමේ භාරය සිවිල් නඩුවකදී ඔප්පු කිරීමේ භාරයට වඩා වැඩි විය යුතුය එය අපරාධ නඩුවක මෙන් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කළ යුතුය" යන්න උපුටා දක්වමින් මෙම පෙත්සම මගින් ඉදිරිපත් කරන ලද කිසිදු චෝදනාවක් ඒ අනුව ඔප්පු කිරීමට පෙත්සම්කරුවන් සමත්වී නොමැති බව පවසමින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 8.4. සිරදඬුවම් නියමවීමෙන් පසු නියමිත කාලය ගතකර නොතිබීම මන්ත්‍රීධූරයක් දැරීමට නුසුදුසුකමක් වේ

**පීරිස් එදිරිව සමරවීර**
Peiris Vs.Samaraweera- 1971-NLR-250

### පසුබිම

1965 මාර්තු පැවති පාර්ලිමේන්තු මැතිවරණයට වැලිමඩ මැතිවරණ කොට්ඨාශයෙන් ඉදිරිපත් වූ පර්සි සමරවීර ජයග්‍රහණය කරන ලදී. නමුත් ඔහුට එරෙහිව මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් වූ අතර එමගින් මෙම පත්වීම අවලංගු විය. ඒ අනුව 1967 පෙබරවාරි 11 වන දින අතුරු මැතිවරණයක් පවත්වන ලදී. මෙම අතුරු මැතිවරණයට පර්සි සමරවීර, ජේම්ස් පීරිස් සහ රත්නායක පුංචිබණ්ඩා යන අපේක්ෂකයන් තරඟ කරන ලදී. එම අතුරු මැතිවරණයෙන්ද පර්සි සමරවීර ජයග්‍රහණය කරන ලදී. දෙවෙනි ස්ථානයට ජේම්ස් පීරිස් පත්විය. ජයග්‍රහණය කළ පර්සි සමරවීර සිරදඬුවම් ලබා නියමිත කාලය ඉක්මවා නැති බැවින් ඔහු ධූරය දැරීමට සුදුසු නොවන බවත් ඊළගට ඡන්ද ලබාගත් අපේක්ෂකයා ලෙස තමන්ව පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයට පත් කරන ලෙසත් ඉල්ලා ජේම්ස් පීරිස් විසින් මැතිවරණ පෙත්සමක් ගොනුකරන ලදී.

### මැතිවරණ පෙත්සම

1946 ලංකා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා) රාජ්‍ය සභා ආඥාවේ 13(3) ව්‍යවස්ථාව අනුව මාස 12කට වඩා වැඩි සිරදඬුවම් ලැබිය හැකි වරදක් සම්බන්ධයෙන් මාස 3කට වඩා වැඩි සිරදඬුවමක් විද තිබේනම් එකී තීන්දුව ලබාදුන් දින සිට වසර 7ක් සම්පූර්ණ වනතෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීම නුසුදුසුකමක් වේ. මෙම ප්‍රතිපාදනය පදනම් කරගනිමින් ජේම්ස් සිල්වා විසින් පර්සි සමරවීර සිරදඬුම ලබා වසර 7 ක කාලය ඉකුත් වී නොමැති බව ප්‍රකාශ කරමින් ඒ අනුව පර්සි සමරවීර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීමට නුසුදුසු පුද්ගලයකු බැවින් ඔහුගේ මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙසත් ඊළඟට වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබාගත් තමන් එම හිස්වන පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයට පත් කරන ලෙසත් ඉල්ලා මැතිවරණ පෙත්සමක් ගොනු කරන ලදී.

### මැතිවරණ පෙත්සම් විභාගය

පෙත්සම විභාග කරන ලද්දේ විනිසුරු පී.පී.ඒ ද සිල්වා විසිනි. මෙම පෙත්සම් විභාගයේදී වගඋත්තරකරු විසින් සිරදඬුවම් ලැබීම පිළිබඳ කරුණ අභියෝගයට ලක් නොකරන ලදී. පෙත්සම්කරුට දඬුවම් නියම වී ඇත්තේ 1960 ඔක්තෝබර් 7 වන දිනය. ඒ අනුව මෙම අතුරු මැතිවරණය පවත්වන දිනය වන විට වසර 7 සම්පූර්ණ වී නොතිබිණි.

### මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සම් විභාගයේ තීරණය 1967 ඔක්තෝබර් මස 6 වන දින පී.පී.ඒ ද සිල්වා විනිසුරු විසින් ලබාදී තිබිණි. වගඋත්තරකරුගේ තර්කයක් වූයේ 1965 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුවද මෙම වගඋත්තරකරුට එරෙහිව මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් වූ නමුත් එහිදී මෙම කරුණ ඉදිරිපත් නොවූ බවට තර්ක කරන ලදී. එම පෙත්සමේදි මෙම කරුණ ඉදිරිපත් නොවීම මෙම පෙත්සමට අදාළ කරගත නොහැකි බව අධිකරණය ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මැතිවරණයට ඉදිරිපත් වන අවස්ථාව වන විට පාර්ලිමේන්තුවට පත්වීමට නුසුදුසුකමක් තිබූ බැවින් වගඋත්තරකරුගේ පත්වීම අහෝසි කළ යුතු බව තීරණය කළ අධිකරණ පෙත්සම්කරුගේ දෙවන ඉල්ලීම වූ තමන්ව මන්ත්‍රීධූරයට පත්කරන ලෙස වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම නඩු තීන්දුවේ ප්‍රතිඵලයක් ලෙස වැලිමඩ මැතිවරණ කොට්ඨාශය සඳහා නැවත වරක් අතුරු මැතිවරණයක් 1968 දෙසැම්බර් 17 වන දින පවත්වන ලද අතර එම මැතිවරණයෙන්ද පර්සි සමරවීර ජයග්‍රහණය කරන ලදී.

## 8.5. සිරදඬුවම් විඳ නියමිත කාලය පසු නොවීම මත පාර්ලිමේන්තු මන්ත්‍රී අසුන අහිමිවීම

**එන්.එස්. එල්ලාවල එදිරිව පී.බී.විජේසුන්දර (1970 රත්නපුර ඡන්ද පෙත්සමෙහි අභියාචනය)**

**Ellawala v.Wiejesundara- 1974 NLR 265**

### පසුබිම

මෙම නඩුවට පසුබිම් වූයේ 1970 පාර්ලිමේන්තු මැතිවරණයයි. එම මැතිවරණයෙන් රත්නපුර මැතිවරණ කොට්ඨාශය සඳහා එන්.එස්.

එල්ලාවල (නන්ද එල්ලාවල) (ශ්‍රී.ල.නි.ප), පී.බී.විජේසුන්දර(එ.ජා.ප), කේ.පී.ධර්මදාස(ස්වාධීන) සහ කේ.පී.මානිස්සිංඛෙද්‍රා(සි.ම.ප) තරග කරන ලද අතර නන්ද එල්ලාවල පාර්ලිමේන්තුවට තේරී පත්විය. ඔහු පාර්ලිමේන්තුට පත්වීමට පෙර මාස 12කට වඩා වැඩි සිරදඬුවම් ලැබිය හැකි වරදකට වරදකරු වී මාස 3ක සිරදඬුවමක් නියම වී තිබිණි. එම තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය මගින්ද සනාථ කර තිබිණි. පසුව ඔහු ප්‍රිවි කවුන්සලය සඳහා අභියාචනා කළ අතර ඒ අනුව ඔහුව ඇප මත නිදහස් කරන ලදී. පසුව ප්‍රිවි කවුන්සලය විසින් අභියාචනය ප්‍රතික්ෂේප කිරීම නිසා නැවත 1968 අප්‍රේල් 30 වන දින සිරගත කරන ලදී. බණ්ධනාගාර රීති අනුව 1968 ජූලි 13 වන දින ඔහුව නිදහස් කරන ලදී. ඔහුට නියමවූ සිරදඬුවම මාස 3ක් වුවත් සැබවින්ම එම සිරදඬුම විඳ තිබුණේ දින 76 ක් පමණි. මෙම මැතිවරණය පවත්වන ලද්දේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව යටතේය. මැතිවරණය පවත්වන විට බලපැවැත්වූයේ සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

## මැතිවරණ පෙත්සම

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 13(3)(එෆ්) වගන්තියට අනුව මාස 12කට වඩා වැඩි සිරදඬුම් ලැබිය හැකි වරදකට වරදකරු වූ පුද්ගලයකු මාස තුනක් එම සිරදඬුම් විඳ තිබේනම් දඬුවම් ලැබූ දින සිට වසර 7ක් ඉක්මවන තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් දැරීමට නුසුදුස්සසෙකු වේ.

ඒ අනුව එල්ලාවල පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය දැරීමට නුසුදුසු බවට නියෝගයක් ඉල්ලා ඔහුට එරෙහිව මැතිවරණ පෙත්සමක් ගොනු කරන ලදී. එහිදී එල්ලාවලගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කිරීමට තීරණය විය.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මෙම තීරණයට එරෙහිව එල්ලාවල ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ගොනු කරන ලදී. එම අභියාචනය විනිශ්චය කරන ලද්දේ අගවිනිසුරු එච්.එන්.ජී.ප්‍රනාන්දු, සී.ජේ සිල්වා, එස්.පී. සහ අලස් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. 1971 ජූනි 16 වන දින මැතිවරණ පෙත්සම් අභියාචනයේ තීරණය ලබාදෙමින් තීන්දුව ප්‍රකාශයට පත් කරන ලද්දේ අගවිනිසුරු එච්.එන්.ජී.ප්‍රනාන්දු විසිනි. එම තීන්දුව මගින් මැතිවරණ පෙත්සම විභාග කළ මැතිවරණ විනිසුරුවරුන්ගේ තීරණය සනාථ කරමින් අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.

ඒ අනුව දඬුවම් ලැබීමෙන් නියමිත කාලය සම්පූර්ණ නොවීම මත එල්ලාවලට පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහිමි විය.

### ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව නන්ද එල්ලාවලට මන්ත්‍රීධූරය අහිමි වූ අතර ඒ හේතුව මත රත්නපුර මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් පවත්වන ලදී, මෙම අතුරු මැතිවරණය 1972 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලදී. ඒ සඳහා නන්ද එල්ලාවල, පියදාස පැලැදගම, ඇතුලු අපේක්ෂකයන් 6ක් ඉදිරිපත් වූ අතර එම අතුරු මැතිවරණයෙන්ද නන්ද එල්ලාවල ජයග්‍රහණය කරන ලදී.

## 8.6. රාජ්‍ය සංස්ථාවන් සමග ගිවිසුමක් තිබියදී මැතිවරණයට තරඟ කිරීම මන්ත්‍රීධූරය අහෝසි වීමට හේතුවකි

**දහනායක එදිරිව ඇල්බට් ද සිල්වා**
**Dahanayake Vs. De Silva (1978-79 -80)1 Sri.L.R 41**

### පසුබිම

මෙම නඩුවට පසුබිම්වූයේ 1977 ජූලි 6වන දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයයි. මෙම මැතිවරණයේ ගාල්ල මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් ඩබ්ලිව් දහනායක (ස්වාධීන) ඇල්බට් ද සිල්වා (එ.ජා.ප),රාජා කුලතිලක (ශ්‍රී.නි.ප) සහ මන්සූර් මරික්කාර් (ල.ස.ස.ප) යන අපේක්ෂකයින් තරඟ කරන ලදී. එම මැතිවරණයේ ප්‍රතිඵල අනුව ඇල්බට් ද සිල්වා ජයග්‍රහණය කළ අතර විජයානන්ද දහනායක දෙවන ස්ථානයට ඡන්ද ලබාගන්නා ලදී. මැතිවරණයෙන් ජයග්‍රහණය කළ ඇල්බට් සිල්වා පාර්ලිමේන්තුවට තේරී පත්විය. පසුව ඇල්බට් ද සිල්වා රක්ෂණ සංස්ථාවේ සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නියෝජිතයකු ලෙස කටයුතු කිරීම හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු ලෙස කටයුතු කිරීමේ නුසුදුසුකමක් පවතින බවට චෝදනා කරමින් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. මෙම මැතිවරණය පවත්වන ලද්දේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ ප්‍රතිපාදන අනුවය. මැතිවරණ පෙත්සම විමසා බැලූ මැතිවරණ විනිසුරුවරයා පෙත්සම නිශ්ප්‍රභා කළ අතර එම තීරණයට එරෙහිව පෙත්සම්කාර විජයානන්ද දහනායක විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් සිදුකරන ලදී.

## මැතිවරණ පෙත්සම

ජයග්‍රාහී අපේක්ෂකයා වූ ඇල්බට් සිල්වා රාජ්‍ය සංස්ථාවක් වූ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලෙවි සහ බෙදාහැරීමේ නියෝජිතයකු වශයෙන් කටයුතු කිරීම මගින් රජය සමග ව්‍යාපාර ගිවිසුමක් පැවතීමත්, ලංකා රක්ෂණ සංස්ථාවේ ගාල්ල නියෝජිතයා ලෙස කටයුතු කිරීම මගින් රජය සමග ව්‍යාපාර ගිවිසුමක් පැවතීමක් යන හේතුව මත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 77(ඉ) වගන්තියට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් දැරීමට නුසුදුසු පුද්ගලයකු වීම මත ඔහුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීම අවලංගු කරන ලෙස පෙත්සම මගින් ඉල්ලා තිබිණි.

## මැතිවරණ පෙත්සම් විභාගය

කාදර් විනිසුරුවරයා විසින් මෙම මැතිවරණ පෙත්සම විභාග කරන ලදී.

වගඋත්තරකරු 1967 ජුනි 4 වන දින ලංකා රක්ෂණ සංස්ථාවේ ගාල්ල නියෝජිතයා ලෙස පත්වී ඇති බවත් එකී පත් කිරීමේ ගිවිසුම අනුව එම ගිවිසුම සමාප්ත කිරීමට අපේක්ෂා කරන පාර්ශවයක් මාසයකට පෙර ඒ සඳහා ගිවිසුමෙන් ඉවත්වීමේ දැන්වීම අනෙක් පාර්ශවයට යොමුකළ යුතු බවත් දැක්වා ඇති බව පෙත්සම්කරුවන් විසින් අධිකරණයට කරුණු ඉදිරිපත් කරන ලදී. ගාල්ල මැතිවරණ කොට්ඨාශය සඳහා නාමයෝජනා භාරගැනීමේ දිනය වූයේ 1977 ජුනි 6 වනදාය. ජුනි 1 වනදා වගඋත්තරකරු ලංකා රක්ෂණ සංස්ථාවේ ජීවිත රක්ෂණ කළමණාකරු වෙත ලිපියක් යොමුකරමින් තමන් මැතිවරණයට තරඟ කරන බැවින් රක්ෂණ නියෝජිත ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා තිබිණි. රක්ෂණ සංස්ථාව විසින් පිළිතුරු ලිපියක් යොමුකරමින් ජූලි 6 වන දින දන්වා තිබුනේ ඉහත ඉල්ලා අස්වීම පිළිගන්නා බවයි.

වගඋත්තරකරු විසින් 1966 දෙසැම්බර් 11 දිනද ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් 1968 සැප්තැම්බර් 8 දිනද අත්සන් කරන ලද ගිවිසුමක් මගින් වගඋත්තරකරු ඛනිජ තෙල් අලෙවි කිරීමේ සහ බෙදාහැරීමේ නියෝජිතයකු ලෙස පත්කර තිබිණි. එම ගිවිසුමට අනුව ගිවිසුම අවසන් කිරීම සඳහා මාස තුනකට පෙර ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත ලිඛිත දැන්වීමක් සිදුකළ යුතු විය. වගඋත්තරකරු විසින් මැයි 27 වන දින ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයා වෙත ලිපියක් යොමුකරමින් තමන්ගේ නියෝජිතභාවය

අවසන් කිරීමට තීරණය කර ඇති බවත් තම නියෝජිත තනතුර තම බිරිඳගේ නමට මාරුකරන ලෙසත් ඉල්ලා සිටින ලදී. එසේම මෙම කටයුතු කඩිනම් කරන ලෙස දකුණු පළාත් භාර කළමනාකරු වෙත ජූනි 3 වන දින වගඋත්තරකරු විසින් තවත් ලිපියක් යොමුකර තිබිණි. පසුව ජූනි 5 වන දින පෙත්සම්කරු විසින් විදුලි සංදේශයක් තමන්ගේ ගිවිසුම අවලංගු කරන ලෙස දන්වා තිබිණි. එදිනම ලිපියක් මගින් වගඋත්තරකරු බනිජ තෙල් නීතිගත සංස්ථාවට දන්වා තිබුනේ තම ගිවිසුම අවසන් කරන ලෙසයි.

මැතිවරණ පෙත්සම විභාග කළ කාදර් විනිසුරුවරයාගේ තීරණය වූයේ වගඋත්රතරකරු ලංකා රක්‍ෂණ සංස්ථාවේ නියෝජිත ධූරයෙන් ඉවත් වි ඇති බවත් එසේම  වගඋත්තරකරු අපේක්‍ෂකයෙකු වීම නිසා බනිජ තෙල් නීතිගත සංස්ථාව සමග ව්‍යාපාර ගිවිසුම් අවසන් කිරීමට ඔහු විසින් හැකි සියලු පියවර ගෙන තිබූ බවත් සංස්ථාවේ ප්‍රමාදය මත ගිවිසුම අවසන් නොවීම මගින් වගඋත්තරකරුට දඬුවම් නොකළ යුතු බවයි. ඒ අනුව පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුවරයාගේ තීරණයෙන් තෘප්තිමත් නොවූ පෙත්සම්කරු එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. අභියාචනය විභාග කරන ලද්දේ අගවිනිසුරු නෙවිල් සමරකෝන් සමග සමරවික්‍රම සහ වනසුන්දර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත විනිසුරු මඩුල්ලක් විසිනි. අනෙක් විනිසුරුවරුන් දෙදෙනාගේද එකඟතාව මත අගවිනිසුරු නෙවිල් සමරකෝන් විසින් 1979 සැප්තැම්බර් 10 වන දින මෙම අභියාචනා විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී. මෙහිදී විනිසුරුවරයා මූලිකවම ශ්‍රේෂ්ඨාධිකරණයට විසඳීමට තිබූ කරුණු පිළිබඳව අවධාරණයක් සිදුකරන ලදී. ඒ අනුව

- ❖ මැතිවරණයට අදාළ දිනය ලෙස සලකනු ලබන්නේ ඡන්ද විමසීම පවත්වන දිනයද නාමයෝජනා භාරදෙන දිනයද?
- ❖ 70,73 සහ 75 ව්‍යවස්ථාවන් සමග කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මගින් ඕනෑම සංස්ථාවක් සමග පවතින ගිවිසුමක් මගින් පුද්ගලයකුගේ නුසුදුසුකමක් ජනිත වන්නේද?

- ❖ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මගින් සෝල්බරි ව්‍යවස්ථාවේ සඳහන් නුසුදුසුකම්වලින් මගින් සහන යැදීමට පෙත්සම්කරුට අයිතියක් තිබේද?
- ❖ පළවෙනි වගඋත්තරකරුගේ ගිවිසුම් දෙක නීතිමය වශයෙන් සමාප්ත වී තිබේද?
- ❖ මෙම සංස්ථාවන් දෙක රාජ්‍ය සංස්ථාවන් හෝ රජයට අයත් දෙපාර්තමේන්තු ලෙස සලකනු ලබන්නේද?
- ❖ තම ගිවිසුම් ඒකපාර්ශවිකව සමාප්ත කිරීමට 1වන වගඋත්තරකරුට අයිතිවාසිකමක් තිබේද?

කරුණු සලකා බැලූ විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ රක්ෂණ සංස්ථාව විසින් වගඋත්තරකරුගේ ඉල්ලීම මත ගිවිසුම සමාප්ත කර ඇති බැවින් රක්ෂණ සංස්ථාව සමග ඔහුට ගිවිසුමක් අදාළ අවස්ථාව වන විට නොතිබුන බවයි.

නමුත් පෙත්සම්කරුවන්ගේ ලේඛන වගඋත්තරකරු විසින් ලබාදුන් ලේඛන සහ ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සටහන් මෙන්ම විදේශීය නඩු තීන්දු කෙරෙහිද අවධානය යොමුකළ විනිසුරුවරයා ප්‍රකාශ කළේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමග වූ වගඋත්තරකරුගේ ගිවිසුම ඡන්දයට අදාළ දිනය වන විට අවසන් වී නොතිබුන බවයි. ඒ අනුව මැතිවරණය පැවැත්වූ දිනය වූ 1977 ජූලි 21 වන විට වගඋත්තරකරු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීධූරයක් දැරීමට නුසුදුසු පුද්ගලයකු බව තීරණය කළ විනිසුරුවරයා මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය අවලංගු කරමින් අභියාචනය පිළිගන්නා ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

මෙම තීරණය අනුව ඇල්බට් ද සිල්වාගේ මන්ත්‍රීධූරය අහෝසි විය. එබැවින් ගාල්ල මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් පැවැත්වීමට තීරණය විය. ඒ අනුව 1979 දෙසැම්බර් 20 වන දින පැවති ගාල්ල මැතිවරණ කොට්ඨාශයේ අතුරු මැතිවරණය සඳහා විජයානන්ද දහනායක (එ.ජා.ප), සරත් වික්‍රම ඩයස් (ශ්‍රී.ල.නි.ප) ලයනල් බෝපගේ (ජ.වි.පෙ) කේ.පී.පියදාස (ස්වාධීන) සහ බී.බී.පෙරේරා (ස්වාධීන) යන අපේක්ෂකයන් ඉදිරිපත් විය. 1977 ජූලි පාර්ලිමේන්තු මැතිවරණයේදී ස්වාධීන අපේක්ෂකයකු ලෙස තරඟ වැදී දෙවන ස්ථානයට පත් මෙම නඩුවේ පෙත්සම්කරු වූ විජයානන්ද දහනායක මෙම අතුරු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් තරඟ වැද ජයග්‍රහණය කරන ලදී.

## 8.7. නිසි පරිදි රාජ්‍ය සේවයෙන් ඉවත් නොවීම පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වීමට හේතුවකි

**අබේවික්‍රම එදිරිව පතිරණ**

**Abeywickrem a v. Pathirana-(1986)-1-Sri.L.R-120**

### පසුබිම

වගඋත්තරකාර රිචඩ් පතිරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ III වන පන්තියේ විදුහල්පතිවරයෙකි. ඔහුගේ පත්වීම් බලධාරියා වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) ව්‍යවස්ථාව යටතේ පත්කළ අධ්‍යාපන සේවා කමිටුවයි. ගාල්ල දිස්ත්‍රික්කයේ ඉඳුරුව ගලබොඩ අතුරුවැල්ල මහා විද්‍යාලයේ විදුහල්පති ලෙස ඔහු සේවය කරන ලදී. ඔහු වාර්ෂික වැටුප 6720 ට වඩා වැඩි රාජ්‍ය නිලධාරියකු විය.1983 වසරේ පැවති අක්මීමන අතුරු මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා ඔහු සිය අස්වීම 1983 අප්‍රේල් 12 වන දින ගාල්ල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා වෙත යොමුකරන ලදී. එහි සඳහන් කරන ලද්දේ තමන් අක්මීමන මැතිවරණය සඳහා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වීමට අපේක්ෂා කරන බැවින් 1983 අප්‍රේල් 21 දින සිට අදාළ තනතුරෙන් ඉල්ලා අස්වන බවත් එය පිළිගන්නා ලෙසත්ය. කලාප අධ්‍යක්ෂක වරයා විසින් එය "අනුමත කරමි" යනුවෙන් සටහනක් යොදන ලදී. ඉල්ලා අස්වීමේ ලිපියේ පිටපත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතද, තමා සේවය කළ පාසැලේ වැඩබලන විදුහල්පතිවෙතද යොමුකර තිබිණ. ඔහු 1983 මාර්තු මාසයෙන් පසුව වැටුප් ලබාගෙන තිබුණේ නැත. ගාල්ල කළාප අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් ජනනන්ද නැමති අයෙකු අදාළ පාසැලේ වැඩබලන විදුහල්පතිවරයා ලෙස පත් කර තිබිණි.

ඔහු අතුරු මැතිවරණය සඳහා 1983 අප්‍රේල් 22 වන දින නාමයෝජනා ඉදිරිපත් කරන ලද අතර 1983 මැයි 18 වන දින පැවති මැතිවරණයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු ලෙස තේරී පත්විය.

### මැතිවරණ පෙත්සම

වගඋත්තරකාර රිචඩ් පතිරණ පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වන අවස්ථාව වන විට රාජ්‍ය සේවයෙන් විධිමත් ලෙස ඉවත් වී නොමැති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඈ)(iii) ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් දැරීමට නුසුදුස්සෙක් වන බැවින් ඔහුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසිකරන ලෙස ඉල්ලා පෙත්සම්කරු මැතිවරණ පෙත්සමක් අභියාචනාධිකරණය වෙත යොමුකරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාමය අර්ථ නිරූපණය

**Abeywickrema v. Pathirana [1984} 1 Sri L.R 215**

පෙත්සම් විභාගය ආරම්භයේදී "පළවෙනි වගඋත්තරකරු විසින් ගාල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලා අස්වීමේ ලිපිය භාරගැනීමේ වලංගුභාවය විමසීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) ව්‍යවස්ථාව අනුව මැතිවරණ විනිසුරුවරයාට අධිකරණ බලයක් නොමැති බවට" මූලික විරෝධතාවක නගන ලදී. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125(1) ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල අර්ථ නිරූපණයක් ලබාගැනීම සඳහා මෙම පෙත්සම විභාග කළ අභියාචනාධිකරණ විනිසුරු ජී.පී.එස්.ද.සිල්වා විනිසුරුවරයා විසින් එය ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමුකරන ලදී.

මෙම විමසීම S.C.Refference No.3/83 Election Pettition No.5/1983 අංකය යටතේ ලියාපදිංචි වූ අතර එම විමසීම සිදුකරන ලද්දේ අගවිනිසුරු ෂර්වානන්ද සහ වනසුන්දර හා රණසිංහ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරවරුන් විසිනි. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ අභියාචනාධිකරණය විසින් යොමුකරන ලද විසඳිය යුතු ප්‍රශ්නය වූයේ "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5(1) ව්‍යවස්ථාවේ විධිවිධාන හේතුවෙන් රාජ්‍ය නිලධාරියකුගේ ඉල්ලා අස්වීමක් පිළිගැනීමේ නියෝගයක් හෝ තීරණයක් මැතිවරණ පෙත්සමක් විභාග කිරීමේදී අභියාචනාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී ප්‍රශ්න කළ නොහැකිද?" යන්නයි. විමසීම අවසානයේ අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව මත අගවිනිසුරු ෂර්වානන්ද විසින් 1984 ජනවාරි 10 දින නියෝගය ප්‍රකාශයට පත් කරමින් ප්‍රකාශ කරන ල්දදේ මෙම පෙත්සම මගින් ප්‍රශ්න කරන්නේ ඉල්ලා අස්වීමක් භාරගැනීමක් වන බැවින් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(5) ව්‍යවස්ථාවේ පරාසය තුළට නොවැටෙන බවයි. එසේම එය 58(1) ව්‍යවස්ථාවෙන් අපේක්ෂා කරන නියෝජනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අවශ්‍යතාවයන් සම්පූර්ණ වීමට ප්‍රමාණවත් නොවන බවයි. ඒ අනුව අදාළ පෙත්සම විභාග කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචනාධිකරණයට නියෝගයක් ලබාදෙන ලදී (Abeywickrema v. Pathirana (1984) 1 Sri L.R. 215 )

## අභියාචනාධිකරණයේ තීරණය

ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය මත අභියාචනාධිකරණය විසින් නැවත පෙත්සම සලකා බැලීම ආරම්භ කරන ලදී. පෙත්සම්කරුවන් එහිදී ප්‍රකාශ කරන ලද්දේ වගඋත්තරකරුගේ පත්වීම් බලධාරියා වන අධ්‍යාපන සේවා කමිටුවට නොව කළාප අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත සිය ඉල්ලා අස්වීම යොමුකර ඇති බැවින් ඔහු විධිමත් ලෙස රාජ්‍ය සේවයෙන් ඉවත් වී නොමැති බවයි. පෙත්සම විභාග කළ විනිසුරුවරුන් 1985 පෙබරවාරි 25 වන දින සිය තීන්දුව ලබාදෙමින් වගඋත්තරකරු 1983 අප්‍රේල් 21 වන දින සිට රාජ්‍ය සේවයෙන් ඉවත්වී ඇති බැවින් ඡන්ද පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ පෙත්සම පිළිබඳ තීරණයෙන් අතෘප්තිමත්වූ පෙත්සම්කරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. මෙම අභියාචනය විභාග කරන ලද්දේ අගවිනිසුරු ෂර්වානන්ද සහ වනසුන්දර, රණසිංහ, අතුකෝරළ සහ එල්.එච්.ද අල්විස් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.

රණසිංහ, අතුකෝරළ සහ එල්.එච්.ද අල්විස් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ එකඟතාවය මත අගවිනිසුරු විසින් 1986 ජනවාරි 31 වන දින නිකුත් කරන ලද තීන්දුව මගින් ප්‍රකාශ කරන ලද්දේ, වගඋත්තරකරු රුපියල් 6720 කට වඩා වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ සේවකයකු බැවින් ඔහු පාර්ලිමේන්තුවට තරඟ කිරීමට පෙර විධිමත්ව එකී රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්විය යුතුය. වගඋත්තරකරුට 1974 ජූලි 31 වන දින ලබාදී ඇති පත්වීම් ලිපියේ දක්වා ඇත්තේ ආයතන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට, ආයතන සංග්‍රහයට මූල්‍ය රෙගුලාසි සහ රජය විසින් කලින් කල පනවන නියෝගවලට යටත්ව කටයුතු කළ යුතු බවයි. ආයතන සංග්‍රහයට අනුව ඉල්ලා අස්වීමක් භාරදිය යුත්තේ පත්වීම් බලධාරියා වෙතය. වගඋත්තරකරුගේ පත්වීම් බලධාරියා වන්නේ අධ්‍යාපන සේවා කමිටුවයි. ඒ අනුව වගඋත්තරකරු නියමිත පරිදි රාජ්‍ය සේවයෙන් ඉවත් වී නොමැති බව තීරණය කර අභියාචනය භාරගන්නා බවත් ඒ අනුව වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙයට පටහැනි තීන්දුවක් ලබාදුන් වනසුන්දර විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ වගඋත්තරකරු ඉල්ලා අස්වීම යොමුකරන ලද්දේ නිවැරදි බලධාරියා වෙත නොවන නමුත් අදාළ නිලධාරීන් ඒ අනුව කටයුතු කර ඇති බැවින් වගඋත්තරකරුගේ මන්ත්‍රී ධූරය අහෝසි නොකළ යුතු බවයි. නමුත් බහුතරයේ තීරණය මත වගඋත්තරකරුගේ මන්ත්‍රීධූරය අහෝසිකරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව රිචඩ් පතිරණගේ මන්ත්‍රීධූරය අහෝසි වූ බැවින් අක්මීමන මැතිවරණ කොට්ඨාශය සඳහා තවත් අතුරු මැතිවරණයක් 1986 අප්‍රේල් 17 වන දින පවත්වන ලදී. එම අතුරු මැතිවරණය සඳහාද රිචඩ් පතිරණ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් තරඟ කරන ලද අතර එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් තරඟ කරන ලද්දේ ඇල්බට් ද සිල්වාය( Dahanayake Vs. De Silva (1978-79 -80)1 Sri.L.R 41 නඩුවේ වගඋත්තරකරු). එම දෙදෙනාට අමතරව අපේක්ෂකයින් 10 දෙනෙකුද එම අතුරු මැතිවරණය සඳහා තරඟ කරන ලදී. එම අතුරු මැතිවරණයෙන්ද රිචඩ් පතිරණ ජයග්‍රහණය කරන ලදී.( චන්ද්‍රානන්ද ද සිල්වා.1987.කොළඹ 25)

## 8.8. නියෝජිතයකු දූෂණ වරදකට වරදකරු වීම මත අපේක්ෂකයාගේ නම ඡන්ද නාමලේඛනයෙන් ඉවත් කළ නොහැක.

**රාජපක්ෂ එදිරිව කුලරත්න සහ තවත් අය**
**Rajapakse v. Kularatne and otheä (1988) 2 Sri LR 382**

### පසුබිම

1985 සැප්තැම්බර් මස 12 වන දින පැවති මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශයේ අතුරු මැතිවරණය සඳහා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් ආනන්ද කුලරත්න සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් චමල් රාජපක්ෂ තරඟ කරන ලදී. මැතිවරණ ප්‍රතිඵල අනුව ආනන්ද කුලරත්න ජයග්‍රහණය කරන ලදී. මෙම අතුරු මැතිවරණය පැවැත්වීමට හේතුව වූයේ 1983 මැයි 18 දින පැවති අතුරු මැතිවරණයෙන් ජයගත් ආනන්ද කුලරත්නගේ ආධාරකරුවකු වූ බැසිල් රාජපක්ෂ විසින් එම මැතිවරණයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තරඟ කරන ලද නිරූපමා රාජපක්ෂගේ චරිතයට හානියක් වන ආකාරයට අසත්‍ය ප්‍රකාශ කිරීම සම්බන්ධව මැතිවරණ

පෙත්සමක් මගින් ආනන්ද කුලරත්නගේ මන්ත්‍රීධූරය අහෝසි වීමය. (මෙම නඩුතීන්දුව පිළිබඳව විස්තරය සඳහා බලන්න - 9.9 අපේක්ෂකයාගේ නියෝජිතයකු විසින් අසත්‍ය මැතිවරණ ප්‍රචාරය අසුන අභිමිවීමට හේතුවකි). ඉන්පසුව ආනන්ද කුලරත්නගේ නම ඡන්ද නාමලේඛනයෙන් ඉවත් කිරීමට මැතිවරණ කොමසාරිස්වරයා සහ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කටයුතු කිරීමට එරෙහිව රිට් පෙත්සමක් ආනන්ද කුලරත්න විසින් ගොනුකළ අතර එහිදී අභියාචනාධිකරණය විසින් ආණ්ඩුක්‍රම අර්ථ නිරූපණයක් සඳහා නඩුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමුකරන ලදුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද්දේ ආනන්ද කුලරත්නගේ නම ඡන්ද නාමලේඛනයෙන් ඉවත් නොකළ යුතු බවයි. (මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය පිළිබඳව විස්තරය සඳහා  බලන්න - 9.10. නියෝජිතයකු විසින් සිදුකරනු ලබන දූෂණ ක්‍රියාවක් මගින් අපේක්ෂකයකු ඡන්දය භාවිතා කිරීම සඳහා නුසුදුසු වන්නේ නැත).

ඒ අනුව මුල්කිරිගල දෙවන අතුරු මැතිවරණය සඳහා ආනන්ද කුලරත්නගේ නාමයෝජනාව භාර ගන්නා ලදී.  මෙම මැතිවරණය සඳහා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් තරඟ කරන ලද්දේ චමල් රාජපක්ෂය. 1985 සැප්තැම්බර් 12 වන දින පැවති අතුරු මැතිවරණයේ ප්‍රතිඵලය අනුව ආනන්ද කුලරත්න නැවත වරක් ජයග්‍රහණය කරන ලදී. ආනන්ද කුලරත්නගේ පත්වීම අභියෝගයට ලක් කරමින් චමල් රාජපක්ෂ මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## මැතිවරණ පෙත්සම

අභියාචනාධිකරණයේ Election Petition No. 1/1985-Electoral District No 75 - Mulkirigala ලෙස ලියාපදිංචි වී තිබූ මෙම පෙත්සම මගින් පෙත්සම්කරු චෝදනා කරන ලද්දේ පළවෙනි වගඋත්තරකාර ආනන්ද කුලරත්න ඉහත කී ආනන්ද කුලරත්න එදිරිව රාජපක්ෂ ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ තීන්දුව (Kularatne v. Rajapaksha-1985-1-Sri.LR-24) මත කටයුතු කළ  මැතිවරණ විනිසුරුගේ වාර්තාව අනුව වසර 7ක් දක්වා මැතිවරණයක් සඳහා තරඟ කිරීමට නුසුදුස්සෙකු වන බවයි.

මැතිවරණ පෙත්සම විභාග කළ විනිසුරුවරු සිය තීරණය 1986 මාර්තු 26 වන දින ලබාදෙන ලදී. එමගින් විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ පළවෙනි වගඋත්තරකරු විසින් ඔහුගේ නම ඡන්ද නාමලේඛනයෙන් ඉවත් කිරීමට එරෙහිව ගොනුකරන ලද 112/85

දරණ නඩුවේ තීරණය ලබාදී තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් මත බැවින් තමන් එම තීරණයෙන් බැඳෙන බැවින් මැතිවරණ පෙත්සම නිශ්ප්‍රභා කරන බවයි.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කිරීම

මැතිවරණ විනිසුරුගේ මෙම තීරණයෙන් අතෘප්තියට පත් පෙත්සම්කරු එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් සිදුකරන ලදී. එම අභියාචනය ELECTION PETITION NO. 1/1986 (Election Petition No. 1/1985-Electoral District No 75 — Mulkirigala) ලෙස ලියාපදිංචිවී තිබිණි. වැදගත් නීති තර්කයක් හා සම්බන්ධ කරුණක් බැවින් මෙම අභියාචනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 132(3) ව්‍යවස්ථාව යටතේ පූර්ණ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් ඉදිරියේ විභාග කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී. ඒ අනුව අගවිනිසුරු ෂර්වානන්ද සමග වනසුන්දර, කොලින් තෝමේ, රණසිංහ, අතුකෝරළ, තම්බයියා, එල්.එච්.ද අල්විස්, සෙනවිරත්න සහ එච්.ඒ.ජී.ද සිල්වා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ඉදිරියේ මෙම අභියාචනය විභාග කරන ලදී.

අභියාචනා විභාගයේදී පළවෙනි වගඋත්තරකරු වෙනුවෙන් මූලික තර්ක දෙකක් නගන ලදී. එනම්.

- ❖ ශ්‍රේෂ්ඨාධිකරණය අධිකරණ තීරණ මගින් බැඳී සිටින ලදී.
- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණ බලතල භාවිතා කරමින් 1985 ජූලි 2වන දින ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් තීරණයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය බැඳේ.

නමුත් ශ්‍රේෂ්ඨාධිකරණ පූර්ණ විනිසුරු මඩුල්ල ඒකමතිකව එම මූලික විරෝධතාවය නිශ්ප්‍රභාකරමින් අභියාචනය විභාග කිරීමට තීරණය කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

වනසුන්දර විනිසුරුවරයා හැර අනෙකුත් විනිසුරුවරුන් 7 දෙනා එකඟවූ තීරණය අගවිනිසුරු ෂර්වානන්ද විසින් 1987 නොවැම්බර් 26 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. එහිදී අගවිනිසුරුවරයා 1946

ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ නුසුදුසුකම් පිළිබඳව සහ සිවිල් අයිතිය අහිමිවීම පිළිබඳව වූ නීතිමය ප්‍රතිපාදන කෙරෙහි අවධානය යොමුකරන ලදී.

එසේම මහා බ්‍රිතාන්‍යයේ නීතියක් වන මහජන නියෝජිත පනත 1949 (Representation of the Peoples Act 1949) හි ප්‍රතිපාදන පිළිබඳව අවධානය යොමුකළ විනිසුරුවරයා පෙන්වා දුන්නේ අපේක්ෂකයා පුද්ගලිකව දූෂණ වරදක් සිදුකළ විට වසර 10ක් දක්වා මහජන මන්ත්‍රී මණ්ඩලයට පත්වීමට නුසුදුසු වන අතර අපේෂකයා නියෝජිතයකුගේ මාර්ගයෙන් දූෂණ ක්‍රියාවක් සිදුකළ විට වසර 7 ක් දක්වා මහජන මන්ත්‍රී මණ්ඩලයට පත්වීමට නුසුදුස්සෙකු වන බවත් පෙන්වා දෙන ලදී. එවැනි වෙනස් ලෙස දැක්වීමක් ශ්‍රී ලංකා නීතියෙහි නොපවතින බව පෙන්වා දුන් විනිසුරවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ සුදුසුකම් හා නුසුදුසුකම් පිළිබඳව සඳහන් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 සහ 90 ව්‍යවස්ථා බවත් ඒ අනුව 1වන වගඋත්තරකරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට සුදුසුවන්නේ ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 සහ 90 ව්‍යවස්ථා පරීක්ෂාකර බැලිය යුතු බවත් මෙම ප්‍රතිපාදන අනුව 1වන වගඋත්තරකරු පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය දැරීමට නුසුදුස්සෙකු නොවන බවත් පෙන්වාදෙන ලදී. ඒ අනුව අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 8.9. රජයේ ආයතන සමග ව්‍යාපාර කටයුතු කිරීම පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයක් දැරීමට නුසුදුසුකමකි

**ඩිලාන් පෙරේරා එදිරිව රාජිත සේනාරත්න -**
**Dilan Perera v. Rajitha Senarathne (2000) 2 Sri LR.79**

**පසුබිම**

ඩිලාන් පෙරේරා 1994 අගෝස්තු මස 16 වන දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් බදුල්ල දිස්ත්‍රික්කය සඳහා පොදු පෙරමුණ දේශපාලන පක්ෂයෙන් තරඟ කර තේරී පත්වූ මන්ත්‍රීවරයෙකි. රාජිත සේනාරත්න එම මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් පත්කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. රාජිත

සේනාරත්න මන්ත්‍රීවරයා අධ්‍යක්ෂක ධූරය දරණ සමාගමක් රජය සමග ව්‍යාපාර සිදුකරන බවට චෝදනා කළ ඩිලාන් පෙරේරා මන්ත්‍රීවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රජය සමග ව්‍යාපාර කරන පුද්ගලයකු පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් දැරීම නුදුසුදුකමක් වන බව පවසමින් රාජිත සේනාරත්න මන්ත්‍රීවරයාගේ මන්ත්‍රීධූරය බලරහිත කරන ලෙස  පෙත්මක් ගොනු කරන ලදී.

## රිට් පෙත්සම

මෙම පෙත්සම මගින් පළවෙනි වගඋත්තරකරු ලෙස රාජිත සේනාරත්න මන්ත්‍රීවරයාද දෙවන වගඋත්තරකරු ලෙස එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයාද, තුන්වන වගඋත්තරකරු ලෙස පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාද නම්කර තිබිණි.

පළවෙනි වගඋත්තරකරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමෙන් අනතුරුව රජයේ ආයතන සමග දන්ත උපකරණ සැපයීමේ කොන්ත්‍රාත්වලට එළඹ ඇති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඉ) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් දැරීමට බලයක් නොමැති බවට ක්වෝවොරන්ටෝ රිට් ආඥාවක්ද, පළවෙනි වගඋත්තරකරු පාර්ලමේන්තුවේ අසුන් ගැනීමෙන් හෝ ඡන්දය භාවිතා කිරීමෙන් වැළැක්වීමේ මැන්ඩාමුස් ආඥාවක් තුන්වන වගඋත්තරකාර පාර්ලිමේන්තු මහලේකම්වරයාට එරෙහිව නිකුත් කරන ලෙසත් ඉල්ලා පෙත්සම්කරු 1998 වසරේදී අභියාචනාධිකරණය වෙත රිට් පෙත්සම ඉදිරිපත් කරන ලදී.

### පෙත්සම් විභාගය

හෙක්ටර් යාපා සහ ද සිල්වා යන අභියාචනාධිකරණ විනිසුරුවරුන් විසින් පෙත්සම් විභාගය  1999 සැප්තැම්බර් ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලදී පවත්වන ලදි.

සී/ස සේනාරත්න මෙඩිකල් සප්ලයර්ස් (පුද්ගලික)සමාගම විසින් දන්ත වෛද්‍ය උපකරණ සැපයීම සඳහා ඇතිකර ගත් කොන්ත්‍රාත් ගිවිසුම් කිහිපයක්ම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. එකී ගිවිසුම් අනුව 1985 වසරේ  සිට සීමාසහිත සේනාරත්න මෙඩිකල් සප්ලයර්ස් නමින් රජය සමග ව්‍යාපාර කටයුතු කරගෙන එන අතර එම ව්‍යාපාර  1998 අගෝස්තු මස 25 වන දිනයෙන් ඔබ්බටද සිදුකර ඇති බව පෙත්සම්කරු දක්වන ලදී.
එසේම 1999 දෙසැම්බර් 11 වන දින "සේනාරත්න සීමාසහිත ඩෙන්ටල්

සප්ලයස් (පුද්ගලික) සමාගම" සමාගම් පනත යටතේ ලියාපදිංචිකර ඇති බවය. සමාගමේ ලියාපදිංචි සහතිකය සාංගමික ව්‍යවස්ථාවලිය සහ සාංගමික සංස්ථාපත්‍රය අධිකරණයට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පළවෙනි වගඋත්තරකරු එකී සමාගමේ අධ්‍යක්ෂකවරයකු ලෙස කටයුතු කරන බව පෙත්සම්කරු පෙන්වාදෙන ලදී.

එම සමාගම සීමාසහිත සුෂ් ඩෙන්ට් (ඉන්දියා) පුද්ගලික සමාගම (M/s Suz-Dent (India) Pvt. Ltd. සමග එක්ව සෞඛ්‍ය මහාමාර්ග සහ සමාජ සේවා අමාත්‍යංශයට සෞඛ්‍යය උපකරණ සැපයීමේ කොන්ත්‍රාත්තුවකට 1995 නොවැම්බර් 16 වන දින අත්සන් කර ඇති බවට පෙත්සම්කරු ලේඛන ඉදිරිපත් කරන ලදී.

එසේම එම සමාගම ඔසුසල සහ නාවික හමුදාවට සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සිදුකරන ලද වෛද්‍ය උපකරණ සැපයීම් සම්බන්ධ ලේඛනද පෙත්සම්කරු අධිකරණයට ඉදිරිපත් කරන ලදී. මේ අනුව 1995 අගෝස්තු මාසයෙන් පසුව පළවෙනි වගඋත්තරකරුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමේ බලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඉ) ව්‍යවස්ථාවට අනුව නොමැති බවත් මෙහිදී එකී ව්‍යවස්ථාව සමග 101(2) ව්‍යවස්ථාවද 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව, සහ සෝල්බරි ව්‍යවස්ථාවේ 13(3) ව්‍යවස්ථාවද අදාළ වන බව පෙත්සම්කරු ප්‍රකාශ කරන ලදී.

පළවෙනි වගඋත්තරකරුගේ තර්කය වූයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඉ) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ "රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නැතහොත් රජය වෙනුවෙන් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙනුවෙන් එළඹ ඇත්තා වූ යම්කිසි ගිවිසුමකට යම්කිසි තැනැත්තකුගේ යම් ආකාරයක සම්බන්ධතාවක් තිබීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ නුසුදුසුකමක් යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබේ ද" එවැනි අවස්ථාවකදී පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහෝසි වන බවත්, එහෙත් මේ වන තෙක් පාර්ලිමේන්තුව එවැනි නීතියක් පනවා නොමැති බවත්ය.

එසේම පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ)රාජ සභා ආඥාව සම්පූර්ණයෙන්ම ඉවත් වී ඇති බවත් තර්ක කරන ලදී. ඒ අනුව රජය සමග ව්‍යාපාර කිරීමේ හේතුවෙන්

පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කිරීමට නීතිමය ප්‍රතිපාදනයක් නොමැති බව පළවෙනි වගඋත්තරකරුගේ තර්කය විය.

## අභියාචනාධිකරණයේ තීරණය

ද සිල්වා විනිසුරුවරයාගේ ද එකඟතාවය මග පෙත්සමේ තීන්දුව හෙක්ටර් යාපා විනිසුරුවරයා විසින් 2000 මාර්තු 31 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101(2) ව්‍යවස්ථාවට අනුව (101(2) ව්‍යවස්ථාව - එවැනි කාරණා සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන යොදන තුරු කලින් කළ සංශෝධිත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව අදාළ වන්නේ ය.) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව සම්පූර්ණයෙන්ම ඉවත්වී නැත. 1980 අංක 44 දරණ ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත සහ 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත මගින් සංශෝධනය වී ඇත්තේ මැතිවරණ ක්‍රියාවලියට අදාළ ප්‍රතිපාදන පමණි. ඒ අනුව ලංකා පාර්ලිමේන්තු පනතේ 77 වගන්තිය මගින් මන්ත්‍රීවරයකුගේ නුසුදුසුකම් සම්බන්ධයෙන් දක්වයි. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය වූ Dissanayake vs De Silva (1978-79-80)1Sri.L.R.41) නඩුවේ තීරණයට අනුව සෝල්බර් ව්‍යවස්ථාවේ 13(3)(ඇ) ව්‍යවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නුසුදුසුකම් සම්බන්ධයෙන් ප්‍රතිපාදන අදාළ කර ගනියි. සෝල්බරි ව්‍යවස්ථාවේ 13(3) (ඇ) ව්‍යවස්ථාවට අනුව රජය සමග ව්‍යාපාර කිරීම පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වන හේතුවක් වේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 168(1) (168(1) ව්‍යවස්ථාව - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනත් විධිවිධාන ප්‍රකාශිතවම ඇතොත් හැර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බලපැවැත්වූ සියලූ ම නීති, ලිඛිත නීති හා ලිඛිත නොවූ නීති පාර්ලිමේන්තුව අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස අවශ්‍ය වෙනස් කිරීම් ඇතිව නොකඩවා බල පැවැත්විය යුත්තේ ය) ඒ අනුව Dissanayake vs De Silva නඩුවේ තීන්දුව බලාත්මක නීතියේ කොටසක් බව දැක්වූ අධිකරණය ඒ අනුව යමින් සෝල්බරි ව්‍යවස්ථාවේ 13(3)(ඇ) ව්‍යවස්ථාවේ දක්වන පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය දැරීමට නුසුදුසුකමක් වන රජය සමග ව්‍යාපාර කිරීම මත පළවෙනි වගඋත්තරකරුගේ මන්ත්‍රීධූරය අහෝසි කිරීම සඳහා ක්වෝවොරන්ටෝ රිට් ආඥාවක්ද පළවෙනි වගඋත්තරකරු

මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවේ අසුන්ගැනීමෙන් වැළැක්වීම සඳහා 3වන වගඋත්තරකාර පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත මැන්ඩාමුස් රිට් ආඥාවක්ද නිකුත් කරන ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය**

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව රාජිත සේනාරත්න මන්ත්‍රීවරයාගේ මන්ත්‍රීධූරය අහෝසි විය. ඔහුගෙන් ඇබෑර්තු වූ එක්සත් ජාතික පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරය සඳහා සුදුසු පුද්ගලයකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක්සත් ජාතික පක්ෂයේ ලේකම්වරයා වෙත දැනුම්දුන් අතර එක්සත් ජාතික පක්ෂය විසින් රාජිත සේනාරත්නගේ නම මැතිවරණ කොමසාරිස්වරයා වෙත නාමයෝජනා කළ අතර ඒ අනුව ඔහු නැවත වරක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්කරන ලදී.

## 8.10. යුද්ධාධිකරණයද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඈ) ව්‍යවස්ථාවේ අධිකරණ යන අර්ථ නිරූපණයට ඇතුළත්වේ.

**සරත් ෆොන්සේකා එදිරිව ධම්මික කිතුල්ගොඩ පාර්ලිමේන්තුවේ මහ ලේකම් සහ තවත් අය**
**Gardihewa Sarath C. Fonseka v. Dammika Kithulegoda SC REF No: 1/2010 S.C.M: 10.01.2011**

**පසුබිම**

2010 අප්‍රේල් 8 වන දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා පෙත්සම්කාර සරත් ෆොන්සේකා ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයෙන් කොළඹ දිස්ත්‍රික්කය වෙනුවෙන් තරංග කරන ලදී. ඒ අනුව පාර්ලිමේන්තුවට තේරී පත්වූ පෙත්සම්කරු 2010 අප්‍රේල් 24 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දෙන ලදී. 2010 සැප්තැම්බර් 17 වන දින යුධ හමුදා පනත යටතේ ස්ථාපනය කර ඇති යුද්ධාධිකරණය මගින් පෙත්සම්කරුට මාස 30ක සිරදඬුවමක් ලබාදුන් අතර එම තීන්දුව ජනාධිපතිවරයා විසින් 2010 සැප්තැම්බර් 29 වන දින අනුමත කරන ලදී, ඒ අනුව ඔහුගේ මන්ත්‍රීධූරය අවසන්වූ බව පාර්ලිමේන්තු මහලේකම් විසින් දැනුම්දෙන ලදී. පසුව ඔහු වෙනුවෙන් ඊළඟට මනාප ලබාගත් ලක්ෂ්මන් නිපුන ආරච්චිව 2010 ඔක්තෝබර් 8 වන දින අති විශෙෂ ගැසට් පත්‍රයක් මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම

තීරණයට එරෙහිව සරත් ෆොන්සේකා විසින් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කරන ලදී,

## රිට් පෙත්සම

2010 ඔක්තෝබර් 12 වන දින අභියාචනාධිකරණයේ ගොනුකරන ලද රිට් පෙත්සම මගින් පාර්ලිමේන්තු මහලේකම්, පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම්, මැතිවරණ කොමසාරිස්, කොළඹ දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරී, බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් , යුධ හමුදාපති, පෙත්සම්කරුගේ හිස්වූ මන්ත්‍රීධූරය වෙනුවෙන් පත් කළ මන්ත්‍රී ලක්ෂ්මන් නිපුන ආරච්චි සහ නීතිපති යන වගඋත්තරකරුවන් 1 සිට 8 දක්වා පිළිවෙලින් නම්කර තිබිණි. පෙත්සම්කරුගේ මන්ත්‍රීධූරය අහෝසි කිරීමට ගත් තීරණ අහෝසි කරන සර්ටියෝරාරි ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්. පෙත්සම්කරු නිසි ලෙස ඡන්දයෙන් පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ප්‍රකාශ කිරීමේ මැන්ඩාමුස් ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත් පෙත්සම්කරු අභියාචනාධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

## රිට් පෙත්සම් විභාගය

පෙත්සම් විභාගයේදී ගරු නීතිපතිවරයා කරුණු දක්වා තිබුනේ පෙත්සම්කරුගේ මන්ත්‍රීධූරය පුරප්පාඩු වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(ඈ) ව්‍යවස්ථාව සමග කියවිය යුතු 89(13) (ආ) ව්‍යවස්ථාවේ ක්‍රියාකාරීත්වය නිසා බවයි.

(යම්කිසි තැනැත්තෙක් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට කවර වූ හෝ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව නියම කරනලද හය මාසයකට නොඅඩු කාලයකට කවර වූ හෝ ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් ම විඳ සිටියේ නම් නැතහොත් මරණ දණ්ඩනයට යටත්ව සිටී නම් නැතහොත් එවැනි දණ්ඩන නියමයක් ක්‍රියාවේ යෙදවීම වෙනුවට හය මාසයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් විඳ සිටියේ නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය:
එසේ වුව ද, මේ ඡේදය යටතේ නුසුදුස්සකු වූ කවර වූ හෝ

තැනැත්තකුට කොන්දේසි රහිත සමාවක් දෙන ලද්දේ නම්, ඒ සමාව දුන් දිනයේ සිට ඒ නුසුදුසුකම නැති වී යන්නේ ය. - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඈ) ව්‍යවස්ථාව) එබැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13)(ආ) ව්‍යවස්ථාව අනුව පුරප්පාඩුව සම්පූර්ණ කර ඇති බවත්ය. මෙහිදී පෙත්සම්කරුවන් අභියෝග කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 ව්‍යවස්ථාවේ සඳහන් වන අධිකරණය යන අර්ථ නිරූපණය තුළට යුද්ධාධිකරණය ඇතුළත් වන්නේද යන්නයි. මේ පිළිබඳ අර්ථ නිරූපණය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125 වන ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රතිපාදන භාවිතා කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අර්ථ නිරූපණය

ශ්‍රේෂ්ඨාධිකරණයේදී මේ පිළිබඳව විමසීම සිදුකරන ලද්දේ අගවිනිසුරු ජේ.ඒ.එන් ද සිල්වා සහ ආචාර්ය ශිරාණි බණ්ඩාරණායක, ගාමිණී අමරතුංග, සලීම් මාර්සූෆ් සහ කේ.ශ්‍රී පවන් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගෙන් සමන්විත පංචපුද්ගල විනිසුරු මඩුල්ලක් විසිනි. දින දෙකක කරුණු විමසීමෙන් සහ ලිඛිත දේශනවලින් අනතුරුව 2011 ජනවාරි 10 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

අගවිනිසුරුවරයා විසින් සකස් කරන ලද දීර්ඝ නඩු තීන්දුව අවසානයේ දී යුධ හමුදා පනතේ 133 වගන්තිය අනුව යුද්ධාධිකරණයට මරණීය දණ්ඩනය සහ සිරදඬුවම් නියම කිරීමේ බලය පවතින බවත්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාව අනුව එවැනි බලයක් පවතින්නේ නිසි පරිදි ස්ථාපිත අධිකරණ වලට පමණක් බවත් සඳහන් කළ අධිකරණය ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඈ) ව්‍යවස්ථාවේ සඳහන් අධිකරණ යන්නට යුද්ධාධිකරණය ඇතුළත් වන බවට ශ්‍රේෂ්ඨාධිකරණ අර්ථ නිරූපණය කරන ලදී.

## තීරණයේ ප්‍රතිඵලය

මෙම තීරණය අනුව පෙත්සම්කාර සරත් ෆොන්සේකාගේ මන්ත්‍රීධූරය අහෝසි වීම තහවුරු විය. 2010 ඔක්තෝබර් මස මැතිවරණ කොමසාරිස්වයා විසින් සරත් ෆොන්සේකා වෙනුවට පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වගන්තිය යටතේ පත් කරන ලද එම පක්ෂයේ ලක්ෂ්මන් නිපුන ආරච්චි එම පක්ෂයේ තීරණයක් මත මාස 3ක්

පාර්ලිමේන්තුවට පැමිණීමෙන් වැළකී සිටි අතර ඔහුගේ මන්ත්‍රීධූරය අහෝසි විය. ඉන් පසුව මැතිවරණ කොමසාරිස් විසින් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(2) වගන්තිය යටතේ 2011 පෙබරවාරි 7 වන දින අංක 1692/1 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ජයන්ත කැටගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු ලෙස පත් කරන ලදී.

## 8.11. විදේශ පුරවැසිභාවය මත පාර්ලිමේන්තු අසුන අහිමිවීම

ගීතා සමන්මලී කුමාරසිංහ එදිරිව බුවනෙක ලලිත් සහ වෙනත් අය
Geetha Samanmali Kumarasinghe v. N.W.E.Buwaneka Lalitha
SC/SPL/LA/109/2017 S.C.M. 2.11.2017

### පසුබිම

2015 පැවති පාර්ලිමේන්තු මැතිවරණ පවත්වන ලද්දේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේය. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඇ) (xiii) අනු ව්‍යවස්ථාව අනුව "වෙනත් රටක ද පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු" වීම පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයක් දැරීමට නුසුදුසුකමකි. මෙම මැතිවරණයට ගීතා කුමාරසිංහ ගාල්ල දිස්ත්‍රික්කයෙන් නාමයෝජනා ඉදිරිපත් කරන ලද අතර ඇය මැතිවරණයේදී ඡන්ද 63,955 ලබාගෙන ජයග්‍රහණය කරන ලදී. මැතිවරණ කොමසාරිස් විසින් ඇය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස තේරී පත්වූ බවට ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. ඒ අනුව ඇය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස දිවුරුම්දී පාර්ලිමේන්තුවේ කටයුතු වලට සහභාගී විය. ඇය ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවයක් මෙන්ම ස්විට්සර්ලන්තයේ ද පුරවැසිභාවය පවතින බව මැතිවරණ කාලයේ සිටම ප්‍රචලිත විය.

**අභියාචනාධිකරණයට ඉදිරිපත් කළ රිට් ආඥාව** CA (Writ) Application 262/2015

ගීතා කුමාරසිංහ වෙත වෙනත් රටක පුරවැසිභාවයක් පවතින බැවින් ඇයගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණයට රිට් ආඥාවක් ගොනුවිය.

ගාල්ල දිස්ත්‍රික්කයේ ඡන්දදායකයන් වූ බුවනෙක ලලිත් හා තවත් 4 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද මෙම පෙත්සමෙන් පහත සහනයන්

අභියාචනාධිකරණයෙන් ආයාචනය කරන ලදී.

- ❖ ගීතා කුමාරසිංහගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය දැරීමට ඇති බලයක් පවතින්නේ කෙසේදැයි පෙන්වීමට නියෝග කරන ක්වෝවොරන්ටෝ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස,
- ❖ ගීතා කුමාරසිංහට පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය දැරීමට නුසුදුසුකමක් පවතින බවට ක්වෝවොරන්ටෝ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස,
- ❖ 2015-8-17 සිට 2015-9-1 දින දක්වා ගීතා කුමාරසිංහගේ පුරවැසිභාවයට අදාළ ලේඛන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ආගමන විගමන පාලකට නියෝගයක් නිකුත් කරන ලෙස,
- ❖ නඩු ගාස්තු ලබාදෙන ලෙස,

මෙම රිට් පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබුනේ ගීතා කුමාරසිංහ, ආගමන විගමන පාලක, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම්, සහ පාර්ලිමේන්තු මහ ලේකම්වරයාය. පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණයේ සභාපති ජනාධිපති නීතිඥ විජිත් මලල්ගොඩ සහ ප්‍රීති පද්මන් සූරසේන යන අභියාචනාධිකරණ විනිසුරුවරුන් විසිනි.

පළවෙනි වගඋත්තරකාර ගීතා කුමාරසිංහ පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් පහත කරුණු මත පෙත්සම ප්‍රතික්ෂේප කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

- ❖ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කිරීමට මෙම අධිකරණයට අධිකරණ බලය නොමැත,
- ❖ මැතිවරණයකින් තේරී පත්වූ මන්ත්‍රීවරුන්ගේ ධූරය ප්‍රශ්න කළ හැක්කේ ඡන්ද පෙත්සමක් මගින් පමණි.
- ❖ පෙත්සම්කරුවන්ට මෙම නඩුව පැවරීමට නඩු පැවරීමේ බලයක් (Locus Standi ) නොමැත.
- ❖ පාර්ලිමේන්තුවේ ක්‍රියාවලියක් ප්‍රශ්න කිරීමට හෝ දෝශාභියෝගයට ලක් කිරීමට අධිකරණයට නොහැක.
- ❖ පෙත්සම්කාරියගේ ද්විත්ව පුරවැසිභාවය ලේඛන මගින් ඔප්පු කිරීමට පෙත්සම්කරුවන් අපොහොසත් වී ඇත.

මෙම පෙත්සමට අධිකරණ නියෝග මත ආගමන විගමන පාලකවරයා විසින් දිවුරුම් ප්‍රකාශ මගින් කරුණු ඉදිරිපත් කර තිබිණි.

ඒ අනුව ආගමන විගමන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව පහත කරුණු අධිකරණයට ඉදිරිපත් විය.

- ❖ පළවෙනි වගඋත්තරකාරිය 2006-08-29 දින ශ්‍රී ලංකා/ ස්විස්ටර්ලන්ත ද්විත්ව පුරවැසියකු ලෙස ලියාපදිංචිවී ඇත.
- ❖ පළවෙනි වගඋත්තරකාරියට ද්විත්ව පුරවැසි සහතිකයක් 2006-09-19 දින නිකුත් කර ඇත.
- ❖ 2015-10-30 දින ඇය රාජ්‍යතාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රයක් අයදුම්කළ අතර එහි ද්විත්ව පුරවැසිභාවය සඳහන් නොකරන ලෙස ඉල්ලීමක් කර ඇත.
- ❖ පළවෙනි වගඋත්තරකාරිය 2015-09-11 වන දාතම යටතේ ස්විට්සර්ලන්ත පුරවැසි සේවය වෙතින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කරන ලද අතර එහි දක්වා තිබුණේ ගීතා සමන්මලී ස්විට්සර්ලන්ත පුරවැසිභාවයෙන් නිදහස් කර ඇති බවයි.
- ❖ මෙම ලිපිය මගින් ස්විට්සර්ලන්තයේ සම්පූර්ණ පුරවැසිභාවය ඉවත් කර තිබේද යන්නට සාක්ෂි ඉදිරිපත් කරන ලෙස පළවෙනි වගඋත්තරකාරියට උපදෙස් දී තිබේ.
- ❖ නමුත් නීතිපතිගේ උපදෙස්වලට පළවෙනි වගඋත්තරකාරිය ප්‍රතිචාර දක්වා නැත.

වගඋත්තරකාරිය ඉදිරිපත් කළ 2015-9-11 දින දරණ ලිපියේ 4වන පරිච්ඡේදයේ සඳහන් වූයේ "පුරවැසි සේවා සහ ලියාපදිංචි කාර්යාලය දැනුම් දෙන්නේ ස්විට්සර්ලන්ත පුරවැසිභාවය මහනගර සභාව විසින් නිදහස් කිරීමෙන් අනතුරුව ඒවා සම්පූර්ණ වෙයි" යනුවෙනි.

## අභියාචනාධිකරණ නියෝගය

අභියාචනාධිකරණයේ සභාපති ජනාධිපති නීතිඥ විජිත් මලල්ගොඩ විනිසුරුවරයාගේ එකඟතාවය මත විනිසුරු ප්‍රීති පද්මන් සූරසේන විසින් 2017 මැයි 3 වන දින නිකුත් කළ නියෝගය අනුව පළවෙනි වගඋත්තරකාරිය ද්විත්ව පුරවැසියකු බව අධිකරණය තීරණය කරන ලදී. පළවෙනි වගඋත්තරකාරියගේ අනෙකුත් විරෝධතාවයන්ද ඉවතලූ අභියාචනාධිකරණය පළවෙනි වගඋත්තරකාරියගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ක්වෝවොරන්ටෝ රිට් ආඥාව නිකුත් කරන ලදී.

එසේම නීතිපතිවරයාට නියම කරන ලද්දේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමේ නුසුදුසුකමින් සිටියදී එය දැරීම වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 100 ව්‍යවස්ථාව යටතේ අයකළ යුතු දඩ මුදල් අයකිරීමට කටයුතු කරන ලෙසයි.

ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුකළ අභියාචනය - SC/SPL/LA/109/2017
අභියාචනාධිකරණ තීරණයෙන් අතෘප්තිමත්වූ පළවෙනි වගඋත්තරකාර ගීතා කුමාරසිංහ එකී තීරණයට එරෙහිව 2017 මැයි 09 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් සිදුකරන ලදී.

මෙම අභියාචනා පෙත්සම අගවිනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රියසාත් ඩෙප් සහ ජනාධිපති නීතිඥ බුවනෙක අලුවිහාරේ, සිසිර ද ආබෲ, අනිල් ගුණතිල සහ නලින් පෙරේරා යන පංච පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් විසින් විනිශ්චය කරන ලදී.

අභියාචනා විභාගයෙන් අනතුරුව 2017 නොවැම්බර් 2 දින ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ලබාදෙන ලදී. අනෙකුත් විනිසුරුවරුන්ද එකඟතාවය පලකළ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ලබාදුන්නේ සිසිර ද ආබෲ විනිසුරුවරයා විසිනි. ඒ අනුව ගීතා කුමාරසිංහ මැතිවරණයට ඉදිරිපත් වන අවස්ථාව වන විටත් ස්විට්සර්ලන්තයේ පුරවැසිභාවයද පැවතුන බව තීරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය අභියාචනාධිකරණයේ තීරණය සනාථ කරමින් අභියාචනා ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

## තීරණයේ ප්‍රතිඵලය

එකී තීරණයට අනුව ගීතා කුමාරසිංහගේ මන්ත්‍රීධූරය අහෝසි වූ බවට පාර්ලිමේන්තු මහලේකම්වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැනුම්දුන් අතර ගාල්ල දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයෙන් තේරීපත් නොවූ අපේක්ෂකයන් අතරින් වැඩිම මනාප ලබාගෙන සිටි අපේක්ෂකයා වූ පියසේන ගමගේව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 ව්‍යවස්ථාවේ 13(ආ) අනු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2017 නොවැම්බර් 8 වන දින අංක 2044/27 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලදී. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද විදේශ පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික පුරවැසියකුට මැතිවරණයකට ඉදිරිපත්වීමේ නුසුදුසුකම 2020 වසරේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එක් කරන ලද 20 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලදී.

## 8.12 පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහිමි නොකළ පුද්ගලයකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම්දීමේ අයිතිය ඇත.

**ප්‍රේමලාල් ජයසේකර එදිරිව බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් සහ තවත් අය**

**Halkandaliya Lekamalage Premalal Jayasekera v. Thushara Upuldeniya Commissioner General of Prisons and Others - C.A (Writ) Application No.295/2020 CA.M 07.09.2020**

### පසුබිම

පෙත්සම්කාර ප්‍රේමලාල් ජයසේකර 2020 අගොස්තු 5 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් රත්නපුර දිස්ත්‍රික්කය සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මගින් තරඟ කිරීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කරන ලදී. නාමයෝජනා ලබාදීමෙන් අනතුරුව මැතිවරණයට පෙර එනම් 2020 ජූලි 31 වන දින ඒ වන විට විභාග වෙමින් පැවති අංක HCR 71/2016 දරණ මිනීමැරුම් නඩුවේ තීන්දුව ලබාදුන් රත්නපුර මහාධිකරණය පෙත්සම්කරුට මරණ දඬුවම ලබාදෙන ලදී. ඒ අනුව පෙත්සම්කරු වැලිකඩ බණ්ධනාගාරයට ඇතුළත් කරන ලදී. පෙත්සම්කරු විසින් 2010 අගොස්තු 4 වන දින එම මහාධිකරණ තීරණයට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනයක් ගොනු කරන ලදී.

අගෝස්තු 5 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී පෙත්සම්කරු ඡන්ද 142,037 ක් ලබා ගනිමින් රත්නපුර දිස්ත්‍රික්කයෙන් 2වන ස්ථානයට මනාප ලබාගෙන පාර්ලිමේන්තුවට තේරී පත්විය. 2020 අගොස්තු 20 දින ජනාධිපති විසින් පාර්ලිමේන්තුව කැඳවා තිබිණි. නීතිපති විසින් ඔහුගේ AG/21/2020 සහ 2020 අගොස්තු 19 දින දරණ ලිපිය මගින් බණ්ධනාගාර කොමසාරිස් ජෙනරාල්ටද පිටපත් සහිතව අමාත්‍යංශ ලේකම් වෙත උපදෙස් ලබාදී තිබුනේ පෙත්සම්කරුව පාර්ලිමේන්තු සැසිවාර සඳහා සහභාගී වීමට අවසර නොමැති බවයි.

තමන්ට පාර්ලිමේන්තුව සැසිවාර සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදෙන නියෝගයක් නිකුත් කරන ලෙස ඉල්ලා පෙත්සම්කරු අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## පෙත්සම් විභාගය

නීතිපති වරයාගේ ලිපිය අභියෝගයට ලක් කරමින් මෙම පෙත්සම ඉදිරිපත් කර තිබූ අතර පෙත්සම මගින් බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් වරයා, වැලිකඩ බන්ධනාගාරයේ අධිකාරිවරයා සහ පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි. පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු ඒ.එච්.එම්.ඩී.නවාස් සහ අභියාචනාධිකරණ විනිසුරු සෝභිත රාජකරුණා යන විනිසුරුවරුන් විසිනි. මෙම පෙත්සම් විභාගයේදී නීතිපතිවරයා වෙනුවෙන් කරුණු දැක්වූ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා ප්‍රකාශ කරන ලද්දේ පෙත්සම්කරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ ඡන්දය භාවිතා කිරීමට නුසුදුස්සකු වී ඇති බවයි.

## අභියාචනාධිකරණයේ අතුරු නියෝගය

2020 සැප්තැම්බර් 9 වන දින අභියාචනාධිකරණයේ අතුරු නියෝගය සෝභිත රාජකරුණා විනිසුරුගේද එකඟතාවය මත සභාපති විනිසුරු විසින් ලබාදෙන ලදී. පාර්ලිමේන්තුවේ අසුන් ගැනීම, ඡන්දය ප්‍රකාශ කිරීමේ ප්‍රශ්නය අප ඉදිරියේ මතු නොවන අතර ඒ පිළිබඳව තීරණය ගැනීමට කතානායක වරයාට හෝ බලයලත් වෙනත් ආයතනයකට අයත් කාර්යක් බවත් අප ඉදිරියේ ඇති දෙය පෙත්සම්කරුට පාර්ලිමේන්තුවට පැමිණීම වළක්වන ලිපිය අභියෝගයට ලක් කිරීමක් වන අතර, පාර්ලිමේන්තුවට අදාළව සාමාජිකයින්ගේ සහ වෙනත් අයගේ හැසිරීම සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමට සභාවට පූර්ණ අයිතියක් ඇති බව සිය අතුරු තීරණයෙන් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 සහ 91 වගන්තිවලින් තේරීපත්වූ මන්ත්‍රීවරයකු දිවුරුම්දීම තහනම් බවට කිසිදු සඳහනක් ඇතුළත් නොවන බව පෙන්වාදුන් විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ මන්ත්‍රීවරයකු ලෙස තේරීපත්වීම වලංගුව සහ දෝෂදර්ශනයට ලක් නොවී තිබෙන අවස්ථාවක එය වලංගු නොවන බවට ප්‍රකාශයක් ලබාදිය හැක්කේ නිසි බලය ඇති අධිකරණයකින් මිස බණ්ධනාගාර කොමිසාරිස්වරයාගේ ලිපියකින් නොවන බවයි.

ඒ අනුව පෙත්සමේ අභියාචනයේ සඳහන් ඈ සහ ඉ ඉල්ලීම්වලට ඉඩ ලබාදෙන ලදී.

### අතුරු නියෝගයේ බලපෑම

මෙම අතුරු නියෝගය අනුව ප්‍රේමලාල් ජයසේකර මන්ත්‍රීවරයා 2020 සැප්තැම්බර් 8 වන දින පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දෙන ලදී.

### පසු සටහන

රත්නපුර මහාධිකරණ නඩු තීන්දුවට එරෙහිව ප්‍රේමලාල් ජයසේකර විසින් අභියාචනාධිකරණයට ගොනුකරන ලද අංක CA Appeal No: CA/HCC/67-69/20 දරණ අභියාචනය අභියාචනාධිකරණ විනිසුරු එන්.බන්දුල කරුණාරත්න සහ ආර්. ගුරුසිංහ යන විනිසුරුවරුන් ඉදිරියේ විභාගවූ අතර 2022 මාර්තු 31 වන දින ගුරුසිංහ විනිසුරුගේ එකඟතාව මත කරුණාරත්න විනිසුරුවරයා ලබාදුන් තීන්දුව අනුව රත්නපුර මහාධිකරණ තීන්දුව අහෝසි කරමින් ප්‍රේමලාල් ජයසේකර සියලු චෝදනාවන්ගෙන් නිදොස්කොට නිදහස් කරන ලදී.

## 8.13. අධිකරණයට අපහාස කිරීමේ වරදට සිරදඬුවම් ලැබීමද මන්ත්‍රීධූරයට නුසුදුසුකමකි

**රන්ජන් රාමනායක එදිරිව පාර්ලිමේන්තු මහලේකම් සහ තවත් අය Ranjan Ramanayake v. Secretary General of Parliament CA (Writ) Application No. 52/2021 C.A.M. 5.04.2021**

### පසුබිම

පෙත්සම්කාර රන්ජන් රාමනායක 2020 අගෝස්තු 5 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයෙන් ගම්පහ දිස්ත්‍රික්කය සඳහා සමගි ජනබලවේගය පක්ෂයෙන් තරඟ කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම්දෙන ලදී. මෙම අවස්ථාව වන විට රන්ජන් රාමනායකට එරෙහිව අධිකරණයට අපහාස කිරීම පිළිබඳව නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පැවතිනි. (SC Rule No. 1/2018; Ranawaka Sunil Perera vs Sadda Vidda Rajapakse Palanga Pathira Ambakumarage Ranjana Leo Sylvester Alphonsu alias Ranjan Ramanayaka) එම පෙත්සම් විභාගයේ තීරණය 2021 ජනවාරි 12 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. එම තීරණය මගින්

රන්ජන් රාමනායක අධිකරණයට අපහාස කිරීමේ වරදට වරදකරු කරමින් වසර 4ක සිරදඬුවමක් ලබාදෙන ලදී. මේ නඩු තීන්දුව අනුව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා විසින් රන්ජන් රාමනායකගේ මන්ත්‍රීධූරය පුරප්පාඩු වී ඇති බව මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම්දීමට කටයුතු කරන බව රන්ජන් රාමනායකට දැනගැනිමට ලැබිණි.

ඒ අනුව තමන්ගේ මන්ත්‍රීධූරය පුරප්පාඩු කිරීමට එරෙහිව රන්ජන් රාමනායක අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

## රිට් පෙත්සම

රන්ජන් රාමනායක විසින් 2021 පෙබරවාරි 01 වන දින අභියාචනාධිකරණයට ඉදිරිපත් කරන ලද මෙම පෙත්සමෙන් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා සහ නීතිපතිවරයාව පළවෙනි සහ දෙවෙනි වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි. දඬුවම් ලැබීම නිසා පෙත්සම්කරුගේ මන්ත්‍රීධූරය පුරප්පාඩුවන බවට නීතිපතිවරයා විසින් පළවෙනි වගඋත්තරකාර පාර්ලිමේන්තු මහලේකම්වරයා වෙත උපදෙස් ලබාදී ඇති බව පෙත්සම්කරුට ජනමාධ්‍ය මගින් දැනගැනීමට ලැබුන බවද, 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත අනුව පෙත්සම්කරුගේ මන්ත්‍රීධූරය පුරප්පාඩු වී ඇති බවට මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැනුම්දීමට කටයුතු කරමින් සිටින බවට විශ්වාසනීය තොරතුරු ලැබී ඇති බවත් පෙත්සම්කරු සිය පෙත්සමෙන් දක්වා තිබිණි. පෙත්සම මගින් ඔහු අවධාරණය කරන ලද්දේ අධිකරණයට අපහාස කිරීම නැමති වරදට දඬුවම් ලැබීම පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වීමට හේතුවක් නොවන බවයි. ඒ අනුව

- ❖ පෙත්සම්කරුගේ මන්ත්‍රීධූරය පුරප්පාඩු වූ බව පළවෙනි වගඋත්තරකාර පාර්ලිමේන්තු මහලේකම් වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම්දීම වළක්වන ලෙස හෝ එය වැළැක්වීමේ ප්‍රොහිබිෂන් ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස.

- ❖ මන්ත්‍රීධූරය පුරප්පාඩු වූ බව පළවෙනි වගඋත්තරකාර පාර්ලිමේන්තු මහලේකම් වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයාට දැනුම්දීම මෙම පෙත්සම් විභාගය අවසන් වනතෙක් වළක්වන අතුරු තහනම් නියෝගයක් නියෝගයක් නිකුත් කරන ලෙසත්, සිය පෙත්සම මගින් පෙත්සම්කරු අභියාචනාධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

## පෙත්සම් විභාගය

අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්න කොරයා විසින් මෙම පෙත්සම විභාග කරන ලදී. පෙත්සම්කරු විසින් මූලික තර්ක දෙකක් ඉදිරිපත් කරන ලදී. පළමු තර්කය වූයේ අධිකරණයට අපහාස කිරීම යන වරදට දඬුවම් ලබාදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඈ) ව්‍යවස්ථාවේ සඳහන් වන නුසුදුසුකමකට යටතේ වන දඬුවමක් නොවන බවයි. දෙවන තර්කය පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය දැරීමට නුසුදුසු වන්නේ වසර දෙකකට වඩා සිරදඬුවම් ලැබිය යුතු වරදකට මාස 6කට වඩා සිරදඬුවමක් ලැබීම බවට සඳහන් වන අතර අධිකරණයට අපහාස කිරීම පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 ව්‍යවස්ථාව තුළ සිරදඬුවම් ලබාදෙන කාලය දක්වා නැති බැවින් එවැනි වරදකට වරදකරු වීම මගින් නුසුදුසුකමකට ලක් නොවන බවයි.

## අභියාචනාධිකරණ තීරණය

මායාදුන්න විනිසුරුවරයාගේද එකඟතාවය මත අභියාචනාධිකරණයේ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර විසින් 2021 අප්‍රේල් 5 වන දින පෙත්සම් විභාගයේ තීන්දුව ලබාදෙන ලදී. අධිකරණයට අපහාස කිරීම නැමති වරද පිළිබඳ ප්‍රතිපාදන ඇතුළත්වන 105(3) "අධිකරණයකට අපහාස කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය සුදුසු යයි සලකන පරිදි බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කිරීමේ බලය ද ඇතුළුව එබඳු අධිකරණයක සියලු බලතල ඒ අධිකරණයන්ට ඇත්තේ ය" යන්නට අවධානය යොමුකළ අධිකරණය. අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 2 වන වගන්තියේ වරද යන්න පිළිබඳව වූ "වරද යන්නෙන් තත් කාලයෙහි ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් නීතියක් මගින් දඬුවම් පැමිණවිය හැකි යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් වේ" යන අර්ථ නිරූපණයටද අවධාරණය යොමුකරන ලදී. එසේම පෙත්සම්කරු අධිකරණයට අපහාස කිරීම පිළිබඳව වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ දැක්වෙන්නේ ද අධිකරණයට අපහාස කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් වන බවයි. ඒ අනුව අධිකරණය දක්වා සිටියේ අධිකරණයට අපහාස කිරීම 105(3) ව්‍යවස්ථාවට අනුව වරදක් වන බවත් ඒ සඳහා දඩයකින් හෝ සිරදඬුවමකින් දඬුවම් කළ හැකි බවයි. ඒ අනුව පෙත්සම්කරුට ලබාදී ඇති දඬුවම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඈ) ව්‍යවස්ථාවේ නුසුදුසුකමකට ලක් නොවන බවට වූ පෙත්සම්කරුගේ තර්කය ප්‍රතික්ෂේප කරන බව

අධිකරණය ප්‍රකාශ කරන ලදී. එසේම පළවෙනි වගඋත්තරකරු සිදුකරනු ලබන්නේ ඔහුට පැවරුනු කාර්යයක් බැවින් ශ්‍රී ලංකාවේ පරිපාලන නීතියට අනුකූලව ප්‍රොහිබිෂන් ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කිරීම කළ නොහැකි බවත් පැවසූ අධිකරණය පෙත්සම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

### අභියාචනාධිකරණයේ තීරණයේ බලපෑම

එකී තීරණයට පසුව පෙත්සම්කරුගේ මන්ත්‍රීධූරය පුරප්පාඩු වූ බවට පාර්ලිමේන්තු මහලේකම්වරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත දැනුම්දුන් අතර ගම්පහ දිස්ත්‍රික්කයෙන් සමගි ජන බලවේගය පක්ෂයෙන් තේරීපත් නොවූ අපේක්ෂකයන් අතරින් වැඩිම මනාප ලබාගෙන සිටි අපේක්ෂකයා වූ අජිත් මාන්නප්පෙරුමව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 ව්‍යවස්ථාවේ 13(ආ) අනු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2021 අප්‍රේල් 08 වන දින අංක 2222/41 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලදී.

## 8.14 ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරයට ප්‍රමාද වී පත් කිරීම අසුන අහිමි වීමට හේතුවක් නොවේ

**නාගානන්ද කොඩිතුවක්කු එදිරිව මැතිවරණ කොමිෂන් සභාව සහ තවත් 10 දෙනෙක්**

**Nagananda Kodithuvakku v. election Commission and 10 others**

**( S.C.F/R No. 205/2022 S.C.M. 19.07.2022 )**

### පසුබිම

2020 අගෝස්තු මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ඡන්ද 246,435 ක් ලබාගත් අතර ඒ අනුව එම පක්ෂයට ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරයක් හිමිවිය(මැතිවරණ කොමිෂන් සභාවේ නිල ඡන්ද ප්‍රතිඵල). එම ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරය සඳහා එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත නාමයෝජනා කරන ලද්දේ මැතිවරණ ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කිරීමෙන් බොහෝ කලකට පසුවය. ඒ අනුව එක්සත් ජාතික පක්ෂ ජාතික ලැයිස්තුවේ නම සඳහන් නොවූ සහ එම මැතිවරණයට කොළඹ දිස්ත්‍රික්කයෙන් තරග කරන ලද එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ 2021 ජූනි 18 වන දින එක්සත් ජාතික පක්ෂයේ

ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයා ලෙස අති විශෙෂ ගැසට් පත්‍රයක් මගින් මැතිවරණ කොමිෂන් සභාව නිවේදනය කරන ලදී.

පසුව අගමැතිවරයා ලෙස කටයුතු කළ මහින්ද රාජපක්ෂ ඉල්ලා අස්වීමෙන් පුරප්පාඩු වූ අගමැති ධූරය සඳහා 2022 මැයි 13 දින අංක 2279/23 දරණ අති විශෙෂ ගැසට්පත්‍රය මගින් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ලෙස පත්කරන ලදී.

පසුව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඉල්ලා අස්වීම හේතුවෙන් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව තාවකාලික ජනාධිපති ලෙස පත්වූ අතර, අනතුරුව 1981 අංක 2 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් අතර වූ ඡන්ද විමසීමක් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40(1)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව අනුප්‍රාප්තික ජනාධිපති ලෙස තේරී පත්විය. (2022 ජූලි 21 දින අංක 2289/39 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමසාරිස්ගේ නිවේදනයෙන් සතියක් තුළ ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරය සඳහා නාමයෝජනා කිරීමට එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා අපොහොසත් වීම මත රනිල් වික්‍රමසිංහගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි විය යුතු යැයි චෝදනා කරමින් විනිවිද පදනම නැමති සංවිධානයේ මහලේකම්වරයා වූ නාගානන්ද කොඩිතුවක්කු විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

**මූලික අයිතිවාසිකම් පෙත්සම**

මෙම පෙත්සම ගොනුකරන ලද්දේ 2022 ජූනි 16 වන දිනය. ඒවන විට රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලදී. මෙම පෙත්සම මගින් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරයට අමතරව, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ ජාතික ලැයිස්තුවෙන් පත්කළ මන්ත්‍රී ධම්මික පෙරේරාගේ මන්ත්‍රීධූරයද අභියෝගයට ලක්කර තිබිණි. මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් 12 දෙනෙකු නම්කර තිබිණි. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව සහ එහි සාමාජිකයන් 5 දෙනා, එක්සත් ජාතික

පක්ෂයේ මහලේකම්වරයා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම්වරයා, රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා, ධම්මික පෙරේරා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ "පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට, ඉහත සඳහන් බෙදා වෙන් කිරීම යටතේ, මන්ත්‍රී ධුරයකට හිමිකම ඇති අවස්ථාවක, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, දැන්වීමක් මගින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත් කරනු ලැබීමට සුදුසුකම් ඇති (මේ ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලැයිස්තුවේ හෝ ඒ මැතිවරණයේ දී ඒ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යම් නාම යෝජනා පත්‍රයක හෝ නම් ඇතුළත් වන්නේ යම් තැනැත්තන්ගේ ද, ඒ තැනැත්තන් වන) තැනැත්තන් ඒ මන්ත්‍රී ධුර සඳහා ඒ දැන්වීමේ දින සිට සතියක් ඇතුළත නම් කරන ලෙස, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට හෝ නියම කළ යුතු අතර එසේ නම් කරනු ලැබූ තැනැත්තන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත්කර ගන්නා ලද බවට ප්‍රකාශයට පත් කළ යුත්තේ ය" යනුවෙන් සඳහන් වන බවත් නමුත් රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ නම මැතිවරණ කොමිෂන් සභාවේ දැන්වීමෙන් සතියක් ඇතළත ලැබී නොමැති බැවින් ඔහුගේ මන්ත්‍රීධූරය අහෝසි විය යුතු බවත් පෙත්සම මගින් කියා සිටින ලදී.

එසේම 99අ ව්‍යවස්ථාවට අනුකූලව පත්වී නොමැති බැවින් පෙත්සම් විභාගය නිමවන තෙක් රනිල් වික්‍රමසිංහ සහ ධම්මික පෙරේරා යන වගඋත්තරකරුවන් පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමෙන් හෝ පාර්ලිමේන්තුවේ ඡන්දය භාවිතා කිරීමෙන් වළක්වන අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසද පෙත්සම මගින් ඉල්ලා තිබිණි.

### ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය

මෙම පෙත්සම පූර්ණ විනිසුරු මඩුල්ලක් ඉදිරියේ පවත්වන ලෙස පෙත්සම්කරු ඉල්ලා සිටින ලද අතර, ගරු අගවිනිසුරුවරයා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබිණි. පෙත්සම පිළිබඳ මූලික කරුණු සලකා බැලීම සිදුකරන ලද්දේ ඊ.ඒ.පී.ආර්.අමරසේකර, ඒ.එල් ශිරාන් ගුණතිලක සහ ජනක් ද සිල්වා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. පෙත්සම පිළිබඳ කරුණු තහවුරු කිරීම 2022 ජූලි මස 18 වන

දින පෙත්සම්කරුවන් සහ වගඋත්තර කරුවන් විසින් සිදුකළ අතර ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය 2022 ජූලි 19 වන දින ලබාදෙන ලදී. මෙහිදී Visuvalingam and Others v. Liyanage and Others (No. 1) [(1983) 1 Sri.L.R. 203 at 214-215] නඩු තීන්දුවේදී අගවිනිසුරු සමරකෝන්ගේ සඳහනක් උපුටා දක්වමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කරන ලද්දේ "යුතුය" යන්න බැලූ බැල්මට අනිවාර්යයෙන්ම කළයුතු දෙයක් බවට පෙනී යන නමුත් අධිකරණය විසින් එම සඳහන මගින් ව්‍යවස්ථාදායකයේ සැබෑ අපේක්ෂාව කුමක්ද යන්න තේරුම් ගැනීම සඳහා සමස්ථ පනත දෙසම පරීක්ෂාවෙන් බැලිය යුතු බව අධිකරණ ප්‍රකාශ කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3වන ව්‍යවස්ථාවට අනුව ඡන්දය යනු ජනතාව සතු පරමාධිපත්‍යයේ එක් ආකාරයක් බවත්. එක්සත් ජාතික පක්ෂයට ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරයක් හිමිවූයේ ජනතාවගේ සෘජු ඡන්දයෙන් බැවින් අධිකරණ විසින් ඡන්ද බලය සහ ජනතා පරමාධිපත්‍ය අඩපණ කරන අර්ථකථනයකට වඩා එය ආරක්ෂා කරන සහ ඉදිරියට ගෙන යන අර්ථකථනයක් තෝරාගත යුතුය බව අවධාරණය කරන ලදී.

එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 69 ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රී පුරප්පාඩුවක් තිබුණද පාර්ලිමේනතුවට පාර්ලිමේන්තුවේ කටයුතු සිදුකිරීමට බාධාවක් නොවන බව ද අධිකරණ අවධාරණය කරන ලදී.

මෙම කරුණු අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවේ දක්වන සතියක කාලසීමාව මගපෙන්වීමක් මිස අනිවාර්ය අවශ්‍යතාවක් නොවන බව තීරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය ඒ අනුව මෙම පෙත්සම විභාග කිරීම සඳහා අවසර ලබාදීමට (grant leave to proceed) කිසිඳු පදනමක් නොපවතින බවට නියෝග කරන ලදී.

නවවන පරිච්ඡේදය

# අසත්‍ය මැතිවරණ ප්‍රචාරය

මැතිවරණයකදී අපේක්ෂකයකුගේ ප්‍රතිරූපය ඉතාමත් වැදගත් වේ. මැතිවරණ කාලසීමාවක් තුළදී අසත්‍ය ප්‍රචාරයන් මගින් යම් අපේක්ෂකයකුගේ ප්‍රතිරූපයට හානි කිරීමක් සිදුවේ නම් එය එකී අපේක්ෂකයාට පමණක් නොව සමස්ථ ඡන්ද දායකයන්ටම කරන අසාධාරණයකි. අපේක්ෂකයාට මැතිවරණ ජයග්‍රහණයට බාධාවක් ඇතිවනවා මෙන්ම ඡන්දදායකයන්ට සිය තීරණය ගැනීමට බාධාවක්ද එමගින් සිදුවනු ඇත. අපේක්ෂකයන්ගේ ප්‍රතිරූපයට හානිකරන අසත්‍ය ප්‍රචාර වැළැක්වීමට පවතින නීතිතත්වයන් පිළිබඳව මෙන්ම එවැනි අවස්ථාවන් මත ජයග්‍රාහී අපේක්ෂකයන්ගේ පත්වීම අභියෝගයට ලක්කළ මැතිවරණ පෙත්සම් කිහිපයක් පිළිබඳවත් මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබයි.

මෙම පරිච්ඡේයද මගින් විස්තර වන ඇතැම් නඩු සම්බන්ධයෙන් භාවිතා වී ඇත්තේ දැනට ඒ සම්බන්ධව බලපාන නීති තත්ත්වය නොවන බව මෙහිදී විශේෂයෙන් සැලකිය යුතුය.

## 9.1. මැතිරවණයකදි අපේක්ෂකයකු සම්බන්ධ අසත්‍ය ප්‍රචාරය පිළිබද නීතිමය ප්‍රතිපාදන

මැතිවරණයකට ඉදිරිපත්වන අපේක්ෂකයකු ගේ ප්‍රතිරූපය ඔහුගේ /ඇයගේ ජයග්‍රහණය සඳහා ඉතා වැදගත්වේ. ඒ නිසාම අපේක්ෂකයකුගේ චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ සහ ප්‍රචාර සිදුකිරීම මැතිවරණ නීති මගින් වළක්වා තිබේ.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 81(1) (ඇ) වගන්තිය දක්වන්නේ "යම් තෝරා පත්කර ගැනීමක ප්‍රතිඵලයට බලපෑමේ කාර්යය සඳහා යම් අපේක්ෂකයකුගේ පෞද්ගලික චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් යම් අසත්‍ය සිද්ධි ප්‍රකාශයක් ඒ තෝරා පත්කර ගැනීමට පෙර හෝ එය පැවැත්වෙන අතරතුරදී කරන හෝ ප්‍රසිද්ධ කරනඃ නැනැත්තකු" දූෂණ ක්‍රියාව නැමති වරද සිදුකරන බව දැක්වේ.

එවැනි පුද්ගලයකුට මහාධිකරණයක් ඉදිරියේ නඩු විභාගයකින් පසුව වරදකරුවුවහොත් මාස 12ක් දක්වා සිරදඬුවම් හා/හෝ රුපියල් පන්සියයක දඩයකට යටත් කළ යුතුය. එවැනි වරදකට වරදකරු වන පුද්ගලයකු වරදකරු කරනු ලැබූ දිනයේ සිට වසර 7ක් දක්වා කාලයකට ඡන්දය භාවිතා කිරීමට හෝ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වීමට නුසුදුස්සෙකු වේ.

මෙම ප්‍රතිපාදනය ට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 81(ඇ) වගන්තිය තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 82(2))ඇ) වගන්තිය තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකරය) 82(ඉ)(1) (ඇ) යන වගන්ති වලද දක්නට ලැබේ. එසේම 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 91 වගන්තියේ දැක්වෙන්නේ "යම් අපේක්ෂකයකු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කරගනු ලැබීම ඔහු යම් දූෂණ ක්‍රියාවකට හෝ නීති විරෝධි ක්‍රියාවකට වරදකරු කරනු ලැබීම හේතුකොට ගෙන අවලංගු" වන බවයි.

එසේම "අපේක්ෂකයා විසින් නැතහොත් ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ අපේක්ෂකයාගේ යම් නියෝජිතයකු විසින් හෝ මැතිවරණ සම්බන්ධයෙන් දූෂණ හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදුකරන ලද බව" මැතිවරණ පෙත්සමකදී ඔප්පු වුවහොත් එම මන්ත්‍රීධූරය අහෝසි කළ හැකිව බව එකී පනතේ 91(2) වගන්තියේ දැක්වේ.

මෙම ප්‍රතිපාදනයට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 91(ඇ) වගන්තිය තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 92(2)(අ) වගන්තිය තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකරය) 82ව(2)(අ) යන වගන්ති වලද දක්නට ලැබේ, මේ අනුව ජනාධිපතිවරණයක, පාර්ලිමේන්තු මැතිවරණයක, පළාත් සභා ඡන්ද

විමසීමක හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක අපේක්ෂකයකුගේ චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ සිදු කිරීම වරදක් වන අතර එම වරද සිදුකළ තැනැත්තාට දඬුවමට අමතරව වසර 7ක් දක්වා ඡන්දය භාවිතා කිරීමට හෝ ඡන්දයකට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමට නුසුදුසුකමක් වේ. එසේම අපේක්ෂයකුගේ දැනීම හෝ කැමැත්ත ඇතිව අපේක්ෂකයකුගේ නියෝජිතයකු දූෂණ ක්‍රියාවක් සිදුකර ඇති බව ඔප්පු වුවහොත් අදාළ අපේක්ෂකයාගේ ධූරය (ජනාධිපති/පාර්ලිමේන්තු මන්ත්‍රී / පළාත් සභා මන්ත්‍රී / පළාත් පාලන ආයතන නියෝජිත) අහෝසි වේ.

## 9.2. අපේක්ෂකයකුගේ ආධාරකරුවෙකු ගේ අසත්‍ය ප්‍රකාශවල බලපෑම

**දොන් පිලිප් එදිරිව ටී.බී.ඉලංගරත්න**
**Don Philp v. T.B.Ilangaratne- 1951 NLR 561**

### පසුබිම

1948 පැවති මහනුවර අතුරු මැතිවරණය වෙනුවෙන් ටී.බී.ඉලංගරත්න (ස්වාධීන) සහ ප්‍රෙඩ් ද සිල්වා (එක්සත් ජාතික පක්ෂය) සහ ඩී.බී.වඩුගොපිටිය (ස්වාධීන) ඉදිරිපත් විය (අලවත්තගේ, 2014, 73). ටී.බි.ඉලංගරත්න ජයග්‍රහණය කරන ලදී. ටී.බී. ඉලංගරත්න ගේ ආධාරකරුවන් විසින් අපේක්ෂක ප්‍රෙඩ් සිල්වා පිළිබඳව අසත්‍ය වාර්තා පළ කිරීම් මගින් ඔහුගේ චරිතයට සහ පැවැත්මට අගතියක් සිදුකරන ලද බවට චෝදනා කරමින් ඡන්ද පෙත්මක් ගොනුකරන ලදී. මෙම පෙත්සම සඳහා පාදක කරගන්නේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ)රාජ්‍ය සභා ආඥාවේ නීතිමය ප්‍රතිපාදන වේ.

### ඡන්ද පෙත්සම

ටී.බී.ඉලංගරත්නගේ ආධාරකරුවන් ලෙස කටයුතු කරමින් පුද්ගලයන් 8 දෙනෙකු පමණ ප්‍රසිද්ධ රැස්වීම්වලදී සහ පුවත්පත් මගින් ප්‍රෙඩ් ද සිල්වා පිළිබඳව අසත්‍ය ප්‍රකාශ සිදුකළ බවත් එම අසත්‍ය ප්‍රකාශ මගින් අපේක්ෂක ප්‍රෙඩ් ද සිල්වා ගේ චරිතය සහ හැසිරීම පිළිබඳව හානිදායක වන බවත් එම නිසා මෙම ඡන්දය අවලංගු කරන ලෙසත් මැතිවරණ පෙත්සම මගින් පෙත්සම්කරු ඉල්ලා සිටින ලදී.

විශේෂයෙන්ම 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(1) (ඇ) සහ (ඈ) වගන්තියට අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කිරීමට වගඋත්තරකරු තවදුරටත් සුදුසු නොවන බව පෙත්සම මගින් කියා සිටින ලදී.

## පෙත්සම් විභාගය

පෙත්සම් විභාගය සිදුකරන ලද්දේ නාගලිංගම් විනිසුරුවරයාය. වගඋත්තරකරුවන්ගේ ආධාර කරුවන් කිපදෙනෙකු ස්ථාන කිහිපයකදී පෙත්සම්කරුගේ චරිතයට හානිදායක වන අසත්‍ය ප්‍රකාශ සිදුකරන ලද බව පෙත්සම්කරුවන් විසින් පොලිස් නිලධාරීන්ගේ සටහන්පොත් වල සඳහන් වූ කරුණු ආශ්‍රයෙන්ද අධිකරණයට ඉදිරිපත් කර තිබිණි. ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ආධාරකරුවන් ප්‍රසිද්ධ රැස්වීම් 5කදී පෙත්සම්කරුගේ චරිතයට හානිදායක අසත්‍ය ප්‍රකාශයන් සිදුකර තිබේ. එසේම වගඋත්තරකරුගේ ප්‍රචාරක කටයුතු සඳහා මුද්‍රණය කර බෙදා හරින ලද පත්‍රිකාවක මුද්‍රණාලයේ නම සඳහන් වුවද ප්‍රකාශකගේ නම සඳහන් නොවූ බවද අධිකරණයට සාක්ෂි ලෙස ඉදිරිපත් විය.

## අධිකරණයේ තීරණය

1949 පෙබරවාරි 10 වන දින සිය තීන්දුව ප්‍රකාශයට පත් කළ නාගලිංගම් විනිසුරුවරයා ප්‍රකාශ කළේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(1)(ඇ) වගන්තිය කඩකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුගේ අධාරකරුවන් 5දෙනෙකුද එම ආඥාවේ 58(1)(ඈ) වගන්තිය කඩකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුගේ අධාරකරුවන් 4දෙනෙකු සහ මුද්‍රණාලයක කළමණාකරුවෙකුද වරදකරු වන බවයි.

එසේම 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(2) වගන්තියේ දක්වන නුසුදුසුකමකට වගඋත්තරකරු ලක්වන බැවින් ඔහුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීම අහෝසි වන බවද ප්‍රකාශ කරන ලදී.

## 9.3 ප්‍රකාශයට පත් නොකළ නිල ලේඛන සාක්ෂි ලෙස මැතිවරණ පෙත්සමකදී භාවිතා කළ හැකිද?

**ඩැනියෙල් අප්පුහාමි එදිරිව ටී.බී.ඉලංගරත්න**
**Deniel Appuhamy v. Illangaratne -1966 NLR 97**

### පසුබිම

1960 ජූලි මස පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ටී.බී.ඉලංගරත්න (ශ්‍රී.ල.නි.ප) සහ ඩැනියෙල් අප්පුහාමි (එ.ජා.ප) යන අපේක්ෂකයන් තරඟ කරන ලදී (මැතිවරණ ප්‍රතිඵල-මැතිවරණ කොමිසම). මැතිවරණයෙන් ටී.බී. ඉලංගරත්න ජයග්‍රහණය කරන ලදී. මැතිවරණය පවත්වන ලද්දේ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව යටතේය. මෙම මැතිවරණයේදී ටී.බී.ඉලංගරත්නගේ නියෝජිතයින් වන දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් විසින් මැතිවරණ රැස්වීම්වල දී සිදුකරන ලද අසත්‍ය ප්‍රකාශයන් හේතුවෙන් තමන්ගේ චරිතයට සහ පැවැත්මට හානියක් වූ බැවින් මෙම මැතිවරණයෙන් ටී.බී.ඉලංගරත්නගේ පාර්ලිමේන්තු මැතිවරණ ධූරය අහෝසිකරන ලෙස ඩැනියෙල් අප්පුහාමි විසින් මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

### මැතිවරණ පෙත්සම

1960 ජූලි මස පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී හේවාහැට මැතිවරණ කොට්ඨාශයේ මැතිවරණ ප්‍රචාරක රැස්වීම් වලදී දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් විසින් සිදුකරන ලද අසත්‍ය ප්‍රකාශ මගින් පෙත්සම්කරුගේ චරිතයට සහ පැවැත්මට හානියක් සිදුවූ බවත්, එබැවින් එම ක්‍රියාව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58 වගන්තිය යටතේ වන දූෂිත ක්‍රියාවක් සිදුකර ඇති බවත් ඔවුන් පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයන් ලෙස ක්‍රියාකර ඇති බැවින් පළවෙනි වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙසත් පෙත්සම්කරු වන තමාව නිසි පරිදි පාර්ලිමේන්තුවට පත් වූ අපේක්ෂකයා ලෙස නම්කරන තීන්දුවක් ලබාදෙන ලෙසත් ඉල්ලා 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82(අ) වගන්තිය යටතේ මැතිවරණ පෙත්සමක් ගොනු කරන ලදී.

## පෙත්සම් විභාගය

මැතිවරණ පෙත්සම් විභාගයේදී පෙත්සම්කරු විසින් දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශන ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සාක්ෂි වූයේ තලාතුඔය පොලිසියට අනුයුක්තව සේවය කළ පොලිස් කොස්තාපල් 7357 දොන් සෝමපාල නැමති නිළධාරියා විසින් සකස් කරන ලද වාර්තාවකි.

මෙම නිලධාරියා 1960 ජූලි මස 3, 6, 8 සහ 16 යන දිනවලදී පළවෙනි වගඋත්තරකරුට සහය පිණිස පවත්වන ලද මැතිවරණ රැළිවලදී දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් විසින් සිදුකරන ලද ප්‍රකාශවල සාරාංශයන් සටහන් කරගෙන තිබිණි. එම සාරාංශ ඇසුරෙන් ඔහු විසින් තම ඉහල නිලධාරීන්ට ලබාදීම සඳහා වාර්තා සකස් කර තිබිණි. එම වාර්ථා සකස් කිරීමේ අරමුණ වූයේ රජය අපහසුතාවයට පත්වන ප්‍රකාශ පිළිබඳව ඉහල නිලධාරීන්ට වාර්තා කිරීමය. ඔහු එම කාර්යය සඳහා පොලිසිය විසින් යොදවා තිබිණි. මෙම වාර්තා කැඳවීම සඳහා තලාතුඔය පොලිස් ස්ථානාධිපතිවරයාද මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාද කැඳවා තිබිණි. නමුත් ඔවුන් අධිකරණයට දැනුම්දී තිබුනේ මෙම වාර්තා සාක්ෂි ආඥා පතතේ 123 වන වගන්තිය යටතේ වන වරප්‍රසාද හිමිවන ලේඛන බවයි. එසේ වගඋත්තරකරුවන්ගේ නීතිඥයාද මෙම වාර්තා අධිකරණයට සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට විරුද්ධ විය. නීතිපති සහ පොලිස්පතිද මෙම ලේඛන ඉදිරිපත් කිරීමට විරුද්ධව කරුණු දක්වා තිබිණි.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ විනිසුරු විසින් මෙම ලේඛන සාක්ෂි ලෙස කැඳවීමට ලබා නොදෙමින් ප්‍රකාශ කරන ලද්දේ එම ලේඛන ප්‍රසිද්ධ නොකළ නිල ලේඛන වන බැවින් සාක්ෂි ආඥා පනතේ 123 වන වගන්තිය මගින් ආරක්ෂාව සැලසෙන ලේඛන බවයි. ඒ අනුව පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

(සාක්ෂි ආඥා පනතේ 123 වගන්තිය-අමාත්‍යවරයාගේ පාලනයට යටත්ව සුදුසු යැයි තමා අදහස් කරන පරිදි අවසර දෙන්නාවූ හෝ අවසර දීම ප්‍රතික්ෂේප කරන්නාවූ ද සම්බන්ධිත දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාව සිටින්නා වූ ද නිලධාරයකුගේ අවසරය ඇතිව මිස රජයේ යම් කටයුතුවලට සම්බන්ධ වූද, ප්‍රසිද්ධ නොකරන ලද්දා වූද, යම් නිලවාර්තා ඉදිරිපත් කිරීමට හෝ එයින් ලබාගන්නා යම් සාක්ෂියක් දීමට කිසිවෙකුට අවසර නොදිය යුතුය.)

### ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

පෙත්සම්කරු මැතිවරණ විනිසුරු තීරණයෙන් අතෘප්තිමත් වූ අතර පොලිස් කොස්තාපල් වරයා විසින් සකස් කරන ලද වාර්තාවන් සාක්ෂි ලෙස මෙහෙයවීමට අවසර ලබා නොදීමට මැතිවරණ විනිසුරුවරයා ගත් තීරණය දෝෂ සහිත බවත් ප්‍රකාශ කරමින් පෙත්සම්කරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනා විභාගය

මෙම අභියාචනය විභාගයට සිදුකරන ලද්දේ අගවිනිසුරු බස්නායක,එස්.පී.ජේ වීරසූරිය සහ ටී.එස්.ප්‍රනාන්දු යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. 1964 පෙබරවාරි 17 වන දින අගවිනිසුරු බස්නායක විනිසුරුවරයා විසින් ලබාදුන් නඩු තීන්දුව මගින් අභියාචනාධිකරණයේ තීරණය ස්ථිර කර තිබිණි. එදිනම වීරසූරිය විනිසුරුවරයාද වෙනත් තීන්දුවක් ලබාදෙමින් මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය ස්ථිර කරන ලදී. නමුත් ප්‍රනාන්දු විනිසුරුවරයාගේ නඩු තීන්දුවේ සඳහන් වූයේ ප්‍රශ්නගත වාර්තාවන් සාක්ෂි ලෙස ලබාගත හැකි බැවින් නැවත මැතිවරණ පෙත්සම විභාග කළ යුතු බවයි.

### ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුව ඉලංගරත්නගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහිමිවූ අතර මැතිවරණයෙන් දෙවන ස්ථානය දිනාගත් ප්‍රෙඩ් ද සිල්වා ද වරදකරුවෙකු බවට තීරණය කරන ලදී. ඒ අනුව මහනුවර මැතිවරණ කොට්ඨාශය සඳහා නැවත අතුරු මැතිවරණයක් 1949 ජුනි මස පවත්වන ලදී (7.4 පරිච්චේදය බලන්න). එකී අතුරු මැතිවරණය සඳහා ටී.බී.ඉලංගරත්න හෝ ප්‍රෙඩ් ද සිල්වා ඉදිරිපත් නොවූ අතර තමරා කුමාරි ඉලංගරත්න (ටී.බී.ඉලංගරත්න ගේ බිරිඳ), සී.එල්.රත්වත්තේ, ආර්.ඊ.ජයතිලක සහ ඩී.බී.වඩුගොපිටිය ඉදිරිපත් වූ අතර තමරා කුමාරි ඉලංගරත්න ජයග්‍රහණය කරන ලදී.

## 9.4. අපේක්ෂකයාගේ නියෝජිතයා යනු කවරෙක්ද?

**විමලසේන බණ්ඩා එදිරිව යාලේගම**

**Wimalasara Banda v. Yalegama [1966) 69 N.L. R. 361.**

### පසුබිම

1965 මාර්තු මස පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා රත්තොට මැතිවරණ කොට්ඨාසට සඳහා එස්.බී.යාලේගම (ශ්‍රී ලංකා නිදහස්

පක්ෂය) චන්ද්‍රසේන මුණාවීර (ශ්‍රී ලංකා නිදහස් සමාජවාදී පක්ෂය) සහ එස්.ඩබ්ලිව් අලවතුවල (ස්වාධීන) යන අපේක්ෂකයන් තරඟ කරන ලදී ( මැතිවරණ ප්‍රතිඵල - මැතිවරණ කොමිසම ). මේ අතරින් චන්ද්‍රසේන මුණාවීර 1964 පාර්ලිමේන්තුව විසුරුවන තෙත් රත්තොට මැතිවරණ කොට්ඨාශය නියෝජනය කළ අතර ඔහු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ආසන්නව ආණ්ඩු පක්ෂයේ සිට විරුද්ධ පක්ෂයට එක් වූ අයෙකි. කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉදිරිපත් වූ ඔහු මෙවර නව පක්ෂයකින් මැතිවරණයට ඉදිරිපත් විය. මැතිවරණ ප්‍රතිඵල අනුව යාලේගම ජයග්‍රහණය කරන ලදී. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළදී යාලේගමගේ නියෝජිතයකු සිදුකරන ලද අසත්‍ය ප්‍රකාශ හේතුවෙන් මුණාවීරගේ චරිතයට සහ පැවැත්මට අගතියක් සිදු වූ බව ප්‍රකාශ කරමින් විමලසාර බණ්ඩා විසින් මැතිවරණ පෙත්සමක් ගොනු කරන ලදී.

## මැතිවරණ පෙත්සම

මැතිවරණ ව්‍යාපාරය තුළදී අසත්‍ය ප්‍රකාශයක් සහිත මැතිවරණ ප්‍රචාරක අත් පත්‍රිකාවක් බෙදාහැරීම, වගඋත්තරකාර යාලේගමගේ නියෝජිතයකු විසින් රැස්වීම් 5කදී මුණාවීර පිළිබඳව අසත්‍ය ප්‍රකාශ කිරීම සහ මැතිවරණ ප්‍රචාරක වාහන කිහිපයකදීම ශබ්ද විකාශන යන්ත්‍ර මගින් වගඋත්තරකරුගේ නියෝජිතයන් විසින් මුණාවීර පිළිබඳව අසත්‍ය කරුණු ප්‍රකාශ කිරීම යන කරුණු හේතුවෙන් මුණාවීරගේ චරිතයට සහ පැවැත්මට අගතිදායක වීම හේතුවෙන් සහ එම සිදුවීම් සිදුවූයේ වගඋත්තරකරුගේ දැනීම සහ කැමැත්ත මත බවට චෝදනා කරමින් එම හේතුවෙන් වගඋත්තරකරුගේ පත්වීම බල රහිත කරන ලෙස ඉල්ලා මැතිවරණ පෙත්සම ගොනුකරන ලදී.

## මැතිවරණ පෙත්සම් විභාගය

චෝදනා කරන ලද මැතිවරණ ප්‍රචාරක අත් පත්‍රිකාව මැතිවරණ පෙත්සමේ ඇමුණුමක් ලෙස ඉදිරිපත් කර තිබූ අතර එහි සඳහන්වූ අනෙකුත් කරුණු අතර මුණාවීර 1964 වසරේදී ආණ්ඩුවට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අල්ලස් ලබාගත් බව සඳහන් කර තිබිණි. නමුත් පෙත්සම් විභාගයේදී හෙලිදරව් වූයේ මෙම පත්‍රිකාව මුද්‍රණය කළ පුද්ගලයා එය මුද්‍රණය කර තිබුනේ 1964 වසරේ දෙසැම්බර් 14වන දිනය. එම මැතිවරණ සඳහා නාමයෝජනා භාරදීමේ දිනය

වූයේ 1965 ජනවාරි 14 වන දිනයි. ඒ අනුව අදාළ පත්‍රිකාව මුද්‍රණය කර තිබුනේ නාමයෝජනා ඉදිරිපත් කිරීමට මාසයකට පෙර බව පෙත්සම් විභාගයේදී හෙළිදරව් විය. එසේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නාමයෝජනා මණ්ඩලයේ සමාජික ඉලංගරත්න මන්ත්‍රීවරයා සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ එම පත්‍රිකාව මුද්‍රණය කළ දුණුවීර නැමති අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් රත්තොට මැතිවරණ කොට්ඨාශය සඳහා ඉදිරිපත් වීමට අපේක්ෂා කරන ලද පුද්ගලයකු බවත් ඔහුට නාමයෝජනා නොලැබී වගඋත්තරකරුට නාමයෝජනා ලැබුණ බවත් පසුව තමන් වගඋත්තරකරුට සහය නොදෙන බව එකී පුද්ගලයා ප්‍රකාශ කර ඇති බවත් ඔහු ප්‍රකාශ කරන ලදී. පසුව 1965 ජනවාරි මාසයේදී ඔහු දුණුවීරට අවවාද කළ බවත් ඒ හේතුවෙන් ඔහු වගඋත්තරකරුට සහය ලබාදීමට එකගවූ බවත් තවදුරටත් සාක්ෂි ලබාදී තිබිණි.

එසේම මුණවීර අගමැතිවරයාට විරුද්ධව ඡන්දය දීම සඳහා රුපියල් 75000ක අල්ලසක් ලබාගෙන ඇති බව 1965 මාර්තු 19 වන දින උඩතැන්න නැමති ස්ථානයේ පැවති වගඋත්තරකරුගේ ප්‍රචාරක රැලියකදී දුණුවීර නැමති අය විසින් ප්‍රකාශ කළ බවට පෙත්සමේ දී කරුණු ඉදිරිපත් කරන ලදී. වගඋත්තරකරුවන් විසින් මෙම කරුණ අභියෝගයට ලක් නොකළ අතර ඔවුන්ගේ විත්තිවාචකය වූයේ මැතිවරණ රැලියකදී අදහස් දක්වන පුද්ගලයා රැලියේ සභාපති විසින් තීරණය කරනු ලබන බවත් ඔහුගේ කථාවට වගඋත්තරකරුගේ දැනීම හෝ කැමැත්ත නොමැති බවත්ය. එසේම ඔහු වගඋත්තරකරුගේ නියෝජිතයකු ලෙස සැලකිය නොහැකි බවත්ය.

උඩතැන්න රැස්වීමේ දුණුවීර සිදුකළ ප්‍රකාශ සම්බන්ධව අධිකරණයට ඉදිරිපත් කර තිබූ එකම සාක්ෂිය වූයේ කොළඹ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් 1965 අප්‍රේල් මාසයේදී ලබාගත් බව පෙනෙන වාර්තාවකි. මෙම වාර්තාව මාතලේ පොලිස් ස්ථානයේ සැරයන් රත්නායක නම් නිලධාරියකු සකස්කරන ලද්දකි. ඔහු මෙම රැස්වීමට පැමිණ ඇති අතර එහිදී මෙම කථාවේ කොටස් අභ්‍යාස පොතක සටහන් කරගෙන නිවසට ගොස් ඔහුගේ සහෝදරයාට (පොලිස් නිළධාරියකු නොවන) එම කොටස් කියවා ඔහුගේ අත් අකුරින් එම වාර්තාව කාබන් පිටපත් සහිතව සකස් කර තිබිණි. පෙත්සම් විභාගයේදී එම නිළධාරියා ප්‍රකාශ කර ඇත්තේ අදාළ අභ්‍යාස පොත පොලිස් ස්ථානයේ තැබූ බවත් දැන් සොයාගත නොහැකි බවත්ය.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සමේ තීරණය ලබාදෙමින් මැතිවරණ විනිසුරුවරයා ප්‍රකාශ කර ඇත්තේ චෝදනා ලැබූ අත්පත්‍රිකාව දුණුවීර නැමති අය විසින් තමන් මැතිවරණයට ඉදිරිපත් වීමේ අපේක්ෂාවෙන් මුද්‍රණය කළ එකක් වීමත් එය බෙදා හැර තිබුණේ ඔහු වගඋත්තරකරුට සභය දැක්වීමට පෙර වීමත් මත එම අත් පත්‍රිකාව පිළිබඳ චෝදනාව වගඋත්තරකරුගේ දැනුම සහ කැමැත්ත නොමැති බවත්ය. එසේම උඩතැන්න සිදුවීම සම්බන්ධයෙන් සාක්ෂි සඳහා ඉදිරිපත් කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ලේඛනය සාක්ෂි ආඥා පනතේ 35 වන වගන්තිය යටතේ ආවරණය වන බැවින් එම සාක්ෂිය පිලිගත නොහැකි බවයි. ඒ අනුව පෙත්සම නිශ්ප්‍රභා කර තිබිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුගේ තීරණයෙන් අතෘප්තියට පත් පෙත්සම්කරු එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කරන ලදී. මෙම අභියාචනය සලකා බලන ලද්දේ අගවිනිසුරු එච්.එන්.ජී ප්‍රනාන්දු ටී.එස්.ප්‍රනාන්දු සහ ශ්‍රී ස්කන්ධරාජා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ය.  මෙම අභියාචනා විභාගය තුළදී අපේක්ෂකයකුගේ "නියෝජිතයකු" යන්නට මැතිවරණ රැලියක් අමතන කථිකයකු ඇතුළත් වන්නේ ද? යන්න සහ සාක්ෂි ආඥා පනතට අනුව "පොදු පොත් හෝ වාර්තා හෝ ලේඛන" සාක්ෂි ලෙස අදාළ කරගැනීම පිළිබඳව සාක්ෂි ආඥා පනතේ 35 සහ 145 වගන්තිද පොලිස් ආඥා පනතේ 56 වගන්තිය සහ දූෂණ ක්‍රියාව පිළිබඳ දැක්වෙන 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 38(1) ව්‍යවස්ථාව සහ මැතිවරණ පෙත්සම් පිළිබඳව එකී රාජ්‍ය සභා ආඥාවේ 77(ඇ) ව්‍යවස්ථාව යන නීතිමය ප්‍රතිපාදන පිළිබඳව අවධානය යොමුකරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

පෙත්සම් විභාගය අවසානයේ විනිසුරුවරුන් තිදෙනා තීරණ තුනක් ලබාදීම විශේෂත්වයක් විය. එකී තීරණ අතරින් අගවිනිසුරු එච්.එන්.ජී.ප්‍රනාන්දු ගේ තීරණයට එකඟ වෙමින් ටී.එස්.ප්‍රනාන්දු විනිසුරුවරයාද තීන්දුවක් ප්‍රකාශ කරන ලදී. මෙම තීන්දු දෙකම මගින් උගත් මැතිවරණ විනිසුරුගේ තීරණය සනාථ කරමින් අභියාචනය නිශ්ප්‍රභා කරන ලදී. එකී තීරණ වලට එකඟ නොවන තීන්දුවක් ලබාදුන් ශ්‍රී ස්කන්ධරාජා විනිසුරුතුමන් ප්‍රකාශ කරන ලද්දේ පොලිස් කොස්තාපල් වරයාගේ වාර්තාව සාක්ෂියක් ලෙස පිළිගත යුතු බවත්

දේශපාලන රැලියේදී කථිකයන් සම්බන්ධ පාලනයක් අපේක්ෂකයාට ඇති බැවින් මෙම අවස්ථානුගත රැස්වීමේ කථිකයන් අපේක්ෂකයාගේ නියෝජිත ලෙස සැලකිය යුතු බවත්ය. එසේම චෝදනා නගන ලද මැතිවරණ ප්‍රචාරක පත්‍රිකාව මුද්‍රණය කළ දිනය කෙසේ වුවත් එය ඔහු වගඋත්තරකාර අපේක්ෂකයාගේ ආධාරකරුවෙකු වූ පසුව බෙදාහැර ඇති බැවින් ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවට අනුව නියෝජිතයකුගේ ක්‍රියාවක් ලෙස සැලකිය හැකි බවත්ය. කෙසේ නමුත් බහුතරයේ තීරණය මත 1966 දෙසැම්බර් 20 වන දින අභියාචනා පෙත්සම නිෂ්ප්‍රභා කරන ලදී:

## 9.5. අපේක්ෂකයා ඉදිරියේ නියෝජිතයන් සිදුකරන කථාවන් සම්බන්ධයෙන් අපේක්ෂකයාට වගකීමක් ඇත.

**සමරනායක එදිරිව කාරියවසම් :(69 N.L.R.1)**
**Samaranayake v. Kariawasam : (69 N.L.R.1)**

### පසුබිම

1965 මාර්තු මස පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා බෙන්තර - ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශය සඳහා ආර්.ජී. සමරනායක (එක්සත් ජාතික පක්ෂය). ඇල්බට් කාරියවසම් (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය) සහ ජේ.පී.ගජනායක (මහජන එක්සත් පෙරමුණ) තරඟ කරන ලදී (මැතිවරණ ප්‍රතිඵල - මැතිවරණ කොමිසම). මැතිවරණ ප්‍රතිඵල අනුව සමරනායක ජයග්‍රහණය කරන ලදී. ඔහුගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ ඔහුගේ නියෝජිතයන් විසින් අසත්‍ය ප්‍රකාශ සිදුකිරීම මගින් තමන්ගේ චරිතයට සහ පැවැත්මට බලපෑමක් වූ බවට චෝදනා කරමින් සමරනායකගේ මන්ත්‍රීධුරය අහෝසිකරන ලෙස ඉල්ලා කාරියවසම් මැතිවරණ පෙත්සමක් ගොනු කරන ලදී.

### මැතිවරණ පෙත්සම

ජයග්‍රාහී අපේක්ෂක සමරනායකව වගඋත්තරකරු ලෙස නම්කර තිබූ මෙම මැතිවරණ පෙත්සම මගින් පෙත්සම්කාර කාරියවසම් ප්‍රකාශ කර සිටියේ වගඋත්තරකරුගේ ආධාරකරුවෙකු සහ ආධාරකාරියක විසින් මැතිවරණ රැස්වීම් කිහිපයකදීම අසත්‍ය ප්‍රකාශ සිදුකරමින් තමන්ගේ චරිතයට සහ පැවැත්මට හානිකර ඇති බවත් එමගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(1) (ඈ) වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බවත් ඔවුන්

වගඋත්කරකරුගේ නියෝජිතයන් ලෙස ක්‍රියාකරමින් වගඋත්තරකරුගේ දැනීම සහ කැමැත්ත මත මෙම ක්‍රියාවන් සිදුකර ඇති බැවින් ඉහත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 77(ඇ) වගන්තිය යටතේ වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අවලංගු කරන ලෙසත්ය.

## මැතිවරණ පෙත්සම් විභාගය

මෙම පෙත්සම් විභාගය තුළදී කරුණාරත්න නැමති පුද්ගලයකු සහ විතානාච්චි නැමති කාන්තාවක් විසින් පෙත්සම්කාර කාරියවසම්ගේ මැතිවරණ රැස්වීම් කිහිපයකදී සිදුකරන ලද ප්‍රකාශ මගින් පෙත්සම්කරුගේ චරිතයට සහ පැවැත්මට හානිකර ප්‍රකාශ කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් කර තිබිණි.
පෙත්සම්කාර කාරියවසම් විසින් රැකියා ලබාදෙන බව පොරොන්දුවෙමින් තමන්ගෙන් රුපියල් 300ක මුදලක් අල්ලස් ලෙස ලබාගෙන ඇති බවට විතානාච්චි නැමති කාන්තාව විසින් රැස්වීම් කිහිපයකදිම ප්‍රකාශ කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී තිබිණි. 1965 පෙබරවාරි 25 වන දින බලගල පැවති රැස්වීමකදීද, පෙබරවාරි 27 වනදින තණබැද්දෙගම පැවති රැස්වීමකදීද මාර්තු 5වන දින බෝධිවෙල පැවති රැස්වීමකදීද, මාර්තු 20 වන දින කහඹිලියාකන්ද පැවති රැස්වීමකදීද මෙම ප්‍රකාශයන් සිදුකළ බවට සාක්ෂි ඉදිරිපත් වී තබිණි. ඇයගේ මෙම කතාවන් වගඋත්තරු විසින් ශ්‍රවනය කර ඇති බවටත් සාක්ෂි ඉදිරිපත් විය. එසේම වගඋත්තරකරු විසින් එම කතා නැවැත්වීමට උත්සාහ කළ බවක්ද සාක්ෂි ලෙස ඉදිරිපත් නොවීය.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සම් විභාගය අවසානයේදී තීන්දුව ලබාදෙමින් පෙත්සම්කරුවන්ගේ ඉදිරිපත් කිරීම් අනුව වගඋත්තරකරුවන්ගේ නියෝජිතයන් ලෙස කටයුතු කළ පුද්ගලයන් වගඋත්තරකරගේ දැනීමේ සහ අනුමැතිය මත සිදුකරන ලද අසත්‍ය ප්‍රකාශ මගින් පෙත්සම්කරුගේ චරිතයට සහ පැවැත්මට හානියක් වූ බව තීරණය කරමින් වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කිරීමට තීන්දු කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුගේ තීරණයෙන් අතෘප්තියට පත් වගඋත්තරකරු එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනා කරන ලදී. මෙම අභියාචනා පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු

සන්සෝනි සහ එච්.එන්.ජී ප්‍රනාන්දු සහ ටී.එස්. ප්‍රනාන්දු යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.

මෙහිදී විනිසුරුවරයා අපේක්ෂකයාගේ නියෝජිතයා යන්න අර්ථ නිරූපණය සඳහා Wakefield Case 2 (O M. A H . at p . 100.) නඩුවේ සඳහන් පහත උපුටනය යොදා ගන්නා ලදී .

"ඒ අනුව, මැතිවරණ සම්බන්ධයෙන් වන කටයුතු වලදී 'නියෝජිතායතනය' යන යෙදුමට පුළුල් විෂය පථයක් ආවරණය වන අර්ථ දැක්වීමක් ලබා දී ඇති අතර, සාමාන්‍යයෙන් මැතිවරණ අපේක්ෂකයෙකු වගකිව යුතු වන්නේ, ඔහුගේ දැනුමට අනුව ඔහුගේ මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම උදෙසා ඉවහල් වන ක්‍රියාවන්හි නිරත වන තැනැත්තන් එවැනි මැතිවරණ ප්‍රචාරණ අරමුණක් පෙරදැරි කරගෙන කටයුතු කරනු ලබන බවට එකී අපේක්ෂකයාට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයන්ට සාධාරණ දැනුමක්/අවබෝධයක් ඇති අවස්ථාවන්හි දී පමණි."
විශේෂයෙන්ම විතානාච්චි නැමති අයගේ පළමු කථාවෙන් පසුව අභියාචක වගඋත්තරකරු විසින් ඇයව තවත් රැස්වීම් කිහිපයකටම ආරාධනා කිරීමටද අධිකරණයේදී සැලකිල්ලට භාජනය විය.

ඒ අනුව අගවිනිසරු සන්සෝනි සහ විනිසරු ටී.එස්. ප්‍රනාන්දුගේද එකඟතාවය මත විනිසුරු එච්.එන්.ජී ප්‍රනාන්දු විසින් අභියාචනා පෙත්සම් විභාගයේ තීරණය 1966 අගෝස්තු මස 1 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. එමගින් මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය සනාථ කරමින් අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## නඩු තීන්දුවේ බලපෑම

මෙම නඩු තීන්දුව මගින් බෙන්තර-ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශයට තේරීපත්වූ ආර්.ජී.සමරනායකගේ (එක්සත් ජාතික පක්ෂය) පත්වීම අහෝසි විය. ඒ අනුව බෙන්තර-ඇල්පිටිය මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් 1966 ඔක්තෝබර් 24 වන දින පවත්වන ලදී. එම මැතිවරණයෙන් ඇල්බට් කාරියවසම් (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය) ජයග්‍රහණය කරන ලදී.

## 9.6. මතකය අලුත් කරගැනීම සඳහා සාක්ෂිකරුවෙකුට පොලිස් වාර්තාවක් භාවිතා කළ හැකිය

**විලියම් ද සිල්වා එදිරිව වික්‍රමසූරිය**
Willian Silva v. Wickramasuriya -69 NLR 409

### පසුබිම

1965 මාර්තු මාසයේදී පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දෙව්නුවර ආසනය වෙනුවෙන් පී.එච්.විලියම් ද සිල්වා (ශ්‍රී.ල.නි.ප). පී.පී. වික්‍රමසූරිය (ශ්‍රී.ල.නි.ස.), ඊ.කේ. සිරිල් (ල,ප්‍ර,ප), චාර්ල්ස් අබේසුන්දර (ස්වාධීන) සහ ටී.එන් බමුණුසිංහ (ස්වාධීන) යන් අපේක්ෂකයන් තරග කරන ලදී.(මැතිවරණ ප්‍රතිඵල - මැතිවරණ කොමිසම) . මැතිවරණ ප්‍රතිඵලය අනුව විලියම් සිල්වා ජයග්‍රහණය ලබන ලදී. විලියම් සිල්වාගේ මැතිවරණ ව්‍යාපාරය තුළදී ඔහුගේ නියෝජිතයන් විසින් සිදුකරන ලද අසත්‍ය ප්‍රකාශන මගින් වික්‍රමසූරියගේ චරිතයට සහ පැවැත්මට බලපෑම් සිදුවූ බව ප්‍රකාශ කරමින් වික්‍රමසූරිය මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

### මැතිවරණ පෙත්සම

විලියම් සිල්වාගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේදී ඔහුගේ ආධාරකරුවෙකු වන යසස්මී නැමති ස්වාමීන් වහන්සේ නමක් තමන්ගේ චරිතයට සහ පැවැත්මක බලපෑමක් ඇති කරන ලද අසත්‍ය ප්‍රකාශයක් සිදුකිරීම මත විලියම් සිල්වාගේ අනුමැතිය සහ කැමැත්ත මත එය සිදුවූ බවත් එම හේතුවෙන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82(අ) වගන්තිය යටතේ වරදක් සිදුකර ඇති බැවින් විලියම් ද සිල්වාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීම අවලංගු කරන ලෙස ඉල්ලා පෙත්සම මැතිවරණ විනිසුරු වෙත ගොනු කරන ලදී.

### මැතිවරණ පෙත්සම

මැතිවරණ පෙත්සමේ දී ඉදිරිපත් වූ මූලික කරුණක් වූයේ පෙත්සමේ පෙත්සම්කරු වූ වික්‍රමසූරිය 1964 දෙසැම්බර් 18 වන දින පාර්ලිමේන්තුව විසුරුවන දිනය දක්වා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන ලදී. ඔහු දෙව්නුවර මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයා ලෙස ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ලදී. 1964 දෙසැම්බර් 3වන දින ඔහු ආණ්ඩු පක්ෂයෙන් ඉවත්විය. 1964 දෙසැම්බර් 18 වන දින පාර්ලිමේන්තුව විසුරුවාහරින ලදී.

1965 පාර්ලිමේන්තු මැතිවරණ සඳහා ඔහු ඉදිරිපත්වූයේ නව පක්ෂයක් වන ශ්‍රී ලංකා නිදහස් සමාජවාදී පක්ෂයේ අපේක්ෂකයකු ලෙසය.
1965 මාර්තු 18 වන දින විලියම් සිල්වා ගේ මැතිවරණ රැස්වීමකදී ඔහුගේ ආධාරකරුවකු වන යසස්සි නැමති භික්ෂූන් වහන්සේ ප්‍රකාශ කර තිබුනේ වික්‍රමසූරිය ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දීම සඳහා පුවත්පත් ආයතනයකින් රුපියල් පහස්දහසක් අල්ලසක් ලෙස ලබාගෙන ඇති බවයි. එසේම බුදුදහම රාජ්‍ය ආගම කිරීම සඳහා යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබූ බවත් එම යෝජනාවට විරුද්ධව සහ ආණ්ඩුව කැඩීම සඳහා ඡන්දය දීමට පෙත්සම්කරු පුවත්පත් ආයතනයකින් රුපියල් 50000ක් අල්ලස් ලෙස ලබාගත් බවත් ප්‍රකාශ කරන ලද බවත් පෙත්සම් විභාගයේදී ඉදිරිපත් විය. මෙම ප්‍රකාශය එම රැස්වීම ආවරණය කළ පොලිස් කොස්තාපල් හෙන්ඩ්‍රික් විසින් සටහන් කරගෙන තිබුණි. පොලිස් ස්ථානයේදී ඔහුගේ එම සටහන් පොලිස් කොස්තාපල් ගුණසේන විසින් යතුරු ලියනය කර සමාන පිටපත් 4ක් සාදා පොලිස් පරීක්ෂකවරයාට ලබාදී තිබිණි. ඔහු විසින් එම පිටපත් අපරාධ පරීක්ෂණ දෙපාර්තාමේන්තුවට යොමුකර තිබිණි. හෙන්ඩ්‍රික් සහ පොලිස් පරීක්ෂකවරයා මැතිවරණ පෙත්සම් විභාගයේදී සාක්ෂි ලබාදී තිබිණි. හරස් ප්‍රශ්න වලටද භාජය වී තිබිණි. ඒ අනුව එම ප්‍රකාශයන් මගින් පෙත්සම්කරුගේ චරිතයට සහ පැවැත්මට හානියක් වූ බව ප්‍රකාශ කළ මැතිවරණ විනිසුරුවරයා වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අවලංගු කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වූ අභියාචනා පෙත්සම

මැතිවරණ විනිසුරුගේ තීරණයෙන් අතෘප්තිමත්වූ විලියම්ද සිල්වා එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් සිදුකරන ලදී. එකී අභියාචනයේ පදනම වූයේ පොලිසියේ නිල වාර්තා ඔප්පු කිරීමකින් තොරව මැතිවරණ විනිසුරුවරයා භාරගෙන ඇති බවත් එය සාක්ෂි ආඥාපනතේ ප්‍රතිපාදන උල්ලංඝනයක් බවත්ය.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

මෙම අභියාචනා පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු එච්.එන්.ජී.ප්‍රනාන්දු, අභයවර්ධන සහ ශ්‍රී ස්කන්ධරාජා යන විනිසුරුවරුන් විසිනි. අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාවය මත අගවිනිසුරුවරයා විසින් 1967 ජනවාරි 16 වන දින අභියාචනා පෙත්සමේ තීරණ ප්‍රකාශයට පත් කරන ලදී.

එහිදී විනිසුරුවරයා ප්‍රකාශ කළේ සාක්ෂි ආඥා පනතේ 35 වන වගන්තිය අනුව පොලිස් නිලධාරියකුගේ වාර්තාවක් කිසියම් කරුණක් ඔප්පු කිරීම සඳහා භාවිතා කර නොහැකි වුවත් සාක්ෂි ආඥා පනතේ 159 වගන්තිය අනුව මතකය අලුත් කර ගැනීම සඳහා එම වාර්තාව භාවිතා කළ හැකි බැවින් මෙම මැතිරවරණ පෙත්සමේදී පොලිස් නිලධාරියා විසින් සාක්ෂි ලබාදීම සහ හරස් ප්‍රශ්නවලට භාජනය වීම නිසා එම කරුණු මත මැතිවරණ විනිසුරුවරයා විසින් එළඹෙන ලද තීරණය නිවැරදි බව ප්‍රකාශ කළ අගවිනිසුරුවරයා සිය තීරණය මගින් අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 9.7. ප්‍රවෘත්ති පත්‍රයක් අපේක්ෂකයකුගේ නියෝජිතයකු ලෙස සලකනු නොලැබේ

**ජයසේන එදිරිව ටී.බී.ඉලංගරත්න - 1973 NLR 35**
**Jayasena v. T.B.Ilangaratne - 1973 NLR 35**

### පසුබිම

1967 පෙබරවාරි 28 දින පැවති කොලොන්න අතුරු මැතිවරණය සඳහා ටී.බී.ඉලංගරත්න(ශ්‍රී ලංකා නිදහස් පක්ෂය), කුසුමා ගුණවර්ධන (මහජන එක්සත් පෙරමුණ) සහ තිලකාවතී සමරසිංහ (ස්වාධීන) යන අපේක්ෂකයන් තරඟ කරන ලදී.(අලවත්තගේ. 2014, 210). මැතිවරණ ප්‍රතිඵල අනුව ඉලංගරත්න ජයග්‍රහණය කරන ලදී. ජයග්‍රණයෙන් පසුව ඔහුගේ පත්වීම අභියෝගයට ලක්කරමින් පෙත්සම්කරු ඡන්ද පෙත්සමක් ගොනුකරන ලදී. එම පෙත්සම මගින් අල්ලස් ලබාගැනීම, අයුතු බලපෑම සහ අසත්‍ය ප්‍රකාශ පලකිරීම යන චෝදනාවන් වගඋත්තරකරුට එරෙහිව එල්ලකර තිබිණි. එම පෙත්සම විභාග කළ මැතිවරණ විනිසුරු එම ඡන්ද පෙත්සම ප්‍රතික්ෂේප කරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුගේ තීරණයෙන් තෘප්තිමත් නොවූ පෙත්සම්කරු එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් සිදුකරන ලදී. අභියාචනයේ ප්‍රධාන නීති තර්කය වූයේ ඇත්ත පුවත්පතේ පලකරන ලද අසත්‍ය ප්‍රකාශ කිහිපයක් මැතිවරණ පෙත්සම

අවස්ථාවේදී ඉදිරිපත් කළද ඇත්ත පුවත්පත වගඋත්තරකරුගේ නියෝජිතයකු ලෙස හඳුනාගැනීමට මැතිවරණ විනිසුරු අපොහොසත් වී ඇති බවයි.

## ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා විභාගය

මෙම අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් වන සිරිමාන්න, වීරමන්ත්‍රී සහ විජයතිලක යන විනිසුරුවරුන් විසින් විභාග කරන ලදී. එම අභියාචනයේදී ඇත්ත පුවත්පතේ සඳහන් වූ සහ ඡන්ද පෙත්සමේදී මැතිවරණ විනිසුරුවරයාගේ අවධානයට යොමුකරන ලද ප්‍රවෘත්ති කිහිපයක්ම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධාරණයට යොමු විය.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අනෙකුත් විනිසුරුවරුන්ගේ ද එකඟතාව මත ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය 1969 අගෝස්තු මස 7 වන දින ප්‍රකාශයට පත් කරන ලද්දේ සිරිමාන්න විනිසුරුවරයා විසිනි.

එහිදී විනිසුරුවරයා ප්‍රකාශ කළේ ඇත්ත පුවත්පත ඉදිරිපත් කරන්නේ කතුවරයකු මුද්‍රණකරුවෙකු හා ප්‍රකාශකයකු මගින් බවයි. මැතිවරණයකදී පුවත්පත් එක් එක් අපේක්ෂකයන්ට සහය පලකරන ප්‍රකාශ පලකළද ඒවා අපේක්ෂකයන්ගේ නියෝජිතයන් ලෙස සැලකිය නොහැකි බව විනිසුරුවරයා සිය තීන්දුවේ සඳහන් කරන ලදී.

Gandasing v. Rai (Doabia's Indian Election Cases, 1935 to 1950, Volume 2, page 94), නඩු තීරණයේදී පුවත්පතක් අපේක්ෂකයකුගේ නියෝජිතයකු ලෙස සලකා ඇතිබව පැවසූ විනිසුරුවරයා එය මෙම නඩුවේ කරුණු වලට වඩා සුවිශේෂී තත්ත්වයක් බවත් එහිදී එම පුවත්පතේ අදාළ පුවත පලවූ පිටපත් විසිදහසක් අපේක්ෂකයකු විසින් මිළදී ගෙන තම ඡන්දදායකයන් අතරේ බෙදාහැර ඇති බවත් ඒ හැර වෙනත් කිසිඳු අවස්ථාවට පුවත්පතක් අපේක්ෂකයකුගේ නියෝජිතයකු ලෙස පිළිගෙන නොමැති බවත් විනිසුරුවරයා සඳහන් කරන ලදී.

මෙහිදී මතුවූ තවත් කරුණක් වනුයේ වගඋත්තරකරුගේ ප්‍රධාන කථිකයකු ඇත්ත පුවත්පතේ උපදේශක කතුවරයකු ලෙස කටයුතු කරන බවයි.

හෙන්රික්ස් :Harwich) නඩුවේදී (3 O'M.& B.p .69.) ලුෂ් (Lush) විනිසුරුගේ ප්‍රකාශය මෙහිදී සිරිමාන්න විනිසරුවරයා උපුටා දැක්වීය. "අපේක්ෂකයෙකු සහ ඔහු තම නියෝජිතයා වන පුද්ගලයෙකු අතර සම්බන්ධය වඩා වැඩිය. සාමාන්‍ය විදුහල්පතිවරයෙකු සහ නියෝජිතයෙකු අතර පවතින දෙයට වඩා එය සමීපවේ. ආසන්නතම සාදෘශ්‍යය නම් ෂෙරිෆ් කෙනෙකු සහ ඔහුගේ යටත් - ෂෙරිෆ් සහ ඇපකරුවන් බව ය. මක්නිසාද යත්, ආසනය සම්බන්ධයෙන්, ඒවා ඔහුගේ ප්‍රකාශිත මඟ පෙන්වීම්වලට පටහැනිව සිදු කළත්, ඒවා නොසලකා හරිමින් පවා අපේක්ෂකයා ඔහුගේ අධිකාරියේ විෂය පථය තුළ සිදු කරන ලද ඔහුගේ නියෝජිතයාගේ සියලු අකටයුතුකම් සඳහා වගකිව යුතුය."

ඒ අනුව පුවත්පතේ කතුවරයා අපේක්ෂකයාගේ ආධාරකරුවෙකු වුවත් පුවත්පතක් අපේක්ෂකයාගේ නියෝජිතයකු ලෙස තීරණය කළ නොහැකි බව පැවසූ ශ්‍රේෂ්ඨාධිකරණය අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 9.8. අසත්‍ය ප්‍රකාශ කළ නියෝජිතයාගේ නියෝජිතභාවය ඔප්පු කළ යුතුය

**මුත්තෙට්ටුවේගම එදිරිව පිලපිටිය සහ තවත් අය.**
**Muththettugama v. Pilapitiya-(1980) 2 Sri LR. 248**

### පසුබිම

1977 ජූලි 21 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී කලවාන ආසනය සඳහා අබේරත්න පිලපිටිය (එ.ජා,ප), සරත්චන්ද්‍ර මුත්තෙට්ටුවේගම (කො.ප), එස්.එස් ගෞතමදාස(ශ්‍රී.ල.නි.ප) සහ එච්.ආර්.එස්.ඩී. සොයිසා යන අපේක්ෂකයන් තරඟ කරන ලදී (මැතිවරණ ප්‍රතිඵල- මැතිවරණ කොමිසම). මැතිවරණයෙන් සරත් මුත්තෙට්ටුවේගමට වඩා වැඩි ඡන්ද 1662ක් ලබාගනිමින් අබේරත්න පිලපිටිය පාර්ලිමේන්තුවට තේරී පත්විය. මෙම මැතිවරණයේදී පිලපිටියගේ නියෝජිතයකු විසින් සරත් මුත්තෙට්ටුවේගම ගේ පුද්ගලික චරිතයට සහ පැවැත්මට හානිකර වූ අසත්‍ය ප්‍රකාශ කිරීම මත ඔහුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කිරීම සඳහා ඡන්ද පෙත්සමක් ගෙන එන ලදී.

## මැතිවරණ පෙත්සම

මෙම පෙත්සමේ පළවෙනි වගඋත්තරකරු ලෙස දක්වා තිබුණේ ජයග්‍රාහී අපේක්ෂකයා වූ පිලපිටිය වේ. දෙවන වගඋත්තරකරුවූයේ පළවෙනි වගඋත්තරකරු සහ දෙවන වගඋත්තරකරුවන් පළවෙනි වගඋත්තරකරුගේ මැතිවරණ ව්‍යාපාරයේ ආධාරකරුවන්ය. ජන අවිය සහ කලවාන ජනතා යන නම්වලින් යුතු පුවත්පත් දෙකක් මැතිවරණ සමයේ කලවාන මැතිවරණ කොට්ඨාශය තුළ බෙදාහැර ඇති බවත් එම පුවත්පත් මගින් පලකරන ලද අසත්‍ය ප්‍රකාශ මගින් පෙත්සම්කරුගේ චරිතය සහ පැවැත්මට අගතියක් සිදුවී ඇති බවත් එය 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(අ) වගන්තිය යටතේ වරදක් බවත් එම පුවත්පත් වල අදාළ අසත්‍ය ප්‍රකාශ සකස් කරන ලද්දේ තුන්වෙනි වගඋත්තරකරු බවත් ඒවායේ ප්‍රකාශ වන්නේ දෙවන වගඋත්තරකරු බවත් මෙම කරුණු අනුව පළවෙනි වගඋත්තරකරු දැනුවත්ව ඔහුගේ නියෝජිතයන් විසින් සිදුකරන ලද ඉහත ක්‍රියාව හේතුවෙන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා අඥාවේ 58(අ) සමග කියවිය යුතු 77(ඇ) වගන්තිය අනුව මෙම මැතිවරණය අවලංගු කළ යුතු බවත් පෙත්සම මගින් කියා සිටින ලදී.

## පෙත්සම් විභාගය

අභියාචනාධිකරණ විනිසුරු අබ්දුල් කාදර් විනිසුරුවරයා ඉදිරියේ මෙම ඡන්ද පෙත්සම 1979 නොවැම්බර් 27 සිට 30 දක්වාද දෙසැම්බර් 13, 14 සහ 17 යන දිනවලදී විභාග වන ලදී. ජන අයිතිය සහ කලවාන ජනතා නැමති ප්‍රකාශන දෙකම කතුවරයකු පිළිබඳව සඳහනක් නොමැතිව ප්‍රකාශයට පත් කර තිබිණි. ජන අවිය නැමති ප්‍රකාශනය පළවෙනි වගඋත්තරකරුගේ මැතිවරණ වියදම් ප්‍රකාශනයේ සඳහන් විය. එසේම  කලවාන ජනතා නැමති ප්‍රකාශනය 1977 ජූලි 20 වන දින පෙත්සම්කරුගේ කාර්යාල අසලින් ගිය පළවෙනි වගඋත්තරකරුගේ මැතිවරණ ප්‍රචාරක රථ පෙළපාලියකදී බෙදාහැර තිබූ බවට පෙත්සම් විභාගයේදී කරුණු ඉදිරිපත් විය. නමුත් පළවෙනි වගඋත්තරකරු මෙම ලිපි ලියු බවට හෝ මෙම ලිපි දුටු බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. දෙවන වගඋත්තරකරු මෙම ප්‍රකාශන මුද්‍රණය සහ ප්‍රකාශනයට වගකිවයුතු බවට සාක්ෂි ඉදිරිපත් විය. දෙවන වගඋත්තරකරු පළවෙනි වගඋත්තරකරුගේ සංවිධාන ලේකම් බවත් පළවෙනි වගඋත්තරකරුගේ නිවසේ ම ඔහු රැඳී සිටිමින් මැතිවරණ මෙහෙයුම් සිදුකර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.

**තීරණය**

මැතිවරණ පෙත්සමේ තීරණය 1980 ජනාවරි 28 වන දින අබ්දුල් කාදර් විනිසුරුවරයා විසින් ලබාදී තිබිණි. එහිදී දෙවන වගඋත්තරකරු 1946 ලංකා ( පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ්‍ය සභා ආඥාවේ 58(අ) වගන්තිය යටතේ දූෂිත ක්‍රියාවක් සිදුකර ඇති බව තීරණය කරන ලදී. එසේම තීන්දුව මගින් ප්‍රකාශ කර තිබුණේ පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශනවල සඳහන් කරුණු තමන්ගේ දැනීම සහ කැමැත්ත මත සිදු නොවූ බවට පෙත්සම්කරු විසින් අධිකරණයේ කරුණු ඉදිරිපත් වීමක් ද සිදු නොවූ බවයි. කෙසේ නමුත් නියෝජිතයකු වරදකරු වූ විට ඒ දූෂිත භාවිතය අපේක්ෂයාගේ කැමැත්ත නොසලකා අපේක්ෂකයාට බලපාන බව විනිසුරුවරයා ඒ අනුව පළවෙනි වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වන බවට තීරණය කරන ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය**

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව පිලපිටිය පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වූ බැවින් කලවාන මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් පැවැත්වීමට තීරණය විය. ඒ අනුව 1981 ජනවාරි මාසයේදී පවත්වන ලද මෙම අතුරු මැතිවරණය සඳහා සරත් මුත්තෙට්ටුවේගම කොමිනිස්ට් පක්ෂයෙන් තරඟ වැදුන අතර තවත් අපේෂක්ෂකයින් 6 දෙනෙකු ස්වාධීනව තරඟ කරන ලදී. එම අතුරු මැතිවරණනේ සරත් මුත්තෙට්ටුවේගම ජයග්‍රහණය කර පාර්ලිමේන්තුවට පත්වන ලදී.

## 9.9. අපේෂකකයාගේ නියෝජිතයකු විසින් අසත්‍ය මැතිවරණ ප්‍රචාරය අසුන අහිමිවීමට හේතුවකි

**කුලරත්න සහ තවත් අය එදිරිව රාජපක්ෂ**
**Kularatne v. Rajapaksha- 1985-1-Sri.LR-24**

**පසුබිම**

මුල්කිරිගල ආසනය සඳහා අතුරු මැතිවරණය 1983 මැයි 14 දින පවත්වන ලදී. මෙම අතුරු මැතිවරණය සඳහා ආනන්ද කුලරත්න (එක්සත් ජාතික පක්ෂය), නිරූපමා රාජපක්ෂ (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය), ප්‍රැන්සිස්කු විමලසේන (ස්වාධීන) සහ රංජිත් සුමනසේන (ස්වාධීන) යන අපේක්ෂකයන් තරඟ (අලවත්තගේ. 2014, 286). මැතිවරණ ප්‍රතිඵලය අනුව ආනන්ද කුලරත්න ජයග්‍රහණය කරන ලදී.

මැතිවරණ ප්‍රචාරක කාලය තුළ මිද්දේණියේ පැවති මැතිවරණ ප්‍රචාරක රැස්වීමකදී කුලරත්න ගේ නියෝජිතයකු විසින් නිරූපමා රාජපක්ෂගේ චරිතයට සහ පැවැත්මට හානිදායක වන අසත්‍ය ප්‍රකාශයක් සිදුකිරීම මත කුලරත්නගේ අපේක්ෂක ධූරය අභියෝගයට ලක් කරමින් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කරන ලදී. එම පෙත්සම මගින් ජයග්‍රාහී අපේක්ෂක පළවෙනි වගඋත්තරකරු ලෙසත් පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයකු ලෙස කටයුතු කරමින් අසත්‍ය ප්‍රකාශ කළ බවට චෝදනා කරමින් බැසිල් රාජපක්ෂ දෙවන වගඋත්තරකරු ලෙසත් නම් කරන ලදී. පෙත්සම විභාග කළ මැතිවරණ විනිසුරු විසින් තීන්දු කරන ලද්දේ දෙවන වගඋත්තරකරුගේ ප්‍රකාශ අසත්‍ය බව පෙත්සම් විභාගයේදී පෙනී ගිය බවත් එසේම එම ප්‍රකාශ මගින් පෙත්සම්කාර නිරූපමා රාජපක්ෂගේ චරිතයට සහ පැවැත්මට බලපෑමක් ඇතිවූ බවත් ඒ අනුව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) 58(1) (ඇ) වගන්තියට අනුව වරදක් කර ඇති බවත් ඒ අනුව එකී පනතේ 82(අ)(1) වගන්තිය අනුව වගඋත්තරකාර කුලරත්නගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසිවන බවත්ය.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මෙම තීරණයට එරෙහිව පළවෙනි වගඋත්තරකාර කුලරත්න (SC Appeal No 1/84) සහ දෙවෙනි වගඋත්තරකරු (SC Appeal No 2/84) ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා දෙකක් ඉදිරිපත් කරන ලද අතර එම අභියාචනා දෙකම එක්ව ගෙන විභාග කරන ලදී.

## අභියාචනා විභාගය

අගවිනිසුරු ෂර්වානන්ද, වනසුන්දර සහ අබ්දුල් කාදර් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ඉදිරියේ මෙම අභියාචනය 1984 සැප්තැම්බර් 19 සිට 21 දක්වාද 24සිට 26 දක්වාද විභාග විය. පෙත්සම්කාරිය මියගිය ජෝර්ජ් රාජපක්ෂගේ දියණියකි. ජෝර්ජ් රාජපක්ෂ 1960 සිට 1976 දක්වා මුල්කිරිගල ආසනය නියෝජනය කර තිබිණි. පෙත්සම්කාරියගේ ප්‍රචාරක පෝස්ටරයක වූයේ මියගිය ජෝර්ජ් රාජපක්ෂට කලගුණ සැලකීම සඳහා ඡන්දය ලබාදෙන ලෙසයි. දෙවන වගඋත්තරකරු විසින් පෙත්සම්කාරිය මියගිය ජෝර්ජ් රාජපක්ෂට ආදරයක් නොතිබුන බවත් ඔහුගේ හදවත් සැත්කම සඳහා එංගලන්තයට යන අවස්ථාවේදී ඇයව හමුවීමට ගිය විට දොර වසාගත් බවත් ප්‍රකාශ කළ බව මෙම අභියාචනා විභාගයේදී සැලකිල්ලට ගන්නා ලදී. එසේම මැතිවරණ පෙත්සම් විභාගයේදී

දෙවන වගඋත්තරකරුගේ කතාවේ හඬපටයක් ඉදිරිපත්වූ අතර සාක්ෂිද ලබාදී තිබිණි. අභියාචනයේදී දෙවන විත්තිකරු විසින් එම ප්‍රකාශය පිළිබඳව අභියෝග කළේ නැත.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය**

අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව මත අගවිනිසුරු ෂර්වානන්ද විසින් 1984 දෙසැම්බර් 12 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

එහිදි විනිසුරුවරයා දක්වා සිටියේ මැතිවරණ පෙත්සම තුළදී දෙවන වගඋත්තරකරු විසින් ප්‍රකාශයක් කළ බවත් එය අසත්‍ය ප්‍රකාශයක් බවත් පෙත්සම්කාරිය විසින් ඔප්පුකර ඇති බවයි. එසේම මැතිවරණ විනිසුරුවරයා විසින් දෙවන වගඋත්තරකරු පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයකු බව හඳුනාගෙන ඇති බවද ප්‍රකාශ කරන ලදී.

එසේම 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82(1) වගන්තිය අනුව අභියාචනයකදී නීති ප්‍රශ්නයක් නොවේ නම් විභාග විනිසුරුවරයා විසින් තහවුරු කරගත් කරුණු පිළිබඳව සමාලෝචනය කළ නොහැකි බව දක්වන ලදී.

මේ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභා කරන ලදී.

ඒ අනුව මැතිවරණ පෙත්සමේ තීරණය පරිදි කුලරත්නගේ පාර්ලිමේන්තු අසුන අහිමි විය.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵල**

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව ආනන්ද කුලරත්නගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි විය. ඒ අනුව මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශය සඳහා නැවත අතුරු මැතිවරණයක් පැවැත්විය. ඒ හා බැඳුන ක්‍රියාවලිය ඊළඟට විස්තර කරනු ලැබේ.

## 9.10. නියෝජිතයකු විසින් සිදුකරනු ලබන දූෂණ ක්‍රියාවක් මගින් අපේක්ෂකයකු ඡන්දය භාවිතා කිරීම සඳහා නුසුදුසු වන්නේ නැත.

**කුලරත්න එදිරිව චන්ද්‍රානන්ද සිල්වා**

Kularatne v. Chandrananda de Silva (1985) 2 Sri.L.R 164)

## පසුබිම

ඉහත සාකච්ඡා කරන ලද කුලරත්න සහ තවත් අය එදිරිව රාජපක්ෂ (Kularatne v. Rajapaksha- 1985-1-Sri.LR-24) නඩුවේ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව ආනන්ද කුලරත්නගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධුරය අහෝසි විය. මැතිවරණ විනිසුරුවරයා විසින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82 වගන්තියට අනුව 1985 ජනවාරි 1 වන දින අති විශෙෂ ගැසට් පත්‍රයක් මගින් වාර්තාව ප්‍රසිද්ධ කරන ලදී. එකී නිවේදනයේ සඳහන් වූයේ "ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82 වැනි වගන්තිය ප්‍රකාරව, අදාළ මැතිවරණ පෙත්සමේ කරුණු ප්‍රකාරව මගේ සොයාගැනීම් අනුව එකී මැතිවරණ පෙත්සමේ 2 වැනි වගඋත්තරකරු වන වීරකැටිය මැදමුලන බැසිල් රාජපක්ෂ මහතා විසින් එකී මැතිවරණයේම අපේක්ෂකයෙකු වූ නිරුපමා රාජපක්ෂ නම් පෙත්සම්කාරියගේ පෞද්ගලික චරිතයට සහ හැසිරීමට බලපාන පරිදි අසත්‍ය ප්‍රකාශයක් ප්‍රසිද්ධ කිරීමේ දූෂිත ක්‍රියාවක් කර ඇති බව ඔප්පු වී ඇති බව මෙයින් වාර්තා කරනු ලබන අතර එකී මැතිවරණයේ දී එම අපේක්ෂකයාගේ පත්වීමට බලපෑම් කිරීමේ අරමුණින්, එම පෙත්සමේ 1 වැනි වගඋත්තරකරු වන ආනන්ද කුලරත්න මහතාගේ අනුදැනුම හා කැමැත්ත ඇතිව ඔහුගේ නියෝජිතයා ලෙස කටයුතු කරමින් ක්‍රියාකර ඇති බව ප්‍රකාශ කරනු ලැබේ."

මෙම නිවේදනයට අනුව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82(ඈ)(2)(ආ)(ii) වගන්තිය සමග කියවිය යුතු 82(ඈ) වගන්තිය අනුව ආනන්ද කුලරත්නගේ සහ බැසිල් රාජපක්ෂගේ නම් ඡන්ද නාමලේඛනවලින් කපා හැරිය යුතුය. ඡන්ද නාමලේඛනයෙන් තම නම කපා හැරීමට කටයුතු කිරීම මගින් ඡන්ද අයිතිය ඇතුලුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අයිතීන් සහ සිවිල් අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට චෝදනා නගමින් ආනන්ද කුලරත්න විසින් අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනුකරන ලදී .

## රිට් පෙත්සම

### Kularatne v. Chandrananda De Silva and another

ආනන්ද කුලරත්න විසින් ඉදිරිපත් කරන ලද පෙත්සම අභියාචනා රිට් අංක 112/85 : CA. APPLICATION No. 112 /85) යටතේ අභියාචානාධිකරණයේ ලියාපදිංචි අතර මෙම රිට් පෙත්සමේ වගඋත්තරකැරුවන් ලෙස මැතිවරණ කොමසාරිස්වරයා සහ හම්බන්තොට තේරීම්භාර නිලධාරියා නම්කර තිබිණි.

අභියාචනාධිකරණයේ ලියාපදිංචි වී තිබූ එම රිට් පෙත්සම මගින් ආනන්ද කුලරත්න පහත සහන ඉල්ලා තිබිණි.

(අ) ඡන්ද නාමලේඛනයෙන් තම නම කපා හැරීමට ගත් තීරණය අවලංගු කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,

(ආ) තම නම නැවත ඡන්ද නාමලේඛනයට ඇතුල් කිරීම සඳහා මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙස.

මෙම රිට් පෙත්සම විභාග වෙමින් පවතින අතර තුර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඉ)(iii) ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් ලබාගැනීම සඳහා ආනන්ද කුලරත්න විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකිරීමක් සිදුකරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට යොමුකිරීම

මෙම යොමුකිරීම ශ්‍රේෂ්ඨාධිකරණ යොමු අංක 1/85 ( S.C. REF. 1 /85.) ලෙස ලියාපදිංචි වූ අතර මෙම යොමුකිරීම මගින් පහත පැහැදිලි කිරීම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා තිබිණි.

(අ) රාජ්‍ය සභා ආඥාවේ 82 ඈ (2) (ආ) (ii) වගන්තියේ සඳහන් වන පරිදි පාර්ලිමේන්තු මැතිවරණයක දී ඡන්දහිමියකු වීමට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමට එවැනි අපේක්ෂකයෙකු නුසුදුසු තැනැත්තකු වීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 88, 89 (ඉ) (iii) සහ 90 ව්‍යවස්ථාවල විධිවිධාන අනුව සලකා බැලීමේ දී, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 82 ඈ (ආ) (ii) වගන්තිය දැනට ක්‍රියාත්මක වන පස්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමඟ කියවනු ලබන්නේ ද.

(ආ) 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58 (1) (ඇ) වගන්තිය යටතේ සාවද්‍ය ප්‍රකාශයක් කිරීමේ දූෂිත ක්‍රියාව සිදු කර ඇති බව මැතිවරණ විනිසුරුවරයෙකු විසින් කරන ලද වාර්තාව මගින් තහවුරු වන අවස්ථාවක දී, එවැන් ක්‍රියාවක් සිදු කර ඇත්තේ එවන් මැතිවරණයක අපේක්ෂකයෙකුගේ නියෝජිතයෙකු වශයෙන් එකී අපේක්ෂකයාගේ අනුදැනුම හා කැමැත්ත ඇතිව නම්, එහිදී එවන් අපේක්ෂකයකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඉ) (iii) ව්‍යවස්ථාවේ අඩංගු නුසුදුසුකමට යටත් වන්නේ ද.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඉ) (iii) ව්‍යවස්ථාවේ ''........... කිසියම් දූෂිත ක්‍රියාවකට වරදකරු බවට විනිශ්චයකරුවෙකු විසින් කරන ලද වාර්තාවක්......... " යන වචන, (ඉහත කී රාජ්‍ය සභා ආඥාවේ 82 (ආ) වගන්තියේ දක්වා ඇති පරිදි) එවැනි දූෂිත ක්‍රියාවක් තමා විසින් සිදු කර වැරදිකරු බව ඔප්පු වී ඇති බවට එවැනි වාර්තාවක දක්වා ඇති පුද්ගලයෙකුට පමණක් අදාළ වන්නේ ද සහ (එවන් දූෂිත ක්‍රියාවකට වරදකරු වී ඇති බව ඔප්පු වී ඇති බවට එවැනි වාර්තාවක දක්වා නැතත්), එවන් වාර්තාවක අදාළ නියෝජිතයා එවැනි අපේක්ෂකයකුගේ අනුදැනුම සහ කැමැත්ත ඇතිව එවැනි ක්‍රියාවක් සිදු කර ඇති බව දක්වා ඇති අවස්ථාවක දී වුව ද, අදාළ වන්නේ ද යන්න"

## ශ්‍රේෂ්ඨාධිකරණ අර්ථ නිරූපණය

යොමුකිරීමේ පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු ෂර්වානන්ද, කොලින්තෝමේ සහ අතුකෝරළ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි, අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාවය මත ෂර්වානන්ද විනිසුරුවරයා විසින් 1985 ජූලි 2 වන දින තීරණය ලබාදෙන ලදී. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයෙන් විමසන ලද ප්‍රශ්න සඳහා පහත පිළිතුරු ලබාදෙන ලදී,

(අ) නැත

(ආ) නැත

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඉ) (iii) ව්‍යවස්ථාවේ ''........... කිසියම් දූෂිත ක්‍රියාවකට වරදකරු බවට විනිශ්චයකරුවෙකු විසින් කරන ලද වාර්තාවක් ......... "යන වචන, (ඉහත කී රාජ්‍ය සභා ආඥාවේ 82 (ආ) වගන්තියේ දක්වා ඇති පරිදි) එවැනි දූෂිත ක්‍රියාවක් තමා විසින් සිදු කර වැරදිකරු බව ඔප්පු වී ඇති බවට එවැනි වාර්තාවක දක්වා ඇති පුද්ගලයෙකුට පමණක් අදාළ වේ. එවන් වාර්තාවක අදාළ නියෝජිතයා එවැනි අපේක්ෂකයකුගේ අනුදැනුම සහ කැමැත්ත ඇතිව එවැනි ක්‍රියාවක් සිදු කර ඇති බව දක්වා ඇති අවස්ථාවක දී වුව ද, අදාළ වන්නේ නැත"

එසේම අගවිනිසුරුවරයා පැහැදිලි කරන ලද්දේ ඡන්දදායකයෙකු වීමට නුසුදුසුකම තීරණය කිරීමේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89(ඉ)(iii) තනිකරම කියවිය යුතු බවයි. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 88 සහ 89 වගන්ති යටතේ පෙත්සම්කරු ඡන්දදායකයකු

වීමට නුසුදුසු පුද්ගලයකු නොවන බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

ආනන්ද කුලරත්නගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වීම හේතුවෙන් මුල්කිරිගල මැතිවරණ කොට්ඨාශය සඳහා යලිත් අතුරු මැතිවරණයක් පැවැත්විය. ඉහත සඳහන් කළ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මගින් ආනන්ද කුලරත්න මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් ලබා තිබූ බැවින් ඔහු එම අතුරු මැතිවරණය සඳහාද එක්සත් ජාතික පක්‍ෂය වෙනුවෙන් තරඟ කරන ලදී. එම අතුරු මැතිවරණය 1985 සැප්තැම්බර් මාසයේදී පැවැත්වූ අතර ඒ සඳහා ආනන්ද කුලරත්න සමග චමල් රාජපක්‍ෂ (ශ්‍රි.ල.නි.ප), යන අපේක්‍ෂකයන් දේශපාලන පක්‍ෂ නියෝජනය කරමින්ද තවත් අපේක්‍ෂකයන් 6 දෙනෙකු ස්වාධීනවද තරඟ කරන ලදී, මැතිවරණ ප්‍රතිඵලය අනුව ආනන්ද කුලරත්න යලිත් ජයග්‍රහණය කර පාර්ලිමේන්තුවට පත්වන ලදී.

දසවන පරිච්ඡේදය

# මැතිවරණ ප්‍රචාරයන් සහ ආගමික කටයුතු

දේශපාලන ක්‍රියාවලියක් වන මැතිවරණ සමග අධ්‍යාත්මක ක්‍රියාවලියක් වන ආගමික කටයුතු සම්බන්ධ කිරීම මගින් ආගමට මෙන්ම දේශපාලනයටද සිදුවන්නේ අගතියකි. එමෙන්ම දේශපාලන තීරණයක් වන ඡන්දය භාවිතා කිරීමේදී එම තීරණය ගැනීම මගින් තම ආගමික සංස්ථාව තුළින් ඒ සඳහා බලපෑමක් සිදුවන්නේ නම් එවැනි අවස්ථාවකදී ඡන්දදායකයා අසරණ භාවයට පත්වේ. මැතිවරණ ක්‍රියාවලිය තුළින් ආගමික සංස්ථාවන් සහ ආගමික ස්ථාන ඈත් කර තබන්නේ ඡන්ද දායකයන්ගේ කැමැත්ත බලපෑමකින් තොරව භාවිතා කිරීමේ අපේක්ෂාවෙනි. මැතිවරණ ප්‍රචාරක කටයුතු වලදී ආගමික උත්සව සහ ආගමික ස්ථාන භාවිතා කිරීමේ සීමාවන් පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සහ මැතිවරණ පෙත්සම් වලදී ආගමික උත්සව අර්ථ නිරූපනය කළ නඩු තීන්දු පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබයි.

## 10.1. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය සමග ආගමික කටයුතු පිළිබඳ නීති තත්ත්වය

මැතිවරණ ප්‍රචාරයේදී යම් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයකුට වාසි ලබාගැනීම සඳහා ආගමික සිද්ධස්ථාන සහ ආගමික වතාවත් භාවිතා කිරීම වර්තමාන නීතියෙන් තහනම් කර තිබේ. 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 79 (2) වගන්තියේ දැක්වෙන්නේ "යම් මැතිවරණයක නාම යෝජනා කාලසීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ මැතිවරණයේ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනයට ඉක්බිතිවම එළඹෙන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ යම් වේලාවක

(අ) ඒ මැතිවරණයේ ප්‍රතිඵලය කෙරෙහි බලපෑමක් ඇති කිරීමේ කාර්යය සඳහා හෝ ඒ මැතිවරණයේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දෙන ලෙස හෝ දීමෙන් වළකින ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීමේ කාර්යය සඳහා, යම් ආගමික රැස්වීමකදී යම් වචන පවසන හෝ

(ආ) ඒ කාර්යය සඳහා යම් ආගමික රැස්වීමක දී යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, අපේක්ෂකයකුගේ ඡායාරූපයක්, ලකුණක් සළකුණක්, කොඩියක් හෝ පතාකයක් බෙදාහරින හෝ ප්‍රදර්ශනය කරන හෝ

(ඇ) ඒ මැතිවරණයේදී යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් තෝරාපත් කර ගැනීම හෝ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක මැතිවරණ ව්‍යාපාරය හෝ ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා පූජනීය ස්ථානයක මහජන රැස්වීමක් පවත්වන හෝ පැවැත්වීමට සලස්වන සෑම තැනැත්තකුම අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතුය.

(3) යම් මැතිවරණක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට හෝ ඒ මැතිවරණයේ දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දීමට හෝ ආධාර දීමෙන් වැළැකී සිටීමට ආගමික නිකායක හෝ සංවිධානයක යම් සාමාජිකයකු හෝ අනුගාමිකයකු පෙළඹවීම සඳහා හෝ ඔහුට බල කිරීම සඳහා නැතහොත් ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ මැතිවරණයේදී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන හෝ ඒ මැතිවරණයේදී එවැනි යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ආධාර දී තිබීම හෝ ආධාර දිමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන

(අ) ඒ සාමාජිකයාට හෝ අනුගාමිකයාට හෝ ඒ සාමාජිකයාගේ හෝ අනුගාමිකයාගේ පවුලේ යම් සාමාජිකයකුට ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා සාමාන්‍යයෙන් කටයුතු කිරීමේදී හිමිකම් ලබන යම් අධ්‍යාත්මික සේවාවක් මෙහෙයක් හෝ ප්‍රතිලාභයක් ප්‍රතික්ෂේප කරන හෝ ප්‍රතික්ෂේප කරන බවට තර්ජනය කරන හෝ

(ආ) ඒ සාමාජිකයා හෝ අනුගාමිකයා ඒ නිකායෙන් හෝ සංවිධානයෙන් බැහැර කරන හෝ බැහැර කරන බවට තර්ජනය කරන

ඒ ආගමික නිකායේ හෝ සංවිධානයේ යම් සාමාජිකයකු හෝ නිලධාරියකු අයුතු බලපෑමේ වරදට වරදකරු විය යුතුය.

මෙම වරදට වරදකරු වූ පුද්ගලයකුට මාස 12ක් දක්වා බරපතල වැඩ ඇතිව සිරදඬුවම් නියම කළ හැකි අතර එයට අමතරව වරදකරුවූ දින සිට වසර 7ක් දක්වා කාලයකට ඡන්දය ප්‍රකාශ කිරීම ඡන්දයකට ඉදිරිපත් වීමට සුදුසුකම් නොලබයි. එසේම වරදකරු කරන අවස්ථාව වන විට පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයක් දරමින් සිටියේ නම් මන්ත්‍රීධූරය අහෝසි වේ.

මෙම ප්‍රතිපාදනයට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 78 (2) සහ 78(3) වගන්ති තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 80(2) සහ 80(3) වගන්ති තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 82(ඇ)(2) සහ 82(ඇ) (3) යන වගන්තිවලද දක්නට ලැබේ. එසේම අපේක්ෂකයා විසින් හෝ ඔහුගේ අනුදැනුම ඇතිව ඔහුගේ නියෝජිතයකු විසින් මැතිවරණ දූෂණ වරදක් සිදුකරන ලද බව ඡන්ද පෙත්සමකදී මැතිවරණ විනිශ්චයකාර වරයා සෑහීමකට පත්වන පරිදි ඔප්පුකරනු ලැබුවහොත් එම අපේක්ෂකයාගේ මන්ත්‍රීධූරය නිශ්ප්‍රභා කළ හැකි බව පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 92 (2) වගන්තියේ සඳහන් වේ.

## 10.2. ආගමික රැස්වීමක් යනු කුමක්ද?

**හේමදාස එදිරිව සිරිසේන**
Hemadasa v. Sirisena 69 NLR 201

**පසුබිම**

1965 පාර්ලිමේන්තු මැතිවරණයට බිංගිරිය මැතිවරණ කොට්ඨාශය සඳහා ජේ.එල්.සිරිසේන (එ.ජා.ප), එල්.බී.ජයසේන (ශ්‍රී.ල.නි.ප), රන්කොඩි වික්‍රමරත්න (ශ්‍රී.ල.නි.ස.ප) සහ එම්.ඒ.එම්.පී.අප්පුහාමි

(ම.එ.පෙ) යන අපේක්ෂකයින් බිංගිරිය මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් තරග කරන ලදී (අලවත්තගේ. 2014, 200). එක්සත් ජාතික පක්ෂයෙන් තරංග කරන ලද සිරිසේන ජයග්‍රහණය කරන ලදී. මෙම මැතිවරණය පවත්වන ලද්දේ 1964 අංක 10 දරණ පනතින් සංශෝධනය වූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ්‍ය සභා ආඥා පනත යටතේය. මෙම පනතේ 56(2)(අ) වගන්තියේ මෙසේ සඳහන් වේ.

"නාම යෝජනා පත්‍ර භාරදීම අවසන්වූ දින සිට ඡන්දය අවසන් වන දිනය දක්වා කාලය තුළ ඕනෑම ආගමික රැස්වීමකදී එවැනි මැතිවරණයක ඡන්ද ප්‍රතිඵලයට බලපෑමක් කිරීමේ අරමුණ ඇතිව හෝ කිසියම් අපේක්ෂකයකුට ඡන්දය දීමට හෝ ඡන්දය නොදීමට ඡන්දදායකයකු පෙළඹවීමක් සිදුකරන ප්‍රකාශයක් සිදුකිරීම අයුතු බලපෑම නැමති වරද සිදුකරයි"

මැතිවරණ ප්‍රචාරක කටයුතු අතරතුරදී ආගමික රැස්වීම්වලදී වගඋත්තරකරුගේ ආධාරකරුවන් විසින් වගඋත්තරකරු වෙනුවෙන් ඡන්දය ඉල්ලීම සිදුකළ බවට පෙත්සම්කරු විසින් චෝදනා නගන ලදී.

## මැතිවරණ පෙත්සම

වගඋත්තරකරුගේ අධාරකරුවන් වූ සාසනරතන නම් ස්වාමීන් වහන්සේ නමක් සහ කරුණාරත්න නැමති වෛද්‍යවරයෙක් සහ කරුණාසේන නැමති පුද්ගලයකු විහාරස්ථාන කිහිපයකදී සහ භාවනා මධ්‍යස්ථානයක පැවති ආගමික රැස්වීම් අතරතුර වගඋත්තරකරුගේ ඡන්ද ලකුණට එනම් අලියා ලකුණට ඡන්ද ලබාදෙන ලෙස එම රැස්වීමේ සහභාගී වූ පිරිසගෙන් ඉල්ලා සිටිය බවත් එම ක්‍රියාව 1964 අංක 10 දරණ පනතින් සංශෝධනය වූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 56(2) (අ) ව්‍යවස්ථාවට අනුව අයුතු බලපෑම නැමති දූෂිත ක්‍රියාව සංයුක්ත වන වරදක් බවත් එබැවින් වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙස ඉල්ලමින් ඡන්ද පෙත්සම ගොනුකරන ලදී.

## ඡන්ද පෙත්සම් විභාගය

ඡන්ද පෙත්සම් විභාගයේදී පහත කරුණු අනාවරණය විය

❖ උඩුබද්දාව පරණගම විහාරස්ථානයේ ආවාස ගෘහය සඳහා මුල්ගල් තැබීමේ උත්සවයේදී දුන්නාපොල විහාරස්ථානයේ සාසනතිස්ස නම් භික්ෂූන් වහන්සේ නමක් විසින් වගඋත්තරකරුට ඡන්ද ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව

- ❖ දුම්මලසූරිය භාවනා මධ්‍යස්ථානයකදී එම භාවනා මධ්‍යස්ථානයේ භාවනා වැඩසටහන් අවසන්වීමෙන් පසුව එහි නැවතී සිටින වන්දනාකරුවන් හමුවීමට පැමිණි කරුණාරත්න නැමති වෛද්‍යවරයෙක් අලියා ලකුණට ඡන්දය ලබාදෙන ලෙස එම වන්දනාකරුවන්ගෙන් ඉල්ලා ඇත.
- ❖ එසේම භාවනා වැඩසටහනේ විවේක කාලය වූ 11.00 සහ 2.30 අතර කාලයේදී එම භාවනා මධ්‍යස්ථානයට පැමිණි බණ්ඩාරප්පු නැමැති පුද්ගලයකු වගඋත්තරකරුගේ ප්‍රචාරක පත්‍රිකා එම වන්දනාකරුවන් අතර බෙදාහැර ඇති බව
- ❖ බෝවත්ත පිහිටි භාවනා මධ්‍යස්ථානයකට ඇතැම් රාත්‍රිකාලවල සහ භාවනා වැඩසටහනේ විවේක කාලය තුළදී පැමිණි කරුණාසේන නැමති පුද්ගලයකු මාක්ස්වාදීන්ගෙන් රට බේරාගැනීමට ඡන්දය භාවිතා කරන ලෙස වන්දනාකරුවන්ගෙන් ඉල්ලා ඇත.
- ❖ මුන්නකුලම විහාරස්ථානයේ පාසල් ශාලාව සහ ලැගුම්ගේ අතර ප්‍රදේශයේ ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ඓතිහාසික සහ ආගමික වැදගත් කමකින් යුතු  ස්ථාන පිළිබඳව චිත්‍රපටයක් ප්‍රදර්ශනය කර ඇති අතර එම චිත්‍රපටය අවසානයේදී සාසනතිස්ස නම් භික්ෂූන් වහන්සේ විසින් අලියාට ඡන්දය දී වගඋත්තරකරු පාර්ලිමේන්තුවට යවන ලෙස රැස්වී සිටි පිරිසගෙන් ඉල්ලා ඇත.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සම විභාග කළ මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය වූයේ පනතේ 56(2)(අ) වගන්තිය මගින් ආවරණය වන්නේ ආගමික රැස්වීම් පමණක් බවයි. ආවාස ගෙයක් සඳහා මුල්ගල් තැබීමේ උත්සවයක් බෞද්ධ ආගමික උත්සවයක් නොවන බවයි. එසේම දුම්මලසූරිය සහ බෝවත්ත භාවනා මධ්‍යස්ථානවලදී වගඋත්තරකරුගේ ආධාරකරුවන් ඡන්දය ලබාදෙන ලෙස ඉල්ලා ඇත්තේ භාවනා වැඩසටහන් අවසන් වීමෙන් පසුව සහ විවේක කාලවලදී බැවින් එම අවස්ථාවන්ද ආගමික රැස්වීම් ලෙස අර්ථ නිරූපණය කළ නොහැකි බව මැතිවරණ විනිසුරුවරයා තීරණය කරන ලදී. එමෙන්ම මුන්නකුලම විහාරස්ථානයේ චිත්‍රපට ප්‍රදර්ශනයද ආගමික රැස්වීමක් නොවන බවත් එම ස්ථානයේ ආගමික කටයුතු සිදුවූ බවට සාක්ෂි නොමැති බවත් සඳහන් කළ විනිසුරුවරයා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුවරයාගේ තීරණයෙන් තෘප්තිමත් නොවූ පෙත්සම්කරු එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී.

### අභියාචනා විභාගය

මෙම අභියාචනය විභාග කරන ලද්දේ එච්.එන්.ජී.ප්‍රනාන්දු, එස්.පී.ජේ.තම්බයියා සහ අභයසුන්දර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. 1966 සැප්තැම්බර් 22 වන දින අභයසුන්දර විනිසුරුවරයා අනෙකුත් විනිසුරුවරුන් දෙදෙනාගේද එකඟතාවය මත අභියාචනා විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී. එම තීරණය මගින් මැතිවරණ විනිසුරුගේ තීරණය තහවුරු කරමින් අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 10.3. අතහැර දමන ලද ආගමික ස්ථානයක රැස්වීම් පැවැත්වීම මැතිවරණ වරදක් නොවේ.

**දිසානායක එදිරිව අබේසිංහ**
**Disanayake v. Abeysinghe(1971) 75 NLR 12**

### පසුබිම

1970 මැයි 27 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නුවරඑළිය මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් ගාමිණී දිසානායක(එ.ජා.ප), ටී.විලියම් ප්‍රනාන්දු (ශ්‍රී.ල.නි.ප) සහ සී.වී.වේලුපිප්ලෙයි(ස්වාධීන) යන අපේක්ෂකයන් ඉදිරිපත් විය (මැතිවරණ ප්‍රතිඵල). මැතිවරණ ප්‍රතිඵල අනුව ගාමිණී දිසානායක ජයග්‍රහණය ලබා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරීපත්විය. ඔහුගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ ඔහු හෝ ඔහුගේ නියෝජිතයන් විසින් අයුතු බලපෑම සිදුකරන ලද බවට චෝදනා කරමින් පෙත්සම්කරු මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරමින් ගාමිණී දිසානායකගේ මන්ත්‍රීධුරය අහෝසි කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

### මැතිවරණ පෙත්සම

1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 80(බී)(ඩී) වගන්තිය යටතේ මෙම මැතිවරණ පෙත්සම ගොනුකර

තිබිණි. මෙම පෙත්සම මගින් ගාමිණී දිසානායක පළවෙනි වගඋත්තරකරු ලෙසත් ඔහුගේ ආධාරකරුවෙකු දෙවන වගඋත්තරකරු ලෙසත් නම්කර තිබිණි. පෙත්සම මගින් මූලික චෝදනා තුනක් නගා තිබිණි. එනම්,

- 1970 මැයි 24 වන දින ආගමික ස්ථානයක් වන නුවරඑළිය ස්කෲබ් වත්තේ හින්දු කෝවිලේ පළවෙනි වගඋත්තරකරු ප්‍රවර්ධනය කිරීමේ දේශපාලන රැස්වීමක් පළවෙනි වගඋත්තරකරුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව පැවැත්වීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවණ) රාජ්‍ය සභා ආඥාවේ 56(2) (සී) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම.
- 1970 මැයි 16 වන දින ආගමික ස්ථානයක් වන නුවරඑළිය, හාවාඑළිය, මාරි අම්මා හින්දු කෝවිලේ පළවෙනි වගඋත්තරකරු ප්‍රවර්ධනය කිරීමේ දේශපාලන රැස්වීමක් පළවෙනි වගඋත්තරකරුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව පැවැත්වීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවණ) රාජ්‍ය සභා ආඥාවේ 56(2) (සී) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම.
- 1970 මැයි 24 වන දින සවස නුවරඑළිය පැරණි කඩවීදියේ පිහිටි ගොල්ෆ් ලින්ක් පිටියේ පැවති දේශපාලන රැස්වීමකදී 4වන වගඋත්තරතකරු පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයකු ලෙස කටයුතු කරමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේක්ෂක විලියම් ප්‍රනාන්දුගේ පෞද්ගලික චරිතයට හානිවන අසත්‍ය ප්‍රකාශයන් සිදුකිරීම මගින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(1)(ඩී) වගන්තිය යටතේ වන දූෂණ ක්‍රියාවක් වන අසත්‍ය ප්‍රකාශයක් සිදුකිරීම.

## මැතිවරණ පෙත්සම් විභාගය

පෙත්සම් විභාගය ආරම්භයේදී මැතිවරණ විනිසුරු ඉදිරියේ මූලික විරෝධතාවක් නගමින් වගඋත්තරකරුවන් ප්‍රකාශ කළේ මෙම පෙත්සම සහ දිවුරුම් පෙත්සම 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(1)(ඩී) වගන්තියට අනුකූලව ඉදිරිපත් කර නොමැති බැවින්ද ඇපමුදල ප්‍රමාණවත් නොවන බැවින්ද, පෙත්සම විභාගයට නොගෙන නිශ්ප්‍රභා කරන ලෙසයි. එසේම වගඋත්තරකරුවන් තවදුරටත් තර්ක කරන ලද්දේ පෙත්සමේ

සඳහන් කර ඇති මාරි අම්මා කෝවිල එම රැස්වීම පැවැත්වෙන අවස්ථාව වන විට අතහැර දමන ලද ස්ථානයක් බවයි. එසේම ස්කෑබ් වත්තේ කෝවිල තුළ එවැනි රැස්වීමක් නොපැවැත්වූ බවට සාක්ෂි ඉදිරිපත් විය. ඒ අනුව එම චෝදනාවද මැතිවරණ විනිසුරුවරයා විසින් බැහැර කරන ලදී. නමුත් 4වන වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ අපේක්ෂක විලියම් ප්‍රනාන්දුගේ ඡන්දය ලැබීමට අදාළව ඔහුගේ පුද්ගලික චරිතයට හානිදායක වන ප්‍රකාශ පිළිබඳව වූ චෝදනාව පිළිගනිමින් මැතිවරණ විනිසුරුවරයා විසින් පළවෙනි වගඋත්තරකාර ගාමිණී දිසානායකගේ පාර්ලිමේන්තු පත්වීම අවලංගු කරන ලදී.

මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමින් පෙත්සම විභාගයට ගත් මැතිවරණ විනිසුරුවරයා 1වන වගඋත්තරකාර ගාමිණී දිසානායකගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අවලංගු කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුගේ තීරණයේ අතෘප්තිමත් වූ 1වන වගඋත්තරකාර ගාමිණී දිසානායක එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. මෙම අභියාචනය නීතිමය තර්ක දෙකක් මත පදනම් විය. පළමු තර්කය වූයේ මැතිවරණ පෙත්සම රාජ්‍ය සභා ආඥාවේ 80බී(ඩී) වගන්තියට අනුකූල ලෙස ඉදිරිපත් කර නොතිබූ බවයි. දෙවෙනි තර්කය වූයේ මැතිවරණ පෙත්සම සඳහා ඉදිරිපත් කරන ලද ඇප මුදල මැතිවරණ පෙත්සම් රීති 12ට අනුව ප්‍රමාණවත් නොවූ බවයි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

මෙම අභියාචනය විභාග කරන ලද්දේ ජී.පී.ඒ.සිල්වා, සිරිමාන්න සහ සමරවික්‍රම යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. අභියාචනා විභාගයේ තීන්දුව 1971 දෙසැම්බර් 21 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. මෙම තීන්දුවේ විශේෂත්වයක් වන්නේ විනිසුරුවරුන් තිදෙනාම තීන්දු තුනක් ප්‍රකාශයට පත් කිරීමයි. සිල්වා විනිසුරුවරයාගේ තීන්දුව මගින් ප්‍රකාශ කරන ලද්දේ අභියාචනයේදී මතු කරන ලද නීති ප්‍රශ්න පිළිගනිමින් මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය අහෝසි කර ගාමිණී දිසානායක නුවරඑළිය මැතිවරණ කොට්ඨාශය සඳහා නිසිලෙස පත්වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස ප්‍රකාශ කළ යුතු බවයි. නමුත් සිරිමාන්න සහ සමරවික්‍රම විනිසුරුවන්රුන් ප්‍රකාශයට පත්කළ නඩු තීන්දු දෙකෙන්ම තීරණය කර තිබුනේ අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කළ යුතු බවයි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ බලපෑම

මෙම තීරණය අනුව 1970 පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජයග්‍රහණය කළ ගාමිණී දිසානායකගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි වූ අතර නුවරඑළිය මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් 1972 ඔක්තෝබර් 9 වන දින පවත්වන ලදී. මෙම මැතිවරණය සඳහා ගාමිණී දිසානායක (එ.ජා.ප), එච්.එම්.අබේසිංහ (ශ්‍රී.ල.නි.ප), මඩවල බණ්ඩාර වීරකෝන් (ම.එ.පෙ), දොන්.සෙනවිරත්න(ස්වාධීන), අභිමාන්.පී.මුරුගයියා (ස්වාධීන) යන අපේක්ෂකයන් තරඟ වැදුන අතර වැඩි ඡන්ද 1871 කින් ගාමිණී දිසානායක ජයග්‍රහණය කරන ලදී.( මැතිවරණ ප්‍රතිඵල-මැතිවරණ කොමිෂන් සභාව)

එකොළොස්වන පරිච්ඡේදය

# ප්‍රචණ්ඩ ක්‍රියා මත මැතිවරණ නිශ්ප්‍රභා කිරීම

මැතිවරණයක් සුපිළිපන්න වීමේ එක් ප්‍රධාන අංගයක් වන්නේ එය ප්‍රචණ්ඩක්‍රියාවන්ගෙන් තොරව පැවැත්වීමට හැකියාවක් ලැබීමයි. ඡන්දදායකයන්ට නිදහස්ව තීරණ ගැනීමට මෙන්ම ඡන්ද මධ්‍යස්ථාන වෙත පැමිණ ඡන්දය භාවිතා කිරීමටද සාමකාමී වාතාවරණයක් අවශ්‍ය වේ. එසේම සෑම අපේක්ෂකයකුටම තම මැතිවරණ ප්‍රචාරක කටයුතු හරහා තම ඡන්දදායකයන් වෙත තම ප්‍රතිපත්ති සහ විවේචන ගෙන යාමට නම් සාමකාමී වාතාවරණයක් අවශ්‍යවේ. ප්‍රචණ්ඩකාරී වාතාවරණයක් තුළ සිදුවන මැතිවරණයක ප්‍රතිඵලයක් මගින් ඡන්දදායකයන්ගේ නියම කැමැත්ත ප්‍රදර්ශනය නොවන බව ප්‍රකාශ කරන්නේ එබැවිනි. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මත ඡන්ද ප්‍රතිඵලය සහ මන්ත්‍රීධූරය අහෝසි කිරීම පිළිබඳව පවතින නීතිමය ප්‍රතිපාදන සහ මැතිවරණ පෙත්සම්වලදී එම කරුණු අභියෝගයට ලක්වූ නඩු තීන්දු පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලැබේ.

මෙම පරිච්ඡේදය මගින් විස්තර වන ඇතැම් නඩු තීන්දුවලට අදාළ වන නීති තත්ත්වයන් මේ වන විට සංශෝධනය වී ඇති බවද සැලකිල්ලට ගත යුතුය.

## 11.1. මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

මැතිවරණ ආශ්‍රිතව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියාවන් සහ බියගැන්වීම් නිදහස් සහ සාධාරණ මැතිවරණයකට දැඩි බාධාවකි. එබැවින් මැතිවරණයක් ආශ්‍රිතව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් ඡන්ද දායකයන් යම් පක්ෂයකට ඡන්දය දීමෙන් වැළැක්වී ඇති මැතිවරණ පෙත්සමකදී ඔප්පු වන්නේ නම් එම මැතිවරණ නිශ්ප්‍රභා කළ යුතු බව

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 92 වගන්තිය දක්වයි.

"92. (1) යම් මැතිවරණ කොට්ඨාශයක් සඳහා වූ මැතිවරණය ඡන්ද පෙත්සමකදී මැතිවරණ විනිශ්චයකාරවරයා සෑහීමකට පත් වන පරිදි ඔප්පු කරනු ලැබිය හැකි පහත සඳහන් හේතු අතුරින් යම් හේතුවක් නිසා නිෂ්ප්‍රභා කරනු ලැබූ ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතුය. එනම්,

(අ) සාමාන්‍ය අල්ලස, සාමාන්‍ය සංග්‍රහ කිරීම හෝ සාමාන්‍ය බියගැන්වීම නැතහොත් වෙනත් විෂමාචාරයක් හෝ මින් පෙර වෙන වෙනම සඳහන් කර ඇති අවස්ථානුගත කරුණු වලට සමාන වන හෝ නොවන වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොටගෙන, ඡන්ද හිමියන්ගෙන් යම් කොටසක්, ඔවුන් වඩා කැමැත්ත දැක්වූ පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඡන්දය දීමෙන් වැළැක්වුන බව සහ එමගින් මැතිවරණයේ ප්‍රතිඵලය කෙරෙහි සෑහෙන බලපෑමක් වූ බවට,

මෙම ප්‍රතිපාදනය ට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 91 වගන්තිය තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 92 වගන්තිය තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 82ව යන වගන්තිවලද දක්නට ලැබේ.

## 11.2. ඡන්දය අවලංගු කිරීම සඳහා සාමාන්‍ය බියගැන්වීම මගින් සිදුවූ බලපෑම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ

**පැල්පොල එදිරිව ගුණවර්ධන**
**Pelpola v. Gunawardene (1948) 49 NLR 407**

### පසුබිම

1947 සැප්තැම්බර් 18 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා රත්නකීර්ති සෙනරත් සේරසිංහ ගුණවර්ධන(එ.ජා.ප) සහ ස්ටැන්ලි පැල්පොල (ස්වාධීන) යන දෙදෙනා ගම්පොල මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් තරඟ කරන ලදී. ඡන්ද ප්‍රතිඵල අනුව ජයග්‍රහණය කරන ලද්දේ ගුණවර්ධනය. ඒ අනුව ගුණවර්ධන කාර්යභාරයක් නොමැති අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන

සංවිධානයක බවට පත්විය. ගුණවර්ධන ලබාගත් වැඩි ඡන්ද ප්‍රමාණය 387කි. මැතිවරණයේ සිදුවූ ප්‍රචණ්ඩ ක්‍රියා සහ අයුතු බලපෑම් හේතුවෙන් තම ඡන්ද ප්‍රමාණය අඩුවූ බවට චෝදනා කරමින් ගුණවර්ධනගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසිකරන ලෙස ඉල්ලා පැල්පොල විසින් මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## මැතිවරණ පෙත්සම

පෙත්සම මගින් ජයග්‍රාහී අපේක්ෂක ගුණවර්ධන වගඋත්තරකරු ලෙස නම්කර තිබිණි. පැල්පොල විසින් ඉදිරිපත් කරන ලද මැතිවරණ පෙත්සම ප්‍රධාන කරුණු දෙකක් මත පදනම් විය. පළමු කරුණ වූයේ උඩවෙල ඡන්ද මධ්‍යස්ථානය සහ තවත් ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් ආශ්‍රිතව සිදුකරන ලද බියගැන්වීම් සහ ඡන්දදායකයන් පලවාහැරීමය. මේ ක්‍රියාවන් මගින් බහුතරයක් ඡන්දදායකයන්ට ඡන්දය භාවිතා කිරීමට අවස්ථාවක් නොලැබුණ බව ඔහු පෙත්සම මගින් කියා සිටින ලදී. දෙවැනි කරුණ වූයේ මෙම අයුතු බලපෑම් සිදුකරන ලද්දේ වගඋත්තරකරුගේ නියෝජිතයන් විසින් බවයි. එය පළමු කරුණටම සම්බන්ධිත කරුණක් විය. මෙම හේතුමත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 77(අ) වගන්තිය අනුව වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙස මැතිවරණ පෙත්සම මගින් ඉල්ලා සිටින ලදී. එසේම වගඋත්තරකරුවන්ගේ නියෝජිතයන් විසින් මෙම අයුතු බලපෑම් සිදුකළ බැවින් ඔහුගේ දැනීම මත මෙම වැරදි සිදුකිරීම හේතුවෙන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(2) වගන්තිය යටතේ වන අෂක්නුතාවයකට වගඋත්තරකරු ලක් කළ යුතු බවට නියෝගක් ලබාදෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

## පෙත්සම් විභාගය

මැතිවරණ පෙත්සම විභාග කරන ලද්දේ වින්ඩම් විනිසුරුවරයා විසිනි. පෙත්සම් විභාගයේදී සාක්ෂි ලබාදුන් උඩවෙල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දපොල නිලධාරියා අධිකරණය ඉදිරියේ ප්‍රකාශ කළේ ඡන්ද මධ්‍යස්ථානයේ ලියාපදිංචි ඡන්ද 1427ක් තිබූ බවත් ඡන්දය දිනයේ භාවිතා වී තිබුණේ ඡන්ද 541ක් පමණක් බවත්ය. එසේ පෙරවරු 10 සිට පස්වරු 4 දක්වා භාවිතා වී තිබුණේ ඡන්ද 147ක් පමණක් බවත් ඉතිරි ඡන්ද 168 භාවිතා වී තිබුණේ පස්වරු 4 සිට 5 දක්වා කාලයේදී බවත්ය. මෙම සාක්ෂිය උඩවෙල ඡන්ද මධ්‍යස්ථානයේ ඡන්දදායකු සහ ඒ අසල මොස්විල්ල වතුයායේ ලංකා ඉන්දීය කම්කරු කොංග්‍රසයේ කම්කරු කමිටුවේ සභාපති වූ එස්.පරමනාදන්ගේ

සාක්ෂිය සමග මනාව ගැලපුනි. ඔහු ප්‍රකාශ කරන ලද්දේ තමන් ඡන්දය භාවිතා කිරීම සඳහා තවත් වතුකම්කරුවන් පිරිසක් සමග උඩවෙල ඡන්ද මධ්‍යස්ථානය දෙසට ගමන් කළ බවත් එම ඡන්ද මධ්‍යස්ථානය අසල බේකරිය ආසන්නයේ රැඳීසිටි සිංහල ගම්වාසීන් පිරිසක් තමන් යන්නේ කොහේදැයි විමසූ බවත් ඡන්දය ප්‍රකාශ කිරීමට යන බව පැවසූ විට "දෙමළ ජනතාවට ඡන්දය අයිතියක් නොමැති බවත් ඡන්දය භාවිතා කිරීමට උත්සාහ කළහොත් පහරදෙන ලෙස තම ප්‍රධානියා උපදෙස් දී ඇති බවත්" පැවසූ බව ප්‍රකාශ කරන ලදී. එම හේතුවෙන් තමන් ඇතුලු කණ්ඩායම පහරදීමක් සිදුවේ යැයි බියෙන් ආපසු ගිය බවත් තමන් මෙම සිදුවීම සම්බින්ධයෙන් විදුලි සංදේශයක් මගින් ලංකා ඉන්දීය කම්කරු කොංග්‍රසයේ දිස්ත්‍රික් කමිටුවේ සභාපතිට දැනුම්දුන් බවත් පැවසීය. එහි ප්‍රතිඵලයක් ලෙස පස්වරු 4.30 ට පමණ පොලිස් නිලධාරීන් පිරිසක් පැමිණ ඡන්දය භාවිතා කිරීමට යන ලෙස උපදෙස් දුන් බව ප්‍රකාශ කළ පරමානන්දන් එහිදී බොහෝ දෙනෙක් බිය නිසා ඡන්දය භාවිතා කිරීමට යාමට අකමැත්ත පලකළ බව පැවසීය. එසේ ඡන්දය ප්‍රකාශ කිරීමට ගිය පිරිසටද ඡන්ද මධ්‍යස්ථානය අසල බේකරිය ආසන්නයේ සිටි පිරිසක් ගල් ප්‍රහාරයක් එල්ලකල බවද පැවසීය. තමන් මෙම මැතිවරණයේදී පෙත්සම්කාර පැල්පොල ට සහයෝගය දීමට තීරණය කළ නිසා මෙම වතුයායේ සහ යාබද වතුවල කම්කරුවන් බොහෝ දෙනෙක් පැල්පොලට ඡන්දය ලබාදීමට කටයුතු කළ බව පැවසූ පරමනාදන් ප්‍රකාශ කළේ සිදුවූ බියගැන්වීම් නිසා බොහෝ දෙනෙකුට ඡන්දය භාවිතා කිරීමට නොහැකි වූ බවයි.

සාමාන්‍ය බියගැන්වීම් පිළිබඳව මෙම කරුණු වගඋත්තරකරු විසින් පෙත්සම් විභාගයේදී අභියෝගයට ලක් කළේ නැත. වගඋත්තරකරුගේ ස්ථාවරය වූයේ තමන් මෙම කරුණු පිළිබඳව දැනගත්තේ ඡන්දය දිනයේ රාත්‍රී කාලයේදී බවත් මෙම සිදුවීම් සම්බන්ධයෙන් තමන්ගේ සම්බන්ධයක් නොමැති බවත්ය. බියගැන්වීම් සහ ඡන්දදායකයන් පලවාහැරීම් පිළිබඳව මෙහෙයවීම් කළ බවට පෙත්සම්කරු විසින් චෝදනාකරන ලද ග්‍රේෂන් නැමති පුද්ගලයා ප්‍රකාශ කරන ලද්දේ චෝදනා කරන ලද වැරදි ඔප්පු කිරීමට පෙත්සම්කරුවන් ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර නොමැති බවයි.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සම විභාගකළ වින්ධම් විනිසුරුවරයා (Windham J.) සිය තීරණය 1048 මාර්තු 12වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

සාමාන්‍ය බියගැන්වීමක් ඔප්පු කිරීම සඳහා ලබාගත් බහුතරය සැලකිල්ලට ගනිමින්, සහ ඡන්ද විමසීමේ ප්‍රබලත්වය, ප්‍රතිඵලයට බලපෑමක් එල්ලවී ඇතැයි පෙත්සම්කරු විසින් සාධාරණ ලෙස පෙන්වාදීම පමණක් ප්‍රමාණවත් වන බව විනිසුරුවරයා සිය තීන්දුව මගින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 77(අ) වගන්තියට අනුව සාමාන්‍ය බියගැන්වීමක් මගින් ඡන්ද ප්‍රතිඵලයට බලපෑමක් වී ඇති බව ඔප්පු වී ඇත. පෙත්සම්කරුගේ දෙවෙනි චෝදනාව වූ වගඋත්තරකරුගේ නියෝජිතයන් විසින් මෙම අයුතු බලපෑම් සිදුකළ බවට සාක්ෂි මෙහෙයවීමක් සිදු නොවූ බව පැවසූ විනිසුරුවරයා. එබැවින් වගඋත්තරකරු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 58(2) වගන්තිය යටතේ අෂක්නුතාවකට ලක් නොවන බව තීරණය කරන ලදී. ඒ අනුව මැතිවරණ ප්‍රතිඵලය අවලංගු කරන ලදී.

### මැතිවරණ විනිසුරුගේ තීරණයේ ප්‍රතිඵලය

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව ගම්පොල මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද ප්‍රතිඵලය අවලංගු වූ බැවින් ගුණවර්ධනගේ මන්ත්‍රීධූරයද අහෝසි විය. ඒ අනුව ගම්පොල මැතිවරණ කොට්ඨාශය සඳහා අතුරු මැතිවරණයක් 1948 මැයි මාසයේදී පවත්වන ලදී. එම අතුරු මැතිවරණයටද ස්ටැන්ලි පැල්පොල ස්වාධීන අපේක්ෂකයකු ලෙස ඉදිරිපත්වූ අතර රත්නකීර්ති සෙනරත් සේරසිංහ ගුණවර්ධන එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින්ද, තවත් අපේක්ෂකයින් 3 දෙනෙකු ස්වාධීනවද තරඟ කරන ලදී. අතුරු මැතිවරණයේ ප්‍රතිඵල අනුව පැල්පොළ ජයග්‍රහණය කර පාර්ලිමේන්තුවට පත්වන ලදී.

## 11.3. දූෂණ ක්‍රියා සිදුකළ බවට චෝදනා කරන පුද්ගලයන්ද මැතිවරණ පෙත්සමක වගඋත්තරකරුවන් ලෙස නම් කළ යුතුය

### විජේවර්ධන එදිරිව සේනානායක
### Wijewardena v. Senenanayake (1971) 74 NLR 97

### පසුබිම

1970 පාර්ලිමේන්තු මැතිවරණයට දැදිගම මැතිවරණ කොට්ඨාශය සඳහා ධර්මසිරි සේනානායක (ශ්‍රී.ල.නි.ප) සහ ඩඩ්ලි සේනානායක

(එ.ජා.ප) තරඟ කරන ලදී . මැතිවරණ ප්‍රතිඵල අනුව ඩඩ්ලි සේනානායක ජයග්‍රහණය කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත්විය. ඡන්ද ප්‍රචාරක ව්‍යාපාරය තුළ දූෂණ සහ අයුතු බලපෑම් සිදුවූ බව ප්‍රකාශ කළ පෙත්සම්කරු ඒ හේතුවෙන් මෙම මැතිවරණය අවලංගු කරන ලෙස ඉල්ලා මැතිවරණ පෙත්සමක් ගොනු කරන ලදී.

## මැතිවරණ පෙත්සම

විජේවර්ධන සිය මැතිවරණ පෙත්සම මගින් 170 මැයි 2 වන දින දූෂණ ක්‍රියා ගනයට ගැනෙන අයුතු බලපෑම් සිදුකළ සිදුවීම් පිළිබඳ වාර්තාවක් සිය පෙත්සමෙහි උපලේඛනයක ඇතුළත් කර තිබිණි. එම උපලේඛනයේ එම අයුතු බලපෑම් සිදුකළ පුද්ගලයන් 6 දෙනාගේ නම්ද සඳහන්ව තිබිණි. නමුත් එම සයදෙනා වගඋත්තරකරුවන් ලෙස නම්කර නොතිබුණි. එම සිදුවීම් මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සිදු නොවූ බැවින් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 80අ වගන්තිය යටතේ මෙම මැතිවරණය අහෝසි කරන ලෙස ඉල්ලා මැතිවරණ පෙත්සම ගොනුකර තිබිණි.

## මැතිවරණ පෙත්සම් විභාගය

මැතිවරණ පෙත්සම් විභාගයේදී මතු වූ ප්‍රධානම කරුණ වූයේ පෙත්සම්කරුගේ පෙත්සම මගින් අයුතු බලපෑම් සිදුකළ බවට චෝදනා නගන පුද්ගලයන්ව පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම් කර නොමැතිවීම මත පෙත්සම නීත්‍යානුකූල ලෙස ගොනු කර තිබේද යන්නයි. වගඋත්තරකරුවන්ගේ තර්කය වූයේ 1970 අංක 9 දරණ සංශෝධන පනත මගින් සංශෝධිත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ්‍ය සභා ආඥාවේ 80අ වගන්තියට අනුව "දූෂණ ක්‍රියා සිදුකළ බවට පෙත්සම මගින් චෝදනා නගන පුද්ගලයන්ව පෙත්සම්කරු විසින් සිය පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස එක්ක කළ යුතුය" යනුවෙන් දැක්වේ.

## මැතිවරණ පෙත්සමේ තීරණය

උගත් මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය වූයේ දූෂණ වරදක් සේ ගැනෙන අයුතු බලපෑම සිදුකළ බවට පෙත්සම මගින් චෝදනා කරන පුද්ගලයන් මැතිවරණ පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස එකතු කිරීම 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 80අ වගන්තියේ අනිවාර්ය අවශ්‍යතාවක් බවයි. ඒ අනුව මැතිවරණ විනිසුරුවරයා විසින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

මැතිවරණ විනිසුරුවරයාගේ තීරණයෙන් තෘප්තිමත් නොවූ පෙත්සම්කරු එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. එහිදී පෙත්සම්කරු තර්ක කරන ලද්දේ පෙත්සම මගින් චෝදනා නැගූ අයුතු බලපෑම් සිදුකළ පුද්ගලයන් මැතිවරණ පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස එක් කිරීම අනිවාර්ය බවට මැතිවරණ විනිසුරුවරයා ලබාදුන් තීරණය දෝස සහිත බවයි.

## අභියාචනා විභාගය

ශ්‍රේෂ්ඨාධිකරණයේදී මෙම අභියාචනය විභාග කරන ලද්දේ අගවිනිසුරු එච්.එන්.ජී.ප්‍රනාන්දු, සිල්වා සහ සිරිමාන්න යන විනිසුරුවරුන් විසිනි. අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාවය මත අගවිනිසුරු එච්.එන්.ජී.ප්‍රනාන්දු විසින් 1971 පෙබරවාරි 26 වන දින අභියාචනා පෙත්සමේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී. දූෂිත ක්‍රියාවන් සිදුකල බවට චෝදනා නගන පුද්ලයන් වගඋත්තරකරුවන් ලෙස එකතු කළ යුත්තතේ එවිට ඔවුන්ට නඩු විභාගයේදී ඉදිරිපත් වී තමන් වෙනුවෙන් විත්තිවාචක ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදිය යුතු නිසා බව අගවිනිසුරුවරයා සිය තීරණය මගින් සඳහන් කරන ලදී. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 80අ(1) වගන්තිය අනුව මැතිවරණයක ප්‍රතිඵලය නිකුත් නිකුත් වී දින 21ක් තුළ චෝදනා ගොනුකරන අතර නොතිසි නිකුත් කිරීමෙන් පසුව උත්තර බැඳීම සඳහා දින 10ක් ලබාදෙන බැවින් එවැනි අවස්ථාවක චෝදනා නගන පුද්ගලයන්ට අධිකරණයේ විත්තිවාචක ඉදිරිපත් කිරීමේ අවස්ථාව හිමිවේ.

මෙහිදී Rajapakse v. Kathirgamanathan (1965)68 NLR 14). නඩුවේදී තම්බයියා විනිසුරුවරයාගේ තීරණය පිළිබඳව සඳහන් කළ විනිසුරුවරයා දූෂණ ක්‍රියා මත ඡන්ද පෙත්සමක් ගෙන එන්නේ නම් ජයග්‍රහණය කළ අපේක්ෂකයා වගඋත්තරකරුවෙකු ලෙස නම් කිරීම අනිවාර්යය බවට තම්බයියා විනිසුරුවරයාගේ තීරණය උපුටා දක්වන ලදී. 1970 වසරේදී 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 80අ වගන්තිය සංශෝධනය කරන ලද්දේ මෙම තීරණය හේතුවෙන් බව පැවසූ විනිසුරුවරයා එකී සංශෝධනයේදී ජයග්‍රහණය කළ අපේක්ෂකයා මෙන්ම දූෂණ ක්‍රියා සිදුකළ බවට පෙත්සම මගින් චෝදනා කරන පුද්ගලයන්ද වගඋත්තරකරුවන් ලෙස එක්කළ යුතු බවට නීතිමය ප්‍රතිපාදන එම සංශෝධනය මගින් ස්ථාපිත කළ බව පැවසීය.

එසේම මැතිවරණ පෙත්සම් විභාගය අතරතුරදී නව වගඋත්තරකරුවන් එකතු කිරීමට අවසරදීමට මැතිවරණ විනිසුරුවරයාට බලයක් නොමැති බවද ප්‍රකාශ කළ අගවිනිසුරුවරයා මැතිවරණ විනිසුරුරයාගේ තීරණයට තමන් ද එකඟවන බව පැවසීය.

ඒ අනුව අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 11.4. බියගැන්වීම ඔප්පු කිරීම සඳහා පෙත්සම සමග දිවුරුම් ප්‍රකාශ අත්‍යවශ්‍ය නොවේ

**අබේවර්ධන එදිරිව ආරිය බුලේගොඩ**
**Abewardhana Vs Ariya Bulegoda- 1985-SLR-86**

### පසුබිම

1983 මැයි 18 වන දින පැවති හක්මන අතුරු මැතිවරණය සඳහා මහින්ද යාපා අබේවර්ධන (එ.ජා.ප), ආරිය බුලේගොඩ (ශ්‍රී,ල.නි.ප), ජේ.එල්.සිරිසේන (ස්වාධීන) සහ පී.රණතුංග (ස්වාධීන) යන අපේක්ෂකයන් තරඟ කරන ලදී (අලවත්තගේ. 2014, 285). ඡන්ද ප්‍රතිඵල අනුව මහින්ද යාපා අබේවර්ධන ඡන්ද 23336ක්ද ආරිය බුලේගොඩ ඡන්ද 21002ක්ද ලබාගන්නා ලදී. අනෙක් අපේක්ෂකයන් දෙදෙනා පිළිවෙලින් 1291ක් සහ 103ක් වශයෙන් ලබාගන්නා ලදී. ඒ අනුව මහින්ද යාපා අබේවර්ධන හක්මන මැතිවරණ කොට්ඨාශයේ ජයග්‍රාහී අපේක්ෂකයා ලෙස තේරී පත්විය.

මැතිවරණ ව්‍යාපාරය තුළදී මහින්ද යාපා අබේවර්ධනගේ නියෝජිතයන් විසින් ඡන්ද දායකයන්ව බිය ගැන්වීම සහ දූෂිත ක්‍රියාවන් වන අයුතු බලපෑම සිදුකිරීමෙන් තමන්ගේ ඡන්ද අඩුවූ බව පවසමින් ආරිය බුලේගොඩ මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

### මැතිවරණ පෙත්සම

මෙම පෙත්සම මගින් ජයග්‍රාහී අපේක්ෂකයා වන මහින්ද යාපා අබේවර්ධන පළවෙනි වගඋත්තරකරු ලෙසත් මැතිවරණ ව්‍යාපාරයේදී ඔහුගේ ආධාරකරුවන් වූ දෙදෙනෙකු දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් ලෙසත් නම්කර තිබිණි.

ආරිය බුලේගොඩ මැතිවරණ පෙත්සම මගින් චෝදනා 2ක් එල්ල කරන ලදී. එනම්,

- ❖ වගඋත්තරකරුවන් විසින් සිදුකරන ලද බියගැන්වීම් හේතුවෙන් බහුතරයක් ඡන්දදායකයන් ඡන්දය භාවිතා කිරීමෙන් වැළකීම හේතුවෙන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 77(අ) වගන්තිය යටතට ගැනෙන ක්‍රියාවක් සිදුකර තිබීම.
- ❖ පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයන් ලෙස කටයුතු කරමින් දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභාවේ ආඥාවේ 55(1) වන වගන්තිය සමග කියවිය යුතු 77(ඇ) වගන්තිය යටතේ සංයුක්ත වන ක්‍රියාවක් සිදුකර තිබීම.

මේ අනුව මහින්ද යාපා අබේවර්ධනගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙස ආරිය බුලේගොඩ සිය මැතිවරණ පෙත්සම මගින් ඉල්ලා තිබිණි.

## මැතිවරණ පෙත්සම් විභාගය

මැතිවරණ පෙත්සම් විභාගයේදී වගඋත්තරකාර පාර්ශවය මූලික විරෝධතාවක් ගොනු කරමින් පෙත්සම්කරු පහත කරුණු මත මෙම පෙත්සම නිශ්ප්‍රභා කරන ලෙස ඉල්ලා සිටින ලදී.

- ▣ තැන්පත් කර ඇති ඇපය ප්‍රමාණවත් නොවන බව
- ▣ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ්‍ය සභා ආඥාවේ 80 (ආ) (ඇ) වගන්තිය අනුව පෙත්සම්කරු පදනම් වන කරුණු වල සංක්ෂිප්තයක් ඇතුළත් කර නොතිබීම,
- ▣ 80ආ((ඇ) වගන්තියේ සඳහන් පරිදි දූෂණ ක්‍රියාවන්ගේ සම්පූර්ණ වාර්තාවක් ඇතුළත් නොවීම,
- ▣ 8ආ (ඇ) වගන්තියේ සඳහන් පරිදි දූෂිත ක්‍රියාවන් පිළිබඳව චෝදනාවන් සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශ ඇතුළත් කර නොතිබීම,
- ▣ 80අ (1) (ආ) වගන්තියට අනුව දූෂිත ක්‍රියාවන් පිළිබඳව චෝදනා නගන පුද්ගලයන්ව වගඋත්තරකරුවන් ලෙස එක් කිරීමට පෙත්සම්කරු අපොහොසත් වීම,

▣ පෙත්සම්කරු විසින් සිය පෙත්සම මගින් දෙවන වගඋත්තරකරු නම්කර ඇත්තේ මනංකල්පිතවය.

උගත් මැතිවරණ විනිසුරුවරයා පෙත්සම්කරුගේ අවසාන මූලික විරෝධතාවය හැර අනෙක් සියලු විරෝධතාවන් ප්‍රතික්ෂේප කරමින් නඩුව විභාග කර තීන්දුව සඳහා තබන ලදී.

## අභියාචන පෙත්සම

මැතිවරණ විනිසුරුවරයාගේ තීරණායට එරෙහිව වගඋත්තරකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරන ලදී.

මෙම අභියාචනය විභාග කරන ලද්දේ විනිසුරු විමලරත්න, විනිසුරු අබ්දුල් කාදර්, සහ විනිසුරු එල්.එච්. ද අල්විස් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අභියාචනා විභාගය අවසානයේදී අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාවය මත විමලරත්න විනිසුරු විසින් 1985 පෙබරවාරි 14වන දින තීරණය ලබාදී තිබිණි.

පෙත්සම්කරු විසින් පෙත්සම මගින් බියගැන්වීම් කිහිපයක්ම විස්තර කර තිබිණි. ඒ අනුව මැර කණ්ඩායමක් පෙත්සම්කරුගේ ජීප් රථයට පහරදී තිබිණි. එසේම මැර පිරිසක් විසින් ඡන්ද මධ්‍යස්ථානයක් අසලදී පෙත්සම්කරුව අයුතු ලෙස රඳවාගෙන තිබිණි. දෙවන සහ තුන්වන වගඋත්තරකරුවන් පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයන් ලෙස ක්‍රියාකරමින් ඡන්දදායකයන් වැළැක්වීම ඡන්දදායකයන් එන මාර්ග අවහිර කිරීම සිදුකර තිබිණි. නම්කරන ලද ග්‍රාම නිලධාරි කොට්ඨාශ 4ක ඡන්ද දායකයන්ව 1වන වගඋත්තරකරුගේ ආධාරකරුවන් විසින් බියගන්වා තිබිණි. වතු ප්‍රදේශවල ඡන්දදායකයන්ව 1වන වගඋත්තරකරුගේ ආධාරකරුවන් විසින් බියගන්වා තිබිණි.

මෙහිදී අධිකරණ විසින් ග්‍රන්ථයේ Rogers on Elections (19th Edition) Vol. 2 p. 521 දැක්වෙන පහත කොටස උපුටා දක්වන ලදී. "මැතිවරණයක නිදහස මැතිවරණයක වලංගුභාවය සම්බන්ධයෙන් පොදු නීතියේ අත්‍යවශ්‍ය අංගයක් වේ. මෙම නිදහස වළක්වන්නේ නම් පොදු නීතියට අනුව එම මැතිවරණය අවලංගු වේ. එබැවින් බියගැන්වීම මගින් අපේක්ෂකයකු හෝ නියෝජිතයකු නිවසට ගෙන නොගියද එම මැතිවරණය අවලංගු වේ".

එසේම මෙහිදී අධිකරණය ප්‍රකාශ කරන ලද්දේ පොදු බියගැන්වීමකදී සොයා බලන්නේ චේතනාව කුමක්ද ක්‍රියාව කුමක්ද යන්න නොවේ ප්‍රතිඵලය කුමක්ද යන්න බවයි.

දූෂිත හෝ නීතිවිරෝධි ක්‍රියාවක් බලය ලබාදීම පිළිබඳව චෝදනාවක් පෙත්සම මගින් නගන්නේ නම් පමණක් දිවුරුම් ප්‍රකාශයක් සමග පෙත්සම ගොනු කළ යුතු බව සඳහන් කළ අධිකරණය පොදු බියගැන්වීමක් පිළිබඳව චෝදනා නැගීමේදී දිවුරුම් ප්‍රකාශයක් අවශ්‍ය නොවන බව පැවසීය.

ඒ අනුව අභියාචනා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

### දොලොස්වන පරිච්ඡේදය

# ඡන්දදායකයන්ට අල්ලස්දීම වැළැක්වීම

ඡන්දයක් නිදහස් සහ සාධාරණ වීමට නම් ඡන්දදායකයන් බාහිර බලපෑම් වලින් තොරව ඡන්දය භාවිතා කිරීමට අවශ්‍ය පරිසරය නිර්මාණය විය යුතුය. මැතිවරණයක් ආසන්නව තිබියදී ඡන්දදායකයන්ට මුදල් හෝ යම් යම් භාණ්ඩ හෝ සේවාවන් සැපයීම මගින් ඔවුන්ගේ කැමැත්ත වෙනස් කළ හැකිය. එය ඡන්දදායකයන්ගේ කැමැත්ත සඳහා කරනු ලබන අයුතු බලපෑමකි. ඡන්දදායකයන්ට අල්ලස් දීම වැළැක්වීම සඳහා මෙන්ම අල්ලස් දීම ඔප්පුවීමකදී අපේක්ෂකයා සම්බන්ධව බලපාන නීති පිළිබඳවත් මැතිවරණ පෙත්සම් වලදී ඡන්දදායකයන්ට අල්ලස්දීම සම්බන්ධව අධිකරණය විසින් ලබාදී තිබෙන නඩු තීන්දු කිහිපයක් පිළිබඳවත් මෙම පරිච්ඡේදය තුළින් විස්තර කරනු ලැබේ.

## 12.1. ඡන්දදායකයන්ට සංග්‍රහ කිරීම සහ අල්ලස්දීම පිළිබඳව පවතින නීතිමය ප්‍රතිපාදන

නිදහස්ව ඡන්දය ප්‍රකාශ කිරීමට නම් කිසිඳු අයුතු බලපෑමක් ඡන්දදායකයන්ට සිදු නොවිය යුතුය. මැතිවරණයක් ආසන්නයේදී ඡන්දදායකයන්ට මුදල් සහ යම් යම් භාණ්ඩ බෙදීම මගින් ඡන්ද දායකයන්ගේ කැමැත්තට බලපෑමක් සිදුකළ හැකිය. එබැවින් එවැනි ක්‍රියාවන් මැතිවරණ නීති මගින් තහනම් කර තිබේ.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 78 වගන්තියේ මෙසේ දැක්වේ. "මැතිවරණයකට පෙර, මැතිවරණයක් පවත්වනු ලබන අතරතුර හෝ මැතිවරණයකින් පසු තමා විසින් හෝ වෙනත් යම් තැනැත්තකුගේ මාර්ගයෙන් යම් තැනැත්තකුට හෝ ඒ තැනැත්තා

උදෙසා හෝ ඒ තැනැත්තාගේ හෝ වෙනත් යම් තැනැත්තකුගේ ඡන්දය ඒ මැතිවරණයෙහි දී දීමට හෝ දීමෙන් වැළකී සිටීමට දූෂිත ලෙස බලපෑමේ කාර්යය සඳහා නැතහොත් ඒ මැතිවරණයෙහි දී එබඳු යම් තැනැත්තකුගේ හෝ වෙනත් යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකීමට සූදානම්ව සිටීම නිසා කෙළින්ම හෝ අන් අයුරකින් යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයන් දෙන හෝ සපයන නැතහොත් දීමට හෝ සැපයීමට සලස්වන හෝ දීමෙහි හෝ සැපයීමෙහිලා ආධාර වන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට සලස්වන නැතහොත් යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබා ගත හැකි වනු පිණිස යම් මුදලයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් ඉහත සඳහන් පරිදි දෙන හෝ සපයන නැතහොත් දීමෙහි හෝ සැපයීමෙහිලා ආධාර වන නැතහොත් දීමේ හෝ සැපයීමේ වියදම් සම්පූර්ණයේම හෝ ඉන් කොටසක් ගෙවන හෝ ගෙවීමට පොරොන්දුවන සෑම තැනැත්තකු ම සහ එවැනි යම් කෑමක්, බීමක් හෝ අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් නැතහොත් එවැනි යම් මුදලක් හෝ බලපත්‍රයක් දූෂිත ලෙස භාර ගන්නා හෝ ලබා ගන්නා නැතහොත් එවැනි යම් කෑමක්, බීමක්, අන්නපානයක් හෝ ආහාර ද්‍රව්‍යයක් ලබාගත හැකිවනු පිණිස එවැනි වෙනත් මාර්ගයක් හෝ උපක්‍රමයක් යොදා ගන්නා සෑම ඡන්ද හිමියකුම සංග්‍රහ කිරීමේ වරදට වරදකරු විය යුතුය"

එසේම 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 80 වගන්තියේ දැක්වෙන්නේ

පහත සඳහන් තැනැත්තන් එනම් -

(අ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා, තමා විසින් ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, යම් ඡන්ද හිමියකුට හෝ ඡන්ද හිමියකු සඳහා නැතහොත් යම් ඡන්ද හිමියකු වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිස්ඨාවක් දෙන, ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟවන, හෝ පොරොන්දු වන නැතහොත් ලබාදීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ පනත යටතේ වූ යම් මැතිවරණයක දී ඒ ඡන්ද හිමියා ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම හේතුකොට ගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකුම,

(ආ) ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීටම යම් ඡන්ද හිමියකු පෙළඹවීම සඳහා තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින්, ඒ ඡන්ද හිමියාට හෝ ඡන්ද හිමියා, සඳහා හෝ යම් ඡන්ද හිමියකු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා නැතහොත් වෙනත් යම් තැනැත්තකුට හෝ නැතැත්තකු සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් යම් නිලයක්, තනතුරක් නැතහොත් දීමට හෝ ලබා දීමට එකඟවන හෝ ඉදිරිපත්වන හෝ පොරොන්දුවන හෝ ලබා දීමට හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට පොරොන්දු වන නැතහොත් මේ පනත යටතේ වූ යම් මැතිවරණයකදී යම් ඡන්ද හිමියකු ඡන්දය දී තිබීම හෝ දීමෙන් වැළකී සිටීම හේතුකොටගෙන ඉහත කී එවැනි යම් ක්‍රියාවක් දූෂිත ලෙස කරන සෑම තැනැත්තකුම,

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස යම් තැනැත්තකු තෝරාපත් කර ගැනීමේ හෝ මේ පනත යටතේ වූ යම් මැතිවරණයකදී යම් ඡන්ද හිමියකු ගේ ඡන්දය හෝ ලබාදීම සිදු කිරීමට හෝ සිදු කිරීමෙහිලා උත්සහා කිරීමට යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් හෝ ඒ තැනැත්තාට හෝ ඒ තැනැත්තා සඳහා කෙළින්ම හෝ අන් අයුරකින් ඉහත කී පරිදි එවැනි යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදිමක් හෝ ගිවිසුමක් දෙන හෝ කරන සෑම තැනැත්තකුම,

(ඈ) එවැනි යම් තෑග්ගක්, ණයක්, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක් හෝ ගිවිසුමක් ලැබුණ විටක නැතහොත් එවැනි යම් තෑග්ගක, ණයක, යෝජනාවක්, පොරොන්දුවක්, ලබාදීමක හෝ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස යම් තැනැත්තකු තෝරා පත් කර ගැනීම හෝ මේ පනත යටතේ වූ යම් මැතිවරණයක දී යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ලබාදීම සිදු කරන හෝ සිදු කිරීමෙහි යෙදෙන හෝ සිදු කිරීමෙහිලා පොරොන්දුවන වන නැතහොත් උත්සාන කරන සෑම තැනැත්තකුම,

(ඉ) මේ පනත යටතේ වූ යම් මැතිවරණයකදී අල්ලස් වශයෙන් යම් මුදලක් හෝ එහි යම් කොටසක් වියදම් කළ යුතුය යන චේතනාවෙන් වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය පිණිස ඒ මුදල හෝ එහි යම් කොටස කලින් දෙන, ගෙවන හෝ ගෙවීමට සලස්වන නැතහොත් ඒ මැතිවරණයේ දී අල්ලස්

වශයෙන් වියදම් කරන ලද යම් මුදලක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් නිදහස් කිරීම හෝ ආපසු ගෙවීමට සඳහා දැන දැනම යම් තැනැත්තකුට යම් මුදලක් ගෙවන හෝ ගෙවීමට සලස්වන සෑම තැනැත්තකුම,

(ඊ) මේ පනත යටතේ වූ යම් මැතිවරණයකට පෙර හෝ මැතිවරණයක් පවත්වනු ලබන අතරතුර, ඒ මැතිවරණයේ දී ඡන්දය දීම හෝ ඡන්දය දීමට එකඟවීම නැතහොත් ඡන්දය දීමෙන් වැළකී සිටීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම එකඟවීම හේතුකොට ගෙන තමා සඳහාම හෝ වෙනත් යම් තැනැත්තකු සඳහා යම් මුදලක්, තෑග්ගක්, ණයක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක්, නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළින්ම හෝ අනු අයුරකින් ලබා ගන්නා හෝ ලබා ගැනීමට එකඟ වන හෝ ඒ සඳහා ගිවිසුමක් ඇති කරන ගන්නා සෑම ඡන්ද හිමියකුම,

(උ) මේ පනත යටතේ වූ යම් මැතිවරණයකින් පසු, ඒ මැතිවරණයේදී යම් තැනැත්තකු ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීම නැතහොත් ඡන්දය දීමට හෝ ඡන්දය දීමෙන් වැළකී සිටීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවා තිබීම හේතුකොට ගෙන යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළින්ම හෝ අන් අයුරකින් ලබා ගන්නා සෑම තැනැත්තකුම,

(ඌ) මැතිවරණයක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට ඡන්දය දීම හෝ ඡන්දය දී තිබීම හෝ ඡන්දය දීමට එකඟව සිටීම හේතුකොට ගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන්, නැතහොත් මැතිවරණයක දී යම් පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට සහාය වී තිබීම හෝ සහය වීමට එකඟව සිටීම හේතුකොට ගෙන හා ඒ සඳහා වූ ගෙවීමක් වශයෙන් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කරන ලෙස හෝ ණයට දෙන ලෙස නැතහොත් යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් තෑගි කිරීමට හෝ ණයට දීමට පොරොන්දුවන ලෙස තැනහොත් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් ලබා දෙන ලෙස නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් ලබා දීමට පොරොන්දු වන ලෙස ඒ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නැතහොත් ඔහුගේ නියෝජිතයා හෝ නියෝජිතයන් වෙත තමා විසින්ම හෝ තමා වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මගින් කෙළන්ම හෝ අන් අයුරකින් ඉල්ලුම් කරන සෑම තැනැත්තකුම,

(ඒ) අපේක්ෂකයකු ලෙස නාම යෝජනා ලැබීමට හෝ අපේක්ෂකයකු වීමෙන් වැළකී සිටීම හෝ අපේක්ෂකයකු වීමෙන් වැළකී සිටීමට හෝ අපේක්ෂකයකු වී ඇත්නම් ඉල්ලා අස්වීමට හෝ එකඟ වන ලෙස වෙනත් යම් තැනැත්තකු පෙළඹවීම සඳහා තමා විසින්ම හෝ අන් අයුරකින් ඒ වෙනත් තැනැත්තාට යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දෙන හෝ ලබා දෙන නැතහොත් යම් නිලයක්, තනතුරක් හෝ සේවා නියුක්තියක් දීමට හෝ ලබා දීමට එකඟ වන නැතහොත් ලබාදීමට හෝ ලබාදීම පිණිස උත්සාහ කිරීමට ඉදිරිපත් වන හෝ පොරොන්දු වන නැතහොත් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා හෝ ඒ වෙනත් තැනැත්තාට හෝ ඒ වෙනත් තැනැත්තා සඳහා හෝ ඒ වෙනත් තැනැත්තා වෙනුවෙන් යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සඳහා යම් මුදලක් හෝ වටිනා ප්‍රතිෂ්ඨාවක් දෙන හෝ ණයට දෙන නැතහොත් දීමට හෝ ණයට දීමට එකඟ වන නැතහොත් ලබාදීමට හෝ ලබා දීම පිණිස උත්සාහ කිරීමට ඉදිරිපත්වන හෝ පොරොන්දු වන සෑම තැනැත්තකුම අල්ලස් වරදට වරදකරු ලෙස සැලකිය යුතුය.

පනතේ 81 වගන්තියේ දැක්වෙන්නේ මෙවැනි වරදට වරදකරු වන සෑම තැන්ත්තෙකුම දූෂණ ක්‍රියාවකට වරදකරු වන අතර එවැනි තැනැත්තකු රුපියල් පස්සියක් දක්වා දඩ සහ වසරක් දක්වා සිරදඬුවම් ලබාදිය හැකි බවයි. එයට අමතරව මෙවැනි වරදට වරදකරු වන පුද්ගලයකුට වසර 7ක් දක්වා කාලයකට ඡන්දය ප්‍රකාශ කිරීම හෝ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීටම නුසුදුස්සෙකු වේ. එසේම පාර්ලිමේන්තු මන්ත්‍රිවරයකු ලෙස සිටින තැනැත්කු මෙම වරදට වරදකරු වුවහොත් එම තැනැත්තාගේ මන්ත්‍රීධූරය අහෝසි වේ.

මෙම ප්‍රතිපාදනයට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 79 වගන්තිය තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 81 වගන්තිය තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකරය) 82(ඇ) යන වගන්ති වලද දක්නට ලැබේ, එසේම 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ඡන්ද පෙත්සම් පිළිබඳව ප්‍රතිපාදන දක්වා ඇති කොටසේ 91 වගන්තියේ දැක්වෙන්නේ "අපේක්ෂකයකු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත්කර ගනු ලැබීම, යම් දූෂණ හෝ නීති විරෝධී ක්‍රියාවකට ඔහු වරදකරු වීම නිසා නිෂ්ප්‍රභ වන්නේය"
එසේම එහි 92 (1) වගන්තියේ දැක්වෙන්නේ දූෂණ ක්‍රියාවක් හේතුවෙන් මැතිවරණ ප්‍රතිඵලයට බලපෑමක් සිදුවූ බවට මැතිවරණ

විනිසුරුවරයා සෑහීමකට පත්වන්නේ නම් එම මැතිවරණය නිශ්ප්‍රභ කළ හැකි බවයි, එසේම 92(2) වගන්තියේ දැක්වෙන්නේ අපේක්ෂකයා විසින් නැතහොත් ඔහුගේ දැනුම හෝ කැමැත්ත ඇතිව හෝ අපේක්ෂකයාගේ යම් නියෝජිතයකු විසින් මැතිවරණ සම්බන්ධයෙන් දූෂණ හෝ නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකරන ලද බව ඔප්පු වූ විට ඡන්ද පෙත්සමකදී එකී මන්ත්‍රීවරයාගේ ධූරය අහෝසි කිරීමට මැතිවරණ විනිසුරවරයා ක්‍රියාකළ යුතු බවයි.

මෙම ප්‍රතිපාදනයට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 90, 91(අ) වගන්ති තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 91(1), 92(1) සහ 92(2)(අ) වගන්ති තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකරය) 82(ග) සහ 82(ච)(1) යන වගන්ති තුළද දක්නට ලැබේ.

## 12.2. නිදහස් සහ සාධාරණ මැතිවරණය මෙන්ම නියඟයට මුහුණදීම සඳහා ක්ෂණික අවශ්‍යතා ඉටුකරන සේවාවන්ද ක්‍රියාත්මක විය යුතුය.

**වසන්ත ජයලත් සහ තවත් අය එදිරිව වෛද්‍ය නිහාල් ජයතිලක ලේකම් ආර්ථික සංවර්ධන අමාත්‍යංශය සහ තවත් අය**

Wasantha Jaylath & Others V. Dr, Nihal Jayathilake & Others – SCFR/ 258/2014 S.C.M.-12.09.2014

### පසුබිම

ඌව පළාත් සභා මැතිවරණය සැප්තැම්බර් 20 වන දිනට නියමිතව තිබිණි. එම කාලයේ දිවයින පුරාම දැඩි නියඟයක් දක්නට ලැබිණි. ආර්ථික කටයුතු අමාත්‍යංශය මොණරාගල දිස්ත්‍රික්කය සඳහා වියළි සහන ලබාදීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී. මැතිවරණ කොමසාරිස්ගේ M/PCE.2014/02 සහ 2014 සැප්තැම්බර් 9 දින දරණ ලිපිය මගින් මෙම සහනාධාර බෙදීමේ වැඩසටහන මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණයකට බාධා වන බැවින් මැතිවරණය පවත්වන සැප්තැම්බර් 20 වන දක්වා කල් දමන ලෙස දැනුම් දෙන ලදී.

මේ හේතුවෙන් මොණරාගල පදිංචිකරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුවන බව පවසමින් පෙත්සම්කරුවන් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

2014 සැප්තැම්බර් 10 වන දින එනම් ඉහත කී මැතිවරණ කොමසාරිස්වරයාගේ ලිපියට පසු දින ගොනු කරන ලද මෙම පෙත්සම පෙත්සම්කරුවන් 5 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අතර ඔවුන් සියලුම දෙනා මොණරාගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් ලෙස හඳුන්වා දී තිබිණි. පෙත්සම මගින් වගඋත්තරකරුවන් කර තිබුණේ පිළිවෙලින් ආර්ථික කටයුතු අමාත්‍යංශයේ ලේකම්වරයා, මොණරාගල දිස්ත්‍රික් ලේකම්වරයා සහ ගරු නීතිපතිවරයාය. තමන් සහ තමන්ගේ පවුලේ අය මොණරාගල දිස්ත්‍රික්කයේ පදිංචිව සිටින අතර දැඩි නියඟය නිසා ගොවිතැන් හානි වී දැඩි දුෂ්කරතාවයකට පත්ව සිටින බවත් ඒ අතරතුර ආර්ථික කටයතු අමාත්‍යංශය විසින් දීපව්‍යාප්තව නියඟයට ලක්වූ අයට සහනාධාර පිරිනැමීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව පුවත්පත් මගින් දනගැනීමට ලැබී ඇති බවත් ප්‍රකාශ කළ ඔවුන් තමන් නොදන්නා හේතුවක් මත එම වැඩසටහන මොණරාගල දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම අත් හිටුවා ඇති බව දැනගැනීමට ඇති බව මෙම පෙත්සම මගින් ඔවුන් දක්වා සිටින ලදී. ඒ හේතුවෙන් සහනාධාර නොමැතිව තමන් ඇතුලු මොණරාගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් දැඩි අපහසුතාවකට ලක්වී ඇති බවත් මෙම ක්‍රියාකාරීත්වය හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යව්‍යවස්ථාවේ 12(1) සහ 12(2) ව්‍යවස්ථා මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවී ඇති බව ප්‍රකාශ කරන ලදී. එකී මූලික අයිතිවාසිකම් උල්ලංඝනයට 1 සහ 2 වගඋත්තරකරුවන් වගකිවයුතු බවත් ප්‍රකාශ කළ පෙත්සම් කරුවන්, පෙත්සමේ 1 සහ 2 වගඋත්තරකරුවන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 12(2) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන ලද බවට ප්‍රකාශයක්ද, මොණරාගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන්ට වියළි සහනාධාර ලබාදෙන ලෙස 1 හා 2 වගඋත්තරකරුවන්ට නියෝග කරන ලෙසත් නඩුව විභාග කර අවසන් කරන තෙක් වියළි සහනාධාර ලබාදීමේ අතුරු නියෝගයක්ද නිකුත් කරන ලෙස මෙම පෙත්සම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ලදී,

## මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය

2014 සැප්තැම්බර් 10 වනදින ඉදිරිපත්වූ මෙම පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු මොහාන් පීරිස් සහ ජනාධිපති නීතිඥ අලුවිහාරේ ජනාධිපති නීතිඥ ජයවර්ධන යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. කඩිනමින් පෙත්සම විභාග කළ අධිකරණ සිය තීරණය 2014

සැප්තැම්බර් 12 වන දින ලබාදෙන ලදී. අනෙක් විනිසුරුවරුන්ගේ එකඟතාව මත තීරණය ලබාදුන්නේ අගවිනිසුරු මොහාන් පීරිස් විසිනි.

නියඟය නිසා ඇතිවී ඇති ජල හිඟය හේතුවෙන් පෙත්සම්කරුවන්ට කිසිඳු කෘෂිකාර්මික කටයුත්තක් සිදුකිරිමට නොහැකිවී ඇති බව නිරීක්ෂණය කළ අධිකරණය මේ හේතුවෙන් ඔවුන් දැඩි දුෂ්කරතාවයකට භාජනය වී ඇති බව පිළිගන්නා ලදී. එසේම දිවයින පුරා ක්‍රියාත්මක වන වැඩසටහනක් මොණරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක නොවීම මගින් එය 12වන ව්‍යවස්ථාව සමග ගැටීමක් ඇති බවත් නිරීක්ෂණය කරන ලදී.

තුන්වන වගඋත්තරකාර නීතිපතිවරයා වෙනුවෙන් ඉදිරිපත් වූ උගත් රජයේ නීතිඥ ප්‍රකාශ කරන ලද්දේ මෙම දිනවල ප්‍රකාශයට පත් කර ඇති ඌව පළාත් සභා මැතිවරණය මොණරාගල දිස්ත්‍රිකයට අදාළව පැවැත්වෙන බැවින් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සහතික කිරීම සඳහා මැතිවරණ කොමසාරිස් විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ වියළි සහනාධාර බෙදා දීම නවත්වා ඇති බවයි. ඒ අනුව මැතිවරණ කොමසාරිස්ගේ M/PCE.2014/02 සහ 2014 සැප්තැම්බර් 9 දින දරණ ලිපිය අධිකරණයට ඉදිරිපත් කරන ලදී. විශේෂයෙන්ම ඇතැම් අපේක්ෂකයන්ට මෙම වියළි සහනාධාර බෙදීමේ වැඩපිළිවෙල මගින් අයුතු වාසියක් අත් කරගැනීමට හැකිවීම මෙසේ එම වැඩපිළිවෙල නැවැත්වීමට හේතුව බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මේ පිළිබඳව අගවිනිසුරුවරයාගේ මතය වූයේ මැතිවරණයක නිදහස් සහ සාධාරණ බව මෙන්ම වියළි කාලගුණය නිසා ඇතිවන හදිසි අවශ්‍යතා සඳහා සහනාධාර ලබාදීමද අත්‍යවශ්‍ය වන බවයි. ඒ අනුව අධිකරණය සිය තීන්දුව මගින් දැනුම් දුන්නේ සහනාධාර බෙදාහැරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පමණක් සිදුකළ යුතු බවයි. එසේම කිසිඳු අවස්ථාවකට මෙම මැතිවරණයේ අපේක්ෂකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ දේශපාලනඥයන් එයට සම්බන්ධ නොවිය යුතු බවයි. මෙම පිරිස් වියළි සහනාධාර බෙදාදීමේ වැඩසටහන සඳහා සම්බන්ධ නොවන බවට පළවෙනි වගඋත්තරකාර ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ලේකම්වරයා සහතික විය යුතු බවද දක්වන ලදී. එසේම වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාට පළවෙනි වගඋත්තරකරු විසින් තොරතුරු සැපයිය යුතු බවද නියෝග කරන ලදී. නීතියෙන් නියමකර ඇති ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට අවශ්‍ය නියෝග නිකුත් කිරීමට

මැතිවරණ කොමසාරිස්වරයාට නියම කළ අධිකරණය නීතිපතිවරයා වෙනුවෙන් සහභාගී වූ රජයේ අධිනීතිඥයාට නියෝග කළේ මැතිවරණ කොමසාරිස්වරයා වෙත මෙම තීරණය සංනිවේදනය කරන ලෙසයි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ක්‍රියාත්මක වීම

මෙම තීන්දුවෙන් පසුව 2014 සැප්තැම්බර් 15 වන දින ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලිපියක් නිකුත් කළ පළවෙනි වගඋත්තරකරු දැනුම් දුන්නේ වියළි සහනාධාර බෙදා දීමේ වැඩ පිළිවෙල නැවත ආරම්භ කරන ලෙසයි. එසේම මෙම කටයුතු සඳහා ආර්ථික සංවර්ධන නිලධාරී, දිවිනැගුම සංවර්ධන නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරී සහ ග්‍රාම නිලධාරී සම්බන්ධ කරගන්නා ලෙස දැනුම්දෙන ලදී. එසේම මෙම බෙදා හැරීම් 2014 සැප්තැම්බර් 16 වන දින සිදුකරන ලෙසත් 17 වන දින සමාලෝචනයක් සිදුකර වාර්තාවක් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමුකරන ලෙසත් යම් කිසිවකුට සහනාධාර නොලැබී ඇත්නම් ඉදිරි දිනවලදී බෙදාහැරීම් සිදුකරන ලෙසත් දැනුම්දෙන ලදී.

ඒ අනුව වියළි සහනාධාර ලෙස රුපියල් 2500ක් ලබාදීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන ලදී. 2014 සැප්තැම්බර් 16 වන දින මැතිවරණ කොමසාරිස්වරයා පළවෙනි සහ දෙවන වගඋත්තරකරුවන් වෙත ලිපියක් මගින් දන්වා සිටින ලද්දේ අදාළ සහනාධාර බෙදීමේ කටයුතු ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයට අනුකූලව සිදු නොවන බව නිරීක්ෂණය වී ඇති බැවින් වහාම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අනුකූලව කටයුතු කිරීමටත් වියළි සහනාධාර බෙදීමේ වැඩසටහන කිසිදු දේශපාලන පක්ෂ අපේක්ෂයකු ප්‍රවර්ධනය සඳහා යොදා නොගැනීමට සියලු නිලධාරීන්ටත් පොලිස් නිලධාරීන්ටත් උපදෙස් ලබාදෙන ලෙස දන්වන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයෙන් පසුව ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් වෛද්‍ය නිහාල් ජයතිලක (1වන වගඋත්තරකරු) විසින් 2014 සැප්තැම්බර් 15 දින සහ MED/sec/02 දරණ ලිපිය මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමුකර තිබිණි. "නියඟයෙන් පීඩාවට පත් ජනතාවට හදිසි සහන සැලසීම" යනුවෙන් ශීර්ෂ ගත කර තිබූ එම ලිපියේ සඳහන් වූයේ 2014.09.04 දින ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව

මොණරාගල කිසිදු බේදයකින් තොරව දිස්ත්‍රික්කයේ සියලුම පවුල්වලට නියං සහනාධාරය ලබාදිය යුතු බවත්, ඒ සඳහා තම අමාත්‍යංශයට අයත්වන ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් තිදෙනා වන ආර්ථික සංවර්ධන නිලධාරී, දිවිනැගුම සංවර්ධන නිලධාරී සහ කෘෂිකර්ම පර්යේෂණ සහකාර සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ යටතේ සිටින ග්‍රාම නිලධාරී යන නිලධාරීන් මේ සඳහා යොදාගත යුතු බවත්, සහ එම ආධාර බෙදා හැරීමේ ක්‍රමවේදය පිළිබඳ උපදෙස්ය. ලිපියේ අවසානයේ දැක්වා තිබුණේ "මෙම නියං සහන ලබාදීමේ වැඩසහටන ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයක් මත සිදුකරන කටයුත්තක් බැවින් හා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 6 වන පරිච්ඡේදයේ 27(8) වගන්තිය ප්‍රකාරව සිදුකරන කාර්යයක් බැවින් මෙම කාර්ය දැඩි කැපවීමකින් හා ඉහල ප්‍රමුඛතාවයකින් සිදුකරීමට අවශ්‍ය කටයුතු ඔබ විසින් සිදුකරනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි" යනුවෙනි.

## 12.3. මැතිවරණයකදී රාජ්‍ය දේපළ අවභාවිතය පිළිබඳව විගණනය කළ යුතුය

**පැෆ්රල් සහ රෝහණ හෙට්ටිආරච්චි එදිරිව මහින්ද දේශප්‍රිය- මැතිවරණ කොමසාරිස් සහ තවත් අය**

PAFFREL & Rohana Hettiarachchi v. Mahinda Deshapriya & 8 Others S.C.(F/R) Application No:76/2015- 05.05.2016

**පසුබිම**

2015 ජනවාරි 8 වන දින පවත්වන ලද ජනාධිපතිවරණය සඳහා එවකට බලයේ සිටි ජනාධිපති මහින්ද රාජපක්ෂ අපේක්ෂකයකු ලෙස තරඟ කරන ලදී. මැතිවරණය ආසන්නයේදී රජයේ විවිධ අමාත්‍යංශ සහ ආයතන මගින් සුවිශේෂී සහනාධාර ක්‍රියාවලීන් සිදුකර තිබිණි. තම අපේක්ෂකයාට ඡන්දය ලබාගැනීමේ අපේක්ෂාවෙන් පොදු දේපළ මැතිවරණ කටයුතු සඳහා උපයෝගී කරගැනීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නීතිය ඉදිරියේ සමානාත්මතාව උල්ලංඝනය වූ බව පවසමින් පැෆ්රල් සංවිධානය මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

2015 මාර්තු 14 වන දින ගොනුකරන ලද මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමේ පෙත්සම්කරුවන් වූයේ පැෆ්රල් සංවිධානය සහ එහි විධායක අධ්‍යක්‍ෂක රෝහණ හෙට්ටිආරච්චිය. පෙත්සම මගින් මැතිවරණ කොමසාරිස්, විගණනකාධිපති, පොලිස්පති, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්‍ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්‍ෂක ජනරාල්, හිටපු ජනාධිපති ලේකම් (මැතිවරණය පවත්වන අවස්ථාවේදී) සහ නීතිපතිවරයා 1 සිට 9 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28(ඈ) ව්‍යවස්ථාවේ ඇතුළත්ව තිබෙන පොදු දේපළ ආරක්‍ෂා කිරීමට සෑම පුද්ගලයකුටම තිබෙන වගකීම පිළිබඳව අවධාරණය කළ පෙත්සම්කරුවන් පෙත්සම මගින් පෙන්වා දුන්නේ 2015 ජනවාරි 8 වන දින පැවති මැතිවරණයේදී පහත සිදුවීම් නිරීක්‍ෂණය කළ බවයි.

- ❖ නීතියේ ප්‍රතිපාදන මගහරිමින් පොදු දේපළ භාවිතා කිරීම.
- ❖ පොදු දේපළ අයතා පරිහරණය.
- ❖ පොදු දේපළ අයතා පරිහරණය වැළැක්වීම සඳහා කටයුතු කළ යුතු රාජ්‍ය ආයතන ක්‍රියා නොකිරීම.
- ❖ පොදු දේපළ අයතා පරිහරණය වැළැක්වීම සඳහා අදාළ අධිකාරීන් විසින් ලබාදුන් මාර්ගෝපදේශ නොතකා හැරීම.

මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පොදු දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදා ගැනීම වැළැක්වීම සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛනයද පෙත්සම්කරුවන් විසින් මෙහිදී අධිකරණයේ අවධානයට යොමුකරන ලදී.

එමෙන්ම පෙත්සම මගින් පෙත්සම්කරුවන් විසින් පොදු දේපළ අයතා ලෙස මැතිවරණ කටයුතු සඳහා යොදාගත් සිදුවීම් කිහිපයක් විස්තරකර තිබිණි.

ඉන් පළමු කරුණ වූයේ "සිල් රෙදි" බෙදාදීම පිළිබඳව සිදුවීමයි. මීටර් 5ක් පමණ සුදු රෙද්දක් ජනාධිපතිවරණයට ඉදිරිපත් වන අපේක්‍ෂකයකු පිළිබඳව සඳහන් වන අත් පත්‍රිකාවක් සමග පැකට් කර බෙදාහැර තිබෙන බවත් එවැනි කට්ටල ලක්‍ෂ 8ක් පමණ බෙදාහැර

ඇති බවත් ඒ සඳහා වියදම දළ වශයෙන් මිලියන 100ක් පමණ වන බවත් පෙත්සම මගින් දක්වා තිබිණි. එසේම පෙත්සම්කරුවන් මේ පිළිබඳව බුද්ධ ශාසන අමාත්‍යංශයෙන් විමසූ විට ඒ සඳහා අරමුදල් අමාත්‍යංශයෙන් නොව අරලියගහ මන්දිරයෙන් ලබාදී ඇති බව ප්‍රකාශ කර ඇති බවත් පෙත්සමේ දක්වා තිබිණි. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සහ මූල්‍ය රෙගුලාසි උල්ලංඝනයක් බවද පෙත්සමේ සඳහන් විය. එසේම මෙම සිල්රෙදි බෙදීම නිදහස් සහ සාධාරණ මැතිවරණයට බාධාවක් බවත් පොදු දේපළ මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීමක් බවත් සඳහන් කරමින් ඒ පිළිබඳව පැමිණිලි සහකාර මැතිවරණ කොමසාරිස්වරයකුට සිදුකළ  බවද පෙත්සමේ සඳහන් විය.

පෙත්සමේ දැක්වූ දෙවන සිදුවීම වූයේ ජනාධිපති අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා ලිත් මුද්‍රණය කර බෙදා හැරීමයි. මේ පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ බවද පෙත්සම් කරුවන් ප්‍රකාශ කර සිටින ලදී. මෙම සිල් රෙදි සහ ලිත් ලබාදීම අල්ලස් පනතේ 70 වගන්තිය යටතේ වන දූෂණය නැමති වරද සංයුක්ත වන ක්‍රියාවක් බවද ඔවුන් දක්වා සිටින ලදී.

එසේම මාර්ග සංවර්ධන අධිකාරියේ, මධ්‍යම සංස්කෘතික අරමුදලේ, වරාය අධිකාරියේ සේවකයන් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා යොදවා ගෙන තිබූ බවට කරුණු ඉදිරිපත් කරන ලදී. මෙම සිදුවීම් සම්බන්ධව පෙත්සම්කරුවන් අදාළ බලධාරීන්ට පැමිණිලි කළද එම ක්‍රියාවන් වැළැක්වීම සඳහා කටයුතු නොකළ බව ප්‍රකාශ කළ පෙත්සම්කරුවන් ඒ හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ සඳහන් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව ප්‍රකාශ කරන ලදී, ඒ අනුව

- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමේ සඳහන් එක් වගඋත්තරකරුවෙකු හෝ වැඩි දෙනෙකු විසින් උල්ලංඝනය කර ඇති බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත්,
- ❖ 2015 ජනාධිපතිවරණයේ දී මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා පොදු දේපළ යොදාගත් පුද්ගලයන්ට එරෙහිව අපරාධ විනය  හෝ වෙනත් නීතිමය පියවර ගන්නා ලෙස වගඋත්තරකරුවන්ට නියෝග කරන ලෙසත්,

- ❖ පෙත්සම මගින් දක්වා තිබෙන සිදුවීම් සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස 1වෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට නියෝගයක් නිකුත් කරන ලෙසත්,
- ❖ අදාළ සිදුවීම් සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් (4 වගඋත්තරකරු) සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් (5 වන වගඋත්තරකරු) වෙත නියෝග කරන ලෙසත්,
- ❖ පෙත්සමේ විස්තර කර ඇති පොදු දේපළ අයතා පරිහරණයේ පාඩුව තක්සේරු කර වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස මුදල් අමාත්‍යංශයේ ලේකම් (6වන වගඋත්තරකරු) සහ විගණකාධිපති (7 වන වගඋත්තරකරු) වෙත නියෝග නිකුත් කරන ලෙසත් අධිකරණයෙන් අයැද සිටින ලදී.

## පෙත්සම් විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු කේ.ශ්‍රීපවන් සහ අනිල් ගුණරත්න යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. පෙත්සම් විභාගයේදී 1 සිට 5 දක්වා සහ 7 සහ 9 වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරල්වරයා අධිකරණය හමුවේ ප්‍රකාශ කරන ලද්දේ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවට සහ අධිකරණයට ඉදිරිපත් කරන බවයි. එම වාර්තාව එදින සිට සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරන බවද දැනුම්දෙන ලදී.

ඒ අනුව පෙත්සම්කරුවන්ගේ නීතිඥවරයා විසින් මෙම නඩුව ඉදිරියට ගෙන යාමට අපේක්ෂා නොකරන බව අධිකරණයට දැනුම්දීම නිසා නඩුවේ කටයුතු අවසන් කරන ලදී.

## අධිකරණ ක්‍රියාමාර්ගයන්ගෙන් පසුව

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් අවධාරණය කරන ලද සිල් රෙදි බෙදීම සම්බන්ධයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වූ බැසිල් රාජපක්ෂ සහ විදුලි සංදේශ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජනරාල් වශයෙන් කටයුතු කළ අනුෂ පැල්පිට යන දෙදෙනාට එරෙහිව නීතිපති වරයා විසින් අංක HC 8086/2015 දරණ මහාධිකරණ නඩුව පවරණ ලද අතර 2017 සැප්තැම්බර් 07 මහාධිකරණය විසින් ඔවුන් දෙදෙනාම වරදකරුවන් කරන ලද අතර එම තීරණයට එරෙහිව සිදුකරන ලද අභියාචනයේදී 2020 නොවැම්බර් 19 වන දින අභියාචනාධිකරණය විසින් දෙදෙනාම නිදොස් කොට

නිදහස් කරන ලදී (CA 413-414 2017 - C.A.M.19.11.2020 ) .(මෙම නඩුව පිළිබඳ සවිස්තර සටහනක් සඳහා 15 වන පරිච්ඡේදයේ බලන්න) එසේම මෙම මූලික අයිතිවාසිකම් නඩුවේ තවත් චෝදනාවක් වූයේ ඡන්දය අපේක්ෂාවෙන් ලිත් බෙදාදීමයි. 2015 ජනාධිපතිවරණය සමයේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රුපියල් දෙකෝටි අනුහතර ලක්ෂයක මුදලක් වැයකර එවකට ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂගේ රුව සහිත ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කර බෙදාහැරීම සම්බන්ධයෙන් එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාව සිටි බැසිල් රාජපක්ෂ සහ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජෙනරාල්වරයාව සිටි කිත්සිරි රණවක යන අයට එරෙහිව නීතිපති විසින් කොළඹ මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා නගණ ලද අතර 2022 පෙබරවාරි 01 වන දින මහාධිකරණය විසින් ඔවුන් දෙදෙනාම නිදොස්කොට නිදහස් කරන ලදී.

## 12.4. ඡන්දදායකයන්ගේ නව ජල සබඳතා සඳහා මුදල් ලබාදීම ඡන්ද අල්ලසකි.

**සුනිල් ශාන්ත එදිරිව තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක,- මැතිවරණ පෙත්සම් 01/2018 (ඌව පළාත්බද මහාධිකරණය - මොණරාගල)**
**Sunil Shantha V Tharanga Harshaka Priya Prasad Dissanayake & Others -HC (Monaragala) Election petition 1/2018 HCM.13.09.2021**

### පසුබිම

2018 පෙබරවාරි 10 වන දින පවත්වන ලද පළාත් පාලන මැතිවරණයේදී පෙත්සම්කරු එක්සත් ජාතික පක්ෂයෙන්ද. පළවෙනි වගඋත්තරකරු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙනුවෙන්ද මොණරාගල ප්‍රාදේශීය සභාව සඳහා මදුරකැටිය කොට්ඨාශයෙන් තරඟ කරන ලදී. ඡන්ද ප්‍රතිඵලය අනුව වගඋත්තරකරු ඡන්ද 2157ක් ලබාගත් අතර පෙත්සම්කරු ලබාගතේ ඡන්ද 855ක් පමණි. ඒ අනුව වගඋත්තරකරු මොණරාගල ප්‍රාදේශිය සභාවට පත්වන ලදී. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළදී වගඋත්තරකරුගේ නියෝජිතයන් විසින් ඡන්දදායකයන් වෙත අල්ලස් ලබාදුන් බව ප්‍රකාශ කරමින් ඒ අනුව පළවෙනි වගඋත්තරකරුගේ පත්වීම අහෝසිකරන

ලෙස ඉල්ලා පෙත්සම්කරු උෟව පළාත්බද මහාධිකරණයේ ඡන්ද පෙත්සමක් ගොනු කරන ලදී.

### ඡන්ද පෙත්සම

පළමුවෙනි වගඋත්තරකරු විසින් පහත දූෂණ / නීති විරෝධී ක්‍රියාවන් සිදුකළ බවට පෙත්සම මගින් චෝදනා නගා තිබිණි.

- ❖ ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධානවලට මුදල් සහ/හෝ ද්‍රව්‍යයන් සහ/හෝ උපකරණ 01 වන වගඋත්තරකරු විසින් සහ/හෝ නියෝජිතයින් මගින් 01 වන වගඋත්තරකරුට ඡන්ද ලබාගැනීමේ අරමුණ ඇතිව 01 වන වගඋත්තරකරුට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලීම් කරමින් ලබාදීම.
- ❖ මදුරුකැටිය මැතිවරණ කොට්ඨාසයේ ඇතැම් නිවාස සඳහා නව ගෘහස්ථ විදුලි සම්බන්ධතා 01 වන වගඋත්තරකරුගේ වියදමින් 01 වන වගඋත්තරකරු සහ/හෝ නියෝජිතයින් විසින් 01 වන වගඋත්තරකරුට ඡන්දය ලබාගැනීමේ අරමුණ ඇතිව සහ/හෝ 01 වන වගඋත්තරකරුට ඡන්දය ලබාදෙන ලෙස ඉල්ලීම් කරමින් ලබාදීම.
- ❖ වර්ෂ 2017 ක් වූ නොවැම්බර් මස 28 දින හෝ ආසන්න දිනයක දී මදුරුකැටිය මැතිවරණ කොට්ඨායේ ඇතැම් නිවාස සඳහා නව ජල සම්බන්ධතා 01 වන වගඋත්තරකරුගේ වියදමින් 01 වන වගඋත්තරකරු සහ/හෝ නියෝජිතයින් විසින් 01 වන වගඋත්තරකරුට ඡන්දය ලබාගැනීමේ අරමුණ ඇතිව 01 වන වගඋත්තරකරුට ඡන්දය ලබාදෙන ලෙස ඉල්ලීම් කරමින් ලබාදීම.
- ❖ මැතිවරණය ප්‍රකාශයට පත්කළ පසුව 01 වන වගඋත්තරකරු සහ/හෝ 01 වන වගඋත්තරකරුගේ නියෝජිතයින් විසින් මදුරුකැටිය පිහිටි එකමුතු අවමංගල්‍යාධාර සමිතියට මුදල් ලබාදීම, ඔයිල් ෆාම් රණමයුර ක්‍රීඩා සමාජයට සහ කලුගල මරණාධාර සමිතියට ද්‍රව්‍යමය ආධාර ලබාදීම සිදුකරමින් 01 වන වගඋත්තරකරුට ඡන්දය ලබාදෙන ලෙස ඉල්ලා සිටීම.

ඒ අනුව පෙත්සම්කරු ප්‍රකාශ කර සිටින්නේ 01 වන වගඋත්තරකරුගේ ඉහත ක්‍රියා කලාපයන් හේතුකොට ගෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 82(ඈ) වගන්තියේ දැක්වෙන දූෂණ ක්‍රියාවන් වන අල්ලස් ලබාදීම යන වරද සිදුකර ඇති බවයි.

මෙම ඡන්ද පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස මදුරකැටිය කොට්ඨාශය ජනයග්‍රහණය කළ අපේක්ෂකයා සහ එම මැතිවරණයට මොණරාගල ප්‍රාදේශීය සභාව සඳහා තරග කළ අපේක්ෂකයන් 83ක් ද මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් 3 දෙනාද, මැතිවරණ කොමසාරිස් ජනරාල් වරයාද, මොණරාගල දිස්ත්‍රික්කයේ සහකාර තේරීම්භාර නිලධාරියාද, එම දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරියා සහ මොණරාගල පොලිස් ස්ථානාධිපතිවරයාද නම්කර තිබිණි. ඒ අනුව පෙත්සම මගින් වගඋත්තරකරුවන් 90ක් නම්කර තිබිණි.

## පෙත්සම් විභාගය

මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධිකාරක විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් සිදුකරමින් පළවෙනි වගඋත්තරකරු විසින් ඡන්දදායකයන් වෙත අල්ලස් ලබාදෙන බවට පැමිණිල්ලක් සිදුකර ඇත. එම පැමිණිල්ල අනුව මැතිවරණ කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරියකු විසින් විමර්ශනයක් සිදුකර ඇත. එම නිලධාරියාගේ විමර්ශණ වාර්තාව අනුව මදුරකැටිය ප්‍රදේශයේ පුද්ගලයන් 20-30 අතර ප්‍රමාණයකට නව ජල සබඳතා ලබාගැනීම සඳහා එකම පුද්ගලයකු විසින් මොණරාගල ලංකා බැංකුව වෙත මුදල් ගෙවා ඇති බවත් එකී පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පත් අංකය අනුව එම පුද්ගලයා හඳුනාගත් බවත් ඔහු රජයේ සේවකයකු බවත් එයට අමතරව ඔහු මෙම 1වන වගඋත්තරකරුගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සහභාගී වන බවට පැමිණිලි ලැබී ඇති බවත් මැතිවරණ කොමිෂන් සභාවේ විමර්ශන වාර්තාව සකස් කළ නිලධාරියා විසින් සාක්ෂි ලබාදී තිබිණි.

එයට අමතරව නව ජල සබඳතා ලබාගත් 94 දෙනෙකුගේ මුදල් භාරදීමේ වවුචර් සහ එම එක් එක් වවුචරයට අදාළ ලංකා බැංකුවට මුදල් තැන්පත් කිරීමේ පත්‍රිකාවල ඡායාස්ථ පිටපත් මොණරාගල ජලසම්පාදන කාර්යාල වෙතින් පෙත්සම්කරුවන් අධිකරණය වෙත ඉදිරිපත් කර තිබිණි. එම ලේඛන ලබාගෙන තිබුණේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ ප්‍රතිපාදන භාවිතා කරමිනි. එම ලේඛන අනුව මුදල් ගෙවීම සිදුකර ඇත්තේ එකම පුද්ගලයෙකි. එම පුද්ගලයා අධිකරණයේ සාක්ෂි ලබාදී ඇති අතර ඔහු පළවෙනි වගඋත්තරකරුගේ මැතිවරණ කටයුතු සඳහා සහය ලබාදුන් බව පිළිගෙන ඇත.

ජල සබඳතා ලබාගත් පුද්ගලයන් කිහිප දෙනෙකු සාක්ෂි සඳහා ඉදිරිපත් වී සිටි අතර ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ තමන් විසින් ණයට ලබාගත් මුදල් මගින් මෙම ජල සබඳතා සඳහා මුද්ල ගෙවූ බවයි. නමුත් එම කරුණු සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබිණි. එසේම එම සාක්ෂි පොලිසියට ලබාදුන් ඔවුන්ගේ ප්‍රකාශ සමගද පරස්පරතාවක් තිබිණි.

## මැතිවරණ පෙත්සමේ තීරණය

මෙම මැතිවරණ පෙත්සම පළාත්බද මහාධිකරණ විනිසුරුවරුන් කිහිප දෙනෙකු විසින් විභාග කරන ලද අතර අවසන් වශයෙන් පෙත්සම විභාගකර තීරණය ලබාදුන්නේ මහාධිකරණ විනිසුරු රංග දිසානායක විසිනි. 2021 සැප්තැම්බර් මස 9 වන දින ලබාදුන් තීන්දුව මගින් විනිසුරුවරයා ප්‍රකාශ කර තිබුනේ 1වන වගඋත්තරකරුට එරෙහිව ඉදිරිපත් වූ සාක්ෂි අනුව මොණරාගල ප්‍රාදේශීය සභාව සඳහා මදුරුකැටිය ඡන්ද කොට්ඨාශය වෙනුවෙන් පවත්වන ලද ඡන්ද විමසීමේ දී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ දැක්වෙන අල්ලස් දීම නැමැති දූෂණ ක්‍රියාව එම 01 වන වගඋත්තරකරුගේ කැමැත්ත සහ දැනීම ඇතිව ඔහුගේ නියෝජිතයෙකු විසින් සිදුකර ඇති බවටත්, ඒ අනුව 82 (ච) (2) වගන්තිය ප්‍රකාරව එම දූෂණ ක්‍රියාව ඔප්පු වී ඇති බැවින් එකී පනතේ 82 (න) වගන්තිය ප්‍රකාරව පළවෙනි වගඋත්තරකරු සභිකයකු ලෙස තෝරා පත් කරගැනීම අවලංගු කරන බවත්ය.

## ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනය

### D.M. Tharanga Harshanka Prasad v. W.M. Sunil Shantha

මෙම තීරණයෙන් අතෘප්තියට පත් 1වන වගඋත්තරකරු එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. අංක SC (SPL) Application 228-2021 අංක දරණ එම අභියාචනය අභියාචනාධිකරණය විසින් නිශ්ප්‍රභා කරන ලදී (SC (SPL) Application 228-2021 S.C.M.07.06.2022)

## අධිකරණ තීරණයේ බලපෑම

මැතිවරණ ජයග්‍රහණය සහ මනාප ලබාගැනීම සඳහා ඡන්ද දායකයන් වෙත අල්ලස් ලබාදීම මගින් මැතිවරණයක් ජයග්‍රහණය කළද තම සභිකධූරය අහෝසි විය හැකි බව පෙන්වාදෙන කදිම නඩු තීන්දුවක් ලෙස මෙම තීන්දුව හඳුන්වාදිය හැක. ඒ අනුව අනාගතයේදී ඡන්දදායකයන්ට අල්ලස්දීම මගින් මැතිවරණ ජයග්‍රහණය කිරීම සඳහා අපේක්ෂකයන් ගේ උත්සාහයන් සීමාවනු ඇත.

දහතුන්වන පරිච්ඡේදය

# නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම

අපේක්ෂකයකුගේ මැතිවරණ ක්‍රියාවලිය නිල වශයෙන් ආරම්භ වන්නේ නාමයෝජනා පත්‍රය තේරීම්භාර නිලධාරී විසින් පිළිගැනීමත් සමගය. නාමයෝජනා පත්‍රයක් විධිමත් ලෙස සකස් කර භාරදීමක් නීතියෙන් අපේක්ෂා කරනු ලබයි. නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම සඳහා විවිධ මැතිවරණ පනත් මගින් තේරීම්භාර නිලධාරීන් වෙත ලබාදී ඇති නීතිමය ප්‍රතිපාදන පිළිබඳවත්, තේරීම්භාර නිලධාරීන්ගේ තීරණ අභියෝගයට ලක්කළ නඩු තීන්දු පිළිබඳවත් මෙම පරිච්ඡේදයෙන් විස්තර කරනු ලැබේ.

## 13.1 නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ නීති තත්ත්වය

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 19(1) වගන්තියට අනුව පහත සඳහන් නුසුදුසුකම් සහිත නාමයෝජනා පත්‍රයක් තේරීම්භාර නිලධාරී විසින් ප්‍රතික්ෂේප කළ යුතු බව සඳහන් වේ. ඒ අනුව,

(අ) 15 වන වගන්තියේ (4) වන උපවගන්තියේ හෝ (5) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව භාර දී නොමැති යම් නාම යෝජනා පත්‍රයක් හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව අනුව නාම යෝජනා කරනු ලැබීමට නියමිත අපේක්ෂකයන් මුළු සංඛ්‍යාව ඇතුළත් නොවන යම් නාම යෝජනා පත්‍රයක් හෝ

(ඇ) 16 වන වගන්තියෙන් නියමිත තැන්පත් මුදල තබනු නොලැබුවේ යම් නාම යෝජනා පත්‍රයක් සම්බන්ධයෙන් ද ඒ නාම යෝජනා පත්‍රයක් හෝ

(ඈ) නාම යෝජනා කරනු ලැබූ එක් අපේක්ෂකයකුගේ හෝ ඊට වැඩි දෙනෙකුගේ කැමැත්ත නාම යෝජනා පත්‍රයෙහි පිටසන් කර නොමැති අවස්ථාවක ඒ නාම යෝජනා පත්‍රයක හෝ

(ඉ) පිළිගත් දේශපාලන පක්ෂයක් සම්බන්ධයෙන් වන විට එහි ලේකම්ගේ අත්සන හෝ ස්වාධීන කණ්ඩායමක් සම්බන්දයෙන් වන විට කණ්ඩායම් නායකයාගේ අත්සන නාමයෝජනා පත්‍රයෙහි තබා නොමැති අවස්ථාවක හෝ 15වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් නියමිත පරිදි ඒ අත්සන සහතික කොට අත්සන් තබා නොමැති අවස්ථාවක ඒ නාම යෝජනා පත්‍රය,

යන අඩුපාඩුකම් වලින් සමන්විත නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදුකරන ලද අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව පක්ෂ ලේකම්වරයාට /ස්වාධීන කණ්ඩායම් නායකයාට තේරීම්භාර නිලධාරී විසින් දැනුම් දිය යුතුය.

මෙම ප්‍රතිපාදනයට සෑම අතින්ම සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 15 වගන්තිය තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 17 වගන්තිය තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරිය) 31 වගන්තිය තුළද දක්නට ලැබේ.

## 13.2 එක් අපේක්ෂකයකුගේ වරදට අනෙක් අපේක්ෂකයන්ට දඬුවම් නොකළ යුතුය

**ඉන්ද්‍රා කුමාර් එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අය**
**Indra Kumar v. Dayananda Dissanayake & Others (2001) 2 sri L.R. 90**

### පසුබිම

මෙම නඩුවට පසුබිම් වූයේ 2000 ඔක්තොබර් මස 10 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයට මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා ජාතික සමගි පෙරමුණ (NUA) පක්ෂය ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රය වේ. මෙම නාමයෝජනා පත්‍රය විධිමත් ලෙස ඉදිරිපත් කර නොමැති බවට ටෙලෝ පක්ෂයෙන් දේශපාලන පක්ෂ කිහිපයක නියෝජිතයන් විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී වෙත විරෝධතාවක් ඉදිරිපත් කරන ලද නමුත් එකී විරෝධතාවය

නොසලකා තේරීම්භාර නිලධාරී විසින් නාමයෝජනා පත්‍රය භාරගන්නා ලදී. තේරම්භාර නිලධාරීගේ තීරණයට එරෙහිව ටෙලෝ පක්ෂයෙන් නාමයෝජනා ඉදිරිපත් කළ අපේක්ෂකයකු වූ පෙත්සම්කරු රිට් ආඥාවක් ඉල්ලමින් අභියාචනාධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## රිට් පෙත්සම

මෙම රිට් පෙත්සම මගින් පෙත්සම්කරු ජාතික සමගි පෙරමුණ පක්ෂයේ නාමයෝජනා පත්‍රයේ අඩුපාඩු කිහිපයක් පිළිබඳව සඳහන් කරන ලදී. එනම්,

- ❖ 4වන වගඋත්තරකාර වෙල්ලයියා රාජේන්ද්‍රන් මැලේසියාවේ සිටි අතර ඔහුගේ අත්සන නාමයෝජනා පත්‍රයේ ව්‍යාජ ලෙස යොදා ඇතිබව.
- ❖ 10 වන වගඋත්තරකරු මහනුවර විශේෂ විමර්ශන ඒකකයේ අත් අඩංගුවේ පසුවූ බැවින් ඔහුගේ අත්සන ව්‍යාප ලෙස යොදා ඇති බව

මෙම කරුණු මත නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙස දේශපාලන පක්ෂ නියෝජිතයන් කිහිප දෙනෙකු මඩකලපුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වූ දෙවන වගඋත්තරකරු වෙත විරෝධතාවයක් ඉදිරිපත් කළ බවත් එකී විරෝධතාවය නොසලකා දෙවන වගඋත්තරකරු මෙම නාමයෝජනා පත්‍රය භාරගත් බවත් සිය පෙත්සම මගින් කියා සිටි පෙත්සම්කරු මෙම නාමයෝජනා ලේඛනය ප්‍රතික්ෂේප කිරීමට බල කෙරෙන මැන්ඩාමුස් රිට් ආඥාවක් පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස් සහ දෙවන වගඋත්තරකාර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියට එරෙහිව නිකුත් කරන ලෙස ගරු අධිකරණයෙන් අයැද සිටින ලදී.

## පෙත්සම් විභාගය

අභියාචනා නඩු අංක CA.NO.1017/2000 ලෙස අංකනය වී තිබූ මෙම රිට් පෙත්සම සලකා බලන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු ජේ.එන්.ඩී.ද සිල්වා විසිනි. මෙම පෙත්සම්කරු විසින් අදාළ නාමයෝජනා පත්‍රය සම්බන්ධයෙන් විරෝධතාවක් ඉදිරිපත් නොකරන ලද නමුත් දේශපාලන පක්ෂ කිහිපයක නියෝජිතයන් විසින් විරෝධතා ඉදිරිපත් කරන ලද බවත් ඒ බව සනාථ කිරීම සඳහා පුවත්පත් වාර්තාවන්ද අධිකරණයට ඉදිරිපත් කර තිබිණි. පළවෙනි සහ දෙවන වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිස්ටර්

ජනරාල්වරයාගේ ස්ථාවරය වූයේ තේරීම්භාර නිලධාරී විසින් මෙම නාමයෝජනා පත්‍රය සම්බන්ධ විරෝධතාවයේදී කටයුතු කර ඇත්තේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 19(1) වගන්තියේ ප්‍රතිපාදන අනුව බවයි.

ඒ අනුව පනතේ 19(1) වගන්තියේ සඳහන් වන නුසුදුසුකමක් පවතින්නේ නම් එකී නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතු බවයි. ඒ අනුව තේරීම්භාර නිලධාරියාගේ නාමයෝජනා පත්‍ර පරීක්ෂාව ඔහු වෙත සපයා ඇති ලේඛන වලින් පිටතට ගොස් පරීක්ෂා කිරීමක් දක්වා දිගු නොවන බව ප්‍රකාශ කරන ලදී.

එසේම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ තේරීම්භාර නිලධාරී විසින් පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව 7(5) වගන්තියේ කරුණු ඇතුළත් වන අතර එහි සඳහන් වන්නේ පිළිගත් දේශපාලන පක්ෂයක්ද යන්න තහවුරු කරගැනීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතු බවයි. ඒ අනුව තේරීම්භාර නිලධාරීගේ පරීක්ෂණ පැවැත්වීම එම කරුණට සීමාවන බවද නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල් වරයා ප්‍රකාශ කරන ලදී.

5වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ආර්.කේ.ඩබ්ලිව් ගුණසේකර ගේ ස්ථාවරය වූයේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පවත්වන මැතිවරණයකදී නාමයෝජනා ලේඛනයක් ඉදිරිපත් කරන බැවින් දේශපාලන පක්ෂයේ වගකීම සීමාවන බවයි. එසේම එක් පුද්ගලයකුගේ දෝෂයක් නිසා නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප වුවහොත් එම පක්ෂයට ඡන්දය ලබාදීමට සිටින ඡන්දදායකයන්ට අසාධාරණයක් වන බවද කියා සිටින ලදී.

## පෙත්සම් විභාගයේ තීරණය

මෙම පෙත්සම් විභාගයේ තීරණය අභියාචනාධිකරණ විනිසුරු ජේ.එන්.ඩී.ද සිල්වා විසින් 2000 ඔක්තෝබර් 9 වන දින ප්‍රකාශයට පත් කරන ලදී. නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව තීරණයක් ගැනීමේදී තේරීම්භාර නිලධාරියා පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 19(1) සඳහන් කරුණු වලට දැඩි ලෙස සීමාවිය යුතු බව සිය තීරණය මගින් විනිසුරුවරයා ප්‍රකාශ කරන ලදී. අපේක්ෂකයකුගේ අත්සනක් ව්‍යාජ ලෙස යොදා ඇති බව තහවුරු වුවද, එක් අපේක්ෂකයකුගේ වරදකට අනෙක් අපේක්ෂකයන්ට දඬුවම් කළ නොහැකි බව ප්‍රකාශ කළ විනිසුරුවරයා එවැනි අවස්ථාවක නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීම මගින් ඡන්දදායකයන්ට ඔවුන්ගේ තෝරාගැනීමට අවස්ථාවක්

නොලැබී යන බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 13.3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම්/නුසුදුසුකම් පිළිබඳව විමර්ශනය කිරීම තේරීම්භාර නිලධාරියාගෙන් අපේක්ෂා කරනු නොලැබේ.

**විග්නේෂ්වරන් සහ ස්ටීවන් එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අය**
**Vigneswaran and Stephen v. Dayananda Dissanayake and Others (2002) 3 Sri.L.R 59**

### පසුබිම

මෙම නඩුවට පසුබිම් වූයේ 2001 දෙසැම්බර් 5 වන දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයයි. මෙම මැතිවරණය සඳහා ඊ.පී.ඩී.පී සහ ටී.යු.එල්.එෆ් යන දේශපාලන පක්ෂ කොළඹ දිස්ත්‍රික්කය සඳහා නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කර තිබිණි. ඊ.පී.ඩී.පී පක්ෂයේ බලයලත් නියෝජිතයා ලෙස කටයුතු කරන ලද්දේ පෙත්සම්කාර විග්නේෂ්වරන්ය. ටී.යු.එල්.එෆ් පක්ෂයේ නාමයෝජනා ලැයිස්තුවේ සඳහන් එක් අපේක්ෂකයකු ඒ වන විටත් තල් සංවර්ධන මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන බව දැනගත් විග්නේෂ්වරයන් නාමයෝජනා සඳහා විරෝධතා දක්වන අවස්ථාවේ දී අපේක්ෂක ලැයිස්තුවේ සිටීමට නුසුදුසු පුද්ගලයකු නාමයෝජනා පත්‍රයේ සිටින බැවින් නාමයෝජනා පත්‍රය අහෝසි කරන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරිවරයාගෙන් ඉල්ලා සිටින ලදී. නමුත් එම විරෝධතාවය දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ප්‍රතික්ෂේප කිරීම නිසා විග්නේෂ්වරන් තේරීම්භාර නිලධාරීගේ තීරණය බලරහිත කරන ලෙස ඉල්ලා රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

### රිට් පෙත්සම

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 14 සහ 15(1) වගන්ති සමග කියවිය යුතු 19(1) (ආ) වගන්තියට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1) (ං) සහ 99(3) ව්‍යවස්ථාවන් අනුව මැතිවරණයකට අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වීමට නුසුදුසු පුද්ගලයකු වන තල් සංවර්ධන මණ්ඩලයේ සභාපතිධූරය දරන පුද්ගලයකු ටී.යු.එල්.එෆ් පක්ෂයේ කොළඹ දිස්ත්‍රික් අපේක්ෂක ලැයිස්තුවේ සිටි බවත් ඒ මත එම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙස කොළඹ දිස්ත්‍රික්

තේරීම්භාර නිලධාරියාගෙන් 2001 ඔක්තෝබර් 27 වන දින ඉල්ලා සිටින ලද නමුත් එසේ ප්‍රතික්ෂේප නොකරන ලද බව ප්‍රකාශ කළ පෙත්සම්කරු එම නිසා එම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප නොකිරීමේ තීරණය බලරහිත කරන ලෙස සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, එසේම එම නාමයෝජනා ලේඛනය ප්‍රතික්ෂේප කළ නාමයෝජනා පත්‍රයක් ලෙස සලකා කටයුතු කරන ලෙස වගඋත්තරකරුවන්ට මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා මෙම පෙත්සම ගොනුකරන ලදී.

## පෙත්සම් විභාගය

පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු ගාමිණී අමරතුංග විනිසුරුවරයා විසිනි. ටී.යු.එල්.එෆ් පක්ෂයේ නාමයෝජනා පත්‍රයේ 4 වන අපේක්ෂකයා (මෙම පෙත්සමේ 8 වන වගඋත්තරකරු) ලෙස නම සඳහන් පුද්ගලයා තල් සංවර්ධන මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන බවත් ඔහුගේ වාර්ෂික වැටුප රුපියල් 72000කට වඩා වැඩි බැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට නුසුදුසු පුද්ගලයකු බවත් පෙත්සම්කරුවන් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.

## පෙත්සම් විභාගයේ තීරණය

2001 නොවැම්බර් 23 වන දින ගාමිණී අමරතුංග විනිසුරුවරයා රිට් පෙත්සම පිළිබඳ සිය තීරණය ලබාදෙන ලදී. ඒ අනුව විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ පනතේ 15(1),(2) සහ (3) යන වගන්තිවලට අනුකූල ලෙස සකස් කරන ලද වලංගු නාමයෝජනා පත්‍රයක් පනතේ 15(4)හෝ (5) හි සඳහන් වන ආකාරයට භාර නොදුන්නේ නම් එම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කළ යුතු බවයි.

එසේම පනතේ 19(1) (අ) සිට (ඉ) දක්වා ප්‍රතිපාදන මගින් තේරීම්භාර නිලධාරී විසින් නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට අදාළ ප්‍රතිපාදන ඇතුළත් වන බව අවධාරණය කළ විනිසුරුවරයා එකී ප්‍රතිපාදන මගින් අපේක්ෂකයකුගේ සුදුසුබව හෝ නුසුදුසු බව සඳහන්ව නොමැති බව සඳහන් කරන ලදී. පනතේ ප්‍රතිපාදන අනුව නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට පෙර විමර්ශනයක් හෝ පරීක්ෂණයක් සිදුකිරීම නීතිය මගින් අපේක්ෂා නොකරන බව පැවසූ විනිසුරුවරයා සඳහා කළේ නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීම කරුණු මත සිදුවන බවත් එහිදී අභිමතය අදාළ නොවන බවත්ය. එසේම විනිසුරුවරයා තවදුරටත් සිය තීරණය මගින් ප්‍රකාශ කරන

ලද්දේ මැතිවරණ පනතේ 19(1) වගන්තිය අනුව තේරීම්භාර නිලධාරියාගේ භූමිකාව පරිපාලන ස්වභාවයක් ගන්නා අතර නාමයෝජනා පත්‍රයේ නම් සඳහන් පුද්ගලයන් නාමායෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු බවට නාමයෝජනා පත්‍රයේ 4වන තීරුවේ සඳහන් සහතිකය මත විශ්වාසය තැබීමට ඔහුට අයිතියක් ඇති බවත්ය.
ඒ අනුව තේරීම්භාර නිලධාරීයාගේ තීරණයට එරෙහිව රිට් ආඥා නිකුත් කිරීමේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

## 13.4 නාමයෝජනා පත්‍රයේ පක්ෂ මහලේකම්ගේ අත්සන පෑනකින් හෝ පැන්සලකින් යෙදිය යුතුය.

**එදිරිවීර, තේරීම්භාර නිලධාරී එදිරිව කපුකොටුව, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්**

**Ediriweera, Returning Officer Vs Kapukotuwa, General Secretary, United National Party (2003) 1 Sri L.R 228**

### පසුබිම

2002 වර්ෂයේ අකුරැස්ස ප්‍රාදේශීය සභාව සඳහා පවත්වන ලද ඡන්ද විමසීම සඳහා එක්සත් ජාතික පක්ෂය නාමයෝජනා පත්‍රයක් ඉදිරිපත් කරන ලදී. එම නාමයෝජනා සඳහා විරෝධතා දක්වන අවස්ථාවේදී තේරීම්භාර නිලධාරී වෙත විරෝධතාවක් ඉදිරිපත් කළ පුද්ගලයකු දක්වා සිටියේ එක්සත් ජාතික පක්ෂයේ නාමයෝජනා පත්‍රයේ එහි මහලේකම්වරයාගේ අත්සන නොමැති බවයි. ඒ අනුව තේරීම්භාර නිලධාරී එම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කරන ලදී. එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා අභියාචනාධිකරණයට රිට් ආඥාවක් ඉල්ලා පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

### රිට් පෙත්සම

එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා විසින් අභියාචනාධිකරණයට ඉදිරිපත් කරන ලද පෙත්සම මගින් කියා සිටින ලද්දේ මහලේකම්වරයාගේ නම සහිත නිල මුද්‍රාව තිබෙන බැවින් එම නාම යොජනා පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කරන ලද නාමයෝජනා පත්‍රයක් ලෙස භාර නොගෙන ප්‍රතික්ෂේප කිරීම මගින් තේරීම්භාර නිලධාරියා වරදක් සිදුකර ඇති බවයි. ඒ අනුව එම නාමයෝජනා පත්‍රය භාර ගන්නා ලෙස තේරීම්භාර නිලධාරීට නියෝග කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත් පෙත්සම් විභාගය අවසන් වන තෙක්

අකුරැස්ස ප්‍රාදේශීය සභාව සඳහා ඡන්ද විමසීම නොපවත්වන ලෙස අතුරු තහනම් නියෝගයක්ද අයැද සිටින ලදී.

## අභියාචනාධිකරණයේ තීරණය

අභියාචනා නඩු අංක 342/2002 යටතේ අංකනය වී තිබූ මෙම පෙත්සම විභාග කළ අභියාචනාධිකරණය පෙත්සම්කරු විසින් ඉල්ලා සිටින ලද සහන ලබාදෙමින් එක්සත් ජාතික පක්ෂ නාමයෝජනා පත්‍රය භාරගන්නා ලෙස මැන්ඩාමුස් ආඥාවක් තේරීම්භාර නිලධාරීවරයා වෙත නිකුත් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනය

අභියාචනාධිකරණ තීරණයෙන් අතෘප්තියට පත් තේරීම්භාර නිලධාරී එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. අභියාචනය විභාග කරන ලද්දේ අගවිනිසුරු සරත් නන්ද සිල්වා සහ ස්මයිල් සහ වීරසූරිය යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. විභාගය අවසානයේදී අනෙක් විනිසුරුවරුන් දෙදෙනාගේද එකගතාව මත අගවිනිසුරුවරයා විසින් සිය තීරණය 2003 ජුනි 19 වන දින ප්‍රකාශයට පත්කරන ලදී.

එහිදී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 31(1)(ඉ) වගන්තියට (2003 වන විට බලාත්මක වූ) අවධානය යොමුකළ විනිසුරුවරයා සඳහන් කළේ ඒ අනුව පක්ෂ ලේකම්වරයාගේ අත්සන නිසිපරිදි සඳහන් නොවීම නාමයෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වන බව ප්‍රකාශ කරන ලදී. එසේම අත්සන යන්න කුමක්ද යන්න සඳහා මායප්පන් එදිරිව මන්චනායක (Mayappan vs Manchanayake (62 NLR 529) නඩුවේදී සන්සෝනි විනිසුරුගේ ප්‍රකාශයක් අගවිනිසුරුවරයා සිය තීරණයේ උපුටා දක්වා ඇත. එනම් "භාෂාව සම්බන්ධයෙන් ගත් කල වචනවල සාමාන්‍ය ආර්ථය ලබාදේ, ලේඛනයක් අත්සන් කිරීම අවශ්‍යවූ විට හෝ ලේඛනයක පුද්ගලයකුගේ අත්සනක් අවශ්‍ය වූ විට පුද්ගලයාගේ නම පෑනකින් හෝ පැන්සලකින් අතින් ලිවිය යුතුය" සන්සෝනි විනිසුරුගේ මෙම ප්‍රකාශයට "මේ ආකාරයට තබන අත්සන එම ලියන හෝ ක්‍රියාව කරන පුද්ගලයා නියෝජනය කරන බව" අගවිනිසුරුවරා අතිරේක එකතු කිරීමක්ද සිදුකරන ලදී.

ඒ අනුව අභියාචනාධිකරණයේ තීරණය නිශ්ප්‍රභා කරමින් තේරීම්භාර නිලධාරීගේ අභියාචනය පිළිගන්නා ලදී. ඒ අනුව අකුරැස්ස ප්‍රාදේශීය

සභා ඡන්ද විමසීම සඳහා ඉදිරි නීතිමය කටයුතු සිදුකරන ලෙස සියලු බලධාරීන්ට නියෝග කරන ලදී.

## 13.5. තිසි වයස සම්පූර්ණ නොකළ අපේක්ෂකයන් ඇතුළත් වන නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප වේ.

**වේරගොඩ එදිරිව දයානන්ද දිසානායක**
Weragoda vs Dayananda Dissanayake and others (2006) 2 Sri LR.197

### පසුබිම

2006 වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කොළඹ මහ නගර සභාව සඳහා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් නාමයෝජනා පත්‍ර ඉදිරිපත් කරන ලද්දේ එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් ලෙස පෙත්සම්කරු විසින්ය. එකී නාමයෝජනා පත්‍රයේ සිටි එක් අපේක්ෂකයකු 2004 ජූනි මස 1 වන දින වන විට වයස අවුරුදු 18ක් සම්පූර්ණ නොවීම මත තේරීම්භාර නිලධාරී විසින් නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කරන ලදී.

එකී තීරණයට එරෙහිව පෙත්සම්කාර පක්ෂ මහලේකම්වරයා විසින් අභියාචනාධිකරණයේ රිට් ආඥාවක් ඉල්ලා පෙත්සමක් ගොනුකරන ලදී.

### රිට් පෙත්සම

ප්‍රශ්නගත අපේක්ෂකයා ඉපදී ඇත්තේ 1987 පෙබරවාරි 28 වන දිනය එබැවින් ඔහු ගේ වයස අවුරුදු 18 ඉක්මවා ඇති බවත් එසේම නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව තේරීම්භාර නිලධාරියාගේ නිවේදනයෙන් ප්‍රතික්ෂේප කිරීමට පැහැදිලි ලෙස හේතු දක්වා නොතිබූ බවත් පෙත්සම්කරු සිය පෙත්සමෙන් ප්‍රකාශ කරන ලදී. එසේම එක් අපේක්ෂකයකුගේ ගැටලුවක් හේතුවෙන් සමස්ථ නාමයෝජනා පත්‍රයම ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවන බවද ප්‍රකාශ කරන ලදී. ඒ අනුව තේරීම්භාර නිලධාරියාගේ තීරණය අවලංගු කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත් තම පක්ෂයේ නාමයෝජනා පත්‍රය භාරගන්නා ලෙස මැන්ඩාමුස් රිට් ආඥාවක් 2වන වගඋත්තරකරුට එරෙහිව නිකුත් කරන ලෙසත් සිය පෙත්සම මගින් ඉල්ලා සිටින ලදී.

## පෙත්සම් විභාගය

අභියාචනාධිකරණ නඩු අංක CA 330/06 ලෙස අංකනය කර තිබූ මෙම පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරන විනිසුරු කේ. ශ්‍රීපවන් විසිනි. පෙත්සම් විභාගය 2006 මාර්තු 16, 17 සහ 20 සිට 22 දක්වා පවත්වන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතට 1996 අංක 25 දරණ සංශෝධනය මගින් සිදුකරන ලද සංශෝධන අනුව අපේක්ෂකයන් අතරින් 40% ක් තරුණ අපේක්ෂකයන් විය යුතු බව දක්වා තිබිණි. එසේම පෙත්සම් විභාගයේදී මතු වූ තවත් කරුණක් වූයේ මෙම මැතිවරණය සඳහා භාවිතා කරන ලද්දේ 2004 ඡන්ද නාම ලේඛනය බවයි. එම ඡන්ද නාම ලේඛනය සඳහා නම් ඇතුළත් කරගනු ලබන්නේ 2004 ජූනි මස 1 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කළ පුරවැසියන්ය. එම ඡන්ද නාම ලේඛනය 2005 ජූනි මස 1 වන දින සිට බලාත්මක වී ඇති බවද පෙත්සම් විභාගයේදී හෙලිදරව් විය.

## පෙත්සම් විභාගයේ තීරණය

පෙත්සම විභාග කළ ශ්‍රීපවන් විනිසුරුවරයා විසින් 2006 මාර්තු 26 වන දින සිය තීරණය ලබාදී තිබුණි. ප්‍රශ්නගත අපේක්ෂකයාගේ වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබුණද පනතේ ප්‍රතිපාදන අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුත්තේ නාමයෝජනා භාරදෙන අවස්ථාවේ නොව ඡන්ද විමසීමට පාදක කරගන්නා ඡන්ද නාම ලේඛනය සකස් කරන දිනට බව විනිසුරුවරයා සඳහන් කරන ලදී. ඒ අනුව මෙම ඡන්ද විමසීමට පාදක කරගත්තේ 2004 ඡන්ද නාම ලේඛනයයි. ඒ අනුව තරුණ අපේක්ෂකයාගේ වසය අවුරුදු 18 සම්පූර්ණ විය යුත්තේ 2004 ජූනි 1 වන දිනට බව අවධාරණය කළ විනිසුරුවරයා ඒ අනුව එම දිනය වන විට අදාළ අපේක්ෂකයාගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වී නොමැති බව විනිසුරුවරයා සිය තීන්දුව මගින් ප්‍රකාශ කරන ලදී. එසේම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 31 වගන්තියේ නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා 7ක් දක්වා තිබුණද තරුණ අපේක්ෂකයන් ප්‍රමාණය සම්පූර්ණ නොවීම මත නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිබව එහි සඳහන්ව නැතත් එකී වගන්තිය කියවිය යුත්තේ තරුණ අපේක්ෂකයන් පිළිබඳව සඳහන් වන 81 වගන්තිය සමග බව ප්‍රකාශ කළ විනිසුරුවරයා පෙත්සමේ දෙවන වගඋත්තරකාර තේරීම්භාර නිලධාරියාගේ තීරණය නිවැරදි බව ප්‍රකාශ කරමින් රිට් පෙත්සම ප්‍රතික්ෂේප කරන ලදී.

## 13.6 බලයලත් නියෝජිත සමග සිටිමින් ඔහුගේ පාලනයෙන් සහ ඔහු වෙනුවෙන් නාමයෝජනා භාරදීම විධිමත් භාරදීමකි.

**කැලෑපොත විතානගේ ආරියරත්න සහ තවත් අයෙක් එදිරිව එස්.ටී.කොඩිකාර, තේරීම්භාර නිලධාරී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ තවත් අය**

Kelepotha Vithanage Ariyaratne and Another v. S.T.Kodikara, Returning officer, District Secrataiat Galle and others - SC Writ Application No. 12/2018 S.C.M- 30.08.2019

### පසුබිම

2018 පෙබරවාරි10 වන දින දිවයින පුරා පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කර තිබිණි. ඒ සඳහා වන නාමයෝජනා භාරගැනීම 2017 දෙසැම්බර් 17 සිට දෙසැම්බර් 21 වන දින මධ්‍යහන 12 දක්වා නියමකර තිබිණි. ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ පක්ෂයෙන් ඉදිරිපත් කළ නාමයෝජනා ගාල්ල තේරීම්භාර නිලධාරී විසින් ප්‍රතික්ෂේප කර තිබිණි. බලයලත් නියෝජිතයා නොවන තැනැත්තෙකු විසින් නාමයෝජනා භාරදීම හේතුවෙන් නාමයෝජනා ප්‍රතික්ෂේප කරන බව නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලෙස ගාල්ල තේරීම්භාර නිලධාරී විසින් තම ලිපියෙන් දක්වා තිබිණි. තේරීම් භාර නිලධාරීගේ මෙම තීරණයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ පක්ෂයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම් සඳහා බලයලත් නියෝජිතයා විසින් රිට් ආඥාවක් ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

### රිට් පෙත්සම

මෙම රිට් පෙත්සම ඉදිරිපත් කර තිබුණේ පෙත්සම්කරුවන් තිදෙනෙකු විසිනි පෙත්සම්කරුවන් තිදෙනාම ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණේ සාමාජිකයන් වන අතර පළමු පෙත්සම්කරු ඇල්පිටිය ප්‍රාදේශීය සභා මැතිවරණයේ කටයුතු සඳහා පළාත් පාලන ඡන්ද විමසීම් පනතේ ප්‍රතිපාදන අනුව බලයලත් නියෝජිතයාය. ගාල්ල දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරී, මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් තිදෙනා සහ ගාල්ල සහකාර මැතිවරණ කොමසාරිස් පිළිවෙලින් 1,2,3,4,5 යන වගඋත්තරකරුවන් ලෙසත් ඇල්පිටිය

ප්‍රාදේශීය සභාව සඳහා නාමයෝජනා භාරදී තිබූ දේශපාලන පක්ෂවල ලේකම්වරුන් 6 සිට 9 දක්වා වගඋත්තරකරුවන් ලෙසත් නීතිපතිවරයා 10 වන වගඋත්තරකරු ලෙසත් මෙම පෙත්සම මගින් නම්කර තිබිණි. පළවෙනි පෙත්සම්කරු සහ දෙවන පෙත්සම්කරු අදාළ නාමයෝජනා පත්‍ර සහ තහවුරු කරන ලේඛන රැගෙන නාමයෝජනා භාරදීම සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2017 දෙසැම්බර් 21 වන දින තේරීම්භාර නිලධාරී වෙත භාරදීමට ගිය බවත්, එසේ යන විට පළමු නාමයෝජනා පත්‍ර, අතිරේක නාමයෝජනා පත්‍ර සහ අදාළ ලේඛන කඩදාසි ෆයිල් කවර දෙකක් තුළ දමාගෙන ගෙන ගිය බවත් පෙත්සම්කරුවන් සිය පෙත්සම මගින් කියා සිටින ලදී. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරය අසල "උපකාරක කවුළුවක්" පැවති බවත් එහිදී නිලධාරීන් පිරිසක් මෙම ලේඛන සියල්ල පරීක්ෂාකර බලා නැවත භාරදුන් බවත් ඒ අනුව ඔවුන් දෙදෙනා නාමයෝජනා භාරදෙන ස්ථානය වූ ශ්‍රවණාගාරය තුළට ඇතුලු වූ බවත් පෙත්සම මගින් තවදුරටත් විස්තර කර තිබිණි. එසේ යන අවස්ථාවේදී පළවෙනි පෙත්සම්කාර තේරීම්භාර නිලධාරී සහ පස්වෙනි පෙත්සම්කාර සහකාර මැතිවරණ කොමසාරිස් මේසයක් අසල වාඩි වී සිටි බවත් පළවෙනි පෙත්සම්කරු(බලයලත් නියෝජිත) විසින් නාමයෝජනා සහ අදාළ ලේඛන ඇතුළත් ලිපිගොනු දෙක තේරීම්භාර නිලධාරී වෙත දීමට උත්සාහ කළ බවත් එහිදී ෆයිල් කවර නොමැතිව නාමයෝජනා භාරදීම සිදුකරන ලෙස තේරීම්භාර නිලධාරී විසින් ප්‍රකාශ කළ බැවින් තමන් එම ෆයිල් කවර ඉවත් කර දෙවන පෙත්සම්කරුට නාමයෝජනා සහ ලිපිලේඛන ලබාදුන් බවත් ඔහු ඒවා තේරීම්භාර නිලධාරී වෙත භාරදුන් බවත් පෙත්සම්කරුවන් ප්‍රකාශ කරයි. ඉන් පසුව තේරීම්භාර නිලධාරී විසින් නාමයෝජනා භාරදුන් පුද්ගලයා ලෙස දෙවන පෙත්සම්කරුගේ තොරතුරු සටහන් කිරීම සඳහා දෙවන පෙත්සම්කරුගේ ජාතික හැඳුනුම්පත ඉල්ලා සිටි බවත් එයට පෙත්සම්කරුවන් විරුද්ධ වූ නමුත් තේරීම්භාර නිලධාරී බලකළ නිසා දෙවන පෙත්සම්කරු එය භාරදුන් බවත් නමුත් ඔවුන් ඒ සඳහා විරෝධය ප්‍රකාශ කළ බවත් පෙත්සම මගින් සඳහන් කර තිබිණි. ජාතික හැඳුනුම්පතේ තොරතුරු සටහන් කරගත් බවත් පසුව ඔවුන් ශාලාවෙන් ඉවත්ව ගිය බවත් පෙත්සමේ සඳහන් විය. මෙම ශාලාව තුළ CCTV කැමරා ක්‍රියාත්මක වී තිබූ බවත් මෙම සිදුවීම එමගින් සනාථ කරගත හැකි බවත් පෙත්සමේ දක්වා තිබිණි. දෙසැම්බර් 21 වන දින නාමයෝජනා සඳහා විරෝධතා දක්වන කාලය අවසන් වූ නමුත් තම නාමයෝජනා පත්‍ර සඳහා කිසිවකු විරෝධතාවක් ඉදිරිපත් නොකළ නමුත් බලයලත් නිලධාරියා නොවන තැනැත්තෙකු විසින් නාමයෝජනා පත්‍රභාරදීම යන හේතුව දක්වමින් පළවෙනි

වගඋත්තරකාර තේරීම්භාර නිලධාරීවරයා විසින් තම නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කළ බව පෙත්සම මගින් දක්වා තිබිණි. එසේම 2017 දෙසැම්බර් 26 වන දින පළවෙනි වගඋත්තරකරු විසින් තමන් වෙත ලිපියක් යොමුකරමින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 28(5) වගන්තියේ අවශ්‍යතා සපුරා නොමැති වීම මත එහි 31(1)(අ) වගන්තිය යටතේ නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කළ බව ලිඛිතව දැනුම්දී ඇති බවත් පෙත්සමේ සඳහන් විය.

මෙම කරුණු මත පෙත්සම්කරුවන් 2018 ජනවාරි 10 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 සමග කියවිය යුතු 104උ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව යමින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත රිට් පෙත්සමක් ගොනු කරන ලදී. දෙසැම්බර් 21 වන දින පළවෙනි වගඋත්තරකාර තේරීම්භාර නිලධාරීවරයාගේ තීරණය බලරහිත කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණේ නාමයෝජනා පත්‍රය පිළිගන්නා ලෙස පළවෙනි වගඋත්තරකරුට බලකරන මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, නව ඡන්ද විමසීම් දිනයක් නියමකරන ලෙස බලකරන මැන්ඩාමුස් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, මෙම පෙත්සම් විභාගය අවසාන වනතෙක් ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා වූ ඡන්ද විමසීම නොපවත්වන ලෙස අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත් පෙත්සම මගින් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා තිබිණි.

## පෙත්සම් විභාගය

ජනාධිපති නීතිඥ ප්‍රසන්න ජයවර්ධන, එල්.ටී.බී.දෙහිදෙණිය සහ ඊ.ඒ.පී.ආර්.අමරසේකර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසින් මෙම පෙත්සම විභාග කරන ලදී. පෙත්සම්කරුවන්ගේ නීතිඥයින්ගේ කරුණු දැක්වීම් සහ ලේඛන පරීක්ෂා කිරීමෙන්ද 1 සිට 5 දක්වා සහ 10 වන වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිටි අතිරේක සොලිස්ටර් ජනරාල්වරයාගේ කරුණු දැක්වීම සහ අනෙක් වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම් සලකා බැලීමෙන් අනතුරුව මෙම පෙත්සම් විභාගය අවසන් වනතුරු ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම් නොපවත්වන ලෙස අතුරු තහනම් නියෝගයක් 2018 ජනවාරි 10 දින නිකුත් කරන ලදී.

පෙත්සම් විභාගයේදී පළමු සහ දෙවන වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ලද්දේ අදාළ නාමයෝජනා භාරදීම සිදුකරන ලද්දේ දෙවන පෙත්සම්කරු විසින් බවත් තවත් පුද්ගලයකු ඒ සමග පැමිණි බවත් තමන් ඔහුව නොදන්නා බවත්ය. එසේම පෙත්සම්කරුවන්ට බලපෑම්

කළ බව හෝ ඔවුන් විරෝධය පෑමක් සිදුවූ බව ප්‍රතික්ෂේප කළ මෙම වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ලද්දේ නාමයෝජනා භාරගත් දින එම ශ්‍රවණාගාරයේ CCTV කැමරා ක්‍රියාකාරී වී නොමැති බැවින් දර්ශන ලබාගත නොහැකි බවයි. පළවෙනි වගඋත්තරකරු අධිකරණය වෙත තමන් භාරගත් නාමයෝජනා පත්‍රවල පිටපත් ඉදිරිපත් කර තිබිණි. එසේම ඔහු ඡායාරූපයක් ඉදිරිපත් කළ අතර දෙවන පෙත්සම්කරු පළවෙනි වගඋත්තරකරු වෙත නාමයෝජනා භාරදෙන ආකාරයක් එකී ඡායාරූපයේ දැක්විනි. එහි පස්වන වගඋත්තරකාර සහකාර මැතිවරණ කොමසාරිස්වරයාද තවත් පුද්ගලයකුද පසෙකින් නිරූපණය වී තිබිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව මත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ජනාධිපති නීතිඥ ප්‍රසන්න ජයවර්ධන විසින් 2019 අගෝස්තු 19 වන දින පෙත්සම් විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී. විනිසුරුවරයා සිය තීරණයේදී සඳහන් කරන ලද්දේ අධිකරණයට ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව 1 වන සහ 2වන පෙත්සම්කරුවන් දෙදෙනා දෙසැම්බර් 21 වන දින උදෑසන නාමයෝජනා පත්‍ර භාරදීමේ අපේක්ෂාවෙන් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරය වෙත ගිය බව තහවුරු වී ඇති බවයි. එසේම පළවෙනි වගඋත්තරකරු ඉදිරිපත් කරන ලද ඡායාරූපයේ නාමයෝජනා පත්‍ර භාරදෙන දෙවන පෙත්සම්කරු පසෙකින් සිටින්නේ පළවෙනි පෙත්සම්කරු බව පළවෙනි සහ දෙවන පෙත්සම්කරුවන් ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂි ප්‍රවේශමෙන් පරීක්ෂා කිරීමේදී පළවෙනි සහ දෙවන පෙත්සම්කරුවන් නාමයෝජනා භාරගත් පළවෙනි වගඋත්තරකරු අසල සිටි බව පැහැදිලි වන බව විනිසුරුවරයා සිය තීරණයේ සඳහන් කර ඇත.

එසේම විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ දෙවන පෙත්සම්කරු භෞතිකව පළවෙනි වගඋත්තරකරුට නාමයෝජනා භාරදී ඇති අතර එය සිදුකර ඇත්තේ පළවෙනි පෙත්සම්කරු වෙනුවෙන් ක්‍රියාකරමින් සහ ඔහුගේ පාලනය යටතේ බවයි. එසේම දෙවන පෙත්සම්කරු සිය හැඳුනුම්පත භාරදී ඇත්තේ පළවෙනි වගඋත්තරකරුගේ බලකිරීම මතය. මෙම කරුණු සැලකිල්ලට ගැනීමේදී පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 28(5) වගන්තිය මගින් අදහස් කරනු ලබන ආකාරයේ "භාරදීමක්" පළවෙනි පෙත්සම්කරු විසින් සිදුකර ඇති බවට පිළිගත හැකි බව සඳහන් කළ විනිසුරුවරයා පෙත්සම්කරුවන්ගේ පෙත්සම භාරගනිමින් එකී පෙත්සම මගින් ඉල්ලා සිටි පරිදි නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමේ පළවෙනි

වගඋත්තරකරුගේ තීරණය බලරහිත කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක්ද, නාමයෝජනා පත්‍ර භාරගැනීම සඳහා මැන්ඩාමුස් රිට් ආඥාවක්ද, නව ඡන්ද විමසීම් දිනයක් නියමකරන ලෙස මැන්ඩාමුස් රිට් ආඥාවක්ද නිකුත් කරන ලදී. මෙම ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයේ ප්‍රතිඵලයක් ලෙස 2019 ඔක්තෝබර් 11 වන දින ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා ඡන්ද විමසීම් පවත්වන ලදී. ඒ අනුව ඡන්ද විමසීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පක්ෂයද තරඟ කළ අතර එම පක්ෂයට ලබාගත හැකිවූයේ ඡන්ද 310ක් පමණි. එම පක්ෂයට සභික ආසනයක් දිනාගැනිමට නොහැකි විය. (https://elections.gov.lk/web/wp-content/uploads/election-results/local-authorities-elections/Elpitiya_PS_2019.pdf - 25/03/2022)

දාහතරවන පරිච්ඡේදය

# ඡන්ද පෙත්සම්

මැතිවරණයක ප්‍රතිඵලය අභියෝගයට ලක් කිරීම මෙන්ම මැතිවරණයකින් තේරී පත්වූ අපේක්ෂකයකුගේ පත්වීමද ඡන්ද පෙත්සම් මගින් අභියෝගයට ලක් කළ හැකිය. විවිධ මැතිවරණ පනත් යටතේ ඡන්ද පෙත්සම් පිළිබඳව පවතින නීතිමය ප්‍රතිපාදන සහ ඡන්ද පෙත්සම් විභාග කරන ලද අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීරණාත්මක නඩු තීන්දු කිහිපයක් මෙම පරිච්ඡේදය තුළින් විස්තර කරනු ලැබේ.

## 14.1 ඡන්ද පෙත්සම් සම්බන්ධ නීතිමය ප්‍රතිපාදන

මැතිවරණයක ප්‍රතිඵලය හෝ අපේක්ෂකයකුගේ පත්වීම අභියෝගයකට ලක් කිරීම ඡන්ද පෙත්සම් මගින් සිදුවේ. ශ්‍රී ලංකාවේ ඡන්ද පෙත්සම් ඉතිහාසයද පැරණිය.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ VII වන පරිච්ඡේදය වෙන් වී ඇත්තේ ඡන්ද පෙත්සම් පිළිබඳ නීතිමය ප්‍රතිපාදන වෙනුවෙනි.

### ඡන්ද පෙත්සම් මත මැතිවරණ කොට්ඨාශයක මැතිවරණය නිශ්ප්‍රභාවීම

පනතේ 92 (1) වගන්තියට අනුව අල්ලස, සංග්‍රහ කිරීම හෝ බියහැන්වීම නිසා යම් සැලකිය යුතු ඡන්දදායකයන් පිරිසක් තමන් කැමති පක්ෂයට/ස්වාධීන කණ්ඩායමට ඡන්දය දීමෙන් වැළකීමෙන් ප්‍රතිඵලයට බලපෑමක් සිදුවූ බව හෝ පනතේ ප්‍රතිපාදනවලට අනුකූල නොවන පරිදි මැතිවරණය පැවැත්වූ බව මැතිවරණ විනිසුරුවරයා සෑහීමකට පත්වුවහොත් මැතිවරණය නිශ්ප්‍රභා කළ හැකිය.

## ජයග්‍රාහී අපේක්ෂකයකුගේ ධූරය අහෝසි කිරීම

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 92(2) අනුව පහත හේතූන් අතරින් යම් හේතුවක් ඔප්පු වුවහොත් මැතිවරණ විනිසුරුවරයා විසින් ජයග්‍රාහී අපේක්ෂකයාගේ ධූරය අහෝසි කළ යුතුය.

- ❖ අපේක්ෂකයා හෝ ඔහුගේ දැනුම ඇතිව නියෝජිතයකු විසින් මැතිවරණ සම්බන්ධ දූෂණයක් හෝ වරදක් සිදුකර තිබීම.
- ❖ මැතිවරණ දූෂණ ක්‍රියාවකට වරදකරුවී වසර 7 ක් නොයික්මවූ පුද්ගලයකු මැතිවරණ ව්‍යාපාරයේ දී කටයුතු සඳහා යෙදවීම.
- ❖ ප්‍රජා අශක්නුතාවකට ලක්වූවකු එම කාල සීමාව තුළ මැතිවරණයකදී සේවයට යොදවා ගැනීම.
- ❖ තෝරාපත්කර ගන්නා අවස්ථාවේදී අපේක්ෂකයා ධූරය දැරීමට නුසුදුසු පුද්ගලයකු වීම.

### ඡන්ද පෙත්සම් සම්බන්ධ අධිකරණ බලය

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 93 වන වගන්තිය අනුව පාර්ලිමේන්තු මැතිවරණයක් සම්බන්ධ ඡන්ද පෙත්සම් විමසීමේ බලය ඇත්තේ අභියාචනාධිකරණයටය.

ජනාධිපතිවරණ මැතිවරණයක් සම්බන්ධ ඡන්ද පෙත්සම් විමසීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවතින බව ජනාධිපතිවරණ පනතේ 92 වගන්තියේ සඳහන් වේ.

පළාත් සභා ඡන්ද විමසීමක ඡන්ද පෙත්සම් විමසීමේ බලය අභියාචනාධිකරණයට පවතින බව පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 93 වගන්තියේ දැක්වේ.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක ඡන්ද පෙත්සම් විමසීමේ බලය අදාළ පළාත්බද මහාධිකරණයටද පවතින බව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 82ජ වගන්තියේ සඳහන් වේ.

## ඡන්ද පෙත්සම් ඉදිරිපත් කිරීමට බලය ඇති පුද්ගලයන්

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 95 වන වගන්තියට අනුව අදාළ මැතිවරණයේ අපේක්ෂකයකුට හෝ ඡන්දදායකයකුට මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.

## ඡන්ද පෙත්සමකදී ඉල්ලා සිටිය හැකි සහන

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 96 වගන්තිය අනුව ඡන්ද පෙත්සමකදී පහත සහන ඉල්ලා සිටිය හැකිය.

- ❖ ඡන්ද කොට්ඨාශයක මැතිවරණය අවලංගු බවට ප්‍රකාශයක් කරන ලෙස.
- ❖ තෝරාපත් කරගත් අපේක්ෂකයකු ගේ තේරීපත්වීම අවලංගු කිරීම මේ ප්‍රකාශයක් සිදුකරන ලෙස
- ❖ යම් අපේක්ෂකයකු යථා පරිදි තෝරාපත් කරගනු ලැබූ බවට ප්‍රකාශයක් සිදුකරන ලෙස.

## ඡන්දපෙත්සමක වගඋත්තරකරුවෝ

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 97 වන වගන්තිය අනුව පහත සඳහන් පුද්ගලයන් මැතිවරණ පෙත්සමක වගඋත්තරකරුවන් ලෙස එක්කළ යුතුය.

- ❖ තෝරාපත්කර ගැනීමටත් අභියෝගයට ලක් කරන අවස්ථාවක පෙත්සම්කරු හැර අනෙක් සියලුම අපේක්ෂකයන් වගඋත්තරකරුවන් ලෙස එක්කළ යුතුය.
- ❖ දූෂණ හෝ නීතිවිරෝධි ක්‍රියාවක් සම්බන්ධව පෙත්සම මගින් චෝදනා කරන විට එම ක්‍රියාව සිදුකළ බවට චෝදනා ලබන අපේක්ෂකයන් සහ වෙනත් තැනැත්තන්.

## ඡන්ද පෙත්සමක ඇතුළත් විය යුතු කරුණු

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 98 වගන්තියට අනුව පහත සඳහන් කරුණු පෙත්සමක ඇතුළත් විස්තර විය යුතුය.

- ❖ පෙත්සම ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුවන්ට ඇති අයිතිවාසිකම.
- ❖ මැතිවරණය පැවැත්වූ බව සහ එහි ප්‍රතිඵලය
- ❖ පෙත්සම්කරු විශ්වාසය තබා සිටින වැදගත් කරුණු පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක්.
- ❖ දූෂණ හෝ නීතිවිරෝධි ක්‍රියා පිළිබඳව හැකිතාක් විස්තර සහ එම කරුණු සනාථ කිරීම සඳහා දිවුරුම් පෙත්සම්.
- ❖ පෙත්සම මගින් ඉල්ලා සිටින සහන නියෝග.

## ඡන්ද පෙත්සම් ඉදිරිපත් කිරීමේ කාලය

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 108 වන වගන්තිය දක්වන්නේ මැතිවරණ ප්‍රතිඵලය ගැසට් පත්‍රයේ පලකළ දින සිට දින 21ක් ඇතුළත මැතිවරණ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවයි. ජනාධිපතිවරණ පනතේ 102 වන වගන්තිය දක්වන්නේ තෝරාපත්කර ගැනීම ගැසට් පත්‍රයේ පලකළ දින සිට දින 21ක් ඇතුළත ජනාධිපතිවරණ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවයි.

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 108 වන වගන්තිය දක්වන්නේ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය ගැසට් පත්‍රයේ පලකළ දින සිට දින 21ක් ඇතුළත මැතිවරණ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවයි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 82(අ)(ඉ) වන වගන්තිය දක්වන්නේ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය ගැසට් පත්‍රයේ පලකළ දින සිට දින 21ක් ඇතුළත මැතිවරණ පෙත්සමක් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බවයි.

## මැතිවරණ විනිසුරුගේ කාර්යය

මැතිවරණ අභියාචනාධිකරණයට යොමුවූ විට කඩිනමින් එය විභාග කළ යුතු අතර විභාගය අවසානයේදී තීරණය ලිඛිතව සකස් කළ යුතුය. එසේම නඩු තීන්දුව අවසානයේදී වාර්තාවක් සකස් කර එය ජනාධිපති වෙත යැවිය යුතු බව පාර්ලිමේන්තු මැතිවරණ පනතේ සඳහන් වේ. (මැතිවරණ විනිසුරුගේ තීරණයට එරෙහිව අභියාචනා කර නොමැති අවස්ථාවකදී)

### මැතිවරණ විනිසුරුගේ තීරණයට එරෙහිව අභියාචනය

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 102 වගන්තිය දක්වන්නේ මැතිවරණ විනිසුරුගේ තීරණයෙන් අතෘප්තිමත් වන පුද්ගලයකුට එකී තීරණයෙන් මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනා කළ හැකි බවයි.

පළාත් සභා සහ පළාත් පාලන ඡන්ද විමසීම් පිළිබඳ පෙත්සම් වල අභියාචනා විමසීමේ බලතලද ශ්‍රේෂ්ඨාධිකරණයට පවතී.

ජනාධිපතිවරණ පෙත්සම් විභාග කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය බැවින් එම තීරණයට එරෙහිව අභියාචනා අවස්ථාවක් නොමැත.

### ඡන්ද පෙත්සම් පිළිබඳ කාර්යය පටිපාටිය

ඡන්ද පෙත්සම් පිළිබඳ කාර්යය පටිපාටිය අදාළ මැතිවරණ පනත් වල උපලේඛනයේ දක්වා ඇත.

## 14.2 ඡන්ද පෙත්සමක් පෙත්සම්කරුට පමණක් අදාළ නොවන අතර එය මැතිවරණ කොට්ඨාශයටම අදාළ කරුණකි

**දොන් ඇලැක්සැන්ඩර් එදිරිව ලියෝ ප්‍රනාන්දු - බුත්තල මැතිවරණ පෙත්සම 1947**
**Don Alexander v. Leo Fernando 49 NLR 202**

### පසුබිම

1947 පාර්ලිමේන්තු මැතිවරණයෙන් බුත්තල මැතිවරණ කොට්ඨාශයට තරග එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරන ලද ඩබ්ලිව්. ලියෝ ප්‍රනාන්දු පාර්ලිමේන්තුවට තේරීපත්වූ අතර මැතිවරණය සඳහා ස්වාධීනව තරග කරන ලද ටී.දොන්. ඇලැන්සැන්ඩ්ර් දෙවන ස්ථානයට ඡන්ද ලබාගන්නා ලදී. පසුව ඇලැක්සැන්ඩර් විසින් ලියෝ ප්‍රනාන්දුගේ පාර්ලිමේන්තු  පත්වීම අභියෝගයට ලක්කරමින් මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කර පසුව ඉල්ලා අස්කර ගැනීමට අධිකරණයේ අවසරය පතන ලදී.

### මැතිවරණ පෙත්සම

1947 පාර්ලිමේන්තු මැතිවරණයේදී වගඋත්තරකාර ලියෝ ප්‍රනාන්දු විසින් සාමාන්‍ය බියවැද්දීම, අයුතු බලපෑම සහ රාජ්‍ය සමග ගිවිසුම් ඇති කරගෙන තිබීම යන චෝදනා ඉදිරිපත් කරමින් එම හේතු මත ලියෝ ප්‍රනාන්දුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙස පෙත්සම මගින් ඉල්ලා තිබිණි. එසේම පෙත්සම අධිකරණය වෙත වෙත ගොනු කිරීමේදී සුරක්ෂිතයක් ලෙස රුපියල් 5000ක්ද පෙත්සම්කරු විසින් තැන්පත් කර තිබිණි.

### පෙත්සම් විභාගය

මැතිවරණ පෙත්සම විභාග කරන ලද්දේ නාගලිංගම් විනිසුරුවරයා විසිනි. පෙත්සම් විභාගය අවස්ථාවේදී පෙත්සම්කරු විසින් පෙත්සම ඉල්ලා අස්කර ගැනීම සඳහා අධිකරණයේ අවසර ඉල්ලා සිටින ලදී. පෙත්සම ඉදිරියට ගෙන යාම සඳහා අවශ්‍ය වියදම් දැරීමට තමන්ට

නොහැකි නිසා පෙත්සම ඉල්ලා අස්කරගැනීමට අදහස් කරන බව ඔහු අධිකරණයට දැනුම්දී තිබිණි.

### මැතිවරණ පෙත්සමේ තීරණය

මැතිවරණ පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට අවසර ලබා දෙන්නේද යන්න පිළිබඳ තීරණය නාගලිංගම් විනිසුරුවරයා විසින් 1948 මාර්තු 5 වන දින ලබාදෙන ලදී. එහිදී විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ මැතිවරණ පෙත්සමක් විභාග කිරීම යනු එහි පෙත්සම්කරුට පමණක් අදාළ කරුණක් නොව එය සමස්ත මැතිවරණ කොට්ඨාශයේම අයිතිවාසිකම් පිළිබඳ කරුණක් බවයි. එසේම පෙත්සම්කරු විසින් විධිමත් ලෙස ඇප මුදල්ද තැන්පත් කර ඇති බැවින් වියදම් පිළිබඳ කරුණු පිළිගත නොහැකි බව පැවසූ විනිසුරුවරයා මැතිවරණ පෙත්සම මගින් ඉදිරිපත් කරන ලද චෝදනා තුන සනාථ කිරීම සඳහා අවශ්‍ය පෙත්සම්කරුවන් සහ වෙනත් ලේඛන සහිතව 1948 අප්‍රේල් 12 වන දිනට පෙර දිවුරුම් ප්‍රකාශ ගොනු කරන ලෙස නියෝග කරන ලදී.

## 14.3. ජනාධිපතිවරයා මැතිවරණ පෙත්සමක වගඋත්තරකරුවෙකු කළ හැකිද?

**කුමාරතුංග එදිරිව ජයකොඩි සහ තවත් අය**
**Kumaranatunge v. Jayakody (1984)2 Sri L.R. 45**

### පසුබිම

මෙම ඡන්ද පෙත්සමට පසුබිම් වූයේ 1983 මැයි 18 වන දින පැවති මහර මැතිවරණ කොට්ඨාශය සඳහා වූ අතුරු මැතිවරණයයි. මෙම පෙත්සමේ පෙත්සම්කාර විජය කුමාරතුංග, 1වන වගඋත්තරකාර කමලවර්ණ ජයකොඩි සහ තවත් තිදෙනෙකු මෙම අතුරු මැතිවරණය සඳහා තරඟ කරන ලදී. මැතිවරණ ප්‍රතිඵලය අනුව එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් තරඟ වැදුන කමලවර්ණ ජයකොඩි ඡන්ද 24944 ක් ලබාගත් අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් තරඟ කළ විජය කුමාරතුංග ඡන්ද 24,899 ක් ලබාගන්නා ලදී. ඒ අනුව වැඩි ඡන්ද 45ක් ලබාගත් ජයකොඩි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වන ලදී. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළදී තමාගේ පුද්ගලික චරිතයට සහ හැසිරීමට බලපෑමක් ඇති කිරීමේ චේතනාවෙන් යුක්තව 1වන වගඋත්තරකරුගේ නියෝජිතයකු ලෙස කටයුතු කළ ජනාධිපති ජේ.ආර් ජයවර්ධන සාවද්‍ය ප්‍රකාශ කිරීම නිසා තමගේ ඡන්ද අඩුවූ බවත් ඒ හේතුවෙන් ජයකොඩිගේ පාර්ලිමේන්තු මන්ත්‍රී

ධූරය අහෝසි කරන ලෙසත් ඉල්ලා විජය කුමාරතුංග අභියාචනාධිකරණයේ මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## මැතිවරණ පෙත්සම

1983 ජූනි මස 9 වන දින ඉදිරිපත් කරන ලද පෙත්සම මගින් ජයග්‍රාහී අපේක්ෂක කමලවර්ණ ජයකොඩි 1වන වගඋත්තරකරු ලෙසත්, ජනාධිපති ජේ. ආර්.ජයවර්ධන දෙවන වගඋත්තරකරු ලෙසත් නම්කර තිබිණි.

ඒ අනුව පළවෙනි වගඋත්තරකරුගේ නියෝජිතයකු වශයෙන් කටයුතු කරමින් දෙවන වගඋත්තරතකරු එකී මැතිවරණයේදී 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ 77(ඇ) වගන්තිය සමග කියවිය යුතු 58(ඈ) වගන්තිය ප්‍රකාරව පෙත්සම්කරුගේ තේරී පත්වීමට අහිතකර බලපෑම් සිදුකිරීමේ අරමුණ ඇතිව පෙත්සම්කරුගේ පුද්ගලික චරිතය සහ හැසිරීම පිළිබඳව අසත්‍ය ප්‍රකාශ කිරීම මගින් දූෂණ ක්‍රියාව සිදුකිරීමේ පදනම මත 1වන වගඋත්තරකරුගේ පත්වීම බලරහිත කරන ලෙස පෙත්සම්කරු අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

## මැතිවරණ පෙත්සම් විභාගය

පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු එච්.ඩී තම්බයියා විනිසුරුවරයා විසිනි. පෙත්සම මගින් 2 වන වගඋත්තරකරු විසින් 1වන වගඋත්තරකරුගේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළදී සිදුකරන ලද ප්‍රකාශයන් කිහිපයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 1983 මැයි 8 වන දින මල්වතුහිරිපිටිය නාරම්මල ප්‍රදේශයේ පැවති ප්‍රචාරක රැස්වීමකදී "ජනාධිපතිවරණයට සහ ජනමත විචාරණයට පසුව රටේ විවිධ ප්‍රදේශවල කලබල කිරීමට සැලසුම්කරමින් සිටි විරුද්ධ පක්ෂයේ ඇතැම් තැනැත්තන් අත්අඩංගුවට ගත් බවත් ඒ සඳහා තමන්ගේ පූර්ණ දැනීම තිබූ බවත් ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වන ලෙස ටිරල් ගුණතිලකට පවරා ඇති බවත් නැක්සලයිට් සාමාජිකයන් නිදහස් කළත් 21 වන දින දරණ විමර්ශන වාර්තාව අනුව වරදකරුවන් වන තැනැත්තන්ට දඬුවම් ලබාදෙන බවත්" ප්‍රකාශ කළ බව. එසේම එහිදී විජය කුමාරතුංග අත්අඩංගුවට ගනු ලැබුවා පමණක් නොව යාම් ඊම් සීමාද පැනවූ පුද්ගලයකු බවත් විජය කුමාරතුංගට ඡන්දය භාවිතා කරන්නේ නම් මෙම ආසනයේ ජනතාව හුදකලා වනු ඇති බවද ප්‍රකාශ කර ඇති බවත්, එසේම තවත් අවස්ථාවකදී 2වන වගඋත්තරකරු විසින්

"පිරිසක් තමාව මරාදමන බවට ප්‍රකාශ කර ඇති බවත් එම විමර්ශන අනුව විජය කුමාරතුංග අත්අඩංගුවට ගත් බවත් 21 වන දිනට පෙර එම විමර්ශන වාර්තාව ලබාගෙන වරදකරුවන්ට නඩු පවරන බවත් ප්‍රකාශ කළ බවත් දක්වන ලදී. මෙම පෙත්සම් විභාගය ආරම්භයේදී වගඋත්තරකරුවන් වෙනුවෙන් මූලික විරෝධතා 4ක් ගොනු කරන ලදී. එනම්,

1. 2වන වගඋත්තරකරු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා වන බැවින් ඔහුට ජනාධිපති මුක්තිය පවතින බැවින් ඔහුව වගඋත්තරකරු කර තිබෙන මෙම පෙත්සම විභාග කළ නොහැක.
2. පනතේ ප්‍රතිපාදනවලට අනුකූල ලෙස ඇපමුදල් තැන්පත් කර නොමැත.
3. පෙත්සමේ සඳහන් කර ඇති දූෂණ ක්‍රියා සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශ ගොනු කර නොමැත.
4. 2වන වගඋත්තරකරු විසින් සිදුකර ඇති බව පෙත්සමේ සඳහන් වන ප්‍රකාශ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ 58(1) වගන්තිය අනුව දූෂණ ක්‍රියා යන්නට ඇතුළත් නොවේ.

දෙවන වගඋත්තරකරු මෙම පෙත්සමට අදාළ සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා බව පෙත්සකම්කරුගේ නීතිඥ විසින් පිළිගන්නා ලදී.

එසේම ඇප මුදල් අවස්ථා 3කදී මැතිවරණ කොමසාරිස්වරයාට තැන්පත් කර ඇති බවද පෙත්සම් විභාගයේදී හෙළිදරව් විය.

## මැතිවරණ විනිසුරුගේ තිරණය

1984 මාර්තු 15 වන දින තම්බයියා විනිසුරුවරයා විසින් සිය තීරණය ලබාදෙන ලදී. එහිදී ඔහු ප්‍රකාශ කරන ලද්දේ,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරුණු ඉතා පැහැදිලි මෙන්ම කිසිඳු ව්‍යාකූල බවකින් ද තොර බවයි. එසේම 35(3) ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති අවස්ථා හැර ජනාධිපතිවරයාට මුක්තිය ඇත. එබැවින් එම මුක්තිය සාවද්‍ය ලෙස යොදාගනු ලැබිය හැකි බවට වූ කරුණ සම්පූර්ණයෙන්ම අදාළ නොවන බවයි.

එසේම ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ මෙම නඩුවේ පවතින එකම චෝදනාව වූයේ ජනාධිපතිවරයා විසින් සිදුකළ සාවද්‍ය

ප්‍රකාශයක් සම්බන්ධයෙන්ය. එබැවින් එම චෝදනාව නිශ්ප්‍රභා වේ නම් විභාග කිරීම සඳහා තවදුරටත් මැතිවරණ පෙත්සමක් නොපවතින බවත් ඒ හේතුවෙන් එම පෙත්සම නිශ්ප්‍රභා කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

එසේම ප්‍රකාශයන්ගේ සාවද්‍ය බව පිළිබඳව අදහස් දැක්වූ විනිසුරුවරයා දක්වා සිටියේ එම ප්‍රකාශයන් අපේක්ෂකයාගේ චරිතය හෝ හැසිරීම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශයක් සංයුක්ත වන බවට කරනු නොලැබූ බවට සලකනු ලැබිය හැකි බවයි. එසේම ඉහත කී කරුණු මත සහ පෙත්සම මගින් විස්තර කර ඇති දූෂණ ක්‍රියා තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කර නොමැති වීම මත වගඋත්තරකරුවන්ගේ මූලික විරෝධතාවලට ඉඩ ලබාදෙමින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 14.4 ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කළ යුතුද නැද්ද යන්න පිළිබඳව ගණන් කිරීමේ නිලධාරියකු විසින් කරන ලද තීරණය ඡන්ද පෙත්සමකදී විවාදයට භාජනය කරනු නොලැබිය යුතුය.

**වීරසිංහ එදිරිව චන්ද්‍රානන්ද සිල්වා මැතිවරණ කොමසාරිස් සහ තවත් අය**

Weerasinghe v. Chandananda De Silva, Commissioner of Elections and Others [1992] 1 Sri L.R. 76

**පසුබිම**

1989 පෙබරවාරි 15 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයට දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශය වෙනුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් එච්.එම්. වීරසිංහ, ටී.ඒ.කේ. තෙවරප්පෙරුම ඇතුළු 9 දෙනෙකු තරඟ කරන ලදී. මැතිවරණ ප්‍රතිඵලය අනුව දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සඳහා එක් මන්ත්‍රී ආසනයක් වෙන්වු අතර මනාප ඡන්ද 21751 ක් ලබාගත් තෙවරප්පෙරුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්විය. මැතිවරණ ප්‍රතිඵල අනුව එච්.එම් වීරසිංහ මනාප ඡන්ද 21675 ක් ලබාගන්නා ලදී. ඡන්දය ගනන් කිරීමේදී අසාධාරණයක් වූ බවට චෝදනා කරමින් එච්.එම්. වීරසිංහ විසින් මැතිවරණ පෙත්සමක් ගොනුකරන ලදී.

## මැතිවරණ පෙත්සම

පෙත්සම්කරු සහ මෙම පෙත්සමේ 32 වන වගඋත්තරකරු වූ තෙවරප්පෙරුම දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශය සඳහා තරඟ වැදුන බවත් පෙත්සම්කරුගේ මනාප අංකය 9 බවත් සඳහන් කළ පෙත්සම්කරු මෙම මැතිවරණ ප්‍රතිඵලය අනුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හිමිවූ එකම මන්ත්‍රීධූරය තමන්ට වඩා මනාප ඡන්ද 76ක් ලබාගත් 32 වන වගඋත්තරකරු ලබාගත් බව පෙත්සම මගින් සඳහන් කරන ලදී. පෙත්සම්කරුගේ විසින් නගන ලද චෝදනා 2ක් විය.

පළමු චෝදනාව වූයේ ඡන්ද පත්‍රිකාවේ තම මනාප අංකය වූ අංක 9 අවසානයට තිබූ අතර අංක 9 ඉදිරියෙන් (කොටුවෙන් ඉවත) කතිරය ලකුණු කරන ලද ඡන්ද පත්‍රිකා 642ක් අවලංගුවූ මනාප ලෙස සඳහන් කරමින් ඉවත් කළ බවත් එසේ වුවත් 11වන වගඋත්තරකරුට අදාළව එසේ අංක 9 ට ආසන්නව ඡන්ද පත්‍රිකාවේ හිස් ප්‍රදේශයේ කතිරය සටහන් කළ ඡන්ද පත්‍රිකාවල මනාප ඔහුගේ මනාප ලෙස එකතු කළ බවය.

දෙවන චෝදනාව වූයේ 13 සහ 15 ගණන් කිරීමේ මධ්‍යස්ථාන තුළදී 32 වන වගඋත්තරකරුට අයත් නොවන මනාප ඡන්ද 1000කට වැඩි ප්‍රමාණයක් ගණන් කිරීමේ නිලධාරින්ගේ අක්‍රමිකතා මත 32 වන වගඋත්තරකරුවෙත සැසඳීමේ ලේඛන වලට ඇතුළත් කළ බවය.

මෙම හේතු මත 32 වන වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය අහෝසි කරන ලෙසත් තමන් නිසිලෙස පාර්ලිමේන්තුවට පත්වූ මන්ත්‍රීවරයා ලෙස ප්‍රකාශයට පත් කරන ලෙසත් ඉල්ලා සිටි පෙත්සම්කරු ඒ සඳහා පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 63(2) වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකා සහ විශ්ලේෂණ පත්‍රිකා අධිකරණය විසින් පරීක්ෂා කිරීමක් සිදුකරන ලෙසත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලබාගත් ඡන්ද පත්‍රිකා වලට අදාළ මනාප නැවත ගණන් කිරීමක් සිදුකරන ලෙසත් අධිකරණයෙන් අයැද සිටිමින් මෙම පෙත්සම අභියාචනාධිකරණය වෙත යොමුකරන ලදී.

## මැතිවරණ පෙත්සමේ තීරණය

අභියාචනාධිකරණය විසින් ඡන්ද පෙත්සම විභාග කර ඉල්ලීම් සියල්ල ප්‍රතික්ෂේප කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුකළ අභියාචනය

අභියාචනාධිකරණයේ තීරණයෙන් අතෘප්තියට පත් පෙත්සම්කරු එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනායක් සිදුකරන ලදී. මෙම අභියාචනය විභාග කරන ලද්දේ එච්.ඒ.පී.ද සිල්වා. බණ්ඩාරණායක සහ කුලතුංග යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.

### ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

අභියාචනය විභාග කරන ලද විනිසුරු මඩුල්ලේ තීරණය බෙදුනු තීරණයක් වූ අතර බණ්ඩාරණායක විනිසුරුගේ තීරණයට ද සිල්වා විනිසුරුවරයා එගකවූ අතර කුලතුංග විනිසුරුවරයා වෙනත් ස්ථාවරයක් සහිත තීරණයක් ලබාදෙන ලදී.

ඒ අනුව සිල්වා විනිසුරුවරයාගේ එකඟතාවය මත බණ්ඩාරණායක විනිසුරුවරයා විසින් 1990 සැප්තැම්බර් 10 වන දින මෙම අභියාචනයේ බහුතරයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

එහිදී විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 3 වන උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව සකස් කරන ඡන්ද පත්‍රිකාවක මනාප ඡන්ද ලකුණු කරන ආකාරය පිළිබඳව පනතේ 39(1) වගන්තියේ සඳහන් වන බවත් එහි සඳහන් වන්නේ මනාප අංකය මත කතිරයක් මගින් මනාප ලකුණු කළ යුතු බවත් ඒ අනුව ඡන්ද පත්‍රිකාවක වෙනත් ස්ථානයක ලකුණු කරන ලද කතිර ලකුණක් පෙත්සම්කරුට හිමිවිය යුතු මනාප ඡන්දයක් ලෙස පිළිගත නොහැකි බවත් ඒ අනුව එම මනාප ලකුණු කිරීම ගණන් නොකළ යුතු බවත්ය. එසේම දෙවන චෝදනාව වූ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන අංක 13 සහ 15 යන මධ්‍යස්ථාන වලදී 1000 කට අධික වෙනත් පුද්ගලයන්ට මනාප ලකුණු කළ ඡන්ද පත්‍රිකාවන් 47 වන වගඋත්තරකරු විසින් 32 වන වගඋත්තරකරුගේ වාසියට විශ්ලේෂණ ලේඛන වලට ඇතුල් කිරීම සම්බන්ධයෙන් විනිසුරුවරයා සිය තීරණය ප්‍රකාශ කරමින් සඳහන් කරන ලද්දේ මැතිවරණ පනතේ 98(ඇ) වගන්තිය අනුව පෙත්සම්කරු විශ්වාසය තබා සිටින වැදගත් කරුණු පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් ඡන්ද පෙත්සමක ඇතුළත් විය යුතු බව අවධාරණය කළ විනිසුරුවරයා පෙත්සම්කරු එසේ අදාළ කරුණු පිළිබඳව ප්‍රමාණවත් ලෙස සඳහන් කිරීමට අපොසත් වී ඇති බවයි. එසේම මැතිවරණ පනතේ 53(9) වගන්තිය මගින් ප්‍රතිපාදන සලසා ඇති යම් ඡන්ද පත්‍රිකාවක් පිළිබඳව පැන නැගෙන යම් ප්‍රශ්නයක්

සම්බන්ධයෙන් ගණන් කිරීමේ නිළධාරියාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය යන්න සහ මැතිවරණ පනතේ 112 වගන්තිය දක්වන්නේ 53 වගන්තිය යටතේ ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කළ යුතුද නැද්ද යන්න පිළිබඳව ගණන් කිරීමේ නිලධාරියකු විසින් කරන ලද තීරණය ඡන්ද පෙත්සමකදී විවාදයට භාජනය කරනු නොලැබිය යුතුය යන්න මෙහිදී අවධාරණය කරමින් එම වගන්ති අනුව එම වගන්ති යටතේ නැවත ගණන් කිරීමක් නියම කිරීමක් අපේක්ෂා නොකරන බව අවධාරණය කරන ලදී. ඒ අනුව මැතිවරණ විනිසුරුවරයාගේ තීරණය තහවුරු කරමින් අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.

### අභියාචනා තීරණයේ ප්‍රතිඵල

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව ටී.ඒ.කේ.තෙවරප්පෙරුම ගේ පාර්ලිමේන්තු මන්ත්‍රීධූරය ආරක්ෂා වූ අතර ඔහු නව වන පාර්ලිමේන්තුවේ අවසානය දක්වා සිය ධූරය දරන ලදී.

## 14.5. මනාප ඡන්ද නැවත ගණන් කරන ලෙස ඉල්ලීම

### පැලැදගම එදිරිව මැතිවරණ කොමසාරිස් සහ වෙනත් අය

Pelendagama v. Commissioner of Elections and Others (2001) 2 Sri L.R. 215

### පසුබිම

මෙම මැතිවරණ පෙත්සමට පසුබිම් වූයේ 1999 අප්‍රේල් 4 වන දින පැවති සබරගමුව පළාත් සභා මැතිවරණයයි. පෙත්සම්කරු මෙම මැතිවරණයට පොදු පෙරමුණ පක්ෂයේ රත්නපුර දිස්ත්‍රික් කණ්ඩායමේ අපේක්ෂකයෙක් විය. ඡන්ද ප්‍රතිඵලය අනුව ඔහුට පළාත් සභා මන්ත්‍රීධූරයක් හිමි නොවු අතර ඡන්ද ගණන් කිරීමේ නිළධාරීන් අභිමතය අත්තනෝමතික ලෙස යොදාගත් බවට චෝදනා කරමින් ඡන්ද පෙත්සම ඉදිරිපත් කරන ලදී.

### මැතිවරණ පෙත්සම

මැතිවරණ කොමසාරිස්වරයා, රත්නපුර දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරිවරයා, ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන 52 හි ඡන්ද ගණන් කිරීමේ නිලධාරීන් ඡන්ද විමසීමෙන් තේරීපත්වූ අපේක්ෂකයන් සහ තේරී පත් නොවූ අපේක්ෂකයන් මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

5 සිට 56 දක්වා පෙත්සම්කරුවන් වූ ඡන්ද ගණන් කිරීමේ නිලධාරීන් පෙත්සම්කරුවට හිමි මනාප ඡන්ද ගණන් කිරීමේදි අභිමතය නිසි පරිදි භාවිතා කිරීමට අපොහොසත් වූ බවත් ද්වේශ සහගතව අත්තනෝමතිකව බලය භාවිතා කළ, චෝදනා කළ පෙත්සම්කරු ඒ අනුව 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 57(7), 51(11), 53(ඒ) සහ 58(1)(අ) වගන්ති අනුව පෙත්සම්කරු සම්බන්ධයෙන් නිදහස් සහ සාධාරණ මැතිවරණයක් නොපැවැත්වීමට චෝදනා කරමින් පහත සඳහන් සහන අභියාචනාධිකරණයෙන් අයැද සිටින ලදී.

- ❖ පොදු පෙරමුණ අපේක්ෂක ලැයිස්තුවට ලබාදුන් මනාප ඡන්ද නැවත ගණන් කිරීමක් සිදුකරන ලෙස නියෝගයක් නිකුත් කරන ලෙස,
- ❖ ඉහත කී මනාප නැවත පරීක්ෂා කිරීම සහ
- ❖ පෙත්සම්කරු නිසි පරිදි තේරී පත්වූ අපේක්ෂකයකු ලෙස ප්‍රකාශයට පත් කරන ලෙස.

## පෙත්සම් විභාගය

අභියාචනාධිකරණ විනිසුරු විග්නේෂ්වරන් විසින් මෙම පෙත්සම විභාග කරන ලදී. පෙත්සම් විභාගය ආරම්භයේදී ම 1 සිට 4 දක්වා වගඋත්තරකරුවන්ගේ නීතීඥයින් මූලික විරෝධතාවක් නගන ලදී. එනම්,

(අ) පළාත් සභා ඡන්ද විමසීම් පනතේ ඉල්ලා සිටිය හැකි සහනය වන්නේ දිස්ත්‍රික්කයේ ඡන්ද ප්‍රතිඵලය අහෝසි කරන ලෙස ඉල්ලීමක් කිරීමය. ඒ නිසා තේරිපත්වූ අපේක්ෂකයන් අතරින් (57 සිට 67 දක්වා වගඋත්තරකරුවන් ) කිසිවෙකු වෙනුවට පෙත්සම්කරුව තේරිපත්වූ බවට ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටීම බැලූ බැල්මටම ඉල්ලීමට අයිතියක් ඇති සහනයක් නොවේ.

(ආ) 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් ආඥා පනතේ 96 වගන්තිය යටතේ මැතිවරණ පෙත්සමකින් ඉල්ලා සිටිය හැකි සහන යටතේ නැවත් ඡන්දය ගණන් කිරීමක් පිළිබඳව සඳහන් නොවේ.

(ඇ) 1998 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ මැතිවරණ පෙත්සම් රීති 10 ට අනුව ඡන්ද පෙත්සම් දැන්වීම දින 10ක් තුළ වගඋත්තරකරුවන්ට භාර දී නොමැත.

(ඈ) 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 97 (1) (අ) වගන්තිය අනුව මැතිවරණයට තරඟ කරන ලද සියලුම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් වගඋත්තරකරුවන් ලෙස පෙත්සමට එකතු කිරීමට පෙත්සම්කරු අපොහොසත් වී ඇත. මෙම මූලික විරෝධතා මත පෙත්සම විභාග නොකරම ප්‍රතික්ෂේප කරන ලෙස 1 සිට 4 දක්වා වගඋත්තරකරුවන්ගේ නීතීඥයා අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

### අභියාචනාධිකරණ තීරණය

විග්නේෂ්වරන් විනිසුරුවරයා විසින් 2000 දෙසැම්බර් 13 වන දින සිය තීරණය  ලබාදෙන ලදී. ඒ අනුව වගඋත්තරකරුවන් විසින් නගන ලද අ සහ ආ විරෝධතා පිළිගනිමින් සහ ඇ සහ ඈ විරෝධතා ප්‍රතික්ෂේප කරමින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 14.6 දින 10ක් තුළ දැන්වීම් භාරදීම අනිවාර්යය අවශ්‍යතාවයකි.

### හාෆි එදිරිව දයානන්ද දිසානායක මැතිවරණ කොමසාරිස් සහ තවත් අය
### Hafi v Dayananda Dissanayake, Commissioner of Elections & others (2003) 3 Sri L.R 81

### පසුබිම

මෙම මැතිවරණ පෙත්සමට පසුබිම් වූයේ 2001 දෙසැම්බර් මස 5 වන දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයයි. පෙත්සම්කරු පුත්තලම දිස්ත්‍රික්කය සඳහා එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක ලැයිස්තුවෙන් තරග කරන ලදී. මෙම මැතිවරණයෙන් පෙත්සම්කරු පාර්ලිමේන්තුවට නොතේරුන අතර පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිළධාරී විසින් වෙනත් අපේක්ෂකයකුට සහයෝගය දැක්වීම නිසා තමන්ට පාර්ලිමේන්තුවට යාමට තිබූ අවස්ථාව අහිමි වූ බව පවසමින් මැතිවරණ පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

### මැතිවරණ පෙත්සම

මෙම මැතිවරණ පෙත්සම මගින් මැතිවරණ කොමසාරිස්වරයා සහ පුත්තලම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා 1සහ 2 වගඋත්තරකරුවන්

ලෙසද, 3 සිට 3,5,7,9 වගඋත්තරකරුවන් ලෙස එක්සත් ජාතික පක්ෂයෙන් තරග කර පුත්තලම දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරීපත්වූ මන්ත්‍රීවරුන්ද එම මැතිවරණය සඳහා සියලුම දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් වලින් තරග කරන ලද අපේක්ෂකයන්ද වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි. තමන් මනාප ඡන්ද 35634ක් ලබාගත් බවත් එහෙත් මනාප ඡන්ද 34348 ක් ලබාගත් 3 වන වගඋත්තරකරු විසින් පාර්ලිමේන්තුවට තේරී පත්වූ බවට ප්‍රකාශ කළ බවත් විශේෂයෙන්ම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 53 55 සහ 60 වන වගන්තිවලට අනුකූලව මැතිවරණයේ කටයුතු සිදුකර නොමැති බවත් පැමිණිලිකරු සිය පෙත්සම මගින් චෝදනා කරන ලදී. පුත්තලම දිස්ත්‍රික්කයේ මැතිවරණය ප්‍රතිඵලය අහෝසි කරන ලෙසත්, 3 වන වගඋත්තරකරුගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වීම අහෝසි කරන ලෙසත් තමන් නිසිලෙස පාර්ලිමේන්තුවට පත්වූ බවට ප්‍රකාශ කරන ලෙසත් පෙත්සම්කරු සිය මැතිවරණ පෙත්සම මගින් ඉල්ලා තිබිණි.

## මැතිවරණ පෙත්සම් විභාගය

අභියාචනාධිකරණ විනිසුරු දිසානායක විනිසුරුවරයා විසින් පෙත්සම විභාග කරන ලදී. පෙත්සම් විභාගය ආරම්භයේදීම 3 වන වගඋත්තරකරුගේ නීතිඥයා විසින් මූලික විරෝධතාවන් කිහිපයක් නගන ලදී. එනම්,

❖ මැතිවරණ පෙත්සම් රීති 14ට අනුකූලව මැතිවරණ පෙත්සමේ පිටපතක් සහ පෙත්සමේ දැන්වීමේ පිටපතක් පෙත්සම ගොනුකල දිනයේ සිට දින 10ක් තුළ වගඋත්තරකරුවන්ට භාර නොදීම.

❖ 191 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ අත්‍යවශ්‍ය ප්‍රතිපාදන වලට අනුකූලව පෙත්සම සකස් කර නොතිබීම.

## මැතිවරණ පෙත්සමේ තීරණය

පෙත්සම විභාග කළ අභියාචානාධිකරණ විනිසුරු දිසානායක විනිසුරුවරයා 2003 ජූලි 10 වන දින සිය තීරණය ප්‍රකාශයට පත් කරන ලදී. නඩු ගොනුවේ කාර්යය සටහන් අනුව පෙත්සම ගොනු කර ඇත්තේ 2001 දෙසැම්බර් 31 වන දින බව පෙන්වාදුන් විනිසුරුවරයා එම කාර්ය සටහන් අනුව මැතිවරණ පෙත්සම පිළිබඳ දැන්වීම වගඋත්තරකරුවන්ට භාරදීම පිළිබඳව සාක්ෂි නොමැති බව සඳහන් කරන ලදී. පළමු වරට නඩුව කැඳවූ 2002 මාර්තු 5 වන දින අධිකරණය මගින් 3වන වගඋත්තරකරු වෙත නොතීසි නිකුත් කර තිබේ. නඩු ගොනුවේ කාර්යය සටහන් පරීක්ෂා කිරීමේදී

පෙත්සම්කරුගේ ලේඛන ගත නීතිඥයා විසින් වගඋත්තරකරුවන් සඳහා පෙත්සම පිළිබඳව නිවේදනයන් 2001 ජනවාරි 11 වන දින අධිකරණයට ගොනු කර තිබේ. එහෙත් 3 වන වගඋත්තරකරුගේ නීතිඥ මෝසමක් මගින් කරුණු දක්වා සිටින ලද්දේ තමන්ට දැන්වීම් නොලැබුන බවයි. එය පරීක්ෂා කරන විට පෙනී ගියේ 3වන වගඋත්තරකරුට දැන්වීම යොමුකර ඇත්තේ වැරදි ලිපියනයකට බවයි, මේ අනුව මැතිවරණ පෙත්සම් රීති 14ට අනුකූලව නිවේදනය භාරදීම අනිවාර්යය අවශ්‍යතාවයක් බැවින් මූලික විරෝධතාවයට ඉඩදෙමින් විනිසුරුවරයා පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## 14.7. ශ්‍රේෂ්ඨාධිකරණයට ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීම සඳහා බලය ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 130 වන ව්‍යවස්ථාවෙන් මිස ජනාධිපති මැතිවරණ පනතේ 91 වගන්තියෙන් නොවේ

**සරත් ෆොන්සේකා එදිරිව මහින්ද රාජපක්ෂ සහ තවත් අය**
Sarath Fonseka v. Mahinda Rajapakse and others (2010) 1 Sri LR .376

### පසුබිම

මෙම මැතිවරණ පෙත්සම සඳහා පසුබිම් වූයේ 2010 ජනවාරි 26 වන දින පැවති ශ්‍රී ලංකාවේ 6 වන ජනාධිපතිවරණයයි. මෙම මැතිවරණයෙන් පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් තරග වැදුන මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කළ අතර ඔහු ජනාධිපතිවරයකු ලෙස පත්වීම අභියෝගයට ලක් කරමින් ජනාධිපතිවරණයේ අපේක්ෂකයකු වූ නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ වෙනුවෙන් තරග වැදුන සරත් ෆොන්සේකා ජනාධිපතිවරණ පෙත්සමක් ගොනුකරන ලදී.

### ජනාධිපතිවරණ පෙත්සම

1981 අංක 15 දරණ ජනාධිපතිවරණ මැතිවරණ පනතේ 94(අ) වගන්තිය මගින් සලසා ඇති නීතිමය ප්‍රතිපාදන අනුව ජනාධිපතිවරණ පෙත්සමක් ගොනුකළ යුතු වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙතය. ඒ අනුව 2010 පෙබරවාරි 16 වන ගොනුකරන ලද මෙම පෙත්සම මගින් 1 සිට 21 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබුණේ ජනාධිපතිවරණයට තරග කළ අපේක්ෂකයන්ය. පළවෙනි

වගඋත්තරකරු ලෙස නම්කර තිබුණේ ජනාධිපතිවරණයේ ජයග්‍රාහී අපේක්ෂකයා වූ මහින්ද රාජපක්ෂය. 22 වන වගඋත්තරකරු ලෙස මැතිවරණ කොමසාරිස්වරයා නම්කර තිබිණි. 23 සිට 26 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබුණේ පෙත්සම මගින් දූෂණ ක්‍රියා සිදුකළ බවට චෝදනා කළ පුද්ගලයන්ය.

මෙම පෙත්සම මගින් පෙත්සම්කරු චෝදනා කළ කරුණු අතර සංග්‍රහ කිරීම මගින් තමන් අභිමත අපේක්ෂකයා වළක්වාගනු ලැබීම හේතුවෙන් ජනාධිපති මැතිවරණ පනතේ 91(අ) වගන්තිය යටතේ අපේක්ෂකයකු පත්වීම අවලංගු කළ හැකි බව, ඇතැම් නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක නොවීම මගින් නියමිත ප්‍රතිපත්තිවලට අනුකූලව මැතිවරණය නොපැවැත්වුන හේතුවෙන් පනතේ 91(ආ) වගන්තියට අනුව අපේක්ෂක පත්වීම අවලංගු කළ හැකි බව, 1වන වගඋත්තරකරු සහ ඔහුගේ නියෝජිතයන් පනතේ 91(ඇ) වගන්තියට අනුව දූෂණ ක්‍රියාවන් සිදුකරන ලද හේතුවෙන් පනතේ 91(ඇ) වගන්තියට අනුව අපේක්ෂකයාගේ පත්වූම අවලංගු කළ හැකි බව, යන කරුණු ඉදිරිපත් කරන ලදී.

මැතිවරණය ආශ්‍රිතව සිදුවූ අල්ලස් ලබාදීම්. අයුතු බලපෑම්, ප්‍රචණ්ඩ ක්‍රියාවන් පිළිබඳව ලේඛනයක්ද පෙත්සමට අන්තර්ගත කර තිබිණි. පෙත්සම මගින් පහත ඉල්ලීම් ඉල්ලා තිබිණි.

- 1වන වගඋත්තරකරුගේ පත්වීම බලරහිත කරන ලෙස.
- පෙත්සම්කරු නිසි ලෙස පත්වූ අපේක්ෂකයා බවට ප්‍රකාශයක් සිදුකරන ලෙස.
- මැතිවරණයේ දී භාවිතා කරන ලද ඡන්ද පත්‍රිකා පෙත්සම්කරුගේ නියෝජිතයන් ඉදිරියේ නැවත ගණන් කරන ලෙස 22වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිවරයාට නියෝගයක් ලබාදෙන ලෙස.
- නඩු ගාස්තු ලබාදෙන ලෙස.

## ජනාධිපතිවරණ පෙත්සම් විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු ජේ.ඒ.එන් ද සිල්වා සහ ආචාර්ය ශිරාණි බණ්ඩාරණායක, ශ්‍රීපවන්, රත්නායක සහ ඉමාම් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. පෙත්සම් විභාගය ආරම්භයේදීම වගඋත්තරකරුවන් විසින් පහත සඳහන් මූලික විරෝධතාවයන් නගන ලදී. එනම්,

- ❖ පෙත්සම මගින් ඉල්ලා ඇති සහන නීතිය වරදවා දැක්වීමක් සිදුකර ඇති අතර එම සහන අධිකරණයෙන් ලබාගත නොහැකි බව,
- ❖ අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් වගඋත්තරකරුවන් ලෙස එකතු කිරීමට පෙත්සම්කරු අපොහොසත් වී ඇති බව ,
- ❖ 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනතේ 96(ඇ) වගන්තිය ප්‍රකාරව කරුණු ඉදිරිපත් කිරීමට පෙත්සම්කරු අපොහොසත් වී ඇති බව,
- ❖ පෙත්සම 1981 අංක 15 දරණ පනතේ 96(ඈ) වගන්තියට අනුකූල නොවන අතර පෙත්සම්කරු විසින් චෝදනා කර ඇති දූෂණ හෝ අක්‍රමිකතාවන් එහි විස්තර කර නොමැතිබව,

මේ අනුව මූලික විරෝධතා පිළිබඳව විමසීම 2010 සැප්තැම්බර් 13. 14 සහ 15 යන දිනයන්හිදී සිදුකරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාවය මත අගවිනිසුරු සිල්වා විසින් සිය තීරණය 2010 ඔක්තෝබර් මස 29 වන දින ලබාදෙන ලදී. එහිදී අගවිනිසුරුවරයා සිය තීන්දුවේ සඳහන් කරන ලද්දේ ශ්‍රේෂ්ඨාධිකරණයට ජනාධිපති පෙත්සම් විභාග කිරීම සඳහා බලය ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 130 වන ව්‍යවස්ථාවෙන් මිස ජනාධිපති මැතිවරණ පනතේ 91 වගන්තියෙන් නොවන බවයි. එසේම පනතේ 95(1)(ආ) වගන්තියට අනුව දූෂණ ක්‍රියාවන් සම්බන්ධව චෝදනා කරනු ලබන සියලු පාර්ශවයන් වගඋත්තරකරුවන් ලෙස පෙත්සමට ඇතුළත් කළ යුතු වුවත් ලක්හඬ සහ ස්වාධීන රූපවාහිනිය වගඋත්තරකරුවන් ලෙස එකතු කර නොමැති බව අගවිනිසුරුවරයා සඳහන් කරන ලදී. එසේම පනතේ 94 වගන්තිය යටතේ නැවත ඡන්ද ගණන් කිරීමක් ඉල්ලා සිටිය හැකිවන්නේ බහුතර ඡන්ද නොව නීත්‍යානුකූල ලෙස බහුතර ඡන්ද ලබාගෙන සිටින පරාජිත අපේක්ෂකයකුට පමණක් බවත් අධිකරණය සඳහන් කරන ලදී.

මේ අනුව වගඋත්තරකරුවන්ගේ මූලික විරෝධතාවන්ට ඉඩ ලබාදෙමින් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

### පහළොස්වන පරිච්ඡේදය

# මැතිවරණ ක්‍රියාකාරකම් හා සම්බන්ද සාපරාධී වගකීම්

මැතිවරණ ක්‍රියාවලියක් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ඒ ඒ මැතිවරණ පනත් මගින් එකී ක්‍රියාවලියට බාධාවන් වන ඇතැම් ක්‍රියාවන් සාපරාධී වැරදි ලෙස හඳුන්වාදී තිබේ. එසේම ඇතැම් වෙනත් පනත් මගින්ද මැතිවරණයක් සඳහා බාධාවන ඇතැම් ක්‍රියාවන් සාපරාධි වැරදි ලෙස හඳුන්වාදී තිබේ. මැතිවරණයක් ආශ්‍රිතව සාපරාධි ක්‍රියාවන් පිළිබඳව නීතිමය ප්‍රතිපාදන මෙන්ම එම සාපරාධි ක්‍රියාවන් සම්බන්ධව චෝදනා නැගුනු අවස්ථාවලදී අධිකරණය විසින් ලබාදුන් තීරණ කිහිපයක් පිළිබඳවත් මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලැබේ.

## 15.1. සාපරාධි වගකීම් පැවරෙන මැතිවරණ ආශ්‍රිත ක්‍රියාකාරකම්

මැතිවරණයක් නිදහස්ව සහ සාධාරණව පැවැත්වීම සඳහා මැතිවරණ නීති තුළ මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළද යම් යම් ක්‍රියාවන් සාපරාධි වැරදි ලෙස හඳුනාගෙන තිබේ. එයට අමතරව වෙනත් පනත් මගින්ද එවැනි ක්‍රියාවන් සාපරාධි වැරදි ලෙස හඳුනාගෙන තිබේ.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු පනතේ වැරදි, දූෂණ ක්‍රියා සහ නීති විරෝධි ක්‍රියා යනුවෙන් වර්ග 3ක තහනම් ක්‍රියාවන් හඳුනාගෙන ඇත. පනතේ වැරදි යන්නට නාමයෝජනා සහ ඡන්ද පත්‍රිකා ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීම සහ බලයක් නොමැතිව ලග තබා ගැනීම, මිලදී ගැනීම

හෝ අයතා භාවිතය, ප්‍රජා අශක්නුතා නියම වූ පුද්ගලයන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා ගැනීම, ඡන්ද දිනයේදී ඡන්ද මධ්‍යස්ථානය ආසන්නයේ ඡන්දය ආයාචනය කිරීම හෝ ඡන්දය නොදෙන ලෙස ප්‍රකාශ කිරීම, එවැනි ප්‍රදේශයක ඡන්ද ලකුණු ප්‍රදර්ශනය කිරීම, රංචු ගැසීම හෝ ශබ්දවාහිනී යන්ත්‍රභාවිතය, නාමයෝජනා භාරදීමේ දින සහ ඡන්ද ප්‍රතිඵලය නිකුත් කරන දිනයෙන් සතියක් දක්වා කාලය තුළ දේශපාලන පෙළපාලි පැවැත්වීම, මැතිවරණයට පැය 48 ක කාලය තුළ ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම, ප්‍රකාශකගේ හෝ මුද්‍රණකරුගේ නම නොමැතිව මැතිවරණ ප්‍රචාරක පත්‍රිකා සකස් කිරීම, නියමිත ප්‍රමාණයට වඩා මැතිවරණ ප්‍රචාරක කාර්යාල පවත්වාගෙන යාම, වාහන වල හෝ ප්‍රසිද්ධ ස්ථානවල අපේක්ෂකයාගේ රුව හෝ ඡන්ද ලකුණ ප්‍රදර්ශනය කිරීම, ඡන්දය ආයාචනය කිරීම සඳහා අපේක්ෂකයා ගෙයින් ගෙට යාම, ඡන්දය භාවිතා කිරීමේ රහස්‍යභාවය නොතැකීම, යන ක්‍රියාවන් වැරදි ලෙස හඳුනාගෙන ඇත.

එසේම පනතේ දූෂණ ක්‍රියාවන් ලෙස, හොර ඡන්ද දැමීම, ඡන්දය ලබාගැනීමේ අපේක්ෂාවෙන් සංග්‍රහ කිරීම, අයුතු බලපෑම, අල්ලස් දීම, හඳුනාගෙන ඇත.

එසේම නීති විරෝධී ක්‍රියා ලෙස ඡන්ද හිමියන් ප්‍රවාහනය සඳහා ගාස්තු ගෙවීමට ගිවිසුම්ගතවීම, ඡන්ද ප්‍රචාරක පත්‍රිකා / දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගෙවීමක් සිදුකිරීම සඳහා ගිවිසුමක් ඇති කර ගැනීම, ප්‍රවෘත්ති පත්‍රවල අපේක්ෂකයන් සම්බන්ධ අසත්‍ය වාර්තා පල කිරීම, හඳුනා ගෙන ඇත.

මෙම ප්‍රතිපාදනයන්ට සමාන ප්‍රතිපාදන 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනත තුළද, 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත තුළ සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකරය) පනත තුළද දක්නට ලැබේ. එයට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104උ වන ව්‍යවස්ථාවේ යටතේ මැතිවරණ කොමිෂන් සභාව පනවනු ලබන උපමාණයකට හෝ විධානයකට විරුද්ධව කටයුතු කරන රාජ්‍ය සංස්ථා හෝ රාජ්‍ය සමාගම්වල නිලධාරීන්ද වරදක් සිදුකරන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙයි. එසේම පොදු දේපල විෂයෙහි ලා සිදුකරනු ලබන වැරදි පිළිබඳව පනත තුළ මෙන්ම දණ්ඩ නීති සංග්‍රහය තුළද මැතිවරණ ක්‍රියාවලියට බාධාකාරීවන ඇතැම් ක්‍රියාවන් සාපරාධි වැරදි ලෙස හඳුනාගෙන ඇත.

## 15.2 ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීම වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකි වරදක් නොවේ

**ජයකොඩි එදිරිව කරුණානායක, පොලිස් ස්ථානාධිපති පොල්ගහවෙල සහ නීතිපති**
**Jayakody v. Karunanayake, Officer-in-Charge Police Station, Polgahawela and AG (1994) 2 Sri.L.R.264**

### පසුබිම

පෙත්සම්කාර සුනිල් රංජන් ජයකොඩි 1988 දෙසැම්බර් දක්වාම එක්සත් ජාතික පක්ෂයෙන් පොල්ගහවෙල මැතිවරණ කොට්ඨාශය නියෝජනය කරන ලදී. 1991 මැයි 11 වන දින පැවති පළාත් පාලන මැතිවරණයේදී පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව සඳහා තරඟ කිරීමට ඔහු වෙනත් කණ්ඩායමකට සහය ලබාදී තිබිණි. මැතිවරණ දිනයේදී ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමේ වරදකට පොල්ගහවෙල පොලිස් ස්ථානාධිපති විසින් ඔහුව අත් අඩංගුවට ගෙන තිබිණි. එම ක්‍රියාව මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් බව ප්‍රකාශකරමින් රන්ජන් ජයකොඩි මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකර තිබිණි.

### මූලික අයිතිවාසිකම් පෙත්සම

මෙම පෙත්සම මගින් පොල්ගහවෙල පොලිස් ස්ථානාධිපතිවරයා සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි. මැතිවරණ දිනයේදී ඡන්ද ප්‍රදේශය වටා සංචාරය කිරීමට 1වන වගඋත්තරකරු බාධා කළ බවත් නමුත් අනෙක් දේශපාලන පක්ෂවලට එසේ බාධා නොකළ බවත් චෝදනා කළ පෙත්සම්කරු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ තමන්ම ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමේ චෝදනාව මත අත් අඩංගුවට ගෙන ඡන්ද විමසීම අවසන් වන තුරුම අත්අංඩංගුවේ තබාගත් බවත්ය. ඔහුව අත් අඩංගුවට ගන්නා ලද්දේ වරෙන්තුවක් නොමැතිව බවත් ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමේ වරද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ පනතේ ප්‍රතිපාදන අනුව වරෙන්තුවක් සහිතව අත්අඩංගුවට ගතයුතු වරදක් බවත් ඒ නිසා 1වන වගඋත්තරකරුගේ ක්‍රියාකාරීත්වය හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2), 13(1) සහ 14(1)(ඇ) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති තමාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය.

## මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය

කුලතුංග, අමරසිංහ සහ ධීරරත්න යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ඉදිරියේ මෙම පෙත්සම් විභාගය පවත්වන ලදී. පෙත්සම් විභාගයේදී කරුණු ඉදිරිපත්කළ පෙත්සම්කරු කියා සිටියේ තමන් සහයෝගය දැක්වූ ස්වාධීන කණ්ඩායමේ නාමයෝජනා අත්සන් කිරීමටද වගඋත්තරකරු බාධා කළ බවත්, මැතිවරණ දිනයේදී තමන් ස්වාධීන කණ්ඩායමේ නායකයා සමග ඡන්දපොල නියෝජිතයින් සහ ගණන් කිරීමේ නියෝජිතයින් හමුවී සංචාරය කරන අතරතුර බුද්ධදාස නැමති පුද්ගලයාගේ නිවසේ සිටියදී 1වන වගඋත්තරකරු තමන් සමග ස්වාධීන කණ්ඩායමේ නායකයාව පස්වරු 1.30 ට පමණ අත් අඩංගුවට ගත් බවත් පසුව පස්වරු 3.30 ට පමණ ස්වාධීන කණ්ඩායමේ නායකයාව මුදා හැර තමන්ව පසුදින මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කර රිමාන්ඩ්භාරයට පත් කළ බවත්ය. වගඋත්තරකරුවන්ගේ ස්ථාවරය වූයේ ස්වාධීන කණ්ඩායමේ දෙදෙනෙකු නාමයෝජනා අත්සන් කරන දිනයේදී අත් අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ මෝටර්රථ වාහන පනත යටතේ වරදක් සම්බන්ධයෙන් බවයි. එසේම පෙත්සම්කරු ඡන්ද දිනයේදී ඡන්දදායකයන් ප්‍රවාහනය කරන බවට ලැබුන තොරතුරක් මත ඔහුව අත් අඩංගුවට ගත් බවත් ස්වාධීන කණ්ඩායමේ නායකයාව අත් අඩංගුවට ගැනීමක් නොකළ බවත්ය. වගඋත්තරකරුවන් විසින් ඡන්දදායකයන් තිදෙනෙකුගේ දිවුරුම් ප්‍රකාශද අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

අනෙක් විනිසුරුවරුන් දෙදෙනාගේද එකගතාව මත මූලික අයිතිවාසිකම් පෙත්සමේ තීරණය 1992 නොවැම්බර් 18 වන දින කුලතුංග විනිසුරුවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. එහිදී සිය තීන්දුව මගින් අධිකරණය ප්‍රකාශයට පත් කරන ලද්දේ පෙත්සම්කරු වෙනස්කමකට ලක්කළ බවට සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔහු අපොහොසත් වී ඇති බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 12(2) ව්‍යවස්ථා වගඋත්තරකරු විසින් උල්ලංඝනය කළ බව පිළිගැනීමට නොහැකි බවයි. එසේම වගඋත්තරකරු විසින් 14(1)(ඇ) ව්‍යවස්ථාව උල්ලංඝනය කළ බව අධිකරණය ඉදිරියේ සනාථ කිරීමටද පෙත්සම්කරු අසමත්වී ඇතිබව අධිකරණය ප්‍රකාශ කරන ලදී. නමුත් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනතේ 80(අ) සහ 80(ඇ) අනුව ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමේ වරද වරෙන්තුවක් නොමැතිව අත් අඩංගුවට ගත හැකි වරදක් (සංඥෙය වරදක්)

නොවන බව පිළිගත් අධිකරණය ප්‍රකාශ කරන ලද්දේ පළවෙනි වගඋත්තරකරුගේ නීතිමය වැරදීමකින් 13(1) ව්‍යවස්ථාවේ සඳහන් (අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන් නිදහස) උල්ලංඝනය වී ඇති බවයි. ඒ අනුව පෙත්සම්කරුට වන්දියක් ලෙස රුපියල් 3000ක් ද නඩු ගාස්තු වශයෙන් රුපියල් 500ක් ගෙවන ලෙස නියෝග කළ අධිකරණය මෙම මුදල් රජය විසින් පෙත්සම්කරුට ගෙවිය යුතු බවටද නියෝග කරන ලදි.

## 15.3 රජයේ දේපල පොදු කටයුතු සඳහා යෙදවීම මගින් සාවද්‍ය පරිහරණය සිදු නොවේ

**අනූෂ පැල්පිට එදිරිව නීතිපති**
**Anusha Pelpita v. AG Court of Appeal Case No: CA 413-414 2017 - C.A.M.19.11.2020**

### පසුබිම

2015 ජනවාරි 8 වන දින පැවති ජනාධිපතිවරණයේදී එවකට බලයේ සිටි ජනාධිපතිවරයා ද අපේක්ෂකයකු ලෙස තරඟ කරන ලදී. මැතිවරණය ආසන්නව තිබියදී ජනාධිපති කාර්යාලයේ මෙහෙයවීමෙන් සිල්රෙදි බෙදීමක් සිදුවූ අතර ඒ සඳහා මිලියන 600 පමණ මුදලක් වැයවූ බවට චෝදනා නගන ලදී. එසේම මේ සම්බන්ධව මැතිවරණ නිරීක්ෂකයන් මැතිවරණයට පෙර මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි කර තිබූ තිබුණි. පැෆ්රල් සංවිධානය විසින් 2015 මාර්තු මාසයේදී මෙම සිදුවීමද ඇතුලුව මැතිවරණ සමයේ රාජ්‍ය දේපළ අවභාවිතා කිරීමට එරෙහිව නීත්‍යානුකූල කටයුතු සිදුකරන ලෙස ඉල්ලා මූලික අයිතිවාසිකම් නඩුවක් පවරන ලදී. (SC (FR) 76/2015) එම නඩුවේදී නීතිපතිවරයා එකඟවී ඇත්තේ අදාළ විගණන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවයි.

### මහාධිකරණයේ අධිචෝදනා

මේ සම්බන්ධයෙන් නීතිපති විසින් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ එවකට හිටපු අධ්‍යක්ෂක ජනරාල් අනූෂ පැල්පිට සහ එවකට ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග යන දෙදෙනාට අධිචෝදනා ඉදිරිපත් කරන ලදී. එම අධිචෝදනාවන්ට ඇතළත් වූයේ

- ❖ 2014 ඔක්තෝබර් 30 සහ 2015 ජනවාරි 15 අතර කාලය තුළ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අයත් මිලියන 600ක මුදලක් එම පනතේ ප්‍රතිපාදනවලට පටහැනිව ජනාධිපති ලේකම් නමින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට ප්‍රේෂණය කිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 113(ආ) (කුමන්ත්‍රණය කිරීම) සහ 102 (අනුබල දීමේ ප්‍රතිඵලයක් ලෙස වරද සිදුකිරීම) වගන්ති සමග කියවිය යුතු 386 වගන්තිය (දේපල වංක ලෙස සාවද්‍ය පරිහරණය) යටතේ වරදක් සිදුකිරීම.
- ❖ පළවෙනි චූදිත විසින් එම අවස්ථාවේදීම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට අයත් මිලියන 600ක මුදලක් එම පනතේ ප්‍රතිපාදන වලට පටහැනිව සිල්රෙදි බෙදාදීමේ වැඩසටහනක් සඳහා ජනාධිපති ලේකම් නමින් පවත්වාගෙන යන ගිණුමකට ප්‍රේෂණය කර දණ්ඩ නීති සංග්‍රහයේ 386 වගන්තිය යටතේ වරදක් සිදුකිරීම.
- ❖ දෙවන චූදිත විසින් එම අවස්ථාවේදීම පළවෙනි චූදිත අනුබල දීම මගින් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වගන්තිය යටතේ සහ 386 වගන්තිය යටතේ වරදක් සිදුකිරීම.

## මහාධිකරණ නඩු විභාගය

අංක HC 8086/2015 ලෙස අංකනය කරන ලද මෙම නඩුවේ අවසන් කොටස කොළඹ මහාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග ඉදිරියේ විභාග කරන ලදී. නඩු විභාගයේදී පැමිණිල්ල විසින් පැමිණිල්ලේ සාක්ෂිකරුවන් 10 ක් කැඳවන ලද අතර, ඒ අතර මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති (එවකට මැතිවරණ කොමසාරිස්) මහින්ද දේශප්‍රියද විය.

විත්තිය වෙනුවෙන් පළවෙනි චූදිත විත්තිකූඩුවේ සිට ප්‍රකාශයක් ලබාදීමෙන්ද, දෙවන විත්තිකරු සාක්ෂිකූඩුවට නැග සාක්ෂි ලබාදීමෙන්ද විත්තියේ සාක්ෂි අවසන් කරන ලදී.

පසුව දෙපාර්ශවයම ලිඛිත දේශන ගොනු කරන ලදී.

## මහාධිකරණයේ තීරණය

නඩු විභාගය අවසානයේ මහාධිකරණ විනිසුරු ගිහාන් කුලතුංග විසින් 2017 සැප්තැම්බර් 07 දින සිය තීන්දුව ප්‍රකාශයට පත් කරන ලදී. එහිදි විනිසුරුවරයා සිය තීන්දුව මගින් අවධාරණය කළේ

අධිකරණයේ ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව ඡන්ද විමසීම් කාලසීමාව තුළ කිසිදු ස්ථානයක සහනාධාර බෙදීම් ව්‍යාපෘති අත්හිටවිය යුතු බවටත්, කල්තැබිය නොහැකි හදිසි ව්‍යාපෘති පමණක් සිදුකරන ලෙසටත්, මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කළ චක්‍රලේඛනයක් නිකුත් වී ඇති බවයි. මෙම සිල් රෙදි බෙදීමේ කිසිඳු ආකාරයක හදිසි හෝ කල්තැබිය නොහැකි ව්‍යාපෘතියක් නොවන බව ද විනිසුරුවරයා අවධාරණය කර ඇත. එසේම මෙම මුදල් සැපයීම සිදුකර ඇත්තේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සී.එස්.ආර් වැය ශීර්ෂය (සාමූහික සමාජ වගකීම්) යටතේ බවත් එම වැය ශීර්ෂය සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය මගින් වෙන් කර ඇති මුදල මිලියන 100ක් බවත් එම මුදල ඒ වන විටත් අවසන්ව තිබූ බවත් ඒ මුදල මෙන් 6 ගුණයක මුදලක් 2වන චූදිතගේ ඉල්ලීම මත පළවෙනි චූදිත විසින් ජනාධිපති ලේකම්ගේ ගිණුමට ප්‍රේෂණය කර ඇති බව හෙලිදරව් වී ඇති බවත් විනිසුරුවරයා දක්වා ඇත. එසේම 2වන චූදිත ජනාධිපති ලේකම්වන අතර නිලබලයෙන් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිද වේ.

එසේම සිල් රෙදි සමග නිකුත් කර තිබුණ පත්‍රිකාවට අවධාරණය කළ විනිසුරුවරයා ප්‍රකාශ කළේ එහි සඳහන් වූ "මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපත්ති වලට අනුව දැහැමි රටක් තිරසාර පැවැත්මක් සහ එකී අභිවෘද්ධිය තහවුරු කරනු වස් සකස්කරන ලද දහම් පඬුරක් වශයෙන්" යනුවෙන් සඳහන් කිරීමෙන් මැතිවරණ කොමසාරිස්වරයාගේ චක්‍රලේඛන කඩ කිරීමක් සිදුවන සිදුවන බවයි. එම චක්‍රලේඛනය අනුව මෙම ව්‍යාපෘතිය නැවැත්විය යුතු වුවත් එසේ නොකර 2015 ජනවාරි 5 වන දිනට යෙදෙන පෝය දිනයේත් මෙම කටයුතු සිදුකර ඇති  බව විනිසුරුවරයා තීන්දුවේ දක්වා තිබිණි. එම දිනය ඡන්ද දිනයට ඉතාම ආසන්න දිනයකි.

විත්තිකරුවන් පෞද්ගලික පරිහරණයට හෝ ඔවුන් වෙත සෘජුව ලබාගැනීමක් සිදුවී නැති බව සඳහන් කළ විනිසුරුවරයා යම් ආකාරයකට නිල මට්ටමින් සැලකිලි කරමින් තිබූ ව්‍යාපෘතියක් නීති විරෝධී ආකාරයකට මැතිවරණ කාලයක දී යොමු කිරීමක් සිදු කර ඇත. එය අපරාධ නීතිය අනුව සාපරාධී සාවද්‍ය පරිහරණය වන බව තීන්දුවේ දක්වා ඇත.

ඒ අනුව චෝදනා තුනටම චූදිතයින් වරදකරුවන් වී ඇති බව ප්‍රකාශ කරන ලදී. එම තීරණය අනුව පළවෙනි චෝදනාවට වැරදිකරු වීම හේතුවෙන් දෙදෙනාටම වසර 1 1/2ක සිරදඬුවම් සහ රුපියල් ලක්ෂ

10ක දඩ මුදල් නියම කරන ලදී. දෙවන චෝදනාව සඳහා වසර 1 1/2 සිරදඬුවම් සහ රුපියල් ලක්ෂ 5 බැගින් දඩ මුදල් නියම කරන ලදී. තුන්වන චෝදනාවට ද 1 1/2 සිරදඬුවම් සහ රුපියල් ලක්ෂ 10 බැගින් දඩ මුදල් නියම කරන ලදී.

එයට අමතරව ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය නිසා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සිදුවූ හානිය වෙනුවෙන් වන්දියක් ලෙස දෙවන විත්තිකරු විසින් රුපියල් මිලියන 100ක වන්දියක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු බවටද නියෝග කරන ලදී.

## අභියාචනය

මහාධිකරණයේ මෙම තීරණයට එරෙහිව ලලිත් වීරතුංග සහ අනූෂ පැල්පිට අභියාචනාධිකරණයට අභියාචනයක් ගොනුකරන ලදී. එය CA 413-414 2017 ලෙස අංකනය වී තිබිණි. අභියාචනාධිකරණ විනිසුරුවරුවරුන් වන කුමුදුනී වික්‍රමසිංහ සහ දේවිකා අබේරත්න යන විනිසුරුවරියන් ඉදිරියේදී මෙම අභියාචනය විභාග විය.

අබේරත්න විනිසුරුතුමියගේද එකඟතාව මත කුමුදුනී වික්‍රමසිංහ විනිසුරුතුමිය විසින් අභියාචනා තීන්දුව 2020 නොවැම්බර් මස 19 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

අධිකරණය ප්‍රකාශ කරන ලද්දේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පනත යටතේ මෙම සිල්රෙදි බෙදාදීමේ කටයුත්ත සඳහා වියදම් කිරීමට කොමිසමේ මුදල් වියදම්කිරීම අනුමැතිය දිය හැකි වියදමක් බවයි. එසේම සිල්රෙදි බෙදාදීමේ ව්‍යාපෘතිය 2014 මාර්තු මාසයේ සිට සැලසුම්වන ව්‍යාපෘතියක් බවට මහාධිකරණයේදී සාක්ෂි ලබාදී ඇති බවද, අධිකරණය අවධාරණය කරන ලදී. එසේම දණ්ඩ නීති සංග්‍රහයේ 386 වගන්තියට අනුව දේපළ වංක ලෙස සාවද්‍ය පරිහරණය යන වරද සිදුකිරීමට නම් යම් චංචල දේපළක් සාවද්‍ය ලෙස පරිහරණය කරන්නා වූ තැනැත්තා සිය ප්‍රයෝජනයට ගත යුතු බවත් මෙම සිදුවීමේදී අභියාචකයින් අදාළ මුදල් සිය පරිහරණයට ගෙන නොමැති බවත්, අධිකරණය අවධාරණය කරන ලදී. ඒ අනුව මෙම චෝදනාවන්ට සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වී නොමැති බව ප්‍රකාශ කළ විනිසුරුතුමිය අභියාචනා පෙත්සම පිළිගන්නා ලදී. ඒ අනුව මෙම අභියාචකයින් දෙදෙනා නිදොස්කොට නිදහස් විය.

දහසයවන පරිච්ඡේදය

# දේශපාලන පක්ෂයෙන් නෙරපීමේදී මන්ත්‍රීධූරය අහිමිවීම

කේවල මන්ත්‍රී ආසන ක්‍රමයෙන් සමානුපාතික නියෝජන ක්‍රමයට ඡන්ද ක්‍රමය මාරුවීමත් සමග මැතිවරණයකදී ප්‍රමුඛ වන්නේ අපේක්ෂයාද, නැත්නම් පක්ෂයද යන්න පිළිබඳ ගැටලුවක් පැන නැගී ඇත. කෙසේ නමුත් වර්ථමාන මැතිවරණ ක්‍රමය තුළ ඡන්දය භාවිතා කිරීමේදී පළමුව තෝරාගනු ලබන්නනේ දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායමයි. එයට අදාළ අපේක්ෂකයා තෝරාගනු ලබන්නේ දෙවනුවයි. අපේක්ෂයකු නොමැතිව පක්ෂයකට ඡන්දයක් දීමට හැකි වුවත් පක්ෂයක් සඳහා ඡන්දය නොදී අපේක්ෂකයකුට ඡන්දය භාවිතා කිරීමේ හැකියාවක් වර්තමාන ඡන්ද ක්‍රමය තුළ නැත. එබැවින් තේරී පත්වූ අපේක්ෂයකුට තමන් තේරිපත්වූ පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සමග විශාල බැඳීමක් ඇත. පක්ෂයෙන් නෙරපීම මගින් මන්ත්‍රීධූරය අහෝසි වීම පිළිබඳව පවතින නීතිමය ප්‍රතිපාදන සහ පක්ෂයෙන් නෙරපීමේ තීරණ අභියෝගයට ලක්කළ මන්ත්‍රීවරුන් ගත් අධිකරණ ක්‍රියාමාර්ග කිහිපයක අධිකරණ තීන්දු මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලැබේ.

## 16.1. දේශපාලන පක්ෂයෙන් නෙරපීමකදී මන්ත්‍රීධූරය සම්බන්ධ නීති තත්ත්වය

1977 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදීමත් සමග මැතිවරණ ක්‍රමයේද වෙනසක් සිදුවිය. ඒ අනුව එතෙක් පැවති කොට්ඨාශ ක්‍රමය වෙනුවට සමානුපාතික මැතිවරණ ක්‍රමය හඳුන්වාදෙන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන පරිදි නව පාර්ලිමේන්තු මැතිවරණ පනතක්

සම්මත කළ අතර එතෙක් පැවති පාළාත් පාළන ආයතන ඡන්ද විමසීමේ ආඥා පනතද සංශෝධනය කරන ලදී. පළාත් සභා ඡන්ද විමසීමේ පනත සම්පාදනය කරන අවස්ථාවේදීම සමානුපාතික ක්‍රමයට අනුකූල වන පරිදි සකස් කරන ලදී.

ඒ අනුව ඡන්දදායකයකු ඡන්දය ලබාදීමේදී මූලින්ම ඡන්දය ප්‍රකාශ කරන්නේ අදාළ දේශපාලන පක්‍ෂය වෙතය. එබැවින් දේශපාලන පක්‍ෂයට මෙම මැතිවරණ ක්‍රමය යටතේ විශාල බලයක් ලැබේ. ඒ අනුව මන්ත්‍රීධූරයක් දරන්නේ දේශපාලන පක්‍ෂයේ/ස්වාධීන කණ්ඩායමේ සාමාජිකත්වය දරණ තෙක් පමණි. දේශපාලන පක්‍ෂයේ /ස්වාධීන කණ්ඩායමේ සාමාජිකයත්වයෙන් ඉවත් වුහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් මන්ත්‍රීධූරයද අහෝසි වේ.

මේ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13(අ) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ "යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ඔහු එසේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ අවස්ථාවේ දී ඔහුගේ නම ඇතුළත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක (මෙහි මින්මතු "අදාළ නාමයෝජනා පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) නාමයෝජනා පත්‍රයේ ද ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ හෝ සාමාජිකයකුව සිටීම, ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හෝ අන් හේතුවක් නිසා හෝ නතර වූ අවස්ථාවක, ඔහු එසේ සාමාජිකයකුව සිටීම නතර වූ දින සිට එක් මාසයක කාල සීමාවක් ඉකුත් වූ විට ඔහුගේ අසුන හිස් වන්නේ ය:

එසේ වුව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පක්ෂයෙන් පහකරනු ලැබූ අවස්ථාවක, ඉහත කී මාසයක කාල සීමාව ඉකුත් වීමට පෙර ඔහු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඉල්ලීමක් කළහොත් සහ ඒ පහකිරීම වලංගු නොවන බව ඒ ඉල්ලීම මත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළහොත් ඔහුගේ අසුන හිස් නොවන්නේ ය. ඒ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් විභාග කළ යුතු අතර, පෙත්සම ඉදිරිපත් කළ තැන් පටන් මාස දෙකක කාල සීමාවක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දෙනු ලැබිය යුත්තේ ය. ඒ පහකිරීම වලංගු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ තීරණයේ දිනයේ සිට ඒ අසුන හිස් වන්නේ ය." යනුවෙනි.

මේ අනුව පක්ෂයකින් මන්ත්‍රීවරයකු ඉවත් කිරීම පිළිබඳව අවසන් වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සලසා ඇත.

## 16.2 පක්ෂ ව්‍යවස්ථාවට අනුකූලව විනය තීරණ අනුව පක්ෂයෙන් නෙරපීම නීත්‍යානුකූල වේ.

**ගාමිණී දිසානායක එදිරිව එම්.සී.එම්.කලීල් සහ තවත් අය.**
**Gamini Dissanayake v. M. C. M. Kaleel and Others (1993) 2 Sri L.R. 135.**

### පසුබිම

1991 අගෝස්තු මාසයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 38 (2) (අ) ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමක් ජනාධිපතිවරයාට එරෙහිව දෝශාභියෝග යෝජනාවක් ගෙන එන ලදී. 1991 අගෝස්තු 28 වනදායින් පසුව ඇතැම් මන්ත්‍රීවරුන් මෙම දෝශාභියෝගයට අත්සන් නොකළ බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව දෝශාභියෝගයේ අත්සන් ප්‍රමාණවත් නොවීම යන හේතුව මත කථානායක වරයා භාරගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.

1998 අගෝස්තු 30 වනදින ජනාධිපති විසින් පාර්ලිමේන්තුවේ වාර අවසාන කරන ලදී. ඒ අනුව නැවත රැස්වන දිනය වූයේ 1991 ජූනි 9 වනදාය. මෙම කාලය අතරතුර පෙත්සම්කරු ඇතුලු කණ්ඩායම් ප්‍රසිද්ධ රැස්වීම් රැසක් පවත්වන ලදී. එම රැස්වීම්වලදී ජනාධිපතිවරයාගේ ක්‍රියාකාරකම් පිළිබඳව සහ විධායක ජනාධිපතිධූරය අහෝසි කිරීම පිළිබඳව විවේචන ඉදිරිපත් කරන ලදී. කෙසේ නමුත් දෝශාභියෝගය ගෙන ඒමට කටයුතු කිරීම මත එවකට රාජ්‍ය අමාත්‍යවරයකු වූ ගාමිණී දිසානායක කැබිනට් අමාත්‍යවරුන් වූ ලලිත් ඇතුලත්මුදලි සහ ප්‍රේමචන්ද්‍ර ඇතුලු මන්ත්‍රීවරුන් 8 දෙනෙකුගේ පක්ෂ සාමාජිකයත්වය තහනම් කිරීමට එක්සත් ජාතික පක්ෂය කටයුතු සම්පාදනය කරන ලදී.

1991 ජූනි 5 වන දින පෙත්සම්කාර ගාමිණී දිසානායක විසින් තමන්ව එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බවත් එය වළක්වාලන නියෝගයක් නිකුත් කරන ලෙසත් ඉල්ලා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරන ලදී. 1991 ජූනි 6 වන දින කොළඹ දිසා

අධිකරණය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී. පෙත්සම්කරු එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත යාමටත් පෙර එදිනම සවස රැස්වූ එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී කමිටුව පෙත්සම්කරු ඇතුලු මන්ත්‍රීවරුන් 8 දෙනෙකු පක්ෂයෙන් නෙරපීමේ යෝජනාව සම්මත කරන ලදී.

එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වූයේ ලලිත් ඇතුලත්මුදලි (කොළඹ දිස්ත්‍රික්කය), ප්‍රේමරත්න ගුණසේකර (කොළඹ දිස්ත්‍රික්කය), ගාමිණී දිසානායක (නුවරඑළිය දිස්ත්‍රික්කය), පී.එම්.ප්‍රේමචන්ද්‍ර(කුරුණෑගල දිස්ත්‍රික්කය), සමරවීර වීරවන්නි(බදුල්ල දිස්ත්‍රික්කය), ලක්ෂ්මන් සෙනවිරත්න (බදුල්ල දිස්ත්‍රික්කය), චන්ද්‍රා ගන්කන්ද(රත්නපුර දිස්ත්‍රික්කය), වින්සන්ට් පෙරේරා (කෑගල්ල දිස්ත්‍රික්කය). එක්සත් ජාතික පක්ෂ ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා නිලබලයෙන් පක්ෂ නායකයා වේ. එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වූ සියලු දෙනා පක්ෂයේ ව්‍යවස්ථාව අනුගමනය කිරීමට බැඳී සිටියි. ඒ අනුව විපක්ෂයේ මන්ත්‍රීවරුන් සමග එක්වී නීත්‍යානුකූල ලෙස ඡන්දයෙන් ජනාධිපතිධූරයකට පත් පක්ෂයේ නායකයා නෙරපීම සඳහා කටයුතු කිරීමේ චෝදනාව මත එම පිරිස පක්ෂයෙන් ඉවත්කළ බවට යෝජනාවේ ඇතුළත් විය.

කැබිනට් අමාත්‍යවරුන් වූ ලලිත් ඇතුලත්මුදලි සහ ප්‍රේමචන්ද්‍ර යන දෙදෙනාට අමතර චෝදනාවක් ලෙස 1991 අගොස්තු 28 වන දින පැවති කැබිනට් රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය නොමග යැවීම පිළිබඳව චෝදනාවක්ද මෙම යෝජනාවේ ඇතුළත් විය.

මෙවැනි චෝදනාවන් 9 ක් ඇතුළත්වූ පක්ෂයෙන් නෙරපීමේ යෝජනාව අනුව 1991 සැප්තැම්බර් 6 වන දින සිට මෙම 8 දෙනාගේ පක්ෂ සාමාජිකත්වය තහනම් කරන ලදී. 1991 සැප්තැම්බර් 7 වන දින රාත්‍රී 7.30 පමණ රැස්වූ පක්ෂයේ ජාතික විධායක සභාවේ සාමාජිකයන් 2500ක් විසින් එම යෝජනාව අනුමත කරන ලදී. පසුව මන්ත්‍රීවරුන් 8 දෙනා වෙත ඔවුන් පක්ෂයෙන් ඉවත්කළ බවට වූ දැන්වීම ලබාදෙන ලදී. එම යෝජනාව අනුව මන්ත්‍රීවරුන් 8 දෙනා පක්ෂයෙන් ඉවත් කළ බව පක්ෂයේ මහලේකම් විසින් 1991 සැප්තැම්බර් 9 වන දින පාර්ලිමේන්තු මහලේකම් වෙත යොමුකරන ලදී.

පාර්ලිමේන්තුව 1991 සැප්තැම්බර් 24 වන දින නැවත රැස්වන ලදී. ඔක්තෝබර් 8 වන දින කථානායකවරයා ප්‍රකාශ කරන ලද්දේ 1991 අගෝස්තු 4 වන දින භාරදුන් දෝෂාභියෝගයට විභාගයට ගැනීමට තරම් අත්සන් නොමැති නිසා ප්‍රතික්ෂේප කරන බවයි.

## ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ අභියාචනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13)(අ) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන භාවිතා කරමින් ගාමිණී දිසානායක ඇතුලුව එක්සත් ජාතික පක්‍ෂයෙන් ඉවත්කළ මන්ත්‍රිවරුන් 8 දෙනා විසින් ශ්‍රේෂ්ඨාධිකරයේ විශේෂ අභියාචනා පෙත්සම් 8 ක් ගොනු කරන ලදී. මෙම පෙත්සම් මගින් ඔවුන් ප්‍රකාශ කළ කරුණු අතර කොළඹ දිසා විනිසුරුවරයා පක්‍ෂග්‍රාහී ලෙස කටයුතු කිරීම, එක්සත් ජාතික පකෂයේ ක්‍රියාකාරී කමිටුව විසින් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය වන පරිදි සිය පක්‍ෂ සාමාජිකයත්වය අහෝසි කිරීම යන කරුණු මූලිකව ඉදිරිපත් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ අභියාචනා විභාගය

ශ්‍රේෂ්ඨාධිකරණයේදී මෙම අභියාචනා පෙත්සම් 8 ම එක්ව විභාගයට ගන්තා ලදී. අභියාචනා විභාග කරන ලද්දේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මාර්ක් ප්‍රනාන්දු, විනිසුරු කුලතුංග සහ විනිසුරු වඩුගපිටිය යන ත්‍රිපුද්ගල විනිශ්චය සභාව විසිනි.

පෙත්සම් විභාගයේදී එක්සත් ජාතික පකෂයේ පක්‍ෂ ව්‍යවස්ථාව මගින් පක්‍ෂයේ ක්‍රියාකාරී කමිටුවට සහ ජාතික විධායක සභාවට ලැබී ඇති බලතල සහ විශේෂයෙන් පක්‍ෂ සාමාජිකයකු ඉවත් කිරීමේ බලතල පිළිබඳව කරුණු ඉදිරිපත් විය. එසේම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ මන්ත්‍රිවරයකු සහ ඔහු පත්වූ දේශපාලන පකෂයට ඔහු සම්බන්ධයෙන් ඇති පාලනය පිළිබඳව කරුණු සාකච්ඡා විය.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

මෙම නඩු විභාගය අවසානයේ 1991 දෙසැම්බර් 3 වන දින අධිකරණයේ තීරණය ලබාදෙන ලදී. ඒ අනුව මෙම විභාගය අවසානයේදී මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා එක් තීරණයක්ද කුලතුංග විනිසුරුවරයා එක් තීන්දුවක් ද ප්‍රකාශයට පත් කරන ලදී. ප්‍රනාන්දු විනිසුරුවරයා සිය තීන්දුව මගින් අංක 5 සහ අංක 8 යන පෙත්සම් භාරගැනීමටත් අනෙක් පෙත්සම් ප්‍රතික්ෂේප කිරීමටත් තීරණය කළ අතර කුලතුංග විනිසුරුවරයාගේ තීරණයෙන් සියලුම පෙත්සම් ප්‍රතික්ෂේප කිරීමට තීරණය විය. වඩුගොපිටිය විනිසුරුවරයා එගකවූයේ කුලතුංග විනිසුරුවරයාගේ තීරණයටයි. ඒ අනුව පෙත්සම් සියල්ල නිශ්ප්‍රභා කරන ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය**

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵලය අනුව අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධුර අහෝසි විය. පසුව එම මන්ත්‍රීවරුන් වෙනුවට නව මන්ත්‍රීවරුන් 8 දෙනෙකු මැතිවරණ කොමසාරිස්වරයාගේ 1991 දෙසැම්බර් 5 වන දින අංක 691/10 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පත්කරන ලදී.

එසේ පත් කරන ලද නව මන්ත්‍රීවරුන් වුයේ හඩ්සන් සමරසිංහ (කොළඹ දිස්ත්‍රික්කය - ලලිත් ඇතුලත්මුදලි වෙනුවට), ශ්‍රීනාත් ලාලක කුමාරසිංහ (කොළඹ දිස්ත්‍රික්කය - ප්‍රේමරත්න ගුණසේකර වෙනුවට), මුතු සිවලිංගම් (නුවරඑළිය දිස්ත්‍රික්කය - ගාමිණී දිසානායක වෙනුවට), ආර්.එම්.ආර්.සී බණ්ඩාර(කුරුණෑගල දිස්ත්‍රික්කය - පී.එම්.ප්‍රේමචන්ද්‍ර වෙනුවට), ආර්.එම්.අප්පුහාමි (බදුල්ල දිස්ත්‍රික්කය - සමරවීර වීරවන්නි වෙුනවට), ටිරාන් සේන්නන් (බදුල්ල දිස්ත්‍රික්කය - ලක්ෂ්මන් සෙනවිරත්න වෙනුවට), එච්.එම්.උපනන්ද සිල්වා (රත්නපුර දිස්ත්‍රික්කය - චන්ද්‍රා ගන්කන්ද වෙනුවට), ෂර්ලි මහින්ද සෙනවිරත්න (කෑගල්ල දිස්ත්‍රික්කය - වින්සන්ට් පෙරේරා වෙනුවට) (1991 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව.1992.කොළඹ.28)

## 16.3. විනය පරීක්ෂණයක් සිදු නොකර පක්ෂයෙන් නෙරපීම නීත්‍යානුකූල නොවේ.

**සරත් අමුණුගම සහ තවත් අය එදිරිව කරු ජයසූරිය සභාපති, එක්සත් ජාතික පක්ෂය**

**Sarath Amunugama and Others V. Karu Jayasurtya, Chairman, United National Party and Others (2002) 1 Sri L.R. 26**

**පසුබිම**

සරත් අමුණුගම, නන්ද මැතිව්, විජේපාල මෙන්ඩිස්, සුසිල් මුණසිංහ සහ චූලා බණ්ඩාර යන පෙත්සම්කරුවන් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විය. 1999 නොවැම්බර් 8 වන දින එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්වරයා ඔවුන් වෙත ලිපියක් යොමුකරමින් කියා සිටියේ 1999 ඔක්තෝබර් 21 පැවති පක්ෂ ක්‍රියාකාරී කමිටුවේදී මෙවර ජනාධිපතිවරණය සඳහා පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් කිරීමට පක්ෂය තීරණය කරන ලද බවත් ඒ පිළිබඳව ඔක්තෝබර් 31 වන දින සියලුම මන්ත්‍රීවරුන්ට දැනුම්දුන් බවත් මාධ්‍ය වෙතද ප්‍රකාශ කළ බවත් 1999

නොවැම්බර් 8 වන දින උදෑසන පැවති පක්ෂ ක්‍රියාකාරී කමිටුවේදී ඔබ විසින් පක්ෂයේ පූර්ව අවසරයකින් තොරව ජනාධිපති ලෙස රනිල් වික්‍රමසිංහට විරුද්ධව තරඟ කරන වර්තමාන ජනාධිපතිවරිය 1999 නොවැම්බර් මස 5 වන දින හමුවී සාකච්ඡා කර ඇති බවත් ජනාධිපතිවරණයේදී ඇයට සහය දීමට පොරොන්දු වී ඇති බවත් එය එක්සත් ජාතික පක්ෂයේ ව්‍යවස්ථාව දැඩි ලෙස උල්ලංඝනය කිරීමක් බැවින් පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීමට ක්‍රියාකාරී කමිටුව තීරණය කළ බවත් දැනුම්දී ඇත. පක්ෂ මහ ලේකම්ගේ මෙම තීරණයට එරෙහිව පෙත්සම්කරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ ඉල්ලීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 93(13)(අ) ව්‍යවස්ථාවට අනුව පක්ෂය විසින් තමන් ඉවත් කිරීමට විරද්ධව පෙත්සම්කරුවන් 4 දෙනෙක් පෙත්සම් 4ක් 1999 දෙසැම්බර් 5 වන දින ඉදිරිපත් කරන ලද අතර 5 වන පෙත්සකම්කරු සිය පෙත්සම දෙසැම්බර් 7 වන දින ඉදිරිපත් කරන ලදී. පෙත්සම් මගින් ඔවුන් කියා සිටින ලද්දේ එක්සත් ජාතික පක්ෂය විසින් ඔවුන්ගේ පක්ෂ සාමාජිකත්වය අහිමි කිරීමේ තීරණය වලංගු නොවන බවත් එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී කමිටුවේ තීරණය නීතිමය බලපෑමක් නොමැති බවත් තමන් තවමත් එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් බවත් ප්‍රකාශ කරන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.

## පෙත්සම් විභාගය

මෙම පෙත්සම් 5ම එක්ව විභාගයට ගන්නා ලදී. වැඩබලන අගවිනිසුරු අමරසිංහ, විනිසුරු බණ්ඩාරණායක සහ විනිසුරු ස්මයිල් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරන් විසින් මෙම පෙත්සම් විභාග කරන ලදී.

පෙත්සම්කරුවන්ට එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව තිබූ චෝදනා අතර ප්‍රධාන චෝදනාවන් වූයේ පක්ෂයේ අනුමැතියකින් තොරව ජාතික ආණ්ඩුවක් පිහිටුවීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කිරීම සහ තමන්ගේ ජාතික ආණ්ඩු සංකල්පයට ප්‍රතිචාර දැක්වීමට එක්සත් ජාතික පක්ෂය අපොහොසත් වන්නේ නම් තමන් පක්ෂයෙන් ඉවත් වන බවට බීබීසී වෙත ප්‍රකාශ කිරීම දක්වා තිබිණි.

පෙත්සම්කරුවන් විසින් අධිකරණයට අවධාරණය කළ කරුණ වූයේ එක්සත් ජාතික පක්ෂය විසින් තමන්ගේ සාමාජිකත්වය අහිමි කිරීමේ තීරණයට එළඹීමේ දී ක්‍රියාවලිය යුක්ති සහගතව සිදු නොවූ බව සහ දෙපාර්ශවයට සවන්දීමේ සිද්ධාන්තය උල්ලංඝනය කර ඇති බවයි. එසේම අදාළ තීරණය අසාධාරණ බවට පෙත්සම්කරුවන් විසින් පහත කරුණු ඉදිරිපත් කර තිබිණි.

- ❖ පක්ෂ ව්‍යවස්ථාවට අනුව පක්ෂ ක්‍රියාකාරී කමිටුව විනය කමිටුවක් පත් කර විනය විරෝධි හැසිරීම් පිළිබඳ පරීක්ෂණ කළ යුතුය.
- ❖ පෙත්සම්කරුවන්ට එරෙහිව එවැනි විනය පරීක්ෂණයක් සිදුකළ බව දැනගැනීමට ලැබී නැත.
- ❖ පෙත්සම්කරුවන්ගෙන් කිසිඳු නිදහසට කරුණක් ඉදිරිපත් කරන ලෙස දැනුම්දී නැත.
- ❖ චෝදනාපත්‍රයක් ඉදිරිපත් කර නැත.
- ❖ විනය පරීක්ෂණයක් සිදුකරන දිනයක් වේලාවක් පෙත්සම්කරුවන්ට දැනුම්දී නැත.
- ❖ පෙත්සම්කරුවන්ට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වා නැත.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

පෙත්සම් විභාගයේ තීරණය 2000 පෙබරවාරි මස 3 වන දින අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව මත වැඩබලන අගවිනිසුරු අමරසිංහ විසින් ලබාදෙන ලදී. එහිදී විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ පක්ෂ ව්‍යවස්ථාවට අනුව විනය පරීක්ෂණ කමිටුවක් පක්ෂ ක්‍රියාකාරී කමිටුව විසින් පත් කිරීම අනිවාර්යය බවත් එය සිදුකළ නොමැති බවත්ය. එසේම මෙම පක්ෂ සමාජිකත්වය තහනම් කිරීම සමාන්‍ය අවශ්‍යතාවක් නොව හදිසියේ සිදුකළ යුතු ක්‍රියාවක් බවට වගඋත්තරකරුවන් අධිකරණය සෑහීමකට පත් කිරීමට අපොහොසත් වී ඇති බවයි. ඒ අනුව ස්වභාවික යුක්තියේ මූලධර්ම පිළිපැදීමට සහ පෙත්සම්කරුවන් නෙරපා හැරීමට පෙර පරීක්ෂණයක් ලබාදීමට අපොහොසත්වීම වගඋත්තරකරුවන් විසින් පෙත්සම් විභාගය තුළ සාධාරණීකරණය නොකළ බැවින් නෙරපා හැරීමද අවලංගුවන බවයි.

ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13)(අ) ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පෙත්සමේ තීන්දුව ලබාදුන් විනිසරුවරයා පෙත්සම්කරුවන් 5දෙනාව එක්සත් ජාතික පක්ෂයෙන් නෙරපා හැරීමේ තීරණය අවලංගු වන බවට තීරණය කරන ලදී.

# 16.3 ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කරමින් සිදුකරන විනය පරීක්ෂණ මගින් පක්ෂයෙන් නෙරපීම නීත්‍යානුකූල නොවේ

**රඹුක්වැල්ල එදිරිව එක්සත් ජාතික පක්ෂය**
Rambukwella v United National Party and others (2007) 2 Sri L.R.329

## පසුබිම

පෙත්සම්කරු එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ අතර, 2000, 2001 සහ 2004 වර්ෂවල පැවති පාර්ලිමේන්තු මැතිවරණයන්හිදී මහනුවර දිස්ත්‍රික්කයෙන් තේරීපත්වී තිබේ. පෙත්සම්කරු 2006 ජනවාරි 13 වන දින මහනුවර දිස්ත්‍රික්කයේ පක්ෂ මධ්‍ය මණ්ඩලයේ රැස්වීමක් අමතන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් සභා මන්ත්‍රීවරුන් ඇතුලු සාමාජිකයන් 400ක් පමණ එම රැස්වීමට සහභාගිවිය. පෙත්සම්කරු එම රැස්වීමේ මුලසුන දරන ලදී. ත්‍රස්ථවාදය පරාජය කිරීම සඳහා මෙම අසීරු අවස්ථාවේදී පක්ෂ භේදයකින් තොරව ජනාධිපතිවරයාට සහය ලබාදිය යුතු බවට එම රැස්වීම අමතමින් පෙත්සම්කරු ප්‍රකාශ කර ඇත.

2006 ජනවාරි 16 වන දින පෙත්සම්කරුට ජනාධිපතිගෙන් ලිපියක් ලැබී ඇත. එකී ලිපියෙන් පෙත්සම්කරු විසින් මහනුවර කරන ලද ප්‍රකාශය පිළිබඳව සඳහන් කරමින් පක්ෂ බාධාවන්ගෙන් මිදී සහය අපේක්ෂා කරන බව සඳහන් වූ අතර ලිපිය අවසන්ව තිබුනේ අමාත්‍යධූරයක් භාරගන්නා ලෙස ආරාධනා කරමිනි. ඒ අනුව 2006 ජනවාරි 25 දින පෙත්සම්කරු ප්‍රතිපත්ති සංවර්ධන සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යවරයා ලෙස දිවුරුම් දෙන ලදී. එයට අමතරව ආණ්ඩුවේ ජාතික ආරක්ෂක මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙසද පත් කරන ලදී.

2006 අගොස්තු 6 වන දින පෙත්සම්කරුව පක්ෂයෙන් ඉවත් කර ඇති බවට පක්ෂයේ මහලේකම්වරයාගේ ලිපියක් ලැබුන අතර, ඔහු පක්ෂයෙන් ඉවත්කර ඇති බවට පාර්ලිමේන්තු මහලේකම්වරයාටද එදිනම පක්ෂ මහලේකම් විසින් ලිපියකින් දැනුම්දී තිබිණි.

ඔහුව පක්ෂයෙන් නෙරපීමේ තීන්දුව අවලංගු කරන ලෙස ඉල්ලා පෙත්සම්කරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13 (අ) ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම

පෙත්සම්කරු 1992 වසරේදී ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ ( DUNF ) පක්ෂය නියෝජනය කළ බවත් 1992 වසරේ මධ්‍යම පළාත් සභාව සඳහා තරඟ කර අමාත්‍යධූරයක් දැරූ බවත් 1994 සහ 1999 වසරවලදී ද පළාත් සභාවට එක්සත් ජාතික පක්ෂ ලැයිස්තුව යටතේ තරඟ කර වැඩිම මනාප ඡන්ද ලබාගත් බවත් ප්‍රකාශ කරන ලදී. එසේම 2000, 2001 සහ 2004 යන වසර වලදී ද එක්සත් ජාතික පක්ෂ ලැයිස්තුව යටතේ මහනුවර දිස්ත්‍රික්කයට තරඟ කර විශාල මනාප ප්‍රමාණයක් ලබාගනිමින් පාර්ලිමේන්තුවට පිවිසි බවත් ප්‍රකාශ කරන ලදී. පසුගිය ජනාධිපතිවරණයේදී තමන් එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයාගේ මහනුවර දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කළ බවත්, සැලකිය යුතු වැඩි ඡන්ද ප්‍රමාණයක් එහිදී එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයා ලබාගත් බවත් ප්‍රකාශ කරන ලදී. එසේම තමන් මහනුවරදී සිදුකරන ලද ප්‍රකාශයකින් පසුව ජනාධිපතිවරයා විසින් තමන්ට අමාත්‍ය ධූරයක් භාරගන්නා ලෙස ආරාධනා කළ බැවින් අමාත්‍ය ධූරයක් භාරගත් බවත්, ඉන් පසුව එක්සත් ජාතික පක්ෂයෙන් තමන්ට එරෙහිව විනය පරීක්ෂණයක් පවත්වන ලෙසට ඉල්ලා පුද්ගලයකු එක්සත් ජාතික පක්ෂ මූලස්ථානයට ලිපියක් යොමුකර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එක්සත් ජාතික පක්ෂ ලැයිස්තුවෙන් තරඟ කර පාර්ලිමේන්තුවට පිවිස අමාත්‍ය ධූරයක් භාරගැනීමෙන් පක්ෂ ව්‍යවස්ථාව පැහැදිලිව උල්ලංඝනය වී ඇති බව එහි සඳහන්වූ බවද, දක්වන ලදී. 2006 මාර්තු මාසයේදී යම් පුද්ගලයකුගේ ඉල්ලීමක් මත පෙත්සම්කරු සම්බන්ධ විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා තිදෙනෙකුගෙන් යුතු පරීක්ෂණ මණ්ඩලයක් පත් කළ බවට පෙත්සම්කරුට එකී පරීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් දැනුම්දී ඇත. එම ලිපියට පිළිතුරු ලෙස පෙත්සම්කරු අදාළ චෝදනාපත්‍රය සහ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීමේ ලිපිය ඉල්ලා ඇත.

2006 ජූලි 5 වන දින විනය පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටින ලෙස පෙත්සම්කරුට දන්වා ඇත. පෙත්සම්කරු ජූලි 1 වන දින ලිපියක් මගින් පරීක්ෂණය කල් දමන ලෙස ඉල්ලා සිටි අතර පසුව ජූලි 28 වන දිනට නියම විය. නීතිඥ පෙනී සිටීමකට ඉඩක් නොමැති බවද එකී ලිපියේ දක්වා තිබිණි. පෙත්සම්කරු ජූලි 27 වන දින ලිපියක්

මගින් දන්වා සිටියේ නීතිඥ සහයක් නොමැතිව පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කිරීම සාධාරණ නොවන සහ පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් වන බැවින් තමන් අදාළ පරීක්ෂණයට සහභාගි නොවන බවයි. අගෝස්තු 10 වන දින පක්ෂයේ ක්‍රියාකාරී කමිටුව පෙත්සම්කරුට දන්වා සිටියේ විනය කමිටුවේ වාර්තාව අනුව පෙත්සම්කරු වරදකරු වී ඇති බැවින් ඔහුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කරන බවයි.

ඒ අනුව පක්ෂ මහලේකම්වරයා විසින් පාර්ලිමේන්තු මහකොමසාරිස්වරයා වෙතද මෙම දැන්වීම සිදුකර ඇත. තමන්ව පක්ෂයෙන් නෙරපීමේ පරීක්ෂණය සාධාරණ නොවන බව ප්‍රකාශ කරමින් පෙත්සම්කරු පෙත්සම ගොනුකරන ලදී.

**පෙත්සම් විභාගය**

පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු සරත් නන්ද සිල්වා. විනිසුරු ජයසිංහ සහ විනිසුරු දිසානායක යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. පෙත්සම් විභාගයේදී පක්ෂයේ තීරණය නීත්‍යයානුකූල නොවන බව තහවුරු කිරීම සඳහා පෙත්සම්කරු පහත කරුණු අධිකරණය ඉදිරියේ දක්වන ලදී.

- ❖ පක්ෂ ව්‍යවස්ථාවට අනුව විනය ක්‍රියාමාර්ග ගත යුත්තේ පක්ෂයේ ජාතික විධායක සභාව මිස පක්ෂයේ ක්‍රියාකාරී කමිටුව නොවේ,
- ❖ වරදක් සම්බන්ධයෙන් විමර්ශනයක් කිරීමේදී නීතිඥ සහයක් ලබාගැනීමට ඉඩ ලබාදීමේ මූලධර්මය මෙම විනය පරීක්ෂණ කමිටුව විසින් උල්ලංඝනය කර ඇත,

වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටියේ දේශපාලන පක්ෂයක සාමාජිකත්වයක් යනු පුද්ගලික සංවිධානයක සාමාජිකත්වයක් හා සමාන බවයි. සංවිධානයේ ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීමට සාමාජිකයන් කැමති විය යුතු අතර සාමාජිකත්වයෙන් නෙරපීමේදී උසස් පටිපාටි හෝ පරිපාලන නීතිය යොදා ගැනීම අත්‍යවශ්‍ය නොවන බවත් එසේම පක්ෂය සහ සාමාජිකයා අතර පවතින්නේ අනිවාර්යය ගිවිසුම්ගත සහ පුද්ගලික නීතිමය සම්බන්ධයක් බවයි.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය**

අනෙක් විනිසුරුවරුන් දෙපලගේද එකඟතාව මත අගවිනිසුරු සරත් නන්ද සිල්වා විසින් පෙත්සම් විභාගයේ තීරණය 2006 නොවැම්බර් 6

වන දින ලබාදෙන ලදී. එහිදී විනිසුරුවරයා දක්වා සිටියේ නෙරපා හැරීමේ තීරණයක් සමාලෝචනය කිරීමේ ප්‍රමිතිය පොදු නීතියේ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳව තීරණය කිරීමට බලය පවරන ලද අධිකාරියක ක්‍රියා සමාලෝචනයට අදාළ වන පරිදි සමාන විය යුතු බවත්, එබැවින් එවැනි සමාලෝචනයක් පරිපාළන නීතියේ සීමාව තුළට පැමිණෙන බවත්ය. එසේම අධිකරණ සංවිධාන පනතේ 41(2) වගන්තිය අනුව පුද්ගලයකුට නීතිඥයකු ගේ සේවය ලබාගැනීමට අයිතිවාසිකමක් ඇති බව පෙන්වා දුන් විනිසුරුවරයා මෙම විමර්ශනයේදී පෙත්සම්කරුට නීතිඥ නියෝජනයක් ප්‍රතික්ෂේප කිරීම මගින් ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කර ඇති බව විනිසුරුවරයා දක්වා ඇත.

ඒ අනුව පෙත්සම්කරුව පක්ෂයෙන් නෙරපීමේ තීරණය අවලංගුවන බව විනිසුරුවරයා සිය තීන්දුවෙන් ප්‍රකාශ කරන ලදී.

## 16.4 පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන මගහරිමින් සිදුකරන නෙරපීම් නීත්‍යානුකූල නොවේ

**පෙරුම්පුලි හේවගේ පියසේන එදිරිව ඉලංගෙයි තමිල් අරසු කච්චු**
**Perumpulli Hewage Piyasena v. ITAK Office SC Application Special [Expulsion] No. 03/2010 SCM, 8.2.2011**

### පසුබිම

පෙත්සම්කරු 2010 අප්‍රේල් මාසයේ පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී ඉලංකෙයි තමිල් අරසු කච්චු (ITAK) පක්ෂයේ නාමයෝජනා ලැයිස්තුව මගින් දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාශය සඳහා තරඟ කර ජයග්‍රහණය කර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම්දෙන ලදී, පසුව 2010 ඔක්තෝබර් මාසයේදී රජය 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එම සංශෝධනයට පක්ෂව පෙත්සම්කරු ඡන්දය භාවිතා කරන ලදී.

පසුව ඔහුව පක්ෂය විසින් නෙරපා හරින ලදී. එම නෙරපා හැරීම අවලංගු කිරීමට ඉල්ලීමක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වූ පෙත්සම

පෙත්සම්කරු මෙම පෙත්සම ඉදිරිපත් කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99(13)(අ) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන මත පක්ෂයෙන් නෙරපීමේ තීරණය අවලංගු කිරීම සඳහාය. මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස ඉලංකෙයි තමිල් අරසු කච්චු (ITAK) පක්ෂය, පක්ෂ නායක ආර්. සම්බන්ධන්, පක්ෂයේ මහලේකම්වරයා, වැඩබලන පාර්ලිමේන්තු මහලේකම්වරයා සහ මැතිවරණ කොමසාරිස්වරයා යන අය 1 සිට 5 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබිණි. 2010 දෙසැම්බර් 10 වන දින ඉදිරිපත් කරන ලද පෙත්සම මගින් පෙත්සම්කරු කියා සිටින ලද්දේ 2010 නොවැම්බර් 28 දින දරණ ලිපියක් මගින් ඉලංකෙයි තමිල් අරසු කච්චි (ITAK) පක්ෂය විසින් තමන්ගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කර ඇති බවයි. පක්ෂයේ මහලේකම්වරයා විසින් අත්සන් කර ඇති ලිපිය මගින් ITAK 2010 නොවැම්බර් 10 වන දින පැවති පක්ෂයේ විනය කමිටුව මගින් පෙත්සම්කරුව පක්ෂයෙන් නෙරපීමේ තීරණයට ඒකමතිකව තීරණය කර ඇති බව සඳහන් කර තිබූ බව පෙත්සමෙන් සඳහන් කර තිබිණි.

ඒ අනුව පෙත්සම්කරු පක්ෂයෙන් ඉවත් කිරීමේ තීරණය අවලංගු කරන ලෙස පෙත්සම මගින් අධිකරණයෙන් අයැද සිටින ලදී.

## පෙත්සම් විභාගය

පෙත්සම විභාග කරන ලද්දේ ජනාධිපති නීතිඥ සලීම් මාස්සූෆ්, කේ ශ්‍රීපවන් සහ ආර්.කේ.එස් සුරේෂ් චන්ද්‍ර යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.

පෙත්සම් විභාගය ආරම්භයේදීම වගඋත්තරකරුවන් මූලික විරෝධතාවක් නගමින් පෙත්සම්කරු පෙත්සම මගින් සියලු කරුණු අධිකරණයට හෙළිදරව් කරමින් පෙත්සම ඉදිරිපත් කර නොමැති නිසා පෙත්සම මගින් ඉල්ලා ඇති සහන ලබාගැනීමේ හිමිකමක් නොමැති බවයි.

තුන්වන වගඋත්තරකරුගේ නීතිඥයා ප්‍රකාශ කරන ලද්දේ පක්ෂයේ ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වගකීම් පිළිබඳව පෙත්සම්කරු කරුණු අධිකරණයට ඉදිරිපත් කර නොමැති බවයි.

2010 සැප්තැම්බර් මස 6 වන දින පැවති පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමේ රැස්වීමේදී 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

සංශෝධනයට විරුද්ධව ඡන්දය භාවිතා කිරීම සඳහා තීරණය කර ඇති බවද සඳහන් කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අනෙක් විනිසුරුවරුන් දෙදෙනාගේද එකඟතාවයෙන් යුතුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය සලීම් මාර්සූෆ් විනිසුරුවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය 2011 පෙබරවාරි 8 වන දින නිකුත් කරන ලදී. පක්ෂයේ ව්‍යවස්ථාවට අනුව විනය පරීක්ෂණ කමිටුව පත් කර නොමැති බැවින් පක්ෂයේ මහලේකම් විසින් 2010 නොවැම්බර් 28 වන දින නිකුත් කරන ලද ලිපිය බල රහිත බව ප්‍රකාශ කළ විනිසුරුවරයා, ඒ අනුව පෙත්සම්කරුව පක්ෂයෙන් නෙරපීමේ තීරණය අවලංගු කරන බව ප්‍රකාශ කරන ලදී.

දාහත්වන පරිච්ඡේදය

# දේශපාලන පක්ෂ ලියාපදිංචිය

ශ්‍රී ලංකාවේ නීතිය යටතේ දේශපාලන පක්ෂ පිහිටුවීමට කිසිඳු නීතිමය බාධාවක් නොමැති වුවත් එම දේශපාලන පක්ෂවලට නීතිමය බලයක් ලැබෙන්නේ ඒවා මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂ ලෙස පිළිගැනීමට ලක්වූ පසුවයි. දේශපාලන පක්ෂ පිළිගැනීමේ ක්‍රමවේදය හඳුන්වාදී ඇත්තේ 1959 අංක 11 දරණ ලංකා පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත මගිනි.(සිරිවර්ධන.2014,47), පසුව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාවේ ඇතැම් කොටස් අහෝසි කරමින් පනවන ලද 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත මගින් දේශපාලන පක්ෂ පිළිගැනීම පිළිබඳ ප්‍රතිපාදන ඇති කරන ලදී.

දේශපාලන පක්ෂයක් පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ නීති තත්ත්වය සහ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කළ අවස්ථාවන්හිදී අදාළ පක්ෂ විසින් පවරණ ලද නඩු කිහිපයක තීන්දු මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලැබේ.

## 17.1 දේශපාලන පක්ෂ ලියාපදිංචිය පිළිබඳ නීතිමය ප්‍රතිපාදන

### පවතින දේශපාලන පක්ෂ

දේශපාලන පක්ෂ ලියාපදිංචියට අදාළ වර්ථමාන නීතිමය ප්‍රතිපාදන ඇතළත් වන්නේ 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත තුළය. පනතේ 7 සිට 10 දක්වා වගන්තිවල දේශපාලන පක්ෂ ලියාපදිංචිය පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් වේ. මෙම ප්‍රතිපාදන 2009 අංක 58 දරණ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනත මගින්

සංශෝධනය වී ඇත. පනතේ 7(2) වගන්තියේ දැක්වෙන්නේ පනත ආරම්භ වන අවස්ථාව වන විට 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලබන දේශපාලන පක්ෂ මෙම පනත යටතේ ද පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබිය යුතු බවයි.

## දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා දැනුම්දීම

පිළිගත් දේශපාලන පක්ෂ වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්කරන ලෙස සෑම වර්ෂයකට ජනවාරි මාසයේ 31 වන දිනට ප්‍රථම මැතිවරණ කොමිෂන් සභාව විසින් දැන්වීමක් පලකළ යුතු බව. පනතේ 7(4) වගන්තියේ දැක්වේ. එම දැන්වීම තුළ අයදුම්පත්‍ර අවසන් වන දිනයද දැනුම්දිය යුතුය. නමුත් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවක, ජනාධිපතිවරණයක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක, පළාත් සභා ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, පළාත් පාලන ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක හෝ ජනමත විචාරණයක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙවැනි ප්‍රකාශයක් නිකුත් නොකළ යුතු බව පනතේ 7(4) වගන්තිය දක්වයි. ජනවාරි මාසයේ මෙවැනි මැතිවරණයක් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවකදී එකී මැතිවරණය අවසන් වීමෙන් දින 30 කාලයක් අවසානයේ මැතිවරණ කොමිෂන් සභාව විසින් එම දැන්වීම පලකළ යුතුය.

## ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම

කොමිෂන් සභාව විසින් දැන්වීමක් සිදුකර ඇති අවස්ථාවක පිළිගත් දේශපාලන පක්ෂයක් නොවන දේශපාලන පක්ෂයක් සිය අයදුම්පත්‍රය සමග පක්ෂ ව්‍යවස්ථාවද, පක්ෂයේ නිළධාරී මණ්ඩලයේ ලැයිස්තුවක්ද, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයේ පිටපතක්ද, තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටපතක්ද මැතිවරණ කොමිෂන් සභාව වෙත සැපයිය යුතුය. දේශපාලන පක්ෂවල හා දේශපාලනයෙහි කාන්තාවන්ගේ වඩාත් හොඳ නියෝජනයක් ඇතිවන බවට සහතික වීම සඳහා සෑම දේශපාලන පක්ෂයක් ම ඒ පක්ෂයේ නිලධාරීන්ගේ ලැයිස්තුවට කාන්තා නිලධාරීන් එක් අයකු හෝ ඊට වැඩි දෙනකු ඇතුළත් කිරීමට වග බලා ගත යුතු බව 7(4)(ඈ) වගන්තියේ දැක්වේ.

## මැතිවරණ කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකිරීම

අදාළ අයදුම්පත්‍රය ලැබීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකිරීමෙන් අනතුරුව පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගනු ලබන්නේ නම්, පනතේ විධිවිධාන අනුව පිළිගත් දේශපාලන පක්ෂයක් බවටත් එකී පක්ෂයට හිමි අනුමත කරන ලකුණත් සම්බන්ධයේ මැතිවරණ කොමිසම විසින් නියමයක් කළ යුතුය. එසේ එම පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිනොගන්නේ නම් එම පක්ෂය දේශපාලන පක්ෂයක් නොවන බව සහ මේ පනත යටතේ වූ යම් මැතිවරණයක් තරඟ කිරීමට සංවිධානය වී නොමැති බව, ඔහුගේ මතය වන්නේ නම්, ඉල්ලීමට ඉඩ නොදෙමින් නියමයක් කළ යුතුය.

## පරීක්ෂණයේදී කොමිෂන් සභාව සෑහීමකට පත්විය යුතු සාධක

පනතේ (5) වගන්තිය දක්වන්නේ පහත කරුණු පිළිබඳව කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස එම පක්ෂය කොමිෂන් සභාව විසින් පිළිගත යුතු බවයි.

- ❖ කොමිෂන් සභාවේ මතය අනුව ඒ පක්ෂය දේශපාලන පක්ෂයක් වන්නේ නම් සහ මේ පනත යටතේ මැතිවරණ වලට තරඟ කිරීම සඳහා හැකියාව ඇති පක්ෂයක් නම්,
- ❖ ඒ පක්ෂය ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දිනයට අවම වශයෙන් අවුරුදු හතරක කාලයකට පෙරාතුව සිට අඛණ්ඩව දේශපාලන කටයුතුවල නියැලී සිටි බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්,
- ❖ ඒ පක්ෂය විසින් නම් කරනු ලබන අපේක්ෂකයන් දෙදෙනකු අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකු, ඒ පක්ෂය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පසුගිය පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බවට කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්,
- ❖ ඒ පක්ෂය විසින් විවිධ පළාත් සභා පහකට නම් කරන ලද අවම වශයෙන් අපේක්ෂකයන් පස් දෙනකු අතරින් අවම වශයෙන් තුන්දෙනෙකු ඒ පක්ෂය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පසුගිය පළාත් සභා මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බවට, කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්,

## පිළිගත් දේශපාලන පක්ෂයක වගකීම්

සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් විසින්ම වාර්ෂිකව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේම සෑම වර්ෂයකම මහා සභාවාරය රැස්වීමක් පැවැත්විය යුතුය. පක්ෂ ව්‍යවස්ථාව සංශෝධනයක් සිදුකළ අවස්ථාවකදී සංශෝධනයේ සිට දින 30ක් ඇතුළත කොමිෂන් සභාවට ඒ පිළිබඳව දැනුම්දිය යුතුය.

## වාර්ෂික ප්‍රකාශය

කොමිෂන් සභාව විසින්, සෑම ලිත් වර්ෂයකම ආරම්භයේ දී මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට හිමිකම් ලබා ඇති සෑම දේශපාලන පක්ෂයකම නම් ඇතුළත් වන ලැයිස්තුවක් නිවේදනයක් මගින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

## සන්ධාන ආරම්භ කිරීම

පනතේ 8අ ව්‍යවස්ථාව දක්වන්නේ පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් එක් කිරීමෙන් සාදන ලද යම් සන්ධානයක සම්පාදක පක්ෂවල නම් සහ එහි නිලධාරීන්ගේ නම් කොමිෂන් සභාව වෙත නිවේදනය කිරීම එම සන්ධානයේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු බවයි.

## දේශපාලන පක්ෂයක් පිළිගැනීම අවසන් වීම

පනතේ 9 වන වගන්තිය දක්වන්නේ පහත සඳහන් හේතු මත පිළිගත් දේශපාලන පක්ෂක පිළිගැනීම අවසන් වන බවයි.

- ❖ පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් පනතේ සඳහන් වූ ඉහත කී වගකීම් ඉටු නොකළ අවස්ථාවකදී,
- ❖ අනුක්‍රමික පාර්ලිමේන්තු මහ මැතිවරණ දෙකක් සඳහා ඒ පක්ෂයේ එක් අපේක්ෂකයකු හෝ නම් කරනු නොලැබුවහොත්,
- ❖ වාර්ෂික විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකිරීම,
- ❖ පක්ෂයේ නිළධාරී මණ්ඩලයේ නාම ලේඛනය කොමිෂන් සභාවට ලබා නොදීම,
- ❖ පක්ෂයේ ව්‍යවස්ථාව කොමිෂන් සභාව වෙත ලබා නොදීම.

## 17.2 දේශපාලන පක්ෂ පිළිගැනීමේදී සමානයන්ට සමාන ලෙස සැලකිය යුතුය

**ගුණරත්න සහ තවත් අය එදිරිව චන්ද්‍රානන්ද ද සිල්වා -මැතිවරණ කොමසාරිස්**
**Gooneratne & Others v. Chandranande De Silva, Commissioner of Elections- (1987) 2 Sri L.R 165**

### පසුබිම

එක්සත් ලංකා ජනතා පක්ෂය 1987 ජනවාරි 2 වන දින ආරම්භ කරන ලදී. පක්ෂ ව්‍යවස්ථාවක් අනුමත කරගෙන තිබූ අතර පක්ෂ සාමාජිකත්වය දස දහසක් ඉක්මවා තිබිණි. මෙම පක්ෂය 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා 1987 ජනාවරි 22 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලදී. 1987 පෙබරවාරි 27 වන දින පක්ෂය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා පක්ෂයේ නිලධාරීන් සමග සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලදී. 1987 මාර්තු 31 වන දින මැතිවරණ කොමසාරිස්වරයා පක්ෂයට ලිපියක් යොමුකරමින් පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කළ නොහැකි බව දන්වන ලදී. ඒ සඳහා කිසිදු හේතුවක් දක්වා තිබුණේ නැත. මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණය මගින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට චෝදනා කරමින් පක්ෂයේ නිලධාරීන් 4 දෙනෙකු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ලැබෙන්නේ 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු පනතට 2009 අංක 58 දරණ සංශෝධනය එක් වීමට පෙරය. දේශපාලන පක්ෂ පිළිගැනීම පිළිබඳ තීරණාත්මක සංශෝධනයන් රැසක් 2009 අංක 58 දරණ සංශෝධනය මගින් සිදුවිය.

### මූලික අයිතිවාසිකම් පෙත්සම

එක්සත් ලංකා ජනතා පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් මූලික අයිතිවාසිකම් කඩවූ බවට චෝදනා කරමින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ගොනුකරන ලද්දේ, එම පක්ෂයේ සභාපති, උපසභාපති/ප්‍රධාන සංවිධානයක, ලේකම් සහ භාණ්ඩාගාරික යන නිලධාරීන් සිව්දෙනාය,

ඔවුන් පිළිවෙලින් 1 සිට 4 දක්වා පෙත්සම්කරුවන් ලෙස නම්කර තිබිණි. මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබුනේ මැතිවරණ කොමසාරිස් සහ නීතිපතිය. ඔවුන් පිළිවෙලින් 1 සහ 2 වගඋත්තරතරුවන් ලෙස නම්කර තිබිණි. තම පක්ෂය දේශපාලන පක්ෂයක් ලෙස 1987 ජනවාරි 2 වන දින ආරම්භ කළ බවත් ආරම්භක රැස්වීමේදී පක්ෂ ව්‍යවස්ථාව සම්මත කළ අතර නිලධාරී මණ්ඩලය සහ මෙහෙයුම් කමිටුවක් පත් කළ බවත් පෙත්සම මගින් දක්වා තිබිණ. මැතිවරණ සඳහා තරඟ කිරීමේ අරමුණින් මෙම පක්ෂය පිහිටුවාගත් බවත් එහි සාමාජිකයන් දස දහසකට වඩා සිටින බවත් විවිධ මැතිවරණ කොට්ඨාශවල රැස්වීම් පවත්වමින් පක්ෂයේ ශාඛා සමිති ස්ථාපනය කළ බවත් පෙත්සම මගින් ප්‍රකාශකර තිබිණි.

1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4) වගන්තිය යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා 1987 ජනවාරි 31 වන දින පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් සිදුකළ බවත් එම ඉල්ලීමේ ලිපිය සමග පක්ෂයේ දසවැදෑරුම් වැඩසටහන, සාමාජික ඉල්ලුම්පත්‍රයේ ආකෘතිය, පක්ෂ සාමාජික කාඩ්පතේ ආකෘතිය, පක්ෂය පිළිබඳව පුවත්පත් දැන්වීම්, හිටපු අගමැති ඩඩ්ලි සේනානායකගේ ඥාති පුත්‍රයකු විසින් දේශපාලන පක්ෂයක් පිහිටුවා ඇති බවටද මැන්ඩ්‍රාස් හින්දු පුවත්පතේ වූ මාධ්‍ය වාර්තාව යන ලේඛනද ගොනුකල බව පෙත්සම මගින් දක්වා තිබිණි. මෙම පක්ෂය ස්ථාපනය කරන ලද්දේ වසර දෙකකට පමණ පෙර සිට ක්‍රියාත්මක වන එක්සත් ලංකා මහජන සභාව නැමති දේශපාලන සංවිධානයේ දී සම්මත කරගන්නා ලද යෝජනාවක් අනුව බවත් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලදී. 1987 පෙබරවාරි 27 වන දින පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් තම ඉල්ලීම සලකා බැලීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද අතර එම සම්මුඛ පරීක්ෂණය සඳහා පෙත්සම්කරුවන් සහභාගී වූ බවත් එහිදී 7000 ක සාමාජික නාමලේඛනයක් ඇතුලු තවත් අතිරේක ලේඛන ඉදිරිපත් කළ බවද පෙත්සම මගින් දක්වා තිබිණි.

එසේ තිබියදී තම පක්ෂය මැතිවරණයට ඉදිරිපත්වීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීමට නොහැකි බවට 1987 මාර්තු 31 වන දින පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස් විසින් තමන් වෙත දන්වන ලද බවත්, එසේ ප්‍රතික්ෂේප කිරීමට කිසිදු හේතුවක් එම ලිපිය මගින් දන්වා නැති බවත් සිය පෙත්සම මගින් දක්වා තිබිණි.

එසේම 1984 ජනවාරි 22 වන දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහජන පක්ෂය විසින් ජනවාරි 30 වන දින ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය මැතිවරණ කොමසාරිස්වරයා විසින් භාරගත් බවත්, පෙත්සම මගින් වැඩිදුරටත් දක්වා තිබිණි.

මැතිවරණ කොමසාරිස්වරයාගේ මෙම තීරණය, අයුක්ති සහගත, අහේතුක සහ අසාධාරණ තීරණයක් බවට චෝදනා කළ පෙත්සම්කරුවන් සිය මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් ඉල්ලා සිටින ලද්දේ, පළවෙනි වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට නියෝගයක් ලබා දෙන ලෙසත්, තම ඉල්ලුම්පත්‍රය පිළිගන්නා ලෙස නියෝගයක් ලබාදෙන ලෙසත්ය.

## මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය

අගවිනිසුරු ෂර්වානන්ද, වනසුන්දර සහ අතුකෝරළ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කරන ලදී. මෙහිදී පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා සිටියේ එක්සත් ලංකා ජනතා පක්ෂය මැතිවරණ සඳහා ඉදිරිපත් වීමේ අරමුණ ඇතිව පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම සඳහා එම පක්ෂය සෑහීමකට පත්විය හැකි පරිදි සංවිධානය වී නොමැති බවය. එසේම එයට පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පවත්වන කිසිඳු මැතිවරණයකට තරඟ කිරීමට තරම් සංවිධාන ශක්තියක් තම විමර්ශනය මගින් තහවුරු නොවූ බවද මැතිවරණ කොමසාරිස්වරයා සිය දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා තිබිණි. එම නිසා පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5) වගන්තිය යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සැලකිය නොහැකි බවද දක්වා තිබිණි.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

අනෙක් විනිසුරුවරුන් දෙදෙනාගේද එකඟතාවය මත අගවිනිසුරු ෂර්වානන්ද විසින් 1987 අගොස්තු 27 වන දින මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

තරඟ කිරීම සඳහා සංවිධානය වූ දේශපාලන පක්ෂයක ගුණාංග සම්බන්ධ මූලික කරුණ පිළිබඳව පළවෙනි වගඋත්තරකරුගේ වැරදි

වැටහීම මත ඔහුගේ නියෝගය දෝෂ සහිත වන බව පෙන්වාදුන් විනිසුරුවරයා පක්ෂය දේශපාලන ක්ෂෙත්‍රයේ රැඳී සිටීමට අදහස් කරන බව පෙන්වන සියලු සාක්ෂිවලට වඩා අනවශ්‍ය බරක් පක්ෂයේ වයස පිළිබඳ කරුණ සම්බන්ධයෙන් ලබාදී ඇති බව නිරීක්ෂණය වන බව අගවිනිසුරුවරයා සිය තීරණය මගින් සඳහන් කරන ලදී. එසේම පිළිගත් දේශපාලන පක්ෂයක් බවට පත්වීම සඳහා අනෙක් දේශපාලන පක්ෂවල පිළිගැනීම අවශ්‍ය නොවන බවද සඳහන් කරන ලදී.

එසේම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව මගින් වෙනස් කම් සිදුකිරීම වළක්වා ඇති බවත් ඒ අනුව සමානයන්ට සමාන ලෙස සැලකිය යුතු වුවත් පක්ෂය ආරම්භ කළ කාලය සම්බන්ධව සැලකීමකින් තොරව මහජන එක්සත් පක්ෂ ලියාපදිංචි කර ඇති නමුත් මෙම පක්ෂය ලියාපදිංචියේදී පක්ෂයේ ආයුකාලය පිළිබඳ සාධකය මතු කර එය ප්‍රතික්ෂේප කර ඇති බවත් පෙන්වා දෙන ලදී. මේ අනුව පුරවැසියන් දෙදෙනෙකුට අසමාන ලෙස සලකා ඇති බව සඳහන් කළ අගවිනිසුරුවරයා රාජ්‍ය නිළධාරියකු බලය භාවිතා කිරීමේදී පුරවැසියන්ට සම තත්ත්වයේ සිටින පුද්ගලයන් දෙදෙනෙකුට වෙනස් ලෙස නොසැලකිය යුතු බව පෙන්වා දෙන ලදී. ඒ අනුව පෙත්සම්කරුවන්ගේ ඉල්ලීම මත පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ තීරණය මගින් 1වන වගඋත්තරකරු සමානාත්මතාවයේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව තීරණය කළ අගවිනිසුරුවරයා 1වන වගඋත්තරකරුට නියෝග කරන ලද්දේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(7) වගන්තිය යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස එක්සත් ලංකා ජනතා පක්ෂය පිළිගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසයි.

## 17.3 සාමාජිකයන් ප්‍රමාණය අඩුවීම ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට සාධාරණ හේතුවක් නොවේ.

**ශ්‍රීනාත් පෙරේරා එදිරිව දයානන්ද දිසානායක**
**A.S.N.Perera v. Dayananda Dissanayake – Writ Aplication No 522/2000- C.A.M.22.08.2000**

### පසුබිම

ජාතික ජනතා පක්ෂය දේශපාලන පක්ෂයක් ලෙස 1999 දෙසැම්බර් 20 වනදා ආරම්භ කරන ලදී. පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස

ලියාපදිංචි කිරීම සඳහා 2000 ජනවාරි 31 වන දින මැතිවරණ කොමසාරිස් වෙත ඉල්ලීමක් සිදුකරන ලදී. එම ඉල්ලුම්පත්‍රය අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වන ලද විමර්ශනයක් සඳහා 2000 මාර්තු 1 වනදින පක්ෂයේ නිලධාරීන් සහභාගීවන ලදී. පසුව අප්‍රේල් 28 වන දින මැතිවරණ කොමසාරිස්වරයා ලිපියක් මගින් දන්වා සිටින ලද්දේ ජාතික ජනතා පක්ෂය දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද බවයි. මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණයට එරෙහිව පක්ෂයේ නිලධාරීන් විසින් අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

## රිට් පෙත්සම

ජාතික ජනතා පක්ෂයේ මහලේකම් සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු පෙත්සම්කරුවන් වූ මෙම රිට් පෙත්සම මගින් මැතිවරණ කොමසාරිස්වරයා සහ නීතිපති වරයා පිළිවෙලින් පළවන සහ දෙවන වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

1999 දෙසැම්බර් 20 වන දින සිය පක්ෂය ආරම්භ කළ බවත් පක්ෂ ව්‍යවස්ථාව සහ ප්‍රතිපත්ති ප්‍රකාශය එදින අනුමත කළ බවත් පසුව 2000 ජනවාරි 31 වන දින පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(අ) වගන්තිය යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ බවත් පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී. එකී ඉල්ලීමට ප්‍රතිචාර ලෙස මැතිවරණ කොමසාරිස්වරයා 2000 මාර්තු 1 වන දින පක්ෂය පිළිගැනීම සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වූ බවත් එකී විමර්ශනයෙන් පසුව මාර්තු 24 වන දින මෙම පක්ෂය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන බව මැතිවරණ කොමසාරිස්වරයා ලිඛිතව දැන්වූ බවත් ප්‍රකාශ කරන ලදී. එකී තීරණය මගින් සෑහීමකට පත් නොවූ පෙත්සම්කරුවන් විසින් 2000 මැයි 10 වන දින පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්රයා වෙත ලිපියක් යොමුකරමින් තම දේශපාලන පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු පැහැදිලි කරන ලෙසත්, පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සුදුසුකම් ලැබී ඇති බවට තීරණය කිරීම සඳහා වන ක්‍රමවේදය කුමක්ද යන්න විමසා ලිපියක් යොමුකළ නමුත් ඒ සඳහා කිසිඳු ප්‍රතිචාරයක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබා නොදුන් බවත් පෙත්සම්කරුවන් සිය පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී.

එම නිසා ජාතික ජනතා පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ මැතිවරණ කොමසාරිස්වරයාගේ තීරණය අත්තනෝමතික, අහේතුක, නීතිවිරෝධී තීරණයක් බැවින් එම තීරණය බලරහිත කරන ලෙස සිය රිට් පෙත්සම මගින් පෙත්සම්කරුවන් ඉල්ලා සිටින ලදී.

## රිට් පෙත්සම් විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු ජේ.ඒ.එන් ද සිල්වා විනිසුරුවරයා විසිනි. පෙත්සම් විභාගයේදී පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජාතික ජනතා පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු සිය දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා තිබිණි. ඒ අනුව,

- ❖ පක්ෂයේ සාමාජිකයන් 257ක් පමණක් සිටින නිසා මැතිවරණයකට ඉදිරිපත් වීම සඳහා සංවිධාන කටයුතු කිරීමට තරම් හැකියාවක් නොමැති වීම.
- ❖ 1999 දෙසැම්බර් තරම් මෑතකදී පිහිටවූ පක්ෂයක් වීම.
- ❖ අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාව වන විට කිසිඳු දේශපාලන ක්‍රියාකාරකමක පක්ෂය නිරත වී නොතිබීම.
- ❖ අයදුම්පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාව වන විට පක්ෂයේ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙල ජනතාව වෙත ඉදිරිපත් කර නොතිබීම.
- ❖ මාර්තු 1වන දින පැවති විමර්ශනයේදී පෙත්සම්කරුවන් වඩාත් පදනම් වූ ප්‍රකාශනය වූ ජාතික සහයෝගිතා ව්‍යාපාරය දේශපාලන ව්‍යාපාරයකට වඩා රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස කටයුතු කිරීම.
- ❖ විමර්ශනයේදී ඉදිරිපත් කළ අනෙක් ප්‍රකාශනයන් පළවෙනි පෙත්සම්කරු විසින් පුද්ගලික මට්ටමින් පුවත්පත්වල පලකළ ප්‍රකාශනයන් වීම.
- ❖ මැතිවරණයක් සඳහා පුලුල් සහයක් තිබෙන බවට පෙත්සම්කරුවන් කිසිඳු සාක්ෂියක් විමර්ශනයේදී ඉදිරිපත් නොකිරීම.

යන කරුණු මත ජාතික ජනතා පක්ෂය දේශපාලන පක්ෂයක් ලෙස මැතිවරණයකට තරඟ කිරීම සඳහා සංවිධානය වී නොතිබීම.

අයදුම් පත්‍රය සමග පක්ෂ ව්‍යවස්ථාව, ප්‍රතිපත්ති ප්‍රකාශය, පක්ෂයේ නිලධාරීන්ගේ ලැයිස්තුව සහ පක්ෂයේ සංවිධානය ව්‍යුහය මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද බව පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාද, අධිකරණයේදී පිළිගන්නා ලදී. පෙත්සම්කරුවන් අධිකරණය ඉදිරියේ ප්‍රකාශ කරන ලද්දේ පක්ෂය ආරම්භ වී මාස 2ක් තුළ සාමාජිකයන් 257 දක්වා වර්ධනය වු අතර, පසුව සාමාජික සංඛ්‍යාව ඉතා වේගයෙන් වර්ධනය වූ බවත් එය 1300ක් දක්වා වර්ධනය වී ඇති බවත්. එම විස්තර ලබාදීමට අවශ්‍ය නොවන බව මැතිවරණ කොමසාරිස්වරයා විමර්ශනයේදී ප්‍රකාශ කළ බවත්ය.

## රිට් පෙත්සමේ තීරණය

රිට් පෙත්සම් විභාගය අවසානයේදී විනිසුරුවරයා 2000 අගෝස්තු 22 වන දින සිය තීරණය ලබාදෙන ලදී. පක්ෂ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිය දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා සිටින ලද එක් හේතුවක් වන සමානුපාතික මැතිවරණයකදී දිවයින පුරා තරඟ වැදීම සඳහා සාමාජිකයන් 257 දෙනෙකු ප්‍රමාණවත් නොවේය යන තර්කය සම්බන්ධයෙන් විනිසුරුවරයා සඳහන් කරන ලද්දේ ටෙලෝ, ප්ලෝට්, ඊ.පී.ඩී.පී වැනි පක්ෂ දිවයිනේ සියලුම මැතිවරණ කොට්ඨාශ සඳහා තරඟ නොකරන බැවින් ඒවැනි මැතිවරණ කොට්ඨාශ කිහිපයක් පමණක් තරඟ කිරීමේ අයිතියද දේශපාලන පක්ෂයකට පවතින බවයි. එබැවින් එවැනි හේතුවක් මත ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම අසාධාරණ බවයි. එසේම ගුණරත්න එදිරිව මැතිවරණ කොමසාරිස් ((1987) 2 Sri L.R. 165) නඩුවේදී අගවිනිසුරු ෂර්වානන්ද විසින් දක්වන ලද "සාමාජිකයන් වර්ධනය වීම කාලය සමග වෙනස්විය හැකිය. පලපුරුදු අත්දැකීම් සහිත වෘත්තීය කණ්ඩායම්වලට ඉතා ඉක්මනින් සිය පක්ෂය සංවිධානාත්මක දේශපාලන පක්ෂයක් ලෙස ඉතා කෙටි කලකින් ගොඩනගා ගත හැකිය" යන ප්‍රකාශ උපුටා දක්වමින් විනිසුරුවරයා ප්‍රකාශ කළේ, මෙම පක්ෂයේ වෘත්තිකයන්ගෙන් සමන්විත සාමාජිකත්වයක් සිටින බැව් සඳහන් කර ඇති බැවින් කෙටි කාලයකින් හොඳින් සංවිධානය විය හැකි බවයි.

පක්ෂය ක්‍රියාකාරී දේශපාලනයේ නිරතවී නැති බවට මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදුකරන ලද හේතුව පිළිබඳව අදහස් දක්වන විනිසුරුවරයා දක්වා සිටියේ "ක්‍රියාකාරී දේශපාලනයේ" යන්න නිශ්චිත අදහසක් ඇති වචනයක් නොවන බවයි. එයින් අදහස් වන්නේ පක්ෂය මැතිවරණයකට ඉදිරිපත් වී ඇතිද යන්න නම් තවමත්

පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීමටකට ලක්නොවූ පක්ෂයකට එම නමින් මැතිවරණයකට තරඟ කළ නොහැකි බවයි.
ඒ අනුව විනිසුරුවරයා පළවෙනි වගඋත්තරකරුට නියෝග කරන ලද්දේ ජාතික ජනතා පක්ෂයේ අයදුම්පත්‍රය නැවත සැලකිල්ලට භාජනය කර අගෝස්තු 31 වන දිනට පෙර නව තීරණයක් ලබාදෙන ලෙසයි.

### අධිකරණ තීරණයේ බලපෑම

අධිකරණ නියෝගයට අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජාතික ජනතා පක්ෂයේ ලියාපදිංචි කිරීමේ ඉල්ලීම යලි සලකා බලන ලද එම විමර්ශනයේදී එය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ජාතික ජනතා පක්ෂය විදුලි බුබුල ලකුණ යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගන්නා ලදී.

## 17.4 දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්වීමට මැතිවරණ කොමිසමට වගකීමක් ඇත.

### හපුආරච්චි සහ තවත් අය එදිරිව මැතිවරණ කොමසාරිස් සහ තවත් අය

Hapuarachchi and Others v. Commissioner of Election and another (2009) I Sri LR. 1

### පසුබිම

පළමු පෙත්සම්කාර හපුආරච්චි එක්සත් ජනතා පෙරමුණ නැමති පක්ෂයේ මහ ලේකම්වරයායා. එම පක්ෂය 1999 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර 2007 ඔක්තෝබර් 31 වන දින පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලදී. නමුත් මැතිවරණ කොමසාරිස්වරයා මෙම පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. එම ප්‍රතික්ෂේප කිරීම සඳහා සාධාරණ හේතු දැක්වීමක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිදු නොකළ බව චෝදනා කරමින් පෙත්සම්කරු මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනුකරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

මෙම පෙත්සමේ පළමු පෙත්සම්කරු සිය පෙත්සම මගින් චෝදනා කරන ලද්දේ 1999 වර්ෂයේදී තමන් දේශපාලන පක්ෂයක් ලෙස එක්සත් ජනතා පෙරමුණ නැමති පක්ෂය ආරම්භ කළ බවත් 2000 වර්ෂයේදී දෙවන වාර්ෂික මහා සභාවාරය පැවැත්වූ බවත් තමන්ගේ පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා වෙත අයදුම්පත්‍රයක් 2007 ඔක්තෝබර් 31 වන දින නිකුත් කළ බවත් එය කොමසාරිස්වරයා විසින් ප්‍රතික්ෂේප කළ බවත් එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා කිසිඳු හේතුවක් කොමසාරිස්වරයා විසින් නොදැක්වීම මගින් තමන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2) සහ 14(1)(ඇ) ව්‍යවස්ථාවන් මගින් සහතික කර දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය. මෙම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය සඳහා 1වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා වගකිව යුතු බවද පෙත්සම්කරු චෝදනා කරන ලදී,

## පෙත්සම් විභාගය

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කරන ලද්දේ ආචාර්ය ශිරාණි බණ්ඩාරණායක විනිසුරුතුමිය, අමරතුංග විනිසුරු සහ මාර්සූෆ් විනිසුරු යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මණ්ඩලය විසිනි. පළවෙනි පෙත්සම්කරු අධිකරණයට ප්‍රකාශ කර සිටියේ තම දේශපාලන පක්ෂයට 2200කට අධික සාමාජික සංඛ්‍යාවක් සිටින බවයි. එසේම තමන් 2007 ඔක්තෝබර් 31 වන දින යොමුකරන ලද අයදුම්පත්‍රයට අනුව පළවෙනි වගඋත්තරකරු විසින් කිසිඳු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත් පසුව 2007 දෙසැම්බර් 14 වන දින නැවත ලිපියක් යොමුකරමින් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිය බවත් ප්‍රකාශ කරන ලදී. එකී ලිපියට පිළිතුරු ලෙස මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2008 ජනවාරි 7 වන දින දරණ ලිපිය මගින් 2008 ජනවාරි 16 වන දා පක්ෂය ලියාපිදිංචි කිරීම සඳහා විමර්ශනයක් සඳහා පෙත්සම්කරු කැඳවූ බවත් ප්‍රකාශ කරන ලදී. එකී පරීක්ෂණයෙන් පසුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2008 ජනවාරි 21 වන දින ලිපියක් එවමින් "ඔබගේ ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කළ බව කණගාටුවෙන් දන්වමි" යනුවෙන් දැනුම්දීමක් සිදුකර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මෙම ලිපියද පෙත්සම්කරු විසින් පෙත්සමේ ඇමුණුමක් ලෙස එක්කර තිබිණි. ඒ අනුව තම ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට කිසිඳු හේතුවක් අදාළ ලිපිය මගින් දක්වා නොමැති බවට පෙත්සම්කරු චෝදනා කරන ලදී.

එසේම මෙම කාලය තුළ ඔක්කොම රජවරු ඔක්කොම වැසියෝ, මුස්ලිම් විමුක්ති පෙරමුණ, නව සිහල උරුමය, පද්මනාද ඊලම් ජනතා විප්ලවකාරී විපුලනාරි සහ ටී.එම්.වී.පී යන දේශපලන පක්ෂ මැතිවරණ කොමසාරිස් විසින් පිළිගත් දේශපාලන පක්ෂ ලෙස ලියාපදිංචිකර ඇති බවද පෙත්සකම්කරු කියා සිටින ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය**

සෙසු විනිසුරුවරුන් දෙදෙනාගේද එකඟතාව මත ආචාර්ය ශිරාණි බණ්ඩාරණායක විනිසුරුතුමිය විසින් 2009 මාර්තු 3වන දින මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදි. අගතියට පත් පුද්ගලයාට ඔහුට බලපාන තීරණායට එළඹීමට හේතුව දැනගැනීමට නොහැකි වීම අත්තනෝමතික ක්‍රියාවක් පමණක් නොව එමගින් නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමේ අයිතිවාසිකමද උල්ලංඝනය වන බව ප්‍රකාශ කළ විනිසුරුවරිය, එබැවින් හේතුවක් නොදක්වා පෙත්සම්කරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමේ අයිතිය මැතිවරණ කොමසාරිස් විසින් උල්ලංඝනය කර ඇති බව තීරණය කරන ලදී. එම නිසා මැතිවරණ කොමසාරිස් විසින් පළවෙනි පෙත්සම්කරුවෙත යොමුකරන ලද පෙත්සම්කරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය බල රහිත කරන බව තීරණය කළ විනිසුරුතුමිය, මැතිවරණ කොමසාරිස්ට නියෝග කරන ලද්දේ පෙත්සම්කරුගේ ඉල්ලුම්පත්‍රය පිළිබඳව යලි සලකා බලන ලෙසයි.

## 17.5 හේතු දැක්වීමකින් තොරව පක්ෂ ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම මූලික අයිතිවාසිකම් කඩකිරීමකි

**දීප්ති කුමාර ගුණරත්න සහ තවත් අය එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අයෙක්**

**Deepthi Kumara Gunarathne & Others v. Dayananda Dissanayake & Others – SC (FR) 56 /2008- S.C.M-19.03.2009**

**පසුබිම**

ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂයේ මහ ලේකම් දීප්ති කුමාර ගුණරත්න විසින් 2008 ජනවාරි 00 දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් යොමු කරමින් සිය දේශපාලන පක්ෂය පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටින ලදී. මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2008 ජනවාරි 7 වන දින දරණ ලිපියක්

මගින් පක්ෂය වෙත ලිපියක් යොමුකරමින් පක්ෂය ලියාපදිංචි කිරීම පිළිබඳ විමර්ශනය 2008 ජනවාරි 17 වන දින පැවැත්වෙන බැවින් සාමාජික නාමලේඛනය ඇතුලු අදාළ ලේඛන රැගෙන පැමිණෙන ලෙස දැනුම්දෙන ලදී. එකී විමර්ශනය සඳහා පක්ෂයේ නිලධාරීන් සහභාගී වී ඇති අතර එහිදී පක්ෂයේ සාමාජිකයන් පිළිබඳව දේශපාලන කටයුතු පිළිබඳව සහ පක්ෂයේ ආකෘතිය පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයා විසින් විමසීම් සිදුකර තිබේ. 2008 ජනවාරි 21 වන දින මැතිවරණ කොමසාරිස්වරයා පක්ෂ ලේකම් වෙත දැනුම්දී ඇත්තේ පෙරටුගාමී පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ බවයි. මැතිවරණ කොමසාරිස්වරයාගේ මෙම තීරණය මගින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට චෝදනා කරමින් පක්ෂයේ මහ ලේකම් විසින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

ශ්‍රී ලංකා පෙරටුගාමී පක්ෂයේ මහලේකම් දීප්ති කුමාර ගුණරත්න සහ තවත් පක්ෂයේ නිලධාරීන් දෙදෙනෙකු විසින් මූලික අයිතිවාසිකම් පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී. මැතිවරණ කොමසාරිස් වරයා සහ නීතිපති මෙම පෙත්සම මගින් පළවෙනි සහ දෙවන වගඋත්තරකරුවන් ලෙස නම් කර තිබිණි.

තම පක්ෂය මහජනතාව තුළ දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික අධ්‍යාපනය සහ සදාචාරය ප්‍රවර්ධනය කිරීම, පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහ ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීම, සමාජ, ආර්ථික සහ සංස්කෘතික සමානාත්මතාවය සහ සම අවස්ථා ප්‍රවර්ධනය යන කරුණු පදනම්කරගෙන දේශපාලන බලය ලබාගැනීමේ අරමුණින් දේශපාලන පක්ෂය ආරම්භ කළ බව සිය පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී. 1977 වර්ෂයේදී තම පක්ෂය X කණ්ඩායම ලෙස සංවිධානය වූ බවත්, එය සමාජය තුළ වෙනස් ධාරාවක් නියෝජනය කරමින් සිය දේශපාලන මතවාදය පොදුවේ බෙදාහරිමින් කටයුතු කළ බවද, පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී. එසේම මෙම දේශපාලන මතවාද ප්‍රචාරය කිරීම සඳහා මාතොට සහ ලන්ඩන් නම් මාසික ප්‍රකාශන නිකුත් කරන ලද බවද පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී. එසේම විවිධ සමාජ ගැටලු සම්බන්ධයෙන් පොත්පත් පලකිරීම් සහ ප්‍රසිද්ධ රැස්වීම් සංවිධානය කළ අතර සාමාජික අයදුම්පත්‍ර 304ක් නිකුත් කර ඇති බවත් අනුගාමිකයන් 10000 ක් පමණ සිටින බවත් පෙත්සම මගින් සඳහන් කරන ලදී. එසේම ඔවුන්ගේ පෙරදිග සුළඟ නම් සංස්කෘති වැඩසටහන සඳහා විශ්ව විද්‍යාල සිසුන් බුද්ධිමතුන් වෘත්තිකයන් රැසක් සම්බන්ධ වී ඇති බවත් ඒ අනුව පාර්ලිමේන්තු

මැතිවරණ පනත යටතේ පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍රයක් 2008 ජනවාරි මාසයේදී යොමුකළ බවත් එකී අයදුම්පත්‍රය මත ජනවාරි 17 වන දින විමර්ශනයක් පැවැත්වූ බවත් ජනවාරි 21 වන දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් තම පක්‍ෂය පිළිගැනීම ප්‍රතික්ෂේප කරන ලද බවත් පෙත්සම මගින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එසේම 2008 ජනවාරි මාසයේදී තමන් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ ද, මැතිවරණ කොමසාරිස්වරයා විසින් වෙනත් දේශපාලන පක්‍ෂ 5ක් පිළිගත් දේශපාලන පක්‍ෂ ලෙස ලියාපදිංචි කර ඇති බවද පෙත්සම මගින් පෙන්වා දෙන ලදී.

ඒ අනුව තමන්ගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවන, අතාර්කික සහ අත්තනෝමතික තීරණයක් බවත් පෙත්සම මගින් චෝදනා කරන ලදී.

පළමුවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ මෙම තීරණය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1), 12(2), 14(1)(අ), 14(1)(ඇ) යන ව්‍යවස්ථාවන් මගින් සහිතක කර දී ඇති තම මූලික අයිතිවාසිකම් පෙත්සම්කරුවන් විසින් උල්ලංඝණය කර ඇති බව පෙත්සම මගින් පෙත්සම්කරුවන් චෝදනා කරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය

ශිරාණි බණ්ඩාරණායක, නිමල් ගාමිණී අමරතුංග සහ සලීම් මාර්සුෆ් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු තිදෙනා විසින් මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කරන ලදී. පළමුවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා විසින් සිය කරුණු දැක්වීමේ පෙත්සම මගින් කරුණු කිහිපයක් තම තීරණය සාධාරණ බව පෙන්වීම සඳහා ඉදිරිපත් කරන ලදී.

- ❖ පක්‍ෂය මැතිවරණ සඳහා තරඟ කිරීම සඳහා සංවිධානය වී නොමැති බව.
- ❖ පක්‍ෂය සිදුකර ඇති විවිධ ක්‍රියාකාරකම් දේශපාලන ක්‍රියාකාරකම් නොවන බව.
- ❖ මැතිවරණයක් සඳහා ඉදිරිපත් වීම පිළිබඳ ප්‍රායෝගික සැලැස්මක් ඉදිරිපත් කිරීමට පක්‍ෂය විසින් අපොහොසත් වීම.

- ❖ පක්‍ෂ සංවිධාන ආකෘතිය අනුව ප්‍රාදේශීය සහ පළාත් මට්ටමින් දේශපාලන ක්‍රියාකාරමක් සිදුකිරීමට සංවිධානය වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් නොවීම.
- ❖ පක්‍ෂයේ කිසිවෙකු පැවති මැතිවරණ සඳහා ඉදිරිපත් වූ පක්‍ෂයකට සහයෝගය දක්වා නොමැති අතර කිසිවෙකු මැතිවරණයක් සඳහා ඉදිරිපත්වීද නැත.

එසේම පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස් වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෂ්ඨ අධිනීතිඥ වරයා අධිකරණය ඉදිරියේ පෙන්වා දුන්නේ පෙත්සම්කරුවන් විසින් අයදුම්පත්‍රය සමග පක්‍ෂයේ "යෝජිත පක්‍ෂ ව්‍යවස්ථාව" ඉදිරිපත් කර ඇති බවත්, 1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ප්‍රතිපාදන අනුව පක්‍ෂ ව්‍යවස්ථාව ඉදිරිපත් කළ යුතු බැවින් එම අවශ්‍යතාව සම්පූර්ණ කර නොමැති බවත්ය. එසේම පළවෙනි වගඋත්තරකරු විසින් 2008 ජනවාරි 21 වන දින පෙත්සම්කරුවන්ගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමේ ලිපිය මගින් එම ප්‍රතික්ෂේප කිරීම සඳහා පාදක කරගත් හේතු දැක්වීමක් සිදුකර නොමැති බව පිළිගන්නා ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය.**

අනෙක් විනිසුරුවරුන්ගේ එකඟතාව මත ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ශිරාණි බණ්ඩාරණායක විනිසුරුතුමිය විසින් 2009 මාර්තු 19 දින මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

පූර්වාදර්ශී නඩු තීන්දු ගණනාවක් උපුටා දක්වමින් විනිසුරු තුමිය සඳහන් කරන ලද්දේ තීරණයට බලපෑ හේතු දැනගැනීමට පාර්ශවයන්ට ඇති අයිතිය ස්වභාවික යුක්තියේ කොටසක් බවයි. ඒ අනුව පළවෙනි වගඋත්තරකරු 2008 ජනවාරි 21 වන දින සිදුකරන ලද ප්‍රතික්ෂේප කිරීමට පාදක වූ හේතු නොදැක්වීම මගින් පෙත්සම්කරුවන් වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව ප්‍රකාශ කළ විනිසුරුතුමිය, ඒ අනුව එකී තීරණය බලරහිත කරන ලදී. පෙත්සම්කරුවන් විසින් සිය පක්‍ෂය ලියාපදිංචි කරන ලෙස සිදුකරන ලද ඉල්ලීම යලි සලකා බලන ලෙසද, අධිකරණය මෙම තීරණය මගින් පළවෙනි වගඋත්තරකරු වෙත නියෝග කරන ලදී.

### අධිකරණ නියෝගයේ බලපෑම

අධිකරණ නියෝගයට අනුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකා පෙරටුගාමී පක්‍ෂයේ ලියාපදිංචි කිරීමේ ඉල්ලීම යලි සලකා බලන ලද එම විමර්ශනයේදී එය පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස ලියාපදිංචි කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා පෙරටුගාමී පක්‍ෂය ලියුම් කවරය ලකුණ යටතේ පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස පිළිගන්නා ලදී. පසුව එම පක්‍ෂය විසින් සිදුකරන ලද ඉල්ලීමක් මත පක්‍ෂයේ නම සමබිම පක්‍ෂය ලෙස 2021 වසරේදී සංශෝධනය කරන ලදී. (දීප්ති කුමාර ගුණරත්න සමග දුරකථන සංවාදය- 2022 අප්‍රේල් 2 දින )

## 17.6 මැතිවරණ කොමසාරිස්ගේ තීරණය අධිකරණයක ප්‍රශ්න කළ හැකිය

**ජයන්ත ලියනගේ එදිරිව මැතිවරණ කොමසාරිස්**
**Jayantha Liyanage v. Election Commission SC Appeal 96/2011 S.C.M. 17.12.2014**

### පසුබිම

පෙත්සම්කාර ජයන්ත ලියනගේ සිංහල ජාතික පෙරමුණ පක්ෂයේ ලේකම්වරයා විය. එම පක්‍ෂය පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් සිදුකළ නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප වීම මත එකී තීරණයට එරෙහිව රිට් ආඥාවක් ඉල්ලා අභියාචනාධිකරණයට පෙත්සමක් ගොනුකරන ලදී. (CA (Writ) Application 448/2008) එම පෙත්සම අභියාචනාධිකරණය විසින් 2010 ජුලි 7 වන දින ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් පෙත්සම්කරු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී.

### රිට් පෙත්සම

පෙත්සම්කරු විසින් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අංක CA (Writ) Application 448/2008 දරණ රිට් පෙත්සම මගින් මැතිවරණ කොමසාරිස්වරයාව වගඋත්තරකරු ලෙස නම්කර තිබිණි. සිංහල ජාතික පෙරමුණ දේශපාලන පක්‍ෂයක් ලෙස 1999 වසරේ ආරම්භ කළ බවත් එම පක්‍ෂය 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ප්‍රතිපාදන අනුව පිළිගත් දේශපාලන පක්‍ෂයක්

ලෙස ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත්‍රයක් 2000 අගෝස්තු 25 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප වූ බවත් පසුව 2006 ජනවාරි 25 වන දින නැවත මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් සිදුකළ බවත් එකී ඉල්ලීමට ප්‍රතිචාර ලෙස මැතිවරණ කොමසාරිස්වරයාගේ 2006 දෙසැම්බර් 27 දින දරණ ලිපියෙන් එම ඉල්ලීමද ප්‍රතික්ෂේප කරන ලද බවත් පෙත්සම්කරු සිය පෙත්සමෙන් කියා සිටින ලදී. ඉන්පසුව පෙත්සම්කරු විසින් 2007 දෙසැම්බර් 10 වන දින දරණ ලිපියක් මගින් තම පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස ලියාපිදිංචි කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලා සිටි අතර එකී ඉල්ලීම මැතිවරණ කොමසාරිස්ගේ 2008 ජනවාරි 21 දරණ ලිපිය මගින් ප්‍රතික්ෂේප කරන ලද බවද කියා සිටි පෙත්සම්කරු අභියාචනාධිකරණයෙන් පහත සහන ඉල්ලා සිටින ලදී.

- ❖ මැතිවරණ කොමසාරිස්වරයාගේ 2008 ජනවාරි 21 දින දරණ ලිපිය බලරහිත කරන සර්ෂියෝරාරි ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස,
- ❖ සිංහල ජාතික පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගන්නා ලෙසත් එහි ලකුණ ඔටුන්න ලෙස පිළිගන්නා ලෙසත් බලකරන මැන්ඩාමුස් ස්වභාවයේ රිට් ආඥාවක් වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට එරෙහිව නිකුත් කරන ලෙසත්.

මෙම පෙත්සම අභියාචනාධිකරණය විසින් 2010 ජූලි 2 වන දින ප්‍රතික්ෂේප කරන ලදී.

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියාචනය

අභියාචනාධිකරණයේ තීරණයෙන් අතෘප්තියට පත් පෙත්සම්කරු 2011 ජූලි 8 වන දින එකී තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී. එම අභියාචනය මගින් පෙත්සම්කරු මූලික ප්‍රශ්න දෙකක් මතු කරන ලදී.

- ❖ මැතිවරණ කොමසාරිස්වරයා ඉදිරියේ ප්‍රමාණවත් කරුණු තිබියදී දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම සඳහා පෙත්සම්කරුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරමින් මැතිවරණ කොමසාරිස්වරයාගේ නියෝගය අභියෝගයට ලක් කරමින් පෙත්සම්කරුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම අභියාචනාධිකරණය වරදක් කළේද?

❖ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 9(7) වගන්තියේ අවසාන වගන්තිය අවසාන වශයෙන් දැක්වීමේදී අභියාචනාධිකරණය වැරදි සහ/හෝ වැරදි ලෙස මගපෙන්වීමක් කර තිබේද?

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

මෙම අභියාචනා පෙත්සම විභාග කරන ලද්දේ කේ ශ්‍රීපවන්, සිසිර ජේ ද ආබෲ සහ සරත් ද ආබෲ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. සරත් ද ආබෲ විනිසුරුවරයාගේද එකඟතාව මත 2014 දෙසැම්බර් මස 17 වන දින සිසිර ද ආබෲ විනිසුරුවරයා විසින් බහුතරයේ තීන්දුව ප්‍රකාශයට පත් කළ අතර, එම තීරණයේ අවසානය එළඹීමට එකඟවෙමින් ශ්‍රීපවන් විනිසුරුවරයා වෙනත් තීන්දුවක් ප්‍රකාශයට පත් කරන ලදී.

සිසිර ද ආබෲ විනිසුරුවරයා සිය තීන්දුව මගින් මුලින්ම අවධානයට යොමුකරන ලද්දේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 (5) වගන්තිය යටතේ සිදුකරන ලද නියෝගයක් අවසානාත්මක වන බවට අභියාචනාධිකරණයේ තීරණය පිළිබඳවයි එහිදී විනිසුරුවරයා විසින් පනතේ 7(7) වගන්තිය යටතේ පවතින ප්‍රතිපාදනය එනම්,

"(7) (4) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් (5) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක් අවසානාත්මක විය යුතු අතර, එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කිරීමකට භාජනය නොකළ යුතු ය."

යන්න පිළිබඳව සිය අර්ථ නිරූපණය ලබාදෙන ලදී. ඒ අනුව අර්ථ නිරූපණය ආඥා පනතට අනුව අවසානාත්මක යැයි සඳහන් වන නියෝගයක් වුවද ස්වභාවික යුක්තියේ මූලධර්ම උල්ලංඝනය කර තිබේනම් එම නියෝගය අධිකරණයට ප්‍රශ්න කළ හැකි බව පෙන්වාදුන් විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ අභියාචනාධිකරණයට රිට් ආඥා බලය ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අභිබවා යන පරිදි පාර්ලිමේන්තු පනතක ප්‍රතිපාදන තේරුම් නොගත යුතු බවයි.

එහිදී විනිසුරුවරයා විසින් B.Sirisena Coory Vs Tissa Dias Bandaranayake ([1991] 1 Sri L.R.1) යන ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේදී ධීරරත්න විනිසුරුවරයා විසින් දක්වන ලද මතයද, උපුටා දක්වන ලදී. ඒ අනුව මැතිවරණ කොමසාරිස් විසින් මෙම පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට සිය

විරෝධතා ප්‍රකාශයේදී දක්වන ලද හේතු කෙරෙහි අවධානය යොමුකරන ලදී. එකී හේතු වන්නේ

01. පක්ෂයේ අය යම් යම් අවස්ථාවලදී පක්ෂයක් ලෙස නොව ස්වාධීනව කටයුතු කර තිබීම.

02. 1999 සිට සභික සංඛ්‍යාව වැඩිවීමක් සිදුවී නොමැති අතර පෙත්සම්කරුට එහි සාමාජිකයන් වැඩිකර ගත හැක්කේ දේශපාලන පක්ෂයකට පමණක් බවට සාවද්‍ය අදහසක් ඇත.

03. දේශපාලන කටයුතුවල නිරත වීමට නම් තම පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් විය යුතු බවට පෙත්සම්කරු මතයක් ගොඩනගා ඇත.

04. තමන් පක්ෂයක් ලෙස සැලකුවත් ඔවුන්ගේ කටයුතුවල නියැලෙන්නේ සීමිත පිරිසකි.

05. 1999 සිට කිසිම අවස්ථාවක, පෙත්සම්කරුගේ පක්ෂය ස්වාධීන පක්ෂයක් ලෙස මැතිවරණයකට ඉදිරිපත් වී නැත.

06. පෙත්සම්කරුගේ පාර්ශවය පිළිගත් දේශපාලන පක්ෂයකින් කැඩී ගිය කණ්ඩායමක් නොවේ.

මෙම කරුණු පිළිබඳව අවධානය කළ විනිසුරුවරයා සිය තීන්දුවේ සඳහන් කර ඇත්තේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් දක්වන ලද කරුණ එම පක්‍ෂය පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ සාධාරණ කරුණක් ලෙස පිළිගත නොහැකි බවයි. එසේම කොමසාරිස්වරයා දක්වා සිටි 5 වන කරුණට අවධානය යොමුකළ විනිසුරුවරයා ප්‍රකාශ කරන ලද්දේ පෙත්සම්කරු 2000 වර්ෂයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා සිහල උරුමය පක්‍ෂයෙන් තරඟ කර ඇති බවට සාක්ෂි ඉදිරිපත් වී ඇති බවයි. එසේම පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5) වගන්තිය මගින් පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස පිළිගැනීමට මැතිවරණයක් සඳහා තරඟ කර තිබීම අත්‍යවශ්‍ය බවට පැහැදිලි ප්‍රතිපාදන නොමැති බව පෙන්වාදුන් විනිසුරුවරයා ඒ බව අභියාචනාධිකරණය විසින් සිය තීරණයේදී සැලකිල්ලට ගෙන නොමැති බව ප්‍රකාශ කරන ලදී.
විනිසුරුවරයා සිය තීරණයේදී සඳහන් කළේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5) වගන්තිය යටතේ පිළිගත් දේශපාලන පක්‍ෂයක් ලෙස පිළිගැනීම සඳහා අවශ්‍ය කරුණු 2ක් පමණක් බවයි. එනම්,

01. පිළිගැනීමට ඉල්ලුම් කරන පාර්ශවය දේශපාලන පක්ෂයක් විය යුතුය.

02. පනත යටතේ ඕනෑම මැතිවරණයකට තරඟ කිරීමට එවැනි පක්ෂයක් සංවිධානය විය යුතුය.

මෙම පක්ෂයේ ජාතික සංවිධායකවරයා 2008 සබරගමුව පළාත් සභාව සඳහා මහජන එක්සත් පෙරමුණ ඡන්ද ලකුණ යටතේ ඉදිරිපත් වී ඇති බවටත්, පෙත්සම්කරු 2000 පාර්ලිමේන්තු මැතිවරණයේදී සිහළ උරුමය පක්ෂයෙන් තරඟ කර ඇති බවටත්, 1999 ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූ ආචාර්ය හරිස්චන්ද්‍ර විජේතුංග හට මෙම පක්ෂය සහය ලබාදී ඇති බවටත් කරුණු ඉදිරිපත් වී ඇති බව පැවසූ විනිසුරුවරයා ඒ අනුව පනතේ 7(5) වගන්තිය මගින් දක්වන අවශ්‍යතා මෙම පක්ෂය සම්පූර්ණ කර ඇති බවට තීරණය කරන ලදී. ඒ අනුව වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ 2008 ජනවාරි 21 දින දරණ ලිපිය සම්බන්ධ අභියාචනාධිකරණයේ තීරණය අවලංගු කළ ශ්‍රේෂ්ඨාධිකරණය සිංහල ජාතික පෙරමුණ පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සහ අදාළ ඡන්ද ලකුණ පිළිගත යුතු යැයි මැන්ඩාමුස් රිට් ආඥාවක් මැතිවරණ කොමසාරිස්වරයාට එරෙහිව නිකුත් කරන ලදී.

දහඅටවන පරිච්ඡේදය

# මහජන නියෝජිත ආයතන විසුරුවාහැරීම

පාර්ලිමේන්තුව පළාත් සභා සහ පළාත් පාලන ආයතන මහජන ඡන්දයෙන් පත්වන්නේ නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහාය. නමුත් ඇතැම් අවස්ථාවලදී එම නීතියෙන් නියමකර ඇති නිශ්චිත කාලය ඉක්මවීමට පෙර ඒවා විසුරුවාහැරීමට කටයුතු කරන අවස්ථාවන් දක්නට ලැබේ. නීතියෙන් නියමකර ඇති කාල පරිච්ඡේදය අවසාන වීමට පෙර විසුරුවාහැරීම පිළිබඳ නීති තත්ත්වය සහ ඒ පිළිබඳව තීරණාත්මක නඩු තීන්දු කිහිපයක් පිළිබඳව මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලබයි.

## 18.1 මහජන නියෝජිත ආයතන විසුරුවාහැරීම පිළිබඳ නීතිප්‍රතිපාදන

### පාර්ලිමේන්තුව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62වන ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුව මහජන ඡන්දයෙන් පත්වන්නේ වසර 5ක කාල පරිච්ඡේදයක් සඳහාය. එසේම එහි තවදුරටත් දක්වෙන්නේ පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ සිට වසරක දක්වා කාලයක් තුළ පාර්ලිමේන්තුව විසුරුවාහැරිය නොහැකි බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව දක්වන්නේ පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ බලය ජනාධිපතිවරයා සතු වන බවත් පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ සිට වසර දෙක හමාරකට පසුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ බලය හිමිවන බවත් එයට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හරින්නේ නම් පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන්ද ඇතුලුව 2/3ක බහුතර ඡන්දයෙන් යෝජනාවක් සම්මත කරගත යුතු බවත්ය.

**පළාත් සභා**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඉ ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ කලින් විසුරුවා හැරියොත් මිස පළාත් සභාවක ධූරකාලය පළමු රැස්වීමේ සිට වසර 5ක් පවතින බවයි. එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ආ)(8)(අ) ව්‍යවස්ථාවේ දැක්වෙන්නේ පළාත් සභාව විසුරුවාහැරීමේ බලය ආණ්ඩුකාරවරයා සතු වන බවයි. එසේම එම ව්‍යවස්ථාවේ තවදුරටත් දැක්වෙන්නේ පළාත් සභාවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක සහයෝගය අමාත්‍ය මණ්ඩලයට ඇති තාක් ආණ්ඩුකාරවරයා මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස්වලට අනුකූලව ක්‍රියාත්මක විය යුතු බවයි.

**පළාත් පාලන ආයතන**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 5 වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවක ධූර කාලය මාස 48කි. එසේම අමාත්‍යවරයාට ගැසට් නිවේදනයක් මගින් එම ධූරකාලය අවසාන වන වර්ෂයේ හෝ ඊට පෙරාතුව වර්ෂයේ හෝ ඒ ධූරකාලය අවසන් වන මාසයකට පූර්වයෙන් වන කවර හෝ මාසයක දිනයක් ඒ ධූරකාලය අවසන් වන දිනය වෙනුවට ආදේශ කරමින් ඒ ධූරකාලය අවසන් වන දිනය වෙනුවට ආදේශ කරමින් නියමයක් කිරීමෙන් ඒ ධූරකාලය අඩු කරනු ලැබිය හැකි බවට ද එම වගන්තියේ සඳහන් වේ. එසේම ප්‍රාදේශීය සභාවක මාස 48 ක ධූර කාලය අමාත්‍යවරයාට ගැසට් නිවේදනයක් මගින් වසරක් දක්වා දීර්ඝ කළ හැකි බවද එම වගන්තියේ තවදුරටත් සඳහන් වේ. මෙයට සමාන ප්‍රතිපාදන (252 අධිකාරය ) මහනගර සභා ආඥා පනතේ 10 වගන්තිය තුළත් (255 අධිකාරිය) නගර සභා ආඥා පනතේ 10 වගන්තිය තුළත් ඇතුළත් වේ.

## 18.2 පළාත් සභාවක් විසුරුවාහැරීමේදී ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා කටයුතු කළ යුතුය

**මෛත්‍රීපාල සේනානායක උතුරු මැද ආණ්ඩුකාර එදිරිව මහින්දසෝම සහ තවත් අය**

**Maithripala Senanayake, Governor of the North-Central Province and Another v. Gamage Don Mahindasoma and Others (1998) 2 Sri LR. 333**

## පසුබිම

උතුරු මැද පළාත් සභාව සඳහා 1993 මැයි 17 වන දින පැවති ඡන්ද විමසීම මගින් එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රීවරුන් 18 දෙනෙකුද ජනතා සන්ධානයට 11 දෙනෙකුද ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණට මන්ත්‍රීවරුන් 3ක්ද, මුස්ලිම් කොංග්‍රසයට එක් මන්ත්‍රීධුරයක් ද හිමිව තිබිණි. 1995 දෙසැම්බර් මස 21 වන දින පළාත් සභාව විසිරවීමට එරෙහිව යෝජනාවක්ද, මෙම පළාත් සභාව විසින් සම්මත කරගෙන තිබිණි. එසේම පළාත් සභාව විසුරුවා හැරීමට විරුද්ධත්වය ප්‍රධාන අමාත්‍යවරයා ලිපියක් මගින් ආණ්ඩුකාරවරයාට දන්වා තිබිණි. එසේ තිබියදී 1996 ජනවාරි 2 වන දින ජනාධිපතිගේ නියෝගයක් ලබාගත් ආණ්ඩුකාරවරයා 1996 ජනවාරි 3 වන දින අංක 904/7 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් උතුරු මැද පළාත් සභාව විසුරුවාහරින ලදී.

සබරගමුව පළාත් සභාව සඳහා 1993 මැයි 17 වන දින පැවති ඡන්ද විමසීම මගින් එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රීවරුන් 24 දෙනෙකුද ජනතා සන්ධානයට 14 දෙනෙකුද ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණට මන්ත්‍රීවරුන් 5ක්ද නව සමසමාජ පක්ෂයට එක් මන්ත්‍රීධුරයක් ද හිමිව තිබිණි. 1995 දෙසැම්බර් 14 වන දින ආණ්ඩුකාරවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිපියක් යොමුකරමින් දන්වා සිටියේ පළාත් සභාව විසුරුවා හැරීමට කටයුතු කරන බවත් ඒ සඳහා නිරීක්ෂණ ලබාදෙන ලෙසත්ය. ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඒ සඳහා ප්‍රතිචාර දක්වමින් ලිපියකින් 1995 දෙසැම්බර් 19 වන දින දැනුම් දුන්නේ පළාත් සභාව විසුරුවාහැරීමට තමන් විරුද්ධ බවයි. එසේ තිබියදී 1996 ජනවාරි 2 වන දින ජනාධිපතිගේ නියෝගයක් ලබාගත් ආණ්ඩුකාරවරයා 1996 ජනවාරි 3 වන දින අංක 904/7 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් උතුරු මැද පළාත් සභාව විසුරුවාහරින ලදී.

එසේම 1996 ජනවාරි 4 වන දින මැතිවරණ කොමසාරිස්වරයා විසින් අංක 904/13 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් මෙම පළාත් දෙක සඳහා ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා 1996 ජනවාරි 18 වන දින සිට නාමයෝජනා කැඳවන බව ප්‍රකාශයට පත් කර තිබිණි.

මේ සම්බන්ධව පළාත් දෙකෙහිම ප්‍රධාන අමාත්‍යවරුන් පළාත් ආණ්ඩුකාරවරුන්ගේ තීරණය අවලංගු කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණය ඉදිරියේ රිට් පෙත්සම් ගොනු කරන ලදී.

## රිට් පෙත්සම්

උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය මහින්දසෝම විසින් එහි ආණ්ඩුකාර මෛත්‍රීපාල සේනානායකව වගඋත්තරකරු කරමින් පවරණ ලද නඩුව අංක CA writ Application 17/96 යටතේ ලියාපදිංචිවූ අතර සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා වූ ජයතිලක පොඩි නිළමේ විසින් එහි ආණ්ඩුකාරවරයා වූ සාලිය මැතිව් වගඋත්තරකරු කරමින් පවරණ ලද රිට් ඉල්ලීම CA writ Application 18/96 යටතේ ලියාපදිංචි වී තිබිණි.

මෙම පෙත්සම් දෙක මගින් ම චෝදනා කර තිබුණේ පළාත් සභාවක ධූර කාලය වසර 5ක් බවත්. එම කාලයට පෙර පළාත් සභාව විසිරවීම සඳහා ආණ්ඩුකාරවරයාට බලය ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8)(ඇ) ව්‍යවස්ථාව යටතේ පමණක් බවත්ය. පළාත් සභාවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක සහයෝගය අමාත්‍ය මණ්ඩලයට ඇති තාක් ආණ්ඩුකාරවරයා මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක විය යුතු බවත් මෙම අවස්ථාවේදී ප්‍රධාන අමාත්‍යවරුන්ගේ උපදෙස් වලට පටහැනිව ආණ්ඩුකාරවරුන් ක්‍රියාකර ඇති බවයි.

ඒ අනුව පෙත්සම්කරුවන් පහත සහන අධිකරණයෙන් අයැද සිටින ලදී.

- ❖ පළාත් සභා විසිරවීමේ ආණ්ඩුකාරවරුන්ගේ නියෝගය බලරහිත කරන සර්ෂියෝරාරි ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,
- ❖ අදාළ පළාත් සභා දෙක සඳහා ඡන්ද විමසීමට නාමයෝජනා කැඳවීමේ මැතිවරණ කොමසාරිස්ගේ තීරණය බලරහිත කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,
- ❖ පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට අදාළව සිදුකරන කටයුතු වලින් මැතිවරණ කොමසාරිස්වරයා වළක්වන ප්‍රොහිබිෂන් ස්වභාවයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,
- ❖ පෙත්සම් විභාගය අවසන් වන තෙක් මැතිවරණ කොමසාරිස්වරයා නාමයෝජනා භාරගැනීමෙන් වැළැක්වීමේ අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත්,
- ❖ නඩු ගාස්තු ලබාදෙන ලෙසත් වේ.

## අතුරු තහනම් නියෝගය පිළිබඳ තීරණය

Mahindasoma V. Hon. Maithripala Senanayake (1996)1 Sri L R 364

රිට් පෙත්සම් මගින් ඉල්ලා සිටි මැතිවරණ කොමසාරිස්වරයාට එරෙහි අතුරු තහනම් නියෝගය නිකුත් කිරීම පිළිබඳව තීන්දුව ජේ.ඒ.එන් ද සිල්වා විනිසුරුවරයාගේ ද එකඟතාව මත ආචාර්ය අශෝක ද ඉසඩ් ගුණවර්ධන විනිසුරුවරයා විසින් 1996 ජනාවරි 16 වන දින නිකුත් කරන ලදී. එහිදී විනිසුරුවරයා සඳහන් කරන ලද්දේ අධිකරණය විසින් අතුරු සහනයක් ලබාදීමේදී අධිකරණය මගපෙන්වීම් 2ක් මත කටයුතු කරන බවයි. එනම්

(අ) පෙත්සම්කරු සාර්ථක වන්නේ නම් අවසාන නියෝගය නිෂේධනාත්මක/බල රහිත ස්වරූපයෙන් සලකනු ලබයිද?

(ආ) පහසුවෙහි තුලනය/සැසඳීම පවතින්නේ කවරෙකුට ද? පෙත්සම්කාර පාර්ශවයේ ද වගඋත්තරකාර පාර්ශවයේ ද යන්න. (වෙනත් වචන වලින් කිවහොත්, වාරණ නියෝගය ප්‍රතික්ෂේප කිරීමෙන් අයදුම්කරුට සිදුවිය හැකි සංසන්දනාත්මක අකටයුතුකම්, දුෂ්කරතා හෝ අපහසුතාවය, එය ලබා දීමෙන් විරුද්ධ පාර්ශ්වයට ඇති වීමට ඉඩ ඇති ප්‍රමාණයට වඩා වැඩි බව අධිකරණය සෑහීමකට පත් විය යුතුය.)

මේ අනුව විනිසුරුවරයා 2වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා 1996 ජනාවරි 4 සහ අංක 904/13 දරණ ගැසට් පත්‍රය අනුව කටයුතු කරමින් නාමයෝජනා ලබාගැනීම වළක්වන තහනම් නියෝගයක් මෙම පෙත්සම් විභාගය අවසන් වන තෙක් නිකුත් කරන ලදී.

### රිට් පෙත්සම් විභාගය

මෙම රිට් පෙත්සම් දෙකම එකම විභාගයකදී සලකා බැලීම සිදුකරන ලදී. විනිසුරු මඩුල්ල වූයේ ආචාර්ය අශෝක ද ඉසඩ් ගුණවර්ධන සහ ජේ.ඒ.එන් ද සිල්වා යන අභියාචනාධිකරණ විනිසුරුවරුන්ය.

තමන් පොදු යහපත වෙනුවෙන් කටයුතු කර ඇති බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(2) ව්‍යවස්ථාව යටතේ කටයුතු කර ඇති බවත්,

ජනාධිපතිවරිය විසින් 1996 ජනවාරි 2 වන දින මෙම පළාත් සභා විසුරුවන ලෙස තමන්ට උපදෙස් ලබාදී ඇති බවත් ඒ අනුව ජනාධිපතිගේ උපදෙස් පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ සහ 154ඊ යටතේ මෙම පළාත් සභා විසුරුවා ඇති බවත් වගඋත්තරකරුවන් අධිකරණය ඉදිරියේ කරුණු දක්වමින් ප්‍රකාශ කරන ලදී. එසේම දෙවන වගඋත්තරකරුගේ නීතිඥයා කරුණු දක්වමින් 154ආ(ඇ) ව්‍යවස්ථාව මගින් ද ආණ්ඩුකාරවරයාට පළාත් සභාව විසිරවීමට හැකි බව දක්වා ඇති බවත්, එසේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ(2) අනුව ජනාධිපතිගේ උපදෙස් මත ආණ්ඩුකාරවරයා විසින් සිදුකරන ක්‍රියාවන් අධිකරණයේ ප්‍රශ්න කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. ජනාධිපති විසින් ආණ්ඩුකාරවරයා පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාවෙන් ජනාධිපතිට පැවරී ඇති බලතල අනුව බැවින් ජනාධිපතිගේ නියෝගයක් මගින් ආණ්ඩුකාරවරයා එය ක්‍රියාත්මක කිරීම සඳහා බැඳී සිටින බවත්, 17/96 පෙත්සමේ පළමු වගඋත්තරකරුගේ නීතිඥයා ප්‍රකාශ කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8)(ඈ) ව්‍යවස්ථාවේ සඳහන් වචන අනුව ආණ්ඩුකාරවරයා ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් පිළිපැදීම අනිවාර්යය නොවන බවටද තර්ක කරන ලදී.

## අභියාචනාධිකරණ තීරණය

Mahindasoma V. Senanayake and Another (1996)1 Sri L R 180

1996 මාර්තු 27 වන දින අභියාචානධිකරණ විනිසුරු සිල්වාගේ ද එඟකතාවය මත මෙම පෙත්සම් විභාගයේ තීරණය ලබාදෙන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය අශෝක ද ඉසඩ් ගුණවර්ධන විනිසුරුවරයා විසිනි. විනිසුරුවරයා මූලිකවම ප්‍රකාශ කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8) ඇ සහ ඈ ව්‍යවස්ථාවල අන්තරගතය පරීක්ෂා කිරීමේදී පළාත් සභාවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක සහය මහ ඇමතිවරයාට පවතින තාක් දුරට 154ආ ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා මහඇමතිවරයාගේ උපදෙස් පිළිපැදීම ආණ්ඩුකාරවරයාට අනිවාර්යය වන බවයි.

ඒ අනුව ආණ්ඩුකාරවරයා 154ආ(8)(ඇ) ව්‍යවස්ථාවෙන් සිදුකළ යුතු කාර්යයන් සම්බන්ධව ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත කටයුතු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව බැඳීමක් පවතින බැවින් 154ඊ (2) ව්‍යවස්ථාව මේ සඳහා සම්බන්ධ කිරීම අදාළ නොවන බව විනිසුරුවරයා ප්‍රකාශ කරන ලදී.

එසේම විධායක බලය යන්නද සීමාවකින් තොර බලයක් නොවන බවද මෙහිදී විනිසුරුවරයා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී විනිසුරුවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිට පාර්ලිමේන්තුව විසුරුවාහැරීමට ඇති බලය පිළිබඳව පෙන්වා දෙමින් එයට සීමාවක් පවතින බව පෙන්වා දෙන ලදී.

ඒ අනුව උතුරු මැද පළාත් සභාව සහ සබරගමුව පළාත් සභා විසිරවීමේ ආණ්ඩුකාරවරුන්ගේ තීරණ නීති විරෝධී සහ බලරහිත බව ප්‍රකාශ කළ විනිසුරුවරයා එම නියෝග බලරහිත කරන සර්ෂියෝරාරි රිට් ආඥා වගඋත්තරකරුවන්ට එරෙහිව නිකුත් කරන ලදී. එසේම මැතිවරණ කොමසාරිස්වරයාව ඡන්ද විමසීම වැළැක්වීම සඳහා ප්‍රොහිබිෂන් රිට් ආඥාවක්ද රුපියල් 5000ක නඩු ගාස්තුද නියම කරන ලදී.

මෙම අභියාචනාධිකරණයේ මෙම තීරණයෙන් තෘප්තිමත් නොවූ වගඋත්තරකරුවන් එම තීරණයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකරන ලදී.

**ශ්‍රේෂ්ඨාධිකරණයට සිදුකළ අභියාචනය**

Maithripala Senanayake, Governor of the North-Central Province and Another v. Gamage Don Mahindasoma and Others (1998) 2 Sri LR. 333

වගඋත්තරකරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට කළ අභියාචනා SC Appeal no 41/96 iy 42/96 යන අංක යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ලියාපදිංචි වී තිබිණි. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය පහත නීතිමය ප්‍රශ්න විසඳීම සඳහා මෙම පෙත්සම් අභියාචනා කිරීම සඳහා අවසරය ලබාදී තිබිණි.

- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8)(ඇ) හි සඳහන් ආණ්ඩුකාරවරයාගේ බලය අභිමතානුසාරී බලයක් ලෙස සලකනු ලබන්නේද? යන්න සහ එසේනම් එම බලය ජනාධිපතිවරයාගේ මඟපෙන්වීම මත ක්‍රියාත්මක කිරීමට අවශ්‍යද යන්න.
- ❖ 154ආ(8)(ඈ) ව්‍යවස්ථාව මගින් ආණ්ඩුකාරවරයාගේ බලය ක්‍රියාත්මක කළ යුත්තේ නියෝජිතයකු ලෙස පමණක්ද? යන්න.

❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8)(ඈ) ව්‍යවස්ථාවට පසුව තිබෙන 154ආ(9) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන එම ව්‍යවස්ථාවට අදාළ වන්නේද?

මෙම අභියාචනා විභාග කරන ලද්දේ අගවිනිසුරු ජී.පී.එස්. ද සිල්වා සහ අමරසිංහ සහ රාමනාදන් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි. 1996 ඔක්තෝබර් 14 වන දින අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව මත අමරසිංහ විනිසුරුවරයා විසින් අභියාචනා විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලදී.

සිය තීරණය ප්‍රකාශයට පත්කරමින් විනිසුරුවරයා ප්‍රකාශ කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (8) (ඇ) යටතේ පළාත් සභාවක් විසිරවීමේ බලය ආණ්ඩුකාරවරයා ක්‍රියාත්මක කළයුත්තේ 154ආ(8)ඈ) ව්‍යවස්ථාවට අනුව ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත බවයි. 154ආ(8)(ඇ) මගින් ආණ්ඩුකාරයාට අභිමත බලයක් ලැබෙන නමුත් එම බලතල 154ආ(8)(ඈ) ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන සමග සම්බන්ධ වන බවද, ප්‍රකාශ කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8)(ඇ) මගින් පළාත් සභාව විසුරුවා හැරීමේ බලය ආණ්ඩුකාරවරයාට පවරාදී ඇති අතර එය නැවත ජනාධිපතිවරයාට පවරා දීමක් සිදුකර නොමැත.

මේ අනුව අභියාචනාධිකරණයේ තීරණය තහවුරු කරමින් අභියාචනා පෙත්සම් දෙකම නිශ්ප්‍රභා කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵල

මෙම ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය අනුව උතුරු මැද සහ සබරගමුව පළාත් සභා විසිර වීම අහෝසි වූ අතර මැතිවරණ කොමසාරිස්වරයාගේ නාමයෝජනා කැඳවීමද අහෝසි විය. (1996 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව.1997.5 ) ඒ අනුව උතුරු මැද පළාත් සභාව සහ සබරගමුව පළාත් සභාවල නිල කාලය 1995 ජූනි මාසය දක්වා පවත්වන ලදී. එම පළාත් වල ඊළඟ මැතිවරණය 1999 අප්‍රේල් 6 පවත්වන ලදී.(මැතිවරණ කොමිෂන් සභාවේ නිල මැතිවරණ ප්‍රතිඵල)

## 18.3 බලයේ සිටින ජනාධිපති අපේක්ෂකයා ජයග්‍රහණය කළ විට ධූරකාලය ආරම්භ වන්නේ එම මැතිවරණ ප්‍රතිඵල නිකුත්වූ දිනයේ සිටය

**ඕමල්පේ සෝභිත හිමි එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අයෙක්**
**Omalpe Sobhita Thero v Dayananda Dissanayake and another (2008) 2 Sri L.R 121**

**පසුබිම**
චන්ද්‍රිකා බණ්ඩාරණායක ජනාධිපති ධූරයට පත්වූයේ 1994 නොවැම්බර් 10 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31වන ව්‍යවස්ථාව අනුව ඇයගේ ධූරකාලය අවසන් වීමට නියමිත වූයේ 2000 නොවැම්බර් 10 වන දින දීය. එසේ තිබියදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(3අ)(අ)(i)ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන (මේ පරිච්ඡේදයේ ඉහතින් වූ විධිවිධාන වලට පටහැනිව කුමක් සඳහන්ව ඇත් ද, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් දෙවන ධූරකාලයක් සඳහා තමා තෝරා පත්කර ගැනීමෙන් ධූරය දැරීම පිණිස වරමක් ලබා ගැනීම සඳහා ජනතාව වෙත ආයාචනය කිරීමේ තම අභිලාශය තම ප්‍රථම ධූරකාලය ආරම්භ වී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය;) අනුව යමින් සිය දෙවන ධූරකාලය සඳහා චන්ද්‍රිකා බණ්ඩාරණායක ජනාධිපතිවරණයට ඉදිරිපත් වන බවට අති විශෙෂ ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කරන ලද අතර ඒ අනුව ජනාධිපති මැතිවරණය 1999 දෙසැම්බර් 21 වන දින පවත්වන ලදී. 1999 දෙසැම්බර් 22 දින නිකුත් කරන ලද මැතිවරණ ප්‍රතිඵලය අනුව චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග දෙවන වරටත් තේරීපත්විය.

ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරණායකගේ දෙවන ජනාධිපති ධූරකාලය අවසන් වි ඊළඟ ජනාධිපතිවරණය පවත්වන්නේ 2004 වර්ෂයේද 2005 වර්ෂයේද යන්න පිළිබඳව සමාජය තුළ සංවාදයට භාජනය වී තිබිණි. ඒ පිළිබඳ පෙත්සම්කාර ඕමල්පේ සෝභිත හිමියන් මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ලිඛිතව ඉල්ලීමක් සිදුකළ අතර එම ලිපියට ප්‍රතිචාරයක් නොලැබුනි. ඒ අනුව ඕමල්පේ සෝභිත හිමියන් විසින් මැතිවරණ කොමසාරිස්ට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පවරන ලදී.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

තමන් බෞද්ධ මූලධර්ම මත පදනම් වූ පිළිගත් දේශපාලන පක්ෂයක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවත් තමන් ඇතුලුව 9 දෙනෙකු මෙම පක්ෂ නියෝජනය කරමින් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වන බවත් සිය පෙත්සම මගින් දක්වා සිටින ලදී. ජනාධිපතිනියගේ දෙවන ධූරකාලය අවසන් වන දිනය සහ නැවත ජනාධිපතිවරණයක් පවත්වන දිනය සම්බන්ධයෙන් විවිධ දේශපාලන පක්ෂ විවිධ අදහස් පලකරන ලද බවත්, ඇතැම් දෙනෙක් 2004 දෙසැම්බර් මාසයේ දෙවන ධූරකාලය අවසන් වන බව ප්‍රකාශ කරන අතර ඇතැම් පාර්ශවයන් 2005 දෙසැම්බර් මාසයේ දෙවන ධූරකාල අවසන් වන බව ප්‍රකාශ කළ බවත් පෙන්වාදුන් පෙත්සම්කරු තමන්ට දේශපාලන ස්ථාවරයක් ලබාගැනීම සඳහා ජනාධිපතිනියගේ දෙවන ධූරකාලය අවසන් වන දිනය සහ නැවත් ජනාධිපතිවරණයක් පැවැත්වෙන කාල වකවානුව දැනගැනීමට අවශ්‍ය බැවින් ඒ පිළිබඳව 1වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් මගින් කරුණු විමසීමක් සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් එම ලිපියට මැතිවරණ කොමසාරිස්වරයා පිළිතුරු ලබා නොදුන් බව සඳහන් කළ පෙත්සම්කරු මැතිවරණ කොමසාරිස්ගේ මෙම ක්‍රියාව මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති "නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය" යන මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන බවට මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් චෝදනා නගා තිබිණි.

## මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගය

SC (FR) 278/2005 යන අංකය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ලියාපදිංචි වී තිබූ මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම විභාගයට ගැනීම සඳහා නීතිපතිවරයා විරෝධයක් ඉදිරිපත් නොකරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31(3අ)(ඈ)(i) ව්‍යවස්ථාව සම්බන්ධව ජනතාවට වැදගත් වන අර්ථ නිරූපණයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 125(1) ව්‍යවස්ථාව යටතේ කඩිනමින් විභාගයට ගැනීමට අධිකරණය තීරණය කළ අතර ඒ අනුව මෙම පෙත්සම සඳහා ඇතුළත් වීමට ඉල්ලා සිටි පාර්ශවයන්ට ඇතුළත් වීමට අවස්ථාව නොදී නමුත් එම ඇතුළත් වන පාර්ශවයන්ගේ නීතිඥයන්ට පෙත්සම් විභාගය සඳහා සහභාගී වීමට අවස්ථාව ලබාදීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී.

පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු සරත් නන්ද සිල්වා, සමග ජයසිංහ, උදලාගම, දිසානායක,අමරතුංග යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමන්ලා විසිනි.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය

අනෙක් සියලුම විනිසුරුවරුන්ගේ එකඟතාවය මත මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ තීරණය 2005 අගෝස්තු 26 වන දින අගවිනිසුරු සරත් නන්ද සිල්වා විසින් ප්‍රකාශයට පත් කරන ලදී. අධිකරණ තීන්දුව මගින් මූලිකවම විධායක ජනාධිපති ක්‍රමය ආරම්භය සහ ධූරකාලය පිළිබඳව විග්‍රහයක් සිදුකරන ලදී. ඒ අනුව 1972 ජනරජ ව්‍යවස්ථාවට 1977 ඔක්තෝබර් 20 දින සිදුකරන ලද දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වා දුන් බව පෙන්වා දුන් අධිකරණය ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වන ව්‍යවස්ථාව සහ 20 වන ව්‍යවස්ථාව සංශෝධනය කරමින් විධායක ජනාධිපතිධූරයක් ස්ථාපනය කරන ලද බව පෙන්වා දෙන ලදී. එසේම ව්‍යවස්ථාවේ නව 26 වන ව්‍යවස්ථාව අනුව ජනතාව විසින් තොරා පත්කර ගනු ලබන විධායක ජනාධිපතිවරයා වසර 6ක කාලයක් සඳහා පත්වන බවත් කෙසේ නමුත් මෙම සංශෝධනය බලාත්මක වන අවස්ථාව වන විට අගමැති ධූරය දරණ තැනැත්තා ඉදිරි වසර 6 ක කාලය සඳහා විධායක ජනාධිපති වන බවත් එහි දක්වා තිබූ බව පෙන්වාදෙන ලදී. එසේම 1978 අගොස්තු 31 වන දින සිට බලාත්මක වූ 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මෙයට සමාන ප්‍රතිපාදන ඇතුළත් කළ බව පෙන්වා දුන් අධිකරණය නව ව්‍යවස්ථාවේ 4වන ව්‍යවස්ථාව මගින් ජනතාව විසින් තෝරා පත් කරගන්නා ජනාධිපති ධූරයක් ස්ථාපනය කරන ලද බව පෙන්වා දෙන ලදී. එසේම ව්‍යවස්ථාවේ 30(2) මගින් ජනාධිපති ධූරකාලය පිළිබඳවද, 92.93 සහ 94 ව්‍යවස්ථා මගින් ජනාධිපති තෝරාපත් කරගැනීම පිළිබඳව සඳහන් වන බවද, පෙන්වා දුන් අධිකරණය 160 වන ව්‍යවස්ථාව මගින් එතෙක් බලයේ සිටි ජනාධිපතිවරයා 1978 පෙබරවාරි 4 වන දින සිට ඉදිරි 6 වසරක කාලය සඳහා ධූරය දරන බවට සඳහන් වූ බවත් පෙන්වා දෙන ලදී.

1982 අගොස්තු 27 වන දින සම්මත වූ තුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව බලයේ සිටින ජනාධිපතිවරයා සිය ධූරකාලයෙන් වසර 4ක් ඉක්මවූ පසු තමන් ඊළඟ ධූරකාලය සඳහා වන මැතිවරණයට ඉදිරිපත් වන බවට ප්‍රකාශයක් කිරීමේ හැකියාව ඇති බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයක් සිදුකරන ලද බව පෙන්වාදුන් අධිකරණය ඒ අනුව 1982 ඔක්තෝබර් 20 වන දින

ජනාධිපතිවරණයක් පැවැත්වූ අතර බලයේ සිටි ජනාධිපතිවරයාම තේරී පත්වූ බවද පෙන්වා දෙන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34(4) ව්‍යවස්ථාව පිළිබඳව අදහස් දැක්වූ අධිකරණය පෙන්වා දුන්නේ ජනාධිපතිවරයාගේ ධූරකාලය පිළිබඳව 34(2) ව්‍යවස්ථාවේ නීතිමය ප්‍රතිපාදන 2ක් අන්තර්ගත බවයි. එනම් සාමාන්‍ය තත්ත්වය යටතේ ජනාධිපතිවරයාගේ ධූරකාලය වසර 6ක් දක්වා පවතින බවට වන ප්‍රතිපාදනය පළමු නීතිමය ප්‍රතිපාදනය බවත් දෙවන නීතිමය ප්‍රතිපාදනය වන්නේ බලයේ සිටින ජනාධිපතිවරයා දෙවන ධූරකාලය සඳහා ප්‍රකාශයක් පත්කිරීම මත පත්වන ජනාධිපතිවරයාගේ ධූරකාලය පිළිබඳව ප්‍රතිපාදනය බවත්ය. සාමාන්‍ය තත්ත්වය යටතේ ජනාධිපතිවරයාගේ ධූරකාලය ධූරය ආරම්භ වූ දින සිට වසර 6ක කාලයක් බවත් බලයේ සිටින ජනාධිපතිවරයා දෙවන වරට ජනාධිපති ලෙස පත්වූ අවස්ථාවේදී ඔහුගේ/ඇයගේ ධූරකාලය ආරම්භ වන්නේ අදාළ ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්වූ අවස්ථාවේ සිට බවත් අධිකරණය පෙන්වා දෙන ලදී.

ඒ අනුව මෙම නිශ්චිත අවස්ථාවේදී චන්ද්‍රිකා බණ්ඩාරණායක ජනාධිපතිනියගේ දෙවන ධූරකාලය ආරම්භ වන්නේ 1999 දෙසැම්බර් 22 දි සිට බව පෙන්වා දුන් අධිකරණය ඒ අනුව ජනාධිපතිනියගේ දෙවන ධූරකාලය 2004 දෙසැම්බර් 22වන දින අවසන්වන බවට තීරණය කරන ලදී.

ඒ අනුව මූලික අයිතිවාසිකම් පෙත්සම අධිකරණය විසින් පිළිගන්නා ලදී. එසේම පළවෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(3) ව්‍යවස්ථාවට අනුකූලව නියමිත පරිදි ජනාධිපතිවරණය පවත්වන ලෙසද නියෝග කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ ප්‍රතිඵල

ඉහත තීරණය අනුව 2005 නොවැම්බර් 17 වන දින ජනාධිපතිවරණය පැවැත්වූ අතර එම ජනාධිපති මැතිවරණය සඳහා අපේක්ෂකයන් 13 ක් ඉදිරිපත් විය. මැතිවරණ ප්‍රතිඵල අනුව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජනාධිපති අපේක්ෂකයා වූ මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කර ජනාධිපති ලෙස තේරී පත්විය.

## 18.4 ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මත පළාත් සභාව විසිරවීම නීත්‍යානුකූල වේ

**රාසයියා තුරයිරත්නම් එදිරිව මහින්ද දේශප්‍රිය**
**Rasiah Thurairatnam vs. Mahinda Deshapriya and 7 Others CA 178/2012**
**C.A.M. 9.08.2012**

### පසුබිම

2008 වර්ෂයේ පැවති නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීමෙන් පත්වූ නැගෙනහිර පළාත් සභාවේ පස් අවුරුදු ධුරකාලය අවසන් වීමට නියමිත වූයේ 2013 ඔක්තෝබර් 5 දිනයටය. පළාත් සභාවේ නිල කාලය අවසන් වන තුරු පළාත් සභාව විසුරුවා නොහැරිය යුතු බවට යෝජනාවක් 2012 අප්‍රේල් 4 වන දින පළාත් සභාවේදී සම්මත කරගන්නා ලදී. එසේ තිබියදී 2012 ජූනි 27 වන දින අති විශෙෂ ගැසට් නිවේදනයක් මගින් නැගෙනහිර ආණ්ඩුකාරවරයා විසින් නැගෙනහිර පළාත් සභාව විසුරුවාහරින ලදී. මෙම නියෝගය අවලංගු කරන ලෙස ඉල්ලා නැගෙනහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයකුව සිටි පෙත්සම්කරු අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනු කරන ලදී.

### රිට් පෙත්සම

මෙම රිට් පෙත්සම මගින් නැගෙහිරි පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා, පළාත් ආණ්ඩුකාරවරයා, නැගෙනහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා, නැගෙනහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යවරයා, නැගෙනහිර පළාත් මහාමාර්ග අමාත්‍යවරයා, නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා නැගෙනහිර පළාත් විපක්ෂ නායකවරයා සහ මැතිවරණ කොමසාරිස්වරයා පිළිවෙලින් 1 සිට 8 දක්වා වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

දෙවන වගඋත්තරකාර ආණ්ඩුකාරවරයාගේ පළාත් සභාව විසුරුවා හැරීමේ තීරණය හේතුවෙන් 8 වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා නැගෙනහිර පළාත සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු යොදමින් පවතින බවත්, මෙම විසුරුවා හැරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බවත් චෝදනා කළ පෙත්සම්කරු පහත සහන ඉල්ලා සිටින ලදී,

❖ වගඋත්තරකරුවන් වෙත නොතීසි නිකුත් කරන ලෙස,

- ❖ දෙවන වගඋත්තරකරුගේ නියෝගය මෙම පෙත්සම අසා නිමවන තෙක් අත් හිටුවන අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙස,
- ❖ නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට අදාළ කටයුතු මෙම පෙත්සම් විභාගය අවසන් වන තෙක් වළක්වන අතුරු තහනම් නියෝගයක් 8 වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට එරෙහිව නිකුත් කරන ලෙස,
- ❖ පළවෙනි වගඋත්තරකාර ප්‍රධාන අමාත්‍යවරයා දෙවන වගඋත්තරකාර අමාත්‍යවරයාට පළාත් සභාව විසුරුවාහැරීමට ලබාදුන් උපදෙස් බලරහිත කරන සර්ෂියෝරාරි ස්වරූපයේ රිට් ආඥාවක් නිකුත් කරන ලෙස සහ /හෝ,
- ❖ නැගෙනහිර පළාත් සභාව විසුරුවා හැරීමේ දෙවන වගඋත්තරකරුගේ තීරණය බලරහිත කරන සර්ෂියොරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙස සහ /හෝ,
- ❖ 8 වන වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයා හෝ ඔහුගේ නිලධාරීන් විසින් නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීමට අදාළ කටයුතු සිදුකිරීම වැළැක්වීමේ ප්‍රොහිබිෂන් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,
- ❖ 8 වන වගඋත්තරකරු නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට ගත් තීරණය අවලංගු කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්,
- ❖ නඩු ගාස්තු ලබාදෙන ලෙසත්ය.

## රිට් පෙත්සම් විභාගය

මෙම පෙත්සම විභාග කරන ලද්දේ සිසිර ඩී ආබෲ, අනිල් ගුණරත්න සහ ඒ.ඩබ්ලිව්.ඒ.සලාම් යන අභියාචනාධිකරණ විනිසුරු මඩුල්ල විසිනි.

පෙත්සම්කරුගේ නීතිඥවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඊ(1) හි සඳහන් වන යම් "පළාතක ආණ්ඩුකාරවරයාට ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහාය වීම සහ උපදෙස් දීම පිණිස ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් වෙනත් අමාත්‍යවරයන් හතර දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ පළාත් අමාත්‍ය මණ්ඩලයක් තිබිය යුත්තේ ය. ආණ්ඩුකාරවරයා විසින් තම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් තම අභිමතය අනුව ඉටු කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ

යටතේ හෝ නියම කරනු ලැබ ඇති තාක් දුරට හැර, ආණ්ඩුකාරවරයා විසින් එම උපදෙස් වලට අනුකූලව තම කර්තව්‍ය ඉටු කළ යුත්තේ ය" යන කරුණ පිළිබඳව අධිකරණයේ අවධානය යොමුකරන ලදී. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8)(ඇ) ව්‍යවස්ථාව යටතේ පළාත් සභාව විසුරුවීමකදී ද ආණ්ඩුකාරවරයා පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයෙන්ම උපදෙස් ලබාගත යුතු බවත් තර්ක කරන ලදී.

## අභියාචනාධිකරණ තීරණය

අනෙක් විනිසුරුවරුන්ගේ ද එකඟතාව මත 2012 අගොස්තු මස 9 වන දින රිට් පෙත්සම් විභාගයේ තීරණය ප්‍රකාශයට පත් කරන ලද්දේ අභියාචනාධිකරණ විනිසුරු සිසිර ද ආබෲ විසිනි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇති Maithripala Senanayake, Governor of the North-Central Province and Another v. Gamage Don Mahindasoma and Others (1998) 2 Sri LR. 333 යන තීරණයට අනුව යමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ආ(8) (ඇ) ව්‍යවස්ථාව යටතේ පළාත් සභාව විසුරුවාහැරීම සඳහා ආණ්ඩුකාරවරයාට එම ඈ ව්‍යවස්ථාව යටතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් මෙම අවස්ථාවේදී ලැබී ඇති බවත් පළාත් සභාවේ බහුතර මන්ත්‍රී කණ්ඩායමේ සහය ප්‍රධාන අමාත්‍යවරයාට පවතින බව නිරීක්ෂණය වන බැවින් ආණ්ඩුකාරවරයාගේ තීරණය නිවැරදි යැයි ප්‍රකාශ කළ විනිසුරුවරයා රිට් පෙත්සම නිශ්ප්‍රභා කරන ලදී.

## අභියාචනාධිකරණයේ තීරණයේ ප්‍රතිඵල

නැගෙනහිර පළාත් සභාව සඳහා වූ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාරගැනීම 2012 ජූලි 12 සිට ජූලි 19 දක්වා සිදුකරන ලදී. අදාළ ඡන්ද විමසීම් 2012 සැප්තැම්බර් මස 8 වන දින පවත්වන ලදී. එම ඡන්ද විමසීමේ ප්‍රතිඵල 2012 සැප්තැම්බර් 17 වන දින අංක 1776/7 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලදී. (2012 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව.2013.13). මේ අනුව රිට් පෙත්සම් විභාගය ආරම්භයේදී අතුරු තහනම් නියෝග නිකුත් නොකළ බැවින් මැතිවරණ කොමසාරිස්වරයා ඡන්ද විමසීමට අදාළ කටයුතු සිදුකරන ලදී.

## 18.5 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුගමනය නොකර පාර්ලිමේන්තුව විසුරුවාහැරීම මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවේ.

**සම්බන්ධන් එදිරිව නීතිපති**
Rajavarothiam Sampanthan v. Attorney General & Others SC FR 351/2018 to 361/2018 SCM 13.12.2018

### පසුබිම

2015 අගෝස්තු 17 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් පත් වූ 8වන පාර්ලිමේන්තුවේ ආරම්භක රැස්වීම 2015 සැප්තැම්බර් 1 වන දින පවත්වන ලද අතර ඒ අනුව එහි නිල කාලය අවසන් වීමට නියමිතව තිබුණේ 2020 සැප්තැම්බර් 1වන දිනය. එවකට ක්‍රියාත්මක වූ 19 වන සංශෝධනය දක්වා සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) වන ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට සිය අභිමතය පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි වන්නේ පර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ සිට වසර හතරක් සහ මාස හයක් පසුවීමෙන් අනතුරුවය. එයට පෙර ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවාහරින්නේ නම් ඒ සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් යෝජනාවක් සම්මත කර තිබිය යුතුය. එසේ තිබියදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා විසින් 2018 නොවැම්බර් 9 වන දින අංක 2096/70 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. එයට පෙර ඔක්තෝබර් 26 වන දින ජනාධිපතිවරයා අති විශෙෂ ගැසට් පත්‍රයක් මගින් රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යධුරයෙන් ඉවත් කර විපක්ෂ නායක ලෙස කටයුතු කළ මහින්ද රාජපක්ෂ අගමැති ලෙස පත් කර තිබිණි. ඉහත කී නොවැම්බර් 9 වන දින ගැසට් පත්‍රය මගින්ම පාර්ලිමේන්තු මැතිවරණය 2019 ජනවාරි 5 වන දිනටත් නාමයෝජනා භාරගැනීම 2018 නොවැම්බර් 19 දින සිට නොවැම්බර් 26 දින දක්වාද නියම කරන ලද අතර පාර්ලිමේන්තුව නැවත කැඳවීම 2019 ජනවාරි 17 වන දිනට නියම කරන ලදී.

මෙම ගැසට් පත්‍රය අනුව යමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් 2018 නොවැම්බර් 10 වන දින අංක 2096/73 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 16 වන වගන්තිය යටතේ ඇප මුදල් තැන්පත් කිරීම පිළිබඳව

නිවේදනයද එදිනම අංක 2096/74 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සඳහා භාරකාර නිලධාරීන් පත් කිරීමද සිදුකරන ලදී. එසේම නොවැම්බර් 11 වන දින අංක 2096/88 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පොදු දේපළ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදාගැනීම වැළැක්වීම සඳහා වන විධානද නිකුත් කරන ලදී.

පාර්ලිමේන්තුව විසුරුවා හැරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති නීතිය ඉදිරියේ සමානාත්මතාවයේ අයිතිය උල්ලංඝනය වූ බවට චෝදනා නගමින් මූලික අයිතිවාසිකම් 10ක් ගොනුකර තිබිණි.

## මූලික අයිතිවාසිකම් පෙත්සම

ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනුකරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් SC FR 351/2018 isg SCFR 361/2018 දක්වා අංකනය වී තිබිණි. මෙම පෙත්සම් වල පෙත්සම්කරුවන් ලෙස පාර්ලිමේන්තුවේ විපක්ෂනායක ආර් සම්බන්ධන්, එක්සත් ජාතික පක්ෂයේ සභාපති සහ ලේකම්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, එක්සත් වාමාංශික පෙරමුණේ ලේකම්, නීතිඥ ජයංගනී පෙරේරා, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන්, සමස්ථ ලංකා මක්කල් කොංග්‍රසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මුස්ලිම් කොංග්‍රසයේ මන්ත්‍රීවරුන්, මැතිවරණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරයකු වන රත්නජීවන් හූල්, පෙත්සම් ගොනුකර තිබිණි. මෙම පෙත්සම් මගින් නීතිපතිවරයා,සියලුම පෙත්සම් මගින් වගඋත්තරකරු කර තිබූ අතර ඇතැම් පෙත්සම් මගින් මැතිවරණ කොමිෂන් සභාව සහ එහි කොමසාරිස්වරුන් තිදෙනා, මැතිවරණ කොමසාරිස් ජනරාල්, පාර්ලිමේන්තුවේ කථානායකවරයා පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, ජනාධිපති ලේකම්වරයා ද වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි. මෙම පෙත්සම් සඳහා මැදිහත් වන පෙත්සම්කරුවන් ලෙස මහාචාර්ය ජී.එල්.පීරිස් සහ උදය ගම්මන්පිල, වැල්ලවත්තගේ ජගත් සිසිර සේන ද සිල්වා, චන්න ජයසුමන, ප්‍රේමනාත් සී දොලවත්ත ද පෙත්සම් ඉදිරිපත් කර තිබිණි. ජනාධිපතිවරයා විසින් නිකුත් කළ 2018 නොවැම්බර් 9 වන දින අංක 2096/70 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද නියෝගය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) වන ව්‍යවස්ථාවට පටහැනි බැවින් එකී නියෝගය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් ආරක්ෂා කර ඇති නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමේ අයිතිය උල්ලංඝනය වී ඇති බවයි. ඇතැම්

පෙත්සම් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසද, 14(1)(ආ) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇත. සාමකාමීව රැස්වීමේ අයිතියද 14(1)(ඇ) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති සමාගමේ නිදහස සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති සිතීමේ සහ හෘදය සාක්ෂියේ නිදහසද උල්ලංඝනය වී ඇති බවට චෝදනා නගන ලදී. ඒ අනුව පෙත්සම් මගින් ජනාධිපතිවරයාගේ නියෝගය සම්බන්ධව පහත චෝදනා ඉදිරිපත් කර තිබිණි.

- ❖ මෙම නියෝගය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බව.
- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විරෝධී ලෙස පාර්ලිමේන්තුවට පහරදීමක්,
- ❖ ජනාධිපතිවරයාගේ බලය ඉක්මවා සිදුකරනු ලද ක්‍රියාවක්,
- ❖ නීති විරෝධි ක්‍රියාවක්,
- ❖ ජනතාවගේ ව්‍යවස්ථාදායක අයිතියට පහර එල්ල කිරීමක්,
- ❖ ජනතාවගේ පරමාධිපති බලය උල්ලංඝනය කිරීමක්,
- ❖ පෙත්සම්කරුවන්ගේ සහ සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්,
- ❖ අත්තනෝමතික අතාර්කික චපල කරදරකාරී සහ අසාධාරණ ක්‍රියාවක්,
- ❖ සාධාරණත්වයේ සහ නීත්‍යානුකූල අපේක්ෂාවේ මූලධර්ම වලට හානි කරන සහ කඩකරන සහ නුසුදුසු අරමුණු මගින් පෙළඹුන ක්‍රියාවක්,
- ❖ නීති විරෝධි සහ බල රහිත සහ නීතියට බලපෑමක් නොමැති නියෝගයක්,

## අතුරු තහනම් නියෝගය

මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයට අවසර ලබා දෙනවාද යන්න පිළිබඳ පරීක්ෂණය අගවිනිසුරු නලින් පෙරේරා, ජනාධිපති නීතිඥ ප්‍රියන්ත ජයවර්ධන සහ ජනාධිපති නීතිඥ ප්‍රසන්න ජයවර්ධන යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයා විසිනි. එම මූලික පරීක්ෂණය අවසානයේදී 2018 නොවැම්බර් 13 වන දින නියෝගයක් සිදුකරමින් අතුරු තහනම් නියෝග නිකුත් කරන ලදී.

ඒ අනුව 2018 දෙසැම්බර් 7 දක්වා ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරන ලද පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නියෝගය ක්‍රියාත්මක කිරීම තහනම් කිරීම මෙම අතුරු තහනම් නියෝග මගින් සිදුකරන ලදී.

එසේම විරෝධතා සඳහා 2018 නොවැම්බර් 19 දින දක්වාද ප්‍රති විරෝධතා සඳහා 2018 නොවැම්බර් 26 දින දක්වාද ලිඛිත දේශන සඳහා 2018 නොවැම්බර් 26 දින දක්වාද කල් ලබාදුන් අධිකරණය 2018 දෙසැම්බර් 4,5 සහ 6 දිනවලට නියම කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම විභාග කරන ලද්දේ අගවිනිසුරු නලින් පෙරේරා, ජනධිපති නීතිඥ බුවනෙක අලුවිහාරේ, සිසිර ද ආබෘෘ, ජනාධිපති නීතිඥ ප්‍රියන්ත ජයවර්ධන, ජනාධිපති නීතිඥ ප්‍රසන්න ජයවර්ධන, ජනාධිපති නීතිඥ විජිත් මලල්ගොඩ, ජනාධිපති නීතිඥ මෘදු ප්‍රනාන්දු යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල විසිනි.

විනිසුරු මඩුල්ලේ ඒකමතික තීරණය අනුව අගවිනිසුරුවරයා විසින් සකස් කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාගයේ තීරණය 2018 දෙසැම්බර් 13 වන දින ප්‍රකාශයට පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) ව්‍යවස්ථාවට අනුව වසර හතර හමාරකට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ජනාධිපතිවරයා විසින් විසුරුවා හරින්නේ නම් පාර්ලිමේන්තුවේ 2/3කට වඩා වැඩි ඡන්දයෙන් යෝජනා සම්මුතියක් සම්මත කළ යුතු බව පෙන්වා දුන් විනිසුරුවරයා එවැනි යෝජනාවක් සම්මත වී නොමැති බැවින් මෙම නියෝගය බලරහිත වන බවද ඒ මගින් පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් අදාළ නියෝගය මගින් උල්ලංඝනය වී ඇති බව තීරණය කරන ලදී.

## ශ්‍රේෂ්ඨාධිකරණ තිරණයේ ප්‍රතිඵල

2018 නොවමැම්බර් 13 වන දින අතුරු තහනම් නියෝගය මගින් පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ නියෝගය දෙසැම්බර් 17 දක්වා අතුරු තහනමකට ලක් කළ බැවින් 2018 නොවැම්බර් 14 වන දින සිට පාර්ලිමේන්තුව යලි රැස්වන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසන් තීරණය ලබාදුන් පසු 2018 දෙසැම්බර් 16 වන දින අංක 2101/39 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපති ලේකම් වරයා නිවේදනය කරන ලද්දේ මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍යධූරායෙන් 2018 දෙසැම්බර් 15 වන දින සිට ඉල්ලා අස්වී ඇති බවයි. ඒ අනුව මහින්ද රාජපක්ෂ නායක්තවය දුන් ආණ්ඩුව දින 52කින් බිඳ වැටිණි.

ඉන් පසුව රනිල් වික්‍රමසිංහ නැවත අගමැති ලෙස පත්වූ අතර අමාත්‍ය මණ්ඩලයක්ද පත් කරන ලදී. ඒ අනුව 8 වන පාර්ලිමේන්තුව 2020 දින දක්වා පවත්වන ලදී. 2019 වර්ෂයේ පවත්වන ලද ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගෝඨාභය රාජපක්ෂ විසින් 2020 මාර්තු 2 වන දින අංක 2165/8 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පාර්ලිමේන්තුව විසුරුවාහරින ලදී. ඒ වන විට පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ සිට වසර හතර හමාරක කාලය අවසන්ව තිබිණි.

දහනවන පරිච්ඡේදය

# පැෆ්රල් සංවිධානයේ අධිකරණමය මැදිහත්වීම්

මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස ආරම්භ වූ පැෆ්රල් සංවිධානය නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ සිය දායකත්වය දැක්වීමේ දී තෝරාගෙන ඇති එක් උපාය මාර්ගයක් වන්නේ අධිකරණමය මැදිහත් වීමය. නිදහස් සහ සාධාරණ මැතිවරණයකට බාධාවක් වන සිදුවීම් සිදුවන විට සහ එයට අත්‍යාසන්න වන විට අනෙකුත් ක්‍රියාමාර්ග අතර අධිකරණයේ පිහිට පැතීමද සිදුකරනු ලබයි. පැෆ්රල් සංවිධානයේ අධිකරණමය මැදිහත්වීමේ ස්වභාවය පිළිබඳවද, සිදුකරන ලද අධිකරණමය මැදිහත්වීම් කිහිපයක් පිළිබඳවද මෙම පරිච්ඡේදය මගින් විස්තර කරනු ලැබේ.

## 19.1 පැෆ්රල් සංවිධනයේ අධිකරණ මැදිහත්වීම් ස්වභාවය

මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස ආරම්භ වූ නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය හෙවත් පැෆ්රල් සංවිධානය නිදහස් සහ සාධාරණ මැතිවරණයක් සහතික කරනු සඳහා අධිකරණමය මැදිහත්වීම් රැසක් සිදුකර තිබේ. පුරවැසියන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම හුදු මැතිවරණ නිරීක්ෂණයකින් පමණක් සහතික කළ නොහැකි බැවින් පැෆ්රල් සංවිධානයේ ඒ සඳහා ගත් බහුවිධ උත්සාහයන් අතර අධිකරණමය මැදිහත් වීම්ද විවිධාකාර වේ.

මූලික අයිතිවාසිකම් පෙත්සම් සහ රිට් ආඥා ලබාගැනීම සඳහා පෙත්සම් ඉදිරිපත් කිරීම වැඩි වශයෙන් සිදුකර ඇති අතර එම අධිකරණමය මැදිහත් වීම් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ

අභියාචනාධිකරණයේ සිදුකර ඇත. පළාත් පාලන ආයතන සම්බන්ධ ඡන්ද පෙත්සම් වලදී පළාත් බද මහාධිකරණයේ අදාළ මැදිහත්වීම් සිදුකර ඇත.

ඇතැම් අවස්ථා වලදී පැෆ්රල් සංවිධානය ලෙසත් ඇතැම් අවස්ථාවලදී සංවිධානයේ විධායක අධ්‍යක්ෂකවරයාගේ නමිනුත් නඩු පැවරීම් සිදුකර ඇති පැෆ්රල් සංවිධානය ඇතැම් අසාධාරණ ක්‍රියාවන් සම්බන්ධයෙන් සෘජුවම අධිකරණ මැදිහත් වීම් සඳහා නඩු පැවරීමේ බලය නොමැති අවස්ථා වලදී එවැනි නඩුපැවරීමේ බලය සහිත පුද්ගලයන් අතරින් නඩුවක් පැවරීමට කැමති පුරවැසියන් තෝරාගෙන එම අයගේ නම්වලින් අධිකරණමය මැදිහත්වීම් සිදුකර ඇත. ඇතැම් අවස්ථාවලදී අධිකරණමය මැදිහත්වීමක් සඳහා නීතිමය උපකාර අවශ්‍ය පුරවැසියන් සඳහා නීතිඥ සහය ලබාදුන් අවස්ථාවන්ද පවතී.

මෙම විවිධාකාරයෙන් සිදුවූ අධිකරණයමය මැදිහත් වීම් පිළිබඳව සාරාංශ සටහනක් මෙම පරිච්ඡේදය තුළින් විස්තර වේ. මෙම පරිච්ඡේදය තුළින් විස්තර කරන්නේ එක් එක් අධිකරණ මැදිහත්වීම්වල පැෆ්රල් භූමිකාව වන අතර ඇතැම් නඩුවලට අදාළ සවිස්තර සටහන් පූර්ව පරිච්ඡේද වලදී විස්තර කර ඇත.

## 19.2 ඡන්දදායකයා හඳුනාගැනීම සඳහා අනන්‍යතා පත්‍රයක් අනිවාර්යය කිරීම

**පැෆ්රල් සහ වෙන් අය එදිරිව දයානන්ද දිසානායක සහ තවත් දෙදෙනෙක්**

**PAFFREL & Others v. Dayananda Dissanayake & 2 Others - C.A.No 176/2006 C.A.M. 16.03.2006**

2004 අංක 14 මැතිවරණ ( විශේෂ විධිවිධාන) පනත මගින් ඡන්දදායකයකුගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා වලංගු අනන්‍යතා පත්‍රයක් අනිවාර්යය කිරීමේ නීතිමය ප්‍රතිපාදන ඇතුළත් කරන ලදී. එම පනතට අනුව පනත ක්‍රියාත්මක වී එක් අවුරුද්දක කාලයක් තුළ මැතිවරණ කොමසාරිස්වරයා විසින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විමසා සියලු ඡන්දදායකයන්ට ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමට සියලු පරිපාලන කටයුතු යොදා ඇති බවට සහතිකයක් ගැසට් පත්‍රයේ පලකළ යුතුය. මෙම පනත

සඳහා කතානායකවරයාගේ සහතිකය සටහන් කරන ලද්දේ 2004 නොවැම්බර් 18 වන දින වන අතර ඒ අනුව 2005 නොවැම්බර් 18 වන විට මැතිවරණ කොමසාරිස්රවයාගේ සහතිකය ගැසට් පත්‍රයේ පලකළ යුතු කාලසීමාව අවසන් විය. නමුත් මැතිවරණ කොමසාරිස්වරයා එම සහතිකය ගැසට් පත්‍රයේ පලකළේ නැත.

මෙවැනි තත්ත්වයක් තුළ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් 2006 ජනවාරි 16 දින අති විශෙෂ ගැසට් පත්‍රයක් මගින් පළාත් පාලන ආයතන 17 ක කාලය 2006 අප්‍රේල් 14 වන දින අවසන් වන බවට නිවේදනය කරන ලදී. එසේම තවත් පළාත් පාලන ආයතන 242ක කාලය 2006 අප්‍රේල් 16 වන දිනට අවසන් වීමට නියමිත විය. අනෙක් පළාත් පාලන ආයතනවලද නිලකාලය 2006 ජූනි මාසය වනවිට අවසන් වීමට නියමිත විය. ඒ අනුව පළාත් පාලන ඡන්ද විමසීමක් නියමිත වූ අතර එම ඡන්ද විමසීමේදී 2004 අංක 14 දරණ පනතේ ප්‍රතිපාදන පරිදි වලංගු අනන්‍යතා පත්‍රය අනිවාර්යය කිරීමට අවශ්‍ය ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඉටුකිරීමට මැතිවරණ කොමසාරිස් සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා අසමත්ව තිබිණි.

මෙම තත්ත්වය තුළ පැෆ්රල් සංවිධානයේ සභාපති කිංස්ලි රොද්‍රිගු විසින් මැතිවරණ කොමසාරිස්වරයා වෙත 2006 ජනවාරි 10 වන දින ලිපියක් යවමින් මෙම තත්ත්වය පිළිබඳව අවධාරණය කරන ලදී.

නමුත් සාර්ථක ප්‍රතිචාරයක් නොවූ බැවින් 2004 අංක 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 2වන වගන්තිය යටතේ මැතිවරණ කොමසාරිස්වරයාට සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයාට පැවරී ඇති නීතිමය වගකීම් ඉටුකිරීමට බලකරන මැන්ඩාමුස් රිට් ආඥාවක් ඉල්ලා අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනුකරන ලදී.

මෙම පෙත්සම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් 2006 මාර්තු 8 වන දින ගොනුකරන ලදී පෙත්සමේ 7 වන වගන්තිය මගින් ප්‍රකාශ කරන ලද්දේ ඉහත පනතේ ප්‍රකාරව වලංගු අනන්‍යතා පත්‍රයක් නොමැති ඡන්දදායකයන් සඳහා විකල්ප ක්‍රියාමාර්ග එනම් තාවකාලික හැඳුණුම්පත්‍ර නිකුත් කිරීමට කටයුතු යොදන බවයි. මෙම ක්‍රියාමාර්ගය මගින්ද සෑම ඡන්දදායකුගේම අනන්‍යතාව තහවුරු කරගෙන ඡන්දය භාවිතා කිරීමේ අවස්ථාව සැලසෙන බැවින් පැෆ්රල් සංවිධානය විසින් එකී සමතයට යටත්ව සිය පෙත්සම ඉල්ලා අස්කරගන්නා ලදී.

(මෙම නඩුව පිළිබඳ සවිස්තර සටහනක් සඳහා හතරවන පරිච්ඡේදය බලන්න)

## 19.3 සෑම ඡන්දයක් සඳහා ඡන්දදායකයා හඳුනාගැනීම සඳහා අනන්‍යතා පත්‍රයක් අනිවාර්යය කිරීම

### පැෆ්රල් සහ රෝහණ හෙට්ටිආරච්චි එදිරිව දයානන්ද දිසානායක සහ අතවත් අය
### PAFFREL & Rohana Hettiarachchi v. Dayananda Dissanayake & another- C.A (Writ) No.356/2008- C.A.M. 28.04.2008

2006 පළාත් පාලන මැතිවරණයෙන් පසුව නියමිත වූ මැතිවරණය වූයේ නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීමයි. එම මැතිවරණය 2008 මාර්තු 8 වන දින පවත්වන බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිවේදනය කරන ලදී. නාමයෝජනා ලබාගැනීමේ දින වකවානුද නිවේදනය කරන ලදී. නමුත් එම අවස්ථාව වන විටත් 2004 අංක 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ ප්‍රකාරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජාතික හැඳුණුම්පත් නිකුත් කිරීමට අදාළ පරිපාලන කටයුතු සම්පූර්ණ වී ඇති බවට සහතිකය ගැසට් පත්‍රයේ පලකර නොතිබිණි. එබැවින් එම මැතිවරණයේදී ඡන්දදායකයන්ගේ අනන්‍යතාව සහතික කිරීම පිළිබඳ කරුණ නීතිමය වශයෙන් අභියෝගයට ලක්වී තිබිණි.

පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි විසින් 2008 අප්‍රේල් 2 වන දින මැතිවරණ කොමසාරිස්වරයා වෙත ලිපියක් ලියමින් පිළිගත් අනන්‍යතා පත්‍රයක් සෑම ඡන්දදායකයකුටම ලබාදීම සහතික කරන ලෙස ඉල්ලා සිටින ලදී. නමුත් ඔහුට මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ප්‍රතිචාරයක් ලැබුනේ නැත. ඒ අනුව ඉදිරියේදී පැවැත්වෙන නැගෙනහිර පළාත් සභා ඡන්ද විමසීම සඳහා ඉදිරිපත්වන සියලුම ඡන්දදායකයන් සඳහා පිළිගත් අනන්‍යතා පත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස නියෝගයක් නිකුත් කරන ලෙස අභියාචනාධිකරණයේ රිට් පෙත්සමක් ගොනු කරන ලදී. එම පෙත්සම මගින් ඉල්ලා සිටි තවත් සහනයක් වූයේ ඉදිරියේ පැවැත්වෙන සියලුම මැතිවරණ සඳහාද සියලුම ඡන්දදායකයන්ට වලංගු අනන්‍යතා පත්‍රයක් ලබාදීම සහතික කරන ලෙසත් එසේම ඡන්දය භාවිතා කිරිමේදී වලංගු අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්යය කරන ලෙසත් ය.

පෙත්සම පිළිබඳව වූ විභාගයේදී මෙයට පූර්ව රිට් පෙත්සමක් වූ 176/2006 පෙත්සම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමේ 7 වන ඡේදයේ සඳහන් වූ 2004 අංක

14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ වන තාවකාලික හැඳුණුම්පත් අවශ්‍ය ඡන්දදායකයන් වෙත නිකුත් කිරීමේ පොරොන්දුව අනුවම ක්‍රියාකිරීමට මැතිවරණ කොමසාරිස්වරයා එකඟවීම මත පැෆ්රල් සංවිධානය විසින් මෙම පෙත්සමද ඉල්ලා අස්කරගන්නා ලදී.

(මෙම නඩුව පිළිබඳ සවිස්තර සටහනක් සඳහා හතරවන පරිච්ඡේදය බලන්න)

## 19.4 නීති විරෝධී මැතිවරණ ප්‍රචාරය මූලික අයිතිවාසිකම් කඩ කිරීමකි.

**පැෆ්රල් සහ වර්ණකුලසූරිය පටබැදිගේ වින්සන් එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අය**
**PAFFREL & Warnakulasooriya Patabedige Wilson V. Dayananda Dissanayake & Others (SC FR 706/2009)**

2009 අගෝස්තු මස 3 වන දින දකුණු පළාත් ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාව විසුරුවාහැරීමේ ප්‍රකාශය ගැසට් පත්‍රයේ පලකරන ලදී. ඒ අනුව දකුණු පළාත් සභා ඡන්ද විමසීම් සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් අගෝස්තු 21 වනදින සිට 28 වන දින දක්වා නාම යෝජනා භාරගැනීම සිදුකරන ලදී. ඒ අනුව දේශපාලන පක්ෂ 18ක අපේක්ෂකයන් 1090ක් නාමයෝජනා භාරදී තිබිණි. දකුණු පළාත් සභා ඡන්ද විමසීම් 2009 ඔක්තෝබර් 10 වන දිනට නියම කරන ලදී. එම මැතිවරණය නිරීක්ෂණය සඳහා පැෆ්රල් සංවිධානය සියලුම මැතිවරණ කොට්ඨාශ වල නිරීක්ෂණ කාර්යාල විවෘත කර ක්ෂෙත්‍ර නිරීක්ෂකයින් යොදවා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් සහ පොලිස් නිලධාරීන් සමග මනා සම්බන්ධතාවයක් ද ගොඩ නගන ලදී. ඒ අනුව පැෆ්රල් සංවිධානයේ මැතිවරණ නිරීක්ෂණ අතුරු වාර්තාව 2009 සැප්තැම්බර් 15 වන දින නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයාට සහ මැතිවරණ මෙහෙයුම්භාර නියෝජ්‍ය පොලිස්පති වරයාට භාරදෙන ලදී.
එම මැතිවරණ නිරීක්ෂණ අතුරු වාර්තාව අනුව පහත සඳහන් කරුණු විශේෂයෙන්ම නිරීක්ෂණය විය.

❖ නීති විරෝධී මැතිවරණ සැරසිලි, පොස්ටර් කටවුට් සහ බැනර් ප්‍රදර්ශනය කර තිබීම
❖ මැතිවරණ නිරීක්ෂකයන් විසින් නීති විරෝධි මැතිවරණ ප්‍රචාරක කාර්යාල ඉදි කර තිබීම

මෙම තත්ත්වය පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 73 සහ 74 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් විය. විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවකදී පොලිසියට එම නීති විරෝධි ප්‍රචාරක ද්‍රව්‍ය ඉවත් කිරීමේ බලතල පවතී. නමුත් එම කටයුතු නිසි ආකාරයෙන් සිදු නොවන බව නිරීක්ෂණය විය.

එම නිසා එම නීති විරෝධි ප්‍රචාරක කටයුතු මගින් මැතිවරණයේ නිදහස් සහ සාධාරණ බවට අගතියක් සිදුවන බව දුටු පැෆ්රල් සංවිධානය එම කටයුතු වැළැක්වීම සඳහා මූලික අයිතිවාසිකම් නඩුවක් 2009 සැප්තැම්බර් 22වන දින පවරන ලදී. මෙම මූලික අයිතිවාසිකම් පෙත්සමේ පළමු පෙත්සම්කරු පැෆ්රල් සංවිධානය වූ අතර දෙවන පෙත්සම්කරු ලෙස එක් වූයේ මෙම මැතිවරණය සඳහා ඡන්ද හිමියකු වූ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පදිංචිකරුවෙකු වූ ඩබ්ලිව්.පී. විල්සන්ය.

මැතිවරණ කොමසාරිස්වරයා, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්,පොලිස්පතිවරයා, 2009 දකුණු පළාත් සභා ඡන්ද විමසීම සඳහා තරඟ කරන ලද දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සහ නීතිපතිවරයාව මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 73 සහ 74 වගන්ති උල්ලංඝනය වන ක්‍රියාවන් සිදුවන බවට විස්තර සහ ඡායාරූප ගොනු කරමින් මෙම නීති විරෝධි ක්‍රියා මගින් නිදහස් සහ සාධාරණ මැතිවරණයකට බාධා වන බවත් එම හේතුව නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) සහ 12(2), 14(1)(අ),14(1)(ඉ) ව්‍යවස්ථා මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සම්කරුවන් විෂයෙහි උල්ලංඝනය වන බවත් පෙත්සම මගින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව -

- ❖ මෙම නීතිවිරෝධී ප්‍රචාරක කටයුතු සහ ප්‍රචාරක කාර්යාල ඉවත් කරන ලෙස මැතිවරණ කොමසාරිස්වරයාට දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට සහ පොලිස්පතිවරයාට අතුරු නියෝගයක් නිකුත් කරන ලෙසත්,
- ❖ නාමයෝජනා භාරගත් දින සිට පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 73 සහ 74 වගන්ති කඩකළ අපේක්ෂකයන්ට සහ පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවරය ගන්නා ලෙස පොලිස්පතිවරයාට අතුරු නියෝගයක් සිදුකරන ලෙසත්,

- ❖ පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 73 සහ 74 වගන්ති කඩකිරීමෙන් වළක්වන අවදානාත්මක අතුරු නියෝගයක් මැතිවරණයට තරග කරන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට නිකුත් කරන ලෙසත්,
- ❖ නීති විරෝධි ප්‍රචාරක කටයුතු සහ නීති විරෝධි මැතිවරණ ප්‍රචාරක කාර්යාල ඔක්තෝබර් 10 වන දින පැවැත්වෙන දකුණු පළාත් සභා ඡන්ද විමසීමේ නිදහස් සහ සාධාරණ බවට බාධාවක් බවට ද ප්‍රකාශයක් සිදුකරන ලෙසත්,

පෙත්සම්කරුවන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යවස්ථා මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට ප්‍රකාශයක් සිදුකරන ලෙසත් පෙත්සම්කරුවන් අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී. මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම ශිරාණි තිලකවර්ධන සහ ශ්‍රීපවන් යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් ඉදිරියේ විභාග කරන ලදී.

පළාත් සභා ඡන්ද විමසීම් පනත උල්ලංඝනය වන ආකාරයේ නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු වැළැක්වීම සඳහා ගෙන ඇති පියවරය පිළිබඳ වාර්තාවක් 2009 ඔක්තෝබර් 5 වන දිනට ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නීතිපතිවරයාට දැනුම්දුන් ශ්‍රේෂ්ඨාධිකරණය නීති විරෝධි මැතිවරණ ප්‍රචාරක වැළැක්වීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා, පොලිස්පතිවරයා, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග සාකච්ඡා කරන ලෙසත් පෙත්සම 2009 සැප්තැම්බර් 25 වන දින අධිකරණයේ කැඳවූ අවස්ථාවේදී අධිකරණ විසින් නීතිපතිවරයාට උපදෙස් දෙන ලදී.

## 19.5 ඌව පළාත් සභා මැතිවරණ අරමුණු කරගෙන වියළි සහනාධාර බෙදීම නියාමනය කිරීම.

**වසන්ත ජයලත් සහ තවත් අය එදිරිව වෛද්‍ය නිහාල් ජයතිලක සහ තවත් අය**

**Wasantha Jayalath & Others V. Dr, Nihal Jayathilake & Others – SCFR/ 258/2014 SCM:12.09.2014**

2014 වසරේ පැවති ඌව පළාත් සභා මැතිවරණයට ආසන්නව තිබිණයදී ආර්ථික සංවර්ධන අමාත්‍යංශය විසින් මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම පවුල් සඳහා නියං සහනාධාර ලෙස රුපියල් 2500/- බැගින් ගෙවීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍ර

ලේඛන නිකුත් කරන ලදී. නමුත් පසුව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ආර්ථික කටයුතු අමාත්‍යංශයට දන්වා ඇත්තේ මෙම සහනාධාර වැඩපිළිවෙල නිදහස් සහ සාධාරණ මැතිවරණයකට බාධාවක් වන බැවින් මැතිවරණය අවසන් වන තෙක් සහනාධාර බෙදීම නවත්වන ලෙසයි.

මේ අනුව සහනාධාර බෙදීම නැවැත්වීමට කටයුතු කළ අතර එම හේතුවෙන් තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට චෝදනා කරමින් මොණරාගල දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් පිරිසක් විසින් මැතිවරණ කොමසාරිස්වරයා ආර්ථික කටයුතු අමාත්‍යංශයේ ලේකම් ඇතුලු පිරිසක් වගඋත්තරකරුවන් කරමින් මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම සඳහා පැෆ්රල් සංවිධානය සහ එහි විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි මැදිහත් වන පෙත්සකම්කරුවෙකු ලෙස එක්වීමට ඉල්ලා 2014 සැප්තැම්බර් 15 වන දින ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් සිදුකරන ලදී. එකී පෙත්සම මගින් පැෆ්රල් සංවිධානය ප්‍රකාශ කර සිටියේ එම අවස්ථාව වන විට දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයකට නියඟය බලපා ඇති අතර ආපදා කළමණාකරන අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියට අනුව වැඩිම පවුල් ප්‍රමාණයක් විපතට පත්වී ඇත්තේ මඩකලපුව දිස්ත්‍රික්කයේ බවත් ඉන්පසුව පිළිවෙලින් පොළොන්නරුව සහ හම්බන්තොට වුවත් එම දිස්ත්‍රික්ක සඳහා රුපියල් 2500ක් බෙදා දීමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක නොවන බවත් ය. එසේම මෙම සහනාධාර බෙදාදීමේ කාර්යය සඳහා ආපදා කළමණාකරන අමාත්‍යංශය කිසිඳු සබඳතාවක් නොමැති බවත් දක්වා සිටින ලදී. එසේම මෙම සහනාධාර බෙදීම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කෘෂි පර්යේෂණ සහකාර නිලධාරීන් මගින් ගම් මට්ටමින් බෙදීමට සැලසුම්කර ඇති අතර ඔවුන් දේශපාලන වශයෙන් එක්සත් ජනතා නිදහස් සංධානයට පක්ෂපාතී බැවින් මෙම සහනාධාර වැඩපිළිවෙල එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ වාසිය සඳහා යොදා ගත හැකි බවත් දක්වා තිබිණි. එසේම මෙම පෙත්සම සඳහා අත්‍යවශ්‍ය පාර්ශවකරුවන් වන මැතිවරණ කොමසාරිස් සහ ආපදා කළමණාකරණ අමාත්‍යංශය වගඋත්තරකරුවන් ලෙස නම් කර නොමැති බවද සිය පෙත්සම මගින් කියා සිටින ලදී.

ඒ අනුව අතරුමැදි පෙත්සම්කරුවෙකු ලෙස තමන් ඇතුළත් කරගන්නා ලෙසද මොණරාගල දිස්ත්‍රික්කයේ සහනාධාර බෙදීම උඌව

පළාත් සභා ඡන්ද විමසීම අවසන් වන තෙක් කල් දමන ලෙසත්, යම් ලෙසකින් සහනාධාර බෙදීම අත්‍යවශ්‍ය වන්නේ නම් එය ග්‍රාම නිලධාරීන් මගින් බෙදීමට නියෝග කරන ලෙසත් පෙත්සම මගින් ඉල්ලා සිටින ලදී.

නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැෆ්රල් සංවිධානය මැදිහත් පෙත්සම්කරුවෙකු ලෙස එක් කිරීම ප්‍රතික්ෂේප කරන ලදී.
නමුත් පෙත්සම් විභාගය අවසානයේදී ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කරන ලද්දේ, සහනාධාර බෙදීමේ ක්‍රියාවලිය ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ සිදුකරන ලෙසත් කිසිඳු ආකාරයක දේශපාලනයට සම්බන්ධ කණ්ඩායම් ඒ සඳහා සම්බන්ධ කර නොගන්නා ලෙසත්ය.

(මෙම නඩුව පිළිබඳ සවිස්තර සටහනක් සඳහා දොලොස්වන පරිච්ඡේදය බලන්න)

## 19.6 ජනාධිපතිවරණයේ රාජ්‍ය මුදල් අවභාවිතාව පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලීම

### පැෆ්රල් එදිරිව මැතිවරණ කොමසාරිස්
### PAFFREL v. Election Commission & Others SC (FR) Application No:76/2015

2015 ජනවාරි මස පැවති ජනාධිපතිවරණයේදී බලයේ සිටි ජනාධිපති මහින්ද රාජපක්ෂ ද ජනාධිපති අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් විය. එම මැතිවරණයේ ජනාධිපති අපේක්ෂක මහින්ද රාජපක්ෂගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය දේපළ අයතා ලෙස පරිහරණය කළ බවට මැතිවරණ නිරීක්ෂකයන් විසින් වාර්තා කර තිබිණි. විශේෂයෙන්ම  මැතිවරණය අරමුණු කරගෙන සිල් රෙදි බෙදීම, ලිත් බෙදීම වැනි බොහෝ ප්‍රකට සිදුවීම් වාර්තා කර තිබිණි.

මැතිවරණයෙන් පසුව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂකවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් පවරමින් ජනාධිපතිවරණයේදී රාජ්‍ය මුදල් අවභාවිතා කරන ලද පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලීමක් කරන ලදී.

මැතිවරණ කොමසාරිස් මහින්ද දේශප්‍රිය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂක ජෙනරාල්, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්, මුදල් අමාත්‍යංශයේ ලේකම්, පොලිස්පති, විගණකාධිපති, නීතිපති සහ 2015 ජනාධිපතිවරණය පැවැත්වෙන අවස්ථාව වන විට ජනාධිපති ලේකම් ලෙස කටයුතු කළ ලලිත් වීරතුංග යන පුද්ගලයන්ව මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

මහජන මුදලින් රුපියල් මිලියන 100කට වඩා වැඩි ප්‍රමාණයක් වියදම් කරමින් සිල් රෙදි බෙදීම, රාජ්‍ය නිලධාරීන් මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා යොදවා ගැනීම, ජනාධිපති අපේක්ෂකයා ප්‍රවර්ධනය වන ආකාරයට ලිත් මුද්‍රණය කර බෙදා හැරීම යන කරුණු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් නීතිමය පියවර නොගත් බවට චෝදනා කරමින් පෙත්සම්කරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටින ලද්දේ,

❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් පෙත්සමේ සඳහන් එක් වගඋත්තරකරුවෙකු හෝ වැඩි දෙනෙකු විසින් උල්ලංඝනය කර ඇති බවට ප්‍රකාශයක් නිකුත් කරන ලෙසත්,

❖ 2015 ජනාධිපතිවරණයේ දී මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා පොදු දේපළ යොදාගත් පුද්ගලයන්ට එරෙහිව අපරාධ විනය හෝ වෙනත් නීතිමය පියවර ගන්නා ලෙස වගඋත්තරකරුවන්ට නියෝග කරන ලෙසත්,

❖ පෙත්සම මගින් දක්වා තිබෙණ සිදුවීම් සම්බන්ධව සම්පූර්ණ වාර්තාවක් අධිකරණය වෙත ඉදිරපත් කරන ලෙස 1වෙනි වගඋත්තරකාර මැතිවරණ කොමසාරිස්වරයාට නියෝගයක් නිකුත් කරන ලෙසත්,

❖ අදාළ සිදුවීම් සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල් (4 වගඋත්තරකරු) සහ මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් (5 වන වගඋත්තරකරු) වෙත නියෝග කරන ලෙසත්,

❖ පෙත්සමේ විස්තර කර ඇති පොදු දේපළ අයතා පරිහරණයේ පාඩුව තක්සේරු කර වාර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස මුදල් අමාත්‍යංශයේ ලේකම් (6වන වගඋත්තරකරු) සහ විගණකාධිපති (7 වන වගඋත්තරකරු) වෙන නියෝග නිකුත් කරන ලෙසත්ය.

ඒ අනුව පෙත්සම්කරුවන්ගේ නීතිඥවරයා විසින් මෙම නඩුව ඉදිරියට ගෙන යාමට අපේක්ෂා නොකරන බව අධිකරණයට දැනුම්දීම නිසා නඩුවේ කටයුතු අවසන් කරන ලදී.

(මෙම නඩුව පිළිබඳ සවිස්තර සටහනක් සඳහා දොලොස්වන පරිච්ඡේදය බලන්න)

## 19.7 විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත-2017 පිළිබඳ පෙත්සම

People's Action For Free and Fair Elections (PAFFREL) & Rohana Hettiarachcchi v. Attorney General- SC SD 22/2017 (19.09.2017 (Hansard Vol. 255; No. 01; Col. 1 – 30)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත නමින් පනත් කෙටුම්පතක් 2017 අගෝස්තු 23 වන දින අග්‍රාමාත්‍ය වරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පත මගින් පළාත් සභා ක්‍රමයට පහත වෙනස්කම් සිදුකිරීමට යෝජනා කර තිබිණි.

01. පළාත් සභා සියල්ලෙහි ඡන්ද විමසීම එකම දිනක පැවැත්වීම.
02. ඒ සඳහා පළාත් සභා විසුරුවන දිනය (නිශ්චිත දිනය) නියම කිරීමේ බලය පාර්ලිමේන්තුවට පවරා ගැනීම.
03. එකම දිනක පළාත් සභා විසිර වීම පිණිස සමහර පළාත් සභාවල කාලය දීර්ඝ කිරීමක් සිදු කිරීම.
04. යම් හේතුවක් නිසා පළාත් සභාවක් විසුරුවා හැරීමක් සිදුවූ විට එකී පළාත් සභාව පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීම.

මෙම අවස්ථාව වන විට ඇතැම් පළාත් සභාවන් 2017 වසරේදී සිය නිලකාලය අවසන්වීමට තිබූ අතර දකුණ, බස්නාහිර සහ ඌව පළාත් සභාවල නිලකාලය අවසන් වීමට තිබුණේ 2019 වසරේදීය. ඒ අනුව 2019 දක්වා අනෙක් පළාත් සභාවල කාලය දීර්ඝ කිරීම සඳහා බලතල පාර්ලිමේන්තුට ලබාගැනීමේ අවධානමක් මෙම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත මගින් පැනනැගී තිබිණි.

පැෆ්රල් සංවිධානය සහ එහි විධායක අධ්‍යක්ෂකවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව යටතේ මෙම පනත් කෙටුම්පතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3,4,10,12 සහ 14(1) ව්‍යවස්ථාවන්ට මෙම පනත් කෙටුම්පත පටහැනි බැවින් මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීම සඳහා 2/3ක බහුතර ඡන්දයෙන් සම්මත වීමක් සහ ජනමත විචාරණයක් පැවැත්වීම අවශ්‍ය බව මෙම පෙත්සම මගින් පැෆ්රල් සංවිධානය තර්ක කරන ලදී. මෙම පෙත්සමද ඇතුලුව පෙත්සම් 12 ක් විභාග කළ ශ්‍රේෂ්ඨාධිකරණය සිය තීරණය මගින් කථානායකවරයාට දන්වා තිබුණේ පනත් කෙටුම්පතේ 2,3 සහ 4 වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3,4,12(1) සහ 14(1) ව්‍යවස්ථාවන්ට පටහැනි බැවින් එම පනත් කෙටුම්පත එම ආකාරයෙන්ම සම්මත කිරීම සඳහා පාර්ලිමේන්තුවේ නොපැමිණි මන්ත්‍රීවරුන්ද ඇතුලුව 2/3 ක බහුතර ඡන්දයක් සහ ජනමත විචාරණයක් මගින් සම්මත විය යුතු බවය. ඒ අනුව එම පනත් කෙටුම්පත රජය විසින් හකුලාගන්නා ලදී.

## 19.8 පළාත් පාලන ඡන්ද විමසීම කඩිනම් කරන ලෙස ඉල්ලා මූලික අයිතිවාසිකම් පෙත්සමක්

**පැෆ්රල් සහ රෝහණ හෙට්ටිආරච්චි එදිරිව ෆයිසර් මුස්තාපා සහ තවත් 10දෙනෙක්**

**PAFFREL & Rohana Hettiarachchi v. Faiszer Musthapha & 10 Others (SC FR Application No: 249/16 S.C.M. 28.02' 2018)**

2012 වර්ෂයේදී පළාත් පාලන ඡන්ද විමසීම් පනතට සිදුකරන ලද සංශෝධනයන් හේතුවෙන් එම ඡන්දය කොට්ඨාශ සහ සමානුපාතික මිශ්‍ර ක්‍රමයක් බවට පත්විය. ඒ අනුව කොට්ඨාශ සීමා නිර්ණය කිරීම අවශ්‍ය විය. ඒ සඳහා සීමා නිර්ණය කමිටුව විසින් සීමා නිර්ණයක් සිදුකර එය ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරන ලද නමුත් එයට තිබූ විරෝධතා හේතුවෙන් අමාත්‍යවරයා විසින් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව සමාලෝචන කමිටුවක්ද පත් කරන ලදී. කෙසේ නමුත් මේ සිදුවීම් මත පළාත් පාලන ආයතනයන්හි සිව්වසරක කාලය අවසන් වූ අතර අදාළ පනත්වල පවනිතන ප්‍රතිපාදන අනුව විෂය

භාර අමාත්‍යවරුන් විසින් එම පළාත් පාලන ආයතනවල කාලසීමාව වසරකින් දික් කරන ලදී. එම වසරක කාලයද අවසාන වූ බැවින් ඉන් පසුව සියලු පළාත් පාලන ආයතන කොමසාරිස් පාලනයට යටත් කරන ලදී. මේ අතරතුර මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තු සහ පුදුකුඩුඉරුප්පු යන පළාත් පාලන ආයතනවලට 2011 වසරේදී නාමයෝජනා කැඳවූ අතර විවිධ හේතු මත එම පළාත් පාලන ආයතන සඳහා ඡන්දයද දිගින් දිගටම කල් යන ලදී.

මෙම කරුණු සැලකිල්ලට ගෙන දීර්ඝ කාලයක් පළාත් පාලන ඡන්ද විමසීම් නොපැවැත්වීම මගින් එකී පළාත් පාලන ආයතන සඳහා මහජන නියෝජිතයන් පත්කර ගැනීමට නොහැකි වීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට චෝදනා කරමින් පැෆ්රල් සංවිධානය සහ එහි විධායක අධ්‍යක්ෂක රෝහණ හෙට්ටිආරච්චි විසින් 2016 වසරේදී මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාපා, එහි ලේකම්වරයා, මැතිවරණ කොමිෂන් සභාව සහ එහි සාමාජිකයන් තිදෙනා, සීමා නිර්ණය සමාලෝචන කමිටුවේ සාමාජිකයන් පස්දෙනා සහ නීතිපතිවරයා මෙම පෙත්සම මගින් වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබිණි.

එම මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් -

- 2011 වර්ෂයට අදාළවූ පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම් කඩිනමින් පවත්වන ලෙස.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් එක් අයෙක් හෝ වැඩිගණනක් විසින් උල්ලංඝනය කර ඇති බව ප්‍රකාශයට පත් කරන ලෙස.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1)(අ) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තරකරුවන් එක් අයෙක් හෝ වැඩිගණනක් විසින් උල්ලංඝනය කර ඇති බව ප්‍රකාශයට පත් කරන ලෙස.
- සීමා නිර්ණය සමාලෝචන නිර්දේශ නිශ්චිත කාලරාමුවක් තුළ අවසන් කරන ලෙස සීමා නිර්ණය සමාලෝචන කමිටුවේ සාමාජිකයන් වෙත නියෝගයක් නිකුත් කරන ලෙස,

- ❖ එම නිර්දේශ මත පදනම්ව සමාලෝචන වාර්තාව ජනාධිපතිවරයා වෙත යොමුකරන ලෙස පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට නියෝගයක් නිකුත් කරන ලෙස
- ❖ පළාත් පාලන ඡන්ද විමසීම් කඩිනමින් පවත්වන ලෙස මැතිවරණ කොමිෂන් සභාවට සහ එහි සාමාජිකයන් වෙත නියෝගයක් නිකුත් කරන ලෙස
- ❖ නඩු ගාස්තු

යන සහන ඉල්ලා තිබිණි.

පෙත්සම විභාග කරන ලද්දේ සිසිර ද ආබෲ, නලීන් පෙරේරා සහ විජිත් මලල්ගොඩ යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් විසිනි.

මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම 2016 වර්ෂයේ දී ගොනුකරන ලද්දේ කඩිනමින් පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සඳහා නියෝගයක් ලබාගැනීම සඳහා වුවත් පළාත් පාලන මැතිවරණය පැවැත්වූ 2018 පෙබරවාරි 10 වන දින දක්වාම මෙම පෙත්සම් විභාගය පැවති අතර 2018 පෙබරවාරි 28 වන දින පෙත්සම්කරුවන් විසින් මෙම පෙත්සම ඉල්ලා අස්කර ගන්නා ලදී.

## 19.9 පළාත් පාලන ආයතන කොට්ඨාශ සීමානිර්ණය ප්‍රතිශෝධන ගැසට් පත්‍රයට එරෙහි රිට් පෙත්සම

**වඩුගෙදර විජේරත්න සහ තවත් 5ක් එදිරිව ෆයිසර් මුස්තාපා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය සහ තවත් අය**
**Wadugedara Wijeratne & 5 Others v. Faizer Mustapha- Minister of Provincial Councils & Local Government and 2 others – CA Writ Application No 373/2017-C.A.M. 30.11.2017**

### පසුබිම

සමානුපාතික නියෝජන ක්‍රමය අනුව පැවති පළාත් පාලන මැතිවරණ ක්‍රමය 2012 අංක 22 දරණ පළාත් පාලන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් කොට්ඨාශ සහ සමානුපාතික යන මිශ්‍ර ක්‍රමයකට පරිවර්තනය කරන ලදී. ඒ අනුව සෑම පළාත් පාලන ආයතනයක්ම කොට්ඨාශවලට බෙදා වෙන් කිරීම පනතේ 3ඇ වගන්තිය අනුව සිදුකර ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පලකළ යුතුය. ඒ අනුව 2015 අගොස්තු 21 වන දින අංක 1928/26 දරණ අති විශෙෂ ගැසට්

පත්‍රය මගින් ජනාධිපතිවරය සියලුම පළාත් පාලන ආයතනවල කොට්ඨාශ ගැසට් පත්‍රයේ පලකරන ලදී.

පනතේ 3අෑ වගන්තියට අනුව ප්‍රතිශෝධන කමිටුවක නිර්දේශ මත විෂයභාර අමාත්‍යවරයාට මෙම කොට්ඨාශවල සීමාවන් වෙනස් කිරීමේ බලය පවතී. ඒ අනුව අමාත්‍යවරයා විසින් පත්කරන ලද පස් දෙනෙකුගෙන් යුතු සීමා නිර්ණය ප්‍රතිශෝධන කමිටුවක් මගින් එම කොට්ඨාශ පිළිබඳව නැවත වාර්තාවක් ලබාදෙන ලද අතර ඒ අනුව අමාත්‍යවරයා විසින් සශෝධිත කොට්ඨාශ සීමා නිර්ණය පිළිබඳව 2017 පෙබරවාරි 17 වන දින අංක 2006/44 දරණ ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලදී.

2015 ගැසට් පත්‍රය මගින් ජන සංයුතිය අනුව බහු සභික කොට්ඨාශ ලෙස තීරණය කර තිබූ ඇතැම් කොට්ඨාශ මෙම නව ගැසට් පත්‍රය අනුව එක් සභිකයකු ලෙස පත්වන කොට්ඨාශ ලෙස නිවේදනය කර තිබිණි. පනතේ 3අෑ වගන්තියට අමාත්‍යවරයාට බලය තිබුණේ ජනාධිපතිවරයා විසින් නිවේදනය කරන ලද කොට්ඨාශවල සීමාවන් පිළිබඳ සංශෝධන කිරීමට විනා සභිකයන් ගණන සංශෝධනය කිරීමට නොවේ.

ඒ අනුව මෙම ගැසට් පත්‍රය මගින් ගත් තීරණ අවලංගු කරන සර්ෂියෝරාරි රිට් ආඥාවක්ද, එම ගැසට් පත්‍රය පාදක කරගෙන වෙනත් ක්‍රියාමාර්ග ගැනීම වළක්වන ප්‍රොහිබිෂන් රිට් ආඥාවක්ද එම ගැසට් පත්‍රයේ නියෝගය සංශෝධනය කරන ලෙස මැන්ඩාමුස් රිට් ආඥාවක්ද ඉල්ලා පැෆ්රල් සංවිධානයේ මෙහෙයවීම මත මෙම ගැටලුවට මුහුණදුන් විවිධ පළාත් පාලන ආයතනවල ඡන්ද දායකයන් 6 දෙනෙකු අභියාචනා අධිකරණයේ නඩු පවරන ලදී. එසේම පෙත්සම් විභාගය අවසන් වන තුරු අදාළ ගැසට් පත්‍රයට අනුව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් වළක්වන අතුරු තහනමක් නිකුත් කරන ලෙසද පෙත්සම්කරුවන් ඉල්ලා තිබිණි. මෙම රිට් පෙත්සම සඳහා අනුග්‍රහය දක්වන ලද්දේ පැෆ්රල් සංවිධානය විසිනි.
මෙම පෙත්සමේ වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබුනේ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයසිර් මුස්තාපා. එම අමාත්‍යංශයේ ලේකම්වරයා සහ නීතිපති වරයාය.

අභියාචනාධිකරණ පෙත්සම සලකා බලන ලද්දේ අභියාචනාධිකරණයේ සභාපති එල්.ටී.බී. දෙහිදෙණිය, කේ.කේ. වික්‍රමසිංහ සහ ශිරාන් ගුණරත්න යන අභියාචනාධිකරණ විනිසුරුවරුන් විසිනි.

අනෙක් විනිසුරුවරුන්ගේද එකඟතාව 2017 නොවැම්බර් 22 වන දින සියලු වගඋත්තරකරුවන්ට නොතිසි නිකුත් කළ අතර ඊළඟ විභාග දිනය දක්වා වගඋත්තරකරුවන්ට එරෙහිව අතුරු තහනම් නියෝගයක්ද නිකුත් කරන ලදී.

පසුව වගඋත්තරකරුවන් විසින් පෙත්සමෙන් ඉල්ලා සිටි කරුණු අනුව කටයුතු කිරීමට පොරොන්දුවූ බැවින් පෙත්සම්කරුවන් ගේ නීතිඥවරුවරුන් 2017 නොවැම්බර් 30 වන දින අභියාචනාධිකරණයට මෝසමක් ගොනුකරමින් පෙත්සම ඉල්ලා අස්කර ගන්නා ලදී.

## 19.10 ඡන්දදායකයන්ට අල්ලස් ලබාදීම මත සභිකධූරය අහෝසි කිරීම - මොණරාගල ප්‍රදේශිය සභා ඡන්ද පෙත්සම-2018

**සුනිල් ශාන්ත එදිරිව තරංග හර්ෂක ප්‍රිය ප්‍රසාද් දිසානායක සහ තවත් අය**

**Sunil Shantha v. Tharanga Harshaka Priya Prasad Dissanayake & Others -HC (Monaragala) Election petition 1/2018**

2018 පෙබරවාරි 10 දින පැවති පළාත් පාලන මැතිවරණයේදී මොණරාගල ප්‍රාදේශිය සභාව වෙනුවෙන් මදුරකැටිය කොට්ඨාශය සඳහා ශ්‍රී ලංකා පොදුජන එක්සත් පෙරමුණ මගින් ඉදිරිපත් වූ අපේක්ෂකයා ඡන්දදායකයන් සඳහා විවිධ ප්‍රධානයන් සිදුකරන බවට මැතිවරණ කාල පරිච්ඡේදයේදී පැෆ්රල් සංවිධානය මෙන්ම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයද නිරීක්ෂණය කර තිබිණි. එසේම ඒ පිළිබඳව මැතිවරණ කොමිසම වෙතද පැමිණිලි කර තිබිණි.

මැතිවරණ ප්‍රතිඵලය අනුව එම අපේක්ෂකයා විශාල වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගනිමින් ජයග්‍රහණය කරන ලදී. එම ජයග්‍රහණය අභියෝගයට ලක් කරමින් ඡන්ද පෙත්සමක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වුවද, එම ඡන්ද පෙත්සම ඉදිරිපත් කිරීමට පළාත් පාලන ඡන්ද විමසීම් පනත අනුව පැෆ්රල් සංවිධානයට නොහැක. එම මදුරකැටිය කොට්ඨාශය සඳහා එක්සත් ජාතික පක්ෂය මගින්

ඉදිරිපත් වූ අපේක්ෂකයා දෙවෙනි ස්ථානයට ඡන්ද ලබාගෙන තිබූ අතර ඔහු ඡන්ද පෙත්සමක් යොමුකිරීම සඳහා ඉදිරිපත් විය. ඒ අනුව පැෆ්රල් සංවිධානය විසින් නීතිඥ සහය ලබාදීම මෙන්ම, ඡන්ද පෙත්සමට ඉදිරිපත් කිරීමට අවශ්‍ය සාක්ෂි ලබාගැනීම සඳහා වූ විමර්ශනයන්ද සිදුකරන ලදී. ඒ අනුව මදුරකැටිය කොට්ඨාශයේ ඡන්ද දායකයන් වෙත මැතිවරණ කාල පරිච්ඡේදය තුළ නව ජල සබඳතා ලබාදීම සහ නව විදුලි සබඳතා ලබාදීම සඳහා ජයග්‍රාහී අපේක්ෂකයාගේ නියෝජිතයකු කටයුතු කිරීම, එම කොට්ඨාශයේ විවිධ ස්වේච්ඡා සංවිධාන සඳහා භාණ්ඩ ලබාදීම ආදිය මගින් ඡන්දදායකයන්ට අල්ලස් ලබාදීම මත එම ජයග්‍රාහී අපේක්ෂකයාගේ තේරී පත්වීම අවලංගු කරන ලෙස ඉල්ලා මොණරාගල පළාත්බද මහාධිකරණයේ ඡන්ද පෙත්සමක් ගොනු කරන ලදී.

මෙම නඩුවේ ප්‍රධාන චෝදනාවන් වූ ජයග්‍රාහී අපේක්ෂකයාගේ නියෝජිතයකු විසින් මුදුරකැටිය කොට්ඨාශයේ ඡන්දදායකයන් වෙත නව ජල සබඳතා සහ නව විදුලිය සබඳතා ලබාගැනීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීම පිළිබඳව සාක්ෂි රැස් කරන ලද්දේ පැෆ්රල් සංවිධානය විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ යොමුකරන ලද තොරතුරු ඉල්ලීම් මතය.

නඩු විභාගයෙන් පසුව ජයග්‍රාහී අපේක්ෂකයාගේ නියෝජිතයකු ඡන්දය අපේක්ෂාවෙන් ඡන්දදායකයන් වෙත අල්ලස් ලබාදීම මත ඔහුගේ පත්වීම අහෝසි වූ අතර පෙත්සම්කරු නිසි ලෙස පත්වූ සභිකයකු බවට තීරණය කරන ලදී.

මෙම තීරණයට එරෙහිව වගඋත්තරකාර ජයග්‍රාහී අපේක්ෂකයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ගොනුකර තිබේ.

මෙම තීරණයට එරෙහිව 1වන වගඋත්තරකරු අසුන අහිමිවූ අපේක්ෂකයා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් සිදුකර තිබේ. අංක SC (SPL) Application 228-2021 දරණ අංකය දරණ අභියාචනය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2022 ජූනි 07 වන දින නිශ්ප්‍රභා කරන ලදී.

(මෙම නඩුව පිළිබඳ සවිස්තර සටහනක් සඳහා දොලොස්වන පරිච්ඡේදය බලන්න)

# ආශ්‍රිත මූලාශ්‍ර

(නඩු තීන්දුවලට අමතරව)


01. විතානවසම්. අතුල (2016) ශ්‍රී ලංකාවේ ඡන්ද විමසීම්, මැතිවරණ ක්‍රියාදාමයේ ආරම්භය සහ වර්ධනය 1912-1977, සර්වජන ඡන්ද බලය 1931 - 2016, ඩොනමෝර් කොමිෂන් සභාවේ සිට මැතිවරණ කොමිෂන් සභාව දක්වා, කොළඹ, මැතිවරණ කොමිෂන් සභාව.

02. හේරත්.හේ.මු.ති.දි. (2016) මැතිවරණ දෙපාර්තමේන්තුවේ සිට මැතිවරණ කොමිෂන් සභාව තෙක්, සර්වජන ඡන්ද බලය 1931 - 2016, ඩොනමෝර් කොමිෂන් සභාවේ සිට මැතිවරණ කොමිෂන් සභාව දක්වා, කොළඹ, මැතිවරණ කොමිෂන් සභාව.

03. අලවත්තගේ. ප්‍රේමදාස ( 2014) ශ්‍රී ලංකා මැතිවරණ ප්‍රතිඵල සංග්‍රහය, කොළඹ, ඇස් ගොඩගේ

04. දිසානායක. ධම්ම සහ ලියන ආරච්චි. ජගත් (2020) ශ්‍රී ලංකාවේ ස්වාධීන රාජ්‍ය කොමිෂන් සභා, කොළඹ, පැෆ්රල් සංවිධානය.

05. ලියන ආරච්චි. ජගත් (2021) විස්ස සහ 20 සම්මතවීමේ ගමන්මග, කොළඹ, පැෆ්රල් සංවිධානය.

06. පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව (1999) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

07. නිශ්ශංක, කමල් (2008) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෙවත් 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා) රාජ මණ්ඩල ආඥාව, කර්තෘ ප්‍රකාශන

08. පාර්ලිමේන්තු ප්‍රකාශමාලා අංක 24- 2004 - ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව-කොළඹ

09. දේශප්‍රිය. මහින්ද (2011) 2010 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව, කොළඹ, මැතිවරණ දෙපාර්තමේන්තුව.

10. චන්ද්‍රානන්ද ද සිල්වා ආර්.කේ (1987) 1986 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව. කොළඹ. මැතිවරණ දෙපාර්තමේන්තුව.

11. චන්ද්‍රානන්ද ද සිල්වා ආර්.කේ (1992) 1991 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව.කොළඹ. මැතිවරණ දෙපාර්තමේන්තුව.

12. දයානනාන්ද දිසානායක(1997) 1996 වර්ෂය සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ පාලන වාර්තාව.කොළඹ. මැතිවරණ දෙපාර්තමේන්තුව.

13. සිරිවර්ධන, පී.එම්.(2014)ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ, කොළඹ, කර්තෘ ප්‍රකාශනයකි.

14. සිරිවර්ධන,පී.එම්.(2019) ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මැතිවරණ, 1947 සිට 2015 දක්වා, කොළඹ, මැතිවරණ කොමිෂන් සභාව.

15. සිරිවර්ධන,පී.එම්.(2013) මැතිවරණ නීතිය හා ක්‍රියාවලිය (ව්‍යවස්ථාදායක හා රාජ්‍ය මන්ත්‍රණ සභා), නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

16. පැෆ්රල් සංවිධානය,(1999) අතුරු වාර්තාව-1999 වයඹ පළාත් සභා මැතිවරණය, කොළඹ, පැෆ්රල්.

17. Costa" Jayatissa De (2016) Law of Elections" Colombo"Auther Publication

## නීති (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, පනත් ආඥා පනත් සහ රාජ්‍ය සභා ආඥා)

18. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව (2020 ඔක්තෝබර් 29 වන දින දක්වා සංශෝධිතයි) (ප්‍රතිශෝධිත මුද්‍රණය 2021) බත්තරමුල්ල, පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය.

19. 1981 අංක 15 දරණ ජනාධිපතිවරණ පනත (1981) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
20. 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත (1981) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
21. 2009 අංක 58 දරණ පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන පනත (2009) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
22. 1988 අංක 2 දරණ පළාත් සභා ඡන්ද විමසීම් පනත (1988) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
23. 2017 අංක 17 දරණ පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත (2017) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
24. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය) (2017) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
25. 2012 අංක 22 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
26. 1981 අංක 20 දරණ සංවර්ධන සභා ඡන්ද විමසීම් පනත (1981) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
27. 1981 අංක 7 දරණ ජනමත විචාරණ පනත (1981) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
28. 1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත (1980) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
29. 2021 අංක 22 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත (2021) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව
30. 1988 අංක 35 දරණ ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත (1988) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
31. 2004 අංක 14 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත (2004) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
32. 1984 අංක 36 දරණ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ ) රාජ්‍ය සභා ආඥාව (සංශෝධන ) පනත (1984) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

33. දණ්ඩ නීති සංග්‍රහය 19 වන අධිකාරය (2015) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

34. 1982 අංක 12 දරණ පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත (1982) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

35. A reprint of the Ceylon (Parliamentary Elections) Order in Council-1946 (Chepter 381) (1970) Colombo, Department of Government Printing

36. Registration of Electors Act, 44 of 1980 (1980) Colombo, Department of Government Printing

37. Ceylon (State Council) Order in Council, 1931

38. Ceylon ( State Council Election) Order in Council 1931

**වෙබ් අඩවි**

39. මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය - https://elections.gov.lk/

40. අධිකරණ අමාත්‍යංශයේ නීති මූලාශ්‍ර පිළිබඳ වෙබ් අඩවිය - https://www.lawnet.gov.lk/ (12/3/2022)

41. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය - http://www.documents.gov.lk/ (12/3/2022)

ඇමුණුම

# මැතිවරණ හා සැබැඳි අධිකරණ තීරණ

## A

1. A.S.N.Perera v. Dayananda Dissanayake –Writ Application No 522/2000- C.A.M.22.08.200
2. Abewardhana v. Ariya Bulegoda- 1985-SLR-86
3. Abeywardana v. Dharmapala -(1956-NLR-399)
4. Abeywickrem a v. Pathirana-(1986)-1-Sri.L.R-120
5. Abeywickrema v. Pathirana (1984) 1 Sri L.R. 215
6. Adikari v. Dlssanayake and others (2001) 3 Sri L.R. 132
7. Ahamed v. Aliyar Lebbe 1973 NLR 73
8. Alexander v. Chandrananda de Silva, Commissioner of Elections and others (1996) 2 Sri LR. 301
9. Ameer Ali and Others vs Sri Lanka Muslim Congress and Others (2006) 1 Sri L R. 189
10. Anthony and others v. Chandrasena, Returning Officer and Others (1996) 2 Sri LR. 311
11. Anusha Pelpita v. AG Court of Appeal Case No: CA 413-414 2017 -C.A.M.19.11.2020
12. Aron v. Senanayake. 40 NLR 257
13. Arulsamy vs. Upcountry Peoples Front and Others (2006) 3 Sri L R. 386
14. Attanayake v. Commissioner General of Elections (2011) 1 Sri LR 220
15. Atukorale v. Dissanayake — (1998) 3 SLR 206

# B


16. Bandaranaike v. Premadasa (1989) 1 Sri. L.R. 240
17. Bandaranaike v. Premadasa (1989) 1 Sri L R. 240
18. Bandaranayake v. Weeraratne - (1981) 1 SLR 10
19. Basheer Segu Dawood v. Ferial Ashraff and Others (2002) 1 S ri L.R. 25
20. Basheer Segu Dawood v. Ferial Ashraff and Others [2002] 1 Sri LR 26
21. Buwaneka Lalith v. Geetha Kumarasinghe SC Appeal 99/2017 SCM. 2.11.20017


# C


22. Centre for Policy Alternatives v. Dayananada Disanayake (Chief Minister case) (2003) 1 Sri L.R 277)
23. Centre for Policy Alternatives( Guarantee)Ltd & Another v. Kabeer Hashim & Others – SC(FR) No.54/2016 S.C.M. 24.05.2016
24. Chandananda de Silva Commissioner of Elections and Another v. George Ivan Appuhamy and Others (1993) 2 Sri L.R. 401
25. Chelvanayagama v. Natesan-(1954 NLR 304)
26. Cooray v. Fernando 5 4 N LR 400


# D


27. Dahanayake v. De Silva (1978-79 -80)1 SLR 41
28. David Perera v. Peiris- 1972-NLR.217
29. Deepthi Kumara Gunarathne & Others v. Dayananda Dissanayake & Others – SC (FR) 56 /2008- S.C.M-19.03.2009
30. Denial Appuhamy v. T.B.Illangaratne -66 NLR 97.
31. Devananda v. Dayananda Dissanayake (2000) 3 Sri LR. 127
32. Dharmadasa Gomes v. Commissioner o f Elections and another (2001) 3 Sri L.R. 207

33. Dilan Perera v. Rajitha Senarathne ( 2000) 2 Sri L.R. 79)
34. Don Alexander v. Leo Fernando. 49 NLR 202
35. Don Philp v. T.B.Ilangaratne 1951 NLR 561
36. Dr.Arjuna Parakarama v. Dayananda Disanayake & 10 others SC/FR 640/2000 S.C.M. 25.02.2002
37. Duraiappah v. Marlyn (1971) 74 NLR 431

## E

38. Ediriweera Premaratne v. Srimani Athulathmudali and Others (SC Special 1/1996, SC Minutes of 27.2.1996),
39. Ediriweera, Returning Officer v. Kapukotuwa, General Secretary, United National Party31 (2003) 1 S. L. R 228 at 234
40. Ellawala v. Wiejesundara- (1974 NLR 265)

## F

41. Farook v. Siriwardena (Returning Officer) (1995) 2 Sri LR. 124
42. Farook v. Siriwardena, Election Officer and Others (1997) 1 Sri L.R. 145
43. Frewin Si Co. v. Ranjit Atapattu - (1993) 2 SLR 33

## G

44. Galappaththi v. Arya Bulegoda and Another [1997] 1 Sri LR 393,
45. Gamini Atukorale v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (1998) 3 Sri L R 206
46. Gamini Dissanayake v. M. C. M. Kaleel and Others [1993/ 2 S ri L.R. 135
47. Gamtni Atukorale v. Chandrika Bandaranaike Kumaratunga (2001) 1 Sri L.R 60
48. General Secretary of the United National Party v. The

Commissioner of Elections and Others (1998) 2 Sri LR.57
49. Ghany v Commissioner of Elections and others (2004) 1 Sri.L.R 17
50. Gooneratne & Others v. Chandranande De Silva, Commissioner of Elections- (1987) 2 Sri L.R 165
51. Gooneratne v. Premachandra [1994] 2 Sri LR 137.

# H

52. Hafi v Dayananda Dissanayake, Commissioner of Elections (2003) 3 Sri L.R 81
53. Hapuarachchi and Others v. Commissioner of Elections and Another. (2009) 1 Sri.L.R.2
54. Hemadasa v. Sirisensa- 1969 NLR 201

# I

55. I n re C. W. F. A. Jayawardene-1954 NLR-358
56. Ilangaratne v. O.E. de Silva.(1948) 49 NLR 169
57. In re Abu Bakr-1952 NLR 286
58. In re de Zoysa. 38 NLR 244
59. In re Fred E, De Silva 51 NLR 55
60. in re, S.N.Rajah 1954 NLR 203
61. Indra Kumar v. Dayananda Dissanayake & Others (2001) 2 Sri.L.R. 89

# J

62. Jayakody v. Karunanayake, Officer-in-Charge Police Station, Polgahawela and AG (1994) 2 Sri.L.R.264
63. Jayasena v. lllangaratne 73 NLR 3
64. Jayasena v. T.B.Ilangaratne- 1973 NLR 35
65. Jayasinghe v. Jayakody (1985} 2 Sri L R 77
66. Jayasinghe v. Jayakody and others - (1985 ) 2 Sri LR .77

# K

67. Kadija Umma et al v. Meera Lebbe et 11 NLR 75
68. Kaleel v. Themis (1956) 58 NLR 396
69. Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (case-1) (1999) 1 Sri LR. 157
70. Karunathilaka and Another v. Dayananda Dissanayake, Commissioner of Elections and Others (Enforcement Judgment) (Case No 2) (1999) 1 Sri LR. 183)
71. Kelepotha Vithanage Ariyaratne and Another v. S.T.Kodikara, Returning officer, District Secrataiat Galle and others - SC Writ Application No. 12/2018 S.C.M- 30.08.2019
72. Kithsiri v. Minister of Provincial Councils and Local Government and others SC FR Application No. 362/2017 – SCM 10.01.2018
73. Kobbekaduwa v. Jayawardena - (1983 ) 1 Sri L.R. 416
74. Kodakkar Pillai v. Madanayake — 54 NLR 433
75. Kularatne v. Chandrananda de Silva (1985) 2 Sri.L.R 164
76. Kularatne v. Chandrananda de Silva and another ( CA Application 112/85)
77. Kularatne v. Rajapaksha- (1985)-1-Sri.L.R-24
78. Kumaranatunge v. Jayakody (1984) 2 Sri.L.R 45
79. Kumarasinghe v. Dayananda Dissanayake (2001) 2 Sri L.R. 252
80. Kuruppu v. Hettiaratchy (1947) 49 NLR 57

# L

81. Lateef v. Saravanamuttu( 1932) 34 NLR 369

# M

82. Mahindasoma V. Senanayakeand Another (1996)1 Sri L R 180

83. Mahindasoma V. Hon. Maithripala Senanayake (1996)1 Sri L R 364
84. Maithripala Senanayake, Governor of the North-Central Province and Another v. Gamage Don Mahindasoma and' Others (1998) 2 Sri LR. 333
85. Masahir vs. Returning Officer Kegalle District and Others (2005) 3 Sri L,R. 39
86. Maseehudeen v. Returning Officer and Others (2002) 2 Sri L.R. 189
87. Medaiwaka v. Dayananda Dissanayaka (2001)-I Sri.LR 177
88. Mohamed Hussain Hajiar Muhammad and 17 others v.. Election Commission of Sri Lanka and Others SC (FR) 35/2016- SCM 15-12-2017
89. Mohamed Mihular v. Nalliah (1944) 45 NLR 151
90. Muththettugama v..Pilapitiya-(1980)-1-Sri.L.R-248

## N

91. Nagananda Kodituwakku v. Election Commission and 10 others (S.C.F.R .No.205/2022 – S.C.M. 19.07.2022)
92. Nanayakkara v. Kiriella (1985) 2 Sri.L.R. 391
93. Nathan v, Chandrananda De Silva Commissioner of Elections and Others (1994) 2 Sri L.R. 209
94. Nathan v, Chandrananda De Silva Commissioner of Elections and Others (1994) 2 Sri L.R. 209

## O

95. Omalpe Sobhita Thero v Dayananda Dissanayake and another (2008) 2 Sri L.R 121

## P

96. Pablis Appuhamy v. Dias 49 NLR 236

97. PAFFREL & Others v. Dayananda Dissanayake & 2 Others - C.A.No 176/2006 C.A.M. 16.03.2006
98. PAFFREL & Rohana Hettiarachchi v. Dayananda Dissanayake & another- C.A (Writ) No.356/2008- C.A.M. 28.04.2008
99. PAFFREL & Rohana Hettiarachchi v. Mahinda Deshapriya & 8 Others S.C.(F/R) Application No:76/2015- 05.05.2016
100. Peiris v.Samaraweera- 1971-NLR-250
101. Peiris v. Saravanamuttu. 33 NLR 229
102. Pelendagama v. Commissioner of Elections and Others (2001) 2 Sri L.R. 215
103. Pelpola v. Gunawardene (1948 ) 49 NLR 207
104. Perumpulli Hewage Piyasena v. Ilankai Tamil Arasu Kadchi ITAK Office SC Application Special [Expulsion] No. 03/2010 SCM, 8.2.2011
105. Peter Nelson Perera v. Dayananda Dissanayake SC(FR) 432 & 434 S.C.M. 9.11.205
106. Piyadasa v. Hewavitarna (1936) 40 NLR 421
107. Premachandra and Dodangoda v. Jayawickrema and Bakeer Markar and Others (1993) 2 Sri L.R. 294
108. Premalal Jaysekara v. Thushara Upuldeniya Commissionar Genaral Prison & Others C.A (Writ) Application No.295/2020 SCM:07,09.2020
109. Premaratne v . Srimani Athulathmudali and Others (SC Special 1/1996, SC Minutes of. 27.2.1996)


# R


110. Rajan v S.Kapukotuwa and others CA 665/2002 - CAM 3.6.2002
111. Rajapakse v. Kathirgamanathan (1965) 68NLR 14
112. Rajapakse v. Kularatne and otheä (1988) 2 Sri LR 382
113. Rajapaksha v.Gunasekara –(1974)-2-NLR-01
114. Rajaratnam v. Dayananda Dissanayake, Commissioner of Elections and others (2004) 1 Sri L.R 30

115. Rajavarothiam Sampanthan v. Attorney General & Others SC FR 351/2018 to 361/2018 SCM 13.12.2018
116. Rajindranath v. Commissioner of Elections & ,others (2001) 3 Sri L.R. 41
117. Rajlndranath v. Commissioner of Elections & others (2001) 3 Sri L.R. 42
118. Rambukwella v United National Party and others (2007) 2 Sri L.R 329
119. Ranjan Ramanayake v.SG Parliament CA (Writ) Application No. 52/2021
120. Rasiah Thurairatnam vs. Mahinda Deshapriya and 7 Others CA 178/2012 C.A.M 9.08.2012
121. Ratwatte v. Piyasena-(1966) 69 N.L R. 49.
122. Rohana Wijeweera v. Chandrananda De Silva, Commissioner of Elections (1998) 3 Sri LR. 203

## S

123. S.B. Dissanayake v. Priyani Wijesekera, Secretary General of Parliament and others
124. Samaranayake v. Kariiyawasam (69 NLR 1)
125. Sarath Amunugama and Others V. Karu Jayasurtya, Chairman, United National Party & Other (2000) 1 Sri.LR 172
126. Sarath Fonseka v. Dammika Kithulegoda SC REF No: 1/2010 SCM: 10.01.2011
127. Sarath Fonseka v. Mahinda Rajapakse and others (2010) 1 SRI LR . 376
128. Saravanamuttu v. de Silva. (1941) 42 NLR 294
129. Saravanamuttu v. de Silva. 43 NLR 77
130. Senanayake v. Navaratne(1954) 56 NL.R. 5 (P. C.)
131. Sirimavo Bandaranaike v. Ranasinghe Premadasa and Another (1992) 2 Sri L.R 1
132. Somadasa v. Saddasena (1957) 69 NLR 469
133. Sundara Banda v. Pathirana (1970) 73 NLR 10
134. Sunil Shantha v. Tharanga Harshaka Priya Prasad Dissanayake & Others -HC (Monaragala) Election petition 1/2018 HCM.13.09.2021

# T

135. Thambayah v. Kulasingham (1948) 50 NLR 126
136. Thavaneethan v Dayananda Dissanayake Commissioner of Elections and Others (2003)-I Sri LR 74)
137. Thavarasa and two Others v. Gunasekera and Others (1996) 2 Sri L.R.357
138. The Attorney-General v. Dharmaeena. 49 NLR 95
139. Thiranagama and 10 Others v. Amarasiri Dodangoda and 25 Others (1996) 2 Sri.LR . 238
140. Tilak Karunanaratne v. Mrs. Sirimavo Bandaranaike and Others, (1993) 2SriL.R. 90
141. Tilekewardene v. Obeysekara (1931) 33 N.L.R. 126.

# V

142. Vigneswaran and Stephen v. Dayananda Dissanayake and Others [2002] 3 Sri L.R.59

# W

143. Wadigamangawa and Others v. Wimalasuriya (1981) 1 S.L R 287
144. Wasantha Jayalath & Others v. Dr. Nihal Jayathilake & Others – SCFR/ 258/2014 SCM:12.09.2014
145. Weerasinghe v. Chandananda De Silva, Commissioner of Elections and Others [1992] 1 Sri L.R. 76
146. Weragoda vs Dayananda Dissanayake and others (2006) 2 Sri L R. 197
147. Wijewardena v. Senenanayake (1971) 74 NLR 97, 100
148. Willian Silva v. Wickramasuriya -69 NLR 409
149. Wimalasara Banda v. Yalegama (1966) 69 NLR 361

# Y

150. Y.P. De Silva, General Secretary, S.L.M.P. and Another v. Raja Collure, U.S.A. Alliance and Two Others [199J] 2 Sri L.R. 323
151. Yapa Abeywardena v. Harsha Abeywardene SC 51/87 (SPL) S.C.M.18.01.1988.

"අපේක්ෂකයන් දෙදෙනකු අතුරින් කෙනකු තෝරා ගැනීම සඳහා පුරවැසියකු විසින් ස්වකීය ඡන්දය හරහා නිශ්ශබ්ද වූත් රහසිගත වූත් අයුරින් කරනු ලබන ප්‍රකාශනය වූ කලී මහජන වේදිකාවක පවත්වනු ලබන වඩාත් වක්තෘම කථාවක් ඔස්සේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස ක්‍රියාවට යෙදීමට කිසිදු අයුරකින් දෙවනි නොවේ"

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මාර්ක් ප්‍රනාන්දු
කරුණාතිලක එදිරිව දයානන්ද දිසානායක සහ තවත් අය
*[1999] 1 Sri LR. පිටුව 157*

**පැෆ්රල්**

නො. 16, බර්ඩ් පෙදෙස, පාමංකඩ පාර, කොළඹ 06.

Tel: 011 2 558 570/1 Fax: 011 2 558 572

paffrel@sltnet.lk

www.paffrel.lk

9 786246 235055